
# කඳවුරු කළමනාකරණය
# මෙහෙයුම් කට්ටලය



කඳවුරු කළමනාකරණ ව්‍යාපෘතිය 2004

සිරං ගොල්ට සිහි කරන්න බැහැ, සරණාගත කඳවුරක් කුමණාකාරදැයි ඈ සිතූ ආකාරය. ඈ සිතන්නට ඇත්තේ, සරණාගත කඳවුරක් මිත්‍රශීලි, සරණාගයින් ගැන බලා ගන්නා, මිනිසුන් සිටින තැනක් කියලා. ආදරයෙන් පිළිගෙන රැකවරණය සලසාලන, හැම දෙයක්ම සුන්දර යයි ඔවුන්ට කියන තැනක් කියලා, හිතන්නට ඇත. ඇය හිතන්නට ඇත්තේ හැමෝටම කුටියක් හෝ කාමරයක් ඇති, පිරිසිදු තැනක්, පාසැල් වෛද්‍යවරු, සත්තු සේවිකාවන් සිටින තැනක් ලෙසයි, ඇය සිතන්නට ඇත්තේ. යුද්ධයේදී නැති වූ හැම දෙයක්ම ලබාදෙන, රෙදිපිළි, ඇඳන්, බිලැන්කේට්ටු, භාජන, සපත්තු, පෑන්, අභ්‍යාස පොත්, පොත්පත්, මිනිසුන් තම ගෙවල් අතහැර දලා ආවාම ඔවුන්ට අවශ්‍ය හැම දෙයක්ම ලැබෙන තැනක්, සරණාගත කඳවුරක් කියලාය. ඈ කොහොමටවත් නොහිතන්නට ඇති සරනාගත කඳවුරක් කෑ මොර දෙන, තර්ජනාත්මක ආලාප කියන කරන තැනක් ලෙස. ඉරුණු, සිදුරු සහිත කුඩාරමක, දුහුදු හමන, දෙවියන් වහන්සේ විසින් ලබා දෙන හිස් පොළවේ ඉඳ ගන්නට, නිදගන්නට හෝ බිමක් නැත. සිරිං ගොල් කෙසේවත් හිතන්නට නැතිවා ඇති කඳවුරක ආහාර, ජලය, සිල්ලර බඩු, භාජන සහ වෙනත් කිසි දෙයක් ගෙවීමක් නොකළොත් මිස නොමැති තැනක් ලෙස. යම් ආධාර දෙන සංවිධනයක් මගින් ඔබව ලියාංදිංචි නොකළොත් මිස ආහාර කාඩ්පතක්, බිලැන්කට් පතක්, මෙට්ටපතක්, භාජන පතක්, වෛද්‍ය පතක් ඔබට හිතන්න පුලුවන් කුමක් හෝ පතක් නැතිව යමක් ලබාගත නොහැකි තැනක් කියලා හිතන්නට ඇත.

ඉරාන ලේඛක

සිබා සාහාකිබ් ගේ,

**"ඇප්ගනිස්ථානය, දෙවියන් කඳුළු සලන්නට පමණක් එන තැනකි"**

නව කාතාවෙනි

උපුටා ගැනිම පරිච්ජේදය 5, පිටු 76 - 77 ඉංග්‍රිසි සංස්කරණය

ඉංග්‍රිසි පරිවර්තනය සාහවුන් වයිට්සයිඩ් විසිනි.

ලන්ඩන්, සෙන්චරි, රැන්ඩම් හිවස 2002

# පටුන

සංස්කාරක කණ්ඩායම සහ දායක වූ ප්‍රධාන කතුවරු
හැඳින්වීම

පරිච්ඡේදය 1: කඳවුර පිහිටුවීමට පෙර සාකච්ජා කිරීම් 15

**හැඳින්වීම**
**සාකච්ජා කළ යුතු කරුණු**
පාර්ශ්වයන් හඳුනා ගැනීම
ඉසව් හඳුනා ගැනීම
සත්කාරක ප්‍රජාව සමග අවබෝධතා ගිවිසුමක් පිළියෙල කිරීම
සත්කාරක ප්‍රජා ප්‍රතිලාභ
සත්කාර ප්‍රජා අන්තර් සබඳතා - කඳවුරු වැසියන්
මෙහෙයුම් කට්ටලය සහ පරිශීලන (ආශ්‍රයන්)

පරිච්ඡේදය 2 : කඳවුර පිහිටුවීම සහ සත්කාර සහ පවත්වාගෙන යෑම 31

**හැඳින්වීම**
කඳවුරු කලමනාකරණ කණ්ඩාමේ වගකීම්
තාක්ෂණ බිම තෝරා ගැනීමේ කමිටුව
බිම් සමීක්ෂණය සහ ඇගයීම
සැළසුම සහ (සංකල්පය) සැකසුම
නිවාසස්ථාන.
කඳවුරු පිහිටුවීමේ ආරක්ෂක කරුණු
මෙහෙයුම් කට්ටලය
අවශ්‍ය කියවීම් සහ පරිශීලනය කළ යුතු ලේඛන

පරිච්ඡේදය 3: ප්‍රජා සහභාගිත්වය සහ කඳවුරු කමිටු 55

**හැඳින්වීම**
කඳවුරු කළමනාකරණ කණ්ඩාමේ වගකීම
ප්‍රජා නියෝජනය
කඳවුරේ වෙනත් කමිටු
ස්වේච්ජාවෙන් සියරට යෑමේදී ප්‍රජා සහභාගිත්වය
මෙහෙයුම් කට්ටලය
සමුද්දේශ මෙවලම්
අවශ්‍ය කියවීම් සහ පරිශීලන ලේඛන

**පරිච්ඡේදය 4: ලියාපදිංචි කිරීම සහ දත්ත එක්රැස් කිරීම** 67

**හැඳින්වීම**
කඳවුරු පසුබිමක ලියාපදිංචිය වැදගත් කුමක් නිසාද?
ලියා පදිංචි කරනු ලබන්නේ කවුරු විසින්, කවදාද?
උනන්දුවක් දක්වන අය සහ ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය
රජයේ කාරිය
අවතැන්වූ අයගේ කාරිය
සරණාගත බිමක එක්සත් ජාතීන්ගේ සරනාගත මහකොමිසාරිස්වරයාගේ (UNHCR) කාරිය
අවතැන් වූ පසුබිමක OCHA කාරිය
ක්‍රියාකාරි පාර්ශ්වයන්ගේ කාරිය
සරණාගත බිමක කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්
ලියාපදිංචි කිරීමේ මට්ටම්
එක්ව නොපැමිණි සහ වෙන්වූ දරුවන්ගේ ලියාපදිංචි කිරීම
ස්ත්‍රී සරණාගතයින් ලියාපදිංචි කිරීම
කඳවුරට අළුතින් එන්නන් ලියාපදිංචි කිරීම
හරි වැරදි බැලීම සහ ලියාපදිංචිය අවලංගු කිරීමේ කියාවලිය
අවතැන්වූ බිමක කඳවුරු කළමනාකරන කණ්ඩායමේ වගකීම්
ලයිබීරියා සිද්ධිය
කඳවුරු වැසියන්ගේ දත්ත සමුදය
මෙහෙයුම් කට්ටලය
අවශ්‍ය කියවීම සහ පරිශීලන ලේඛන

**පරිච්ඡේදය 5: ආරක්ෂාව** 99

**හැඳින්වීම**
සරණාගතයින්ගේ ආරක්ෂාව
අභ්‍යංතර අවතැන්වුවන්ගේ ආරක්ෂාව
ආරක්ෂාව සඳහා න්‍යාය පත්‍රය
කඳවුරු බිමක ආරක්ෂාව
ආරක්ෂාවක් තුළ ප්‍රධාන පාර්ශ්වයන්
අවතැන්වූ ජනයාගේ කාරිය
ජාතික රජයේ කාරිය
UNCHE කාරිය
OCHA කාරිය
ICRC සහ රතු කුරුස සංවිධානයේ කාරිය
රාජ්‍ය නොවන සංවිධාන වල කාරිය
කඳවුරු කළමනාකරන කණ්ඩායාමේ වගකීම්
වගකීම සහ පැවැතුම් පරිපාටිය
නිරීක්ෂණය, ලියවිලි පිළියෙල කිරීම, වාර්තා කිරීම සහ තොරතුරු බෙද ගැනිම.
අවතැන් වූ කාන්තාවන් සහ ළමුන්
අත්‍යවශ්‍ය පසුබිම් තොරතුරු
කල්පවත්නා විසඳුම්
ICLA සංකල්පය
මෙහෙයුම් කට්ටලය
සමුද්දේශ මෙවලම්
අවශ්‍ය කියවීම් සහ පරිශීලන

**පරිච්ඡේදය 6: ළමා ආරක්ෂාව** 123

**හැඳින්වීම**
ළමුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය
විශේෂ අවශ්‍යතා ඇති අවතැන්වූ ළමුන්
කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්
නිරීක්ෂණය, ලියාපදිංචි කිරීම,
ලියවලි සැකසීම සහ තොරතුරු බෙදා ගැනීම.
කඳවුරු තුල විකල්ප ජීවත්වීමේ විධිවිධාන
අභිවර්ධනය කිරීම
නිදහස් ලෙස ජීවත්වීම: විශේෂිත ආරක්ෂක අවශ්‍යතා ඇමතීම
හඳුනා ගැනීම සහ යලි එකමුතු කිරීම
සහභාගිත්ව මැදිහත්වීම
මෙහෙයුම් කට්ටලය
සමුද්දේශ මෙවලම්
අවශ්‍ය කියවීම් සහ සමුද්දේශ

**පරිච්ඡේදය 7 ලිංගාශ්‍රිත ප්‍රචණ්ඩත්වය වැළැක්වීම** 153

**හැඳින්වීම**
ලිංගාශ්‍රිත ප්‍රචණ්ඩත්වය පිළිබඳ අර්ථ දැක්වීම (GBV)
ලිංග
බලය
ප්‍රචණ්ඩත්වය
කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්
අත්‍යාවශ්‍ය පසුබිම් දැනුම
සංවිධානාත්මක පියවර
ආහාර හා ආහාර නොවන ද්‍රව්‍ය (NFIS) බෙදා හැරීම
ප්‍රජා සහභාගිත්වය හා සනීපාරක්ෂාව
ලිංගික ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම
මෙහෙයුම් කට්ටලය
සමුද්දේශ මෙවලම්
අවශ්‍ය කියවීම් සහ සමුද්දේශ

**පරිච්ඡේදය 8 කඳවුරු ආරක්ෂාව** 191

**හැඳින්වීම**
කඳවුරු සහ ආරක්ෂාව
රාජ්‍ය / ප්‍රාදේශීය බලධාරීන්/අධිකාරීන්
කඳවුරු වැසියන්
එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස්වරයා UNHCR
කඳවුරු කළමනාකරණ ඒජන්සි / රාජ්‍ය නොවන සංවිධාන
ස්වදේශීය ප්‍රජාව
කඳවුරු කළමනාකරණය කණ්ඩායමේ වගකීම්
මෙහෙයුම් කට්ටලය
අවශ්‍ය කියවීම සහ සමුද්දේශ

**පරිච්ඡේදය 9 ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය බෙදා හැරීම** 211

**හැඳින්වීම**
සංකල්පමය ව්‍යුහය
අවම ප්‍රමිතීන්
විශ්වාසවන්ත ජනයාට ආහාර ආධාර දෛනික සලකා සාම්පල තෝරාගත් ආහාර වැඩසටහන්
එච්.අයි.වී./ඒඩ්ස් රෝගීන් සමග විසීම (PLWHA)
ගබඩා කිරීම.
කඳවුරු කළමානකරන කන්ඩායමේ වගකිම්
දන්ත එකලස් කිරීම / ලියාපදිංචිය
නිරීක්ෂණය, වාර්තා කිරීම සහ තොරතුරු බෙදා ගැනීම
බෙදාහැරීමේ ක්‍රම
ප්‍රසංගානත්මක ප්‍රජා ව්‍යාපෘති
එළවළු කොටු / කුඩා පශු සම්පත් ඇතිකිරීම්
ආදායම් ජනනය කෙරෙන ව්‍යාපෘති
ආහාර නොවන ද්‍රව්‍ය (NFLS)
ආහාර නොවන ද්‍රව්‍ය සම්බන්ධයෙන් කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකිම්.
මෙහෙයුම් කට්ටලය
සමුද්දේශ මෙවලම්
අවශ්‍ය කියවීම් සහ සමුද්දේශ

**පරිච්ඡේදය 10 ජලය සහ සනිපාරක්ෂාව** 235

**හැඳින්වීම**
කඳවුර කළමානකරණ කණ්ඩායමේ වගකිම්
නිරීක්ෂණය, වාර්තා කිරීම සහ තොරතුරු හුවමාරුව
සනිපාරක්ෂාව සහ ප්‍රජා දායකත්වය
ජලය සහ සනිපාරක්ෂාව පිළිබඳ ආරක්ෂක දර්ශකයන්
මෙහෙයුම් කට්ටලය
අවශ්‍ය කියවීම් සහ සමුද්දේශ

**පරිච්ඡේදය 11 අධ්‍යාපනය** 257

**හැඳින්වීම**
කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකිම්
පොදු කාර්ය සංවිධානය (ව්‍යුහ) සහ සැළසුම
ලිංගික කරුණු පිළිබඳ සැලකිලිලමත් වීම
ප්‍රජා සහභාගිත්වය
අධ්‍යාපනය සඳහා වගකිව යුතු ඒජන්සි නැති විටක
කඳවුරු කළමනාකරන කණ්ඩායම වෙනත් බලය පවරන ලද ඒජන්සි සමග සම්බන්ධතාවය.
මෙහෙයුම් කට්ටලය
සමුද්දේශ මෙවලම්
අවශ්‍ය කියවීම් සහ සමුද්දේශ

පරිච්ඡේදය 12, ස්ව ශක්තියෙන් ජීවත්වීම සඳහා ජීවන ක්‍රමවේද දිරිමත් කිරීම 285

හැඳින්වීම
කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්
වෙළඳ පොල පහසුකම් සැලසීම
කුසලතා පුහුණුව සහ ආදායම් ඉපැද්දවීම (ජනනය)
මෙහෙයුම් කට්ටලය
අවශ්‍ය කියවීම් සහ සමුද්දේශ

පරිච්ඡේදය 13 තරුණයන් සහ විනෝදාංශ 299

හැඳින්වීම
කඳවුරු කළමානාකරණ කණ්ඩායමේ වගකීම්
කඳවුරු සැලැස්ම සහ වැඩසටහන් සැකසීම
තරුණයන්ගේ සහභාගීත්වය
වෙනත් වගකිවයුතු ඒජන්සි සමග සම්බන්ධ වීම.
මෙහෙයුම් කට්ටලය.
අවශ්‍ය කියවීම් සහ සමුද්දේශ

පරිච්ඡේදය 14 සෞඛ්‍යය සත්කාරය හා සෞඛ්‍යය අධ්‍යාපනය 319

හැඳින්වීම
සම්පාරක්ෂාව පුවර්ධනය සහ සෞඛ්‍ය අධ්‍යාපනය
කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්
දත්ත එකලස් කිරීම හා සේවා බෙදහැරීම සොයා බැලීම
ප්‍රසාදත්මක සෞඛ්‍ය සත්කාර සම්බන්ධ කටයුතු
විශේෂඥයකු වෙත උපදෙස් සඳහා යොමු කිරීම සහ දැඩි වෛද්‍ය කරුණු කාරණ
වැඩි දුර සෞඛ්‍ය සම්බන්ධ කාරණා
මෙහෙයුම් කට්ටලය
සමුද්දේශ මෙවලම්
අවශ්‍ය කියවීම් සහ සමුද්දේශ

පරිච්ඡේදය 15 මනෝවිද්‍යාත්මක සත්කාරය 333

හැඳින්වීම
සමහර ප්‍රධාන සංකල්ප
චිත්තවේගී කම්පනය
මනෝවිද්‍යාත්මක චිත්තවේගී කම්පන පිළිබඳ යම් හැඟවීම්
කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්
මෙහෙයුම් කට්ටලය
අවශ්‍ය කියවීම් සහ සමුද්දේශ.

පරිච්ඡේදය 16 සාමය ඇති කිරීම සහ ප්‍රතිසන්ධානය 343

හැඳින්වීම
ප්‍රජාව සමග අර්බුද
පිටතින් ගෙන ආ අර්බුද

සත්කාරක ප්‍රජාව සමග අර්බුද
සාමය ඇති කිරීමේ උපාය විධි
කඳවුරු කළමානකරණ කණ්ඩායමේ වගකීම්
මෙහෙයුම් කට්ටලය
අවශ්‍ය කියවීම් සහ සමුද්දේශ

පරිච්ඡේද 17 කඳවුරු කළමානාකරණ කණ්ඩායමේ වගකීම 349

හැඳින්වීම
කඳවුරු කළමණාකරණ කණ්ඩායම
කඳවුරු කළමණාකරන කණ්ඩායමේ වගකීම්
කඳවුරු කළමණාකරණ කණ්ඩායමේ සම්බන්ධීකරණ යාන්ත්‍රණය
මෙහෙයුම් කට්ටලය
අවශ්‍ය කියවීම් සහ සමුද්දේශ

පරිච්ඡේදය 18 කඳවුර වැසීම 375

හැඳින්වීම
පිටවීමට කරනු ලබන ඇගැවීම.
කඳවුරු කළමනාකරණ කණඩායමේ වගකීම්
වැසීමට පූර්ව සැලකිය යුතු කරුණු සමහරක්
ප්‍රචාරක ව්‍යාපාර කල්පවත්නා විසිඳුම් පිළිබඳ උපදේශනය
බිම් බෝම්බ පිළිබඳ දැනුවත් කිරීම, දියුණු කිරීම
සත්තාකරක ප්‍රජාව
ක්‍රියාත්මක කිරීමේ සහ මෙහෙයුම් පාර්ශවයන්
සැපයුම් සහ ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරුවන්
කඳවුරු ප්‍රජාව සංචලනය
ඉවත් වූ ව්‍යුහයන්/පහසුකම්/ද්‍රව්‍ය/උපකරණ වල අනාගත භාවිතය.
පරිසරය

මෙහෙයුම් කට්ටලය
අවශ්‍ය කියවීම් සහ සමුද්දේශ

කඳවුරු කළමනාකරණ ව්‍යාපෘතිය
උපකාර අනුෂ්මෘති
කෙටි යෙදුම්

# සංස්කාරක මණ්ඩලය

**කළමනාකරණ සංස්කාරකවරු:**
නිනා එම් බ්‍රිස්ලැන්ඩ්, එලන් වර්මෙව්ලන් සහ ටෝර් වංග්ලි NRC

**පින්තූර සංස්කාරකවරු සහ සහායකයින්.**
ටොරිල් ස්පෙට්නි සහ එලි වාරුම් රොග්නෙරුඩ්, NRC

**සංස්කාරක කණ්ඩායම:**
ජෝගස් ඇගියුටන්ට් NRC
එලන් හකීම් සහ රස්මුස් ස්ටුහර් ජෙකොබ්සන් DRC
ලවුරෙන්ස් ජෝල්ස්, කාඩරු නෙමොතෙ
නැන්සි පොලුටැන්, ඉඑඉන් හෝල් UNHCR

**සැළසුම:**
පේටි ටයිපර්

**ප්‍රකාශනය**
නෝර්විජියානු සරණාගත කවුන්සිලය/කඳවුරු කළමනාකරණ ව්‍යාපෘතිය
තැ.පෙ. 6758 ශාන්ත ඔලාව්ස් ප්ලාස්
0130 ඔස්ලො, නෝර්වේ.
දුරකථනය + 4723109800
ෆැක්ස් + 4723109801
E- mail - camp @nrc.no.
Website - http://www.nrc.nocamp
ISBN 827411-145-1

# දායකත්වය දැක්වූ ප්‍රධාන කතුවරුන්

නිනා එම් බ්‍රිස්ලැන්ඩ්, NRC ව්‍යාපෘති කළමනාකරු සහ එලන් වර්මෙවුලන් NRC ව්‍යාපෘති උපදේශක - සියරා ලියෝන්

**සහය දෙනු ලැබුවෝ.,**

රපායල් U. ඇබිස්, සර්ප් / IRC, ජෝගස් අගුවට්ටන්ට්, NRC සම්බන්ධතා නිළධාරි ජනිවා ක්‍රිස් බිලියර්ස්, NRC කඳවුරු කළමනාකරු සියරාලියෝන/මාරියා - ක්ලව්ඩ් බොතිනෙවු ,UNHCR ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශිය සෞඛ්‍ය සම්බන්ධිකාරක ජෙනිපර් ක්ලයින්, IRC සරනාගත වැඩසටහන් සම්බන්ධිකාරක සාරා ක්‍රවුපෝර්ඩ් බ්‍රවුන්, CVT මානසික සෞඛ්‍ය සම්බන්ධිකාරක ගිලියන් දුන් IRC හදිසි අවස්තා ප්‍රතිචාර සම්බන්ධිකාරක කැතරින් ග්ලෙන්කැම්ප් OCHA අපයෝජන සහ හිරිහැර වැළැක්වේමේ සම්බන්ධිකාරක මිචෙල් ඉසෙමිංගාර් WFP වැඩසටහන් නිළධාරි - මෙහෙයුම් සියරා ලියෝන් ජෝන් ලාහයි කෙයාර් ව්‍යාපෘති සම්බන්ධිකාරක මරියා - ඇග්නෙ ලාල්ලියර් NRC වැඩසටහන් කළමනාකරු සියරා ලියෝන් මයිල්ස් මාර්ටින් NRC ආරක්ෂක සම්බන්ධිකාරක සාරා මුස්ක්‍රොප්ට් OCHA මානව හිතවාදි කටයුතු පිළිබඳ ජ්‍යෂ්ඨ නිළධාරි- සියරා-ලියෝන් ටිම් නෝර්සෝ ARC ජගත් සුළු මූල්‍ය සම්බන්ධිකාරක ටෝර් වංග්ලි NRC සම්බන්ධිකාරක

# හැඳින්වීම.

## කඳවුරු කළමනාකරණ ඒජන්සීන්, කඳවුරු කළමනාකරුවන්,

කඳවුරු කළමනාකරණ කණ්ඩායම් ක්ෂේත්‍රයට පිවිසීමෙන් අවතැන්වූවන්ගේ මූලික අයිතිවාසිකම් සපුරාලීම සඳහා තීරණාත්මක කාර්ය භාරයක් ඉටුකරයි. සරණාගත හා අභ්‍යන්තර අවතැන් පුද්ගලයන් අයිතිවාසිකම් හිමියන් වන අතර අන් සියලු අයිතීන් සමග ගෞරවාන්විතවද, ආත්ම ගරුත්වය කෙලසන කෲර අමානුෂික ක්‍රියාවලට භාජන නොවී නැත්නම්, අන්තර්ජාතික ප්‍රඥප්තීන්හි සඳහන් දඬුවම්වලින්, මිදී ද ජීවත්වීම සඳහා ඔවුන්ට මූලික අයිතියක් ඇත. 2002 කේ දී යූ.එන්.එච්.සී.ආරය (UNHCR) හා එක්සත් රාජධානියේ සේව් ද චිල්ඩ්‍රන් ද (Save the Children U.K) වාර්තා කළ පරිදි පසුගිය අවුරුදු කිපය තුළ බටහිර අප්‍රිකාවේ කඳවුරු වල ජාතික හා අන්තර් ජාතික මානව සුභසාධන පුද්ගලයන් මගින් විශේෂයෙන්ම අභ්‍යන්තර අවතැන්වූ ළමයින් ගොදුරු වූ ලිංගික අතවර හා හිංසනකාරී පීඩන පසුබිම මත්තේ ආරක්ෂාවට හා පිළිසරණට ඇති අයිතිය ඉස්මතුවී පෙනෙයි. මේ වාර්තාවලින් කළ අනාවරණයන් අතිරේක ප්‍රතිකාර්මික හා වැළකුම් පියවරයන්හි අවශ්‍යතාව මනාව ගෙන හැර පායි. ක්ෂෙත්‍රගාමී මෙහෙයුමක් ඇති මේ කඳවුරු කළමනාකරණ ව්‍යාපෘතිය එවැනි එක් පියවරෙකි.

නිපුණත්වය, අත්දැකීම්, හා ආධාර ඉල්ලීමේ හා ලබා ගැනීමේ දක්ෂතාම යනාදිය අනුව කඳවුරු කළමනාකරණ ඒජන්සීන්ගේ හැකියා ප්‍රමාණ පුළුල් ලෙස වෙනස් වෙයි. සරණාගත හා අභ්‍යන්තර අවතැන් (IDP) තත්ව සංසන්දනය කර බලන විට කළමනාකරණයේ හා යොමුවීමේ වෙනස්කම් පැහැදිලිව මතුවී පෙනෙයි. කඳවුරු සැලැසුම් හා තැනීම් සඳහා පුළුල් උපදෙස් මාලා සහ අවම ප්‍රමිතීන් වෙයි. ඊට අමතරව පසුගිය අවුරුදු ගණනාවක් මුළුල්ලේ, ජලය සැපයුම, සනීපාරක්ෂාව හා සෞඛ්‍ය ආදී කඳවුරු කාර්යයන්හි තාක්ෂණික පැතිවලට යොමුවූ විශාල ප්‍රමාණයක් කරුණද එක්රැස්කර ගෙන ඇත. එසේ වුවද කඳවුරක් පිහිටුවීම සඳහා ගිවිස ගැනීමේ සිට කඳවුරු නිමාකරණය දක්වා කඳවුර සමස්තයක් සේ ගෙන නිමවා ගත් දේ ඇත්තේ අල්පයක් පමණි. තවද මැතක් වන තෙක් කඳවුරු කළමනාකරුවන් හා ප්‍රායෝගික සැකසුමකට අනුව එක්තැන් කෙරෙන හා මේ සියලු වගකීම් ආවරණය වන ආශ්‍රේය ද්‍රව්‍යවල ඌනතාවක් පැවතින.

මේ අඩුපාඩුව මකා ගැනීම සඳහා සියලුම මුඛ්‍ය දයක කාරක හවුල් කරුවන්. සම්බන්ධකර ගෙන අන්තර්-ඒජන්සිය සාකච්ඡා ක්‍රියාදමයකට 2002 ඔක්තෝබරයේ සියරා-ලියෝන්හි දී මුල පිරිණ. සියරා-ලියෝන්හි අවතැන්වූවන් හා නැවත පදිංචිකිරීම් සඳහා වූ කඳවුරුවලින් ලත් අත්දැකීම් අධ්‍යනය සඳහා කුඩා අන්තර් ඒජන්සි වැඩ කණ්ඩායමක් පිහිටුවන ලදී. මේ වැඩ කණ්ඩායමේ අරමුණ ඒජන්සීන්ට සහාය වීම සඳහා ප්‍රායෝගික ප්‍රවේශයක් පාදගැනීමත්, කළමනාකරණ ව්‍යවහාරවල සමස්ත වැඩි දියුණුවක් ඇති කිරීමත් පිළිබඳව යොමුවීමත්ය. කඳවුරු කළමනාකරණ වගකීම් සම්බන්ධ මුඛ්‍ය කරුණු අනාවරණය කර ගැනීමටද ලබාගත් ඇත්දැකීම් ඔස්සේ උගත් පාඩම් පුනරීක්ෂණයටද, අවතැන් කඳවුරු සඳහා සරණාගත කඳවුරු වලින් ගත හැකි හොඳ භාවිත හඳුනා ගැනීමටද කෙරෙහි යොමුවුන විධිමත් කඳවුරු කළමනාකරණ ව්‍යාපෘතියක් සේ වැඩ කණ්ඩායම කල් නොයවාම මේ ප්‍රයත්නය සකස්කර ගති. සාකච්ජාමය ක්‍රියාවලියකින් කඳවුරු කළමනාකරණය පිළිබඳ සම්පූර්ණ පොදු සමාලෝචනයක් කිරීම වැඩ කණ්ඩායම අරමුණු කර ගති. ඒ සාකච්ජාවල අවසාන ඵලය මේ කඳවුරු කළමනාකරණ මෙවලම් කට්ටලයයි.

සම්පූර්ණ ව්‍යාපෘති කාලය තුළම වඩ වඩාත් ඒත්තු ගැනුනේ අභ්‍යන්තර අවතැන් (IDP) තත්ව යටතේ කඳවුරු කළමනාකරණය, බොහෝ විට සරණාගත තත්ව යටතේ කඳවුරු කළමනාකරණයට වඩා ගැටළු සහිත බවයි. අන්තර් ඒජන්සි ස්ථාවර කමිටුව මගින් යෝජනා කරණ ලද සහයෝගිතා ප්‍රවේශය ක්‍රියාවට නැංවීම, ගැටළු සහගත බව ඒත්තු ගොස් ඇත. ක්ෂේත්‍ර තත්වය, විශෙෂඥ දැනීම, හා ආයෝජන පාදක කරගෙන අයිඩීපී (IDP) තත්ත්ව වලදී විවිධ ඒජන්සීන් මූලිකත්වය ගෙන ඇත. අන්තර්ජාතික ප්‍රජාවගේද

ස්ථිර නිපුණකම් වර්ධනය කරගැනීම ඒජන්සීන්ට දුෂ්කර කෙරෙයි. (IDP) කඳවුරුවාසීන් සඳහා කඳවුරු නඩත්තුව, අවතැනුන්ට සහන හා ආරක්‍ෂාව සැපයීම ආදියට දීර්ඝ කාලීන මූලාධාර සහතික කිරීම තීරණාත්මක වෙයි. සැකයෙක් නැතිවම ගැටුම්කාරී සහ පශ්චාත් ගැටුම්කාරී තත්වයන්හිදී, අභ්‍යන්තර අවතැනුන්ට උපකාර හා ආරක්‍ෂාව සැපයීමේ අවශ්‍යතාවයනට ඵලදායි ලෙස ප්‍රතිචාර දැක්වීමට සම්පත් හා හැකියාවද බොහෝ විට අධිෂ්ඨානයද රජයයනට නොමැත.

## කඳවුරු කළමනාකරණ මෙවලම් කට්ටලයේ අරමුණු.

මෙවලම් කට්ටලය කඳවුරු කළමනාකරණයෙහි තාක්ෂණික, පරිපාලනමය මෙන්ම සමාජයීය අංශයන් කෙරෙහි ද යොමුවෙයි. එය විශේෂයෙන්ම කඳවුරු කළමනාකරුවන්, කඳවුරු කළමනාකරණ කණ්ඩායම්, හා කළමනාකරණ ඒජන්සීන් වෙත අවධානය එල්ල කරයි. මෙය සර්වසම්පූර්ණවූවක් නොවන අතර මෙයින් අදහස් කරනුයේ පවත්නා උපදෙස් හා ප්‍රමිතීන් පුනරුච්චාරනය කිරීමත් සංශෝධනය කිරීමත් ගොනුකර ඌනපූරණ පිරවීම වෙයි.

මෙවලම් කට්ටලයේ අරමුණු.

- කඳවුරු කාර්යවල සියලු අංශයන් සම්බන්ධයෙන් කඳවුරු කළමනාකරුවකු, කළමනාකරණ කණ්ඩායමක් මනාව දැන සිටිය යුතු තොරතුරු නිශ්චය කර ගන ගොනු කිරීම.
- එක් එක් අංශයක් සම්බන්ධයෙන් කඳවුරු කළමනාකරුවන්ගේ හා කළමනාකරණ කණ්ඩායම්වල කාර්ය භාරය හා වගකීම නිර්ණය කිරීම.
- එක් එක් කරුණ සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය කියවීම් ලැයිස්තුවක් පිළියෙළ කිරීම.
- සැසදීම් ලේඛන, අධීක්ෂණ ආකෘති ප්‍රායෝගික උපදෙස් ද ඇතුළුව කඳවුරු කළමනාකරුවනට හා කළමනාකරණ කණ්ඩායම් වල එදිනෙද කටයුතුවලට සහාය සඳහා වූ ප්‍රායෝගික හා ආශ්‍රේය මෙවලම් සැපයීම්.

අවතැන්වූවන් සඳහා වූ කඳවුරු පුළුල් සන්දර්භයක ලා සැලකිය යුතුය. හැකි සෑම විටම කඳවුරු කළමනාකරණ ඒජන්සිය සත්කාරක ප්‍රජාවගේ අවශ්‍යතාවන් හා අයිතිවාසිකම් ද සැලකිල්ලට ගත යුතුය. විශාල සංඛ්‍යාවක අවතැන් වූවන් පිරිසක් ඉවසා දරා සිටීමට සත්කාරක ප්‍රජාවට ඇති හැකියාව ශක්තිමත් කිරීම ප්‍රමුඛතාවයක් විය යුතු අතර, ස්ථානීය ප්‍රජාවට, අතිරේක මානව ශුභසාධන ආධාර සැපයීම ගැනද, සැලකිල්ල යෙදවිය යුතුය. සරණාගතයන් හා අවතැන්වූවන් සත්කාරක ප්‍රජාව සමග එකට ගැටීම නිසා, විශේෂයෙන්ම විදේශිකයන් පිළිබඳ බිය හා වැරදි ආකල්ප ඇතිවීමට අවකාශ ඇති විටෙක, ස්ථානීය සමාජයේ සියළු තරාතිරම් අතර සරණාගතයන්ගේ හා අවතැන්වූවන්ගේ අවශ්‍යතා හා අයිතිවාසිකම් පිළිබඳ අවබෝධ ප්‍රමාණ වැඩිකිරීම ඉතාමත්ම වැදගත් වෙයි.

ලැබෙනැයි අපේක්ෂා කෙරෙයි. මේ දෙවන කෙටුම්පත මේ ආකාරයට බෙදා හැරීමට තීරණය කළේ මෙය වැඩි දියුණු කර ගැනිම සඳහා පසුපෙවුම් හා යෝජනා ආදිය වඩා පුළුල් පිරිසකගෙන් ලබා ගැනීමේ අපේක්ෂාවෙනි. විශේෂයෙන් ක්ෂේත්‍රයෙන් වඩා හොඳ භාවිතයන් පිළිබඳ අතිරේක මෙවලම් හා තොරතුරු ලබාගැනීමට ද කඳවුරු කළමනාකාර ව්‍යාපෘතිය උනන්දුවෙන් සිටියි.

මෙවලම් කට්ටලයේ දෙවන පිටපත http//www.nrc.no/camp/ යන්නෙන් ලබාගත හැක. බා ගැනිමට පෙර දැල්පොළේ (Network) ඇති ලියාපදිංචිවීමේ ආකෘතිය සම්පූර්ණ කරන්න. වැඩිදියුණු කර ගැනිම සඳහා දත්ත ගොනුවට පසුපෙවුම්, නිවරද කිරීම් හා යෝජනා සඳහා ඇගැයුම් පතක් ඇද ඇත. යෝජනා මේ ලිපිනයට යොමු කළ හැක. camp@nrc.no

වඩා සර්ව ව්‍යාප්ත හා පරිපූර්ණ අවසාන කෘතියක් සකස් කර ගැනිම සඳහා මේ මෙවලම් කට්ටලය මේ ආකරයෙන්ම 2004 අප්‍රේල් හා දෙසැම්බර් කාලය තුළ ක්ෂේත්‍ර පරීක්ෂණයට භාජනය කිරීමට කඳවුරු කළමනාකරණ ව්‍යාපෘතියට සම්බන්ධ ඒජන්සින් උනන්දු කෙරෙයි.

## මෙවලම් කට්ටලයේ සැකැස්ම.

මේ මෙවලම් කට්ටලය කඳවුරු කළමනාකරණය සම්බන්ධ පරිපූර්ණ ප්‍රකාශනයක් නොවේ. සමාන වැදගත් කමක් ඇති වෙනත් අංග වලට අවධානය දෙනවා වෙනුවට කඳවුරක දෛනික ක්‍රියාවන් කෙරෙහි කෙළින්ම බලපෑමක් කෙරෙන කරුණු කෙරෙහි කඳවුරු කළමනාකරන ව්‍යාපෘතිය ඍජු අවධානය මෙහෙයවා ඇත. උදහරණයක් වශයෙන් පරිසරය වැනි වැදගත් කරුනක් වේ නම් විෂයයන් වශයෙන් නොව අදාල පරිදි කෙටියෙන් සලකා බලා ඇත.

හැම පරිච්ඡේදයක්ම පහත දැක්වෙන සේ පෙළ ගස්වා ඇත.

**කඳවුරු කළමනාකාර කණ්ඩායම්වල වගකීම්.** කඳවුරු කළමනාකාර කණ්ඩායම් විසින් දැන සිටිය යුතු, ක්‍රියා කළ යුතු කරුණු සඳහන් සෝදිසි ලැයිස්තුවක්, ආශ්‍රේයනට පිවිසීමෙන් අදාළ පරිච්ඡේදයට කෙළින්ම යොමු විය හැකි වනසේ වෙනත් පරිච්ඡේද වලට හරස්-යොමු, ඊට අමතරව කඳවුරේ වෙනත් කවර කාරකයින් හා සම්බන්ධවීම හෝ සම්බන්ධීකරණය ඇති කරගත යුතුද යන්න යෝජනා මෙහි ඇතුළති.

**මෙවලම් කට්ටලය.** හැම පරිච්ඡේදයක් සඳහාම කළමනාකරණ කණ්ඩායමේ දෛනික කාර්ය සඳහා අවශ්‍යවන විවිධ වාර්තා ආකෘති, ගිවිසුම් හා වෙනත් දේවල සාම්පල ඇත. සමහර මෙවලම් පවතින අයුරෙන්ම භාවිත කළ හැක. සමහරෙක් අදාළ තත්වයට ගැලපෙන සේ සකස් කරගත යුතුවෙයි. ලිංග මූලික ප්‍රචණ්ඩකම් වාර්තා කිරීමට අදාළ ආකෘති කඳවුරුවල නිරන්තරව තිබිය යුතුය. එක් එක් පරිච්ඡේදයේ ඉලෙක්ට්‍රොනික අනුරුවේ Words හා Excel සැකැස්මෙන් මෙවලම් ඇතුළු කර ඇත. ඒ මෙවලම් ස්ථානිය තත්වයන්ට උචිත සේ ගලපා ගැනිම සඳහායි.

**ආශ්‍රේය මෙවලම් :** අදාළ කරුණු සම්බන්ධ ඉතා මුඛ්‍ය අත්පොත් හා උපදෙස් මාලා මේ කොටසෙහි දැක්වෙයි. සාමාන්‍යයෙන් ඒවා අන්තර් ජාලයෙන් හෝ එක්සත් ජාතින්ගේ කාර්යාල වලින් ලබා ගත හැක. ක්ෂේත්‍රයේදී විශේෂඥ ඒජන්සියක් සමග සම්බන්ධීකරණයේ දී දැනුවත්ම සිටීම පිණිස, මේවා ගැන ද, ඒවායේ ඇතුළත් වැදගත් කරුනු ගැන ද, කඳවුරු කළමනාකරණ කණ්ඩායම් දැන සිටිය යුතුය.

**අවශ්‍ය කියවීම් හා මූලාශ්‍රයන් :** අදාළ කරුණු සම්බන්ධ වඩා පොදු මූලාශ්‍ර සම්පත්වලට මේ කොටස යොමු වෙයි. එය ඇතුළත් කර ඇත්තේ පසුබිමක් හා වඩා ගැඹුරු අවබෝධයක් ලබාදීම සඳහායි.

## මේ මෙවලම් කට්ටලය භාවිතය:

මේ කඳවුරු කළමනාකරණ මෙවලම් කට්ටලය, එක් අංශ සම්බන්ධ විශෙෂඥ අත්පොත් වලට ආදේශයක් නොව, කඳවුරු කළමනාකාර පැත්තෙන් බලන විට ප්‍රධාන ප්‍රශ්ණ හා බාධාවන් සම්බන්ධයෙන් වඩා හොඳ අවබෝධයක් වර්ධණයකර දීම සඳහා වෙයි. කඳවුරු කළමනාකරණය හා අංශ වගකීම පැවරුණු විවිධ ඒජන්සීන් අතර කඳවුරු පවත්වා ගන යාම සඳහා සක්‍රිය සහයොගයක් ගොඩ නගා ගැනුමට එය අනුබල දෙයි. එවැනි ඒජන්සින් නැතිවිට කඳවුරු කළමනාකරණයට එක් එක් අංශය අවබෝධ කර ගැනීමටත් නිසි පරිදි උපදේශනයටත් මේ මෙවලම් කට්ටලය අවකාශ සලසනු ඇත.

මෙවලම් කට්ටලයේ පිටපතක් පොතක් වශයෙන් හෝ ඉලෙක්ට්‍රොනිකව සැමවිටම කඳවුරේ තිබිය යුතුය. කඳවුරු කළමනාකාර කණ්ඩායමට පමණක් නොව කඳවුර පවත්වාගෙන යන සියල්ලන්ටම, අංශ හා විශෙෂඥ ඒජන්සීන්ට, කඳවුරුවාසින්ගේ නියෝජිතයිනට ප්‍රාදේශීය බලධාරින්ට, පොලිසියට හා අවශ්‍යයෙන්ම කඳවුරුවාසීන්ට ද මේ මෙවලම් කට්ටලය පරිහරනයට විවෘතව තිබිය යුතුය.

## පුහුණුව

මෙවලම් කට්ටලය භාවිතය සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම, කඳවුරු කළමනාකරන ඒජන්සියේ වගකීම වෙයි. පුහුණු කාර්ය සඳහා උදව් ලබාගැනීමට Camp@nrc.no ලිපිනයෙන් කඳවුරු කළමනාකරණ සම්බන්ධිකාරක හමුවෙන්න.

මෙවලම් කට්ටල භාවිත පුහුණුවට ප්‍රමුඛ අවධානය ලැබෙන සේ ව්‍යාපෘතියේ අනාගත කටයුතු සඳහා විධික්‍රම, කඳවුරු කළමණාකරන මෙවලම් කට්ටල ව්‍යාපෘතියට සම්බන්ධ ඒජන්සීන් විසින් නිර්මාණය කරනු ඇත.

# 1 කඳවුරු පිහිටුවීමට පෙර ගිවිස ගත යුතු කරුණු



සියරා ලියෝන්හි සරණාගත පවුලක් ඔවුන්ගේ නව නිවස ඉදිකිරීමට පෙර කඳවුරු කළමනාකරණ කණ්ඩායම සමග සාකච්ඡා කිරීම කඳවුරු පිහිටුවීමට පෙර කතාබහ කිරීම සාර්ථකව කඳවුරු පවත්වා ගෙන යෑමට තීරණය කෙරේ පින්තූරය එඩුවාර්ඩ් කොම්ප්ටිනෙ වර්දගුවර්

# පරිච්ඡේදය 1 : කඳවුරු පිහිටුවීමට පෙර ගිවිස ගත යුතු කරුණු

## හැඳින්වීම

කඳවුර පිහිටුවා ගන්නා තැන පිළිබඳව පූර්ව ගිවිසුම් ඇති කරගත් ආකාරය හා කඳවුර පිහිටුවා ගත් ආකාරයද, එය පිහිටුවා ගත්තාට පසු එහි පාලනමය කාර්ය කර ගත යෑමේ හැකියාව කෙරෙහි තීරණාත්මක බලපෑමක් කෙරෙනු ඇත. කඳවුරක් පවත්වාගත යාම හා පාලනය කර ගැනීමේ හැකියාව කෙරෙහි කඳවුරුවාසීන් හා සත්කාරක ප්‍රජාව අතර ඵලදායී සම්බන්ධතා ඇතිකරගැනීමද දැඩි බලපෑමක් කෙරෙයි.

එනිසා නේවාසිකයනට පිළිසරණ හා ආරාක්ෂාව හා වෙනත් ප්‍රජා සේවා සැපයෙන, ක්‍රියාකාරී ප්‍රජාවක් සේ සාර්ථක වීම කෙරෙහි, කඳවුරක ජීවිත කාලයේ මුල් අදියර තීරණාත්මක වෙයි, කඳවුරක් පිහිටුවූ පසු කොපමණ කාලයකට කඳවුරු සේවා අවශ්‍ය වේ දැයි නිශ්චිතව කිව නොහැක.ඒ නිසාම නිවැරදි මනා ආරම්භයක් තහවුරු කර ගැනීම හැම අතින්ම වැදගත් වෙයි, මේ පරිච්ඡේදයේ අවධානය, සැලසුම් කර පිහිටුවා ගනු ලබන කඳවුරුවලට මිස ඉබේ ඇතිවූ හෝ ඇතිකරගත් කඳවුරු වලට නොවේ.එසේ වුවද සමහර අවස්ථාවලදී ඉබේ ඇතිවූ හෝ ඇතිකර ගත් කඳවුරක් සැලැසුම් කඳවුරකට පරිවර්තනය කර දෙන ලෙස කඳවුරු කළමනාකරණ ඒජන්සියකට ඉල්වීම් විය හැක(විස්තර සඳහා පරිච්ඡේදය 2 බලන්න)

සම්මතයක් වශයෙන් කඳවුරු කළමනාකරණ එජන්සියක් තෝරා ගැනීමට පෙර සැලැසුම් කඳවුරු සඳහා නව කඳවුරු ස්ථාන තෝරා හඳුනා ගිවිස ගැනීමත් අදාළ වගකීම දරණ රජය මගින් හෝ වෙනත් වගකීම් පැවරුනු බලයලත් අධිකාරයන් මගින්-සරණාගතයන් සම්බන්ධයෙන් "යූඑන්එච්සී ආරය" මගින් (UNHCR) - හෝ සාමාන්‍යයෙන් කරනු ලැබෙයි, එලෙසම කඳවුරු බිම තෝරා ගැනීම, කඳවුරු බිම් පිඹුරු පිළියෙල කිරීම, පෙදෙසි ප්‍රජාව සමග සාකච්ඡා කර ගැනීම්, අවබෝධතා ගිවිසුම් පිළියෙළකර ගැනීම,කඳවුරෙහි වෙනත් කාර්ය කෙරෙන ඒජන්සීන් තෝරා ගැනීම් ආදියද කඳවුරු කළමනාකාර ඒජන්සියේ වගකීම නොවෙයි. මේ කාර්ය බොහෝවිට කෙරෙන්නේ කඳවුරු කළමණාකාර ඒජන්සියේ සහභාගිත්වයෙන් තොරවය මෙය එක් අතකින් අවසනාවන්ත තත්ත්වයකි, මන්ද කළමණාකාර ඒජන්සියට කඳවුර පිහිටුවීම සහ පවත්වාගත යාම සඳහා සමස්ත වශයෙන් වගකීමෙක් පැවරෙන බැවිනි. එනිසාම ක්‍රියාවලියේ මුල් අදියරයන්හි සිටම ඔවුන්ට සහභාගිවීමේ අවකාශය තිබිය යුතුය,

## අවධානය යොමු විය යුතු කරුණු

### සහකරුවන් හඳුනාගැනීම

මුහුණ දීමට සිදුවන අවස්ථාවේ හදිසි ස්වභාවය නිසා හෝ රාජ්‍ය නොවන සංවිධාන (NGOO) සීමාවීම නිසා හෝ සෑම විටම නොහැකි වුවද පුළුවන් හැම විටකම පහත දැක්වෙන පරිදි

- හැකි මුල් අවස්ථාවේම කඳවුරු කළමනාකාර ඒජන්සිය තෝරා බේරා ගැනිමත්
- කඳවුර සම්බන්ධයෙන් ප්‍රධාන දායක කාරක හවුල්කාර ඒජන්සින් ගෙන් සැදි හවුල් කඳවුරු සැලසුම් කමිටුවක් පුළුවන් මුල් අවස්ථාවේදිම පත්කර ගැනිමත් යෝජනා කෙරෙයි.

**නොපමාව කඳවුරු කළමනාකරණ ඒජන්සියක් හඳුනා ගැනිම:** කඳවුරක් පිහිටුවිමේ ක්‍රියාවලියේදි හැකි ඉක්මනින් හැකියා ඇති කඳවුරු කළමනාකරණ ඒජන්සින් හඳුනාගත යුතුය. ගිවිස ගැනිමේ මුල් අවස්ථාවේ සිටම, හැකි පමණ ඉක්මනින් සියලු සැලැසුම් කාර්යයන්හි ද දායක කාරක හවුල් කරුවන් සමග කෙරෙන සාකච්ජාවලටද ඔවුන් සහභාගිකර ගත යුතුයි. එවැන්නකින්, ඇතිකරගත් තිරණයන් පිළිබඳ පුර්ණ අවබෝධයක් කඳවුරු කළමනාකරුට ලැබෙන අතර කඳවුර පිහිටුවූ පසු මතුවන ගැටළු වලට මැදිහත්විමේදි හා ප්‍රශ්ණ විසඳිමේදි කළමනාකරු වඩාත්ම ශක්තිමත් කෙරෙයි.

***ඒකාබද්ධ කඳවුරු සැලසුම් කමිටුව:*** කඳවුර තෝරාගැනිමේදි හා පිහිටුවිමේදි දායක කාරක හවුල්කරුවන් සමුහයක් සහභාගිකර ගත යුතුවෙයි, සියයට පණහක කාන්තා නියෝජනයක් කමිටුවෙහි ඇතිකර ගැනිම ඉලක්කයක් විය යුතුය.මෙවැනි කමිටුවකින් සැලසෙන වාසි බොහෝ වෙයි. කඳවුර පිහිටුවිම සම්බන්ධව මෙන්ම ඉහළ තලයේ තිරණයන් ගැනිම්හිදි ද විනිවිද බවක්ද ඉන් තහවුරු වනු ඇත. කමිටුවේ ස්වරූපය නිශ්චය කර ගත හැක්කේ ස්ථානිය තත්වය හා කවුරුවාසින්ගේ ස්වභාවය අනුව පමණක්ම වෙයි.

- කඳවුරුවාසින් (මේ වන විට සිටිත් නම්)
- ඉඩම් හා දේපළ හිමිකරුවන්
- තාක්‍ෂණික කණ්ඩායම:(යුඑන්සිඑච් ආරයෙන් හෝ මෙහෙයුම් ඒජන්සියෙන්)
- (රජයේ අදාල අමාත්‍යාංශ ද ඇතුළුව) මධ්‍යම, ප්‍රාදේශිය, හා ගැම් මට්ටමේ රාජ්‍ය ආයතන
- ජාතික ආරක්‍ෂක සේවා
- ප්‍රාදේශිය/ සත්කාරක ප්‍රජාවන් හා අදාල තැන්හි දී සම්ප්‍රදායිය බල කණ්ඩායම්
- (අවශ්‍ය තන්හි දී සම්බන්ධිකරණය සලසන හා රජයේ අධිකාරයනට ආධාර කාරක වන) ඕසිඑච්ඒය: (OCHA) එක්සත් ජාතින්ගේ වෙනත් මෙහෙයුම් ඒජන්සියක් සම්බන්ධ වි නොමැති විටක ඕසිඑච්ඒයේ කාර්ය භාරය වඩා වැදගත් වෙයි
- කඳවුර පිහිටුවිමට පෙර හඳුනා ගත් කඳවුරු කළමනාකරණ ඒජන්සිය
- වෙනත් අදාල සේවා සපයන්නන්-ජලය හා සනිපාරක්‍ෂක (WATSAN), ආහාර , අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා සපයන්නන්,

## කඳවුර පිහිටුවන තැන් තෝරා ගැනිම.

කඳවුර පිහිටුවන තැන තෝරා ගැනිම සම්බන්ධ සම්පුර්ණ වගකිම රජය හා මෙහෙයුම් ඒජන්සින් වෙත පැවරුණද අදාල දායක කාරක හවුල්කරුවන් සියළු දෙනාම ගිවිස ගැනිම්හිදි සහභාගි කරගත යුතු වෙයි. හවුල්කාර පරාසය අදාල තත්වය මත තිරණය වෙයි. උදාහරණයක් වශයෙන් සියරාලියෝන්හි ක්‍රියාවලියට යුඑන්එච්සි ආරය ඇතුලත් කර ගැනුනු අතර සියරාලියෝන් රජය

ද,දිස්ත්‍රික් නිලධාරි හා පරුමුක නායකයා ඇතුළු අනෙක් ප්‍රාදේශීය ප්‍රජා නියෝජිතයින්ද, අංශ නායකයින් හා ප්‍රාදේශීය නායකයින්ද ඉඩම් හිමියන්ද ප්‍රාදේශීය ප්‍රජාවද සමග ඉතා සමීපව හවුලේ කටයුතු කෙරින.

**යෝග්‍ය ස්ථාන තෝරා බේරා ගැනීමේදී සැලකිල්ලට ගතයුතු කරුණු රාශියක් වෙයි.**

- ප්‍රතිග්‍රාහක(සත්කාරක) ප්‍රජාවට දරා ගැනීමේ හැකියාව සහ ඔවුන් කෙරෙහි වන බල පෑම. කඳවුර පිහිටුවීම නිසා නැවත වරක් කොන්වීමේ අන්තරායට මුහුණ පෑ හැකි පෙර අවතැන්වූ කණ්ඩායම් මේ පෙදෙසේ ප්‍රතිග්‍රාහක(සත්කාරක) ප්‍රජාව අතර ස්ථිර පදිංචිකරුවන්ව සිටිය හැකිය.
- අවතැන්වූ ජනගහනය කෙරෙහි ප්‍රාදේශීය ප්‍රජාව දක්වන ප්‍රතිචාරය: ප්‍රතිග්‍රාහක ප්‍රජාව අභ්‍යන්තරව අවතැන්වූවන් තමන්ගේම අය නිසා සරණාගතයින්ට වඩා ඔවුන් කෙරෙහි වැඩි සානුකම්පික බවක් දක්වනු ඇත යන්න බොහෝ විට අනුමාන කෙරෙන්නක්, එහෙත් එය එලෙසම වෙතැයි කිව නොහැක.ප්‍රාදේශීය තත්වයන් සැලකිල්ලට ගත යුතු වනු ඇත.
- ආරක්ෂාව (මායිම් හි සිට හෝ ගැටුම් ප්‍රදේශවල සිට කිලෝ මීටර 50 ක්)
- පාසල් පිවිසුම් පහසුව
- සෞඛ්‍ය සේවාවනට සමීප බව.
- වෙළඳපොළ පහසුකම්
- මාර්ග, පාළම් හා පණිවුඩ හුවමාරු පහසුව
- ජල පහසුව
- ඉඩම්වලට පිවිසුම් පහසුව හා දර ඉන්ධන වැනි ප්‍රාදේශීය සම්පත්වලට පිවිසුම් පහසුව
- ගබඩා පහසුකම් හා ප්‍රදේශීය යටිතල පහසුකම්
- පූජනීය ස්ථාන, ක්‍රීඩා පිටි ආදී ප්‍රාදේශීය යටිතල පහසුකම් පරිහරනය
- එහා මෙහා යෑමේ බාධා විරහිත බව
- අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස-සංස්කෘතික අනන්‍යතාව පවත්වා ගැනීමට අවකාශය

**මේවා කිසියම් ප්‍රමුඛතාවක් අනුව පෙළ ගස්වා නොමැත. මේවායේ අදාල බව හා වැදගත්කම ස්ථානීයව වෙනස් වනු ඇත. ඒකාබද්ධ කමිටුවක් පිහිටුවා ඇත් නම් ඒ ඒ අවස්ථාවට සරිලන සේ මේ අවශ්‍යතා ප්‍රමුඛතාවක් අනුව පෙළගැස්වීම මැනවි. මේ එක් එක් කරුණක් සම්බන්ධයෙන් ඇතිකර ගත් සම්මුතින් පිළිබඳ පැහැදිලි අවබෝධයක් අදාල හවුල්කරුවන් විසින් ඇති කර ගත යුතුවෙයි.**


## කඳවුරු කළමනාකරුවකුගේ මූඛ්‍ය වගකීම්

**මේ කරුණු එකකට වත් කඳවුරු කළමනාකරුවකුට කෙළින්ම වගකීමක් නොමැති වුවද ඔහුට හෝ ඇයට ගිවිස ගත් තිරණ පරාමිතින් තුළ කටයුතු කළ යුතු වෙයි. ඒ නිසා ඇතිකර ගත් සියළු එකඟතාවන් පිළිබඳ පූර්ණ අවබෝධයක් ඔහුට හෝ ඇයට තිබීම අතිශය වැදගත් වෙයි.හැකි සෑම අවස්ථාවකම කඳවුරු හා සම්බන්ධ ගිවිසීම්වලදී මෙන්ම සැලසුම් කිරීම්හි දීද ඔහු හෝ ඇය සම්බන්ධ කර ගත යුතුවෙයි**

- ***ගිවිසුම්:*** කඳවුරු සම්බන්ධ සාකච්ඡාවන් හා සැලසුම් අවස්ථාවන්හිදී ඇති කර ගත් සියලු ගිවිසුම් පිළිබඳව යෝග්‍ය පරිදි දැනුවත්වීමේ වගකීම කඳවුරු කළමනාකරු හෝ කළමනාකාරිය වෙත පැවරෙයි.

- ***අවබෝධතා ගිවිසුම:*** කඳවුරු කළමනාකරණ ඒජන්සිය රජය සමග හෝ, යූඑන්එච්සී ආරය (UNHCR) හෝ වෙනත් මෙහෙයුම් ඒජන්සියක් සමග හෝ කඳවුරු කළමනාකාරක වශයෙන් තමාගේ වගකීම් විස්තර කෙරෙන අවබෝධතා ගිවිසුමකට අත්සන් තබා ඇත්දැයි ඔහු හෝ ඇය තහවුරු කර ගත යුතුය.

- ***අදාළ තොරතුරු:*** කඳවුරු සම්බන්ධ සාකච්ජා හා සැලසුම් පිළිබඳ අදාළ සියළු තොරතුරු රජයේ අධිකාරිය හෝ යූඑන්එච්සී ආරය (UNHCR) විසින් ඔහු හෝ ඇය වෙත ලබාදී ඇතිබව තහවුරු කර ගත යුතුය



ලයිබීරියාවේ අගනුවර මොන්රෝවියාව යන අභ්‍යන්තර අවතැන් වු ජනයා කඳවුර සැලසුම සත්කාරක රටේ සමීප සම්බන්ධතාව ඇතිව කළ යුතුය ඡායාරූප : හාන්ස් ක්‍රිස්ටියන් කනෙවලස්රූම් NRC

## ප්‍රතිග්‍රාහක (සත්කාරක) ප්‍රජාව සමග අවබෝධතා ගිවිසුමක් පිළියෙල කර ගැනීම,

කඳවුරු පිහිටුවීම සම්බන්ධයෙන් සියළු පාර්ශවයන්ගේ අයිතීන් හා වගකීම් පාලනය සඳහා අවබෝධතා ගිවිසුමක් පිළියෙල කර ගැනීම අත්‍යාවශ්‍යය. ඉහත සඳහන් එක් එක් කරුණක් සම්බන්ධයෙන් කඳවුරු ප්‍රජාවගේ අවශ්‍යතාද, ඒවා ප්‍රතිග්‍රාහක ප්‍රජාව කෙරෙහි බලපාන ආකාරය පිළිබඳවද, පොදු අවබෝධයක් ඇතිකර ගැනීමට ස්ථානීය ප්‍රජාව සමග සවිස්තරව සාකච්ඡා කළ යුතුය යෝග්‍ය සහ අවශ්‍ය පරිදි ගිවිස ගත් සියල්ල පැහැදිලිව අවබෝධතා ගිවිසුමෙහි සඳහන් විය යුතුය. අවබෝධතා ගිවිසුම පිළියෙළ කිරීම අදාළ තත්වය මත රඳා පවතියි.සාමාන්‍යයෙන් සරණාගත තත්වයන්හිදී වගකීම යුඑන්එච්සීආරය (UNHCR) හා රජය වෙත පැවරෙයි. අභ්‍යන්තර අවතැන්වීම් (IDP) තත්වයන්හි දී වගකීම අදාල රජයන් වෙතම පමණක් පැවරෙයි.

රජය, යුඑන්එච්සීආරය (UNHCR) අදාල වෙත් නම් ඉඩම් හිමියන් හා ස්ථානීය ප්‍රජාව ආදී විවිධ හවුල්කරුවන්: සමග ඇතිකර ගන්නා අවබෝධතා ගිවිසුම පිළියෙළ කර ගැනීමේදී කළමනාකාර ඒජන්සිය සහභාගි කරගැනීමෙන් සැබවින්ම වාසි රැසක් අත්කර ගැණීමට හැකිවෙයි. යෝග්‍යයැයි හැඟෙන කඳවුරු බිම් තෝරා ගැනීම සඳහා කෙරෙන මූලික සාකච්ජාවල අරමුණ වනුයේ අවතැන් වූ හෝ සරණාගත ජනගහණය කඳවුරුවලට පැමිණි විට අනාගතයේදී ඇතිවිය හැකි ගැටීම් නොරිස්සුම් හැකිතරම් දුරට අවම කර ගැනීමට තුඩුදෙන විදියේ ක්‍රියා මාර්ගයක් පාදාගැනීමයි.

---

### ▷▷▷ කඳවුරු කළමනාකරුගේ මුඛ්‍ය වගකීම්

---

- ***අවබෝධතා ගිවිසුම් පිටපත:*** රජය,/ යුන්එච්සීඅරය /ස්ථානීය ප්‍රජාව/ සමග ඇතිගර ගත් අවබෝධතා ගිවිසුමේ පිටපතක් කඳවුරු කළමනාකරු වෙත තිබිය යුතුය.අවබෝධතා ගිවිසුමක් නොමැති විට (සමහර විටක අභ්‍යන්තර අවතැන්වීම් තත්ව යටතේ) අවබෝධතා ගිවිසුමක් සකස්කිරීමට අදාල වගකිවයුතු ඒජන්සින් පෙළඹවිය යුතුය.

- **අවබෝධතා ගිවිසම පිළිබඳ කාර්ය මණ්ඩලයේ අවබෝධය: කඳවුරු කාර්ය මණ්ඩලයේ සියල්ලන් තුලම අවබෝධතා ගිවිසුම පිළිබඳ මනා අවබෝධයක් ඇති බවට කළමනාකරු සහතික විය යුතුය**

- ***අවබෝධතා ගිවිසුම පිළිබඳව කඳවුරු ප්‍රජාවගේ අවබෝධය.*** අදාල අංගයන් පිළිබඳ නිසි අවබෝධයක් ඇතිකර දීම සඳහා හැකි සෑම විටම අවබෝධතා ගිවිසුම් සම්බන්ධ සාකච්ජාවලට කඳවුරු ප්‍රජා නායකයින් සහභාගි කර ගත යුතුය.

## ප්‍රතිග්‍රාහක හෙවත් සත්කාරක ප්‍රජා ප්‍රතිලාභ

සත්කාරක ප්‍රජාවට අත්වන ප්‍රතිලාභ කවරේදැයි නිශ්චයය සඳහා අවබෝධතා ගිවිසුම පිළියෙළ කිරීමේ එක් අංගයක් වශයෙන් සලකා සාමාන්‍යයෙන් රජය හෝ මෙහෙයුම් ඒජන්සිය විසින්

මැදිහත්වීම පවරා ගනු ඇත. සංස්කෘතික සම්මතයන් සහ එක් එක් ප්‍රදේශයට සුවිශෙෂවූ තත්වයන් අනුව ප්‍රජාවට හිමිවන වන්දි හෝ ප්‍රතිලාභවල ස්වභාව බොහෝ සේ වෙනස් විය හැක.

### වන්දි පැකේජ පිළිබඳ උදාහරණ

සියරාලියෝන්හි විවිධ මාර්ග ගනු ලැබිනි.

- බෝ දිස්ත්‍රික්ක සත්කාරක ප්‍රජා කඳවුරු සමාජ කාර්යසාධන ජාතික කොමිසම හා සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කළ සංවර්ධන දිරිගැන්වීම් වෙනුවෙන් ඇමෙරිකන් ඩොලර 20,000 ක් ලබා ගති.
- ප්‍රජාවට බැහැරින් තිරණය කරනු ලැබූ ප්‍රජා සංවර්ධනයන් මගින් කෙනෙමා දිස්ත්‍රික්කයේ සත්කාරක ප්‍රජා කඳවුරු ප්‍රතිලාභ ලබාගති.

අනුගමනය කළයුතු වැදගත් මූලධර්මයක් නම් ගිවිසගන්නාවූ වන්දි පැකේජ කඳවුරුවාසීන් හා සත්කාරක ප්‍රජාව හා සේවා සපයන්නන් අතර බිඳවීම් හෝ අමනාප කම් ඇතිනොකිරීමට හේතුවන තරමට පරස්පරතාවලින් තොර සමතාවකින් යුතුවීමයි.

වන්දි පැකේජ පැහැදිලිවම අවබෝධතා ගිවිසුමේ හෝ ඇනෙක්සයක (ඇමුණුම් ලේඛණයක) සඳහන් විය යුතුය.

### ▷▷▷ කඳවුරු කළමනාකරුගේ මුඛ්‍ය වගකීම.

- ***වන්දි ගිවිසුම්:*** ස්ථානිය ප්‍රජාව සමග ඇතකරගත් වන්දි ගිවිසුම් පිළිබඳව සම්පූර්ණ අවබෝධයක් කඳවුරු කළමනාකරුට හා ඔහුගේ හෝ ඇයගේ කාර්ය මණ්ඩලයට තිබිය යුතුය.
- ***ප්‍රතිලාභ සම්පාදනය කළමනාකරණය හා බෙදා හැරීම:*** සමහර තැන්හි මේ ප්‍රතිලාභ සැපයිම, කළමනාකරණය, සහ බෙදා හැරීම සම්බන්ධ වගකීම කඳවුරු කළමනාකරණ ඒජන්සියට පැවරෙනු ඇත.මේ වගකිම බුද්ධිමත්ව භාවිත කිරීමට කඳවුරු කළමනාකරණය කැපවී සිටියි. බොරු අපෙක්ෂා ඇතිකිරීම හෝ ගිවිසුම් වක ගැසිම හෝ අශුභදායක ප්‍රශ්ණ ඇති කරයි.

**ස්ථානියව පවත්නා සිරිත් විරිත් අනුගමනයෙහි වැදගත්කම:**
සියරාලියෝන්හි ජෙම්බේ කඳවුරෙහි අවතැන්වූවන් නියෝජනය කරන්නෙක් ප්‍රදේශීය නායකයා විධිමත් ලෙස බැහැ දැක චාරිත්‍රානුකූලව කෝලා ඇට පිළිගන්වන තෙක් අවතැන්වූවන් කඳවුරට ගෙන ඒම එම ප්‍රාදේශීය නායකයා අනුදුටුවේ නැත.

- ***හවුල් කමිටු:*** යෝග්‍ය හැම තැනකදීම අදාල පොදු කරුණු සාකච්ඡාවට භාජන කළ හැකි වේදිකාවක් ලෙස උපයෝගි කර ගත හැකි වනසේ හවුල් කමිටු පිහිටුවා ගත යුතු

- ***සත්කාරක ප්‍රජා සම්බන්ධතා නිලධාරී:*** නියෝජන කාර්ය සඳහා සත්කාරක ප්‍රජා සම්බන්ධතා නිලධරයෙක් පත්කර ගත හැකිය. එසේත් නොමැති නම් අවධානය දිය යුතු පොදු කරුණුවලට යොමු වීම සඳහා විකල්ප ප්‍රජා/කඳවුරු සම්බන්ධතා ක්‍රම වේදයක් ස්ථාපිත කළ හැක.

- ***අයිතීන් හා වගකීම් ප්‍රවර්ධණය:*** ආරම්භයේ සිටම එක් එක් හවුල්කරුවන් එකිනෙකාගේ සුවිශේස රැකවරණ තත්වයන් කෙබඳුදැයි දැන ගත යුතුය, මේ සම්බන්ධ සාකච්ඡාවලට අවතැන්වූවන් සහ සරණාගතයින් මුල සිටම සහභාගිකර ගත යුතුවෙයි. මන්ද අවතැන් හෝ සරණාගත තත්ව නිසා ඔවුන්ට හිමි අයිතීන් කෙබඳුද යන්න ගැන නිසි අවබෝධයක් ඔවුන් ලැබිය යුතු හෙයිනි. ඒ අතරම ඔවුන්ටද වගකීම් ඇතැයි පිළිගත යුතු අතර ඔවුන්ගේ සත්කාරකයින්ගේ අයිතීන් හා වගකීම් ද ඔවුන් පිළිගත යුතුය.පොදු අවබෝධයක් ඇතිකර ගැනීමට ගන්නා උත්සාහයනට ධෛර්ය දිය යුතුය. මෙවැනි දිරි ගැන්වීම් කළ යුත්තේ රජය,ස්ථානිය ප්‍රජාව සහ අවතැන්වූ ප්‍රජාවගේ නායකයන් සමග හවුල්වය.



කඳවුරක පිහිටීම ඉතාමත්ම වැදගත් මුළු බිම නිතරම හොඳම නොවේ ජෝර්දනයේ රොමාෂිඩ් කඳවුරේ මුළු සරණාගතයෝ නිරායාශයෙන්ම පාර අයිනක පදිංචි වුහ ජායාරූපය ක්නම් ඒනර් NRC

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ මුඛ්‍ය වගකීම්.

- ***සත්කාරක/කඳවුරු ප්‍රජා සබඳතාම්:*** ස්ථානිය සිරිත් විරිත් අනුව රිසි නිසි විධිමත් මුණගැස්විම් ආදිය මගින් සත්කාරක හා කඳවුරු ප්‍රජාව අතර ඵලදායි සුහද සබඳකම් ඇතිකර ගැනිම සඳහා කළමනාකාර කණ්ඩායම මැදිහතෙක විය යුතුය.

- ***සත්කාරක හා කඳවුරු ප්‍රජාවන්ට සාකච්ජා වේදිකාවක් සැලසීම:*** ස්ථානියව තෝරාගත් ප්‍රජා හා කඳවුරු සම්බන්ධීකරණ නිලධාරීන් මගින් යෝග්‍ය වෙත්නම් මෙවැන්නකට සහාය වීම වැනවි.

- ***අයිතින් හා වගකීම් ප්‍රවර්ධනය:*** කඳවුරක් පිහිටුවා පවත්වා ගන යන විට කඳවුරු ප්‍රජාවගේ අයිතිවාසිකම් හා වගසීම් පිළිබඳ නිසි දැනුවත් කිරීමක් ඇතිකිරීමට කඳවුරු කළමනාකරණ ඒජන්සිය වගබලා ගත යුතුය.

**බලවත් කිරීම් පිළිබඳ අභියෝග.**

තිරණ ගැනිම් ක්‍රියාවලින්හිදි අවතැන් වූ ප්‍රජාව මුළුවනින්ම සහභාගි කර ගැනීම අතිශය වැදගත් වෙයි. එසේ වුවද ඔවුන්ගේ අපේක්ෂාවන් ඉටුකරලීම අභියෝගයක් වෙයි දේශපාලන, ආරක්ෂක හා සංවිධානමය හේතුන් නිසා අපේක්ෂිත පරමාදර්ශී තත්වයන් ඇතිකර ගැනිමට අපහසු අවස්ථා හැමවිටම පැවතෙනු ඇති බැවින් සම්මුතින්ට එළෙඹීම අවශ්‍ය වෙයි ඉදිරිපත්ව ඇති ගැටළු පිළිබඳ පැහැදිලි අවබෝධයක් නැති මුල් අවස්ථාවන්හිදි අවතැන්වූ ප්‍රජාවගේ නියෝජිතයින් සාකච්ජාවලට සහභාගි කර ගැනිමෙන් තිරණ ගැනිමේ ක්‍රියාවලින් අතර මග අත්හිටීමේ අවදානමකට මුහුණ පානු ඇත, අවතැන්වූවන් තිරණ ගැනිම් සඳහා වූ සාකච්ජා ක්‍රියාවලියට සහභාගිකර ගන්නා අවස්ථාව තිරණාත්මක වන අතර ඒ පිළිබඳව නිසි තිරනයක් ගත හැක්කේ ස්ථානිය තත්වයන් අනුවය.

අයැදුම් කළ ඒජන්සින්ගේ යෝග්‍යතාව තිරණය කිරීමේදී තේරීම් අධික්ෂණ කමිටුව විසින් ඉල්ලා සිටිය හැක

*3. සම්පත් තිබීම*

කඳවුරු අඛණ්ඩව පවත්වා ගන යාමට අවශ්‍ය තරම් මුල්‍ය,සංවිධාන හා පිරිස් සම්පත් IDP කඳවුරු කළමනාකරණය අපේක්ෂා කරන ඒජන්සින් වෙත තිබිය යුතුය.කඳවුරු කළමනාකරණ වගකීම් සපුරා ලිම සඳහා අතිරේක ප්‍රදානකාරක සහාය අවශ්‍යවෙතැයි යන්න පිළිබඳ මතභේදයක් නැත.

*4. කළමනාකරණ කුසලතා*

තරක්වන කණ්ඩායම් හෝ ඒජන්සි සමග ගනුදෙනුකිරීමේ හැකියාව, බෙදාහැරීම් කළමනාකරණය හා අධික්ෂණය හා අවශ්‍ය ලිපි ලේඛණ පවත්වා ගන යාම ආදියද ඇතුලත් ශක්තිමත් කළමනාකරණ හැකියාවක් ඒජන්සිය සතුව තිබිය යුතුය.

*5. IDPs යන්ගේ සමාජ සංස්කෘතික හරයන් පිළිබඳ දැනිම.*

සමාජ සුසංගමය පවත්වා ගැනිම හා අවදානම්වලට ලක් විය හැකි කණ්ඩායම්වල සුබ සාධනය හා රැකවරණය හා ආරක්ෂාවද සම්බන්ධ ප්‍රශ්ණද ඇතුලුව ලයිබීරියානු සමාජ සංස්කෘතික හරයන් පිළිබඳ නිරවුල් අවබෝධයක් ඒජන්සින් වෙත තිබිය යුතුය.

*6. ප්‍රජා සහභාගිත්වයට අනුබල දීම*

කඳවුරු කළමනාකරණ කණ්ඩායමට තොරතුරු දැන්වීමට හා සහාය දැක්වීමට IDP යනට හැකිවන සේ ප්‍රජා සහභාගිත්වයනට සහාය වීමේ අත්දැකීම් ඒජන්සිය වෙත තිබිය යුතුය.

*7. අධික්ෂණය*

කාර්යක්ෂම අධික්ෂණය හා දායක ආයතනවලට පසුපෙවුම් සැපයිම කඳවුරු කළමනාකරණ මෙහෙයුම් ඒජන්සියක් විමට සුදුසු විම සඳහා වැදගත් සාධකයක් වෙයි

*8. වාර්තාකිරීම්*

කරගන යන්නාවු සියලු කාර්යයන් සම්බන්ධයෙන් කාලින වාර්තා සැපයිමේ හැකියාව IDP කඳවුරු කළමනාකරණය සඳහා සලකා බැලිමට පූර්ව අවශ්‍යතාවකි.

*9. ගැටුම් නිරාකරණ අත්දැකිම.*

ගැටුම් එදිනෙදා පිවිතයේ අංගයෙකි. විටෙක අනර්ථකරවුවද සමහර විටෙක නවිකරණයනට යොමු කෙරෙන නිසා ඒවා උවමනා වෙයි. කඳවුරු වල දිවි ගෙවන IDP යනගේ ශුභසාධන කටයුතු සඳහා මෙහෙයුම් ඒජන්සියකට ගැටුම් නිරාකරණ හැකියාවන් තිබිම වැදගත් හා අවශ්‍ය ගුණාංගයෙකි.

# ලයිබීරියාවේ IDP යන්ගේ කළමනාකරණය හා සම්බන්ධීකරණය. මෙහෙයුම් ඒජන්සි සඳහා යොමු හා නිර්ණායක.

## UNOCHA - Liberia නොවැම්බර 2003 (කෙටුම්පත)

ලයිබීරියාවේ IDP යන්ගේ කළමනාකරණය හා සම්බන්ධීකරණය.
මෙහෙයුම් ඒජන්සි සඳහා යොමු හා නිර්ණායක.

### හැඳින්වීම

අවුරුදු 13කටත් අධික කාලයක් තිස්සේ ලයිබීරියාවේ පැවති යුද්ධය නිසා සිවිල් ජනතාවෙන් අති විශාල පිරිසක් අවතැන්වීමක් වූ. මොවුන් ගෙන් වැඩි දෙනෙක් රටේ විවිධ පළාත්වල වෙසෙති.සහාය හා රැකවරණ අවශ්‍ය අභ්‍යන්තර අවතැන්වූවනට (IDP යනට) පිළිසරණ සැපයීමට මානව ශුභසාධන ප්‍රජාව ලයිබීරියානු රජයට ආධාර උපකාර සැපයේ. ඍජ වාසයන්හි කෙරෙන මැදහත්වීම් අඩු තරමින් අවශ්‍ය අවම තත්වයන්ට අනුරූප වීමත් අවතැන්වූ ලයිබීරියානුවන් ගේ ගෞරවය හා ශුභසාධනයටත් ආරක්ෂාව තහවුරු කිරීමටත් තුඩු දෙන පරිසරයක් නිර්මාණය කර පවත්වා ගැනීමටත් අභ්‍යන්තර අවතැනුන් සම්බන්ධයෙන් එක්සත් ජාතීන් සැකැසූ ප්‍රතිපත්ති මාලාවට අනුකූලව කටයුතු මෙහෙයවීමේ වැදගත් කමත් ලයිබීයාවේ හා වෙනත් තැන්හි අත්දැකීම් ඉස්මතුකරයි. කොටින්ම එක්සත් ජාතීන්ගේ ශුභසාධන ප්‍රඥප්තිය, අභ්‍යන්තර අවතැන්වූවන් සම්බන්ධ ඒක්සත් ජාතීන්ගේ උපදෙස් මාලාව හා වෙනත් ජාත්‍යන්තර සම්මුතීන් යටතේ සඳහන් අයිතීන් හා නිදහස, අභ්‍යන්තර අවතැන්වූවන් එක සමානව විඳිය යුතුය. අභ්‍යන්තර අවතැනුන්වූ වනට සහාය සඳහා වූ සියලු ශුභසාධන කාර්ය හා සම්බන්ධ මූලික ප්‍රතිපත්ති තුනට, ගෞරවාන්විතව ජීවිතය පවත්වා ගැනීම, සටන් වැදියන් හා සටන් නොවැදියන් අතර වෙනස පැහැදිලිවම පවත්වා ගැනීම, තමන්ගේ ජීවිතයට ආරක්ෂාවට, සෞඛ්‍යයට හා නිදහසට තර්ජන එල්ල විය හැකි ස්ථාන වලට බලෙන් පිටත්කර යැවීමෙන් වැළැක්වීමද ඇතුලත් වෙයි,

අභ්‍යන්තර අවතැන් කඳවුරුවල මානව ශුභසාධන මැදහත් වීම් ලයිබීරියානු සරණාගත ආපසු යැවීම් හා නැවත පදිංචිකිරීම් සම්බන්ධ කොමිසම (LRRRC) සමග සමීප සහයෝගිතාවකින් කටයුතු කරන මතුවට මෙහෙයුම් ඒජන්සිය යනුවෙන් නම් කෙරෙන, නිපුණ මානව ශුභසාධන ඒජන්සියක් මගින් කළමනාකරනය හා සම්බන්ධීකරණය වියයුතුයි. මෙයට යෝග්‍ය කඳවුරුබිම් තෝරාගැනීම, ජලය, සෞඛ්‍යය, පාරිසාරික සනිපාරක්‍ෂාව, නිවහන්. ආහාර, අධ්‍යාපනය රැකවරණ හා ආරක්ෂාව ආදී මූලික අවශ්‍යතාද ඇතුළත් පුළුල් පරාසයක වගකීම් රාශියක් වෙයි.කඳවුරක දෛනික කටයුතු පවත්වාගන යාම සඳහා මෙහෙයුම් ඒජන්සිය වගකීම් දරණ අතර වෙනත් රාජ්‍ය නොවන සංවිධාන මගින් පවත්වා ගනු ලබන ආංශික මැදහත්වීම් සම්බන්ධයෙන්ද වගකිව යුතු වෙයි. මෙහෙයුම් ඒජන්සිය පහත සඳහන් කරුණුවලට අවධානය දිය යුතුය

**ජල පහසුව:** බාලයන් කාන්තාවන් ආදීනටද පරිහරනය කළ හැකි වනසේ අවතැන්වූවන්ට බිමට ඉවුම් පිහුම් වලට නැමට සේදීම් ආදියට සෑහෙන පමණ ජලය නොකඩවා ලැබෙන සේ අවශ්‍ය කටයුතු සැලසිය යුතුය.

**පාරිසරික සනීපාරක්ෂාව:** පාසල් හා සායන සඳහා සනීපාරක්ෂක පහසුකම් ද ඇතුලුව සෞඛ්‍ය අධ්‍යාපනය හා සනීපාරක්ෂක වැඩසටහන් වලට සහභාගි වීමේ අවස්ථාද, කරාම හා වොෂ් බේසින් වටා වැනි ජලය පරිහරනයට වෙන්වූ තැන් වල නිසි ජල අපවහන පහසුකම්ද අවතැනුන්ට විවෘතව ඇති බවට මෙහෙයුම් ඒජන්සිය සහතික විය යුතුය.නිතිපතා සබන් සැපයීමත් අපද්‍රව්‍ය එක් රැස් කිරීම,ප්‍රවහනය, ඉවත් තිරීම සඳහා නිසි ක්‍රියා මාර්ග සැලසීම තහවුරු කළ යුතුය. තමන්ගේ ආරක්ෂාව පිළිබඳව වකිතයක් නැතුව ළමයින්ට හා කාන්තාවන්ට පාවිච්චි කල හැකි වන තැන් වල වැසිකිළි තනා ආලෝක කළ යුතුය. සංස්කෘතිය හරයනට සැලකිලිමත් වීම් වස් වැසිකිලි සැලසුම් කිරීමේ දී හා තැනීමේදී කාන්තාවන්ගෙන් නිසි උපදෙස් ලබා ගත යුතුය. වැසිකිළි පාවිච්චියෙන් පසු යොග්‍ය පුද්ගල සනීපාරක්ෂා පුරුදු පවත්වා ගැනිමටද ඇතුලුව සනීපාරක්ෂක පහසුකම් සඳහා වූ ස්ථාන නඩත්තුව හා පිරිසුදු කිරීම ආදියටද ප්‍රජා සහභාගිත්වය සඳහා පහසුකම් ඇතිකිරීම හා උනන්දුකරවීමද මෙහෙයුම් ඒජන්සිය විසින් කළ යුතුය.

**තාවකාලික නිවහන්:** ඉඩකඩ හා පෞද්ගලික බව සුරැකෙන තරමට ප්‍රමාණවත් නිවහන් සහතික කිරීමේ වගකීම මෙහෙයුම් ඒජන්සිය වෙත පැවරෙයි. තම දරුවන්ගේ වර්ධන අවශ්‍යතා සපුරා ගැනීමටත් ගෞරවාන්විතව දරුවන් ඇති දැඩි කර ගැනීමටත් සෑහෙන පමණට එහා මෙහා යෑමේ නිදහස දෙමාපියනට තිබිය යුතුය.

**ආහාර:** ආහාර සැපයීම් සම්බන්ධ ඒජන්සීන් සමග සහයෝගය ඇතිව ඇවතැන්වූ ජනගහනයට සෑහෙන පමණ යෝග්‍ය ගුණයෙන් යුත් ආහාරද, අහර පිස ගැනීම සඳහා භාජන හා ඉන්ධනද ලබා දීමට මෙහෙයුම් ඒජන්සිය සහතික විය යුතුය.මෙහෙයුම් ඒජන්සිය යෝග්‍ය සහකරුවන් හා සමග සහයෝගය ඇතිව කාර්යක්ෂමව අහර බෙදා හැරීම හා අධීක්ෂණ ක්‍රියාවලින් ද තහවුරු කළ යුතුය කාර්යක්ෂම පෝෂණ අධීක්ෂණය සඳහා යෝග්‍ය යන්ත්‍රණ ක්‍රම වේදයන් ද ඇති බවට මෙහෙයුම් ඒජන්සිය සහතික විය යුතුය,මවුකිරි දීම සඳහා දිරිගැන්විය යුතු අතර බෝතල වලින් කිරි පෙවීම අධෛර්ය කළ යුතුය.

**සෞඛ්‍ය සේවා: සෞඛ්‍ය සේවා සැපයීම් හා වසංගත රෝග අධීක්ෂණ ක්‍රම නිසි පරිදි පවත්වා ගැනීම මෙහෙයුම් ඒජන්සිය මගින් සහතික කළ යුතුය. ඒ**

අ) වයස මාස 06 යේ සිට පස් අවුරුදු වයස් දරුවනටත් (කිසියම් හෙයකින් එන්නත් ආවරණය නිසි පරිදි නොලැබී ඇත්නම් වයස 12 දරුවන්ටත්) මාස නවයේදී වර්ධක එන්නත ඇතුලුව සරම්ප ප්‍රතිශක්තිකරණය ලබාදීම

ආ) සෑහෙන පමණ පානීය ප්‍රතිස ජලන දියර (ORS) තබා ගැනීමත්, අවශ්‍ය වෙතොත් විජලනයට භාජන වුවනට කඩිනමින් ප්‍රතිකාර කිරීම සඳහා මධ්‍යස්ථාන ඇතිකිරීමෙන් ප්‍රතිසජලන සත්කාරයට (ORT) අනුබල දීම ,

ඇ) ළමයින්ගේ විටමින් ඒ ඌනතා ආබාධයන් කඩිනමින් හඳුනා ගැනීමත් ප්‍රතිකාරක කිරීමත් සඳහා යාන්ත්‍රණයන් ඇතිකර පවත්වා ගැනීමටත්,යෝග්‍ය විටමින් ඒ ඌනතා නිවාරක ප්‍රතිකාර සැපයීම,

ඈ) ගැබිනි හා මවුකිරිදෙන මවුවරුන්ගේ සෞඛ්‍ය අධීක්ෂණය ගැබිනි මවුවරුන් සඳහා ටෙටනස්වාරක ප්‍රතිශක්තිකරණය, මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා, ළමයින් අතර සුලභ රෝගවලට ප්‍රතිකාර කිරීම, ප්‍රතිශක්තිකරණය, ප්‍රජා සෞඛ්‍ය සේවකයින් හා පාරම්පරික වින්නඹු සේවිකා පුහුණුව, සක්‍රිය සෞඛ්‍ය හා සනීපාරක්ෂ පවුල් සංවිධාන සේවා. සෞඛ්‍ය අධ්‍යාපන සඳහාවූ ප්‍රාථමික සෞඛ්‍යරක්ෂා සේවා, අවතැනුන්ට (IDP යනට) විවෘත කර දීම.

ඉ) ළමා හා නව යොවුන් සෞඛ්‍ය අවශ්‍යතා සපුරා ලන සෞඛ්‍ය සේවා හා

ඊ) පොදු සෞඛ්‍ය වැදගත්කමක් ඇති රෝග වැළැක්වීම හා පාලනය සඳහා උපකාරක අධ්‍යාපන හා වෙනත් පියවර හා ළමා හා නව යොවුනන්ට බලපාන සම්ප්‍රදායක සෞඛ්‍ය පුරුදු වෙනුයෙන් නිසි පියවර ගැනීම සඳහා වෙයි.

**අබාධ වැළැක්වීම හා ඒවාට ප්‍රතිකාර කිරීම:** අබාධිත පවුල් වලට තම පවුල් සාමාජිකයන්ගේ සුවිශේෂ අවශ්‍යතා සපුරා ගැනීමට උදව් වීමක් වශයෙන් ආබාධිතයන් හඳුනා ගැනීමත්, ආබාධිතයන්ගේ ආබාධවල ස්වභාවයත් ප්‍රමාණයත් නිශ්චය කර ගැනීමත් යෝග්‍ය ආධාර සැපයීමත් සහතික කිරීමට මෙහෙයුම් ඒජන්සිය උත්සුක විය යුතුය .

**රැකවරණයට තර්ජන හා ආරක්ෂාව:** අවතැන් කඳවුරුවල ආරක්ෂාවට එල්ලවන තර්ජන වල ස්වභාවය හා මට්ටම නිශ්චය කරගැනීමට මෙහෙයුම් ඒජන්සියට හැකි විය යුතුය. කඳවුරු වාසීන්ගෙන් කෙනෙක් මිය ගිය හොත් මරණයට හේතුව තහවුරු කර ගත යුතු අතර වළක්වා ගත හැකි මරණ වළක්වා ගැනීම සඳහා නිසි පියවර ගත යුතුය, කඳවුරුවාසීන් කායික හෝ ලිංගික අතවරවලට, හිංසාවලට, පැහැර ගැනීම්වලට හෝ යුද සේවාවලට බඳවා ගැනීම් ආදියට භාජන නොවීම සහතික කිරීම සඳහා පිළිගත් උපදෙස් මාලාවට අනුකූලව එකඟවූ පරිදි මෙහෙයුම් ඒජන්සිය පියවර ගත යුතුය.

**අධ්‍යාපන අවස්ථා:** කඳවුරු කළමනාකරණ කණ්ඩායම් හා අධ්‍යාපන සේවා සපයන ඒජන්සීන් සමග සහයෝගයෙන්, අවතැන්වූවන්ගේ අවශ්‍යතාවලට සරිලන ගුණාත්මක ප්‍රාථමික, පශ්චාත් ප්‍රාථමික හා නොවිධිමත් අධ්‍යාපන අවස්ථා සැපයීම මෙහෙයුම් ඒජන්සිය අධීක්ෂණය කළ යුතුය. අධ්‍යාපන විශෙෂඥයකුගේ සේවය ලබාගන වරින් වර අධ්‍යාපන අවශ්‍යතා හා සම්පත් තක්සේරුකර මනා ලෙස

සකස්කර ගත් අධ්‍යාපන සැලැස්මක් ක්‍රියාවට නැගිය යුතුය.ළමා අධ්‍යාපන සාධනයන් සඳහා සහතික පිරිනැමිය යුතුය.

**භාරකරුවන් නැති ළමයි:** ළමයින් සම්බන්ධයෙන් කටයුතු කරන කේන්ද්‍රිය විශෙෂඥ ඒජන්සින් සමග සහයෝගයෙන් භාරකරුවන් රහිත ළමයින් හඳුනාගැනිමට ලේඛනගත කිරීමට හා ඔවුන්ට සහාය විමට අවශ්‍ය සේවා ඇති කිරීම මෙහෙයුම් ඒජන්සිය තහවුරු කළ යුතුය, පවුල් විසිරී යෑමේ හේතු හඳුනාගෙන පවුල් එකමුතුව රැකගැනිමට අවශ්‍ය ප්‍රතිපියවර සකස් කර ගත යුතුය. භාරකරුවන් නොමැති ළමයින් සඳහා නිතිමය භාරකාරත්වයක් හෝ ඒ හා සමාන තත්වයක් ලබාදීමට යෝග්‍ය වැඩ පිළිවෙලක් ඇති කළ යුතුය. ඊට අමතරව රැකවරණ අවශ්‍යතා නිගමනයටත් යෝග්‍ය බාරකාර වැඩ පිළිවෙලවල් පහසුකිරීමටත්, ඵලවත් හා කාර්යක්‍ෂම පවුල් පිය සටහන් සෝදිසි වැඩ සටහන් අරඹා ක්‍රියාත්මක කිරීමටත් සෑහෙන ළමා රැඳවුම් සේවා ලබාදිය යුතුය. භාරකරුවන් රහිත ළමයින් පිළිබඳ සම්පූර්ණ වාර්තා ආරක්ෂා කොට සුරක්ෂිතව තැන්පත්කොට තබා ගත යුතුය.

**කඳවුරු වසා දැම්ම සහ ලේඛණකරණය:** ස්වේච්ඡා හා සැලැසුම් ගතව ආදි දෙආකාරයෙන් මුල් ගම් හෝ තෝරාගත් වාසස්ථානය කරා යෑම සඳහා සැලැසුම් සකස් කිරීමේදි අවතැන්වුවන් සහභාගිකරවා ගැනිමද ඇතුළුව මූලික කාර්ය මෙහෙයුම් ඒජන්සිය සම්පාදනය කළ යුතුය. භාරකරුවන් නොමැති ළමයින් වයස්ගතඵවන් ගැබිනින් හෝ කිරිදෙන මවුන් වැනි අවදනම් ගෝචර කණ්ඩායම් වල විශේෂ අවශ්‍යතා හැම සැලැසුම් කිරීමකදිම සැලකිල්ලට ගත යුතුය. සම්පූර්ණ අවතැන් ජනගහනය වෛද්‍ය පරීක්ෂණයනට භාජන කිරිම ගැනද අවදනය දිය යුතු අතර රෝගිවුවන්ගේ වෛද්‍ය වර්තා පිටපත් ඔවුන්ගේ පවුල්වලට ලබාදිම යුතුය.

**කඳවුරු කමිටු පිහිටුවිමට අනුබල දීම:** මෙහෙයුම් ඒජන්සිය අනෙක් සහකරුවන් සමග සහයෝගයෙන් අවතැන්වුවන් අතර ඇතිවන සුළු ආරවුල් සමථයට පත්කිරීමද ඇතුළුව කඳවුරේ සාමාන්‍ය භූභ සාධනය හා සාමකාමී පැවැත්ම සඳහා සහායට අවතැන්වුවන්ගේ නියෝජනය ඇති කමිටු පිහිටුවා ගැනිමට උර දිය යුතුය.

**වගකීම්දැරීම:** කඳවුරු කළමනාකරණයට අදළ නිවැරදි හා කාලින තොරතුරු තබාගැනිමට **මෙහෙයුම් ඒජන්සියෙන් අපේක්ෂාකෙරෙයි. IDP කමිටු හෝ / හා IDP කාර්ය සාධන කණ්ඩායම් වැනි පිළිගත් අන්තර් ඒජන්සි සම්බන්ධිකරනයන් වෙතව නිතිපතා වාර්තා සැපයිය යුතුය.**

# 2 කඳවුරු පිහිටුවීම, රක්ෂණය සහ නඩත්තුව.



සියරා ලියෝන්හි ජෙම්බෙ කඳවුරේ අළුතින් පැමිණි ලයිබීරියානු සරණාගතයින් ඔවුන්ගේ නව නිවාසස්ථාන ඉදිකිරීමට පෙර එකිනෙකාට උදව්වීම ඡායාරූපය : එඩුවාර්ඩ් කොම්ස්ටිතෙ වර්දගුවර්

# පරිච්ඡේදය 2 : කඳවුරු පිහිටුවීම, රක්ෂණය සහ නඩත්තුව.

## හැඳින්වීම

කඳවුරක් සැලැසුම් කිරීමේ මූලික පරමාර්ථය සුරක්ෂිතව, රැකවරණ ඇතිව, ගෞරවයෙන් යුතුව අවතැන්වූවන්ට ජීවත්විය හැකි තැනක් සකස්කර දීමයි. හොඳ කඳවුරුක් සකස්කිරීම බහු ශිල්පීය ප්‍රයත්නයකි. කඳවුරු ස්ථානයක් සංවිධානයේ මුල් අදියරයන්හි ශක්තිමත් ගිවිසුම් ඇති කර ගැනීමේ හැකියාවන්.. සෞඛ්‍ය,,ජලය, විධික්‍රම ,අධ්‍යාපනය, ප්‍රජා සේවා,පාරිසරික පවිත්‍රතාව, ආදි සුබසාධන සේවාවන් පිළිබඳ මනා ප්‍රායෝගික දැනිමක් හා බැඳුනු ශිල්පීය දක්ෂතාවන් තිබීම අත්‍යාවශ්‍යවෙයි. සරණාගත තත්වයකදී බිම සෝදිසි කාර්ය හා සමස්ත සැලසුම් සම්පාදනය සඳහා මූලිකත්වය UNCHRය ගනියි. හදිසි සරණාගත පතනයක් සඳහා සූදානමෙන් සිටින අතර හැකියා ඇති කඳවුරු කළමනාකරන ඒජන්සියක් හඳුනාගැනීමටත් කලින්ම බිම් පිඹුරු සැලසුම් කිරීම අරඹයි. ඒජන්සිය පසු අදියරක එන අතර ඒවකටත් සකස් කරණ ලද සැලසුම් ක්‍රියාත්මක කරණු ඇත. බොහෝවිට IDP / තත්ව වලදී බිම තෝරා ගැනිම කඳවුරු සැලසුම් සම්පාදනය හා සංවිධානය සඳහා වඩා පුළුල් කාර්ය භාරයක් කළමනාකරන ඒජන්සියට පැවරෙනු ඇත.

හදිසි ආපදා තත්ත්වයේ ස්වභාවයත් කඳවුරු කළමනාකරන ඒජන්සිය සිය වගකිම් කොපමණ ඉක්මනින් භාර ගන්නේ ද යන්නත් අනුව නීතිමය හා බිම සැකැසුම පිළිබඳ සැලැසුම් කිරිම හා තිරණ ගැනිමට සම්බන්ධ පුද්ගලයින් වෙනස්වනු ඇත. සාමාන්‍ය වශයෙන් සම්බන්ධ විය හැක්කන් නම් ප්‍රාදේශිය ආයතන වල නියෝජිතයන්,සත්කාරක ප්‍රජාව,අදාළ එක්සත් ජාතින්ගේ ඒජන්සින්.සේවා සපයන්නන්,සහ අවතැන්වූවන්ගේ නියෝජිතයින් වනු ඇත. ස්ථානයේ මිනුම් කාර්ය, ගෙවල් සැලසුම් කිරීම යටිතල පහසුකම් සහ කඳවුරේ අනෙක් අංගෝපාංග සැලසුම්, කිරීම මේ ඒජන්සින් අතර බෙදා ගෙන කෙරෙන හවුල් කටයුත්තක් වනු ඇත. මේ ක්‍රියාවලයට කඳවුරු කළමනාකරුගේ දායකත්වය අවශ්‍යවන අතර එය හැම විටම සැලකිල්ලට ගත යුතුය. කොහොම උනත් සැලසුම් ක්‍රියාවලියේ මුල් අවදියේ ගන්නා ලද සියලු තිරණ පසුකාලිනව ප්‍රතිඵල දියි හැකි වීමෙන් ඒවා කළමනාකරුගේ වගකිම් වීමට ඉඩ ඇත. කෙසේ වෙතත් බොහෝවිට කළමනාකරණ ඒජන්සිය එන්නේ සැලැසුම් සකස්කිරීමේ ක්‍රියාවලිය බොහෝදුරට සම්පූර්ණ වූවාට පසුවය.මෙහෙයින් මේ කොටසේ දක්වනු ලබන මුඛ්‍ය වගකිම් කඳවුරු කළමනාකරණ ඒජන්සියේ සහභාගිත්ව මට්ටම හා කාලිනබව හා බැඳේ ,කඳවුරු පිහිටුවිම හා සැලසුම් කිරීම්හි සියලු අංගවලදී ලිංග-පාදක සැඩකම් (GVB) සහ HIV/AIDS පිළිබඳව ද අවධානයක් තිබිය යුතුය.

**කඳවුරු සැලසුම් ක්‍රියාවලිය.- සහභාගි විය යුත්තෝ කවුරුන්ද?**

- අනාගත කඳවුරුවාසින්
- සත්කාරක ප්‍රජා නායකයින්
- සේවා සම්පාදන හවුල් කරුවන්-NGOs.
- එක්සත්ජාතින්ගේ අදාළ ඒජන්සින්
- අමාත්‍යාංශ,ප්‍රාදේශිය හා ජාතික බලධාරීන්

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්.

### කඳවුරුබිම් තෝරාගැනීමේ තාක්ෂණික කමිටුව.

කඳවුරු සැලසුම් කිරීමේ පළමු පියවර කඳවුරු බිම තෝරා ගැනීමේ තාක්ෂණික කමිටුවක් පිහිටුවා ගැනීමයි.බොහෝ දුරට මේ කමිටුවේ සමාජිකයන් වනුයේ අනාගත සේවා සපයන්නන් සහ කඳවුරු කටයුතු සඳහා මුදල් ආධාර සපයන්නන් වනු ඇත. සාමාන්‍යයෙන් බිම තෝරා ගැනීම සඳහා අවශ්‍ය ඉඩ ප්‍රමාණය, පිවිසුම් මාර්ග, ස්ථානය, භූමි ලක්ෂණ,පසේ සොබාව, ගහකොළ සහ පාරිසරික බලපෑම යන කරුණු නිර්නායකන් වනු ඇත.ඇති සම්පත් හා පුද්ගලයින් ද ඒ හා සමග මේ වෙලාවේ සැලකිල්ලට ගත යුතුය.

### ස්ථාන සෝදිසිය හා තුලනය.

කඳවුර පිහිටුවීමේ ඊළඟ පියවර වනුයේ තාක්ෂණික කමිටුව මගින් කඳවුරු සඳහා සුදුසු වෙතැයි මුලින් තෝරාගත් ස්ථාන එක එකේ යෝග්‍යතාව තුලනය කර බැලීමයි. පවත්නා සම්පත්, ස්ථානයේ වර්තමාන හා අනාගත අවශ්‍යතා ඉක්මනින් මැන ගැනීම් ආදියද කඳවුරු තෝරා ගැනීමේ සම්මත ක්‍රියාවන් වෙයි. සියලු මැනීම් ගෝලිය තැන්ගත කිරීම් ක්‍රමය හා භූගෝලීය තොරතුරු ක්‍රම වේද අනුව විය යුතුය.සැලකිල්ලට ගතයුතු ඉතා වැදගත් නිර්නායකයන් වන්නේ:

- **ජල ප්‍රභවය :** ජලය අත්‍යවශ්‍යය.අවුරුද්ද මුළුල්ලේම තිබිය යුතුය. ගංගා, ඇල දොළ, පොකුණු වැනි මතුපිට ජලය ගැන සොයා බැලිය යුතුය. හැරු ලිං හා දිය සිදුරු වඩා මැන්වි. ඒවා කල් පවතින ආයෝජන වන අතර කඳවුරු වැසූ පසු පෙදෙසි ප්‍රජාවට පාවිච්චියට ගත හැක.

- **කඳවුරු බිමේ විශාලත්වය :** UNHCR. ය එක් අයෙකුට වර්ග මීටර 45 ක බිම පමණක් යෝජනා කෙරෙයි.මෙයට ගෙවතු ඉඩක්ද ඇතුළත් වෙයි. ගෙවතු ඉඩක් රහිතව එක් අයෙකුට වර්ග මීටර 30කට නො අඩු විය යුතුයැයි සැලකෙයි. එනිසා ඇතුළු විය හැකි නේවාසිකයන් ප්‍රමාණය ඇස්තමේන්තු කර ගත යුතු අතර අනපේක්ෂිත පිරිස් වැඩිවීම් නිසා අවුරුද්දකට සියයට 3-4 ක පමණ අනාගත ජනගහන වර්ධනයක් වෙතැයි සලකා ඒ වෙනුවෙන් ඉඩකඩද ඇස්තමේන්තු ගත කර ගත යුතුය. මේ මිම්මට, පාර,සේවාවන්,සෙවණ, ගෙවතු,ඇතුළත් නුමුත් සතුන් සඳහා ගොදුරු බිම් ඇතුළත් නැත.

- **පිවිසුම් පහසුව:** සහනාධාර සැපයුම සඳහා අවුරුද්ද මුළුල්ලේම කඳවුරට ඇතුළු වීමේ පහසුව තිබිය යුතුය. තෙත් හා වියළි කාල දෙකේමද මාර්ග පහසුව තිබිය යුතුය. ඒ අතරම පාර තැනීමට ගර්ඩර ආදියද බිම සැකසීමට බර උපකරණ ආදිය ද සඳහා පාරවල යෝග්‍යතාව ද නිගමනය කර ගැනීම ද වැදගත්ය.

- **පිහිටීම:** ස්ථානය සලකා බැලීමේදී පෙදෙසි ජනාවාසවලට පිවිසීම් පහසුව වෙළහෙළඳාම් සඳහා ඇති අවස්ථා වර්ධනය කර ගැනීමට ඇති ඉඩ කඩ ද සැලකිල්ලට ගත යුතුය. හැම කල්හිම වගුරු බිම්, ගංවතුරු පිටාර තැනි, සමතලා බිම්, ගංඉවුරු වැනි අන්තරායකර ස්ථාන අත් හළ යුතුය. ස්ථානය කළින් පාවිච්චියට ගත් ආකාරය පිළිබඳ සවිස්තර ඉතිහාසයක් ගොඩනගා ගත යුතුය, ඉන් ලැබෙන තොරතුරු වලින් ජලය, ඉන්ධන, හා පෙදෙස් ගොඩනැගිලි ද්‍රව්‍ය ආදි සම්පත් සඳහා ඇති විය හැකි තරගය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැක.

- **භූමි ලක්ෂණ:** ජල අපවහනය,ගුරුත්ව ජල බෙදා හැරුම සහ ගොවිතැන් කටයුතු වලට යොග්‍ය පමණට බෑවුම සියයට 2 ත් 6 ත් අතර ක්‍රමික එකක් විය යුතුය. දැඩි බෑවුම් (සියයට 10 ක් හෝ වැඩි) සකස් කිරීම් දුෂ්කර වන අතර වැයද අධික වන නිසා අත්හළ යුතුය. සමතලා බිම් වල ජල අපවහන ප්‍රශ්න බොහෝ විට අතිවිය හැකි අතර වැසි කාල වලදී වගුරු විමට අවකාශ ඇත.

- **පසෙහි ස්වභාව:** මනා වැසිකිළි ජල අපවහනයක් සඳහා කඳවුරු ඉඩම දිය උරාගන්නා සුලු වැලි පසින් යුත් එකක් විම වඩා මැනවි. සරු කළු පස වැසිකිළි තැනීමට සුදුසු නැත. එක් එක් වැසිකිළි තැනුම් සඳහා ස්ථාන කිහිපයක පිරික්සුම් කැනිම් කළ යුතුය. සනිපාරක්ෂක කාර්ය සඳහා ගලින් සෑදි ඝන පස් තට්ටු කැනීම දුෂ්කර කාර්යයකි. කැණූ ලිං ප්‍රධාන ජල සැපයුම් මාර්ගය වන්නේ නම් බිම් දිය මට්ටම මතුපිට සිට මිටර 3 ක් පහළින් විය යුතුය. ළිං තිබිය යුත්තේ වළ වැසිකිළි වලට මිටර 5ක අවම දුරකිනි. ඊට අතිරේකව බිම් දිය මට්ටම ගැඹුරුම වැසිකිළි වළේ පතුලට මිටර එකහමාරක පමණවත් පහළින් විය යුතුය.

- **ගහකොළ හා දර:** හෙවණ සඳහා ස්වාභාවික ගසින් යුත් තැනක් විම යෝග්‍යයැයි යෝජනා කෙරෙයි..රුක් රැක ගැනිම පස සේදියාමද වළක්වයි.කඳවුරකට නිතර අවශ්‍ය වන්නක් නම් දර ලි යි. ඒ නිසා මැරුණු ගස් ලබා ගත හැකි වනරොදක් සමිප තැනක කඳවුරක පිහිටුවිය යුතුය. ජනකාය අතර තරග වැළැක්වීම සඳහා සත්කාරක ප්‍රජාවන්ගෙන් සෑහෙන තරම් ඇතින් තැනක් කඳවුර සඳහා යෝජනා කෙරෙයි.

- **පරිසරය හා සංස්කෘතිය:** උදාහරණ වශයෙන් ජාතික උද්‍යාන, සංස්කෘතික භාවිතයන් සඳහා ජාතික හෝ අන්තර්ජාතික වැදගත්කමින් යුත් තැන්, පෙදෙසේ පූජනිය තැන්,ස්මාරක, ඓතිහාසික ගොඩනැගිලි සහ අනුස්මරණ ස්ථාන ආදි සංවේදි තැන් කඳවුරු පිහිටුවිම් සඳහා ගැනිමෙන් වැළකිය යුතුය.


- **පරිසර බලපෑම:** සැලසුම් සැකසිමේ ක්‍රියාවලියේ මුල්කාලයේම කඳවුරු කළමනාකරණ ඒජන්සිය සත්කාරක ප්‍රජාවගෙන් ප්‍රදේශයේ ගොඩනැගිලි ද්‍රව්‍ය ලබාගැනිම සංවිධාන කරගන ඒවා කඳවුරු බිමට ප්‍රවාහනය කර ගත යුතුය. එසේ ලබාගැනිම සමිප පරිසරයෙන් ද්‍රව්‍ය ලබාගැනිමෙන් ඇතිවන ගැටිම වළක්වනු ඇති අතර එය සත්කාරක ප්‍රජාව හා අවතැන්වූ ජනකාය අතර සුහද සම්බන්ධය පවත්වා ගන යැමට දායක වනු ඇත.

**වැඩි විස්තර සඳහා කියවන්න රෙඩ් ආර්ගෙ හදිසි අවස්තාවන්හිදි ඉංජිනේරු ශිල්පය**

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ මුඛ්‍ය වගකීම්.

**ජල තත්ත්ව විමසුම:** කඳවුර තෝරා ගැනිමට ප්‍රථම කළමනාකරණ කමිටුව විසින් ස්ථානයේ ජලය ඇත්දැයි සුවිශේෂ තාක්ෂණික විමර්ශනයක් කරන සේ ඉල්ලා සිටිය යුතුය. සත්කාරක ප්‍රජාව අතර සිටින ස්ථානිය නියෝජිතයන්ගෙන් ඒ ඒ ඍතු වලදී ජල තත්ත්වයන් වෙනස්වන අයුරු විමසා දැනගත යුතුය.

**කඳවුරු බිම තෝරා ගැනීම ඇගයීම:** කඳවුරු තෝරාගැනීමේ ඇගයීම් අංශ හැකි පමණකට කඳවුරු කළමනාකරණ ඒජන්සිය සහභාගි විය යුතුය. කඳවුරු කළමනාකරණ ඒජන්සියක් වශයෙන් ගොඩනැගිලි තැනීමට පෙර බිම ගැන දැන සිටීම පසු කාලයේ යටිතල පහසුකම් සංවර්ධනයටත් ගැටළු නිරාකරණයටත් උදව්වක් වනු ඇත.




ලියිබේරියානු සරණාගතයින් සියරා-ලියොන්හි කඳවුරකට ඒම කඳවුරු බිමක් තෝරා ගැනීමේදී ප්‍රධාන උපමානය වන්නේ වසර පුරා පිවිසීමට ප්‍රමාණවත් පරිදි මාර්ග තිබේද ඡායාරූපය : OCHA

## සැලස්ම සම්පාදනය හා සැකස්ම නිමැවුම.

යෝග්‍ය කඳවුරු බිම තෝරාගැනීමෙන් පසුව ප්‍රධාන සැලැස්ම හෙවත් සමස්ත බිම් පිඹුරක් නිර්මාණය කර ගත යුතුය අඩුවැය GPS යකින් කඳවුරේ හැඩහුරුව මෙන්ම ඇස්තමේන්තු ගත ධාරිතාව, වට පිටා අංශ, ස්වාභාවික ලක්ෂණ හා පවත්නා වෙනත් ජනාවාස ආදී ආශ්‍රිත අංගද සිතියම් ගත කළ හැකි වෙයි.,

මූලික පවුල් ඒකකයෙන් අරඹා කඳවුරේ සමස්ත භෞතික පිහිටීම මොඩියුල ප්‍රවේශයකින් හෝ මේ පරිච්ඡේදයේ මෙවලම්වලින් නිදර්ශිත විකල්ප ආකෘති භාවිතයෙන් වර්ධනය කර ගත හැක.

| මොඩියුල | සැදිය | පුද්ගල ගණන |
|---|---|---|
| පවුල | එක පවුලක් | 4- 6 |
| ප්‍රජාවක් | පවුල් හෝ ගෙවල් 16 | 80 |
| ගමක් | ප්‍රජා ඒකක 4 | 320 |
| කාණ්ඩයක් | ගම් 4 (හෝ ප්‍රජා 16ක්) | 1280 |

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ මුඛ්‍ය වගකීම්.

- **එක් එක් නිවසක අවශ්‍යතා සැලකිල්ලට ගැනීම:** කඳවුරේ බිම් සැලැස්ම සැකසුමේදී ගමක පරිදි ගෙයක නිවැසියන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන තිබීම කඳවුරු කළමනාකරණ කණ්ඩායම විසින් සහතික විය යුතුය.

- **දිගු කාලීන නඩත්තුව සැලකිල්ලට ගැනීම:** පාරවල තත්වය,පොදු යටිතල පහසුකම්, ජල අපවහනය ආදියේ දිගු කාලීන නඩත්තුව හා සම්බන්ධ කරුණු සම්පූර්ණ ලෙස සලකා බැලිය යුතුය. නඩත්තු ප්‍රශ්න (වියදමද ඇතුළුව)කලින්ම හඳුනාගත් විට වඩා ඵලදායි ලෙස විසඳා ගත හැක.

- **ජනගහන කරුණු සැලකිල්ලට ගැනීම:** ජනගහනය තුල විවිධ ජන කණ්ඩායම් වල අවශ්‍යතාවනට පිරිමැසීමට හැකි පරිදි කඳවුරු යටිතලය සකස්ව තිබිය යුතුය.සරණාගතයන් හා අවතැන්වූවන් ඒකීය කණ්ඩායමක් නොවන අතර බොහෝ අවස්ථාවලදී දුර්වල තත්වයකින් පිවිසෙනු ඇත.සායන තැන්, බෙදා හැරීමේ මධ්‍යස්ථාන, ප්‍රජා සේවා කාර්යාල ආදී අත්‍යවශ්‍ය සේවාවනට සමීප නිවාස සඳහා ප්‍රමුඛතාව ජනගහනයේ ආපදා ගෝචර පුද්ගලයන්ට ලැබිය යුතුය. (පරිච්ජේදය 5 රැකවරණ බලන්න)

හොඳ මාර්ග, විශ්වාසදායක ජල සැපයුම,සෑහෙන සනීපාරක්ෂක පහසුකම්, නිවැසියන් ඇතුළු කර ගැනීමට පෙර සම්පූර්ණ වී තිබිය යුතුය.තවද ආහාර පිළියෙළ කිරීමේ ස්ථාන,බෙදා හැරීමේ මධ්‍යස්ථාන, හදිසි තාවකාලික පාසල් හා ප්‍රතිකාරක පෝෂණ මධ්‍යස්ථාන ආදියද නිවැසියන් පැමිණීමට පෙර තිබිය යුතු අතිරේක කඳවුරු අංග වෙයි.

- **සම්පත් පාවිච්චිය සැලැකුම:** කාලයත් තිස්සේ පාවිච්චියෙන් වැය වෙන සම්පත් කවරේදැයි සැලකිල්ලට ගෙන ඒවා යළි පියවා ගන්නේ කෙසේද යන්න කඳවුරු කළමනාකරණ කණ්ඩායම විසින් වේලාසනින්ම විමසීමට භාජන කළ යුතුය

- **ගිනි ඇවුරුම් හා ගිනි වැළකුම් ක්‍රම සැලසුම:** ගොඩනැගිලි සහිත හැම මීටර 300ක බිම් ප්‍රමාණයකටම ගිනි කපොලු හෝ ගොඩනැගිලි රහිත හිස් තැන් පිහිටුවීම යෝජිතයි.යෝජිත පළල මීටර 30 කි. එක් එක් ප්‍රජාවක් සඳහා ගෙවල් අතර ඉඩ පරතරය අඩු තරමින් ගොඩනැගිල්ලේ උස මෙන් දෙගුණයක්වත් විය යුතුය. එහා දැවෙන සුළු ගොනැගිලි ද්‍රව්‍ය ඇති තැන්වල ඉඩ පරතරය සම්පූර්ණ උස මෙන් තුන් හතර ගුණයක්වත් විය යුතුය

- **ඔරොත්තු දිය හැකි ඉන්ධන සැපයුම:** මුල සිටම ඉවුම් පිහුම් සඳහා දර, භූමි තෙල් හෝ අඟුරු සැපයුම ගැන අවධානය දිය යුතුය. ගස්වැවීම හා පරිසර හිතකර උදුන් භාවිතයට අනුබලදීම අඛණ්ඩ ඉන්ධන සැපයුම් මගක් වන අතර කඳවුර තුළ හා අවට පෙදෙස්වල පරිසරයට කෙරෙන බලපෑම අඩු කිරීමටද හේතුවනු ඇත.

- **ප්‍රාදේශීය ද්‍රව්‍ය හා සම්පත් භාවිතය:** ඝර්ම කලාපීය පෙදෙස් හි ඉක්මනට වැවෙන උණ ගස් වැනි ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතය පරිසරය ආරක්ෂා කරණු වස් අනුබල දිය යුතුය. හැකි තරම් පමණ සත්කාරක ප්‍රජාවගෙන් ස්ථානීය සම්පත් ලබා ගැනීමට දිරි ගැන්විය යුතුය. කඳවුරු වසා දැමූ පසු නැවත වනවගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා කණ්ඩායම විසින් මුලදීම සැලැසුම් කිරීම අතිශය වැදගත්ය.

- **පවුල් ගෙවතු. :** විශේෂයෙන් පොකුරු වශයෙන් සැලසුම් කළ නිවාස කට්ටිවල පවුල් එළවලු කොටු හා ගෙවතුවලට අනුබල දියයුතුය (පරිච්ඡේදය 9 ආහාර හා ආහාර නොවන ද්‍රව්‍ය බෙදා හැරීම සහ පරිච්ඡේදය 12 සියත් බව වැඩුම සඳහා ජීවනෝපාය මාර්ග වැඩි දියුණ, බලන්න)

## නිවහන්.

රට හා පවත්නා තත්ත්වය අනුව කඳවුරු නිවැසියන් විසින්ම තමන්ගේ නිවහන තනා ගැනීම අපේක්ෂා කෙරේ. මේ ප්‍රවේශය ශ්‍රමයත් කාලයත් ඉතිරි කරන අතර සියත්සවිය, බලවත්වීම හා ප්‍රජා සහභාගිත්වයට රැකුලක් වෙයි. පවුල් සඳහා නිවහන් තනන අතරම බොහෝවිට පළමුවෙන් අළුතෙන් එන්නන් සඳහා තාවකාලික ඉඳුම් හිටුම් සැපයිය යුතුවනු ඇත.කෙටි කාලීන නවාතැන් වශයෙන් කූඩාරම් හා පොදු ගොඩනැගිලි පාවිච්චි කළ හැක. විවිධ අවතැන් තත්ත්වයන්හිදී භාවිත කෙරෙන අවම ප්‍රමිතින් UNHCR ය සකස්කොට ඇත. සියලු නිවහන් වෙනස් වන කාල ගුණ තත්වයන්ගෙන් රැකවරණද,ජීවත් වීමට, බඩු තබා ගැනීමට ඉඩකඩද සැපයෙන අතර පුද්ගලිකබව පවත්වා ගැනීමට හා සුරක්ෂිතබවක් ඇතිකිරීමට ඉවහල්වන තැනක්ද විය යුතුය. උණුසුම් කාල ගුණයෙන් යුත්පෙදෙස්හි වර්ග මීටර තුන හමාරක් හා සීත කලාප වල වර්ග මීටර හතර හමාරක් පමණ නිවහනක් සඳහා සෑහෙන ඉදිකිරීම් ද්‍රව්‍ය ලබා දිය යුතුය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩියමේ මූඛ්‍ය වගකීම.

- **නිවහන් තත්ත්ව සෝදිසිය:** පොරවන (බිලැන්කට්) හා ඇඳුම් පැළඳුම් ආදියද ඇතුළුව නිවහන් තත්ත්ව සෝදිසිය වැදගත්වන අතර අළුතෙන් පැමිණියවුන්ගේ අවශ්‍යතා හැකි ඉක්මනින් සැපයීම සහතික කළ යුතුය.
- **සියලු කාල ගුණ තත්ව සඳහා සෙවණ:** නිවහන් හා වහළ වෙනස් කාලගුණ තත්ත්ව වලට යෝග්‍ය විය යුතුය.
- **සුළඟින් ආවරණය :** වැස්ස. සුළඟ හා අහිතකර කාළගුණ තත්ව විශේෂයෙන්ම සීත දේශගුණ ප්‍රදේශවල පහසුවෙන්ම සෞඛ්‍යයට හානිකර වනු ඇත. වහළ බිත්ති හා දොර ජනේල සුළඟින් ආරක්ෂාකර ගැනිම සඳහා සැලකිලිමත් විය යුතුය.
- **ප්‍රජා සහභාගිත්වය :** ප්‍රජා සහභාගිත්වයට අනුබල දිය යුතු අතර තමන්ගේ නිවාස තනා ගැනිම සඳහා ප්‍රජාව විවිධ වැඩ කණ්ඩායම් වශයෙන් සංවිධාන විය යුතුය.
- **අපදාවලට ලක්විය හැක්කන් සඳහා නිවහන්:** ආපදාවලට ලක්විය හැක්කන් සඳහා නිවාස පළමුවෙන්ම තැනිම අතිශයෙන් වැදගත්ය. මෙහෙයුම් ඒජන්සිය සමග සහයෝගයෙන් කඳවුරු කළමනාකරු ආපදාවලට වැඩියෙන් භාජන විය හැකි අය  හඳුනා ගන ප්‍රජා සහාය සංවිධානය සඳහා කළමනා සම්පාදනය කළ යුතුය.

## කඳවුරු ආරක්ෂාව

කඳවුර සැලසුම් පිඹුරු සකස්කිරීමේ සිට තැනිම් කටයුතු කරගන යන අතරේද  කඳවුරේ සුරක්ෂිතව බව සහ නිවැසියන්ගේ සුබසාධනය වැඩි දියුණුකර ගැනිම සඳහා ආරක්ෂාව සම්බන්ධ කරුණු සැලකිල්ලට ගත යුතුය. විශේෂයෙන්ම කාන්තාවන්ගේ හා ළමයින්ගේ සහ ප්‍රජාව අතර සිටින ආපදාවලට ලක්විය හැකි වෙනත්  අයගේ ආරක්ෂාව සම්බන්ධ කරුණුවලට විශේෂ අවධානය දිය යුතුය.(පරිච්ජේදය 5 ආරක්ෂාව 6 ළමා ආරක්ෂාව 7 GBV ය (ලිංග පාදක ප්‍රචණ්ඩත්වය) වැළැක්ම.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ මූඛ්‍ය වගකීම්.

- **කඳවුරේ ගොඩනැගිලි සැලසුම:** සියලු කල්හි කඳවුරු ආරක්ෂාව සම්බන්ධ කරුණුවලට අදාළ කණ්ඩායම් වල සහභාගිත්වය ඇතිව සැලකිල්ලට යොමු කළ යුතුය. විවිධ කණ්ඩායම්වල අවශ්‍යතා සහ ඕනැකම් විවිධය. ඒනිසා කඳවුරු සැලැසුමේ දී සහ ගොඩනැගිලි තැන්ගත කිරීමේදී ප්‍රජාවේ ගැහැනු පිරිමි සහ ළමයි සහභාගි කරවා ගත යුතුය.
- **කඳවුරු පහසුකම් හා ආරක්ෂාව:** සේදිමේ ස්ථාන හා වැසිකිළි ඇති ස්ථාන කාන්තාවන්ට සහ ළමයින්ට පහසුවෙන් පිවිසිය හැකි තැන් මෙන්ම ඔවුන්ට අවශ්‍ය තරම් නිස්කලංකය ඇති තැන් බවට කඳවුරු කළමනාකරණ කණඩායම සහතික විය යුතුය. විශේෂයෙන්ම රාත්‍රියෙහි අවශ්‍ය

තරම් ආලෝකය ඇති බවට සැහිමට පත්විම වැදගත්ය. එසේම පාසල් හා ක්‍රීඩා පිටි සඳහා බිම් වෙන්කර දෙන විට ආරක්ෂාව ගැන අවධානය දිය යුතුය.

- **කාන්තා ගෘහ මූලික පවුල් සඳහා වෙනම නිවාස:** තාවකාලික සංක්‍රමණ නවාතැන්වල ,ගෘහ මූලිකයා වු අවිවාහක කාන්තාවන් සඳහා වූ වාසස්ථාන ඔවුන් අන්තරායයනට ගොදුරු විම අවම කරගැනිම හැකිවන පිළිවෙළකට එක යායට පිහිටුවිය යුතුය.

- **භාරකරුවන් නැති ළමයින් සඳහා වෙනම නිවහන්:** භාරකරුවන් නැති හෝ භාරකරුවන්ගෙන් වෙන්වූ ළමයින් සඳහා පිරිමි ළමයින්ට හා ගැහැනු ළමයින්ට වෙන වෙනම විශේෂ සංක්‍රමණ කුටි තැනිමට අනුබල දිය යුතුය.



ඉංගුස්හේතියාවේ සරණාගත කඳවුරකදී, චෙච්නියන් අවතැන්වූ කතුන් UNHCR නියෝජිතයින් සමග කතාබහක හැකි තාක් උනන්දුවක් දක්වන්නන් කඳවුර සැලසුම් කිරීමේදී සම්බන්ධ විය යුත්ත ජායාරූපය UNHCR

- **තදබදවිම්:** වළක්වා ගත යුතුය..කඳවුරු කළමනාකරණ කණ්ඩායම තදබද විම් හා එක නිවහනේ එක පවුලකට වැඩියෙන් නවාතැන් ගැනිම වැළැක්විමට වගබලා ගත යුතුය

- **කාන්තා සේවක පිරිස් සිටිම:** කඳවුරු කළමනාකරණ මණ්ඩලයේ කොටසක් වශයෙන් විශේෂයෙන් ලියාපදිංචි කිරීමේ හා බෙදා හැරීමේ කණ්ඩායම්වලට කාන්තාවන් යොදවා ගැනිමට අනුබල දිම වැදගත් වෙයි.

# මෙවලම් කට්ටලය

## සරණාගත කඳවුරු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා සාමාන්‍ය සේවාවන් (UNHCR)

මේ වගුවේ, මූලික කඳවුරු සේවාවන් හා යටිතල පහසුකම් සඳහා UNHCR ය සකස්කර භාවිත මූලික ප්‍රමිතීන් දක්වා ඇත. උදාහරණයක් වශයෙන් එය (වෙනත් සේවාවන් අතර) වැසිකිළි හා ජලකරාම එක පවුලකට (පුද්ගලයින් 4-6) එක ප්‍රජාවකට (පුද්ගලයින් 80 - 100) එක අංශයකට (පුද්ගලයින් 5000) එක කඳවුරකට (පුද්ගලයින් 20000) ආදි වශයෙන් කොපමණ අවශ්‍ය වේදැයි පහසුවෙන් පෙන්වයි.

## කඳවුරු තත්ත්වයකදී සේවා හා යටිතල අවශ්‍යතා සඳහා (UNHCR) ප්‍රමිතීන්.

මෙහි වෙනත් අවශ්‍ය සම්පත් අතර එක් පුද්ගලයකු සඳහා ඉඩම්, නිවාස ඉඩ, මාර්ග, සක්මන් මං හා ජල අවශ්‍ය ප්‍රමාණ පහසුවෙන් බලාගත හැකි ප්‍රයෝජනවත් වගුවක් දක්වයි.. UNHCR හදිසි අවස්ථා අතපොතෙන්.

## කඳවුරු සැලසුම් කිරීම: නිදර්ශක ආකෘති (NRC යෙන්)

මේ ඇඳ දක්වා ඇති රූප පවත්නා විවිධ කඳවුරු හා යටිතලයන් කඳවුරු සැලසුම් අංගවල ආකෘති වෙයි. කඳවුරු යටිතල පහසුකම් සැලසුම් කිරීමේදී ඉතා ප්‍රයෝජනවත් වෙයි. NRC නිවහන් අත්පොත.

## අවශ්‍ය කියවීම් හා ආශ්‍රේයය.

- ඩේවිඩ් ජේ, ලැම්බර්ට් ආර් ආර් රෙඩ් වෙනුවෙන් 2002 හදිසි අවස්ථාවන්හිදී ඉංජිනේරු ශිල්පය - ලන්ඩන් මධ්‍යම තාක්ෂණ සංවර්ධන කණ්ඩායම (ITDG)
- UNHCR 2000 හදිසි අවස්තාවන් සඳහා අත්පොත පරිච්ඡේදය 12 බිම තේරීම: සැලසුම සහ නිවස්නය පිනිවා UNHCR
- ස්පියර් ව්‍යාපෘතිය 2004 ආපාද වල මුහුණ දීමේදී අවම ප්‍රමිති සහ මානව හිතවාදී පොදු සම්මතය. ලන්ඩන් – ඔක්ස්පාම් ප්‍රකාශනය.
- shelterproject.org 2004 සංක්‍රමික පදිංචි අවතැන් වූ ප්‍රජාව කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලය http://www.shelterproject.org වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
- UN/OCHA 2004 කුඩාරම්: මානව හිතවාදී සහන තුළ පවුල් කුඩාරම් සංවිධානය සහ භාවිතය සඳහා මං දැක්වීම http://www.shelterproject.org වෙබ් අඩවියෙන් ගත හැක.
- වාට් එස් වුඩ් ඔබ් 1977 අතින් හැරු ලිං සඳහා ඒවා ඉදිකිරීම ලන්ඩන් – මධ්‍යම තාක්ෂණ සංවර්ධන කණ්ඩායම (ITDG)
- IASC 2003 හදිසි වටපිටාවකදී HIV/Aids වලට මැදිහත්වීම සඳහා නිර්නායක
- සරණාගත කාන්තාවන් සහ ළමුන් සඳහා කාන්තා කොමිෂම සරණාගතයින් සහ Aids මානවහිතවාදී සමාජ කළ යුත්තේ කුමක් ද?
  - www.shelterproject.org
  - www.redr.org/resourus/eng emergency htm. (Engineering in emergencies homepage)

**සරණාගත කඳවුරු සඳහා සේවාවන් වර්ග හා යටිතල පහසුකම් සඳහා අවශ්‍යතා.**

| | | |
|---|---|---|
| වැසිකිළි 1 | පවුල් 1 කට | (පුද්ගලයින් 6- 10) |
| ජල කරාම 1 | ප්‍රජා 1 කට | (පුද්ලගයින් 80- 100) |
| සෞඛ්‍ය මධ්‍යස්ථාන 1 | කඳවුරු 1කට | (පුද්ගලයින් 20000) |
| රෝහල 1 | පුද්ගලයින් 200000 | |
| පාසල් 1 | එක් අංශයකට | (පුද්ගලයින් 5000) |
| තැන් 4ක් | එක කඳවුරු මොඩියුලයකට | (පුද්ගලයින් 20000) |
| මාකට් 1 | එක කඳවුරු මොඩියුලයකට | (පුද්ගලයින් 20000) |
| කසල බැරල | එක ප්‍රජාවකට | (පුද්ගලයින් 80-100) |

# කඳවුරක සේවාවන් හා යටිතල පහසුකම් සම්බන්ධ UNHCR ප්‍රමිතීන්.

| | | |
|---|---|---|
| ජල කරාම 1ක් | ප්‍රජා 1කට | (නිවාස 16, පුද්ගලයින් 96) |
| පරිහරණය කරන්නන්ට වැඩිම දුර | | මීටර 150 |
| වැසිකිළි | | |
| පොදු වැසිකිළි පාවිච්චිය | | පුද්ගලයින් 15- 20/වල |
| පරිහරණය කරන්නන්ට වැසිකිළියට වැඩිම දුර | | මීටර 100 |
| නිවහන සිට වැසිකිළියට අවම දුර | | මීටර 30 |
| නිවහන සිට වැසිකිළියට අවම දුර | | |
| පුද්ගලික පවුල් වැසිකිළි යෝග්‍ය සංඛ්‍යාව | | පවුලකට 1ත් (6-10 කට) |
| පරිහරණය කරන්නන්ට වැඩිම දුර | | මීටර 10 |
| නිවහන සිට වැසිකිළියට අවම දුර | | මීටර 5 |
| වැසිකිළියක සිට ජලය ප්‍රභයකට අවම දුර | | මීටර 30 |
| සෞඛ්‍ය මධ්‍යස්ථාන 1ක් | | කඳවුරකට (20000 කට) |
| රෝහල 1ක් | | කඳවුරු 10කට (200,000කට) |
| පාසල් 1 ගුරු 1/සිසු 40 | | 1 යායකට (1280 කට) |
| බෙදාහැරීම් මධ්‍යස්ථාන (NFIs) | | 1 කඳවුරකට |
| මාකට් 1 | | යාය 2කට |
| බෙදාහැරීම් මධ්‍යස්ථාන (ආහාර) | | 1 කඳවුරකට |
| කුණු වල 1 | | 1 ප්‍රජාවකට |
| පරිහරණය කරන්නන්ට වැඩිම දුර | | මීටර 15 |
| බිම ඉඩ (ගෙවතු ඇතුළත්ව) | | වර්ග මීටර 45ක් පුද්ගලයකුට |
| ආවරණය කළ හදිසි නිවහන් | | වර්ග මීටර 3.5 පුද්ගලයකුට |
| ගිනි කපොලු | | ගොඩනැගිල්ලක උස මෙන් 2 ගුණයක් |
| ගම් අතර දුර | | අවම මීටර 30--- |

# කඳවුරු සැලසුම් කිරීම : නිදර්ශක ආකෘති (NRC යෙන්)

කඳවුරු සැලසුම් සකස්කිරීමට පළමු කඳවුරු කළමනාකරණ මෙවලම් කට්ටලයේ ඇති කඳවුරු සැලසුම් කිරීමේ උපදෙස් බැලිය යුතුය ආරක්ෂක අවශ්‍යතා ගැන දැඩි අවබෝධයක්ද ඩිසයින් හැකියා ඇති සමාජ හා භෞතික සැලැසුම් සැකසීමේ අත්දැකීම්ද සහිත වෘත්තිය ජනාවාස සැලසුම් කරුවෙකු විමසා උපදෙස් ලබා ගත යුතුය.

කඳවුරු සැලසුම් සංවර්ධනයට උපකාර වීමටත් සහභාගිවීම පහසු කිරීමටත් ආදර්ශ ඩිසයින ආකෘති කට්ටල සකස්කර ඩිසයින දළ රූ සටහන් සේ දක්වා ඇත.

රූපය 1 ආදර්ශ කඳවුර නිවැසියන් 10000කය පමණ

රූපය 2 මූලික විකල්පයන්/ ප්‍රජා පොකුරු වල සැලසුම්

රූපය 6 බිම් පිඹුර

රූපය 7 ප්‍රජා පොකුර වර්ගය බී 4

ආදර්ශ කඳවුර සැලසුම් කර ඇත්තේ හා අදාළ සමාජ මාන හා අනාගත කාර්ය හා සම්බන්ධතා පිළිඹිබු වුන කාර්ය අනුව අනු කොට්ඨාස වලට බෙදුන සංයුක්ත ටවුමක් නැත්නම් නගරයක් ලෙසිනි. විවිධ කාර්ය හා මෙහෙයුම් වලටත් කඳවුරු නිවැසියන් සඳහා සුදුසු ඉඩ ප්‍රස්තාත්, සමාජීය ජීවිතයකටත් පාලන ඒකකවලටත් අවකාශ සැලසෙන පරිදි කඳවුර සැලසුම් කිරීම අතිශයෙන් වැදගත් වෙයි. සෑහෙන ජනඝනයකටත් විවිධ පාලන තලයන්ටත් වැඩ කණ්ඩායම්වලටත් සමාජ කණ්ඩායම්වලටත් ක්‍රීඩාවලටත් විශේෂ අවධානය දී ඇත.

ප්‍රදර්ශිත ආදර්ශ කඳවුරු සැලස්ම නියම කඳවුරක සැලැස්මක් සේ නොව එය සැලැසුම් කිරීමේ නැත්නම් ආදර්ශ නිදර්ශනයක්සේ භාවිත කළ යුතුය. එක් එක් කඳවුර සඳහා වු සුවිශේෂ සැලැස්මේ ස්වරූපය පුළුල් පරාසයක ස්ථානයට අදාළ තත්වයන් හා ප්‍රයෝගික කරුණුද මත තිරණය වෙයි.(මෙවලම් කට්ටලය හා ආශ්‍රේයයන් බලන්න) ඒ නිසා කඳවුරු සැලැස්මේ සුවිශේෂ අවශ්‍යතා හා ලක්ෂණ (ස්ථානිය තත්වයන්, උදා: ප්‍රවේශය, භූ විෂමතා ලක්ෂණ, ගහ කොළ ස්වභාව,පවත්නා සුළං තත්ව(විවෘතවීම් හා ආවරණ අවශ්‍යතා ආදිය), පිළිඹිබු විය යුතුය.

කඳවුරු සැලැස්ම පහත දැක්වෙන සමාජ හා තාක්ෂණික අංගයන්ද සහිත ප්‍රධාන අවකාශමය අංගයන්ගෙන් සමන්විත වෙයි.

ප්‍රජා මහද්ජරිය (කැටිය)

නිවාස 16ක ඉඩ,දළ වශයෙන් නිවැසියන් 80ක්. සාමාන්‍ය වපසරිය වර්ග මිටර 3200-3800 පමණ

ප්‍රජාපහසුකම්: පොදු බිමක් හා එක් කුණු වළක්.

වැයික්කිය.

ගිහිකඩනයක් තුල අවකාශය : සාමාන්‍යයෙන් ප්‍රජා කැට් 10 ක්: දළ වශයෙන් නිවාස 160 ක්: නිවැසියන් 800 ක්

සාමාන්‍ය වපසරිය: මීටර 220 ∘ 220 දළ වශයෙන් වර්ග මීටර 48000.

ප්‍රජා පහසුකම් : කේන්ද්‍රිය ජල සැපයුම්පළ (ජල කරාම 3ක් 4ක් රෙදි සේදීමට හා නෑමට ඉඩකඩ)

හිස් ඉඩම්: දළ වශවෙන් ප්‍රජා කැට්යක ඉඩ සමාජ කාරය හෝ පුළුල් කිරීම් ඉඩ නිවාස 16කට

ටවුම.

වැයික්කි 4ක ඉඩ:ප්‍රජා කැට් 40යි :දළ වශයෙන් නිවැසියන් 3300 යි

සාමාන්‍ය ඉඩ ප්‍රමාණය: වර්ග මීටර 200000යි

ප්‍රජා පහසුකම් : මධ්‍යම චතුරශ්‍රයක්, ප්‍රාථමික පාසලක්( දෙවාර වැඩ කරන)

වෙළඳපොළ / හෝ බෙදාහැරීම් පොළක්, ආගමික බිමක්.

කඳවුරු සංවර්ධනය සඳහා මූලික ජනගහනය / ඉඩ ටවුම වෙයි.

කඳවුරු නගරය

ටවුම් 3ක ඉඩ ප්‍රමාණය (උපරිමය) නිවැසියන් 10000 ක්

සාමාන්‍ය ඉඩ ප්‍රමාණය: වර්ග මීටර 600000 හෝවැඩි.

ප්‍රජා පහසුකම්: කඳවුරු කළමනාකරණ කාර්යාල ගබඩා, සායන. අවශ්‍යතා සම්පත් අනුව වෙනත් කාර්ය. මාකට් එක,ක්‍රීඩා පිටිය, සංස්කෘතික මධ්‍යස්ථානය ආදිය.

**අතිරේක කාර්ය/ ඉඩකඩ**

**සුසාන භූමි, ගෙවතු . වැව්ලි සහ තණබිම් සඳහා ඉඩ,**

**ප්‍රජ මණ්ඩරිය (කැට්ය)**

කඳවුරු සැලස්මේ පදනම පොදු ප්‍රජා බිම්කඩක් වටා සකස් කළ දළ වශයෙන් පවුල් හො නිවහන් 16 කින් සැදි ප්‍රජා මණ්ඩරියයි. එවැන්නකින් එක් එක් පවුල් නිවහනට නිස්කලංකයත් මැද පොදු බිම්කඩකටත් අවකාශ සැලසෙයි. බොහෝවිට අවතැන්වන්නන් ගැලවුම සොයා පැනයන්නේ පවුල් පිටින්, නෑ පිරිස් අසලවැසි කාණ්ඩ වශයෙන්. ගම් පිටින් එකටයි. ඒ නිසා අවතැන්වූවන්ගේ දරා සිටීමේ ශක්තිය සඳහා ඔවුන්ගේ සමාජ හා සම්බන්ධතා ජාල පවත්වා ගැනීම අතිශය වැදගත් වෙයි. පොදු ප්‍රජා බිම් කඩ මූලික වශයෙන් රැකවරණ හා ඇස්බැල්මැතිව කෙළි සෙල්ලම් සඳහා යොදගත හැකි වන අතර පොදු කාර්ය, උත්සව ආදි බොහෝ කාරීය සඳහාද ප්‍රයෝජනයට ගත හැකිවෙයි. මේ පොදු බිම ගෙවතු සඳහා පවුල් අතර බෙද නොදිය යුතුය. ගිනි ඇවිරුම් තිරය ආසන්නයේ ඒවා

හැර, අනෙක් ප්‍රජා කැටි අතර දුර අවම වශයෙන් මීටර 10 ක් විය යුතුය. කඳවුරු මාන ගණනය සඳහා පහත සඳහන් වගුවේ එක් එක් කැටියක් වටා මීටර 5 ක ඉම් තීරුවක් ඇතුළත් කර ඇත

ප්‍රජා කැටි ජනඝනත්වය: බොහෝ ගැටුම් හටගන්නේ අධික දරු ඵලදායිතාව ඇති දකුණේ රටවලයි. සාමාන්‍ය පවුලක හෝ නිවහනක ප්‍රමාණය (පෙළ ගැස්වුම් ක්‍රමයක් අනුව තීරණය කිරීමේකින්) පුද්ගලයන් 5 දෙනෙකි. ප්‍රජා මණ්ඩපයේ ජන ගහනය දළ වශයෙන් 80 කි. දළ සාමාන්‍යයක් ගතහොත් ඔවුන්ගෙන් සියට 50 ක් වයස 16 ට අඩු අය වනු ඇත. ඒ නිසා පොදු ඉඩට ප්‍රමුඛතාව දිය යුත්තේ විවිධ වයස් කාණ්ඩ වල පිරිමි හා ගැහැනු ළමයින්ගේ අවශ්‍යතාවන්ට සරිලන සේ විවිධ කාරය සඳහා පහසුවෙන් ඇස්බැල්ම දිය හැකි සුරක්ෂිත ක්‍රීඩා ඉඩක් ලෙසටයි.

සැකැසුම්: A.B.C.D.E. යනුවෙන් මූලික ප්‍රජා කැටි 5 ක් සැකැසුම් කර ඇත. එකක් මීටර 6 ක් පළල සහ 12 දී බිම් කඩක විහිදුවා ඇත. කැටි සැලැසුම් නිවහන් බිම් පේළි ගැස්වීමෙන් හා මානයන් ගෙන් වෙනස් වෙයි. වෙනත් විකල්ප පෙළ ගැසුම්ද සැලසුම් ද බැරි නොවේ.

| කැටිය | පොදු ප්‍රජා ඉඩ | කැටිය | කැටිය ඉම් තීරුව සහිත |
|---|---|---|---|
| A | 12x36m=432 | 36x60m=2160 | 46x70m=3220 |
| B | 19x36m=684 | 43x60m=2580 | 53x70m=3710 |
| C | 19x39m=741 | 43x63m=2709 | 53x73m=3869 |
| D | 36x32m=832 | 50x56m=2800 | 60x66m=3960 |
| E | 26x25m=625 | 49x49m=2401 | 59x595m=3481 |

වෙනත් සැකැසුම් ද සකස් කර ගත හැකියි.

**<u>ප්‍රවේශය, නිවහන් හා විසිකිළි පිහිටීම.</u>**

කුඩාම ඉඩමෙහි වුවද නිවහනක දෛනික කාර්ය සඳහා අවකාශ සැලසිය යුතුය. ඉඩමේ පාවිච්චිය තීරණය වන්නේ සංස්කෘතික චරියා (ඇබ්බැහිකම්) මගින් නිසා ප්‍රජා කැටි සැලසුම්. කඳවුරු නිවැසියන් සමග සාකච්ඡා කිරීම අතිශයෙන් වැදගත්ය. අලුතෙන් එන්නවුන් නිසා හෝ පසුගිය අත්දැකීම නිසා හෝ සැලසුම් වෙනස් කිරීමක හෝ සංශෝධනය කිරීමක හො අවශ්‍යතාව ඉස් මතු කෙරෙනු ඇත. වෙනත් සැලකිම් හෝ භාවිතාද නිසා වෙනස් සැලසුම් අවශ්‍ය කෙරෙනු ඇත.

වෙනත් විකල්ප වලදී වෙනස් වන සැලසුම් අංග තුනක් වෙයි.

***ගෙයි පිහිටීම:*** ප්‍රවේශය අවටින් / සේවා මාර්ගයෙන් නැත්නම් පොදු ප්‍රජා බිම්කඩය සම්පව.

**පිවිසුම්:** පිවිසුමෙන්, සේවා මාර්ගයෙන් හෝ පොදු ප්‍රජා බිමෙන් කවරෙකින් හෝ,

**වැසිකිළි:** බිම් ස්වභාව, ආරක්ෂා අවශ්‍යතා වටා සේවා මාර්ග පාවිච්චිය, පොදු ඉඩ පාවිච්චිය, සේවා මාර්ග හෝ පොදු ඉඩමේ සිට නිවසට පිවිසුමේ සිට නිවසට පිවිසුම, සේවා මං වලට මුහුණ නිවාස,

හෝ පොදු ඉඩමට මුහුණ ලා පිහිටි නිවාස ආදී ප්‍රායෝගික හා සංස්කෘතික කරුණු සැලකිල්ලට ගෙන සැකසූ තැන් 4 ක බිම් දසුන 4 ක් දක්වායි. වැසිකිළි පිහිටුවන තැන සංවේදී කරුණක් නිසා සෑහෙන අවධානයක් දිය යුතුයි. නිවැසියන්ට ගොඩනැගිලි ද්‍රව්‍ය දීමට පෙර පුද්ගලික වැසිකිළි කැණිය යුතුය.

1. **බිම් දසුන් A1, B1 etc :** සේවා මාර්ග එල්ලේ පොදු වැසිකිළි (කඳවුරු ආරම්භ කිරීමේදී): මේවා සත්කාරක ප්‍රජාව විසින් හෝ මුල් නේවාසිකයන් විසින් අහරට සේවා (බත් වැටුප්) වැනි වැඩ පිළිවෙළ යටගේ කැණිය හැක. එහෙත් එවැන්නක් තාවකාලික පිළිවෙළක් විය යුතුය. පොදු වැසිකිළි හා පවිත්‍රවීමේ තැන් කඳවුර වටා ඉමේ (පෙරිමිටරයේ) නැත්නම් අවම මීටර 50 හෝ ගිනි ඇවුරුම් ඉඩෙහි පිහිටුවිය යුතුය.

2. **බිම් දසුන් A2, B2 etc :** පුද්ගලික වැසිකිළි මධ්‍යම පොදු ඉඩ පෙදෙසෙහි වෙයි. මෙවැන්නකින්, ළමයින්ට රැකවරණ ඇති ක්‍රීඩා පෙදෙසක් වශයෙන් හෝ වෙනත් පොදු කටයුතු සඳහා හෝ පොදු ඉඩ පාවිච්චියට අවකාශ නොලැබෙයි. එවැනි කටයුතු සඳහා පාවිච්චි කිරීමට සිදුවන්නේ පිවිසුම් / සේවා මං ජාලයයි. එවනැනකින් යහපත් තත්වයක සමාජ ජිවිතයකට ඉඩ නොසැලසෙයි. ඒ නිසා මෙය අනුමත කරනු නොලැබෙයි.

3. **බිම් දසුන් A3, B4 etc :** පොදු වැසිකිළි ඒ ඒ ඉඩමට මුහුණලා: මෙයින් පොදු ඉඩ සමාජ කටයුතු වලට යොදා ගත හැකි. පොදු ඉඩමට සමීපව වැසිකිළි තිබීම පිළිකන්නක ගතියක් ඇති කෙරෙයි, නිවහල්වලට පිවිසුම සේවා මංවලින් හෝ පොදු ඉඩමෙන් විය හැක.

4. **බිම් දසුන් A4, B4 etc :** වැසිකිළි සේවා මං වලට මුහුණ ලා පිවිසුම් මගෙන් හෝ පොදු ඉඩමෙන් ඇතුලුවීමට හැකි වනසේ වෙයි. එසේ වුවත් පුද්ගලික ගෙවතු යාබඳව වන, වැසිකිළි ගෙඉඩ පිටිපසෙහි සේවා මං වලට සමීප වන සේත් ඇති මේ සැලසුම පොදු ප්‍රජා ඉඩම සිත්කලු ආකර්ෂණීය තැනක් සේ අවධාරණය කරයි.

සතර ආකාර වූ ප්‍රතිපත්ති පාදක කරගත් මේ සැලසුම් අවට පිවිසුම් / සේවා මං වලත් පොදු ප්‍රජා ඉඩේත් වැදගත්කම හා පාවිච්චිය කෙරෙහි බලපෑමක් කෙරෙයි. වඩා යොග්‍යයැයි තෝරා ගන්නා විකල්පය, මේ ඉඩ කඩ පාවිච්චිය කරෙහිත් දෛනික ජිවිතය කෙරෙහිත් බලපෑමක් කරනු ඇත.

<u>ජල සැපයුම:</u> සෑහෙන තරම් භූගත ජලය ඇති තැන්වල එක් එක් පොදු ඉඩමේ ළිං තැනිය හැකි. වැසිකිළි පුද්ගලික ඒවා විය යුතු අතර ඒ ඒ ගෙවත්තේ පිටුපස ළිංවලින් හැකි තරම් දුරින් ද වැසිකිළි පත්වල බිම් ජල මිට්ටමට මීටරයක් ඉහළින්ද විය යුතුය. බිම් ජල මට්ටම ඉහළවුත් ළිං විශාල ප්‍රමාණයක් අති තැන් වල (විශේෂයෙන්ම දිගු කල් පාවිච්චි වූ කඳවුරක) වළ වැසිකිළි අනුමත කරනු නොලැබේ. ඒ වෙනුවට පොදු කොම්පෝස්ට් වන වැසිකිළි තැනිය යුතුය. කඳවුරු කළමනා කමිටුව ජලයේ තත්වය හා සනිපාරක්ෂා තත්ත්වය අධීක්ෂණය කළ යුතු අතර යාබඳ ප්‍රජා කැටි අතර ගැටළු පාලනය කර යුතුය.

<u>කැළිකසළ අපද්‍රව්‍ය:</u> එක් ප්‍රජා කැටියකට අවම වශයෙන් කැළිකසළ කන්ටේනරයක් හෝ කුණු වළක් තිබිය යුතුය. මෙය මධ්‍යම පොදු ඉඩෙන් බැහැර හෝ සේවා දොරුවෙහි හෝ පිහිටු විය හැක. කුඩා ළමයන් ඒවා තුළට වැටීමෙන් වැළැක්වීමටත් කසල ඇවිස්සීමෙන් (විදුරු කැලි වැනි දෙයින් කැපි තුවාල වීම් ආදියෙන්) වැළැක් වීමටත් ඒවා සලකුණු කොට වටා වැට ගසා තිබිය යුතුය. එකතු කළ කසළ, තැන්පත් කිරීම වළ ලෑම/ වසා දැමීම, යෝග්‍ය ප්‍රවහන ක්‍රමයකින් ඉවත් කිරීම නිතිපතා සේවාවක් මෙන් ඉතාම පහළ පරිපාලන මට්ටමෙන් සංවිධාන කළ යුතුය.

## වැයික්කිය:

වැයික්කිය යන්නෙන් හඳුන්වන්නේ කඳවුරු ව්‍යුහයේ ඊළඟ ඉහළ මට්ටමයි. වැයික්කියේ ජනගහනය සාමාන්‍යයෙන් 800 කි. වැයික්ක පෙදෙසත් එහි නිවැසියන්ගේ පරිපාලන කාර්යවලටත් සමාජ හා සංස්කෘතික කටයුතු වලටත් එය යෝග්‍ය සංඛ්‍යාවක්.

කටයුතු

- වැයික්කිය මීටර 30-50 ගිනි ඇවුරුම් වලින් වටවුනු සාමාන්‍යයෙන් ප්‍රජාකැටි 10 ක පෙදෙක්. ගිනි ඇවුරුම් තුළ වර්ග ප්‍රමාණය දළ වශයෙන් මීටර 220 x 220
- අවම ජල සැපයුම: එක් එක් වැයික්කියේ කේන්ද්‍රීය ජල බෙදාහැරුම් පොළක් (කාරම 4යි) ඇවිදුම් දුර දළ වශයෙන් මීටර 150 යි.
- කෙළි බිම / විවිධ ක්‍රීඩා සහ සෙල්ලම් සඳහා ඉඩ.

## ටවුම,

කඳවුරේ අදියරෙන් අදියරට කෙරෙන සංවර්ධනය සඳහා ඒකකය ටවුමයි එහි මූලික කාරය රැසක් වෙයි, ටවුමේ ජනගහනය වැයික්කි 4 ක නිවැසියන් ගෙන් සැදුනක්. 800 කණ්ඩායම් 4 ක්. 3200 පිරිසක්.

කටයුතු

- ප්‍රධාන චතුරශ්‍රය: පොදු ගොඩනැගිලි ඇති කේන්ද්‍රීය පෙදෙස. මෙතැන මිනිස්සු මුණගැහෙන තොරතුරු හුවමාරු කරගන්න ප්‍රධාන සමාජ බිම, ටවුමේ නැබ.
- ප්‍රාථමික පාසල (විශාලත්වය, ළමයින් සංඛ්‍යාව සහ ජාතික අධ්‍යාපන ක්‍රමය වයස් පරාස. ගුරු/සිසු අනුපාතය අනුව) 1/40 අනුපාතයක් අනුව: පන්ති 16 දෙවරකට. ඒ අනුව පන්ති කාමර 8 ක් සැ.යු මිශ්‍ර හෝ ලිංග පාදක පංති / වාර.
- ඒකාබද්ධ වෙළඳපොළ සහ බෙදා හැරුම් පොළ (ඇවිදුම් දුර අනුව) ටවුමේ නිවැසියන්ට සෑහෙන ඉඩ කඩ ඇතිව මේ කාර්ය දෙක සංවිධානය කළ හැකි තැන්වල.
- ආගමික තැන්: කඳවුරු නිවැසියන් විවිධ ආගම්වලට අයත් තැන්වල, එක් එක් ආගමකට වෙනම ගොඩනැගිල්ලක්.
- අලුතෙන් පැමිණියවුනට සංක්‍රාමික පහසුකම්.

## කඳවුරු: කඳවුරු නගරය

සම්පූර්ණ කඳවුර ටවුම් 3 කින් සැදුනක්. හෝ වෙනත් බහු - සංයුතින් ගෙන් නිවැසියන් 3300 බැගින් වූ ටවුම් (උපරිමය) 6 ක්. දළ වශයෙන් නිවැසියන් 20.000.

කටයුතු

- කඳවුරු කළමනාකරන / පරිපාලන පෙදෙස

  පිවිසුම් / සෝදිසි පල

  කාර්යාල

  ගබඩා

  කඳවුරු කළමනාකාර නිවාස: කඳවුරු කළමනාකරණය සඳහා එක් ප්‍රජා කැටියක් (කළමනාකරණ පිරිසේ ප්‍රමාණය අනුව) කළමනාකරණ පෙදෙසට සම්පව ලබාදිය යුතුයි.

- සායනය (නිවැසියන් 10,000 - 20,000 කට)
- සංස්කෘතිය මධ්‍යස්ථානය හෝ වෙනත් මධ්‍යම සමාජ / සංස්කෘතික කාර්ය: පුහුණු මධ්‍යස්ථානය නගර මට්ටමෙන් වරදෙක් නැති.
- ආගමික ගොඩනැගිලි: කඳවුරු නිවැසියන් වෙනස් ආගම් හෝ අනු ආගම් හෝ නිකාය වලට බෙදී ඇති තැන්වල මෙවා කඳවුර පුරා පැතිර සිටින සේ තැනින් තැන පිහිටුවීම යෝජනා කරන්නේ එක් එක් ටවුමේ එක් එක් කණ්ඩායම් ගොඩනැගිල්ලත් ඔවුන්ගේ ආගමික ගොඩනැගිල්ලත් ද්විකරණය වැළැක්වීම සඳහායි.

## අතිරේක කාර්ය සහ පෙදෙස්.

### මාර්ග

ඇතුළත් කර ඇති සටහනේ පිවිසුම් හෝ අභ්‍යන්තර මාර්ග දක්වා නැත. අභ්‍යන්තර මාර්ග හා සේවා දෙවැට පාගමන් වලට යොදා ගත යුතුයි. කාර් ගමන් හා රිය ගාල් කිරීම, හදිසි අවස්ථාවකදී හැර, ගිනි ඇවරුම් පෙදෙස්වලට සීමා කළ යුතුයි.

### ගොවිතැන්

කෘෂිකර්මය (ගොවිතැන හා සතුන් ඇති කිරීම) ස්වයං පෝෂණය සඳහා වැදගත් වන හෙයින් ඒ සඳහා හැකි සෑම තැනකම ඉඩම් ලබා දීමට ප්‍රමුඛත්වය දිය යුතුයි. ඒ සඳහා ඉඩම් කඳවුරෙන් පිටත විය යුතුය. වගාවලට හානි කිරීම වැළැක්ම සඳහා සතුන්ද පාලනය කළ යුතු වෙයි ගැල් (රැයෙහි) සහ එඩෙරුනුත් යොදවා ගත යුතුයි. එයින් හොරකම් වළක්වා ගැනීමත් එයින් කෙරෙයි.

### දෑව රැස්කිරීම (දරට හා ගොඩනැගිලි සඳහා)

ලෝකයේ බොහෝ ප්‍රදේශවල ඉවුම් පිහුම් හා උණුසුම් කිරීමට ඇති එකම ඉන්ධන ප්‍රභවය දර පමණි. බොහෝ තැන්වල ගොඩනැගිලි වලට විශේෂයෙන්ම වහළ සඳහා දෑව අවශ්‍යයි. අසීමිතව දර රැස්කිරීමට හා ගොඩනැගිලි දෑව රැස්කිරීමට අවකාශ නොදිය යුතුය. ඒ සඳහා විශේෂ තැන් වෙන්කළ යුතු අතර අවශ්‍ය වෙතොත් ප්‍රවාහන පහසුකම් සැපයිය යුතුය. බීජාංකුර සඳහා බිම් අවශ්‍ය වනු ඇත. සත්කාර හෝ අසල්වැසි ප්‍රජාවේ අයිතිකරුවන් සමග සහයෝගය හා ගිවිසීම් අත්‍යවශ්‍ය විය හැක.

### සුසාන භූමි


වෙනස් වෙනස් ආගම්වල වෙනස් වෙනස් අවමංගල්‍ය හා සොහොන් කිරීමේ චාරිත්‍ර ඇත. සොහොන් කිරීම් වලට සෑහෙන ඉඩම් ප්‍රමාණයක් වෙන්කළ යුතුය. සමහර කාලවල වැඩි මරණ සංඛ්‍යාවක් අති විය හැක.

- වසංගත හෝ මාරාන්තික රෝග ඇති කාලවල ඒඩ්ස් රෝගීන්ද ඇතුළුව, විශේෂයෙන්ව දුබල හා අසාධ්‍ය තත්ත්වයේ අය අතර,
- මැලේරියා අන්තරාය අධික ඝර්ම කලාපීය දේශගුණික ප්‍රදේශවල වැසි සෘතුවේ.
- සාමාන්‍යයෙන් දුර්වල සෞඛ්‍ය තත්ත්ව, දුර්වල නිවහල් සහිත හා සෑහෙන පමණ ආහාර සැපයුම නැති ශීත දේශ ගුණය ඇති ප්‍රදේශවල.

### ආරක්ෂාව

රැකවරණය ප්‍රශ්නයක් නම්: උදාහරණ වශයෙන් ස්ත්‍රී දූෂණ, පැහැරගෙන යෑම්, සුළු හොරකම් ආදිය ප්‍රශ්නයක් වුවහොත්, අවශ්‍ය නම් අසල්වැසි / සත්කාරක ප්‍රජාව සමග එක්ව, කඳවුරු පෙරිමිටරයෙත් කඳවුරු ඇතුළෙත්, මුර සංචාරයක් පවත්වා ගැනීමට කඳවුරු නිවැසියන් මුර ඇණියක් සංවිධානය කර ගත යුතුවෙයි. නිවැසියන්, විශේෂයෙන්ම ගැහැනු, අසල පෙදෙස්වල වගා වැඩ සඳහා යන්නේ නම් හෝ අවතැන්වූවන් තමනගේ ගොවි බිම්වල ගොවිතැන් වැඩට අස්වැන් එකතුකිරීම් ආදියට යන්නේ නම් හෝ ඔවුන්ටද අවශ්‍ය උදව් දීමක් මේ බල ඇණියේ තවත් කාරියක් වනු ඇත.


අනවසරයෙන් ඇතුළුවන්නන් අධෛර්ය කරණු පිණිස. කඳවුරු පෙරිමිටරය පහසුවෙන් පෙනිය යුතුවා මෙන්ම විවෘතව තැබිය යුතුය.





**මූලික පසුතලය ජ 10000 කට කඳවුරක්**

1 පාසල්
2 වෙළඳ පොල බෙදහැරීමේ තැන
3 සරණාගත ගොඩනැගිලි
4 සෙල්ලම් කිරීමට තැන/ඉදිරි ව්‍යාප්ත කිරීම
5 පරිපාලනය
6 ප්‍රජා සංස්කෘතික මධ්‍යස්ථාන

රූපය 1




රූපය 2





රූපය 3

රූපය 4



රූපය 5






රූපය 6

කට්ටි (9x12m) නිවාස සහිත (4x6m) සහ වැසිකිලි


රූපය 7



සමූහ වර්ගය 84

ප්‍රජා සමූහයක අහස් දැක්ම

# 3 ප්‍රජා සහභාගිත්වය සහ කඳවුරු කමිටු.



කඳවුරු වැසියන්, ස්වදේශීය අධිකාරීන්, ප්‍රජා නායකයින් සහ එකට එක්වූ අවස්ථාවක්, සියරා ලියෝන් ලාගු කඳවුරේ ආරක්ෂාව පිළිබඳ කරුණු සාකච්ඡා කිරීම පිණිස
ඡායාරූපය එඩුවාර්ඩ් කොම්ප්තෙ වර්දගුවර්

# පරිච්ඡේදය 3 : ප්‍රජා සහභාගිත්වය සහ කඳවුරු කමිටු.

## හැඳින්වීම.

යහපත් ක්‍රියාකාරීත්වයකින් යුත් ප්‍රජාවක් වර්ධනය කර ගැනීමට හෝ පුනර්වර්ධනය කර ගැනීමට ප්‍රජාසහභාගිත්වය ඉතාමත්ම මූලික අවශ්‍යතාවයකි.සහභාගිත්වය මගින් අවතැන්වූවන්ට තමන්ගේ ජීවිත හසුරුවා ගැනීමටත් ,යළි ගොඩ නගා ගැනීමටත් හැකිවන අතර එයින් ඔවුන්ගේ පුද්ගල ශුභ සිද්ධිය කෙරෙහි ධනාත්මක බලපෑමක් කෙරෙනු ඇත. නිවාස තැනීම ,කඳවුරු සැලසුම, ආහාර රුචි අරුචිකම් ආදී කරුණු ගැන හෝ ආගමික පුනර්ජීවනය පිළිබඳව හෝ කඳවුරු නිවැසියන්ගේ අදහස් විමසා බැලීමෙකින් ඔවුන් බලවත් කිරීමට අනුබලයක් ලැබෙන අතර සාමාන්‍ය තත්වයක හැඟීමක් යළි ඇතිකර ගැනීම කෙරෙහි තීරණාත්මක යහපත් වෙනසක් ඇති කරනු ඇත.

ප්‍රජා සහභාගිත්වය යනු අවතැන් ප්‍රජාවේ පුද්ගලයන් හා කණ්ඩායම් ඔවුන්ගේ ඕනෑ එපාකම් හඳුනාගන්නා වූත්, ඔවුන්ගේ අවශ්‍යතාවයන් පළකර සිටින්නාවූත් ඒවා සපුරා ගැනීමට සාමූහිකව කටයුතු කරන්නාවූත් සැලසුම් සහගත ක්‍රියාවලියෙකි.

කඳවුරු ජනතාවේ සහභාගිත්වය ලබගැනීමට හා එයට අනුබල දීමට හැකි මාර්ග රැසක් කඳවුරු කළමණාකරුවනට ඇත.උදාහරණ වශයෙන් , සම්ප්‍රදායික හෝ තෝරාපත්කර ගත් නායකයින්ගේ නියෝජනයෙන්,කඳවුරු කමිටු මගින්, ,කඳවුරු නිවැසියන් හා සේවක මණ්ඩල අතර සුහද හමුවීම් ආදියෙන් හෝ කඳවුරු නිවැසියන් සේවාවන්හි යෙදවීම් ආදියෙන් වැනි මාර්ග දැක්විය හැකිය. වඩාත්ම වැදගත් වනුයේ කඳවුරු නිවැසියන් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී කර ගැනීමයි. සංවිධානමය කාර්ය සම්බන්ධයෙන් වගකීම් පිළිබඳ හැඟීමක් වර්ධනය කර ගැනීමටත්,ප්‍රතිපත්ති ගරුක දක්ෂ නායකයින් හඳුනා ගැනීමටත් කල් ගතවනු ඇත. එසේ වුවද එවැනි ක්‍රියාවලියකින් අවසානයේදී යම් ප්‍රමාණයකට ස්වාභීය පාලනයක් සඳහා මං සැලසෙනු ඇත. නායකත්වය සම්පූර්නයෙන්ම පිරිමින්ට සීමාවූ බොහෝ සම්ප්‍රදායිය සමාජවල කාන්තා සහභාගිත්වය සඳහා උනන්දු කිරීමට විශේෂ ප්‍රයත්න දැරිය යුතු වනු ඇත. එවැන්නක ප්‍රතිඵල හැම විටම, එවෙලේම ලැබෙනු හෝ පැහැදිලිව පෙනෙනු හෝ නැති වුවද ඒ සඳහා ගන්නා ප්‍රයත්න ඉතාමත්ම අගනේය.

කඳවුරු පාලනය හා සැලැසුම් කිරීම් සඳහා අවතැන්වූ ජනතාව සහභාගි කර ගැනීම සාමාන්‍ය තත්වයට පත්ව ඇතැයි යන්න පිළිබඳ හැඟීමක් යළි ඇතිකර ගැනීම සඳහා දායක වෙයි. ඒ හැරුණ විට වෙනත් බොහෝ වාසි ද ඇත.කඳවුරු ජනතාව සමඟ එක්ව කටයුතු කිරීමෙන් දායකත්වයක් ලබා දෙන සමහර කරුණු නම්:

- ජනතාව අතර වැඩි වගකීමක් වර්ධනය කර ගැනීම. කඳවුරු නඩත්තු මට්ටමේ දියුණුවක ඇතිවීම,ප්‍රජාව තුළ ඉදිරිපත්වීමට දිරිගැන්වීමක් හා කඳවුරු නීතිරීති වලට අනුකූලව හැසිරීමට ප්‍රබෝධනයක් වීම,
- තීරණ ගැනීම් ක්‍රියාවලියේ විනිවිද භාවයක්. ආහාර ,ද්‍රව්‍ය හා සේවාවන් සැපයීම් සම්බන්ධ අසහනයන් විනිවිද භාවය මගින් අවම කර ගැනීම.
- නිවැසියන්ගේ ක්ෂතිය(සිතෙහි සැලීම)මග හරවා යළි ප්‍රකෘති තත්වයට පත් කිරීම.සහභාගිත්වය හා ජනයාගේ වගකීම පිළිබඳ හැඟීමේ දියුණුව, ආත්මාභිමානය වර්ධනයකට හා තමන්ගේ ප්‍රශ්ණ විසඳා ගැනීමට තමන්ම යෙදීමේ අවස්ථා ඇතිකිරීමට මග පෑදීම. ආදිය වෙයි.

කඳවුරු නිවැසියන් බලවත් කිරීම පදනම්ව ඇත්තේ අවතැන්වූවන්ගේ ඕනෑ එපාකම් හා රුචි අරුචිකම් හොඳින්ම දන්නේ අවතැන්වූවන්මය යන අවබෝධය මතයි. ඒ නිසා සහන සැලසීමේ උපක්‍රම සාර්ථක විය හැක්කේ කඳවුරු ජනතාව අතර වූ විවිධ කණ්ඩායම් වලට ඔවුන්ගේ සුවිශේෂ අවශ්‍යතා සපුරා ගැනීමට දායකවිය හැකි නම් පමණි. කවර සැලසුමක් ක්‍රියාත්මක කිරීමේදී සාර්ථක වුවද හැකි මුල් පියවරවල සිටම කඳවුරු නිවැසියන් සහභාගි කර ගැනීමත්, මෙසේ සහභාගි කර ගැනීමේ පුරුද්ද කඳවුර නිමාකෙරෙන තෙක් පවත්වා ගෙන යෑමත් වැදගත්ය.

# කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම

## ප්‍රජා නියෝජනය

ප්‍රජා සහභාගිත්වය සහතික කිරීම රඳාපවත්නේ කඳවුර තුළ පවත්නා නායකත්ව ව්‍යුහයේ ස්වරූපය මතයි. වර්තමාන සරණාගත /අවතැන්වූ ප්‍රජා නියෝජිතයන් වූයේ අවතැන්වීමට පෙරත් පාරම්පරික නායකයින් හෝ ප්‍රජානායකයින්ව සිටි අයයි. සියරාලියෝන්හි කඳවුරුවල ප්‍රජාතාන්ත්‍රික නායකත්ව ජන්ද විමසීමේ අත්දැකීම් සහ නායකත්ව වාර මාරුව ප්‍රජාව අතර ඔවුන්ගේ නායකත්වය කෙරෙහි විශ්වාසයත් සහාය දීමට ඇති ඕනෑකමත් , වර්ධනය කෙරීන..

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ මුඛ්‍ය වගකීම

- **නායකයින් තෝරා ගැනීම සඳහා තේරීම්වරණ පැවැත්වීම :** කඳවුර ආරම්භ කළ මුල් කාලයේම නායකයින් තෝරා ගැනීමේ තේරීම්වරණ පැවැත්වීමට උපක්‍රම සකස් කර ,කටයුතු සංවිධාන කර ගත යුතුය.තෝරා පත් කර ගන්නා හැම පිරිමි සභාපති/හෝ කඳවුරු නායකයෙකු වෙනුවෙන්ම ඔහුට හා සමාන වගකීම් හා බලතල ඇති කාන්තාවක්ද වීම සහතික කළ යුතුය (ඇමුණුමේ කඳවුරු ජන්ද විමසීම් සඳහා අවශ්‍ය දේ හා උපකරණ සම්බන්ධ මෙවලම ද ආදර්ශ ජන්ද පත්‍රිකාවද බලන්න)

- **කඳවුරු නියෝජිතයන් සඳහා චරියා ධර්ම පද්ධතියක් නිර්මාණය කර ගැනීම :** සාමාන්‍ය පුද්ගල හැසිරීම් හැඩගැස්වීමට මග පෙන්වන චරියා ධර්ම පද්ධතිය, බලය සහිත තනතුරු දරන සියල්ලන්ටම එකසේ බලපැවත්විය යුතුය. ඒ නිසා සියලු නියොජිතයන් හා කඳවුරු විධායක කමිටු හා වෙනත් තීරක කාරක කමිටු ආදීන් වැනි නායක තරාතිරම් පෙළ සඳහා (හැසිරුම්) ප්‍රමිතීන් නිර්මාණය කර ඒවාට අනුගතවීමට පෙළඹවිය යුතුය.

- **දුක්ගැනවිලි කමිටුවක් පිහිටුවීම:** කඳවුර තුළ සිදුවන ආරවුල්, සුළු අපරාධ හා කඳවුරු නීති රීති උල්ලංඝණයන් විසඳීම සඳහා නිදහස් දුක්ගැනවිලි කමිටුවක් පිහිටුවිය යුතුය. සුළු අපරාධ මේ කමිටු මගින් විසඳිය හැකි වන අතර වඩා බරපතල වැරදි, ජාතික නීති විසර්ජන පද්ධතියට යොමු කළ යුතුය.මේ පරිච්ඡේදයට ඇමිණුමක් ලෙස දුක්ගැනැවිලි කමිටු ආකෘතියක් ඇත.

## කඳවුරේ වෙනත් කමිටු

සහභාගිත්වය සඳහා කඳවුරු නිවැසියන් උනන්දු කිරීමේ එක් විධියක් නම් කඳවුරේ සැලැසුම් ව්‍යුහයට අනුරූපීව කමිටු ඇති කිරීමයි. සියරාලියෝන්හි පුද්ගලයන් 100 ක් පමණ වූ නිවාස 16ක කැටි වලින් සැදි කඳවුරු සැලැස්ම අනුව වෙනස් වෙනස් කැටිවල ප්‍රජාවට එක් කැටියක නිවැසියන් වෙනුවෙන් පෙනී සිටීමට, පිරිමි හා ගැහැණු නායකයින් දෙදෙනෙකු බැගින් තෝරා ගැනීමට දිරි ගැන්විනි.මේ අනුව හැම 100 දෙනෙකු වෙනුවෙන්ම නියෝජිතයෝ දෙදෙනෙක් වූහ. මුල් කාලයේදී මොවුන් අතරෙන් කඳවුරු විධායකයින් එනම් සභාපතියෙකු හා සභාපතිනියකද තෝරා ගැනිනි.

කඳවුරු නිවැසියන්ගේ සහභාගිත්වය ලබා ගැනීමට ඔවුන් උනන්දු කිරීම සඳහා තවත් අනගි අදහසක් නම්, ජලය, පොදු හා පුද්ගල සනිපාරක්ෂාව, ආහාර බෙදා දීම ආදිය හා වෙනත් ආංශික උවමනාවන් සඳහා වෙන් වෙන් අනු කමිටු පිහිටුවීමයි. එක් නිවාස කැටියක් වෙනුවෙන් කුඩා අනුකමිටු පිහිටුවීමෙන් එක් එක් අංශය සම්බන්ධ ගැටළු අනාවරණය කර ගැනීමටත් විසඳුම් සොයා ගැනීමටත් ඒ ඒ අංශය සම්බන්ධයෙන් මතුවන විවිධ කරුණු ගැන විමසා බැලීමටත් ඉඩ සැලසෙයි. කඳවුරු නිවැසියන් සමග අදහස් හුවමාරුව සඳහා කළමනාකරුවකුට ඇති ප්‍රථම මෙන්ම මූලික සංනිවේදන මාර්ගය ද මෙය විය හැක.

## කඳවුරු කමිටු : කඳවුරු නිවැසියන්ගේ නායකත්ව ව්‍යුහ සැලැසුම් කිරීම- සියරාලියෝන් මාදිලිය.

2002කේදී සියරාලියෝනයට ගලා ආ ලයිබීරියානු සරණාගතයින්ට යහපතක් සැලසුනේ නිදහස් සරණාගත තේරීම් වරණවලට දුන් උද්යෝගි අනුබලයත්, පසුව, සියරාලියෝන්හි කඳවුරු තත්ව යටතේ තෙරීම්වරණ පැවැත්වීම නිසා වෙනුත්ය.
ලයිබීරියානු සරණාගත කඳවුරුවල සරණාගත විධායක කමිටු සඳහා දිරිගැන්වීමටත් ඒවා පිහිටුවීටත් රජයේ ආයතනයක්වූ සමාජ ක්‍රියාකාරිත්වයන් සඳහා වූ ජාතික කොමිසම (NaCSA) එක් ප්‍රධාන කාරකයෙක් විය. NaCSA යෙන් යෝජනා කෙරුන නායකත්ව පෙළ ගැස්ම යට දැක්වෙන ආකාරයට වීය.

- මුලසුන්පති
- සම-මුලසුන්පති
- මුලසුන්පතිනි
- සම මුලසුන්පතිනි
- ලේකම්
- උප ලේකම්
- තුරුණුවෙක්
- තරුණියක්
- සම්බන්ධතා නිලධරයෙක්.

මොවුනට අතිරේකව කඳවුරු ප්‍රජාවේ එක් එක් ගෝත්‍රිය කණ්ඩායමෙන් එක නියේජිතයෙකුගෙන් සැදි වැඩිහිටි මණ්ඩලයක් පිහිටුවීමට ද NaCSA යෙන් යෝජනා කෙරිනි. වැඩිහිටි මණ්ඩලයට පැවරෙනුයේ විධායක කමිටුවට උපදේශණ මණ්ඩලයක් සේ කටයුතු කිරීමත්, කඳවුරු අතුරු නීති උල්ලංඝනයන් සම්බන්ධ මතභේද පසිඳලීමත් (වැඩි ජන්දයෙන් ,දුක්ගැනවිලි කමිටු තිරණ අනුමත කිරීම හෝ වෙනස් කිරීම) සහ බටහිර අප්‍රිකාවේ සම්ප්‍රදායික ගෝත්‍රිය නායකයින්ගේ ගරු සේවා කාර්ය භාරය ඉටුකරණ ආදේශකයන් සේ කටයුතු කිරීමටත්ය.

මේ නිලතල වල කාලය අවුරුද්දක් විය. එහෙත් ඔවුන් පෙන්වූ කාර්යක්ෂමතාව හා කඳවුරු නිවැසියන්ගේ මනාපය අනුව විධායක කමිටු සාමාජිකයින් නැවත තෝරාපත් කර ගත හැකිවිය.

### විධායක කමිටු කාර්ය භාරය පහත සඳහන් පරිදි විය

- කඳවුරු නිවැසියන් හා පහත සඳහන් ආයතනයන් අතර සම්බන්ධීකරණය:කඳවුරේ පොදු ශුභ සාධනය හා කඳවුරතුළ සාමාකාමී තත්වයක් පවත්වාගැනිම සඳහා හ්සිලධක්‍ෂ්‍ය,සත්කාරක ප්‍රජාව, කළමනාකරණ ඒජන්සිය සහ වෙනත් මානව ශුභසාධන ආයතන සමග සම්බන්ධීකරණය පවත්වාගැනිම.
- කඳවුරු පවත්වාගන යැමේදී මතුවන ප්‍රශ්ණ සඳහා අවශ්‍ය කටයුතු කිරීම්, ස්ථාපිත නිත්‍යානුකුල ආයතන මාර්ග ඔස්සේ කෙරෙන බවට සහතික කිරීම.
- කඳවුරේ සියලු නිවැසියන්ගේ පොදු ශුභසධනය හා සම්බන්ධ කරුණු ගැන වැඩිහිටි මණ්ඩලයෙන් උපදෙස් ලබා ගැනිම.
- අනු කමිටු සමග නිති පතා රැස්වීම් හා සාකච්ජා මගින් ස්ථාපිත අනුකමිටු කටයුතු සම්බන්ධීකරණය.

මූලාශ්‍රය:
මෙහි දක්වා ඇති ආදර්ශ සරණාගත නායකත්වය ව්‍යුහය සියරාලියෝන් කඳවුරු වල ස්ථාපනය කොට පවත්වා ගැනිමට දිරිදෙන ලදී. මේ කඳවුරුවල ප්‍රජාතන්ත්‍ර තේරීම්වරණ පැවැත්වීම උනන්දු කරවීම ඉතාම සාර්ථක ව්‍යායාමයක් විය. නායකයින් හා නායකත්ව ව්‍යුහය පිළිබඳ විශ්වාසය ශක්තිමත් විය.

සරණාගත කඳවුරු සඳහා සියරාලියෝනු අතුරු නියෝග,UNHCR උපකාර්යාලය කෙනෙමා, සියරාලියෝන්.

කඳවුරු කමිටු සහ වැඩිහිටි කවුන්සලය යන දෙකම කඳවුරු නිවැසියන්ට වගකීමක් පිළිබඳ අදහසක් ඇතිකර ගැනීමටත් අන්‍යෝන්‍ය සහයෝගය පිළිබඳ හැඟීම් දියුණු තියුණු කර ගැනීමටත් දිරිදෙනු ඇත.එක් එක් කළමනාකරුට හා කළමනාකරණ ඒජන්සියට, තම තමන්ගේ සුවිශේෂ සංස්කෘතික හා කඳවුරු තත්වයන් යටතේ ක්‍රියාත්මක කළ හැකි, නිවැරදි සංවිධාන ව්‍යුහයන් සොයාගැනීම අවශ්‍යය යන්න පැහැදිලිය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ මුඛ්‍ය වගකීම්.

කමිටු හෝ අනු කමිටු පිහිටුවීමේ දී එයට සහභාගිවීම සඳහා ප්‍රජාව උනන්දුකිරීම අතිශය වැදගත්ය. ප්‍රජා සහභාගිත්වය සඳහා දිරිගැන්වීමට පහත දැක්වෙන පියවර ගැනීමට සිත් යොමු කළ යුතුය.



**සියරා-ලියොන්, රජය මැතිවරණය දිරිමත් කළේය. ලයිබීරියන් සරණාගත කඳවුරුවල සරණාගත කවුන්සල පිහිටුවීම.**
ඡායාරූපය : OCHA

- **ප්‍රජා රැස්වීම් ස්ථාන:**කඳවුරෙහි සෑහෙන පමණ රැස්වීම් පොළ වෙන්කොට සාදා දිය යුතුය.(ගිනි කපොලු මේ සඳහා යොදා ගත හැක.)මේවා විශේෂ ආවරණය වූ කුටි., සාම නිවහන් හෝ එළිමහන් තැන් විය හැක. උණුසුම් කාලගුණයක් පවතී නම් සෙවන . ජලය සහ වෙනත් පහසුකම් ඇති තැන් ලබා දිය යුතුය,

- **සහභාගිවන්නන් හඳුනා ගැනීම:** විවිධ මට්ටම් වලින් සහභාගිවීමට උනන්දුවක් දක්වන කඳවුරු නිවැසියන්ගේ ලේඛණයක් සකස්කර ගැනීම කණ්ඩායමට සෙරෙන යෝජනාවෙකි. පුද්ගලික ලැදිකම හා හකියාවන් ලේඛණ ගත කර යුතුය.

- **කමිටු පිහිටුවීම:** කවර කමිටු පිහිටුවා ගත යුතුද යන්න ප්‍රජා නියෝජිතයන් සමග සම්බන්ධිකරණයෙන් කර ගැනීම අතිශයෙන්ම වැදගත්ය.මුල්ම පියවරේ සිටම ප්‍රජා නායකයින් හවුල් කර ගත යුතුය

- **හැකියා වර්ධනය හා පුහුණුව :** හැකියා වර්ධනය හා පුහුණුව හා සම්බන්ධ ක්‍රියා ඒ සඳහා ශක්තියක් වෙතැයි සලකන කණ්ඩායම් හා පුද්ගලයන්ට ඇතිකර දිය යුතුයි.මේවා පරිපාලන හෝ සමාජ වැඩ  ක්ෂේත්‍රවල විය හැකිය.මේ සම්බන්ධයෙන් ප්‍රජා සේවා නිලධාරීන් හා වගකීම් දරණ විවිධ ඒජන්සි සමග සම්බන්ධීකරණයක් ඇති කර ගත යුතුය. ඒ අතරම  අවතැන්වූ ප්‍රජාව සැලසුම් සම්පාදනයෙහි හා ක්‍රියාත්මකරණ පියවරයන්හිදී සහභාගී කර ගැනීමට මේ ඒජන්සි උනන්දුකරවිය යුතුය.

- **අදහස් ප්‍රකාශකිරීමේ නිදහස:**කඳවුරු කළමනාකරන කණ්ඩායම විසින් නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට  දිරිගැන්විය යුතු අතර ප්‍රයෝජනවත්  විවේචන පිළිගැනීමටද කැමතිවිය යුතුය.

## කමිටු පිහිටුවීමේදී සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණු සමහරක්.

- **චර්යා පද්ධතියක්. :** කවරම හෝ කමිටුවකට හෝ නායකත්ව ව්‍යුහයකට මිනිසුන්ගේ  හැසිරීම් මෙහෙයවන චර්යා පද්ධතියක් ගොඩනගා ගත යුතු අතර එහි අන්තරගත ප්‍රමිතීන්ට අනුගාමීවීමට පෙළඹවිය යුතුය.(පරිච්ඡේදය 5,සහ 7 ද ලිංග මූලික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමද බලන්න)

- **කමිටු විශාලත්වය :** අනුගමනය කළ යුතු සාමාන්‍ය රීතියක් සේ සැලකුවොත් 30කට වඩා විශාල කමිටු ඒත්තු ගැන්විය නොහැකියි

- **නිතිපතා වාරමාරුව :** පදවි දැරීම් නිතිපතා වෙනස්කළ යුතුය. නිතිපතා ජන්ද විමසීම්ද පැවැත්විය යුතුය. කඳවුරු/ප්‍රජා නියෝජිතයින් නිතිපතා වාරිකව තෝරා පත් කර ගත යුතුය(අවුරුද්දක කාලයක් යෝග්‍යයි)ඒ අතරම එක් අයෙකුට කොපමණ වාර ගණනක් ජන්දයට ඉදිරිපත් විය හැකිද යන්නත් පිළිබඳ රීති  සකස්කර ගත යුතුය.

- **ඉවත් කිරීමේ ක්‍රියාවලිය :** සතුටුදායක නොවන නියෝජිතයින් ඉවත් කිරීමට ඉල්ලා සිටීමට ජන්ද දායකයිනට අවකාශ දිය යුතුය.නියෝජිතයකු ඉවත්කිරීමට අවසර සලසන  ක්‍රියාමාර්ග සකස්කර ගැනිම අතිශය වැදගත්ය. අකාර්යක්ෂමතාව නිර්නය කරන සාධක හා කොන්දේසි  ඒ ක්‍රියාමාර්ගයේ අන්තර් ගත අංගයක් විය යුතු අතර අළුතෙන් ජන්ද විමසීමක් පැවැත්වීමට  නම් ඒ කොන්දේසි සපුරා තිබිය යුතුය. විවිධ කමිටු සමග සහභාගිත්වයෙන් කඳවුරු කළමනානරුවෙකු විසින් මේ නිර්නායක සාධක නිර්මාණය කර ගත යුතුයි.

- **සමාන සහභාගිත්වය :** මේ කමිටු පිහිටුවීමේදී කඳවුරු ප්‍රජාව තුළවූ විවිධ කණ්ඩායම් (කාන්තාවන්,තුරුණුවන්,ළමයි,වැඩිහිටි සහ ආබාධිතයන්, ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් ආදීන්)නියෝජනය වීම තහවුරු කිරීම අතිශය වැදගත්ය.ඒ හා සමානවම වඩා ආපදාගෝචර අයට (උදාහරණ වශයෙන් ආබාධියන්, කාන්තා මූලික නිවහන්, HIV/AIDS වැළඳියන් ඇති නිවෙස් හි වූ අය/හැකි නම් ඔවුන්ගේ නියෝජිතයින්) සමාන නියෝජනයක් ලබා දීමත් ඔවුන්ගේ හඬ පැහැදිලිව ඇසෙන්නට සැලැස්වීමත් අතිශය වැදගත්ය.

- **කාන්තා සහභාගිත්වය :** සියලුම නායකයත්ව තරාතිරම් හා කමිටුවල කාන්තා සහභාගිත්වයට අනුබල දිය යුතුය. සියලු නායකත්ව ව්‍යුහයන්හි සියයට 50 ක කාන්තා සහභාගිත්වයක්  ඇතිකර ගැනිම ඉලක්කයක් විය යුතුය.

- **පක්ෂග්‍රාහිවීමෙන් වැළකීම :** එක කණ්ඩායමකට,එක කමිටුවකට,හෝ එක් පුද්ගයකුට හෝ විශේෂ සැලකිල්ලක් පෙන්වීමෙන් වැළැකෙන සේ යෝජනා කෙරෙයි.

මනා කඳවුරු නිවැසි නායකත්වයක් ඇතිකර ගැනිම කල් ගතවන කාරියක්  බව වටහා ගැනීම වැදගත්ය. කඳවුරු නායක්ත්වය මගින් දිරිගැන්වීමේ දීමනා ඉල්ලීම බොහෝවිට මුදල් වේතනයක් ඉල්වීමෙක් නොවේ. රැකියාවකින් මුදල් උපායා ගැනිම සඳහා යෙදවිය හැකි කාලය පරිපාලන කටයුතු සඳහා ස්වේච්ඡාවෙන් යොදවන දිගු කාලය සඳහා  සාධාරණ වන්දි දීමනාවක් සඳහා කෙරෙන ඉල්වීමක් සේ සැලකිය හැකිය. බොහෝවිට කඳවුරු නායකයෝ හුදෙක් නායකත්ව කාරිය වලට පමණක් යෙදෙනු වෙනුවට වෙනත් අයුරින් රැකියාවන්හි නිරතවිය හැකි උගත් පුද්ගලයෝ වෙති. ඔවුන්ගේ ප්‍රයත්නවලට නිර්මාණශිලි සහාය දැක්වීමේ මාර්ග සොයා බැලිය යුතුය.

**සැලකිල්ලට යොමු කළ යුතු කරුණු අතර මේවාද වෙයි.**

- **නිර්දේශිත කොන්දේසි :** කඳවුරු කළමනාකරණ කණ්ඩායම මගින් නායකත්ව ව්‍යුහයක් සහ කඳවුරු ප්‍රජාව සහභාගිකර ගැනීමක් සඳහා කොන්දේසි මාලාව/වගකීම් පද්ධතියක්ද සැලසුම් කර යුතුය.

- **තොරතුරු විසුරුවා හැරීම :** භාෂා හා උපභාෂා රාශියකින් නිරවුල් තොරතුරු විනිවිද බවකින් බෙදා හැරීම සඳහා කළමණාකරණ කණ්ඩායම් උපාය මාර්ග නිර්මාණය කර ගත යුතුය. හැම දෙනා අතර තොරතුරු සමසේ බෙදී නොයයි. නායකත්ව කාරිය වල යෙදුන අය ලබන තරම් සමාන නිරවුල් පැහැදිලි තොරතුරු කඳවුරේ සිටිනා අකුරු නොදන්නා අය හා වඩා ආපදා ගෝචර අයටද ලබාදීම තහවුරු කිරීම ඉතා වැදගත්ය.

- **ප්‍රජා සුසංවේදීකරණය :** අළුතෙන් එන නිවැසියන්හට ජන්ද ක්‍රියාවලිය, නායකත්ව ව්‍යුහය, හා කමිටු පිළිබඳ දැනීමක් අවබෝධයක් කළමණාකරණ කණ්ඩායම විසින් ලබා දිය යුතුය.

- **සත්කාරක ප්‍රජා සහභාගිත්වය:** සත්කාරක ප්‍රජාව හා අවතැන්වූවන් නුදුරෙහි ජීවත්වන විට අන්තර් පුද්ගල සම්බන්ධතා,හා සබඳකම් වර්ධනය සඳහා දිරිගැන්විය යුතුය. මෙය සම්ප්‍රදායික නායකයින් හා නායක වැඩිහිටියන් අතර, තරුණ කණ්ඩායම් අතර,කාන්තා සංසද අතර ආදි වශයෙන් විවිධ මට්ටම්වලින් සිදුවිය යුතුය. සංස්කෘතික කටයුතු ,ක්‍රීඩා හා ධනාත්මක අන්තර් සම්බන්ධකම් වලට දිරිගැන්වෙන වෙනත් කාර්ය කඳවුර හා සත්කාරක ප්‍රජාව අතර අන්‍යෝන්‍ය සබඳකම් වර්ධනය සඳහා උනන්දු කිරීමට හොඳ මාර්ගවෙයි.

කඳවුරු ප්‍රජාව අතරෙන් සත්කාරක ප්‍රජා සම්බන්ධතා නිලධාරීයකු හඳුනා ගැනීම, සත්කාරක ප්‍රජාව හා අවතැන් ප්‍රජාවන් අතර සුහද සබඳතා ඇතිකර ගැනීමට හොඳ ප්‍රවේශයක් වෙයි. කටයුතු සම්බන්ධීකරණය, ගැටළුවලට සහ/හෝ හැළහැප්පිළි වලට සහ තොරතුරු බෙදා හදා ගැනීම් ආදියට සම්බන්ධතා නිලධාරියා හොඳ කේන්ද්‍රිය පුද්ගලයෙක් වනු ඇත.

**ස්වේච්ඡාවෙන් ආපසු යන අවදියේ ප්‍රජා සහභාගිත්වය.**

ප්‍රසන්න ස්වේච්ඡා ආපසු යාමක් ප්‍රජා සහභාගිත්වය මත තදින්ම රැඳී සිටියි. ආපසු යැම් සමයේ සහ කඳවුරු වසා දැමීමේදී ප්‍රජා නායකයින්ගේ කාර්ය භාරය අතිශය වැදගත්වෙයි. ඒ නිසාම ආපසු යැවීමේ ඒ ඒ පියවරවල් සම්බන්ධව සම්පූර්ණයෙන්ම ඔවුන් දැනුවත් කර යුතු අතර ඒ ඒ පියවරේදී ඔවුන්ගේ සුවිශේෂ කාර්ය භාරය ඔවුන් දැන සිටිය යුතුය. ආපසු යැවීමේ කටයුතු සම්බන්ධයෙන් මතුවන යම් ගැටළුවකට යොමුවීමට ඔවුන්ට හැකි විය යුතුය. අදාළ තොරතුරු නිසි පරිදි සන්නිවේදනය කිරීමට හැකි විය යුතුය. ස්වේච්ඡා විසිරී යෑම සම්බන්ධ කටයුතු සැකසීමේ හා සැලසුම් කිරීමේදී කඳවුරු නිවැසියන් නියම් ලෙස සහභාගිකර ගැනීම කඳවුර වසාදැමීමේ ප්‍රායෝගික අත්දැකීමක් ලබාදීමට එක් පහසු මගෙකි. කඳවුර හැර යාම සඳහා සූදානම්වීමක් වශයෙන් තමන්ගේ රටට හෝ සාමාන්‍යයෙන් නිත්‍ය පදිංචිය තුබූ තැනට ගොස් දැක බලා ගෙන ඒමට නිවැසියන්ට අවසර දිය යුතුය.

---

## ▷▷▷ කඳවුරු කළමණාකාර කණ්ඩායමේ මුඛ්‍ය වගකීම්.

---

- **සැලසුම් සංවිධානයට සම්බන්ධවීම :** සැලසුම් සංවිධාන කාර්යවලට කඳවුරු නිවැසියන් සම්බන්ධ කර ගැනීම කඳවුරු කළමනාකාර කණ්ඩායමට යෝජනා කෙරෙයි. ප්‍රවහනය සම්බන්ධ විවිධ ගෝත්‍රික හා සංස්කෘතික අවශ්‍යතා සඳහා තොරතුරු ලබා දීමෙන්ද ,වගා කන්න හා මාර්ග පහසුව ආදිය පාදක කර ගෙන පිටත් කර යැවීමේ ප්‍රමුඛතා සකස් නිශ්චය කර දීමෙන්ද, ආපසු ගෙන යායුතු තැන්, සැලසුම් කර ගැනීමට ඔවුන් හොඳ තොරතුරු සපයන්නන්වනු ඇත.

- **සංවේදීකිරීම සඳහා හවුල් උපාය මාර්ග. :** ආපසු යැවීමේ සමස්ත ක්‍රියා වලිය සියලු අංග සම්බන්ධයෙන් කඳවුරු නිවැසියන් සියලු දෙනම දැනුවත් කිරීම කළමනාකරණ කණ්ඩායමේ අරමුණ විය යුතුයි. මුල් භාෂා රාශියක් ඇති කල්හි එක් එක් මවු බසින් තොරතුරු ලබා දීම අතිශය වැදගත්ය. සුගම ක්‍රියාවලියක් සහතික කර ගැනීමට ,ආපසු යැවීම් පිළිබඳ සියලු තොරතුරු ප්‍රජාව සමග බෙදා හදා ගැනීම,තීරණාත්මක වෙයි.

- **තොරතුරු පතුරුවා හැරීමේ ක්‍රම** : තොරතුරු පතුරුවා හැරීමේ ව්‍යාපාරය නිර්මාණාත්මක ක්‍රම භාවිතයෙන් සැලසුම් කර සකසා ගන්නා ලෙස යෝජනා කෙරෙයි. සාමාන්‍ය දේශනවලට වඩා රැඟුම් කණ්ඩායම්, අත්පත්‍රිකා, පෝස්ටර ,රේඩියෝ හා වෙනත් මාධ්‍ය ඔස්සේ ප්‍රචාර, දැකබලා ගැනීමේ චාරිකා, නිවැසියන් සමඟ තොරතුරු බෙදා හදා ගැනීමට පලදායි මාර්ග වෙයි.

- **ආපසු යැම සඳහා ලියා පදිංචිවීම** ; ආපසු යැමට සූදානම් අය විශේෂයෙන්ම ආපදා ගෝචර අය ලියාපදිංචිකිරීමට සහායවීම සඳහා කඳවුරු නායකයින්, කඳවුරු කළමනාකරු/UNHCR ය සමග එක්ව  කටයුතු කර යුතුයි.

- **කඳවුර වසා දැමීම** : අවසානයට පිටමං වන්නන් ප්‍රජා නායකයින් විය යුතුය. ඔවුන් ඒකල නිවහන් හා ගෙවල් ගලවා ඉවත් කිරීමට සම්බන්ධ විය යුතුය. කුඩාරම් වෙයි නම් ඒවා නවා අසුරාලිය හැක.මැටි ගෙවල් කඩා ඒ තැන්වල ගස් සිටුවිය හැක

## මෙවලම් කට්ටලය

**කඳවුරු ජන්ද සඳහා භාණ්ඩ සහ උපකරණ (IRC)යෙනි**
කඳවුරු ජන්ද සඳහා සැලසුම් කිරීම හා ජන්දයට අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීම හා බෙදා හැරීම සම්බන්ධ  මූලික කරුණු ප්‍රශ්ණ ආදිය මෙයින් හඳුන්වා දෙයි.

**ආදර්ශ ජන්ද පත්‍රිකාව (IRC)යෙනි**
කියවීමට ලිවීමට නොදන්නා නිවැසියන් විශාල සංඛ්‍යාවක් ඇති කඳවුරු වල ජන්ද සඳහා ගත හැකි ජන්ද පත්‍රිකාවක ආකෘතියෙකි. මනාප අපේක්ෂකයාගේ සංකේතය ඉදිරියෙන් සලකුණක් හෝ මුද්‍රාවක් යෙදීම අදහස් කෙරේ.

**සරණාගත විධායක කමිටුවක් සඳහා කොන්දේසි මාලාව (UNHCR sub** office Kenema district Sierra Leone)
මේ කොන්දේසි මාලාව නිර්මාණය කර ගනු ලැබුයේ සියරාලියෝන්හි සරණාගත කඳවුරු වල සරණාගත විධායක කමිටු සඳහායි.කොන්දේසි මාලාව විධායක කමිටුවෙන් අපේක්ෂාකරණ දේ දක්වා ඇති අතර හැසිරීම් හා විනිවිදභාවය පිළිබඳ ප්‍රමිතීන්ද සපයා ඇත.

**දුක්ගැනවිලි කමිටුවක් සැලසුම් කිරීම (සියරා ලියෝන් ආදර්ශකය)**
දුක්ගැලවිලි කමිටු මාදිලිය ගෙන ඇත්තේ සියරා ලියෝන් UNHCRයෙනි. අතුරු නිති (අමුණා නැත) කඳවුරු තත්වය යටතේ ආරවුල් හා සුළු අපරාධ පසිඳලීමට මඟ පෙන්වීමක් වශයෙන් වෙයි.

## Reference Tools

***People-Oriented Planning: A Practical tool for Refugee Workers***
((Anderson,M.B.,HoworthA.M.,(Brazeau),Overhold,C. 1992
A Framework for People-Oriented Planning(POP) in Refugee Situations Taking  Account of Women.Men and Children.Geneva UNHCR)

UNHCR  කාර්ය මණ්ඩලයට හා හවුල්කරුවන් උදෙසා කළ මේ සැලැසුම් කිරීමේ මෙවලම කවරම හෝ සරණාගත/අවතැන් කණඩායමක් සම්බන්ධයෙන් වැදගත් කරුණු අනාවරණය කරගැනීමට උදව් වෙයි. මේ තොරතුරු (ජනගහන, සංස්කෘතික හර පද්ධති හා සිරිත් විරිත්) ඵලදායි සැලසුම් සම්පාදනයට අවශ්‍යවෙයි. වැඩසටහන් සම්බන්ධ හොඳ තිරණ ගැනීමටත් ඵලදායි වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමටත් හැකිවන සේ තොරතුරු සංවිධාන කර ගැනීමටත් උපකරණ මෙය ලබාදෙයි.

## අවශ්‍ය කියවීම් හා ආශ්‍රේයයන්.

- එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස් 1994, සරණාගත දරුවන්, රැකවරණය සහ සත්කාරය පිළිබඳ නිර්නායකයන් පිනිවා - UNHCR

- වෙයිස්, ඩබ්. එම්., බෝල්ටන්, පී. සංකර්, ඒ.වි. බැල්ටිමෝර්, ජෝන්ස් හොප්කිං විශ්ව විද්‍යාලය, CERTI ව්‍යාපෘතිය, නිව් ඕර්ලියන්ස්, අන්තර්ජාතික සංවර්ධනය සහ තාක්ෂණය මාරු කිරිම සඳහා වන පේසන් මධ්‍යස්ථානය, තුලානෙ විශ්ව විද්‍යාලය, 2000 ක්ෂණික ඇගයීම් පිළිවෙත් (RAP) , සහභාගිත්ව ඉගැන්ම සහ ක්‍රියාකාරිත්වය මගින් අභ්‍යංතර අවතැන් වුවන් සහ සරණාගතයින්ගේ අවශ්‍යතා ඇමැතිම.

- ෆෘඩන්බර්ගර්, කේ. 1998, කඩිනම් ග්‍රාමිය ඇගයීම (RRA) සහ සහභාගිත්ව ග්‍රාමිය ඇගයීම (PRA) : CRS ක්ෂේත්‍ර සේවකයින් සහ පාර්ශ්වකරුවන් සඳහා අත්පොත , මැල්ටිමොර් : කතෝලික සහන සේවා, සම්පුර්ණ පෙල සඳහා on-line http://www.–tholicrelife,org/pwbli–tion/issue/cfm

- IASC , 2003, HIV/AIDS , හදිසි තත්ත්වයන්වල සඳහා නිර්නායක.

- අන්තර්ජාතික ගලවා ගැනිමේ කමිටුව, 2003 අනාගතය සුරකිම, HIV වැළක්වීම, සත්කාරය සහ සහාය අවතැන් වු සහ යුද්දයෙන් බලපෑම් වු ජනතාව අතර.

  - www.unhcr.ch
  - www.ineesite.org (inter-Agency Network for Education in Emergencies)
  - www.catholicrelief.org
  - www.unaids.org
  - www.theirc.org

# කඳවුරු ඡන්ද සඳහා ද්‍රව්‍ය හා උපකරණ

### සැපයුම් වැඩසටහනක් (ෆ්‍රෝග්‍රෑම) ගොඩනගා ගැනිම.

ඡන්ද පැවැත්වෙන දින සඳහා සියල්ල සූදානම් බව සහතික කරගැනිම සඳහා ඡන්දයට අවශ්‍ය ද්‍රව්‍ය සඳහා සැලැසුම් සම්පාදනය, උපකරණ ලබාගැනිම හා බෙදා හැරීම, ඡන්ද කළමනාකරන්නන්ගේ ප්‍රධාන යොමුවීම විය යුතුයි.

සැපයුම් වැඩ සටහන් සම්පාදනය කිරීමේදී සමස්ත අවධානය යෙදිය යුත්තේ : සැලැසුම් කරන භාණ්ඩ හා උපකරණ:

- පිරිවැය-ඵලදායිතාව සලකා මිලට ගැනිමට,
- භාවිතයේ පහසුව .විශේෂයෙන් ඡන්ද දායකයන්ට පාවිච්චිය සඳහා වන දේවල් සඳහා අවධානය විය යුත්තේ සැකැස්ම සරල බවට.
- සැලැසුම් සහගත සපයා ගැනිම් පටිපාටියකට අනුව ලබා ගැනිම (මුල සිටම ඉතාමත්ම සැලකිල්ලෙන් හා සම්පූර්ණ වශයෙන් සියළු ද්‍රව්‍ය උපකරණ අවශ්‍යතා සැලසුම් කර ගැනිමට
- කඳවුරු පරිසර තත්වයනට ගැලපෙන බවට
- ඡන්ද වපුහයේ නිතිමය වගකිම් සපුරාලන ඒවා විය යුතු බවට
- සියලූ ඡන්ද ක්‍රියාවලින් සඳහා නිසි ආරක්ෂාව හා විනිවිදබව ලබාදෙන බවට.
- ඡන්දයට සූදානම් විම හා ඇතිවිය හැකි ඌනතා පියවා ගැනිමට අවශ්‍ය සැලැසුම්, අවශ්‍යවිට කල්තියා ක්‍රියාත්මක කිරීම පිණිස උවමනා කරන අඛණ්ඩව ඇගයීමක් සඳහා පරිපූර්ණ හා නිතිපතා අධික්ෂණයට භාජන කිරීමට ආදියටයි.

## පාලන පියවර

ඡන්දයට භාවිත කළ ද්‍රව්‍ය හා උපකරණ සපයා ගැනීම, බෙදා හැරීම පාවිච්චිය හා ඡන්ද ද්‍රව්‍ය ආපසු දීම ආදිය සඳහා පාලනයක් අවශ්‍ය වන්නේ පහත සඳහන් කරුණු සහතික කර ගැනීම සඳහායි.

- මුදල් පරිහරණයේ විශ්වසනීය බවත් සම්පත් නාස්තිය වළක්වා ගැනීමටත්,
- ඡන්දයට සූදානම සහතික කරගැනීම සඳහා, උපකරන ඇති ස්ථානය, ඒවායේ ප්‍රමාණය හා තත්වය ගැන ඡන්ද කළමනාකරුවන් හැමවිටම දැනුවත්ම සිටීමට සහ ඌනතා මගහරවා ගැනීම සඳහා ගතයුතුවන පියවර ගැනීමටත්,

ද්‍රව්‍ය හා උපකරණ පාලනය සඳහා අවශ්‍ය පාලන අංගවලට පහත සඳහන් දේ ද ඇතුළත් වෙයි. ·

- සපයා ගත යුතු සියලු භාණ්ඩ හා උපකරණවල පැහැදිලි පිරිවිතර,
- අනුමත කිරීම් හා නඩත්තු පිරික්සුම් වැඩසටහන්,
- සම්මත හඳුනාගැනීම් සඳහා සියලු භාණ්ඩ හා උපකරණ ක්‍රමානුකූලව අංක යෙදීමේ ක්‍රමයක්
- භාණ්ඩ හා උපකරණ සඳහා වැය අනුමත කිරීමේ ක්‍රමයක්
- නිෂ්පාදකයාගේ සිට ඡන්ද විමසීම් දින අවසානයේ විනාශ කිරීම සඳහා ගබඩාවට ආපසු එවන තෙක් හැම සැපයීම් අවස්ථාවකදීම,සියලුම අයිතම සඳහා යැවීම් හා ලැබීම් දත්ත, වාර්තා කිරීමේ, සසඳා බැලීමේ, සහ පරීක්ෂා කිරීමේ සරල ක්‍රමයක්
- බලය ලත් අයට පමණක් සැපයුම් ස්ථාන වලට ප්‍රවේශයත්, සැපයුම් බෙදා වෙන් කිරීමත් සඳහා ක්‍රමයක්,
- ප්‍රමාණ, සැපයූ තැන, වගකීම් සහ ඡන්ද කාර්යවලට ගත් භාණ්ඩ හා උපකරණ වල තත්වය පෙන්වන නිවැරදි සම්පත් ලේඛණ පවත්වා ගැනීමත්
- භාණ්ඩ හා උපකරණ විනාශ කිරීම හෝ බැහැර කිරීම අනුමත කිරීමේ ක්‍රමයක්,

සැපයුම් ලබාගැනීමට බෙදා හැරීමට සම්බන්ධ සියල්ලන්ම- සපයන්නෝ,ප්‍රවාහන හා ගබඩා සේවකයෝ,ඡන්ද පොළ නිලධාරි, ඡන්ද කළමනාකාර කාර්ය මණ්ඩලය- භාණ්ඩ සැපයුම් විගණන පෙළ පවත්වා ගත යැම සම්බන්ධ පැහැදිලි උපදෙස් ලැබිය යුතුය. ඡන්ද සූදානම පිළිබඳ විස්තර සටහන් ගැන ඔවුන් දැනුවත්ව සිටීම සඳහාත් භාණ්ඩ සැපයුම හා බෙදා හැරීම කාර්යක්ෂම ලෙස අධීක්ෂණය සඳහාත්, සැපයීම් හා බෙදාහැරීම් කළමනාකරණ සංක්ෂිප්ත වාර්තා පිටපත් ,ස්ථානීය, ප්‍රාදේශීය, හා මධ්‍යම තලවල කළමනාකරණකරුවනට ලබාදීම වැදගත්ය.

භාණ්ඩ හා උපකරණ සඳහා නිසි පාලන හා විගණනක මං නොමැතිවීම ඡන්ද කළමනාකරණ පිරිසකට ඉතා බරපතල ප්‍රශ්ණ ඇති කළ හැකිය. බොහෝවිට ඉතා කෙටි කාල පරාසයක් තුළ ඡන්ද පවත්වන විට හදිසියෙන් සැපයුම් ලබාගැනීම්, පාලනයක් නොමැතිවීමකට හෝ සෑහෙන තරම් පාලනයක් නොමැතිවිට හෝ සෑහෙන තරම් පාලනයක් ඇතිතර ගැනීමට නොහැකි වීමට හේතු වනු ඇත. සැපයුම් ඇණවුම් සම්පූර්ණ කර ඇත්ද, නියමිත තැනට සැපයුම් ලැබී ඇත්ද,එසේත් නැත්නම් සැපයුම්වල ගුණාත්කම බව හා තත්වය ආදිය නොදැනීම කාර්යක්ෂම ඡන්දයක් පැවැත්වීම සහතික කිරීම දුෂ්කර කරනු ඇත.

බෙදාහැරීම සඳහා නිසි පාලනයක් හා වගකීමක් සහ සැපයීම් පාලනයක් නොමැතිවීම ඡන්ද පිළිබඳ විශ්වසනීයත්යට බලපෑමක් කල හැකියි ගණන්හිලවු පෙන්විය යුතු භාණ්ඩ අස්ථාන ගත වී නම් ඉතා බරපතළ මුදල් හානියක් ඇති කරනු ඇත. ඡන්ද ක්‍රියාවලිය සඳහා පාවිච්චි කරන ජංගම ටෙලිෆෝන, කොම්පියුටර උවාරණ සහ වාහන ආදී බොහෝ උපකරණ ඉතා පහසුවෙන් එහා මෙහා ගෙන යාහැකි බැවින් සොරකම් කිරීමට හෝ නැතිවීමට බොහෝ ඉඩ ඇත

## සැපයුම් ප්‍රභව පාලනය

මුදල් පිළිබඳ අවංක බව, මිළට ගන්නා භාණ්ඩවල පිරිවැය-ඵලදායිතාව සහ විශ්වාසතාව ඇති කිරීම සඳහා භාණ්ඩ හා උපකරණ ලබා ගන්නා ස්ථාන පිළිබඳ පාලනයක් අවශ්‍යයි. අවශ්‍ය පාලනයන් අතර මේවාද වෙයි.



- පිරිවැය ඵලදායිතාව සඳහා විනිවිදවූ තරගකාරී ඉල්ලම් පටිපාටියක්.
- සැපයුම් මාර්ග දිගට පවත්වා ගත යාම, විශ්වාසය තැබිය හැකි බව ගතවන සැපයුම් කාලය සහ වැය ඵලදායිතාව ආදී කරුණු ඔස්සේ අන්තර්ජාතික සැපයුම් මාර්ග වලින් ඇතිවිය හැකි අවාසි සුපරීක්ෂාකාරීව සැලකිල්ලට භාජන කළ යුතුය.
- කාර්යපූරණ ඇපකර හෝ සහතික ගිවිසුම් වලට එළඹීමට සූදානම් අයගෙන් පමණක් සැපයුම් ලබා ගැනීම.
- තහවුරුවූ තත්ව පාලන ක්‍රම ඇති සැපයුම් කරුවන්ගෙන් පමණක් සැපයුම් ලබා ගැනීම.

A

සියරා-ලියෝන්

# ඡන්ද පත්‍රිකාව

## ප්‍රාදේශිය සභා ඡන්දය

| සංකේතය | මෙහි සලකුණු කරන්න |
| --- | --- |
|  | |
|  | |
|  | |
|  | |
|  | |

ඔබේ තේරීම සංකේතයට ඉදිරියේ ඇති
කොටුවේ සලකුණ/මුද්‍රාව තබන්න

## කෙටුම්පත.

## සරණාගත විධායක කමිටුවක් සඳහා කොන්දේසි මාලාවක්.

කොන්දේසි මාලාවට පාදක මූල ධර්මය: එක් එක් කඳවුරේ ආරක්ෂක/සත්කාර සේවා වැඩ සටහන් සඳහා සැලසුම් සම්පාදනයේදී හා ඒවා ක්‍රියාත්මක කිරීමේදී සරණාගතයින් හවුල් කර ගැනීම.

හැම කඳවුරක මෙන්ම සරණාගත ජනගහනය සඳහා සැපයෙන සේවා/සත්කාර සම්බන්ධ සාමාන්‍ය කළමනාකරණය හවුල්කරුවකුට පවරා ඇත. කඳවුරු කළමනාකරු හා සමීප සහයෝගයෙන් සරණාගත විධායක කමිටුව පහත සඳහන් කාර්ය ඉටු කරනු ඇත.

1. කඳවුරු මට්ටමෙන් පොදු සම්බන්ධීකරණ රැස්වීම්වලදී සරණාගත ජනගහනය නියෝජනය.
2. ගැමි,ප්‍රජා අංග නායකයින් පත්කිරීම
3. ගම් ප්‍රජා අංග නායකයින් හා සහයෝගයෙන් එක් එක් අංගය සඳහා අනු කාරක සාමාජිකයන් පත් කිරීම. එක් එක් අංගය සඳහා වගකීම දරණ හවුල් කරු සමග එකට වැඩ කරන අනුකාරක කමිටුව පිරිමින්. ගැහැණුන් සහ ළමයින්ගෙන් සමන්වනු ඇත
4. කඳවුරේ සෙසු පිරිස අතරට කඳවුරේ ආරක්ෂාව හා සහන සැපයීමේ යාන්ත්‍රණය සම්බන්ධ තොරතුරු ගෙන යාම සඳහා වගකීම දැරීම. කඳවුරු ප්‍රජාව විසින් හඳුනා ගනු ලැබූ, අංග අනු කමිටු මගින් විසඳුම් ලබාදිය නොහැකි ගැටළු හා තොරතුරු , කඳවුරු කළමනාකරුගේ අවධානයට යොමු කිරීම.
5. අතුරු නියෝග පාදක කර ගෙන, ලිංගිකත්වයද සැලකිල්ලට ගනිමින් ආගමික හා ගෝත්‍රික කණ්ඩායම් නියෝජනයෙන් සෑදි දුක්ගැනවිලි කමිටුවක් (කඳවුර තුළ සිදුවන සුලු සොරකම් හා ගෙවල ආරවුල් : උදා: සිදුවන සුලු හොරකම්) පත්කිරීම.
6. කාන්තා, තුරුණු, ආබාධිත සමාජ නැති තැන්වල එවැනි සමාජ පිහිටුවීම සඳහා සහාය දීම.
7. පොලිස් නිලධරයා සමග සහයෝගයෙන් කඳවුර තුළ ආරක්ෂක නිලධාරීන් පත්කර ගැනීමට සහාය දීම
8. කඳවුර තුළ නීතිය හා සාමය කඩකිරීම සඳහා කුමන්ත්‍රණකාරී ක්‍රියා සැලැසුම් පිළිබඳ තොරතුරු කඳවුරු කළමනාකරුට සහ/හෝ පොලිසියට දැන්වීම/වාර්තා කිරීම
9. කඳවුරට අළුතෙන් සරණාගතයින් පැමිණීම් හෝ පදිංචිවී සිටීම් කඳවුරු කඳවුරු කළමනාකරුට දැන්වීම.
10. සත්කාරක ප්‍රජා නියෝජිතයන් මුණ ගැසීම් කඳවුරු කළමනාකරුගේ හෝ සම්බන්ධතා නිලධාරි මගින් කිරීම.
11. මසකට වරක් කඳවුරු ශුද්ධ පවිත්‍ර කිරීමේ දිනයක් පැවැත්වීම
12. ක්‍රීඩා සංවිධානය,සංස්කෘතික හා අන්තර්ජාතික උත්සව දින කටයුතු වලට සහාය දීම


හඳුනා ගත් ගැටළු සඳහා විසඳුම් සොයා ගත නොහැකි අවස්ථාවලදී කඳවුරු කළමනාකරු හා සරණාගත විධායක කමිටුව එවැනි කරුණු UNHCR ට හෝ/NACSAයට යොමු කළ යුතුයි.

### දුක් ගැනවිලි කමිටුවක් සැකැසුම - සියරාලියෝන් මාදිලය

1. දුක් ගැනවිලි කමිටුවේ මුලසුන් පති හා පතිනිය සරණාගත කමිටුවේ සාමාජිකයන් විසින් පත් කරනු ලැබේ
2. දුක් ගැනවිලි කමිටුව කඳවුරු ජනගහනයේ ආගමික හා ජනවාර්ගික මිශ්‍රණය පිළිඹිබු කළ යුතු අතර ඉහත සඳහන් මුලසුන්පති / පතිනි දෙදෙනාද තවත් පත්කරණු ලබන සරණාගත දෙදෙනකුද (සරණාගත ප්‍රජාව අතර පිළිගැනීමක් ඇති පිරිමියෙක් හා ගැහැණියක්)එයට ඇතළත් විය යුතුය.
3. දුක් ගැනවිලි කමිටුව අතුරු නීති කඩවීම් සම්බන්ධ කරුණු විමර්ශණයට යොමු කරන අතර දඬගැසීම් සඳහා ද කඳවුරු කළමනාකාර ඒජන්සිය සමග සහයෝගයෙන් අතුරු නීති කඩකරනන්ට කවර ප්‍රජා මෙහෙ පැවරිය යුතුද යන්න තීරණ සඳහාද වගකීම දරණු ඇත.

උපුටා ගැනුම සියරා ලියෝන් අතුරු නීති.
UNHCR Sub –Office Kenema .Sierra Leone'

# 4 ලියා පදිංචි කිරීම සහ දත්ත එක්රැස් කිරීම



ඇෆ්ගන් සරණාගතයින් පාකිස්ථානයේ ජලෝෂායි කඳවුරෙහි දි ලියාපදිංචි කිරීම. වැඩසටහන් සැලසුම් කිරීමේ දි කඳවුරක් තුළ සිටින ජනගහණයේ ප්‍රමාණය සහ ගති ලක්ෂණ යන දෙ අංශයම සහ තිරණාත්මක වගේම කල් පවත්නා විසඳුම් සොයාගැනීම ද තිරණාත්මකය. ඡායාරූපය UNCHR

# 4 වන පරිච්ඡේදය : ලියාපදිංචි කිරීම දත්ත එක්රැස් කිරීම.

## හැඳින්වීම

අවතැන් වූ පුද්ගලයින් ලේඛනගත කිරීම පළමු සහ ප්‍රමුඛ ආරක්ෂක මෙහෙයකි. මෙය යලි සපාරාධි ක්‍රියාවන්ට සහ බලෙන් බඳවා ගැනීමෙන් අවතැන් වූවන් ආරක්ෂා කර ගැනීමට උපකාර වෙයි. මූලික අයිතීන් ලබා ගැනීම සහ පවුල් යලි එක් තැන් වීම ආරක්ෂා කරයි. එසේ විශේෂ උදව් අවශ්‍ය වන තැනැත්තන් හඳුනා ගැනීමට උපකාර වෙයි.

කඳවුරක් පිහිටුවීමේ දි ලේඛනගත කිරීම මූලික මෙහෙයක් වන්නේ, කඳවුරු කළමනාකරණ කණ්ඩායම් වලට සහ බොහෝ කරුණු කාරණා සම්බන්ධයෙන් අමතන්නට සිදුවන, මානව හිතවාදි ක්‍රියාකරුවන්ට මෙන්ම කඳවුරේ වසන්නන්ටය. ලේඛනගත කිරීම, දත්ත එක්රැස් කිරීමේ ක්‍රමානුකූල විදිය වන අතර ම යම් නියමිත ජන කොට්ඨාශයක ප්‍රමාණය, ගති ලක්ෂණ තිරණය කිරීමට උපයෝගි කර ගනී. සරණාගතයෙකු හෝ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තත්ත්වයකදි ලේඛනගත කිරීම, අදාල රජයේ වගකීමකි. කෙසේ වුවද, එක්සත් ජාතින්ගේ සංවිධානයට සම්බන්ධ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ කඳවුරු ඒජන්සි ආයතන අවශ්‍යයෙන් ම සැලසුම් කිරීමේ දි, දත්ත එක්රැස් කිරීමේ දි සහ උපයෝගි කර ගැනීමේ දි ප්‍රධාන මෙහෙයක් ඉටුකරයි.

## කඳවුරක් පිහිටුවීමේදි ලේඛනගත කිරීම වැදගත් වෙන්නේ ඇයි?

### (අ) වැඩසටහන සැළසුම් කිරීමේ නිර්නායකය වන්නේ ලියාපදිංචි කිරීමය. සහයෝගය සපයමින් කඳවුරේ ආරක්ෂාව තහවුරු කරන්නේය.

කඳවුරේ ප්‍රමාණය ක්‍රියාකාරි ප්‍රදනයක් සහ සමස්ථ වැඩසටහන් කෙරේ බලපෑමක් කරයි. එසේම ප්‍රතිඵල ඇගයීම අධීක්ෂණය කෙරේ බලපායි. ප්‍රදනයන්ට ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය නිවාසස්ථාන, ද්‍රව්‍යයන් ඇතුළත් විය හැකිය. ක්‍රියාත්මක ප්‍රදනයන් සඳහා අරමුදල් මට්ටම්, කාර්ය මණ්ඩල ප්‍රමාණයන් හරියාකාරව තක්සේරු කිරීමටය. උදහරණ වශයෙන් දළ මරණ සංඛ්‍යාව සහ වැසිකිලි ආවරණය දැක්විය හැකිය. ජනගහනයේ ස්වාභාවය (ස්ත්‍රී පුරුෂ බව, වයස් කාණ්ඩ, විශේෂ අවශ්‍යතා ඇති කණ්ඩායම් සහ වර්ග) කළමණාකරුවන්ට ප්‍රයෝජනවත් වෙන්නේ වැඩසටහන් වලට එක් කිරීමට හෝ වෙනස් කරණ අතර උදව්වීම උපරිම කිරීමටය. නිශ්චිත ස්වාභාවයන් බලපෑම් ඇති වූ වැඩසටහන් වල උදහරණ වන්නේ ආරක්ෂාව (පවුල් හඳුනා ගැනීම, පවුල් යලි එක් කිරීම, බලයෙන් හරවා යැවීම සහ සේවාවන් අවදනමට ලක්විය හැකි යයි සැලකිය හැකි ජනයා, කායික මානසික නොහැකියාවෙන් පසුවන්නන්, වැඩිහිටියන්, කැඳවාගෙන නොආ දරුවන්, තනි කාන්තා මව්වරුන්, තනි කාන්තාවන්, ප්‍රචණ්ඩත්වයට හසු වූවන්, අන්ධයින්, බිහිරි අය හා ගොළුවන් හා නිදන්ගත රෝග වලින් පෙලෙන්නන් ගේ (එකතු නොකළ) දත්ත එක් රැස් කිරීම වැදගත් වේ. යලි ලියාපදිංචි කිරීම, මගින් මුඛ්‍ය ආරක්ෂණ තොරතුරු, අවතැන් වූවන්ගේ වයස් කාණ්ඩ ආදිය ලබා දෙනු ඇත. (උදා: හමුද කාණ්ඩවලට බලෙන් බඳවා ගනු ලැබූ පිරිමි ළමුන් ආදිය)

### (ආ) ලියාපදිංචි කිරීම කල්පවත්නා විසඳුම්වලට අදල දත්ත ලබා දෙයි.

ලියාපදිංචි කිරීම මගින් යම් පුද්ගලයෙකු පැමිණියේ කොහෙන්ද යන්න ඔහුගේ/ඇයගේ බලාපොරොත්තු හෝ අභිලාෂයන් පිළිබඳ කල්පවත්නා විසඳුම් පිළිබඳ තොරතුරු ලබා දෙනවා ඇත. මෙම තොරතුරු

උදව් කරගන්න පුළුවන් සියරට යැවීම පෙළඹවීමට (උද: ආපසු යවනු ලබන ප්‍රදේශයක පුනරුත්ථාපනය කිරීම, සිය රට යැවීමේ වැඩසටහනක සවිස්තරාත්මක සැළසුම් කිරීම) හෝ යලි පදිංචි කිරීම සඳහා. (හඳුනා ගැනීම සහ විස්තරාත්මක සහ ප්‍රයෝජනයට ගත හැකි දේවල් පිළිබඳ තොරතුරු ලබාගැනීම)

අභ්‍යන්තර හා බාහිර යන දෙඅංශයෙන්ම ලේඛනගත කිරීම, අමතර කටයුතු සඳහා කඳවුර කළමණාකරණයට සහ වෙනත් ඒජන්සිවලට සේවා සපයයි. ජනගහනයේ ප්‍රමාණය සහ ගති ස්වභාවයන් පිළිබඳ තොරතුරු තත්ත්ව වාර්තා, ඒජන්සි අතර සහසම්බන්ධතාව, උපදෙස් දීම, මාධ්‍ය වාර්තා සහ අරමුදල් රැස්කිරීම සඳහා යොදගන්නට පුලුවන්කම ඇත. නිරවද්‍ය සංඛ්‍යා ලේඛනවලින්, වැඩ සටහනේ පිරිවැය සාර්ථක බව වගේම වෙනත් නිරීක්ෂණයන් සහ ඇගයීමේ කාර්ය බෙහෙවින්ම කාර්යක්ෂම වේ

## ලේඛනගත කිරීම කරන්නේ කෙසේ, කවුරුන් විසින් ද?

සරණාගත හෝ අභ්‍යන්තර අවතැන් වීමේ තත්වයකදී ලේඛනගත කිරීම අදල රටේ රජයේ වගකීමක් වෙයි.

සරණාගත අවස්ථාවකදී කෙසේ වුවද සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ තානාපතිවරයා (UNHCR) රජය අපොහොසත් වන අවස්ථාවක දී ලේඛනගත කිරීමේ ක්‍රමය පවත්වාගෙන යාමට සහාය වෙයි. රාජ්‍ය නොවන සංවිධාන, කඳවුරු වැසියන් සහ වෙනත් අය ඔවුනොවුන්ගේ ප්‍රයෝජනය සඳහා ලේඛනගත කිරීම කරනු ලැබේ.

මේ කොයියම්ම ආකාරයක දී වුවත් ලියාපදිංචි කිරීම ඉතා උසස් සහයෝගිතා මෙහෙවරක් වේ. කඳවුරු කළමණාකරණ කණ්ඩායමේ අයට, කඳවුරු වැසියන්ට, ජනතා කණ්ඩායම්වලට, රාජ්‍ය නොවන සංවිධානවලට එක්සත් ජාතීන්ගේ ආයතන වලට සහ ස්වදේශීය අධිකාරීන්ට අවම තොරතුරු අවශ්‍ය වේ. සරණාගත අවස්ථාවක දී එක්සත් ජාතීන්ගේ සරණාගත තානාපතිවරයාගේ පෝරමය යොදගත යුතුය. එම පෝරමයේ කිනම් ආකාර ප්‍රශ්න අවධාරණය කළ යුතු දැයි යන්න පිළිබඳ යම් නම්‍යතාවක් පවති. උදහරණයක් වශයෙන් කඳවුරු කළමණාකරණ කණ්ඩායමට අවදනමට ලක් වූ විශේෂිත අයවලුන් පිළිබඳව දැනගැනීමට අවශ්‍ය වීම ගත හැකිය.

අභ්‍යන්තර අවතැන් වූ පසුබිමක දී ලේඛනගත කිරීමේ ක්‍රියා පිළිවෙළ බොහෝ විට තත්කාර්ය ස්වභාවයක් තිබිය හැක. බොහෝ විට ඒජන්සි ආයතන ලේඛනගත කිරීම සඳහා පාදක කරගනු ලබන්නේ එක්සත් ජාතීන්ගේ ආයතන, ලෝක ආහාර සංවිධානය (WFP) වැනි ආයතන මගින් දැනටමත් පවත්වාගෙන යනු ලබන ක්‍රමවේදයන් ය.

ප්‍රමාණය සහ ගලා ඒමේ ස්වරූපය මත ලේඛනගත කිරීම සඳහා තෝරගනු ලබන යන්ත්‍රණය තිරණය කරනවා ඇත. සාමාන්‍ය තත්ත්වයන් වලදී, ලේඛනගත කිරීම/සත්‍යාපනය සිදුවන්නේ ප්‍රධාන පැමිණීම පටන්ගෙන මාස තුනක කාලයක් තුළදිය. අළුතෙන් එන අය ලේඛනගත කිරීමට අවශ්‍ය විධිවිධාන ඉන් පසුව යෙදිය යුතුවේ. ලියාපදිංචි වන දත්ත නිතිපතා සත්‍යාපනය කළ යුතු වන අතර අළුත් කළ යුතුය. ආහාර බෙද හැරීමට විශේෂයෙන් සීමා නොකොට කළ යුතු වේ. අවස්ථාවට අවශ්‍ය වන ආකාරයට යලි යලිත් කලානුරූපිව අවතැන් වුවන් පිළිබඳ සත්‍යාපනයන් කළ යුතු වේ. අවස්ථාවට අවශ්‍ය වන ආකාරයට යලි යලිත් කාලානුරූපිව අවතැන් වුවන් පිළිබඳ සත්‍යාපනයන් කළ යුතුවේ. කඳවුර ස්ථාවර නම් සහ පැමිණෙන්නන්ගේ ප්‍රමාණය පාලනය කළ හැකි නම් රජය සහ/හෝ එක්සත් ජාතීන්ගේ සරණාගත තානාපතිවරයා ඔවුන්ගේ ලේඛනගත කිරීමේ ක්‍රියාවලියක් පවත්වාගෙන යනවා ඇත. එවන් අවස්ථාවලදී කඳවුර කළමණාකරණ කණ්ඩායම රාජ්‍ය නොවන සංවිධානය සහ වෙනත් අය ඒ වෙනුවට උනන්දු කරවන මෙහෙවරක් ඉටු කරයි. ඒ වෛද්‍ය පහසුකම් අවශ්‍ය අය හඳුනා දෙමින්, ලේඛනගත කිරීමේ ස්ථාන පිහිටුවීමෙන් හා පවත්වාගෙන යැමෙන් ආදි වශයෙන් හදිසි අවස්ථාවක දී වැඩි පිරිසක් එන විටක,

කඳවුරු කළමණාකරණ කණ්ඩායමට සෘජු සහය, කාර්ය සංවිධානයට අවශ්‍ය කාර්ය සංවිධානයට අවශ්‍ය කාර්ය මණ්ඩල, කාර්යාලීය සැපයුම් සන්නිවේදන උපකරණ ආදිය අවශ්‍ය වේ. යළි ලේඛනගත කිරීම සංකීර්ණ ක්‍රියාවලියක් වේ. සාමාන්‍ය ප්‍රමාණයේ කඳවුරක් වුවත් අදල කණ්ඩායම්වලින් වැඩිපුර දායකත්වයන් අවශ්‍ය වේ.

කඳවුරු කළමණාකාරිත්ව කණ්ඩායම ලේඛනගත කිරීමේ ක්‍රියාවේදී සහයෝගාත්මක මෙහෙවරක් පමණක් ඉටු කරන්නේ නම් භාවිතයට ගනු ලබන ක්‍රම වේදයන්, දත්ත විශ්ලේෂනය කරන ආකාරය, එසේ ම තොරතුරු පිළිබඳ ප්‍රතිඵල ගැන ඔවුන් දැනුවත්ව සිටිය යුතුවේ. මීට අවශ්‍ය වෙන්නෙ කඳවුරු කළමණාකරණ කණ්ඩායම, එක්සත් ජාතින්ගෙ ජාත්‍යන්තර සරණාගත ආයතන සහ අදල වෙනත් ක්‍රියාකාරීන්ගේ සහයෝගිත්වය සහ සම්බන්ධිකාරත්වය ඇතිව, දත්ත අදල කරගනී.

## යමක් පිළිබඳ උනන්දුවක් දක්වන්නන් සහ ඔවුන්ගේ කාර්යභාරය

ලේඛනගත කිරීමේ සැලැස්මක් පිළියෙල කිරීමේ දි විවිධ උනන්දුවක් දක්වන්නන්ගේ ක්‍රියාකාරී මෙහෙවර තිරණය කිරීම, කාර්යයන්, වගකීම් සහ ගණනය කිරීමේ හැකියාව ගැන තිරණය කිරීම ප්‍රධාන අරමුණ වන්නේය. මේ මගින් කළමණාකරණයට සහ සම්බන්ධිකරණය පිළිබඳ ඵලදයි පහසුවක් සළකනු ලබයි.

### රජයේ මෙහෙවර

ලියාපදිංචි කිරීම රජයේ වගකීමක් වේ. කෙසේ වුවද සමහර රටවල දේශපාලන කැමැත්ත සහ නිතිමය පදනම යන දෙඅංශයේම අවතැන් වුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රමය පවතින්නේ වුවත් රජයට ක්‍රියාකාරී හැකියාව සහ නිර්මාණය කිරීමට අවශ්‍ය සම්පත්, සංස්ථාපනය සහ ලේඛනගත කිරීම පවත්වාගෙන යෑමට නුපුලුවන. අනෙක් රටවල් අවතැන් වූ ජනයා ගැන සම්පූර්ණ වගකීම භාර ගැනීමට හැකියාව ඇතත් එසේ කිරීම ප්‍රතික්ෂේප කරයි. මේවට සහ වෙනත් හේතු මත (UNCHR) සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතින්ගේ තානාපතිවරයා හෝ වෙනත් ඒජන්සි/රාජ්‍ය නොවන සංවිධාන වලට ලේඛනගත කිරීම පිළිබඳ වැඩිපුර ක්‍රියාකාරී මෙහෙවරක් ඇත්තේය.

### අවතැන් වූවන්ගේ මෙහෙවර

සරණාගතයින් සහ අභ්‍යන්තර අවතැන් වුවන් ලියාපදිංචි කිරීමේ දි හැකිතාක් දුර සම්බන්ධ විය යුතුය. සැලසුම් කිරීමේ දි හා ක්‍රියාවට නැගිමේදි යන අවස්ථා දෙකේදිම නාම ලේඛනගත කිරීමේ කටයුතු එසේ විම අවශ්‍ය වේ. කාන්තා සරණාගතයන්, දේශිය වශයෙන් අවතැන් වුවන් සහ අදල අයවලුන්ව ලියාපදිංචි කිරීමේ කටයුතු වලදි නිශ්චිත කාර්ය භාරයක් හිමිවේ. ආරක්ෂණ වගකිම් විශ්ලේෂණය කිරීමේදි ද ඔවුන්ගේ හඬක් සඳහා ඇතුළත් විය යුත්තේ හිරිහැර කිරීමට ඇති හැකියාව, ගැහැණු දරුවන්ට හා කාන්තාවන්ට කෙරෙන ප්‍රචණ්ඩත්වයන්ය. ඔවුන් විසින් තෝරා ගැනිම සහ ලේඛනගත කිරීම පිළිබඳ ක්‍රමවේදයෙහි වලංගු භාවය සඳහා සම්මාදම් විය යුතුය. කාන්තා සරණාගතයන්/දේශිය වශයෙන් අවතැන් වුවන් සහ අදාල අනෙකුත් අය ලේඛනගත කිරීම සම්බන්ධව සමාජය දැනුවත් කිරීම පිළිබඳ පූර්ණ වශයෙන් සහසම්බන්ධ විය යුතුය. කාන්තාවන් ද ලේඛනගත කෙරෙන ඉසව්වලට ගොස් නිරීක්ෂණය කළ යුතු වන අතර අනන්‍යතාවන් හඳුනා ගැනිමට උදව් විය යුතුය. නිත්‍ය වශයෙන් ම අවතැන් වුවන් අතර දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් ලියාපදිංචි වීමට උත්සහ කරන්නන් සිටිය හැකි වන්නේ ඔවුන්ට ලැබෙන දේවල් වැඩි කර ගැනිමටය. ඇත්ත වශයෙන්ම මේ කරුණ නිතරම දකින්නට ලැබෙන්නේ සරණාගතයින් ලියාපදිංචි කිරීම/දේශිය අවතැන් වුවන්ගේ කඳවුරු ලියාපදිංචි කිරීමේදි වඩාත් බරපතල දෙයක් වශයෙනි. වටපිටාවේ ජන කොටස් සහ අසල පිහිටි කඳවුරුවල සාමාජිකයින්ද ලේඛනගත කිරීමේ කටයුත්තෙන් ඵල ප්‍රයෝජන ලබාගන්නට උත්සහ කරනවා ඇත. ඒ නිසා බොරුකාරයින්ගෙන් නියම වශයෙන්ම ආපදාවට ලක්වුවන් තෝරා ගැනිමට පියවර ගත යුතුවේ. අවතැන් වුවන්ට පුලුවන්කම තිබෙනවා මේ සම්බන්ධව නියාමන කාර්යයක් අවශ්‍යයෙන් කළ හැකි වේ. ඔවුන්ගේ සමාජයේ සාමාජිකයින්

දන්නා නිසා බැහැරියන් ප්‍රත්‍යක්‍ෂ කරගෙන පුලුවන්කම ඇත. ඒ ස්වරණ විලාශයෙන්, භාෂාවෙන් හෝ ගෝත්‍රයෙනි. ස්වභාවයෙන් ම සමාජයේ සැලකිය යුතු අය ප්‍රධාන පුද්ගලයින් වශයෙන් මතු වී එන්නේ ඔවුන් කෙරෙහි ඇති විශ්වාසය සහ අපක්‍ෂපාතිභාවය ඔවුන්ගේ ප්‍රසිද්ධිය ලබා ගැනීමට ඇති කාලය මතය. මෙම පුද්ගලයින් කඳවුරු කළමනාකරණ කණ්ඩායම සමග සහයෝගිතාවය පැවැත්වීමෙන් සහ / හෝ එක්සත් ජාතීන්ගේ සරණාගත තානාපතිවරයාගේ ආයතනය සමඟ ක්‍රියාකාරී ලෙස ලේඛනගත කිරීමේ ක්‍රියාවලියට දායකවීමට පිළිවන.

## සරණාගත කණ්ඩායමක දී එක්සත් ජාතීන්ගේ සරණාගත (UNHCR) තානාපති ආයතනයේ මෙහෙවර

එක්සත් ජාතීන්ගේ සරණාගතයිනගේ තානාපතිගේ ලියාපදිංචි කිරීම සහ ජනගහන දත්ත කළමනාකරණය සරල නිරීක්‍ෂණයේ සිට සම්පූර්ණ සැලසුම දක්වා මෙහෙවර වෙනස් වෙයි. එය ලියාපදිංචි කිරීමේ ක්‍රම සපුරාලීම සහ පවත්වාගෙන යෑම සම්බන්ධව අදාල වේ. ඒජන්සිය විසින් නිසි සරණාගත ලියාපදිංචි කිරීමේ යාන්ත්‍රණයක් සංවර්ධනය කර පවත්වාගෙන යයි.

එක්සත් ජාතීන්ගේ සරණාගත තානාපති ආයතනය සත්කාර රජය සමග බද්ධ වගකීමක් තිබේ. සරණාගත පිරිස් නිත්‍ය පරිදි හැකිතාක් කඩිනමින් තහවුරු කළ යුතු වන්නේ අළුත් හදිසි සරණාගතයන් සංස්ථාපනය කිරීම සඳහාය. ඉන් අනතුරුව එම වාර්තා අළුත් කිරීම නිතිපතා කළ යුතු වේ. එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ තානාපතිගේ මුල් භූවමාරුව විද්‍යමාන කරන්නේ අවතැන් වූ පිරිස් සමඟ කඳවුරට කැඳවා ගෙන එන්නන් තිරණාත්මක ලේඛනයක් බවය. එය ලේඛනගත කිරීමේ ක්‍රියාවලියේ නිතර දැකිය හැකි පදනමකි. එක්සත් ජාතීන්ගේ සරණාගත තානාපතිවරයා උත්සහ කළ යුතු වන්නේ එම ලේඛනයේ පිටපතක් කඳවුරු කළමණාකරණ කණ්ඩායමට අවසන කඳවුරු නිමාවෙවි දී ලබාදීමය.. එසේ කිරීමෙන් කොටස්කාර ඒජන්සි ආයතන අතර අනාගතයේ දී ඇතිවිය හැකි විසංගතතාවන් අඩු කිරීමට උදව්වන අතර කඳවුරු වැසියන්ට අවශ්‍ය සේවාවක් සැපයීමට ඇති ප්‍රමාදයන් වළක්වනු ලැබේ.

## අභ්‍යන්තර අවතැන් වුවන් ස්ථානගත කිරීමේ දී OCHA මෙහෙවර

අභ්‍යන්තර අවතැන් වුවන් සම්බන්ධ මග පෙන්වන ප්‍රතිපත්තියෙහි 25.1 නියමයෙන් සඳහන් කර ඇති පරිදි "ප්‍රාථමික කාර්ය සහ මානුෂික සහාය අභ්‍යන්තර අවතැන් වුවන්ට ලබාදීමේ දී වගකීම පැවැරෙන්නේ ජාතික අධිකාරීන්ටය." ඒ හෙයින් ලියාපදිංචි කිරීමේ වගකීම පැවැරෙන්නේ අධිකාරීන්ටය. නමුත් කඳවුරු කළමණාකරණ කණ්ඩායම් විසින් නිරීක්‍ෂණය කළ යුතුවේ. එසේ වුවද බලාපොරොත්තු විය යුත්තේ කඳවුර කළමණාකරණ කණ්ඩායමට නියම ලියාපදිංචි කිරීම සංවිධානය කිරීමට ඉල්ලා සිටීමය. තවද අදාල ක්‍රියාකාරී පාර්ශ්ව කරුවෙකු හඳුනා ගත යුතුය. සමස්ථ සම්බන්ධීකාරක මෙහෙවරෙහි දී ඒජන්සි ආයතන තිරණය කිරීමේ දී OCHA සහයෝගය දක්වන්නේ මානසික සම්බන්ධීකාරකවරයා සහ අදාල රටේ කණ්ඩායමටය. කඳවුර කළමණාකරණය කිරීමේ වගකීම්, අභ්‍යන්තර අවතැන් වූ ජනයා ලියාපදිංචි කිරීම ද ඇතුළුව වගකීම පවරනු ලබන්නේ ලියාපදිංචි කිරීම පිළිබඳ අනුකූලතාව දක්වන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහාය.

## ක්‍රියාකාරී පාර්ශවකරුවන්ගේ මෙහෙවර

එක්සත් ජාතීන්ගේ සරණාගත ආයතනයට සහ රජයන්ට විශාල පිරිස් ලේඛනගත කිරීම ඔවුන් විසින්ම කිරීම උගහටය. ඔවුන් ක්‍රියාකළ යුත්තේ වෙනත් උනන්දුවක් දක්වන පාර්ශව කරුවන්, විශේෂයෙන් රතු කුරුස සංවිධානය (ICRC) ලෝක ආහාර වැඩසටහන (WFP), යුනිසෙෆ් ආයතනය සහ රාජ්‍ය නොවන සංවිධාන කොටස්කරුවන් කර ගැනීමෙනි. බොහෝ අවස්ථාවලදී මේ ආයතන සෘජුවම ලියාපදිංචි කිරීමේ කටයුතුවලට සම්බන්ධ වේ. ක්‍රියාකාරී පාර්ශවකරුවන් හඳුනාගෙන ඔවුන් ඇමතූ විට ලියාපදිංචි කිරීමේ

සියලුම අදියරවලදී, සැලසුම් කිරීමේ දී, ක්‍රියාවට නැගීමේ දී සම්බන්ධවීමට උනන්දු කළ යුතුවේ. කඳවුරුවල ක්‍රියාකාරී පාර්ශවකරුවන් සිතෙහි තබාගත යුත්තේ බිම් මට්ටමේ සවිස්තරාත්මක සැලසුම් සංවිධානය හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකීම දරන්නන් සේය. (උදාහරණ වශයෙන් ලියාපදිංචි කිරීමේ තාවකාලික කුටි ඉදිකිරීම, පිරිස් පාලනය, ලේඛනගත කරන්නන්ට අවශ්‍ය ලි බඩු, කාර්ය මණ්ඩලය දිවා ආහාර ආදිය ඇතුළත් වේ)

බොහෝ අවස්ථාවන් සැලකිල්ලට ගැනීමේදී, කඳවුරු රැඳවියන් ලියාපදිංචි කිරීම සහ හඳුනා ගැනීම, ආහාර ආධාර ලබන්නන් යන්න අවශ්‍යයෙන්ම එකම කාර්යයකි. ලෝක ආහාර වැඩසටහන සමඟ සමීප සහයෝගීතාවකින් කටයුතු කිරීම, සැලසුම් කිරීම සහ ලියාපදිංචි කිරීම ක්‍රියාවට නැගීම අත්‍යාවශ්‍ය වේ. අභ්‍යන්තර අවතැන් වුවන් පිළිබඳ, ස්ථානයක දී තවමත් ලියාපදිංචි කිරීමේ විසඳුම් කෙරෙන්නේ අපිලිවෙලටය. බොහෝ විට රාජ්‍ය නොවන සංවිධානවල ලේඛනගත කිරීමේ ක්‍රියාකාරිත්වයට පාදක වන්නේ එක්සත් ජාතීන්ගේ ආයතන, ලෝක ආහාර වැඩසටහන වැනි ආයතනවලින් පවත්වාගෙන යන ආකාරයටය. කඳවුරු නායකයින්ගේ සහසම්බන්ධය ඇතිව කඳවුර කළමනාකාරීත්ව කණ්ඩායමට, ලෝක ආහාර වැඩසටහන වෙනුවෙන් ලියාපදිංචි කිරීමේ කටයුතු පවත්වා ගෙන යැමට ඉල්ලා සිටිනු ලැබේ.

# සරණාගත ස්ථානයක දී කඳවුරු කළමණාකරණ කණ්ඩායමට පැවරෙන වගකීම්

ලියාපදිංචි කිරීම සාමාන්‍යයෙන් තුන් ආකාරයට/මට්ටමකට වර්ගීකරණය කරන්නේ ලියාපදිංචි කිරීමේ සන්දර්භය අනුවය. එසේ ම එක්රැස් කරනු ලැබූ තොරතුරු ප්‍රමාණය සහ ස්වභාවය අනුවය.

## ලියාපදිංචි කිරීමේ මට්ටම් අනුව:

### පළමුවන මට්ටම : හදිසි අවස්ථාවකදී ලියාපදිංචි කිරීම

මෙම මට්ටමේ ලියාපදිංචි කිරීම් නිතරම හඳුන්වනු ලබන්නේ "නිවැසියන්" හෝ පාලක පත් ලියාපදිංචිය යනුවෙනි. ඊට හේතුව සරල පෝරමයක් දත්ත එක් කිරීමට යොදා ගැනීමය. මෙවන් ලියාපදිංචි කිරීමක් නිතරම කරනු ලබන්නේ විශාල පිරිසක් පැමිණෙන මුල් අදියරේ දී හෝ හදිසි තත්ත්වයකදී අවම තොරතුරු එකතු කිරීමය. මේ මට්ටමේ දී තොරතුරු එක්රැස් කරන්නේ නිවැසියන්ගෙන් හෝ පවුලෙනි. හැකිකමක් ඇත්නම් හැම පුද්ගලයෙකුටම ටෝකන් එකක් දිය යුතුය. කඳවුර තුළ ඇමතුම් ක්‍රමයක් පිහිටුවිය යුතු වන අතර පවුල් යලිත් සොයා ගත හැකිවේ.

**පළමුවන මට්ටම - තොරතුරු**

- නිවැසියන් හෝ පවුලේ ප්‍රමාණය
- පවුලේ හැම සාමාජිකයෙකුම ස්ත්‍රී/පුරුෂ සහ වයස අනුව වාර්තා ගත කළ යුතුය.
- පදිංචි ස්ථානය සහ ලිපිනය (උදා: නිවැසියන් පසු කටයුතු සඳහා සොයා ගැනීමට)
- පවුලේ පුරුෂ සහ ස්ත්‍රී මූලිකයන්ගේ නම්.
- නිවැසියන් හෝ පවුලේ උපන් රට
- නිවැසියන්ට හෝ පවුලට අවශ්‍ය විශේෂ අවශ්‍යතා

පළමුවන මට්ටමේ ලියාපදිංචි කිරීම් සම්මුඛ සාකච්ඡා හෝ ඡායාරූප ගැනීමට පෙර කළ යුතුවේ. මේ අදියරේ දී සරණාගතයන්ට පවුල් ලියාපදිංචි කිරීමේ කාඩ්පත් හෝ සලාක පත් අවස්ථාවේ හැටියට ලබා දිය යුතුය. හිමිකම් ලේඛන නිතරම නිකුත් කරනු ලබන්නේ පවුල් හෝ නිවැසියන් පදනම් කරගෙන, පවුලේ මූලික වන පුරුෂයා/ස්ත්‍රිය සලකාය. ලියාපදිංචි කළ මුල් අවස්ථාවේදීම ලේඛනගත කිරීමේ තොරතුරු අදාළ කඳවුරු කළමණාකරණ කණ්ඩායම වෙත යොමු කිරීම වැදගත්වේ.

**මට්ටම 2 : තහවුරු කළ කඳවුරුවල ලියාපදිංචි කිරීම.**

මූලික සැලසුම් සහ නිරීක්‍ෂණ කටයුතු සඳහා අවශ්‍යවන ලියාපදිංචි කිරීම මේ මට්ටමය. එසේම පළමුවන මට්ටමේදී එක්රැස් කරගත් තොරතුරු අතිරේක ඒවා වේ. දෙවන මට්ටමේ ලියාපදිංචි කිරීම පිළිබඳ අඛණ්ඩ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වන අතර එය කටයුතු රාශියකට උපකාර වෙයි. සහාය සහ මැදිහත්වීම මහා පරිමාණයේ සහ කුඩා ප්‍රමාණයේ මෙහෙයුම්වලදී හෝ සරණාගත කඳවුරු කළමනාකරණය කිරීමේ දී, සැළසුම් කිරීමේ දී, නිරීක්‍ෂණ සේවා සහ සහාය ලබාදීම, ප්‍රයෝජනයට ගැනීමට දෙවන මට්ටමේ ලියාපදිංචි කිරීමේ තොරතුරු අවශ්‍ය වේ. බොහෝ අවස්ථාවලදී, දෙවන මට්ටමේ ලියාපදිංචි කිරීම් කරනු ලබන්නේ පැමිණීමෙන් මාස තුනක් තුළදීය. මෙම අවස්ථාවේදී ලබා ගන්නා තොරතුරු එකිනෙක පුද්ගලයා කෙරෙහි අවධාරණය කෙරේ.

**මට්ටම 2 : තොරතුරු**

- නම :-
- ස්ත්‍රී/පුරුෂ භාවය :-
- උපන් දිනය :-
- දැනට පදිංචි ස්ථානය :-
- උපන් ස්ථානය, (ලිපිනය)
- පැමිණි දිනය, (කඳවුරට ආ දිනය සහ දේශ සීමාව පසුකළ දිනය)
- විශේෂ ආරක්‍ෂාව සහ අවශ්‍ය සහාය :-
- විවාහක/අවිවාහක බව :-
- පුරවැසි භාවය :-
- අධ්‍යාපන මට්ටම :-
- රැකියාව/දක්‍ෂතා :-
- ආගම :-
- උපතේදී ජාතිය (ගෝත්‍රය/වර්ගය/උප වර්ගය)
- ඡායාරූපය :-
- ජීවමිතිය (අවශ්‍ය නම්)
- තොරතුරු හුවමාරු කිරීමට අනුමැතිය

**මට්ටම 3 : තනි පුද්ගලයන් ලියාපදිංචි කිරීම :- සම්පූර්ණ (ජීව දත්ත) ආකෘතිය**

තනි පුද්ගලයින්ගේ ආරක්‍ෂාව සැලසුම් කිරීම සහ නිරීක්‍ෂණ කටයුතු සඳහා අවශ්‍ය පිළිගත් ලේඛනයයි. අවශ්‍ය සහාය හා සේවාවන් සැපයීමට එකිනෙක පුද්ගලයාගේ තත්ත්වය තිරණය කිරීමට. හඳුනා ගැනීම සහ කල්පවත්නා විසඳුම් ලබාදීමට අදාල වේ. එය ඉදිරිපත් වන්නේ දෙවන මට්ටමේ තොරතුරුවලට අමතර වශයෙනි. තුන්වන මට්ටමේ ලියාපදිංචි කිරීම කඳවුර විවෘත කර මාස 12 ක් තුළ සිදු විය යුතුය.

මට්ටම 3 : තොරතුරු

- භාර්යාවගේ නම :-
- පියාගේ / මවගේ සහ භාර්යාවගේ නම :-
- අමතර පුද්ගලයින්ගේ නම් :-
- දරුවන්ගේ නම් :-
- උපන් ස්ථානය :-
- තිබෙන පුද්ගලික ලේඛන :-
- රැකියාව :-
- භාෂා :-
- දේශීය වශයෙන් නිකුත් කළ ලියවිලි :-
- ස්වේච්ඡාවෙන් සියරට ගිය/යලි පදිංචි වූ/දේශීය පදිංචි කිරීමේ තත්ත්වය :-
- එකිනෙක පුද්ගලයාට විශේෂිත කරුණු, ඔවුන් අයත්වන කණ්ඩායම :- (නිවැසියන්/පවුල/සිද්ධිය)
- හඳුනා ගැනීමේ සළකුණු, එකම නමින් ඉන්න අයවලුන් ප්‍රත්‍යක්ෂ කරගැනීම සඳහා.



කොලොම්බියාවේ අභ්‍යන්තර අවතැන් වූ අයෙක් තම හඳුනාගැනීමේ කාඩ්පත පෙන්වයි. හඳුනා ගැනීමේ කාඩ්පත රජයෙන් ලැබෙන මානව සුභ සාධක සේවාවන් ලබාගැනීමට ඇති මූලික අවශ්‍යතාවයයි. සෞඛ්‍ය, අධ්‍යාපන, දීමනා, බැංකුණය ඡායාරූපය (පි. ස්මිත් UNHCR)

## සමග නොආ අයවලුන් සහ වෙන්වූ දරුවන් ලියාපදිංචි කිරීම

හමුදාමය අර්බුදවලදී, වෙනත් අර්බුදවලදී විශාල ජනගහනයක් අවතැන්වීම් වලදී නිරන්තරයෙන්ම දරුවන් ඔවුන්ගේ පවුල්වලින් වෙන් කෙරෙන අතර ඔවුන්ගේ භාරකාර වැඩිහිටියන්ගෙන් ඈත් වෙයි. මේ දරුවන්ට එක්තරා ආකාරයක අවදානමකි. ඒ ඔවුන්ට නිතරම ආරක්ෂාව සහ රැකවරණයන් අහිමි කෙරෙන නිසාය. (6 වන පරිච්ඡේදය බලන්න. ළමා රැකවරණය ළමයින්ගේ හඳුනා ගැනීම, තත්කාලීන ජීවන තත්ත්වය, වෙන්වීමේ ඉතිහාසය, අදහස් සහ අභිප්‍රායයන් ලේඛනගත කළ යුතුය. ලියාපදිංචි කිරීමේ පෝරම දරුවා විසින් තබාගැනීම හෝ දරුවා වෙත තිබිය යුතුය. ස්ථානය වෙනස්වීමක දී ඒ බව ඉක්මනින්ම වාර්තා ගත කළ යුතුවේ.

## කාන්තා සරණාගතයින් ලේඛනගත කිරීම

සම්පූර්ණ සහ නිරවද්‍ය කාන්තා ලේඛනගත කිරීමක් අවශ්‍ය වන්නේ කාන්තා සරණාගතයින්ගේ ආරක්ෂාව උදෙසාය. අදාල කාන්තාවන් කවුරුන්ද යන්න ලියාපදිංචි කිරීමෙන් ඔවුන් සිටින්නේ කොහිද, ඔවුන්ගේ පවුල, නිවැසියන්ගේ සංයුතිය, ලියාපදිංචියට අදාල පෞද්ගලික තොරතුරු, ඔවුන්ගේ පෞද්ගලික ආරක්ෂාව සහ අවශ්‍ය වන සහාය තක්සේරු කළ හැකිය. මේ මගින් හිසි මැදිහත්වීම් ඉලක්ක කර ගැනීම සහ ඔවුන්ගේ තත්ත්වය නිරීක්ෂණය කළ හැකිය. එක් අත්‍යාවශ්‍ය දෙයක් ලෙස කාන්තා සරණාගතයින්ගේ හිමිකම් ප්‍රවර්ධනය කිරීම එකිනෙක ලේඛනගත කිරීම සහ සියලුම ස්ත්‍රී සහ පුරුෂ සරණාගතයින් ලේඛනගත කිරීම කළ හැකිය.

## කඳවුරේ නව ප්‍රවේශකයින් ලේඛනගත කිරීම

කඳවුරේ දැනටමත් වෙසෙන ජනයා ලේඛනගත කිරීමට අනුගමනය කළ ක්‍රියාවලියට සමාන ක්‍රමයක් නව ප්‍රවේශකයින් සඳහා ද අනුගමනය කොට හඳුනා ගැනීමේපත් නිකුත් කළ යුතුවේ. හැකිතාක් දුරට නව ප්‍රවේශකයින් විකල්ප මගකින් පරීක්ෂා කළ යුත්තේ තවත් කඳවුරක ලියාපදිංචි වී නොමැතිදැයි හෝ වෙනත් බෙදා හැරීමේ ස්ථානයකින් සළාක පත් දෙවැනි වරටත් ගනිදැයි දැන ගැනීමටය. දත්ත සමුදායක් සකසා ඇත්නම් මෙය පහසුවෙන් කළ හැකිය. සරණාගත පසුබිමක දී තනි පුද්ගලයින්, පයින් එන්නන් කඳවුරු මට්ටමේ දී ලියාපදිංචි නොකළ යුතුය. සාමාන්‍යයෙන් අවසාන කඳවුරට ළඟාවීමට පෙර වෙනත් අවස්ථාවන් තිබිය හැකිය. එනම් දේශ සීමාව, එක්සත් ජාතීන්ගේ සරණාගත ක්ෂේත්‍ර නිලධාරීන්, මාරුවන මධ්‍යස්ථාන ආදිය වේ. හරියාකාර දත්ත සමුදායක් නොමැති නම් පයින් එන්නන් දෙවරක් ලේඛනගත වීමට පහසුවෙන් ඉඩ ඇත.

## සත්‍යාපනය සහ ලේඛනයෙන් ඉවත් කිරීම

ලේඛනගත කිරීම පිළිබඳ තොරතුරු නූතනම විය යුතුය. ආරක්ෂාව සහ බෙදා හැරීමේ උපක්‍රම වැදගත් තොරතුරු සැපයීමට අමතරව නිතිපතා අළුත් කිරීම සහ දත්ත කළමණාකරණ වියදම් යන සහ සංකීර්ණ විශාල ලියාපදිංචි කිරීමේ අවශ්‍යතා අවම කරයි. ක්‍රම සහ පරිපාටි තිබිය යුතු වන්නේ නව ප්‍රවේශකයින් ලියාපදිංචි කිරීම සඳහා පැමිණීමේදීම. උපත් විවාහ සහ වෙනත් සිදුවීම් මීට ඇතුළත් වේ. ක්‍රම සහ උපාය මාර්ග ලේඛනගත වාර්තා සහ සරණාගත පත් සංශෝධනය කිරීම කළ යුතුවේ. එසේම පිටව ගිය සරණාගතයින් ලේඛනයෙන් ඉවත් කිරීම ද ඇතුළත්ය. නැති වුවන් අවලංගු කිරීම, හොරකම් කරන ලද සහ හානි වූ කාඩ් වෙනුවට පිටපත් කළ කාඩ් නිකුත් කළ යුතුය. සත්‍යාපනයට අදාල පුද්ගලයින්ගේ පෞද්ගලික පෙනීසිටීම ඇතුළත් වේ. මේ මගින් බහු වාර්තාගතවීම මග හැර දේශීය ජනකොටස සාවද්‍ය ලේඛන ගත කිරීම් සිදු නොවේ. නිවැසියන්ගේ සංයුතිය පරීක්ෂා කිරීම, පවුලේ සම්බන්ධතාවය, හඳුනාගැනීම, සේවා භාවිතය සහ සහායන් ආදිය මීට ඇතුළත් වේ. ලෝක ආහාර වැඩසටහන, එක්සත් ජාතීන්ගේ සරණාගත වැඩසටහන වැනි ආයතන සමඟ ලියාපදිංචි වී ඇත්දැයි දෙවැනි සොයාබැලීමක් කිරීම අවශ්‍යයෙන් ම සිදුවිය යුතු බව මතක තබා ගත යුතුවේ.

- **සම්මත මෙහෙයුම් පරිපාටිය :** කළමනාකරණ කණ්ඩායම තහවුරු කරගත යුතු වෙනවා, සම්මත, ලිඛිත මෙහෙයුම් පරිපාටියක් ලියාපදිංචි කිරීම සහ තොරතුරු රැස් කිරීම සම්බන්ධව තිබේ ද යන්න.

**ඇමතුම් ක්‍රම සහ පිහිටුවීම් :**

- **උපකරණ සහ ද්‍රව්‍ය මිළදී ගැනීම :** සම්මත ලියාපදිංචි ද්‍රව්‍ය මිළ දී ගත යුතුවේ. සැපයීම් සඳහා ක්‍රමයක් සංවිධානය කළ යුතුවේ.

- **පිහිටුවීම් ලියාපදිංචි කිරීම :** කණ්ඩායමට ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා පහසුකම් සැලසිය යුත්තේ අවදානම් සහිත කණ්ඩායම් වෙත පිවිසීමට සුරක්‍ෂිත භාවය ද සහිතවය.

- **සුදුසු කම් ලත් කාර්ය මණ්ඩලය :** කණ්ඩායමේ වගකීමක් වන්නේ පුහුණු පුද්ගලයින් සරණාගතයින් ලියාපදිංචි කිරීම සඳහා ලබාදීම සහ ස්වදේශිය නිලධාරීන් මේ කාර්යයට පුහුණු කිරීම සඳහාය. පරිවර්තකයින් ද යෙදිය යුතුවේ.

- **කාන්තා ලියාපදිංචි කිරීමේ කාර්ය මණ්ඩලය :** ලියාපදිංචි කිරීමේ සැම පියවරකදීම ප්‍රමාණවත් කාන්තා කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය. විශේෂ සහාය අවශ්‍ය කාන්තා සහ ගැහැනු ළමයින් හඳුනා ගැනීමට ඔවුන් පුහුණු කළ යුතුය.

- **තිබෙන තොරතුරු :** කණ්ඩායම විසින් තොරතුරු හදිසි අවස්ථාවේ මූලික අදියරේදීම සෙවිල්ලෙන් තෝරා ගත යුතුය. (ඉහත පළමුවන මට්ටම බලන්න) හැකි අවස්ථාවක දී කලින් කරන ලද ලේඛනගත කිරීම් වලින් තොරතුරු දත්ත සමුදායෙන් ලබාගෙන ලියාපදිංචි පෝරමයේ ඇතුළත් කළ යුතුය.

- **තොරතුරු පතුරුවා හැරීම :** ලියාපදිංචි කිරීමේ අරමුණ සහ අපේක්‍ෂිත ප්‍රතිඵල පිළිබඳ තොරතුරු විවිධ මාර්ග ඔස්සේ පතුරුවා හැරීම සහ වැඩිහිටියන්, කාන්තා කණ්ඩායම්, ආගමික නායකයින්, සහ පත්‍රිකා ද යොදා ගැනීම ඉතා වැදගත් වේ. කඳවුරු කළමනාකරණ කාර්යාලය මගින් කාර්යාලිය නිවේදන සඳහා පුවරුවක් කාර්යාලයෙන් පිටත යොදා ගත යුතු අතර කඳවුර පුරා වැඩියෙන් වසෙන තැන්වල දැන්වීම් පුවරු පිහිටුවිය යුතුවේ. එම පුවරු ප්ලාස්ටික් ආවරණ යොදා සකස්කර වසා තැබිය යුතු අතර කඳවුරු වැසියන් නිල තොරතුරු පමණක් කියවීම සාක්‍ෂාත් කළ යුතු වේ.

- **කාන්තා සහභාගිත්වය සඳහා ගනු ලබන පියවර :** කණ්ඩායම විසින් ලියාපදිංචි කිරීමට පිවිසීමට සුදුසු පියවර ගැන සපට විය යුතුය.

- **ජංගම ලියාපදිංචි කිරීමේ ඒකක :** අවශ්‍ය වුවන්ගේ නිවෙස්වලට ලියාපදිංචි කිරීමේ ජංගම කණ්ඩායම් යැවීම පිළියෙල කළ යුතුය. මෙය විශේෂයෙන් කඳවුරු වැසියන්ගේ නොහැකිකමේ සත්‍ය වුන්, වැඩිහිටියන්, රෝගී අය සම්බන්ධයෙන් වැදගත් වේ.

- **පැමිණිලි කිරීමේ පටිපාටි :** අවතැන් වුවන්ට පැමිණිලි කිරීමට සහ ලියාපදිංචි කිරීමේ කටයුතු දියුණු කිරීමට පටිපාටි සංස්ථාපනය කළ යුතුවේ.

- **ආරක්‍ෂිත ගබඩා කිරීම :** සියලුම පෞද්ගලික තොරතුරු සුරකිව තැබිය යුතුවේ.

## අභ්‍යන්තර අවතැන් වුවන් පිහිටුවීමේ අවස්ථාවකදී කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්

ජාතික අධිකාරීන්ට අභ්‍යන්තර අවතැන් වුවන් පිළිබඳ අදාල කටයුතු වලදී සම්පූර්ණ වගකීම පැවරෙන අතර එය ලියාපදිංචි කිරීම්වලට අදාල අයගේ සම්බන්ධය එක් අවශ්‍යතාවකි. අභ්‍යන්තර අවතැන් වුවන් ලියාපදිංචි කිරීම එක් එක් තත්ත්වයන් තුළ වෙනස් වෙන්නේ ජාතික අධිකාරීන්ගේ හැකියාව සහ උනන්දුව මතය. මෙතෙක් අභ්‍යන්තර අවතැන් වුවන් පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් අනුරූප වන ක්‍රමයක් ඇති වී නැත. බොහෝ රටවල යථායෝග ලියාපදිංචි කිරීම් පවත්වාගෙන ගොස් තිබෙන්නේ ප්‍රමාණය හා ඉලක්ක පිරිසගේ සංයුතිය ලබාගැනීම සඳහාය. මෙම පරිච්ජේදයේ දී අප උදාහරණයක් ලෙස ඉදිරිපත් කරන්නේ ලයිබීරියාවේ අභ්‍යන්තර අවතැන් වුවන් පිළිබඳ ජාතික ලේඛනාරූඪ මධ්‍යස්ථානය (NRC) විසින් ආදේශ කර ගනු ලැබ ඇති ලියාපදිංචි කිරීමේ ක්‍රමයයි. මේ කඳවුර ජාතික ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයේ (NRC) කඳවුරු කළමණාකරණ ඒජන්සි ක්‍රියාකාරීත්වය ගැන දැනටමත් පවති. මෙය, අවතැන් වුවන් ලියාපදිංචි කිරීම පිළිබඳ පරිපූර්ණ හැඳින්වීමක් නොවන බව අවධාරණය කරන්නට කැමැති වෙමු.

## ලයිබීරියා තත්ත්වය

අභ්‍යන්තර අවතැන් වුවන් ලියාපදිංචි කිරීමේ වගකීම ලයිබීරියානු සරණාගතයින් සියරට යැවීම සහ යලි පදිංචි කරවීම පිළිබඳ කමිටුව (LRRRC) වෙත පවතින අතර මානව සුභසාධක මෙහෙවර සම්බන්ධ ක්‍රියාකාරීන්ගේ සමීප සම්බන්ධතාවයෙන් සිදු කෙරේ. ලියාපදිංචි කිරීම සහ තොරතුරු එක්රැස් කිරීම විවිධ කණ්ඩායම් විසින් විවිධ අදියරවල දී සිදු කෙරේ. එල්ආර්ආර්ආර්සී (LRRRC) විසින් අභ්‍යන්තර අවතැන් වූ අයගේ නියෝජිතයින් කඳවුර තුළ දී තෝරාගනු ලබන්නේ කඳවුරු කළමණාකරණ කමිටුව සමගය. (උදාහරණ වශයෙන් සභාපතිතුමා / සභාපතිතුමිය ඒකක නියමුවන් ආදිය) තවද මෙහිදී නව ප්‍රවේශකයින්ට කඳවුරේ පදිංචිවීමට ඉඩදීම ද තිරණය කරයි. එසේ පිළිගනු ලැබුවහොත් ලෝක ආහාර වැඩසටහනේ පෝරමය පාදක කරගෙන ඒකක නියමුවන් විසින් (නිවැසියන්ගෙන් ප්‍රධානියා විසින්) මූලික තොරතුරු ඇතුළත් කළ යුතුය. මෙම අවස්ථාවේදී අවදානමට ලක් වූ පුද්ගලයින් හඳුනා නියමිත ලේඛන ගත කිරීම පසුව කඳවුර කළමනාකරණ කණ්ඩායම විසින් කරනවා ඇත.

අවතැන් වුවන් කඳවුරේ පදිංචි වූ පසුව කඳවුර කළමනාකාර කණ්ඩායම ඒකක නායකයින්ගේ මාර්ගයෙන් නව ලියාපදිංචි කිරීම් පවත්වනවා ඇත්තේ කඳවුරුවාසීන්ට සේවා සැපයීමේ පදනමක් වශයෙනි. මේ ආකාර ලියාපදිංචි කිරීමක් පවත්වනු ලබන්නේ නිත්‍ය පදනමක් මත අළුතින් පුද්ගලයින් කඳවුරට පැමිණීමේ දී සහ වැඩි පිරිසක් ඇති කඳවුරුවලින් වෙනත් තැන්වලට යැවීමේ දී සහ කඳවුරු වල ඉඩකඩ ඇති විටකදීය. ලියාපදිංචි කිරීම ගැන නිරන්තර නිරීක්ෂණයක් අවශ්‍ය වන්නේ අවතැන් වුවන් අඛණ්ඩව කඳවුරට එීම සහ ඉන් පිටව යන බැවිනි. ඒකක නියමුවන් විසින් කඳවුර කළමනාකරණ කණ්ඩායමේ නිරීක්ෂණය යටතේ පහත දැක්වෙන තොරතුරු රැස් කරනු ලැබේ.

**සම්මත ලෝක ආහාර වැඩසටහනේ (WFP) ලියාපදිංචි කිරීම.**

- කඳවුරේ ලිපිනය/නිවාස අංකය
- නිවාසි නියමුවරයාගේ නම
- නිවැසියන් හෝ පවුල් ප්‍රමාණය
- ස්ත්‍රී/පුරුෂ වශයෙන් පවුල් සංඛ්‍යාව
- වයස අවුරුදු පහට අඩු අයගේ සංඛ්‍යාව
- නිවැසියන්ට/පවුල්වලට අවශ්‍ය විශේෂ අවශ්‍යතා
- ආරම්භක ස්ථානය

අවදානම් සහිත පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දී, දෙමාපියන්ගෙන් වෙන් වූ දරුවන් වැනි අය, කඳවුරු කළමනාකරණ කණ්ඩායම විසින් සහ/හෝ අවදානමට ලක් වූවන් පිළිබඳ විශේෂිත අවධානයක් යොමු කරන ඒජන්සි ආයතන විසින් වෙනම කළ යුතු වේ.

අවතැන් වූවන්ගේ කඳවුරු සඳහා විශේෂිත හඳුනාගැනීමේ කාඩ්පත් නොමැත. ඇති එකම කාඩ්පත වන්නේ ලෝක ආහාර වැඩසටහනේ සලාක පත පමණි. නිවැසි නියමුවන් විසින් කාඩ් නිකුත් කිරීමට බලය ඇති අතර, විශේෂ අවධායනය යොමු කළ යුත්තේ නියමු නිවැසියන් වෙතය. ආපසු පැමිණීමේ අවස්ථාව සඳහා කාඩ් ලබාදීම වර්තමානයේ දී විවාදයට ලක් කර තිබේ. එක් විකල්පයක් නම් ආපසු පැමිණීමේ කාඩ් වර්ගයක් අවතැන් වූවන් විසින් ඔවුන්ගේ අයිතිය අහිමි නොකරගෙන ආපසු භාරදීමේ පැකේජයක් ලෙස නිරායාසයෙන් ආපසු භාරදිය හැකිය.

## කඳවුරු කළමණාකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීම

- **ඇමතුම් ක්‍රම සහ පිහිටුම් :** මැනවින් සංවිධානය වූ ඇමතුම් ක්‍රමයක් ඇති කිරීම අත්‍යවශ්‍ය සහ කඳවුරු පිහිටුවීම් මුලින් තහවුරු කළ යුතු වන්නේ හැකිතාක් ඉක්මනින් අවතැන් වූවන් පැමිණීමට පෙරාතුවය.

- **ලියාපදිංචි කිරීමේ ක්‍රම :** කඳවුරු කළමණාකරණ කණ්ඩායමට හොඳ ලියාපදිංචි කිරීමේ ක්‍රමය ඇති කිරීමට සහ දියුණු කිරීමට විකල්ප ගැන සොයා බැලීමේ වගකීමක් පවතී.

- **සම්බන්ධීකරණය සහ සහයෝගිතාව :** දේශීය අධිකාරීන් සමඟ මනා වූ සම්බන්ධීකරණයක් සහ සහයෝගිතාවක් ඇති කරගත යුතුය. කඳවුරු නිවැසි කමිටු/නියෝජිතයින් සහ ලියාපදිංචි කිරීමට සම්බන්ධව අනෙක් ක්‍රියාකාරීන් ද මීට ඇතුළත්ය.

- **නිරීක්ෂණය :** කඳවුරු කළමනාකරණ කණ්ඩායම නිත්‍ය පදනමක් මත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලින් නිරීක්ෂණය කළ යුතුවේ.

- **කාන්තා ලියාපදිංචි කාර්ය මණ්ඩලය :** ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ විවිධ අදියරවලදී ප්‍රමාණවත් කාන්තා සහභාගීත්වයක් තිබිය යුතුය. අවතැන් වූවන්ගේ විශේෂ සහාය අවශ්‍ය කාන්තාවන් සහ ළමුන් හඳුනා ගැනීමට ඔවුන් පුහුණු කළ යුතුය.

- **තොරතුරු පතුරුවා හැරීම :** විවිධ මාර්ග ඔස්සේ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය, අපේක්ෂිත ප්‍රතිඵල සාර්ථකත්වය පිළිබඳ තොරතුරු පතුරුවා හැරීම වැදගත්ය. ඒ සඳහා වැඩිහිටියන්, කාන්තා කණ්ඩායම්, ආගමික නායකයින්, නිවැසි නියමුවන්, මාධ්‍යය, පුවත් පුවරු ද ඇතුළත් විය යුතුය.

- **කාන්තා සහභාගිත්වය පිළිබඳ ගනු ලබන පියවර :** කණ්ඩායමට ප්‍රමාණවත් කාන්තා සහභාගිත්වයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ දී ලබාගත යුතුවේ.

- **අවදානම් සහිත වූ කණ්ඩායම් :** අවදානමට ලක්වූ කණ්ඩායම් ලියා පදිංචි කිරීමට සහ පසු විපරම් කිරීමට වෙනම ලියාපදිංචි කිරීමක් කරයි.

- **පැමිණිලි කිරීමේ පටිපාටි :** සරණාගතයින්ට පැමිණිලි කිරීමට සහ ලියාපදිංචි කිරීමේ කටයුතු දියුණු කිරීමට යෝජනා ඉදිරිපත් කිරීමට පටිපාටි ඇති කළ යුතුවේ.

- **ආරක්ෂක ගබඩාකරණය :** ආරක්ෂිත පිළිවෙලකට සියලුම තොරතුරු තැන්පත් කළ යුතුවේ.

## කඳවුරු වැසියන්ගේ දත්ත සමුදාය

විද්‍යුත් දත්ත සමුදායක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ දී ප්‍රයෝජනවත් උපකරණයක් විය හැකි වන අතර වඩාත් දියුණු ලියාපදිංචි කිරීමේ ක්‍රමයක් පවත්වා ගැනීමට ඉඩකඩ සලසා දෙයි. ඩිජිටල් පින්තූර, GIS ක්‍රම සහ මිහිමත මං සෙවීමේ පද්ධති (GPS) මගින් සම්බන්ධීකාරකයින් යොදා ගැනීමට, යොදා ගැනීමේ හැකියාව හරියටම කඳවුරු රැඳවියන් ජිවත්වන්නේ කොහිද යන්න අනාවරණය කර ගැනීමට පුලුවන්කම තිබේ. එසේම ඔවුන්ගේ අවදානම් සහිත බව, ආරම්භක ප්‍රදේශය, වහසි වශයෙන් දැක්විය හැකිය. මෙම ක්‍රමයෙන් එකිනෙක නිවැසියන් කඳවුරේ සිතියම් ගත කිරීමට, ප්‍රශ්නවලට මුහුණ දී ඇති පවුල්වලට අදාල ජන සංඛ්‍යා ලේඛන තොරතුරු ඇතුළත් කිරීමට, පුලුවන් වේ. විද්‍යුත් දත්ත සමුදායක් මගින් නිතර නිතර අවශ්‍ය කාලානරූපි කිරීම් පහසු කරයි. කඳවුරු කළමනාකරණ කණ්ඩායම එවැනි ලියාපදිංචි කිරීමේ ක්‍රම ගැන මනා අවබෝධයක් ලබා තිබිය යුතුය. අදාල එකිනෙක අයගේ පෞද්ගලික තොරතුරු වැඩිමනක්ම ඇතුළත් කිරීම නීත්‍යානුකූල විය නොහැකි විය හැකි අතර සමහරක් ක්‍රම ප්‍රමාණවත් නොවේ. එක්සත් ජාතීන්ගේ සරණාගත තානාපති වෙනුවෙන් පක්‍ෂව කතා කිරීම සහ ලියාපදිංචි කිරීම නිරීක්‍ෂණය කිරීම කඳවුර කළමණාකරණ කණ්ඩායමේ වගකීමක් වේ. විශ්වාසී බවට ගරු කළ යුතු අතර දත්ත සමුදායේ ඇති තොරතුරු හුදෙක් වෘත්තිය කටයුතු වලට පමණක් යොදා ගත යුතුය. ප්‍රවේශ සංකේත යොදා ගැනීමෙන් රහස්‍ය බව තහවුරු කළ හැකිය.

ඇති විය හැකි ගැටලු වැලැක්වීම සඳහා ජනවාර්ගික වශයෙන්, ජාතික වශයෙන් (නීත්‍යානුකූල වන්නේ නම්) ලියාපදිංචි කිරීම ප්‍රයෝජනවත්ය. භාෂාව සහ ආගම අනුව ද ලියාපදිංචි කළ හැකිය. මෙම තොරතුරු ඉගැන්වීමට, වන්දනා මාන කිරීමට තැන් පිහිටුවීමට, ප්‍රචාරක ද්‍රව්‍ය නිපදවීමට ප්‍රයෝජනවත් විය හැකිය. ආහාර ද්‍රව්‍ය බෙදා හැරීමට, ආදායම්, වටිනාකම් සහ වියදම් ලේඛනගත කිරීමට ප්‍රයෝජනවත් විය හැකිය. විශේෂයෙන්ම අවතැන් වූවන් දිගු කලක් නතරවී සිටින විට මෙය විශේෂිතය.

# මෙවලම් කට්ටලය

### කඳවුරු කළමණාකරුවන් ලියාපදිංචි කිරීම පිළිබඳ හරි වැරදි බැලීමේ ලේඛනය :

විශ්ලේශනය, සැලසුම් කිරීම හෝ ලියාපදිංචි කිරීම සිදු කිරීම කෙරෙන විට මේ අයිතම සැලකිල්ලට ගත යුතු ප්‍රශ්න වේ. වෙනත් කරුණු ද අදාල වීමට පිළිවන.

### එක්සත් ජාතීන්ගේ සරණාගත ප්‍රමිති වර්ග සහ පරිපාටි : (UNHCR)

මෙම ලේඛනය (ඇමුණුම 7 එක්සත් ජාතීන්ගේ ලියාපදිංචි කිරීමේ අත්පොතින් උපුටාගන්නා ලදී) අරුත් දක්වන පරිදි එක්සත් ජාතීන්ගේ සරණාගත තානාපති ආයතනය මගින් අනුගමනය කරනු ලබන විවිධ වර්ග පැහැදිලි කරයි. කඳවුරු කළමණාකරුවන්ට සහ සරණාගතයින් හා අවතැන් වූවන් මැනවින් තේරුම් ගැනීම පිණිස එක්සත් ජාතීන්ගේ සරණාගත තානාපති ආයතනය වර්ගීකරණය සහ පටිපාටි, විශේෂ ආරක්‍ෂාව අවශ්‍ය පුද්ගලයින් හඳුනාගැනීමට හැකිවෙනු ඇත.

### එක්සත් ජාතීන්ගේ ලියාපදිංචි කිරීමේ පෝරමය මට්ටම 2 (UNHCR)

කඳවුරක බෙහෙවින් මූලික සැළසුම් සහ නිරීක්‍ෂණ කටයුතු වලට අදාල තොරතුරු ලබා ගැනීමට මෙම පෝරමය උපකාරි වේ. දෙවන මට්ටම ලියාපදිංචි කිරීම පළමුවන මට්ටම ලියාපදිංචි කිරීමේ දී එක්රැස්

කරගත් තොරතුරුය. දෙවන මට්ටමෙ ලියාපදිංචි කිරීම අඛණ්ඩ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියක ආරම්භය බව සලකන්න.

## එක්ව නොපැමිණි සහ නැතිවූ දරුවන් ලියාපදිංචි කිරීමේ පෝරමය (UNHCR)

මෙම පෝරමයේ ඇතුළත්වන තොරතුරු එක්ව නොආ සහ නැති වූ දරුවන් යලි දෙමව්පියන්ට හා ආරක්ෂකයින් වෙත පැමිණීවිමට උපකාර වන බැවින් වෙනම ලියාපදිංචි කළ යුතුවේ. ලියාපදිංචි කිරීමේ පෝරම දරුවා සමඟ හෝ දරුවා වෙත තිබිය යුත්තේ පදිංචිය වෙනස්වීමක දී ඉක්මනින්ම වාර්තා කළ යුතු හෙයිනි.

### අවශ්‍යයෙන්ම කියවිය යුතු සහ පරිශීලනය කළ යුතු ලේඛන :

- එක්සත් ජාතින්ගේ සරණාගත තානාපති (UNHCR) 2003 ලියාපදිංචි කිරීම සඳහා අත්පොත
- එක්සත් ජාතින්ගේ සරණාගත තානාපති (UNHCR) 2003 හදිසි අවස්ථා පිළිබඳ අත්පොත
- එක්සත් ජාතින්ගේ සරණාගත තානාපති (UNHCR) 2003 සරණාගතයින් පිළිබඳ ආරක්ෂාව
- සරණාගතයින් පිළිබඳ ජාත්‍යන්තර නීතිය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා අත්පොත ජිනීවා (UNHCR)
- එක්සත් ජාතින්ගේ සරණාගත තානාපති (UNHCR) 1991, සරණාගත කාන්තාවන්ගේ ආරක්ෂාව පිළිබඳ මෙහෙයුම් නිර්නායකයන්, ජිනීවා, (UNHCR)
- UNHCR - 1998 අභ්‍යන්තර අවතැන් වූවන් පිළිබඳ මෙහෙයුම් ප්‍රතිපත්ති - ජිනීවා
- UNHCR - 1998 අභ්‍යන්තර අවතැන් වූවන් පිළිබඳ අනුගමනය කරනු ලබන මෙහෙයුම් ප්‍රතිපත්ති පිළිබඳ අත්පොත ජිනීවා - UNHCRA
- නෝර්වීජියානු සරණාගත කවුන්සිලය (NRC) ජගත් අවතැන් වූවන් පිළිබඳ සමීක්ෂණය - 1998 හිමිකම් සඳහා සීමාවන් නොමැත. ලොව පුරා අභ්‍යන්තර අවතැන් වූවන් ජිනීවා (NRC) වින්සන්ට්, එම්/රෙජ්ස්ලුන්ව් සොරෙන්සන්, B(Eds) NRC. 2001 දේශ සීමාවන් අතර දී අල්ලා ගන්නා ලදී. අභ්‍යන්තර අවතැන් වූවන්ගේ උපක්‍රම, සම්බන්ධ ප්‍රතිචාර NRC - ඔස්ලෝ
- එක්සත් ජාතින්ගේ සරණාගත තානාපති 2002 ආරක්ෂක උපක්‍රම සැළසුම් කිරීම සහ මිනුම් ප්‍රගතිය : එක්සත් ජාතින්ගේ සරණාගත නිලධාරින් සඳහා හරි වැරදි බැලීමේ ලේඛනය
- IRC 2003 අනාගතය සුරකීම : අවතැන් වූවන් සහ යුද්ධය බලපෑ ජනයා HIV වැළැක්වීම, රැකවරණය සහ සහයෝගය.

- WWW.unhcr.ch
- WWW.reliefweb.int/ocha ol/
- WWW.wfp.org/
- WWW.unicef.org/
- WWW.theirc.org

## සඳවුරු කළමනාකරුවන් සඳහා ලියාපදිංචි කිරීම පිළිබඳ හරි වැරදි බැලීමේ ලේඛනය :

1 ලියාපදිංචි කිරීම සඳහා පටිපාටියක් තිබේ ද?

2 එය පරිපූර්ණ එකක් ද?

3 වගකීමට බැඳී සිටින්නේ කවුරුන් ද?

4 එක්සත් ජාතීන්ගේ සරණාගත "truck manifest" ස්වරූපයේ වාර්තාගත දත්ත දැනටමත් තිබේ ද?

5 ලියාපදිංචි කිරීම කරනු ලබන්නේ තනි තනි පුද්ගලයින් වශයෙන් ද පවුල් වශයෙන් ද?

6 නැති වූ කාඩ් වෙනුවෙන් අළුතින් නිකුත් කිරීමේ පරිපාටියක් තිබේ ද?

7 ලියාපදිංචි කිරීමේ පත් යොදා ගනු ලබන්නේ අයිතිකරුගේ අනන්‍යතාව සහ නිකුත් කරන ස්ථානය තහවුරු කිරීමට ද?

8 අවදානමට ලක් වූ අය වෙනම ලියාපදිංචි කරනු ලැබේ ද? (ළමයින්, ආබාධිත අය වෙන් කරනු ලැබේ ද?)

9 ලියාපදිංචි කිරීමේ පත් ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය නිකුත් කිරීම් සඳහා භාවිත කෙරේ ද?

10 ජන කොට්ඨාස නියෝජිතයින් මගින් හෝ සෘජුව බෙදා හැරීම් කරනු ලබන්නේ ද? කවුරුන් විසින් ද?

# ඇමුණුම 07 : එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ සම්මත වර්ගීකරණයන් සහ පටිපාටි

**එක්සත් ජාතීන්ගේ සරණාගත සම්මත පොදු අරමුණක් වෙනුවෙන් එකතු වූ පිරිස් (සම්මත වයස් කාණ්ඩ)**

| වර්ගය | විස්තරය | කේතය |
|---|---|---|
| වයස අවුරුදු 0-4 | වයස අවු : 0-4 අතර සියලුම අය (වයස අවුරුදු 05 ට අඩු සියල්ලන්) | A-1 |
| වයස අවුරුදු 5-17 | වයස අවු : 5-17 අතර සියලු වයස් කාණ්ඩ (සියලුම අය අවම වශයෙන් වයස අවු : 05 සහ අවු : 18 ට අඩු) | A-2 |
| වයස අවුරුදු 18-59 | වයස අවු : 18 සහ 59 අතර සියලු දෙනා (සියලුම අය අවම වශයෙන් වයස අවු : 18 සහ 60 ට අඩු) | A-3 |
| වයස අවුරුදු 60 හෝ ඊට | වයස අවු : 60 හෝ ඊට වැඩි මහල් | A-4 |

**එක්සත් ජාතීන්ගේ සරණාගත වර්ගීකරණය. ස්ත්‍රී / පුරුෂ වාර්තාගත**

| වර්ගය | විස්තර | කේතය |
|---|---|---|
| ගැහැණු | සෑම වයස්වල කාන්තාවන් | F |
| පිරිමි | සෑම වයස්වලම පිරිමි | M |

**එක්සත් ජාතීන්ගේ සරණාගත සම්මත වර්ග සඳහා නිවැසියන්ගේ සම්බන්ධකම් සහ පවුල් ලියාපදිංචි කිරීම.**

| වර්ගය | විස්තර | කේතය |
|---|---|---|
| නිවැසියෝ නියෝජනය 1 | මෙය සාමාන්‍ය පවුලේ තනි පුද්ගලයින් හෝ පවුලේ සාමාජිකයින් විසින් නිවැසියෙක් ලෙස සලකනු ලබන්නෙකු හෝ මූලික නියෝජිතයෙකු ලෙස සලකන්නෙකු. සාමාන්‍යයෙන් ඔහු පුරුෂයෙකි. කාන්තා වුවද විය හැකිය. | HR1 |
| නිවැසියෝ නියෝජනය 2 | මෙය සාමාන්‍යයෙන් පවුලේ කාන්තාවන් හෝ පවුල තුළ මූලික වගකීම ඇති අය වේ. ඒ පවුලේ මූලිකයාගේ බිරිඳ, මව හෝ දියණිය විය හැක. මේ තැනැත්තා සහ නිවැසියන්ගේ වෙනත් මූලිකයින් අතර ඇති සම්බන්ධතාව සටහන් කළ යුතුය. | HR2 |
| බිරිඳ | නීත්‍යානුකූල හෝ පොදු නීතිය යටතේ බිරිඳ | SPO |
| දරුවා (පුතා/දුව) | ස්වාභාවික හෝ සහජාත, උපත ද ඇතුළත්, දරුකමට හදාගත් හෝ ඥාති දරුවන්, රටේ තත්ත්වය අනුව කැපකරු දරුවන් ඇතුළත් වීමට හෝ නොවීමට පිළිවන | CHI |
| දෙමව්පියන් පියා/මව | උපතින්, දරුකමට හදාගැනීමෙන් හෝ ඥාති මාපියන්, නැන්දා/මාමා ඇතුළත් නොවන්නේ වෙනම වර්ගයක් ඇති බැවිනි. | PAR |
| සීබියා/සහෝදරිය | නීතියෙන් හෝ ස්වභාවික සීබියන් (ලේ නෑයන්) දරුකමට හදාගත් සහ ඥාති සහෝදරයන් හා සහෝදරියන් ඇතුළත් වේ. රටේ තත්ත්වය අනුව කැපකරු සහෝදරයන් හෝ සහෝදරියන් ඇතුළත් විය හැකිය. නෑනා/මස්සිනාවරුන් ඇතුළත් නොවේ. (උදා: මස්සිනා හෝ නෑනා) | SBR |
| සීයා/ආච්චි | සෘජු ලේ සීයා/ආච්චි, ආච්චි හෝ සීයාගෙන් කෙනෙකි, මුතුන් මිත්තන් ද ඇතුළත් වේ. නැන්දා මාමා විසින් ආච්චි/සීයා ඇතුළත් නොවේ. | CPR |
| මුණුපුරා/මිනිපිරිය | උපතින්, දරුකමට හදාගැනීමෙන් හෝ ඥාති දරු මුණුපුරන් මී දරු මුණුපුරන් ද ඇතුළත් වේ. | CCH |
| මාමා/නැන්දා | උපතින්, දරුකමට හදා ගැනීමෙන් හෝ මවුපියන්ගේ සහෝදරියන් සහ සහෝදරියන් (නිවැසි නියමුවා හෝ නිවැසි ගෘහමූලික) | AOU |

| | | |
|---|---|---|
| මස්සිනා | ස්වාභාවික, දරුකමට හදාගත් හෝ මාමා හෝ නැන්දාගේ ඥාති දරුවන් (ගෘහ මූලික නියෝජිතයා හෝ නිවැසි ගෘහ මූලික) මස්සිනාවරුන්, බිරිඳගේ මස්සිනාවරුන් ඇතුළත් නොවේ. | CUS |
| බෑනා/ලේලි | ස්වභාවික, දරුකමට හදාගත් හෝ මව්පියන්ගේ සහෝදරයා හෝ සහෝදරියගේ ඥාති දරුවන් | NEP |
| දරුවන්ගේ දරුවන් | බිරින්දෑවරුන් (නීති හෝ පොදු නීතිය) දරුවන්ගේ | ILC |
| නැන්දනිය/මාමණ්ඩිය | බිරිඳගේ දෙමාපියන් | ILP |
| වෙනත් | විවාහය හේතුවෙන් ඇති ඥාතිත්වය, සහජාත දරුවන්ගේ බිරින්දෑවරුන් ආදී | ILO |
| වෙනත් ලේ ඥාතින් | වෙනත් වර්ග වලට අයත් නොවන ගෘහමූලික හෝ නිවැසි නියෝජිත වර්ගවලින් ආවරණය නොවන | OFM |
| ලේ ඥාතින් නොවන | ලේ නෑකමින් හෝ විවාහයකින් ඥාති නොවන නිවැසි සාමාජිකයින් | UNR |
| නොදත් ඥාතිත්වය | ඥාතිත්වය/සම්බන්ධය නොදනී | |

**විවාහක තත්ත්වය ලේඛනගත කිරීම පිණිස එක්සත් ජාතීන්ගේ සරණාගත තානාපති ආයතනයේ සම්මත වර්ගීකරණය**

| වර්ගය | විස්තර | කේතය |
|---|---|---|
| තනි | කිසිදු විවාහ නොවූ පුද්ගලයන් පමණක් "තනි" පුද්ගලයින් ලෙස දැක්විය යුතුය. | SW |
| විවාහ ගිවිසගත් | සමාජයක් තුළ සම්ප්‍රදායානුකූලව හෝ නීත්‍යානුකූලව විවාහ ගිවිස ගත් අයට අදාල වේ. ජෝඩුව ආරක්ෂාව, සහාය හා කල්පවත්නා විසඳුම් කාර්ය සඳහා ද යන්න සලකා බැලිය යුතුවේ. | EG |
| විවාහක | පොදු නීතිය යටතේ ඇති සබඳතාව සහ සබඳියාව ඇතුළත් වේ. | MA |
| වෙන්වූ | නීතියෙන් වෙන් වූ සමාන අයව සැලකේ, ආරක්ෂාව, සහාය සහ කල්පවත්නා විසඳුම් වෙනුවෙන් එකට නොසිටින ජෝඩුවලට අදාල වේ. | SR |

| | | |
|---|---|---|
| දික්කසාද වූ | දික්කසාද වී තවමත් අවිවාහක, අය දික්කසාද වූ ලෙස සලකනු ලැබේ. යලි විවාහ වූ විට, පුද්ගලයින් විවාහක ලෙස සැලකිය යුතුවේ. | DV |
| වැන්දඹු | වැන්දඹු අය යලි විවාහ වූ විට විවාහක ලෙස සැලකිය යුතුවේ. | WD |

**එක්සත් ජාතින්ගේ සරණාගත තානාපති ආයතනයේ සම්මත වර්ගීකරණය සඳහා අධ්‍යාපනික මට්ටම අනුව ලේඛනගත කිරීම**

| වර්ගය | විස්තරය | කේතය |
|---|---|---|
| අධ්‍යාපනය නොලත් | ප්‍රාථමික මට්ටමෙන් එපිට විධිමත් අධ්‍යාපනයක් නොලැබූ | NE |
| 1 වසර(හෝ පළමු ශ්‍රේණිය) | පළමු වසර විධිමත් අධ්‍යාපන අවම වශයෙන් සම්පූර්ණ කළ | 01 |
| 2 වසර(හෝ 2 වන ශ්‍රේණිය) | වසර දෙකක් අවම වශයෙන් විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද | 02 |
| 3 වසර(හෝ 3 වන ශ්‍රේණිය) | වසර තුනක් අවම වශයෙන් විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද | 03 |
| 4 වසර(හෝ 4 වන ශ්‍රේණිය) | වසර හතරක් අවම වශයෙන් විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද | 04 |
| 5 වසර(හෝ 5 වන ශ්‍රේණිය) | වසර පහක් අවම වශයෙන් විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද | 05 |
| 6 වසර(හෝ 6 වන ශ්‍රේණිය) | වසර හයක් අවම වශයෙන් විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද | 06 |
| 7 වසර(හෝ 7 වන ශ්‍රේණිය) | වසර හතක් අවම වශයෙන් විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද | 07 |
| 8 වසර(හෝ 8 වන ශ්‍රේණිය) | වසර අටක් අවම වශයෙන් විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද | 08 |
| 9 වසර(හෝ 9 වන ශ්‍රේණිය) | වසර නවයක් අවම වශයෙන් විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද | 09 |
| 10 වසර(හෝ 10 වන ශ්‍රේණිය) | වසර දහයක් අවම වශයෙන් විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද | 10 |
| 11 වසර(හෝ 11 වන ශ්‍රේණිය) | වසර එකොළහක් අවම වශයෙන් විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද | 11 |

| | | |
|---|---|---|
| 12 වසර (හෝ 12 වන ශ්‍රේණිය) | වසර දොළහක් අවම වශයෙන් විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද. | 12 |
| කාර්මික/වෘත්තිය | නියමිත රැකියාවක නියුතුවීමට අදාලව සුදානම් වන ඉගෙනීම් සඳහා ස්වයං රැකියා හෝ ජීවන ක්‍රමයකට පරිපූරකව ලබන ඉගෙනීම. කුසලතා පුහුණුව හෝ ආධුනිකත්ව පුහුණුව ද ඇතුළත් විය හැක. | TC |
| විශ්ව විද්‍යාල මට්ටම | පශ්චාද් ද්විතිය විශ්ව විද්‍යාල මට්ටමේ අධ්‍යාපන මට්ටම ඇතුළත් වේ. වෘත්තිය/අධ්‍යාපනයට වැඩි මට්ටමේ අධ්‍යාපනයක් විශ්ව විද්‍යාල අධ්‍යාපනය යනුවෙන් සැලකේ | PE |
| විධිමත් නොවන අධ්‍යාපනය | විධිමත් නොවන පාසල් අධ්‍යාපනයට අදාලවේ. නිවෙසේ අධ්‍යාපනය, ස්වයං අධ්‍යාපනය සහ ආගමික අධ්‍යාපනය, විධිමත් පාඨමාලාවකින් තොර අධ්‍යාපනය ඇතුලත් වේ. | IN |
| නොදත් | අධ්‍යාපන මට්ටම නොදන්නා | UN |

**විශේෂ රැකවරණය සහ සහාය අවශ්‍ය වර්ගවලට අයත් එක්සත් ජාතීන්ගේ සරණාගත තානාපති සම්මත**

| වර්ගය | විස්තර | කේතය |
|---|---|---|
| ආබාධිත | ශාරීරික හෝ මානසික ආබාධිත ස්ත්‍රී හෝ පුරුෂ විය හැකිය. | DS |
| විශේෂිත නිතිමය සහ ශරීරික ආරක්‍ෂාව අවශ්‍ය | විශේෂ තත්ත්වයන් යටතේ අවදානමට ලක් වුවන් සේ සලකන ගනයන්ට අයත් නොවන; උදාහරණ ලෙස ප්‍රචණ්ඩත්වයෙන් පෙළෙන්නන් හෝ නිශ්චිත ජනවාර්ගික හෝ ආගමික ජන කොටස් | LP |
| අවදානමට ලක්වන කාන්තාවන් | විශේෂයෙන් අවධානමට ලක් වු කාන්තාවන්, තනි කාන්තාවන් හෝ පවුලේ සාමාජිකයින් හෝ ප්‍රචණ්ඩනයන්ගෙන් පසුවන කාන්තාවන් | WR |
| තනි මාපියන් | පුරුෂයෙකු හෝ ස්ත්‍රියක විය හැක. වයස අවුරුදු 18 ට අඩු ගැහැණු ළමයෙකු / පිරිමි ළමයෙකු විය හැක. රක්‍ෂා ස්ථානයක දෙවන මාපියන් නොමැති නිවැසියන් ඇතුළත් වේ. | SP |
| කැඳවාගෙන නොආ සහ නැති වු දරුවන් | අවුරුදු 18 ට අඩු පිරිමි හෝ ගැහැණු දරුවන් විය හැක. | U/SC |
| නොආ වැඩිහිටියන් | ස්ත්‍රී පුරුෂ විය හැකිය. සාමාන්‍යයෙන් වයස අවුරුදු 59 ට වැඩි අය. ජන කොට්ඨාශයේ වැඩිහිටි සාමාජිකයින්ගේ සංස්කෘතික ප්‍රතිමාන අදාල කර ගත හැක. | UE |

| | | |
|---|---|---|
| මන්දපෝෂිත | ළදරුවෙක්, ගැහැණු දරුවෙක්, පිරිමි දරුවෙක් හෝ මිනිසෙක්, පෝෂණ තත්ත්වයන් කෙරෙහි තවදුරටත් සොයා බැලිය යුතු අය | MN |
| ප්‍රබල වෛද්‍ය තත්ත්වය | සොයා බැලිය යුතු විශේෂිත වෛද්‍ය තත්ත්වයන්ට අදාලවේ. සියරට යැවීම හෝ යලි පදිංචි කිරීම වැනි තත්ත්වයන් කෙරේ සැලකිලිමත්වීම. නිරීක්ෂණය කළ යුතු ක්ෂය රෝගය වෙනත් තත්ත්වයන් විය හැක. | SM |
| ගැබිනි | ගැබිනි කාන්තාවන් හෝ ගැහැණු ළමයින් | PT |

**එක්සත් ජාතීන්ගේ සරණාගත තානාපති ආයතනයේ සම්මත ආකාරයට ආගමික වර්ගීකරණය කිරීම**

| වර්ගය | විස්තර | කේතය |
|---|---|---|
| අහමදියා | අහමදියා ලෙස ද උච්චාරණය කරයි. (අහමදීස්) | AHM |
| ඇන්ග්ලෝ කතෝලිකවාදය | ඇන්ගිලිකන් | ANG |
| ජීවවාදීය | ජීවවාදියා | ANI |
| පූර්වජයින් පිදීම | | ANC |
| ආ දේවවාදය | ආදේවවාදියා | ATH |
| බහායි විශ්වාසය | බහායි | BAH |
| බැප්ටිස්ට් පල්ලිය | බැප්ටිස්ට් | BAP |
| බෞද්ධාගම | බෞද්ධයා | BUD |
| කචොදායි | | CAO |
| ක්‍රිස්තියානි ධර්මය | මෙම ලේඛනයේ ඇතුළත් නොවන වෙනත් ක්‍රිස්තු භක්තිකයින් | CHR |
| ක්‍රිස්තු විද්‍යාවාදි | ක්‍රිස්තු විභවවාදියා | CSC |
| කොන්පියුසියස් දහම | කොන්පියුසියස්වාදියා | COF |
| පෙරදිග නිදහස | ආර්මේනියම්, ඇසිරියන්, කැල්ඩියන්, ඉතියෝපියන්, කොප්ටික් | EAS |
| පාලුන් ගොංග් | | FLG |
| හින්දු දහම | හින්දු | HIN |
| ඉස්ලාම් | මෙම ලේඛනයේ ඇතුළත් නොවන වෙනත් ඉස්ලාම්වාදීන් | MUS |

| | | |
|---|---|---|
| ඉස්මායිලි | ඉස්මායිලියන් | ISM |
| ජෙහොවාස්වරුන් | ජෙහාස්වාදීන් | JEH |
| ජෛනදහම | ජෛනයින් | JAI |
| යුදෙව් දහම | යුදෙව්වා | JDS |
| ලූතර් දහම | ලූතර් ලබ්දියා | LUT |
| බහු විවාහ ක්‍රමය පිළිගන්නා ජේසු ක්‍රිස්තුවාදය | එම ආගමේ සාමාජිකයෙක් | MOR |
| ඔතොඩොක්ස් ක්‍රිස්තියානි | ග්‍රීක, රුසියන් හා සර්බියන් ඔතොඩොක්වාදීන් අයත් වේ | ORT |
| පාර්සි | | PAR |
| පෙන්තකොස්ත පල්ලිය | පෙන්තකොස්තයා | PEN |
| ප්‍රොතෙස්තෝ ප්‍රතිසංස්කරණය | ක්‍රිස්තු නිකායේ ප්‍රොතෙස්තෝ ශාඛාවක | PRO |
| රෝමන් කතෝලික | රෝමන් කතෝලිකයා | ROM |
| සික් දහම | සික් | SIK |
| විද්‍යාවේදියා | | SCI |
| සින්තෝදහම | සින්තෝලබ්දියා | SHI |
| භූත වේදය | භූත වේදියා-භූතවේදවාදියා ලෙස ද හඳුන්වයි | SPI |
| සුන්නි | සුන්නි ලබ්දියා | SUN |
| ෂියා | ෂියා ලබ්දියා | SHI |
| තාඕදහම | තාඕලබ්දිය | TAO |
| සරතුස් දහම | සරතුස් අනුගාමියා | ZOR |
| යිදිස් දහම | යිදිසි (යිෂිදිස් ලෙස ද උසුරුවයි) | YAZ |
| ආගමක් නැති | | NON |
| වෙනත් | | OTH |

දේපල අයිතිය පිළිබඳ වාර්තා තබා ගැනීමේ එක්සත් ජාතීන්ගේ සරණාගතයින්ගේ තානාපති ආයතනයේ වර්ග

| වර්ගය | විස්තරය | කේතය |
|---|---|---|
| ඔව් | දේපල අයිතිය ඇත. | Y |
| නැතිවිය | කලින් අයිතිව තිබූ දේපල තමුන් එනවිට අයිතිය පවරාගෙන හෝ ස්වීරව අනෙකුත් පියවර යටතේ නැතිවීම | L |
| නැහැ | අයිතියක් නැති දේපල | N |

දේපල ලේඛනගත කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සරණාගත තානාපති ආයතනයේ සම්මත වර්ගීකරණය

| වර්ගය | විස්තරය | කේතය |
|---|---|---|
| පාවිච්චිය සඳහා ඇත | දේපල හෝ නවාතැන් ගැනීම ඉඩ තිබෙනවා, අයිතිකරුවා විසින් නැවතීම සඳහා | AV |
| පදිංචි වී ඇත | අයිතිකරුගේ ගිවිසුම හෝ අවසරය නැතිව පදිංචි වී ඇත | OC |
| අලාභහානි වී ඇත | දේපල වලට අලාභහානිවී හෝ විනාශ වී ඇත. | DM |
| වැලලී ඇත | දේපල පිළිබඳ තත්ත්වය නොදනී | NK |

ස්ථාන වර්ග ලේඛනගත කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සරණාගත ආයතනයේ සම්මත වර්ගීකරණයක්

| වර්ගය | විස්තරය | කේතය |
|---|---|---|
| නාගරික කඳවුර | නාගරික පසුබිමක පිහිටි, කඳවුරු (5000 කට අඩු දේශීය නිවැසියන් පදිංචිව සිටින කඳවුරු | UCP |
| නාගරික මධ්‍යස්ථාන | සාමාජික මධ්‍යස්ථාන, අතරමැදි මධ්‍යස්ථාන, හිරගෙවල්, රෝහල්, නාගරිකව පිහිටි වෙනත් වර්ගවල සාමූහික, වෙනත් වර්ගවල සාමූහික ආයතන | UCT |
| ග්‍රාමීය කඳවුර | ග්‍රාමීය ප්‍රදේශවල පිහිටි කඳවුරු (දේශීය ජනයා 5000 ට වඩා අඩුවෙන් වෙසෙන ස්ථාන) | RCP |
| ග්‍රාමීය මධ්‍යාස්ථාන | සාමූහික මධ්‍යස්ථාන, අතරමැදි මධ්‍යස්ථාන, හිරගෙවල්, රෝහල් සහ ග්‍රාමීයව පිහිටි වෙනත් සාමූහික වර්ගවල ස්ථාන | RCT |
| නාගරික තනි වාසස්ථාන | තනි වාසස්ථානවල ස්ථානගත කළ, සී සී කඩ ගිය නාගරික ප්‍රදේශවල ජනයා (ජනගහනය 5000) | UIA |
| ග්‍රාමීය-තනි වාසස්ථාන | තනි වාසස්ථානවල ස්ථාන ගත කළ සී සී කඩය ගිය ග්‍රාමීය ප්‍රදේශ වල ජනයා ඒවා 5000 ට අඩු වාසයක් ඇති ස්ථානය | RIA |

| 88-ISCO දෙවන මට්ටම සම්මත | 88-ISCO තුන්වන මට්ටම උපවර්ග සඳහා සම්මත | කේතය |
|---|---|---|
| ව්‍යවස්ථාදායක සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් | ව්‍යවස්ථාදායකයින් : ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරින්: සම්ප්‍රදායික ප්‍රධානීන් සහ ගම්වල ප්‍රධානීන්: විශේෂිත කටයුතු සඳහා විශේෂිත උනන්දුවක් ඇති ආයතනවල, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් | 11 |
| සංස්ථාපිත කළමනාකරුවන් | අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන විධායකයින් නිෂ්පාදන සහ ක්‍රියාකාරී දෙපාර්තමේන්තු කළමනාකරුවන් : වෙනත් දෙපාර්තමේන්තු කළමණාකරුවන් | 12 |
| සාමාන්‍යාධිකාරීවරු | සාමාන්‍යාධිකාරීවරුන් | 13 |
| ස්වභාවික, ගණිතය පිළිබඳ සහ ඉංජිනේරු වෘත්තිකයින් | භෞතික විද්‍යාඥයින්, රසායන විද්‍යාඥයින් සහ අදාල වෘත්තිකයින්, ගණිතඥයින්, සංඛ්‍යා ලේඛඥයින් සහ අදාල වෘත්තිකයින්, පරිගණක වෘත්තිකයින්, වාස්තු විද්‍යාඥයින් ඉංජිනේරුවන් සහ අදාල වෘත්තිකයින් | 21 |
| ජීව විද්‍යාව හා සෞඛ්‍ය වෘත්තිකයින් | සෞඛ්‍ය වෘත්තිකයින් (වෛද්‍යයන් හැර) වෛද්‍යයන්, වින්නඹු මාතාවන් සහ අදාල වෘත්තිකයින් | 22 |
| ඉගැන්වීම හා සම්බන්ධ වෘත්තිකයින් | විද්‍යාල, විශ්ව විද්‍යාල, සහ උසස් අධ්‍යාපන වෘත්තිකයින්, ද්විතියක පාසල් අධ්‍යයන වෘත්තිකයින්, ප්‍රාථමික සහ පෙර පාසල් අධ්‍යාපන වෘත්තිකයින්, විශේෂ අධ්‍යාපන වෘත්තිකයින්, වෙනත් අධ්‍යාපන වෘත්තිකයින් | 23 |
| වෙනත් වෘත්තිකයින් | ව්‍යාපාරිකයින්, නීති වෘත්තිකයින්, සංරක්ෂිතයින්, පුස්තකාලාධිපතින් සහ අදාල තොරතුරු වෘත්තිකයින්, සමාජ විද්‍යාව සහ අදාල වෘත්තිකයින්, ලේඛකයින්, නිර්මාණ ශිල්පීන් සහ ප්‍රසාංගික කලාකරුවන්, ආගමික වෘත්තිකයින් | 24 |
| ස්වභාවික සහ ඉංජිනේරු විද්‍යාව සහ අදාල වෘත්තිකයින් | ස්වභාවික සහ ඉංජිනේරු විද්‍යාව කාර්මිකයින් පරිගණක ආශ්‍රිත වෘත්තිකයින්, දෘෂ්ටි සහ විද්‍යුත් උපකරණ ක්‍රියාකාරින්, නැව් සහ ගුවන් යානා පාලකයින් සහ කාර්මිකයින් ආරක්ෂක සහ තත්ත්ව පරීක්ෂකයින් | 31 |
| ජීව විද්‍යාව සහ සෞඛ්‍ය ආශ්‍රිත වෘත්තිකයින් | ජීව විද්‍යා කාර්මිකයින් සහ අදාල ආශ්‍රය වෘත්තිකයින්, නූතන සෞඛ්‍ය ආශ්‍රය වෘත්තිකයින් (වෛද්‍යයන් හැර) වෛද්‍යයන්, වින්නඹු මාතාවන් හා ආශ්‍රය වෘත්තිකයින්, සම්ප්‍රදායික වෛද්‍ය සේවාවන්හි නියුතු සහ සුවකරන්නන්. | 32 |

| | | |
|---|---|---|
| ඉගැන්වීම ආශ්‍රය වෘත්තිකයින් | ප්‍රාථමික අධ්‍යාපනික ඉගැන්වීම් ආශ්‍රය වෘත්තිකයින්, පෙර පාසල් අධ්‍යාපනික ඉගැන්වීම් ආශ්‍රය වෘත්තිකයින්, විශේෂ අධ්‍යාපන ඉගැන්වීම් ආශ්‍රය වෘත්තිකයින්, වෙනත් ඉගැන්වීම් ආශ්‍රය වෘත්තිකයින් | 33 |
| වෙනත් ආශ්‍රය වෘත්තිකයින් | මූල්‍ය සහ අලෙවි අංශ වලට අදාල වෘත්තිකයින්, ව්‍යාපාර සේවා ඒජන්තවරු හා වෙළඳ බ්‍රෝකරුවරු, පරිපාලන වෘත්තිකයින්, රේගු ආදායම් බදු, ටැක්ස් හා අදාල රාජ්‍ය වෘත්තිකයින්, හා අදාල රාජ්‍ය වෘත්තිකයින්, පොලිස් පරීක්ෂකවරු සහ රහස් පරීක්ෂකවරු, සමාජ සේවකයින්, කලාකරුවන්, විනෝද සහ ක්‍රීඩා ආශ්‍රිය වෘත්තිකයින්, ආගමික වෘත්තිකයින් | 34 |
| වෙනත් ලිපිකරුවන් | ලේඛිකාවන් සහ යතුරු පුවරු ක්‍රියාකාරී ලිපිකරුවන්, සංඛ්‍යාත්මක ලිපිකරුවන්, ද්‍රව්‍ය ලේඛනගත කිරීම සහ ප්‍රවාහන ලිපිකරුවන්, පුස්තකාල තැපැල් සහ අදාල ලිපිකරුවන් වෙනත් කාර්යාලයීය ලිපිකරුවන් | 56 |
| කස්ටම් සේවා ලිපිකරුවන් | කැෂියර්වරු, ටෙලර් සහ ආශ්‍රය සේවකයින්, සේවාදායකයාට අදාල තොරතුරු ලබා දෙන ලිපිකරුවන් | 42 |
| පුද්ගලික සහ ආරක්ෂක සේවා සේවකයින් | සංචාරක ඇටෙන්ඩන්වරු සහ අදාල සේවකයින්, ගෘහ පාලක සහ අවන්හල් සේවා සේවකයින්, පුද්ගලික රැ කවරණ සහ ආශ්‍රිය සේවා, වෙනත් වෘත්තිය සේවකයින්, නක්ෂත්‍රයින්, සාස්තර කියන්නන් හා අදාල සේවකයින්, ආරක්ෂක සේවා සේවකයින් | 51 |
| නිරූපිකාවන්, අලෙවි සේවකයින්, ආදර්ශකයින් | පැෂන් සහ වෙනත් නිරූපිකාවන්, සාප්පු වෙළඳ සේවකයින් සහ ආදර්ශකයින්, වෙළඳ කුටි සහ වෙළඳ පොළ අලෙවි සේවකයින් | 52 |
| වෙළඳ පොළ සම්බන්ධ කුසලතා ඇති කෘෂි සහ ධීවර සේවකයින් | වෙළඳ පොළ සඳහා වවන්නන් සහ ධාන්‍ය වගාකරුවන්, වෙළඳ පොලට සත්ව නිෂ්පාදන හා අදාල සේවකයින්, වෙළඳ පොළ ධාන්‍ය, සත්ව නිපැයුම්කරුවන්, වන කළමණාකරණය සහ අදාල සේවකයින් ධීවර සේවකයින්, දඩයම්කරුවන් හා උගුල් අටවන්නන්. | 61 |
| යැපුම් කෘෂි සහ ධීවර සේවකයින් | යැපුම් කෘෂිකර්මය හා ධීවර සේවකයින් | 62 |

| | | |
|---|---|---|
| ගොඩනැගිලි වෙළඳ සේවකයින් | පතල් කරුවන්, තුවක්කු කරුවන්, ගල් කපන්නන්, කැටයම්කරුවන්, ගොඩනැගිලි රාමු සහ අදාල වෙළඳාම් ගොඩනැගිලි අවසන් කරන්නන් සහ අදාල වෙළඳ සේවකයින් | 71 |
| ලෝහ, යාන්ත්‍රෝපකරණ සහ අදාල වෙළඳ සේවකයින් | ලෝහ වැඩකරුවන්, වෑල්ඩර්වරුන්, සීට්-ලෝහ සේවකයින්, සංස්කෘතික ලෝහ සකසන්නන්, හා ආශ්‍රිය සේවකයින්, කම්මල්කරුවන්, කට්ටල සාදන්නන්, සහ අදාල වෙළඳ සේවකයින්, යන්ත්‍රෝපකරණ මැකනික්වරු සහ පිටර්ස්වරු, විදුලි සහ විද්‍යුත් උපකරණ මැකනික් සහ පිටර්ස්වරු | 72 |
| නිරවද්‍යතාකරුවන්, අත්කම් භාණ්ඩ, මුද්‍රණ සහ අදාල වෙළඳ සේවකයින් | ලෝහ හා අදාල ද්‍රව්‍ය සම්බන්ධ නිරවධ්‍යතා සේවකයින්, කුඹල්කරුවන්, වීදුරු හදන්නන්, සහ අදාල වෙළඳ සේවකයින්, ලි වලින් අත්කම්භාණ්ඩ සාදන්නන්, රෙදිපිලි, හම් සහ අදාල ද්‍රව්‍ය, මුද්‍රණ සහ අදාල කර්මාන්ත | 73 |
| වෙනත් නිමැවුම් සහ අදාල වෙළඳ සේවකයින් | ආහාර සැකසුම් හා අදාල වෙළඳ සේවකයින්, ලි වෙළෙන්දන්, කැබිනට් සාදන්නන්, හා අදාල වෙළඳ සේවකයින්, රෙදිපිලි, ඇදුම් සහ අදාල වෙළඳ සේවකයින් සත්ව හම්, හම් සහ සත්තු සාදන කර්මාන්ත, සේවකයින් | 74 |
| ලිපිද්‍රව්‍ය, ප්ලාන් සහ අදාල ක්‍රියාකරුවන් | පතල් හැරීම, හා ඛනිජ ද්‍රව්‍ය සැකසීමේ ප්ලාන්ට් ක්‍රියාකරුවන්, ලෝහ සැකසීමේ ක්‍රියාකරුවන්, විදුරු, පිඟන් හා අදාල ප්ලාන්ට් ක්‍රියාකරුවන්, ලි සකසන්නන්, සහ කඩදාසි සාදන්නන් ප්ලාන්ට් ක්‍රියාකරුවන් රසායන ද්‍රව්‍ය සකසන ප්ලාන්ට් ක්‍රියාකරුවන්, බලය නිපදවන නිපදවීම අදාල ප්ලාන්ට් ක්‍රියාකරුවන්, රථවාහන එකලස් කිරීම හා කාර්මික රොබෝවන් ක්‍රියාකරවන්නන් | 81 |
| යන්ත්‍ර ක්‍රියාකරුවන් සහ එක්ලස් කරන්නන් | ලෝහ හා ඛනිජ නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකරුවන්, රසායනික නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකරුවන්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකරුවන්, ලි නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකරන්නන්, මුද්‍රණ, බැදීම ඍහ කඩදාසි නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකරුවන්, රෙදිපිලි, ලොම්, සහ හම් නිෂ්පාදන යන්ත්‍ර කළයාකරන්නන්, ආහාර ආශ්‍රිත නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකරන්නන්, එක්ලස් කරන්නන්, වෙනත් යන්ත්‍ර ක්‍රියාකරන්නන් සහ එක්ලස් කරන්නන්. | 82 |
| රියදුරන් සහ ජංගම යන්ත්‍ර සූත්‍ර ක්‍රියාකරන්නන් | ලොකොමොටිව්, එන්ජින් රියදුරන් සහ අදාල සේවකයින්, මෝටර් රථ රියදුරන්, කෘෂිකාර්මික සහ වෙනත් ජංගම ප්ලාන්ට් ක්‍රියාකරුවන්, නැව් ඩෙක් කාර්ය මණ්ඩල සහ අදාල සේවකයින් | 83 |

| | | |
|---|---|---|
| වෙළඳ සහ සේවා, මූලික රැකියාවල නියුතු වූවන් | වීදි වෙළෙන්දන් හා අදාල සේවකයින්, සපත්තු ශුද්ධ කරන්නන් සහ වෙනත් වීදි සේවා, මූලික වෘත්තීන්, ගෘහාශ්‍රිත සහ අදාල උදව්කරුවන්, ශුද්ධකරන්නන්, සහ ලොන්ඩ්‍රිසේවා, ගොඩනැගිලි කඩන්නන්, ජනෙල් දොරවල් ශුද්ධ කරන්නන්, පණිවුඩකරුවන්, පෝටර්වරු, දොර රැඳවියන්, සහ අදාල සේවකයින්, කැලි කසල එක්කරන්නන් සහ සේවාවන් | 91 |
| කෘෂිකාර්මික, ධීවර සහ අදාල කම්කරුවන් | කෘෂිකාර්මික, ධීවර කර්මාන්ත අදාල කම්කරුවන් | 92 |
| පතල් කම්කරුවන්, ඉදිකිරීම්, නිෂ්පාදක සහ ප්‍රවාහන | පතල් සහ ඉදිකිරීම් කම්කරුවන් නිෂ්පාදන කම්කරුවන්, ප්‍රවාහන සේවකයින් සහ ගුවන්යානා සේවකයින් | 93 |
| හමුදා සේවා | හමුදා බලකා | 01 |

## දෙවන මට්ටමේ (UNHCR) ලියාපිදිංචි කිරීමේ පෝරමය.
## අවතැන්ය කිරීමට මේ තැන "ක්ලික්" කරන්න.

**UNHCR**
එක්සත් ජාතීන්ගේ සරණාගත ඒජන්සි

**REGISTRATION FROM**

| | |
|---|---|
| සලාක හෝ හඳුනා ගැනීමේ අංකය | |
| ගෘහ මූලික ප්‍රධානය | |

| උපන් රටේ ස්ථානය | | රට | ජනපදය / පළාත | කම්යූනය / දිස්ත්‍රික්කය | නගරය /ගම |
|---|---|---|---|---|---|
| | HR1 | | | | |
| | HR2 | | | | |

| රැකවරණය ලබන රටේ වත්මන් ස්ථානය | රට | නගරය, කඳවුර හෝ පදිංචිය |
|---|---|---|
| | | |
| | කැටිය සහ/හෝ කොටස් අංකය | නිවස/කුලිය ලිපිනය කුඩාරම් |
| | | |

| ආපසු යෑමට අපේක්ෂාව | අපේක්ෂිත දිනය | | දේපල | ගෙදර: ඔව් / නැත |
|---|---|---|---|---|
| | | | | ඉඩම: ඔව් / නැත |

| හඳුනා ගැනීමේ අංක | HR1 | HR2 |
|---|---|---|
| | | |

ගෘහ මූලික නියෝජිතයන්

| | දෙන ලද නම | වෙනත් නම් 1 | වෙනත් නම් 2 | ලිංගය | දින/මාස/අවු: | ද්‍රව්‍ය සත්වය | Rel to HR1 | අධ්‍යා: | වෘත්තිය කුසලතා | විශේෂ අවශ්‍යතා | පුද්ගලි සලකුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ☐ | | | | | | | HR1 | | | | |
| 2 ☐ | | | | | | | | | | | |

එක්ව එන ගෘහ මූලික අංක

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3 ☐ | | | | | | | | | | | |
| 4 ☐ | | | | | | | | | | | |
| 5 ☐ | | | | | | | | | | | |
| 6 ☐ | | | | | | | | | | | |
| 7 ☐ | | | | | | | | | | | |
| 8 ☐ | | | | | | | | | | | |
| 9 ☐ | | | | | | | | | | | |
| 10 ☐ | | | | | | | | | | | |
| 11 ☐ | | | | | | | | | | | |
| 12 ☐ | | | | | | | | | | | |

| | ආගම | වර්ගය | ජාතිය | DOA in COA |
|---|---|---|---|---|
| HR1 | | | | |
| HR2 | | | | |

| වෙනත් කරුණු / නිරීක්ෂණ |
|---|
| රැකවරණය සහ කල්පවත්නා විසඳුම් සඳහා තොරතුරු හුවමාරුවට අවසර නැත. ☐ |

* ☑ වෙන වෙනම පිළිතුරගත් විට "✓" කරන්න

| ලියාපදිංචි කළේ | දිනය | ඉසව්ව | | දත්ත ඇතුළත් කළේ | දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |

▽
▽
▽

**අවපතනය කිරීමට මෙතන ක්ලික් කරන්න : එකට නොආ සහ වෙන්ව සිටින දරුවන් සඳහා ලියාපදිංචි කිරීමට පෝරමය. (UNHCR)**



## එක්ව නොආ සහ වෙන්ව සිටින දරුවන් සඳහා ලියාපදිංචි කිරීමේ පෝරමය

ඡායාරූපය

ICRC හඳුනාගැනීමේ පත්‍රය ..........................................
එක්ව නොආ දරුවන්

කරුණාවෙන් සලකන්න :

- දෙමව්පියන් දෙදෙනාගෙන් වෙන් වූ වයස අවු :18 ට අඩු ඕනෑම තැනැත්තෙක් වෙන්වූ දරුවෙකු වේ. නොඑසේනම් ඔහුගේ / ඇයගේ පෙර නිතිමය හෝ මූලික රැකවරණය දුන් අය, නමුත් අවශ්‍යයෙන්ම වෙනත් නෑදෑයන්ගෙන් නොවේ. එක්ව නොආ දරුවෙකු වයස අවු: 18 ට අඩු ඕනෑම තැනැත්තෙකු දෙමාපියන්ගෙන් වෙන් වූ නැත්නම් ඔහුගේ/ඇගේ ඥාතින්

- දරුවා ඔහුගේ/ ඇගේ ලිපිනය නොදනී නම් කරුණාකර අදල වෙනත් තොරතුරු දක්වන්න. එනම් පල්ලියේ විස්තර මොස්ක් එකේ විස්තර පාසලේ සහ වෙනත් සලකුණු.

මෙම පෝරමය බෝල්ට්පොයින්ට් පෑනකින් පුරවන්න.

## 1. ළමයාගේ අනන්‍යතාව

පෞද්ගලික හඳුනාගැනීමේ ලේඛන අංකය.......................................................................... ගැහැණු / පිරිමි

සම්පූර්ණ නම (දේශිය වශයෙන් අමතන පිළිවෙලට)..................................................................

එසේම හඳුන්වන වෙනත් නම් (විකට නාම)

නම (නම්) දෙමාපියන්ගෙන් වෙන්වූ පසු අන් අය විසින් දෙන ලද ..............................................

උපන්දිනය/ වයස .......................................... උපන් ස්ථානය ..................................................

ජාතිය .......................................... රට ..................................................

ජනවාර්ගික කණ්ඩායම ............................................................................

**කථා කරන භාෂාව / භාෂා** ..................................................................................

හඳුනාගැනීමේ ශාරීරික ලක්ෂණ ......................................................................................

පියාගේ නම ........................................................................................................

මවගේ නම ........................................................................................................

ළමයාට සමීප වෙනත් පුද්ගලයින් ..............................................................................

වෙන්වීමට පෙර ළමයාගේ ලිපිනය (ඔහු /ඇය ජිවත් වූයේ කා සමගද ?)

..........................................................................................................................

දුරකථන අංකය ..........................................................................

ළමයා වෙන් වූ පසු ලිපිනය (ඔහු /ඇය ජිවත් වුයේ කා සමගද?) ..........................................

දුරකථන අංකය ..........................................................

2 ළමයා සමඟ එන පුද්ලයින් (සහජාතයින්ද ඇතුළුව)

(අ) සම්පූර්ණ නම ..............................................................................................................

ඥාති සම්බන්ධය .............................................. උපන් ස්ථානය සහ දවස ..............................

වත්මන් ලිපිනය ..............................................................................................................

.................................................................................... දුරකථන අංකය : ........................................

(ආ) සම්පූර්ණ නම ..............................................................................................................

ඥාති සම්බන්ධය .............................................. උපන් ස්ථානය සහ දවස ..............................

වත්මන් ලිපිනය ..............................................................................................................

.................................................................................... දුරකථන අංකය : ........................................

---

03. වර්තමානයේ දරුවා වෙසෙන ස්ථානය

(අ) ළමා මධ්‍යස්ථානය (ඇ) තනිව

(ආ) සැපකරු පවුල (ඉ) වෙනත්

සම්පූර්ණ නම ..............................................................................................................

ලිපිනය ............................................................................................ දුරකථන අංකය ................................

පැමිණියේ කොහි සිටද ?........................................ මෙම ස්ථානයට පැමිණි දිනය ................................

---

04. වෙන්වීම පිළිබඳ ස්ථානය

වෙන් වූ දිනය සහ ස්ථානය ..............................................................................................................

වෙන් වීමට බලපෑ කරුණු ..............................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

---

05. ළමයා බේරාගනු ලැබූ විටකදී

කවරෙක් විසින් ද ? කුමන සංවිධානයක් මගින් ද ? ..............................................................................

කොහිදීද ?..............................................................................................................

ගෙනයන ලැබුවේ කුමන ස්ථානයකට ද ? ..............................................................................

දිනය

---

06. වෙනත් තොරතුරු

දරුවා හිටපු හමුද සෙබලෙක්ද ? ඔව් .............................................. නැහැ ..............................................

**07. මව්පියන්ගේ තත්ත්වය**

පියා ජීවත්ව සිටියි / මියගොස් ඇත / නොදනී ..........

මව ජීවත්ව සිටියි / මියගොස් ඇත / නොදනී ..........

දෙමාපියන් මියගොස් යැයි විශ්වාසකරන්නේ නම් කරුණාකර විස්තර දක්වන්න ..........

..........

..........

---

**08. දරුවාගේ අපේක්ෂා**

දරුවා සොයාගැනීමට කැමතිවන තැනැත්තා / තැනැත්තන්

(අ) පියා (ආ) මව (ඇ) සහෝදරයා

(ඈ) සහෝදරිය (ඉ) වෙනත් (කරුණාකර විස්තර කරන්න)

**තැනැත්තා (අ)**

නම සහ සම්බන්ධය ..........

අන්තිමට දැන සිටි ලිපිනය ..........

දුරකථන අංකය ..........

**තැනැත්තා (ආ)**

නම සහ සම්බන්ධය ..........

අන්තිමට දැන සිටි ලිපිනය ..........

දුරකථන අංකය ..........

**තැනැත්තා (ඇ)**

නම සහ සම්බන්ධය ..........

අන්තිමට දැන සිටි ලිපිනය ..........

දුරකථන අංකය ..........

---

**09. අනාවරණය කරගැනීමට සම්බන්ධ සම්මුඛ සාකච්ඡාවට භාජනය කළ වෙනත් ආයතන**

දරුවා වෙනත් ආයතනයක් මගින් සම්මුඛ සාකච්ඡාවට භාජනය කර තිබේ ද? ඔව්/නැහැ ..........

සංවිධානයේ නම ..........

සම්මුඛ සාකච්ඡාව කළ ස්ථානය .......... දිනය ..........

රට ..........

වෙනත් සංවිධාන මගින් දරුවාට දෙන ලද යොමු අංකය ..........

10. දරුවා විසින් ගෙන එන ලද ලේඛන ලැයිස්තුව

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

---

11. දරුවාගේ පවුල සොයාගැනීමට උදව් විය හැකි අමතර තොරතුරු

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

---

12. දරුවා ඔහුගේ /ඇගේ නම සහ ඥාතීන්ගේ ජනමාධයෙන් හෙළි දරව් කිරීමට කැමතිද ? (ගුවන් විදුලිය/ අන්තර්ජාලය ආදිය)

ඔව් / නැහැ ........................................

---


13. සම්මුඛ සාකච්ඡාව කළ ස්ථනය සහ දිනය ..............................................................................

14. සම්මුඛ සාකච්ඡාව කළ අයගේ නම සහ සංවිධානය ..............................................................

15. දරුවාගේ පවුල සොයාගැනීමට කටයුතු කරන සංවිධානය

---

# 5 රැකවරණය



ජාත්‍යන්තර පොදු සම්මතයන් සහ ප්‍රමිතීන් විසින් පිළිගන්නා ලද, අවතැන්වූවන්ගේ මානව අයිතීන් තහවුරුවීම රැකවරණයයි. ඡායාරූපය : *UNHCR*

# පරිච්ඡේදය 5 : රැකවරණය

## හැඳින්වීම:

ජාත්‍යන්තරව අත්සන් කොට පිළිගත් සම්මතයන් සහ ප්‍රමිතීන්ට අදාලව මානව අයිතීන් තහවුරු කෙරෙන බවට පැහැදිලි කළ මැදිහත්වීම්, අභ්‍යන්තර අවතැන් වූ අය සහ සරනාගතයින්ගේ රැකවරණය ලෙස හැඳින්විය හැකිය. සරණාගතයින් සහ අභ්‍යන්තර අවතැන් වූවන්ට අවශ්‍යවන ආරක්ෂාව බොහෝ සෙයින් එක හා සමානය. ඔවුන් බොහෝවිට පලා යන්නේ සමාන හේතු මතය. එසේම ඔවුන්ට මුහුණ දෙන්න වෙන්නේ පලා යෑමේ දී සහ අවතැන්වීමේ දි සමාන දුෂ්කරතාවලටය. අභ්‍යන්තර අවතැන් වූවන් අවතැන් වන්නේ ඔවුන්ගේම රටේ වීම තීරණාත්මක වෙනසය. සරණාගතයෙකු ලෙස පිළිගැනීම සඳහා ජාත්‍යාන්තර වශයෙන් පිළිගත් දේශ සීමාවක් පසුකර යා යුතුවේ.

> තකාලීන බොහෝ අර්බුද වලදී, ජත්‍යාන්තර මානව සුභසාධක නීතිය, මානව හිමිකම් සහ සරණාගත නීතිය නොදන්නා දෙයකි. නොසලකා හරින ලද, හෝ සිතාමතාම අගෞරවනීය බවට පත්වේ. පවතින ජාත්‍යන්තර සම්මත සහ සැලකීම අතර අදහස් හා හැඟීම් ආදියේ පරතරය ඔවුන් අරඹයා නියත වශයෙන්ම කවදාවත් එතරම් පුළුල් නොවිය. අපගේ බලවත්ම අභියෝගය වන්නෙ දැනට ක්‍රියාත්මක ජාත්‍යන්තර නීති සහ මූලික ප්‍රතිපත්තීන් හදුනා ගැනීම තුළින් පරතරය අවම කිරීමයි.
>
> *සර්පියෝ වියිරා ද මෙලෝ (හිටපු කනිෂ්ඨ ලේකම් ජනරල් සහ හදිසි සහන සම්බන්ධීකාරක OCHA ), 1999. ඩි මෙලෝ 2003. දි ඉරානයේ මරා දමන ලදි.*

මෙම මෙහෙයුම් කට්ටලයේ හැම මාතෘකාවක්ම ආමන්ත්‍රණය කරනු ලබන්නේ ඊටම සම්බන්ධවූ රැකවරණයකටය. එම නිසා මෙම පරිච්ඡේදයෙන් සවිස්තරාත්මකව කිරීමට අපේක්ෂා නොකෙරේ. කඳවුරු කළමනාකරණයට අදාල මූලික රැකවරණ කරුණු පිළිබඳ හරස් කඩක් ගැන, ඒජන්සි ආයතන සහ උපදෙස් ලබාගත් පුද්ගලයින් විසින් විස්තර කරන ලද පරිදි සලකා බලනු ඇත.

### සරනාගතයින්ගේ රැකවරණය :-

සරණාගතයින් යන්න සාමාන්‍යයෙන් යොද ගනු ලබන්නේ ජාත්‍යංතර රැකවරණය අවශ්‍ය තැනැත්තන් හැඳින්වීමටය. 1951 ප්‍රඥප්තියේ සහ 1967 සරණාගතයින්ගේ මුල ලේඛවලට අනුව මෙම තැනැත්තන් තමන්ගේ රට හැර යා යුතු වන්නේ වර්ගය, ආගම හා ජාතිය නිසා හිංසනයට ලක්වූ හොඳින් දැනගත් බියක් යම් සමාජ හෝ දේශපාලන වෙනසක් දරන කණ්ඩායමක සමාජිකයෙකුවීම, හේතු කොට ගෙනය. හමුද අර්බුද බලපෑමෙන් වෙනස්කම් නොසලකා හරින ලදුව පලායනවුන්ද සරණාගතයින් ලෙස සලකනු ලබයි. සමාන්‍ය කරනය කරන ලද ප්‍රචන්ඩ තත්ත්ව විදේශ බලපෑම් හෝ මහජන නියමයන්ට බලවත් සේ හිංසාකාරී වු අවස්ථා (උද. 1969 අප්‍රිකානු සමගි සංධානය සහ 1984 කාර්තගිනා ප්‍රකාශය) ද පිළිගනු ලබයි. ජාත්‍යංතර රැකවරණයක පිළිගැනීම අවශ්‍ය වන්නේ සහ ප්‍රතිපතිත්වලට අනුරූපි යෝග්‍යතාව, ජිවිතයට හෝ නිදහසට බලපෑමක් වේ නම් එම කරුණු ද සැලකිල්ලට ගනු ලැබේ.

මූලික මානව අයිතීන් සහතික කිරීමේ මූලික වගකීම සහ ඔවුන්ගේ රටවැසියන්ගේ භෞතික රැකවරණය රජයන් සතුය. ආරක්ෂාව පතා ජාත්‍යාන්තර වශයෙන් පිළිගත් දේශසීමා හරහා යන්නන් සහ ඔවුන්ගේම රටේ ආරක්ෂාව තවදුරටත් භුක්ති නොවිඳින තත්ත්වයන් වලදී සරණපාගතයින් පිළිබඳ එක්සත් ජාතින්ගෙ මහා කොමසාරිස් (UNHCR), සත්කාරක රටේ සමීප සම්බන්ධතාව ඇතිව සරනාගතයින්ගේ අයිතීන් සහ

රැකවරණය තහවුරු කිරීමට ක්‍රියකරනු ඇත. සත්කාරක රාජ්‍ය විසින් මේ අයවලුන්ට ඔවුන්ගේ බල ප්‍රදේශයන්ට ඇතුළත්වීමට ඉඩ දෙන අතර වෙනත් රටකට පලවා හැරීම හෝ යැවීම නොකිරීම හෝ ඔවුන්ගේ ජිවිතවලට සහ නිදහස අවහිරවන රාජ්‍යයකට නොයැවීම, ආරක්ෂාව පිළිබඳ මූලික ප්‍රතිපත්තියයි. මෙම නිෂ්පාදනය හඳුන්වනු ලබන්නේ NON - refoulement ප්‍රතිපත්තිය ලෙසිනි. එය පිළිගත් ජාත්‍යන්තර නීතිය වී ඇති අතර, විශ්ව ව්‍යාප්තව රාජ්‍යයන් විසින් පිළිගෙන ඇත. සරණගතයින් සඳහා ජාත්‍යන්තර ආරක්ෂාව හරියටම ආරම්භ වන්නේ රැකවරණය ලබාදෙන රටේ දේශ සීමාවේදිය. සරණගතන්යින්ට ආරක්ෂාව සැලසීම සඳහා නිතිමය පදනම පටන් ගන්නේ, ජාත්‍යන්තර නිතිමය ලියවිලි ගණනාවකිනි. ජාත්‍යන්තර සරණගත නිතියේ පදනම වන්නේ 1951 සරණාගතයින්ගේ තත්ත්වයට අදාල පොදු සම්මතය සහ 1967 අභ්‍යන්තර අවතැන්වූවන්ට (IDPS) අදාල වන මූල ලේඛය අනුව,

පුද්ගලයින් හෝ පුද්ගලයින් කණ්ඩායමක් බලෙන් හෝ ඉල්ලා සිටිමෙන් පලා යැමට හෝ ඔවුන්ගේ නිවාස අතහැර යැමට හෝ වෙසෙන නිවාස හැර යැමට බලකළ අයවලුන්, යම් නිශ්චිත හේතුවක ප්‍රතිඵලයක් හෝ යමක් වැලැක්වීම පිණිස, හමුද අරගලයක් හේතුවෙන්, සාමාන්‍යකරණය වූ ප්‍රචණ්ඩත්ව තත්ත්වයක් මානව හිමිකම් උල්ලංඝනයවීමක් හෝ ස්වාභාවික හෝ මිනිසා විසින් සිදුකරන ලද ව්‍යසනයක් සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් දේශ සීමාවන් පසුකර නොගිය අයට අදාල වේ.

අභ්‍යන්තර අවතැන් වූවන්ගේ රැකවරණය සඳහා ප්‍රධාන ලියවිල්ල වන්නේ 1998 අභ්‍යන්තර අවතැන්වීම පිළිබඳ මඟ පෙන්වන ප්‍රතිපත්ති මාලාවය. මෙම ප්‍රතිපත්ති පිළිබිඹු කරන්නේ සහ අනුරූපවන්නේ අන්තර් ජාතික මානව හිමිකම් සහ මානව සුභසාධන නීති සහ සදෘශ්‍ය සරණාගත නීතියටයි.

අවතැන්වූවන්ට රැකවරණය සහ සහාය සැලසීමේදී සංවර්ධනය කටයුතු ඉටු කරන ඒජන්සි ආයතන ජාත්‍යන්තර සුභසාධන සපයන්නන්ට මෙන් රාජ්‍යවලට මෙම ජාත්‍යන්තර ප්‍රමිතීන් ලෙස මෙම ප්‍රතිපත්ති මග පෙන්වයි. මෙම ප්‍රතිපත්ති හිමිකම් හඳුන්වා දීම සහ අභ්‍යන්තරව අවතැන්වූවන්ගේ සහ අවතැන්වීම පිළිබඳ සෑම අදියරකදී ඔවුන්ගේ බලධාරීන් විසින් බැඳීම් සහතික වෙයි. අහඹු ලෙස අවතැන්වීමට එරෙහිව ඔවුන් රැකවරණය සපයයි. රැකවරණට පදනමක් සලකයි. අවතැන්වීමේදී සාහය සළසායි. ආරක්ෂිතව ආපසු යැමට සහතිකවීමක් සැලසීමට යලි පදිංචි කිරීම සහ ප්‍රතිසංකලනයට රැකවරණය සළසයි.

## රැකවරණය සහ න්‍යායපත්‍රය

ජගත් රැකවරණය පිළිබඳ විශ්ව උපදේශන එක්සත් ජතින්ගේ සංවිධානයේ සරණාගත මහ කොමසාරිස් විසින් 2000 දී දියත් කරන ලදී. නව ගැටළු වලට ආමන්ත්‍රණය කිරීමේ නම්‍යතාව තහවුරු කෙරෙන අතර ජාත්‍යාන්තර රැකවරණය පිළිබඳ පවතින ක්‍රමය සෝදිසි කිරීම අරමුණ වේ. "රැකවරණ න්‍යාය පත්‍රය" ප්‍රතිඵලය 1951 සරණාගත පොදු සම්මතය අනුව (අත්‍යාවශ්‍ය කියවීම් සහ සමුද්දේශ බලන්න) සාදන ලද නමුත් තවදුරටත් යැම අරමුණු කරයි. මෙම පොදු සම්මත සමහරවිට හඳුන්වා දෙන පරිදි, විශේෂ ගිවිසුම් සැකසීම සම්බන්ධයෙන් ක්‍රියා කරනවා හෝ බහු පාර්ශ්වික ගිවිසුම් වැඩි දියුණු කරන බර බෙද ගැනීම තහවුරු කරන්නේ උතුරු දකුණු රටවල සරණාගතයින් සඳහා වන කල්පවතින විසඳුම් සොයා ගැනීමට එක්ව ක්‍රියාකාරී වීමයි. මහා පරිමාණ පිටාර ගැලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවශ්‍ය පරිපූර්ණ සැලසුම් ක්‍රියා ඇතුළත්වේ. ආරම්භක රටවල වගකීම් සහ මෙහෙවර ගැන "ද්විතියක මෙහෙයුම්" ගැන ගිවිසුම්, අතර මැදි නැවැතුම් සහ අපේක්ෂා කළ හැකි ගමනාන්තයක් මැනවින් අර්ථකථනය කර තිබේ. සරණාගතයින් සඳහා වඩාත් සුදුසු සංවර්ධනාත්මක, සහායාත්මක අරමුණු, ඉලක්ක කරගන්නා ගිවිසුම්, ආරම්භක ප්‍රදේශ, සරණාගතයින් යළි පදිංචි කිරීමේ බහු පාර්ශ්වික බැඳීම ද ඇතුලත් වේ "රැ කවරණය පිළිබඳ න්‍යාය පත්‍රය කාන්තාවන් සහ දරුවන්ගේ රැකවරණ අවශ්‍යතා ගැන විශේෂ අවධානයක් යොමු කරයි.

### කඳවුරු පිහිටුමේ දී ආරක්ෂාව

රැකවරණ අභික්ෂාවක් කඳවුරු පැවැත්මේ සැම පියවරක් පාසාම, සැලසුම් කිරිමේ සිට වසා දැමීම, දක්වා හැමෝගේම වගකීමක් ලෙස, අධිකාරීන්, කඳවුර තුළ නියුතු ඒජන්සි ආයතන, කඳවුර කළමනාකරුවන් සහ කඳවුරු වැසියන්, අතර ප්‍රචලිත ප්‍රවණතාවක් විය යුතුය. රැකවරණය ජාත්‍යන්තර පොදු සම්මත සහ ප්‍රමිතින් විසින් සකස් කරන ලද පරිදි අවතැන් වූ මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් තහවුරු කිරීම පිළිබඳවය. එය ආරක්ෂාව සම්බන්ධව හෝ ආහාර බෙද හැරීම වැනි සේවාවන් සම්බන්ධව, නිවාසස්ථාන, සෞඛ්‍ය සේවා, අධ්‍යපනය, ලිංගාංශ්‍රිත එච්. අයි. වි. ඒඩ්ස් යනාදි අංග සියල්ලම සංමෝදන ගත විය යුතුය.

දැනටමත් කඳවුරු බිමක් තෝරා ගැනීමේදි රැකවරණය එක් අවශ්‍යතාවකි. කඳවුර දේශ සීමාවෙන් හෝ අර්බුදකාරි ප්‍රදේශවලින් අවම සැලකිය යුතු දුරකින් පිහිටුවිය යුතුය. කඳවුරක් සැලසුම් කිරිමේ දි සුදුසු භෞතික පසුබිමක් තිබීමද තවත් අවශ්‍යතාවකි. අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ප්‍රචණ්ඩත්වයෙහි හා අපචාරයෙහි යෙදීම වැළක්වීම් වස් පොදු පහසුකම්, වැසිකිලි ආදිය, සේදීම් පහසුකම් ආදිය කඳවුරේ හොඳින් ආලෝකමත් කළ මධ්‍යගත ස්ථානවල පිහිටුවිය යුතුවේ. සමාන සැලකිල්ලක් ආහාර බෙදා දෙනු ලබන ස්ථාන සම්බන්ධයෙන් ද අනුගමනය කළ යුතුවේ.

ඔවුන් කඳවුරට පැමිණි මුල් අවස්ථාවේදිම, එක්සත් ජාතින්ගේ ආයතනය සහ රාජ්‍ය නොවන සංවිධාන මගින් අපචාරයන් වැලැක්වීමට හෝ අධෛර්යට පත් කිරිමට දයක විය යුතුවේ. ඔවුන් සපයන රැකවරණය සහ සහාය අවශ්‍යයෙන්ම එකිනෙකට බද්ධ විය යුතුය. ළමයින් සහ නව යොවුන් අයට අධ්‍යාපන අවස්ථා සඳහා අයිතියක් ඇත. ඒ අතර පාසල් ද පිහිටුවන අතර ස්ථායිතාව සහ ඔවුන්ගේ ජිවිතවල සාමාන්‍ය තත්ත්වයන් සුරක්‍ෂා කළ යුතුවීම සහ කැරලි කණ්ඩායම් විසින් බඳවා ගැනීම වැලැක්විය යුතුය. කඳවුරේ සියලුම වැසියන් ආහාර සහ ආහාර නොවන අයිතම සඳහා නින්දා පරවශව සහ සුරා කැමකින් තොරව හිමිකම් ලබයි. කාන්තාවන්ට ආදායම් ලැබිය හැකි නිපුණතාවල පුහුණුවක් ලබා දීමෙන් ආධාර ගැන ඇති ඔවුන්ගේ නිදහස අවම කරයි. එසේම අපචාරයට ගොදුරු කර ගැනීමේ ඇති අවදානමද අවම කරයි. ආහාර හෝ වෙනත් අවශ්‍යතා සඳහා ලිංගික අලෙවියට ඇති ඉඩ අඩුය. එසේම ඔවුන්ගේ ආරක්ෂාව තමන් විසින්ම හා ඔවුන්ගේ දරුවන්ට සිදුවිය හැකි විවිධ අපචාරවලින් වඩාත් හොඳින් ආරක්ෂා කර ගැනීමට පිළිවන. තමන්ගේ අයිතින් පිළිබඳව උගත් කඳවුරු වැසියන්ට, හිමිකම් ගැන අදහසක් සමග උරුමකරදි ඇති විට කඳවුරු වැසියන්ට අන්‍යෝන්‍ය වශයෙන් ආරක්ෂාවක් සලසා ගෙන භාවිතා කිරීමට පුලුවන. කැඳවා ගෙන නොආ දරුවන් සහ වෙන් වූ දරුවන් වඩාත් හොඳින් ආරක්ෂාව කර ගැනීමට සහ අපචාරවලින් මුද ගැනීමට මානව උපදේශන ආයතනවලට පවුලේ සාමාජිකයින් හඳුනා ගැනීමට උදව් වීමට දරුවන් ඥතින් සමග යලි එක් කිරීම හෝ කැපකරු මාපිය ජාල දියුණු කිරිමට උදව් විය හැකිය. මානව හිමිකම් පුහුණු කිරීම මගින් සුළු ප්‍රහාර සහ වෙනත් ආකාර අපචාර අවම කිරීමට ප්‍රාදේශීය පොලිසිවලට පුලුවන. තොරතුරු සැපයීමේ සහ ආපසු පැමිණීමේදි උපදේශන කටයුතු මගින් අරමුණු ගත වන්නේ, ආපසු එන විට ඒ සඳහා තීරණය කරන විට, අවතැන් වූවන්ට උදව්වීමය. ගිහිල්ලා, සොයා බැලීම මේ ක්‍රියාවලියේදි එක් මූලික දෙයකි (බලන්න 6 වන පරිච්ජේදය: ළමා රැකවරණය 7 ලිංගික පාදක ප්‍රචණ්ඩත්වයෙන් වැළකීම.)

## රැකවරණයේදි ප්‍රධාන කොටස්කරුවන්

### අවතැන් වූ ජනයාගේ කාර්යභාරය:

මානව උපදේශන ක්‍රියාකාරත්වයක අභිප්‍රාය වන්නේ මැදිහත්වීම මගින් අර්බුද සහ අවතැන් වූ සිවිල් වැසියන්ට සහය වී රැකවරණය සැලසීමය. එවන් තත්ත්වයක් තුළදි අවතැන් වූවන් ක්‍රියාත්මකව සාහායවීම

සහ උදව්විමේ කාර්යට සම්බන්ධව සිටිම මානව උපදේශන ඒජන්සි ආයතන අවතැන් වුවන්ගේම සම්පත්වලින් ප්‍රයෝජන ලැබීමකි. ඔවුන් ඉලක්ක පිරිසක් නොවෙනවා පමණක් නොවැ සම්ප සහායක කොටස් කරුවන් ද වෙනවා ඇත. මානව උපදේශන ක්‍රියාවන්ගේ සාර්ථක ප්‍රතිඵල බොහෝ වශයෙන් රද පවත්නේ අදාල අයවලුන් සමග ඇති සහයෝගිතාව සහ සන්නිවේදින යාන්ත්‍රණය මතය. සහාය සලසා දියයුත්තේ තමන්ගේ ජිවිත බල ගැන්විමට, මගක් සැලසිමට, ප්‍රකෘති තත්ත්වයට පත් කිරීමට හෝ ශක්තිමත් කිරිම මගින් අවසානයේදී අවතැන්වුවන් තමන් විසින්ම සිය කටයුතු ඉටුකර ගැනීමේ හැකියාව ඇති කිරිමත් සඳහාය.

## ජාතික ආණ්ඩුවේ කාර්යභාරය

ආණ්ඩුවේ මූලික වගකිම වන්නේ සරණාගතයින් සහ අභ්‍යංතර අවතැන් වුවන් යන දෙපිරිසටම රැකවරණය සැළසිමය.

අභ්‍යන්තර අවතැන් වුවන් සිය රටේම පුරවැසියන් (සහ සමහර අවස්ථාවලදී අතුලුත් වෙනවා පරිචිත නිවැසියන් සහ තුන්වන රටක ජාතිකයන් ඇතුළත් වන බැවින් තමන්ගේ රටේ ආණ්ඩුවේ රැකවරණය විඳිමට හැකි විය යුතුය. කඳවුරු ජනයාගේ ආරක්ෂා සහිත බව සහ රැකවරණය තහවුරු කිරිම පිණිස ආණ්ඩුව සපට කළ යුතු වන දෙයක් වන්නේ කඳවුරට ඇතුළත් වූ මොහොතේ සිටම හමුද බලකායන් හඳුනා ගැනිමය. ඔවුන්ගේ අවි හරණය කොට අවතැන් වුවන්ගෙන් වෙන් කර තැබිය යුතුය. අභ්‍යන්තර අවතැන්වුවන්ගේ කඳවුරු ස්ථානවල හැම වෙලාවක මානව උපදේශන සහ සිවිල් තත්ත්වයන් පවත්වා ගත යුතුය. අවශ්‍යවන අවස්ථාවන්හි රජය විකල්ප නැවැතිමේ පහසුකම් වෙන්වූ සහ කඩා දමන ලද සටන් වැදියන් සඳහා සකස් කළ යුතුවේ. එය කඳවුරු ස්ථානයෙන් ආරක්‍ෂා සහිත දුරකින් පිහිටිය යුතුවේ. එක්සත් ජාතින්ගේ සරණාගත තානාපතිවරයාගේ සරණාගතයින් සඳහා මෙන් නොවැ. අභ්‍යන්තර අවතැන් වුවන්ගේ කඳවුරු පිළිබඳව කටයුතු කරන එක් විශේෂිත සංවිධානයක් නොමැත. කෙසේ වුවද අභ්‍යාන්තර අවතැන්විමකදී සහසම්බන්ධිය යොමුවිම් අදල ක්‍රියාකාරින් අතර පැහැදිලි වගකිම් බෙදා ගැනිමක් (රජය සහ ප්‍රාදේශිය අධිකාරින්, එක්සත් ජාතින්ගේ ඒජන්සි ආයතන, ජාත්‍යන්තර සංවිධාන, ජාතික සහ ජාත්‍යාන්තර රාජ්‍ය නොවන සංවිධාන) දක්නට ලැබේ.

සත්කාරක රජයන්ට සරණාගතයන් ආරක්ෂා කිරීම සඳහා, වර්ගය, ආගම, උපන් රට, ආදි කිසිම දෙයක් නොසලකා ඇතුළත්විමට ඉඩදීම මගින් වගකිමක් පැවැරේ. ජනයාගේ ආරක්ෂාව සහ රැකවරණය සහතික කිරිම් වස් කඳවුරක් තුළ විය හැකි හමුද කරණයක් වැලැක්විමට සත්කාරක රජය විසින් මූලික වගකිම භාරගත යුතුවේ. සිවිල් සහ මානව හිතවාදි ආකාරයක් ඇතිව එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස් කාර්යාලය සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ ද සහාය අවශ්‍යවන විට ලබා ගෙන කඳවුර තුළ පවත්වා ගෙන යෑමේ වගකිම සත්කාරක රට වෙත පැවැරේ, අවශ්‍යවන අවස්ථාවන්වලදී රජය මගින් විකල්ප නවාතැන් පහසුකම් වෙන්වූ, අවතැන් වු සහ කඩබිඳ දමන ලද සටන් වැදියන් වෙනුවෙන් ඉදිකිරිම් කළ යුතුවේ. එය කඳවුරු බිමට ආරක්ෂාකාරී දුරකින් පිහිටිම සුදුසුය.

## එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස් කාර්යාලයේ කාර්යභාරය.

එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස් (UNHCR) එක්සත් ජාතින්ගේ ඒජන්සියකි, මානව සුභසාධන කාර්යයේ නියලි, දේශපාලනකි නොවන. UNHCR ඒජන්සියට නිලබලයක් ලබාදී තිබෙනනවා ජාත්‍යන්තර රැකවරණය සහ සහාය, සරණගතයින්ට සහ ඔවුන්ගේ ගැටළුවලට දිගුකල්පවත්නා විසදුම් ලබාදිම පිණිස, එකිසත් ජාතින්ගේ සංවිධානය මගින් UNHCR මගින් අන්තර් ජාතික සරණාගත ගිවිසුම ප්‍රවර්ධනය කරන අතර ජාතිපන්තර නිතියට අනුව රජයන් ක්‍රියාකරන්නේ දැයි නිරීක්ෂණය කරයි. ක්‍ෂේත්‍ර මට්ටමේදි සරණාගතයින්ට රැකවරණය සහ ඔවුන්ගේ හිමිකම් භුක්ති විඳිමට ඉඩකඩ සලසාදිම සඳහා UNHCR

කාර්ය මණ්ඩල මගින් මෙහෙවර රාශියක් ඉටු කරයි. ආරක්ෂාව සඳහා මැදිහත්වීම, සරණාගතයින්ගෙ හදිසි අවස්ථාවලදී ප්‍රතිචාර දැක්වීම, ආරක්ෂිත ස්ථානවල කඳවුරු පිහිටුවීම, සියලුම සරණාගතයින්ට පිවිසීමට සහ මූලික අවශ්‍යතා සඳහා සමාන අවස්ථා සැලසීම සහ සියලුම සරණාගතයින් පුද්ගලිකව එකිනෙකා වෙන වෙනම ලියාපදිංචි කිරීම ද ඇතුලත් විය යුතුය. මෙම කටයුතු නිතරම භාරගනු ලබන්නේ අධිකාරීන්ගේ සහයෝගය සහ එක්සත් ජාතීන්ගේ සහ රාජ්‍ය නොවන සංවිධානවල (අන්තර් ඒජන්සි රාමුවක් තුළ) සබැඳියාවද ඇතිවෙය. එක්සත් ජාතීන්ගේ සරණාගත මහා කොමසාරිස්වරයාට අභ්‍යන්තර අවසන් වුවන්ට (IDPS) උදව්වීමට නිතිමය තත්ත්වයක් නොමැති වුවද, එය වැඩි වැඩි වශයෙන් සිදු කෙරෙයි. 2004 වන විට UNHCR මගින් දළ වශයෙන් අවතැන් වුවන් 1/4 කට සහාය සළසා ඇත.

## මානව සුභ සාධන කාර්ය සම්බන්ධීකරණ කාර්යාලායයේ කාර්යභාරය (OCHA)

එක්සත් ජාතීන්ගේ ආයතන වෙත ඇති නීතිමය බලයේ පරතරයන් තුළ, මානව සුභසාධානය අවශ්‍ය අයට රැකවරණය හා සහයක සේවා සම්බන්ධීකරණය පිණිස එක්සත් ජාතීන්ගේ මානව සුභසාධන කාර්ය සම්බන්ධීකරණ කාර්යාලයට (OCHA) නිතිමය බලය පවරා ඇත. ඊට අභ්‍යංන්තර අවතැන්වීමද ඇතුලත් වේ. අවතැන් වුවන්ගේ ආරක්ෂාව මූලික වගකීම පැවැරී ඇත්තෙ ජාතික අධිකාරීන්ටය. කෙසේ වුවද මෙම වගකීම ඉටු කිරීමට බලධාරීන්ට ඇති හැකියාව සහ අභිමතය නිතරම ප්‍රමාණවත් නොවෙනවා හෝ අඩුය. මෙවන් තත්ත්වයන් යටතේ ජාත්‍යන්තර ප්‍රජාවට (OCHA මගින් සම්බන්ධීකරණය ලබා) උදව්මට සිදුවීම සහ අතිරේක සහාය සැලසීමට රජයන් සහ ප්‍රාදේශිය බලධාරීන් විසින් කරනු ලබන කටයුත් වලට සහාය වෙයි. OCHC මගින් මානව සුභසාධන කටයුතු සම්බන්ධයෙන් දේශපාලනික ආයතන, හදිසි සහන සම්බන්ධීකාරක සහාය වෙයි. (ERO) එසේම මානව සුභසාධන ප්‍රතිචාර හදිසි අවස්ථාවලදී සම්බන්ධීකරනය කිරීම, අභ්‍යන්තර අවතැන් වුවන් ද ඇතුලුව, පක්ෂව සාකච්ජාවට භාජනය කරනු ලබයි.



*අභ්‍යාන්තර අවතැන් වුවන්, මේ ඇජගන් දරුවන් වැනි අය එකම අකාරයේ බොහෝ දුෂ්කරතාවන්ට සහ සම්ප්‍රදායානුකූල සරණාගතයින් ලෙස අවශ්‍ය රැකවරණයට මුහුණපා සිටී. ජායා රූපය ලාර්ස් ඕවේ කාවේල්ඩින් (NRC)*

## රතු කුරුස සංවිධානයේ සහ අන්තර් ජාතික රතු කුරුස කමිටුවේ (ICRC) කාර්ය භාරය

රතු කුරුස සමාජයේ ජාත්‍යන්තර කමිටුව (ICRC) ජාත්‍යංතර සහ ජාත්‍යංතර නොවන හමුද අර්බුදවලින් සහ යුදමය සහ සිවිල් අර්බුදවලින් අන්තරාවට ලක්ව සිටින්නන්ට රැකකවරණය සහ සහාය සලසන නිදහස් අපක්ෂපාති සංවිධානයකි. රතු කුරුස සමාජයේ ජාත්‍යන්තර කමිටුව අරමුණු කර ගෙන ඇත්තේ හමුදාමය ප්‍රචණ්ඩත්වය අඩුකිරීම සහ පෙළෙන්නන් සවිබල කිරීමෙන් සහ ජාතිඝන්තර මානව සුභසාධක නිතින් ප්‍රවර්ධනය කිරීම තුළිනි. එසේ කිරීමේදී, ICRC සංවිධානය මානව සුභසාධන නිති ලොව පුරා පිළිපදින්නේදැයි යන්න සහතික කිරීමට උත්සාහ දරයි. ICRC සංවිධානය ජාත්‍යන්තර සහ අභ්‍යන්තර අරබුද තත්ත්වන් වලදී යන අවස්ථා දෙකේදීම කටයුතු කරන බැවින් අභ්‍යන්තර අවතැන් වුවන්, හා සම්බන්ධ සුභසාධන මැදිහත්වීම් වලදී ප්‍රධාන ඉලක්කගත කණ්ඩායම බවට පත් වෙයි.

රාජ්‍ය නොවන සංවිධාන ප්‍රජාව සමග සබඳතාව තර කර ගැනීමට ICRC මගින් වැදගත් පියවර ගෙන තිබේ. රාජ්‍ය නොවන සංවිධාන සමග සබඳතා පැවැත්වීමට අළුත් ක්‍රියාමාර්ග සෙවීම වැදගත් අංගයක් වී ඇත්තේ ICRC හි විශ්වසනියත්වයට ඇති බැඳීමය. ICRC නිතර ක්ෂේත්‍රයෙහි වැඩ කරන වෙනත් කණ්ඩායම සමග තොරතුරු හුවමාරු කර නොගන්නේ, එක්ව වැඩ කිරීම දුෂ්කරතා ඇති කරන නිසාය. හෙළි නොවු අපචාර පිළිබඳ සහන ඒජන්සි ආයතන වැඩියෙන් පක්ෂපාතිව කතා කරන විට ICRC පසු පසින් සිට කටයුතු කරනු ලබන්නේ පිහිවා පොදු සම්මතය මත පිහිටාය. ICRC සහ රාජ්‍ය නොවන සංවිධාන අතර ශ්‍රමය බෙද ගන්නා පාර්ශවයක් ලෙස සිවිල් ජනතාව සුරකිමට උදව් වියහැකි පුළුල් පරාශයක උපක්‍රම භාවිත කරයි.

## රාජ්‍ය නොවන සංවිධානවල කාර්ය භාරය

සරණාගතයින් සුරකිම පිළිබඳ රාජ්‍ය නොවන සංවිධනවල වැදගත්කම එක්සත් ජාතින්ගේ මහ මණ්ඩලය මගින් හඳුනා ගනු ලැබුවේ 1950 දී එක්සත් ජාතින්ගේ සරණාගතයින් පිළිබඳ මහා කොමසාරිස්වරයාගේ ආඥපණත පිළිගැනිම කළ අවස්ථාවේදිය. එමගින් මහ කොමසාරිස්වරයා සරණාගත ප්‍රශ්න ගැන කටයුතු කිරීමේදී පෞද්ගලික සංවිධාන (NGO) සමග සංබඳතා ඇති කර ගැනීම දිරිමත් කරන ලදි. එක්සත් ජාතින්ගෙ සරණගත මහ කොමසාරිස් අවතැන් වුවන් ගැන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී 500කට අධික දේශිය සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාවක් සමග කටයුතු කරයි. රාජ්‍ය නොවන සංවිධානවලට සරණාගතයින්ට රැකවරණය සැළසීමට ජාත්‍යන්තර පොදු නිතිය මගින් විශේෂ නිතිමය තත්ත්වයක් තිබිය නොහැකිය. ඔවුන්ගේ වැඩ මගින්, කෙසේ නමුත් බොහෝ රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරි වන්නේ මෙහෙවර ප්‍රකාශ යටතේ ඔවුන්ට ආරක්ෂාව සැපයිමට කැපවීම වගේම මානව සුභසාධන සහාය සැපයිම මගිනි. රාජ්‍ය නොවන සංවිධාන ක්ෂේත්‍රයේ දී ආරක්ෂාව සහ උපදේශනය සහ අළුත් මෙහෙවර ගැන සාකාච්ජා කරමින් සිටි. එසේම අභ්‍යාන්තර වශයෙන් අවතැන්වුවන්ගේ ආරක්ෂාව වැඩි දියුණු කිරිම සහ රැකවරණය සැළසිම පිළිබඳ ප්‍රායෝගික ප්‍රවේශවීම් ගැන සාකාච්ජා කරයි. මෙම සංවිධාන මානව සුභසාධන මෙහෙවරවලදී වැදගත් ක්‍රියාකාරින් බවට පත්ව සිටි. අවතැන්වුවවි සඳහා පුර්ණ නිතිමය තත්ත්වයක් නොමැති එක්සත් ජාතින්ගේ එකම ආයතනයක්වත් නොමැති (සරණාගතයන් සඳහා UNHCR වැනි) අවස්ථාවක මෙම ක්‍රියාකාරීත්වය වැදගත් වේ.

“කඳවුරු බිමක රැකවරණය” යටතේ සඳහන් කර ඇති පරිදි රාජ්‍ය නොවන සංවිධාන මගින් විවිධාකාර සාහය, රැකවරණය වෙනුවෙන් ලබා දෙයි.

# කඳවුර කළමනාකරණ කණ්ඩායම් වගකීම්

## වගකීම සහ මෙහෙයවන ආකාර පිළිබඳ පරිපාටිය:

විෂය පථයෙහි නියුතුව සිටින බැවින් කඳවුරු කළමනාරණ කණ්ඩායමට කඳවුරු වැසියන් හා සෘජු සම්බන්ධකම් ඇති බොහෝ කටයුතුවලට සම්බන්ධකම් තිබේ. කඳවුරු වැසියන් හා සම්බන්ධව, එක්තරා කඳවුරු තත්ත්වයක් තුළ මානව සුභසාධන සේවකයින්ට එක්තරා බලයක් ලබා දී තිබෙන බව පුළුල් වශයෙන් හඳුනාගෙන ඇත. එබැවින් කඳවුරු කළමනාකරණ ඒජන්සි ආයතනය ඉහළ මට්ටමේ සදාචාරාත්මක ප්‍රමිතීන් සහ වෘත්තිය හැඳියාවක් සහ කඳවුරු වැසියන් සමග අන්‍යෝන්‍ය ගෞරවයකින් හා විශ්වාසයක් ඇතිව වැඩ කිරීමට වග බලා ගත යුතුවේ.

## කඳවුරු කළමනාකරණ කණ්ඩයාම මුඛ්‍ය වගකීම්:

- ***දැනුම, වගකීම සහ මෙහෙයුම් පටිපාටිය පිළිබඳ ප්‍රචාරණය:*** එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්වරයාගේ වගකීම මෙහෙයුම පිලිබඳ පටිපාටිය සහ හර වටිනාකම් සහ මාර්ගෝපදේශන ප්‍රතිපත්ති එක්සත් ජාතීන්ගෙ සරණාගත මහ කොමසාරිස් ආයතනයේ සියලුම නිළධාරින්ට අදල වේ. කඳවුරු කළමනාකරණ ඒජන්සි ආයතන, සරණාගත කඳවුරු පිහිටීම සහ එම බිමේ සිටින ඔවුන්ගේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම වගකීම වේ. රාජ්‍ය නොවන සංවිධාන ඔවුන්ගේ ක්‍රියාකාරී පටිපාටි කාර්යක්‍ෂම හා මනාව සංවිධානය කිරිමේ ක්‍රියාවලියක නියුතුව සිටි. එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් ආයතනයේ මෙහෙයුම් පටිපාටියන් සහ රාජ්‍ය නොවන සංවිධානයක මෙහයුම් පාටිපාටියන් උදහරණයක් ලෙස මෙම පර්විඡේදයේ මෙහෙයුම කට්ටලයේ දක්වා ඇත. *(බලන්න 7 වන පරිච්ජේදය ද GBV)*

- ***රැකවරණය නිල නියෝගය සමග ඇති සමීප බව:*** එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්වරයාගේ රැකවරණය සහ සහායක සේවා ගැන කඳවුරු කළමනාකාරවරයාට රැකවරණ නිල නියෝගය සහ ඒවායේ අරමුණු ගැන මනා අවබෝධයක් තිබිය යුතුවේ. සරණාගත සහ අවතැන් වු අවස්ථාවන්වලදී විවිධ ඒජන්සි ආයතන නිතරම අවතැන් වු පුද්ගලයින්ට රැකවරණය සපයයි. කඳවුරු කළමනාකරුවා තමන්ගේ කාර්ය මණ්ඩලය නිල නියෝගය සහ විවිධ රැකවරණ සලසා ඒජන්සි ආයතනය මනා අවබෝධයක් ලබා දුන් බවට සෑහීමකට පත්විය යුතුය. තවද සියල්ලන් විසින් වගකීම හා කාර්යයන් තේරුම් ගත් බවද අවබෝධ කටයුතුය.

- ***ප්‍රජා නියෝජිතයින් සඳහා මෙහෙවර පරිපාටී සැකසීම:*** ජනයාගේ හැසිරීමට මග පෙන්වන මෙහෙවර පටිපාටි බල ස්ථානයන්හි සිටින සියලූ දෙනාටම අදල විය යුතුය. එම නිසා කඳවුරු කළමනාකරු සියලුම නියෝජිතයන් නායකත්ව ව්‍යුහ, එනම් කඳවුරු විධායක කමිටුව (කමිටු) සහ තිරණ ගන්නා වෙනත් කමිටු සඳහා ප්‍රමිතීන් සකසා උනන්දු කළ යුතුවේ. මෙම ප්‍රමිතීන් මුලික මානව අයිතින්, සමාජ සාධාරනය, මානව අභිමානය සහ මිනිසුන්ගේ සහ කාන්තාවන්ගේ සමාන අයිතින්ට ගරු කිරීම පිලිබිඹු විය යුතුය. සරණාගත ස්ථානයකදී කඳවුරු කළමානකරු විසින් එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් කාර්ය මණ්ඩලය සමග සම්බන්ධිකරණ කොට මෙහෙවර පටිපාටි සකසා විවිධ නායකත්ව ව්‍යුහයන් අතර ව්‍යාප්ත කළ යුතුවේ.

- ***මෙහෙවර පටිපාටි නිරීක්ෂණය සහ ප්‍රවර්ධනය කිරීම:*** ප්‍රජා නියෝජිතයන් සහ නායකත්ව කමිටු මෙහෙවර පටිපාටිවල දක්වා ඇති ආකාරයට හැසිරීම් වල තත්ත්වය පිළිපැදීමට සහ ප්‍රවර්ධනය කිරීමට යන දේ අංශයම කෙරෙහි උනන්දු කළ යුතුවේ.

- ***ප්‍රජා සංවේදීකරණය:*** ප්‍රජා නියෝජිතයන්, නායකත්වය කමිටු, වගකිවයුතු ඒජන්සි ආයතන සහ කඳවුරු කළමනාකරණ කණ්ඩායම අනුගමනය කරන වෘත්තිය චර්යාව සහ චර්යාත්මක සම්මතයන් අවතැන් වූ ප්‍රජාව අතර දැනුවත් කිරීම කළ යුතුවේ.

## නිරීක්ෂණය කිරීම, තොරතුරු රැස්කිරීම, වාර්තා කිරීම සහ තොරතුරු බෙදාහදා ගැනීම:

කඳවුරු කළමනාකරුවෙකුට කඳවුරේ සේවය කරන විවිධ ඒජන්සි ආයතන සහ අවතැන්වූවන් අතර ඉටුකළ යුතු වැදගත් අතරමැදි මෙහෙවරක් ඇත. කඳවුරු කළමනාකරු කඳවුරේ සේවය කරන ඒජන්සිවල ඇස් සහ කන් ලෙස දැකිය යුතු අතර නිතරම කඳවුරු වාසීන් සඳහා වන, ප්‍රථමයෙන්ම සම්බන්ධවන ඉලක්කය වේ. කඳවුර කළමාණකාරන මට්ටමේදී එනිසාම රැකවරණය පිළිබඳ ඇමැතිම නිතරම ආරම්භ වේ. කඳවුරු පිහිටීමේ විභව්‍ය රැකවරණය සම්බන්ධයෙන් තේරුම් ගැනිම සහ ඇමැතිමට, නිරීක්ෂණය කිරීම සහ තොරුතුරු බෙද හද ගැනිමේ ක්ෂේත්‍ර තුළ කඳවුරු කළමනාකරණ කණ්ඩායම් සතුවන ප්‍රධාන වගකිම් සමුදායක් පවති.

### කඳවුරු කළමානකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීම:

- ***පොදු අවබෝධයක් ඇතිකිරීම:*** විශේෂ රැකවරණ අවශ්‍ය වන අවතැන්වූ අය සඳහා පොදු අවබෝධයක් සුරක්ෂිත කිරීම ඉතා අවශ්‍යය.

- ***තොරතුරු බෙද ගැනිම:*** කටයුතු සම්බන්ධිකරණය සහ තොරතුරු බෙද ගැනිම සඳහා එක්සත් ජාතින්ගේ සරනාගත මහ කොමසාරිස්වරයා සහ රැකවරණ සලසන ඒජ්න්සි නිතර මුණ ගැසිම වැදගත් වේ. සාර්ථකව සහ කාලීනව රැකවරණය සම්බන්ධව ඇමැතිම සඳහා තොරතුරු බෙද ගැනිම ඉතා අවශ්‍ය වේ.

- ***කමිටු පිහිටුවීම:*** ප්‍රජා සහභගිත්වය සහ තොරතුරු බෙද ගැනිම සහතික කිරීමට අවශ්‍ය වන්නෙ කඳවුරු ජනයා අතර සිටින විවිධ කණ්ඩායම් කමිටු නියෝජනයට අවශ්‍ය නිසාය. (නිතරම කාන්තාවන්, සුළු ජාතික කණ්ඩායාම් ප්‍රායෝජික අවස්ථාවලදී එච්. අයි. වී. / ඒඩ්ස් ආසාදනයට ගොදුරුවූ නිවැසියන්, ඔවුන්ගේ නියෝජතයින්) හරියාකාරිව ක්‍රියකාරි වන විට සහ ප්‍රජාව වෙනුවෙන් මෙම කමිටු තොරතුරු බෙද ගැනිම සහ රැකවරණය හා ආරක්ෂාවට අදලව බලගතු කාර්ය භාරයක් ඉටුකරනවා ඇත. බලන්න 3 පරිච්ඡේදය ප්‍රජා සහභාගිත්වය සහ කඳවුරු කමිටු

- ***අවදානමට ලක්වූවන් හඳුනා ගැනීම:*** කඳවුරු පැවැත්වෙන කාලය පුරාම අතිරේක රැකවරණය අවශ්‍ය අය සහ අවදානම් සහිත අයවලුන් සහ බලෙන් යොමු කරන අයවලුන් ඇතුලුවීමේ දී සහ පිටවීමේ දී සහ සැලකිමේ දී සහ නඩත්තු කටයුතු කෙරෙන අවස්තාවලදී හඳුනා ගැනිම සිදුවිය යුතුයි. මේ කරුණේදී රැකවරණ නිළධාරියා සමග සම්බන්ධිකරණය කිරීම වැදගත් වේ.

- ***විශේෂ රැකවරණ අවශ්‍යතා සම්බන්ධයෙන් වාර්තා කිරීම:*** රැකවරණය ගැන අවධානය ගන්නා, ආරක්ෂාව අවශ්‍ය තැනැත්තන් ගැන ලේඛන ගත කිරිමට සහ වාර්තා කිරිමට යාන්ත්‍රයක් සැකසිය යුතුවේ. තොරතුරු අදල රැකවරණ ඒජන්සියට එක්සත් ජාතින්ගේ සරණාගත නිළධාරිවරයාට සහ සුදුසු බලධාරින්ට ඉදිරිපත් කළ යුතුවේ. අවශ්‍ය වුව හොත් වඩාත් ආරක්ෂිත ස්ථානයකට යොමු කිරිමට යාන්ත්‍රණයක් ද තිබිය යුතුය. මේ පිළිබඳ කරුනු ආරක්ෂණ ඒජන්සියට නිළධාරියාට දැන ගැනිමට සැලසිය යුතුවේ. සියලුම කඳවුරු වැසියන් සහ රැකවරණ ඒජින්සි වාර්තා කිරිමේ මාධ්‍ය ගැන දැන සිටිම වැදගත්වේ. (බලන්න පරිච්ඡේදය 7: කඳවුරු ආරක්ෂාව)

* ***සම්බන්ධීකරණ යාන්ත්‍රණය:*** කාණ්ඩයම නිතිපතා ආරක්ෂක නිළධාරීන් පොලිසිය සහ කඳවුරේ මුරකරුවන් ආරක්ෂකයින් සමග සම්බන්ධීරණය කළ යුතුවේ. සම්බන්ධීකරණ යාන්ත්‍රායක් පිහිටුවිය යුතුය. දිනපතා කටයුතු සම්බන්ධීකරණය කරන නිත්‍ය රැස්වීම් සහ කඳවුරේ ආරක්ෂාව සහ රැකවණරයට අදල තොරතුරු බෙදා ගැනීමට මේ මගින් පුලුවන් විය යුතුය.

* ***විශ්වසනියත්වය:*** තනිපුද්ගලයන් සහ හෝ අදල රැකවරණ සහ ආරක්ෂාණ කරුනු සම්බන්ධයෙන් රැස්කරනු ලබන තොරතුරුවල විශ්වසනිය බව හැම කල්හිම සැලකිල්ලට ගත යුතු අතර සුරකිව තබා ගත යුතුවේ. සම්මුඛ සාකච්ජාවලට ලක් කිරීමට පෙර කඳවුරු වැසියන් විශ්වසනියත්වය ගැන ඔවුන්ට ඇති අයිතිය ගැන දැනුවත් කළ යුතුය.

**කඳවුරු කළමනාකරණ කණ්ඩායම පවතින නිතිමය රාමුව පිළිබඳව හොඳින් දැන ගත යුත්තේ සරණාගතයින්ට සහ අභ්‍යන්තර අවතැන්වුවන්ගේ රැකවරණය ගැන අවධානය යොමු කිරීම සහ තේරුම් ගැනිම සඳහාය. ප්‍රධාන ලේඛන ගණනවක් විශේෂයෙන්ම ප්‍රයෝජනවත් වේ. ඒවා නම්:**

* සරණාගතයන් රැකිම, රාජ්‍ය නොවන සංවිධාන සඳහා ක්ෂේත්‍ර මග පෙන්වීමක්, (එක්සත් ජාතින්ගේ සරනාගත මහ කොමසාරිස් (UNHCR) රාජ්‍ය නොවන සංවිධාන කොටස්කරුවන් 2001)
* අභ්‍යන්තර අවතැන්වුවන් පිළිබඳ අනුගමනය කරනු ලබන මහ පෙන්වීමේ ප්‍රතිපත්ති අත්පොත (UNOCHA, 1999)
* සරණාගතයන්ට එරෙහි ලිංගික සහ ලිංගික ප්‍රචණ්ඩත්වය, ආපසු එන්නන් සහ අභ්‍යන්තර අවතැන්වුවන් වැළක්වීම සහ ප්‍රතිචාර දැකිවීමේ නිර්නායක (UNHCR 2003)
* සරණාගත කාන්තාවන් සුරකිම ගැන නිර්නායකය (UNHCR 1991)
* සරණාගත දරුවන්, ආරක්ෂාව සහ රැකවරණය ගැන නිර්නායක (UNHCR 1994)
* රැකවරනය සඳහා නිර්නායකය (UNHC R 2003)
* හදිසි අවස්තා සඳහා එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස්වරයාගේ අත්පොත
* හදිසි අවස්ථාවලදී එච්.අයි.වී/ඒඩ්ස් සඳහා මැදහත්වීමේ හා සම්බන්ධ නිර්නායක- (IASC 2003)

## අවතැන් වූ කාන්තාවන් සහ ගැහැණු දරුවන්:

කුමණ හෝ කඳවුරු පසුබිමක් තුළ වුවන් කාන්තාවන් සහ ගැහැනු දරුන්ට විශේෂ රැකවරණ අවශ්‍යතා ඇත. ද්‍රව්‍ය හා සේවා ලබා ගැනිමේදී කාන්තාවන් සහ ගැහැනු දරුවන්ට ලිංගික සහ කායික අපචාරවලට ලක්වීමට සහ සූරාකෑමට සහ දුෂ්කරතා වලට මුහුණ දීමට සිදුවේ. කඳවුරකට පැමිණිමට පෙර වුවද කාන්තාවන් සහ ගැහැනු දරුවන් ප්‍රචණ්ඩත්වය සහ සිත් කම්පකරන තත්ත්වයන් අත්විඳ තිබිය හැකි අතර, එන අතරතුරේ කායික අපහැරණ, පැහැර ගෙන යෑම හා දූෂණයට ලක්වීමට ඉඩ ඇත. කඳවුරු මෙහෙයුමේ සෑම අංශයකදීම කාන්තාවන් සහ ගැහැනු දරුවන්ගේ රැකවරණය ගැන විශේෂ සැලකිල්ලක් පිළිබිඹු විය යුතුය. (කරුණාකර 6 වන පරිච්ජේදය බලන්න. ළමා රැකවරණය සහ 7:GBV)

- ***පෞද්ගලික ලියාපදිංචි වීම:*** සියළුම අවතැන්වූවන් පෞද්ගලිකව ලියාපදිංචි කළ යුතුය. (4 වන වන පරිච්ඡේදය බලන්න. ලියාපදිංචි කිරීම)

- ***කඳවුරු පහසුකම් තුළ ආරක්ෂාව පිළිබඳ අංග:*** දෝවන පහසුකම් සහිත ස්ථාන සහ වැසිකිලි වල නිරුපද්‍රිත බව සහතික කිරීම සහ පහසුවෙන් පිවිසීමට හැකිවීම, කාන්තාවන්ට සහ ගැහැනු දරුවන්ට ප්‍රමාණවත් පෞද්ගලිකත්වයක් තිබීම ඉතාමත් තීරණාත්මක වේ. පහසුකම් වගේම පිවිසුම් මාර්ග මනාව ආලෝකවත් කර තිබිය යුතු වන්නේ ප්‍රහාරවලට ලක්වීමට හෝ අපහරණයට ලක්වීම වැළක්වීම සඳහාය. සමාන ආරක්ෂක අංග ගැන සලකා බලන විට පාසල් වෙන් කිරීමේදී, බෙද හැරීමේ තැන් සහ ක්‍රීඩා පිටි සම්බන්ධයෙන් සැලකිල්ලට ගත යුතුවේ. (බලන්න පරිච්ඡේදය 2, කඳවුරු පිහිටුවීම: 9: ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය බෙද හැරීම 10: ජලය සහ සනීපාරක්ෂාව)

- ***ලිංගික ප්‍රචණ්ඩත්ව (GBV) වාර්තා කිරීමේ යන්ත්‍රණය:*** ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ වගකිව යුතු ඒජන්සීන්ට, රැකවරණ නිලධාරියාට / ඒජන්සියට සහ අදල බලධාරීන්ට, ලේඛනගත කිරීමට සහ වාර්තා කිරීමට යාන්ත්‍රණයක් සලසා තිබිය යුතුය. එසේම සුදුසු පසු විපරම් කිරීමද තහවුරු කළ යුතුවේ. ලිංගික ප්‍රචණ්ඩත්ව රැකවරණ ඒජන්සි සියලුම කඳවුරු වැසියන් සහ අදල ඒජන්සි මේ කරුණු ගැන සම්බන්ධීකරණය අවශ්‍ය වේ. ආයතන යාන්ත්‍රණ පිළිබඳව දැන ගත යුතුය. විශ්වසනීයත්වය ආරක්ෂා කළ යුතු අතර සියලුම ක්‍රියාකාරීත් විසින් ගරු කටයුතුය.

- ***කාන්තා නිලධාරීන්ගේ නියෝජනය:*** කඳවුරු කළමනාකරනණ කණ්ඩායමට ප්‍රමාණවත් ප්‍රචණ්ඩත්වය සංඛාවක් කාන්තාවන් ඇතුළත් විය යුතුය. සමාජිකයින්ගේ වැඩිකරණ ලද නියෝජනය ගැන සැලකිල්ලට ගත යුතුය. මේ මගින් සුරක්‍ෂිත බව සහ ආරක්ෂාව සහ ප්‍රජාවට සුරක්‍ෂිත බව පිළිබඳ හැගීමක් ඇති විය යුතුය.

- ***කාන්තා සහභාගීත්වය:*** ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය සංවිධානය කිරීමේදී සහ බෙද හැරීමේදී කාන්තාවන් සහභාගිවිය යුතුය. ඉලක්කය විය යුත්තේ 50% ක කාන්තා සහභාගීත්වයකි.

- ***සමාන සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම:*** නායකත්ව ව්‍යුහයන් සහ කමිටුවලට කාන්තාවන්ගේ සමාන සහභාගීත්වයක් ලබාගැනීම උනන්දු කිරීම වැදගත්ය. ඉලක්කය විය යුත්තේ නායකත්ව ව්‍යුහයන්හි 50% ක කාන්තා නියෝජනයකි.

- ***ප්‍රජා සංවේදීකරණය:*** කාන්තාවන් සහ ගැහැණු දරුවන්ගේ අවශ්‍යතා සහ විශේෂිත රැකවරණය සම්බන්ධයෙන් අවතැන් වු ජනයා අතර අවබෝධය සහ දැනුවත් බව ඉහළ දැමීම ඉතා අවශ්‍යය. මේ පිළිබඳව රැකවරණ ඒජන්සිය / නිළධාරීන් සමග සම්බන්ධකරණය කළ යුතුය.

සරණාගත / අවතැන් වු කාන්තාවන් සහ ගැහැනු දරුවන් සමාජාතිය කණ්ඩායමක් නිර්මාණය නොකරයි. අවතැන් වු සියලුම අයවලුන්ට රැකවරණ අවශ්‍යතා ඇතත් කාන්තාවන්ට ඔවුන්ගේ ස්ත්‍රී බව සහ ලිංගික හේතු මත විශේෂ ආරක්ෂාණ අවශ්‍යතා පවති. මේ කණ්ඩායම් අතර සමහර කාන්තාවන්ට සහ ගැහැනු දරුවන්ට වෙනත් අයට වඩා අවදනම් සහිත බවක් පවති

මේ කාන්තාවන් නම්:

- එක්ව නොආ නවයොවුන් ගැහැනු දරුවන්
- කාන්තා ගෘහ මූලික නිවැසියන්
- වෙන් වූ දරුවන්
- වියපත් කාන්තාවන්
- අබාධිත කාන්තාවන්
- හමුදාවෙන් ඉවත් වූ ස්ත්‍රීන්

- ***හඳුනා ගැනීම:*** මේ කාණ්ඩවලට වැටෙන කාන්තාවන් සහ ගැහැනු දරුවන් හඳුනා ගත යුතුය. තවද ඔවුන්ට විශේෂිත වූ රැකවරණ ගැටළු ඇද්දැයි තීරණය කළ යුතුය. රැකවරණ ඒජන්සියේ නිළධාරීන් සමග මේ කරුණු සම්බන්ධයෙන් සම්බන්ධීකරණය කිරීම වැදගත්ය.

- ***නියෝජනය:*** විවිධ කමිටුවල මෙම අවදානමකට ලක් වන කණ්ඩායම් සමානව නියෝජනය වන්නේ දැයි සනාථ කිරීම අවශ්‍යය.

### අත්‍යාවශ්‍ය පසුබිම් තොරතුරු

කඳවුර, කළමනාකාරණ කණ්ඩායම විසින් අවතැන් වූ ප්‍රජාවගේ මුල් රටේ / ප්‍රදේශයේ මානව හිමිකම් පිළිබඳ තත්ත්වය, දේශපාලන, සමාජ, තොරතුරු ලබාගෙන කඳවුර කළමනාකර කණ්ඩායම සහ වගකිව යුතු ඒජන්සි ආයතනය අතර බෙද හැරීමට නිර්දේශ කරනු ලැබේ. අමතරව යන අතරතුර සහ ඊට පෙර පවතින තත්ත්වය පිළිබඳව හොඳින් දැනුවත් කිරීම වැදගත්වේ. යැමට අදළ මෙම තොරතුරු කළමනාකරණ කණ්ඩායමේ සමාජිකයින් සහ ඒජන්සිය අතර කලින් කලට යාවක් කළ යුතුවාක් මෙන්ම බෙද ගත යුතුය. මෙසේ කිරීමේදී කඳවුර කළමනාකරණය කණ්ඩායම අවදනමට ලක්වූ අය හොඳින් හඳුනා ගැනීමට සන්නද්ධ විය යුතුවීම සහ චිත්තවේගී කම්පනයට අදළ පොදු ලක්‍ෂණ හඳුනාගත යුතුය. ඒවා නම් කාංසාව, මානසික ආතතිය වගේම එච්.අයි.වී/ඒඩ්ස් ලක්‍ෂණ වේ. මේ ආකාර තොරතුරු කණ්ඩායමට මැදිගත්වීමට සුදුසු ඒජන්සි හඳුනා ගැනීමට උපකාර වෙයි.

## කල්පවත්නා විසඳුම්:

අනෙකුත් ඒවා අතර එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්වරයා විසින් අවධාරණය කරන ලද පරිදි හදිසි අවස්ථාවකදී අවසාන අරමුණ වන්නෙ අවතැන්වුවන් වෙනුවෙන් කල්පවත්නා විසඳුමකි. කල්පවත්නා විසඳුමකි. කල්පවත්නා විසඳුමක් සඳහා පිළියම් තුනක් ඇත. ස්වේජාවෙන් ආපසු පැමිණීම, දේශියව පදිංචි කිරීම සහ යලි පදිංචි කිරීමය.

## ICLA උපදේශන සහ නෛතික සහය සැළසීමේ සංකල්පය:

සරණාගත හදිසි අවස්ථාවන්හි වැඩ කිරීමේ දී ලාබයක් ලබා දෙනවාට වඩා අවධානය යොමු විය යුත්තේ හදිසි අවශ්‍යතා සහ ස්ථානීය විසඳුම් වෙනුවෙනි. "ස්ථානීය පහසුකම් සැලසීම - තොරතුරු, උපදේශනය සහ නීති ආධාර" (ICLA)[1] වැනි ව්‍යාපෘති විකල්ප ප්‍රතිචාර දියුණු කර තිබීම සහ විශේෂිත ක්‍රියාවන්, ස්ථානීය පහසුකම් සැලැස්මෙ කෙරෙහි අරමුණු කර ඇත. තොරතුරු , උපදේශනය සහ නීති ආධාර තුන් ආකාර අංග තුනකින් යුක්තය. තමන්ගේ මව් රට යන්නන් / පුරුදු වාසස්ථාන වලට යැමට සලකා බලා ඇති අයට අවශ්‍ය තොරතුරු, උපදේශනය සහ නීති ආධාර සැලසීමය.

1 නෝර්විජියානු සරණාගත කවුන්සලය (NRC) තොරතුරු උපදේශන සහ නීති ආධාර (ICLA) ව්‍යාපෘති පිහිටුවා ඇත. ක්‍රොසියා, බොස්නියා- හර්සගොවිනා, සර්බියා සහ මොන්ටෙනෙග්‍රො, (කොසොවෝ) මැසිඩොනියා, ජෝර්ජියා, අසර්බයිජාන්, ඇජ්ගනිස්ථානය, උගැන්ඩා, කොලොම්බියා, නෝර්වේ යන රටවල, සැළසුම් කළේ 2004 දී. බුරුන්ඩි DR කොංගෝ.

***තොරතුරු:*** ආපසු යෑමේදී තොරතුරු සහ උපදේශනය පාදක කර ගන්නේ සරණාගතයින් සහ අවතැන් වුවත් අදහස් කරන නමුත් තවමත් නිශ්චිත නොවන දේවල් මතය. ආපසු යෑම වඩාත් හොඳින් සැලසුම් ගත වන්නේ ඔවුන් තමන් විසින් ම ප්‍රවේශමෙන් සලකා බැලීමෙන් අනතුරුව ස්වේච්ඡාවෙන් ආපසු යෑමේ ක්‍රියාවලියක් සහ යලි සමෝදනගතවීමක් පැහැර හැරිය නොහැකි සේ සැලකිල්ලට ගැනීමෙනි. සම්භවය වූ ප්‍රදේශය පිළිබඳ නිරවද්‍ය සහ විශ්වසනීය තොරතුරු ලබා ගැනීමට ඇති ඉඩකඩ, ආපසු යෑමේ ක්‍රියා මාර්ග සහ අනෙකුත් ආපසු යවනු ලැබුවන්ගේ අත්දැකීම් කල්පවත්නා ස්වාධීන සහ දැනුවත් කරනු ලැබූ තීරණයක් සඳහා අවශ්‍ය වේ.



කල්පවත්නා විසඳුමක් සඳහා දැනුවත් කරන ලැබූ සහ ස්වාධීන තීරණයක් ගැනීමට හැකිවනු පිණිස නිවැරදි සහ විශ්වසනීය තොරතුරු ලබා ගැනීමට පුලුවන් විය යුතුය. පින්තූරය : පෝල් ජෙප්රි / ACT ජාත්‍යන්තරය.

- ***තොරතුරු ප්‍රචාරය කර හැරීමේ ක්‍රමවේද:*** තොරතුරු යැවීමේ හැකියාව පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට පෞද්ගලික මට්ටමින්, යැවීමේ හැකියාව ඇත. තොරතුරු ලබාදීමේ සහ උපදේශන ක්‍රියාවලියක කොටසක් ලෙස, හෝ විශාල පිරිසක් අතර, මෙය විශාල රැස්වීම් මගින් කළ හැකිය: උද: සාමුහික මධ්‍යස්ථාන හෝ සරණාගතයින්ගේ කඳවුරු/අවතැන්වුවන්, සරණගතයින් /සරණාගත සේවකයින්, වෙනත් නිලධාරීන්, තීරණ ගනු ලබන්නන්ගේ රැස්වීම්, සම්මන්ත්‍රණ වලදී, පුවත් හසුන් වලින් හෝ පෝස්ටර්, නිල මාධ්‍ය මගින්, පුවත්පත් හෝ ගුවන් විදුලිය සහ රූපවාහිනි මගින්, වශයෙනි.

- ***උපදේශනය:*** බොහෝ අවතැන්වුන්ට ආපසු යෑමේ අත්දැකීම් නොමැත. උපදේශකවරයාට මිස අවතැන් වුවනට ආපසු යෑමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුම නොමැත. කල්පවන්නා විසඳුමක් ලෙස ආපසු යෑමට අදහස් කරනු ලබන කුමනාකාර තොරතුරු සහ කරුණු සැලකිල්ලට ගත යුත්තේ ද යන්න තීරණය කිරීමේදී උපදේශනය කරනු බලන්නා තීරණ ගැනීමේ සුදුසු කොටස්කරුවෙක් වෙයි. තෝරා ගැනීමේ ප්‍රමුඛත්වය දෙන්නා උපදේශකරයා එක් අයෙකු පමණක් නොවීම ඉතා වැදගත් වේ. අවසාන තීරණය, රැඳී සිටීම හෝ ආපසු යෑම සම්බන්ධයෙන් ගනු ලැබිය යුත්තේ අවතැන් වු ඔහු / ඇය විසිනි.

- ***දේශ සීමා හරහා යෑමේ ජාල (Networks):*** දේශ සීමාව පසුකර යෑමේ අවශ්‍යතා ආපසු යෑමේ පහසුකම් සැලසීමේදී විශේෂයෙන් වැදගත් වන්නේ පක්ෂපාතිව කතා කිරීමේ දිය. සරණගතායාගේ රටේ දී සරණාගතයන් පිළිබඳ ව්‍යාපෘතියක් පිහිටුවීමේ දී උපදේශන කටයුතු බොහෝ විට යොමු වන්නේ මව් රටේ ආයතන සහ බලධාරී වෙතය මෙය සාමාන්‍යයෙන් අවශ්‍ය වන්නේ සහයෝගිත්ව කොටස්කරුවන් හෝ දේශ සීමාව හරහා යෑමට ජාලයක් ඇති විටය.

ICLA පිළිබඳව වැඩිමනත් තොරතුරු ලබා ගැනීම සඳහා සම්බන්ධ වන්න NRC: nrc@ nrc.no

# මෙවලම් කට්ටලය

### *පාලන පරිපාටිය (UNHCR)*

කඳවුරු පාලන ඒජන්සි ආයතන වැනි පාර්ශ්වකරුවන් අතර දිරිමත්කිරිම, උපදෙස්දීම සහ ප්‍රමිතීන් පතුරුවා හැරීම සඳහා වගකීමට බැඳී සිටින එක්සත් ජාතීන්ගේ සරණාගත කාර්ය මණ්ඩල නිළධාරීන්ට පාලන පරිපාටිය අදාල වේ. පාලන පරිපටිය එක්සත් ජාතීන්ගේ සරණාගත කාර්ය මණ්ඩලය සහ මානව උපදේශන ක්‍රියාකාරීන්ට ඔවුන්ගේ වෘත්තිය සහ සමහර විට පෞද්ගලික ජීවිතයේ දී සනිදර්ශනාත්මකව මාර්ගෝප දේශයක් ලෙස සේවය සළසයි. මෙම පරිපාටිය කඳවුර තුළ ප්‍රජා නියෝජිතයින්ට සහ කමිටු නායකයින්ට සමාන පරිපාටියක් සැකසීමට උපයෝගි කර ගත හැකිය.

### *රාජ්‍ය නොවන සංවිධාන පාලන පරිපාටිය (උදහරණ NRC වලින්)*

මෙම පාලන පරිපාටින් නෝර්වීජියනු සරණාගත කවුන්සලයේ සියලුම ක්‍ෂෙත්‍ර නිලධරින්ට අදල වෙව්. (NRC) එය ප්‍රජා නියෝජිතයින්ට සමාන පරිපාලන පරිපාටියක් සැකසීමට උදව්වන්නක් ලෙස රාජ්‍ය නොවන සංවිධාන සහ සරණාගතයින් සහ අවතැන්වුවන් පිළිබඳව කටයුතු කරන වෙනත් අයටද යොද ගත හැකිය.

### *සිද්ධි වාර්තා කරන පෝරමය (IRC)*

කඳවුර තුළ සිදුවන විවිධාකාර සිදුවීම් ලේඛන ගත කර තැබීමට ජාත්‍යන්තර රතු කුරුස (IRC) කඳවුරු කළමනාකරුවන් වාර්තා ගත කිරීමේ පොදු පෝරමයක් යොද ගනී. මෙම පෝරමයට සිද්ධියේ ස්වාභාවය, දිනය, ස්ථානය සහ සිද්ධියේ තත්ත්වයන් ගැන විස්තර සහ පසු පිරික්සුම් කටයුතු සඳහා නිර්දේශ ඇතුලත් වෙයි. මෙම පෝරමය බොහෝ වශයෙන් කඳවුරු කළමනාකරණ කණ්ඩායම අභ්‍යන්තර කටයුතු සඳහා යොද ගනී.

## ආශ්‍රිය මෙහෙවර කට්ටල

### *සෙවණ සාදන වෘක්ෂ ව්‍යාපෘතිය පෝෂණය:*

මෙම ව්‍යාපෘතියට පොතක්, වැඩසටහන ඇතුළත් සහ ක්‍ෂේත්‍රයෙන් ලබා ගන්නා ලද පුරුදු සහ අන්තර් ක්‍රියාකාරී වෙබ් අඩවියක් ඇතුළත් වේ. http://www.icva.ch/cgi-bin/browse pl?doc=doc'ooooo'/17

අයි.ඒ.එස්.සී. (IASC) මානව උපදේශන ක්‍රියා සහ මානව අයිතින් ගැන ආශ්‍රය කණ්ඩායාම විශේෂයන් කැමැති වන්නේ ජාත්‍යාන්තර මානව උපදේශන, මානව අයිතීන් සහ / හෝ සරනාගත නීතිය කැඩීමෙන් පෙළීමට ලක්වු සිවිල් වැසියන් සම්බන්ධව මානව උපදේශන කටයුතුවල නියලීමටය. අර්බුදකාරී කලාපවල නියැලි ජනයා හඳුනා ගැනීම හෝ හිංසාකාරි පාලනයන් යටතේ දැනටමත් බොහෝ නවීන ක්‍රම සහ වැලක්වීමට, අපහරණයන් සංසිඳවීමට වැඩසටහන් සංවර්ධනය කර ඇත. මෙම පුරුදු හඳුනා ගැනීම සහ බෙදහද ගැනීමට තිරණය කර ඇත්තේ මානව සුභසාධන සහකරුවන් වගේම දුෂ්කර තත්ත්වයන් යටතේ සේවය කරන්නන් විසින් යොද ගනිවි යන අපේක්‍ෂාවෙනි.

### *මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රකාශය:*

මානව හිමිකම් පිළිබඳ ප්‍රකාශනය අරමුණු කර ගනු ලබන්නේ සියලුම ප්‍රජාවට සහ සියලුම ජාතීන්ට අදල අයිතීන් ඉගැන්වීම, අධ්‍යාපනය ලබාදීම, ප්‍රවර්ධනය සහ ගරුකිරීමය.

### සරණගතයින්ගේ තත්ත්වයන් හා අදල, 1951 පොදු සම්මතය:

මෙම පොදු සම්මතය තුළ ජාත්‍යාන්තර සරනාගත නිතිය පිළිබඳ පදනම පිහිටා ඇත. මෙම ද්‍රව්‍ය සරණාගතයින් හා එක් වී ක්‍රියාකරන්නන් හා අදල වේ.

### අභ්‍යන්තර අවතැන්වීම ගැන 1998 මාර්ගෝපදේශ ප්‍රතිපත්ති:

මෙම මාර්ගෝපදේශ ප්‍රතිපත්ති අරමුණු කර ගනු ලබන්නේ අවතැන් වු ප්‍රජාව සහ ඔවුන්ට රැකවරණය සැළසීමට ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව දැනුවත් කිරීමය. මෙම ප්‍රතිපත්ති පාදක කර ගෙන ඇත්තේ ජාත්‍යාන්තර මානව හිමිකම්, සරණගත සහ මානව උපදේශන නිතිය, අභ්‍යන්තර අවතැන් වුවන් පිළිබඳව නිරන්තරයෙන්ම අමතක කරනු ලබන, ඔවුන්ට අදල ඕනෑ එපාකම් පිළිබඳ ජාත්‍යන්තර අවබෝධය දියුණු කිරීමට අවශ්‍ය කාරකයක් ලෙස මෙම මාර්ගෝපදේශ ප්‍රතිපත්ති මාලාව තහවුරු කරනු ලැබ ඇත. මෙම ප්‍රතිපත්ති මාලාව සහ අත්පොත (අවශ්‍ය කියවීම් සහ ආශ්‍රයන්) අවතැන් වුවන් සම්බන්ධ කටයුතු කරන අය දැනුවත් වීම සහ යොද ගැනීමට අවශ්‍ය වේ.

### 1969 අප්‍රිකානු සරණාගතයින් පිළිබඳ ගැටලු සම්බන්ධ විශේෂිත කරුණු අනාවරණය කෙරෙන පොදු සම්මතය. අප්‍රිකානු ඒකාග්‍රතා සංවිධනය OAU.

1951 පොදු සම්මතයට ප්‍රසාදාත්මකව පිළියෙල කරන ලද ප්‍රාදේශිය ප්‍රකාශය, සරණාගතයින් පිළිබඳ අර්ථකථනය, පුළුල් ලෙස ක්‍රියාකාරවන්නකි. එසේ අප්‍රිකානු සරණාගතයින්ට අදල විශේෂ ප්‍රාදේශිය අංග ඉන් ආවරණය කෙරේ.

### 1984 සරනාගයින් පිළිබඳ කාර්තජිනා ප්‍රකාශනය:

අප්‍රිකානු ඒකාග්‍රතා සංවිධනාය මෙන්ම කාර්තජිනා ප්‍රකාශනය ගැන සරණාගත නිර්වචනය සහ වෙනත් ප්‍රාදේශිය දේවල් පිළිබඳ අදහස පුලුල් කෙරේ. එය ගිවිසුමක් නොවුවද එහි අඩංගු කරුණු මධ්‍යම ඇමෙරිකාව පුරාම හොඳින් සැලකිල්ලට ලක්වේ.

### එක්සත් ජාතින්ගේ සරණාගත කාර්ය මණ්ඩලය, එක්සත් ජාතින්ගේ කාර්ය මණ්ඩලය සහ මානව උපදේශක ක්‍රියාකාරින් (UNHCR) සඳහා වන හරාත්මක අගයන් සහ මාර්ගෝපදේශන ප්‍රතිපත්ති:

එක්සත් ජාතින්ගේ ප්‍රඥප්තියෙන් දක්වා ඇති මුලික නියමයන් මාලවක්, අගයන් සහ ප්‍රතිපත්ති, එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස්වරයාගේ කාර්ය මණ්ඩලය, එක්සත් ජාතින්ගේ කාර්ය මණ්ඩලය හා මානව උපදේශන ක්‍රියාකාරින්ට අදල වේ. UNHCR පාලන පරිපාටිය මෙම හරාත්මක වටිනාකම් සහ මාර්ගෝපදේශ ප්‍රතිපත්ති පිළිබිඹු කරන්නේය.

### නිරන්තරයෙන්ම අසනු ලබන ප්‍රශ්න සහ පිළිතුරු (UNHCR)

එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස්වරයාගේ ලියවිල්ල ප්‍රයෝජනවත් වඩාත් පොදු සහ නිතර අසනු ලබන ප්‍රශ්න මාලාවකට, සරණාගතයින් සහ සරණාගතයින්ගේ රැකවරණය පිළිබඳ වු කරුණු සම්බන්ධයෙන් පිළිතුරු සපයයි. උදහරණ: රැකවරණ නිති, රාජ්‍යවල වගකිම්, තත්ත්ව තිරණය, සරණාගතයෙක් යනු කවරෙක්ද? යළි පදිංචි කිරීම, සරණාගතයින්ගේ අයතින් සහ බැඳිම් ආදිය.

## අවශ්‍ය කියවීම සහ පරිශීලනය කළ යුතු ලේඛන

- එක්සත් ජාතින්ගෙ සරණාගත මහ කොමසාරිස් සහ රාජ්‍ය නොවන සංවිධාන පාර්ශ්ව කරුවන්, 2001. සරණාගතයින් සුරකිම, රාජ්‍ය නොවන සංවිධාන සඳහා ක්ෂේත්‍ර මග පෙන්වීමක්, පිනිවා.
- එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස් 2001, සරණාගතයින් සුරකිම, ජාත්‍යංතර සරණාගත නිතියට මාර්ගෝපදේශයක්, පාර්ලිමෙන්තු මන්ත්‍රවරුන්ට සඳහා වන අත්පොත පිනිවා, - UNHCR
- එක්සත් ජාතින්ගේ සරණගත මහ කොමසාරිස් 1991: කාන්තා සරණගතයින් සුරැකිම පිළිබඳ මාර්ගෝපදේශ පිනිවා - UNHCR
- එක්සත් ජාතින්ගේ සරණගත මහ කොමසාරිස් 2001: සරණාගත කාන්තාවන් සහ මහකොමසාරිස්වරයාගේ පොරොන්දු පහ: පිනිවා.
- එක්සත් ජාතින්ගේ සරණගත මහ කොමසාරිස් 2003, රැකිවරණය සඳහා න්‍යාය පත්‍රය
- එක්සත් ජාතින්, 1988 අභ්‍යන්තර අවතැන්වීම ගැන මග පෙන්වන ප්‍රතිපත්ති: පිනිවා
- එක්සත් ජාතින්ගේ මනාව උපදේශන කටයුතු සම්බන්ධකරණය (UNOCHA) 1999: අභ්‍යන්තර අවතැන්වීම පිළිබඳ අදල මග පෙන්වීම ගැන අත්පොත, පිනිවා (UNOCHA)
- 2000 අයි. ඒ. එස්. සි. (IASC) අභ්‍යන්තර අවතැන් වුවන් ආරක්ෂා කිරිම: IASC ප්‍රතිපත්ති ලේඛනය:
- නෝර්වීජියානු සරණාගත කවුන්සලය (NRC) ජගත් අවතැන්වුවන් පිළිබද සමික්ෂණය, 1998, "අයිතින් සඳහා සිමා මායිම් නැත." ලොව පුරා අභන්තර අවතැන්වීම: පිනවා (NRC)
- එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස් 2002: ආරක්ෂාණ ක්‍රියාමාර්ග සැලසුම් කිරිම සහ මිනුමේ ප්‍රගතිය, එක්සත් ජාතින්ගේ සරනාගත මහකොමස්සාරිස් කාර්ය මණ්ඩලය සඳහා හරි වැරදි බැලිමේ ලේඛනය
- එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස් හදිසි අවස්ථා සඳහා වන අත්පොත
- එක්සත් ජාතින්ගේ සරනාගත මහකොමසාරිස් 2003: සරණාගතයින්ට එරෙහි ලිංගික සහ ලිංගාශ්‍රිත ප්‍රචන්ඩත්වය, ආපසු යන්නත් සහ අභ්‍යන්තර අවතැන් වුවන්, වැළැක්වීම සහ ප්‍රතිචාර හා මග පෙන්වීම.
- අයි. ඒ. එස්. සි. (IASC) 2003 හදිසි අවස්ථාවන්හිදි එච්.අයි.වි./ ඒඩ්ස් සඳහා මැදිහත්වීම පිළිබඳ මෙහෙයුම.
- එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස් (UNHCR) සහ රාජ්‍ය නොවන සංවිධාන (NGO) ක්‍රියාකාරි පාර්ශවකරුවන් අතර ගිවිසුම් රාමුව.
- ත්‍රයිපාක්ෂික උප- ව්‍යාපෘති ගිවිසුම, ආදර්ශන ආකෘතිය සඳහා සම්මත පාලනය ගැන ඇමුණුම 2 සමග.

* www.unhcr.ch
* www.unicef.org
* www.icrc.org
* www.hrw.org
* www.idpproject.org
* www. hrweb. org

## සරණාගතයින් සඳහා වන එක්සත් ජාතින්ගේ මහකොමසාරිස්වරයාගේ කාර්යාලයය (UNHCR)

## පාලන පාරිපාටිය:

## හැඳින්වීම:

එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස්වරයා සරණාගතයින්ට හා වෙනත් අදාල අයට සහාය සහ රැකවරණය සැලසීම පිළිබඳ හැකියාව රඳා පවත්නේ ඔහුගේ කාර්ය මණ්ඩලයට උසස් ප්‍රමිතින් සහ සදචාරාත්මක වෘත්තිය පැවැත්ම පවත්වාගෙන යාමට සහ ප්‍රවර්ධනය කිරීමට ඇති හැකියාව මතය. එක්සත් ජාතින්ගේ මහ කොමසාරිස්වරයාගේ කාර්ය මණ්ඩලයේ සමාජිකයන් ලෙස අප පෞද්ගලිකව සහ සාමූහිකව මෙම ප්‍රමිතින් පවත්වා ගෙන යාමට වගකිව යුතු වන්නෙමු. කළමනාකරුවන්ට විශේෂයෙන්ම මෙම තත්වයන් පවත්වාගෙන යාමට වගකීමක් ඇත. මනා ආදර්ශණයන් සැලසීමට සහ කාර්ය මණ්ඩලයට වැඩ කිරීමේ පසුබිමක් නිර්මාණය කිරීමට සහායවීමට සහ බලය පැවැරීමට කටයුතු සැලසිය යුතුය.

එක්සත් ජාතින්ගේ සංවිධානයේ සරණාගත මහකොමසාරිස්වරයා නිතරම සිය කාර්ය මණ්ඩලය වෙත බලයක් ලබාදී ඇත්තේ එහි ප්‍රයෝජන ලබන්නන්ට අදාලවය. එම බලය අනිසි ලෙස යොදා නොගැනීමේ යුතුකමක් කාර්ය මණ්ඩලය සතුව පවති.

ඔවුන්ගේ වෘත්තිය ජිවිතවලට සදචාරත්මක තිරණයක් ගැනීමට, පාලන පරිපාටිය සනිදර්ශනාත්මක මාර්ගෝපදේශයක් ලෙස සහ ඔවුන්ගේ පෞද්ගලික ජිවිතයේ අවස්ථාවලදී සේවය සැලසීමේ අපේක්ෂාවෙනි. නිතියෙන් බල නොකරන සදචාරාත්මක පරිපාටියකි. කාර්ය මණ්ඩලය රෙගුලාසි හා නිතිරිති සහ එක්සත් ජාතින්ගේ ප්‍රඥප්තිය අනුව ඔවුන්ගේ පැවැත්ම හොඳින් අවබෝධ කර ගැනීමට උදව්වන ආකාරයට එය සැලලුම් කර ඇත. එය එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස්වරයාට පිලිගත හැකි මෙහෙවරක් තිරණය කිරිමට ඇති එකම නිතිමය ලියවිල්ලය. පරිපාටිය අත්සන් කිරීම මගින් එක්සත් ජාතින්ගේ සරණගත මහකොමසාරිස් වරයාගේ කාර්ය මණ්ඩලය ලබා ඇති අයිතින් පවරා ගනු නොලැබේ.

දේශිය නිතිය සහ සිරිත් විරිත් පිළිගන්නා අතර ඒවා රටින් රට වෙනස් වේ. පරිපාලන පරිපාටින්ට පදනම් වී ඇත්තේ ජාත්‍යන්තර සම්මත නිතියයි. උදාහරණයක් ලෙස දැක්විය හැක්කේ වයස 18 ට අඩු අය ළමයින් ලෙස අර්ථකථනය කිරීමය. ගැලපෙන පරිදි අර්ථකථන කිරීම සඳහා වන මග පෙන්වීම පාලන පරිපාටියේ සටහන් යටතේ දක්වා ඇත.

පරිපාටිය එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස්වරයාගේ කාර්ය මණ්ඩලවලට අදාල වන අතර ඒවා අත්සන් කිරීමට ඉල්ලා සිටිය හැකිය. එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස්වරයා යටතේ උපදේශන කොන්ත්‍රාත්තුවක් දරණ අය සහ ආධුනිකයින්ට ද පාලන පරිපාටින් ලබා දෙන අතර ඔවුන්ගේ තත්ත්වයන්ට ගැලපෙන ආකරයට අනුගමනය කරන බවට සපථ කිරිමට ඉල්ලා සිටිනු ලැබේ. රාජ්‍ය නොවන සංවිධානවලට, සමාගම්වලට, ඔවුන්ගේ සේවා යෝජකයින් මගින් එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස්වරයාට සේවය කිරීමේ දී පරිපාටියේ අන්තර්ගත ප්‍රතිපත්ති ගැන සුදුසු පිළිවෙලකට දැනුවත්වීමට ඉල්ලා සිටිනු ලැබේ.

සියලුම නිළධාරින් (UNHCR) පාලන පරිපාටිය දිරිමත් කිරිම, උපදේශනය, ප්‍රවර්ධනය කිරීම හා ව්‍යප්ත කිරිම සඳහා බැඳී සිටි. එහි තත්ත්වය ක්‍රියාත්මක කිරිම, නිරික්ෂණය සහ බලගැන්වීමට වගකීමක් ඔවුන් වෙත පැවැරී තිබේ. මෙම ප්‍රමිතින් අනුගමනය කිරීමට සහ පවත්වා ගෙන යාමට එක්සත් ජාතින්ගේ කාර්ය මණ්ඩලය දිරි ගැන්වීමට ද ඉල්ලා සිටිනු ලැබේ.

## හරාත්මක වටිනාකමක් සහ මග පෙන්වන ප්‍රතිපත්ති:

*එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස්වරයාගේ කාර්ය මණ්ඩලය පහත දැක්වෙන මූලික වටිනාකම් සහ ප්‍රතිපත්ති වලට බැඳී සිටී.*

- එක්සත් ජාතින්ගේ ක්‍රමය තුළ සේවය කරන කාර්ය මණ්ඩලයක් වශයෙන්, එක්සත් ජාතින්ගේ ප්‍රඥප්තියෙහි විදහා දැක්වෙන අගයන් පිළිබිඹුවන ආකාරයට පැවැත්ම සහතික වෙමු: මූලික අයිතින්ට ගරු කිරීම, සමාජ සාධාරණත්වය, මිනිසුන්ගේ සහ කාන්තාවන්ගේ සමාන අයිතින් සඳහා ගරු කිරීම, එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස්වරයා අන්තර් ජාතින් සරණාගත නීතිය පිළිබඳ ප්‍රතිපත්ති පවත්වාගෙන යෑමට, ප්‍රවර්ධනය කිරීමට, අන්තර් ජාතික මානව හිමිකම් සහ අන්තර්ජාතික මනාව උපදේශන නීතිය පවත්වා ගෙන යෑමට උදව් වන්නෙමු. අපට එක්සත් ජාතින්ගේ හරාත්මක ඇගයීම් ක්‍රම මගින් මඟ පෙන්වානවා දී ඇත. ඊට වෘත්තියමය තත්ත්වය, සමෝධානය සහ විවිධත්වයට ගරු කිරීම සහ ජාත්‍යන්තර යටදර්ශයන් සෑම කල්හිම පවත්වාගෙන යෑමටද සහාය වෙමු.

- එක්සත් ජාතින්ගේ සරණාගත මහා කොමසාරස් නිළධරීවරුන් ලෙස කාර්යලයීය නීතිමය තත්ත්වයන්ට අනුව සරණාගතයින්ට සහ අවතැන්වූවන්ට සහායවීම සහ රැකවරණය සැලසීම තහවුරු කිරීම අපගේ මූලික බැඳීම වේ. හැකි උපරිම අයුරින් සරණාගතයන්ට සහභාගිවීමට වෙනත් අදාල අයට තනි පුද්ගලයින්. පවුල් සහ ප්‍රචාරවන් ලෙස ඔවුන්ගේ ජීවිතවලට බලපාන දේවල්වලට සහායවීමට බැඳී සිටිමු.

- සෑම පුද්ගලියෙකුගේම වටිනාකමට සහ ආත්ම ගෞරවයට ගරු කරමු. අවබෝධ කරගැනීමට හුරුවීමට ප්‍රවර්ධනය කරමු. අවශ්‍ය පරිදි දයාව හා ඉවසීමට ගරු කරමු, විචාරවත් බව විදහා දක්වමු. විශ්වසනීයත්වය රකිමු. අපගේ මානව උපදේශන පාර්ශවකරුවන් සමග සංසාරණාත්මක සහ ගරුකටයුතු සේවා සැබැඳියාවක් නිර්මාණය කිරීමට අරමුණු කර ගනිමු. අඛණ්ඩව අපගේ කාර්ය සාදනය දියුණු කිරීමට කැපවෙමු. ඉගෙනීමට සුදුසු පසුබිමක් නිර්මාණය කිරීමට අවධානය යොමු කරමු. ධනාත්මක වෙනස්වීම් වලට සහය වෙමු. අපගේ අත්දැකීම් වලින් පාඩම් ඉගෙනීම ආදේශ කර ගනිමු.

- ජාතිය, ලිංගය, ආගම, වර්ණය, ජාතික හෝ ජනවාර්ගික මූලය, භාෂාව, විවාහක තත්ත්වය, ලිංගික අනුස්ථාපනය, වයස, සමාජ - ආර්ථික තත්ත්වය, ආබාධික බව, දේශපාලන බැඳීම්, වෙත හඳුනාගත හැකි ස්වරූපයක් පිළිබඳ කිසිදු බේදයකින් තොරව සෑම කෙනෙකුටම සමානව ගරුසරු බව පෙන්වමු. සමානාත්මතාවට ඇති සියලු බාධක ඉවත් කිරීමට උත්සාහ කරමු.

- සියලුම ජනයාගේ සංස්කෘතින්, සිරිත් විරිත් සහ සම්ප්‍රදායන්ට අපි ගරු කරමු. කිසිදු සංස්කෘතියකට අදල නොවන ආකාරයෙන් හැසිරීම මගහැරීමට උත්සහ කරමු. කෙසේ වුවද සම්ප්‍රදාය හෝ පැවැත්ම එක්සත් ජාතින්ගේ යම් සංවිධානයක ජාත්‍යාන්තර මනාව අයිතිවාසිකම් සම්මතයකට හෝ සම්මතයකට ප්‍රතිවිරුද්ධ වේ නම් අපට පිළිගත හැකි මනාව හිමිකම් නියමයකට හෝ සම්මතයකට අනුව ක්‍රියා කරමු.

## එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස්වරයාගේ පාලන පරිපාටියට ඇති බැඳීම

1) සරණාගතයින් සහ අනෙකුත් අදාල තැනැත්තන්ට සාධාරණ ලෙස සහ ගෞරවයෙන්, අභිමානයෙන් සැලකීම.

එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස්වරයාට අදාල කරුණු සම්බන්ධයෙන් සරණාගතයන් සහ වෙනත් අය අත්විඳින දුෂ්කරතා තේරුම් ගැනීමට නිතරම සොයා බලනවා වගේම වරප්‍රසාද නොලබන්නන්, විශේෂයෙන් ලිංගිකත්වය, වයස, ආබාධිත බව හේතුවෙන්, බලය තිබෙන අයවලුන්ට සම්බන්ධකම් තිබිය හැකි. හෝ ඔවුන්ගේ ජීවිත පිළිබඳව බලපෑ හැකි. අන් අය ගැන අවබෝධ කරගැනීමට මහන්සි ගනු ලැබේ.

නිතරම ළමයින්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සහ රැකවරණය සොයා බැලීමට සහ ඔවුන්ගේ ඕනෑකම් උතුම් ලෙස සලකා ඒවා තහවුරුවන අයුරින් ක්‍රියා කිරීම, මාගේ රාජකාරි, සරණාගතයින් සහ අදල වෙනත් අන් වෙනුවෙන් සෘජුව සම්බන්ධවේ නම්, මා විසින් ඒවාට නිතර සොයා බැලීමට, ඔවුන්ගේ අත්දැකීම් හා අවශ්‍යතා සම්පූර්ණ වශයෙන් තෙරුම් ගැනීම පිණිස, එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස්වරයාගේ කාර්ය විෂය පථය පැහැදිලි කිරීමට කටයුතු කරනු ලැබේ.

මා විසින් එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස් වරයාගේ ප්‍රතිපත්ති, අරමුණු සහ ක්‍රියාවන් සහ සරණාගතයින්ට අදල දේවල් දැනුවත් කරනු ලැබේ. මට හැකි උපරිම අයුරින් නිළධාරින්ගේ ආරක්ෂාව සහ වෘත්තිය කටයුතු වලට උදව්වෙමි.

2) මාගේ පෞද්ගලික සහ වෘත්තිය මෙහෙවර උසස් තත්ත්වයකින් පවත්වා ගනිමින් එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස්වරයාගේ සාධුගුණය පවත්වා ගැනීමට සපථ වෙමි. මා විසින් සාධුගුණය, සත්‍යවාදී බව, කැපවීම සහ මාගේ කටයුතු පිළිබඳ අවංකත්වය ප්‍රදර්ශණය කරමි. රාජකාරි මට්ටමින් කටයුතු කරන සියලු දෙනා වෙනුවෙන් මා ඉවසිලිමත්ව, ගරුකටයුතුව සහ විනීතව පවතිමි. සරණාගතයින් සහ අදල අයවලුන් සම්බන්ධයෙන් ද, ක්‍රියාකාරි නියෝජිතයන් සහ ක්‍රියාත්මක කරනු ලබන පාර්ශ්වකරුවන්, රජයන් සහ දනපතියන් වෙනුවෙන්ද එසේ පවතිමි.

මා විසින් ස්වදේශය නිතිය පිළිබඳිමි. එක්සත් ජාතීන්ගේ අභිලාෂයන් වෙනුවෙන් මා වෙත පැවැරී ඇති වරප්‍රසාද හෝ වැළක්වීමේ හැකියා, මාගේ පෞද්ගිලික වාසියට හෝ වරප්‍රසාද සඳහා යොද නොගැනීමට වග බලා ගනිමි. එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස්වරයාගේ සාධුගුණය මගේ නිවැසියන් සම්බන්ධයෙන් අහිතකර අයුරින් බලනොපෑමට, සමාජිකයින්ගේ පැවැත්ම සුරකීමට හැකි හැම දෙයක්ම කිරීමට මාගේ ශක්තිය යොදවමි.

3) මාගේ නිල කටයුතු සහ පෞද්ගලික කටයුතු පිළිබඳ මගේ පැවැත්ම, ගැටලු වැළැක්වීමට සුදුසු ආකාරයකින් ඉටු කරමි. එමගින් එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස්වරයා ගැන මහජන විශ්වාසය ප්‍රවර්ධනය වන සහ ආරක්ෂාවන අයුරින් මේ කටයුතු ඉටු කරනු ඇත. මාගේ ක්‍රියාමාර්ග පෞද්ගලික ලාභාපේක්ෂවන්ගෙන් නිදහස් වෙනවා ඇත. එසේම අනවශ්‍ය දේශපාලන බලපෑම්. තීරණ ගැනීමේදී වළක්වනු ඇත. මාගේ රාජකාරි ක්‍රියාත්මක කිරීමේ දී කිසිදු රජයකින්, මාගේ ජාතික අධිකාරීන් ද ඇතුලුව. එක්සත් ජාතීන්ගේ සංවිධානයට පරිබාහිර කිසිදු අධිකාරියකින් උපදෙස් ලබා නොගැනීමට වග බලා ගනු ලැබේ. කාර්ය මණ්ඩල රෙගුලාසි සහ නිතිරිති අනුව මා විසින් කිසිදු ගෞරවයක්, පදක්කමක්, ත්‍යාගයක්, මුලයමය ප්‍රතිලාභයක්, කිසිදු රජයකින්, වෙනත් බාහිර මාර්ගයකින්, එක්සත් ජාතීන්ගේ සංවිධානයට පූර්ව අනුදැනුමකින් තොරව ලබා ගැනීමට අපේක්ෂා නොකෙරේ.

රජයකින් හෝ වෙනත් මාර්ගයකින් කිසිදු ගෙවීමක් හෝ දීමනාවක් ලබා නොගනු ඇති අතර යම් දේශපාලනික ක්‍රියාවක පොදු කාර්යාලයක් වෙනුවෙන් පෙනී සිටීමට සම්බන්ධ නොවන්නෙමි.

එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස්වරයා සමග කිසිදු ගණුදෙනුවකදී පෞද්ගලික අය හෝ සමාගම් සමග සහායවීමෙන් වැළකෙමි. මෙවැනි දේවල් නිත්‍ය හෝ මනාපය දැක්වීමේ සංග්‍රහයකට යොමුවීමට පිළිවන් වනු ඇත. මා විසින් භාණ්ඩ හෝ සේවාවන් මිළට ගැනීමේ ක්‍රියාවන්ට, මානව සම්පත් ක්‍රියාවන්ට, අර්බුද පැන නැගිය හැකි දේවලට සම්බන්ධ නොවන්නෙමි.

4) කණ්ඩායම් හැඟීමෙන් යුත් සුසංගත වැඩ බිමක් නිර්මාණය කිරීමට, අන්‍යෝන්‍ය ගෞරවය සහ අවබෝධය සඳහා දායකවීම.

තත්ත්වය හෝ තරාතිරම නොසලකා එක්ව සේවය කරන තැනැත්තන්ට මා ගෞරවය දක්වා සියලුම සහායක සේවකයින්ගේ අදහස්වලට ඇහුම්කන් දෙනු ඇත. එසේම ඔවුන්ගේ දැනුම සහ අත්දැකීම කණ්ඩායම් සාර්ථකත්වයට දායක කිරීමට අවස්ථාව සළසමි. මම විවෘතව ඔවුන් සමග සන්නිවේදනය කරමින් අදාල තොරතුරු සහායක සේවකයින් සමග බෙදා හදා (විශ්වාසනීයත්වයට යටත්ව) ගැනීමට කාලීන ක්‍රමයක් තුළ උදක්ම ප්‍රතිචාර දක්වයි.

මා සමග සේවය කරන සහායක සේවකයින්ගේ පෞද්ගලිකත්වයට ගරු කරමින්, වැරදි තොරතුරු ලබාදීමෙන් වැළකෙමි, වෙනස්කම් නිරාකරණය කිරීම සහ ගැටළු මතුවන විට ඒවා විසඳන්නෙමි. මා විසින් සංස්කරණාත්මක දෙබසක් ඇති කිරීමට දායක වෙමි. අන්‍යෝන්‍ය ගෞරවයකින් සහ විවෘත, ධනාත්මක හැඟුරුවකින් කළමනාකරණය සහ කාර්ය මණ්ඩල නියෝජිතයින්ගේ මග පෙන්වීම ඇතිව කටයුතු කරමි. මගපෙන්වීම, පෙළඹවීම, ඔවුන්ගේ කුසලතා හඳුනා ගැනීම මගින් හැම කණ්ඩායම් සමාජිකයෙකුගේ කාර්ය පථය පිලිබඳව කාලීනව ප්‍රතිචාර දක්වමි.

5) එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස්වරයාගේ කාර්ය මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සාර්ථකව සහ සංගත ක්‍රියාකාරත්වයක් පවත්වා ගැනීම සඳහා සුරක්ෂිත බව, සෞඛ්‍ය සම්පන්න බව සහ සුභසාධනය ප්‍රවර්ධනය කරණු ඇත මාගේ සෞඛ, සුභ සාධනය සහ සුරකීමට සැලසුම් ගත සියලු උපදෙස්වලට අනුකූලව, දැනුවත්ව සිටිමි. මෙහෙවර තීරණ ගැනීමේ දී කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව ගැන නිතරම මෙනෙහි කරමි. මගේ හෝ මාගේ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව පිළිබඳ සැකයක් ඇති වන විටක, ඉක්මනින්ම මගේ ඉහළ නිළධාරීන්ගේ අවධානයට යොමු කරමි. කළමනාකරුවෙකු අධීක්ෂකයෙකු ලෙස මගේ කාර්ය මණ්ඩලයේ සහ ඔවුන්ගේ පවුලේ උදවියගේ සෞඛ්‍යයට හෝ යහ පැවැත්මට අනවශ්‍ය අවදනමක් ඇති නොවීමට උදක්ම සහතික වෙමි. යහපත් සමබර සේවා දිවියක් පවත්වා ගැනීමට කාර්ය මණ්ඩලයට සහායවීම සහ ඔවුන්ගේ හිමිකම්වලට ගරු කිරීමට බැඳී සිටිමි.

6) එක්සත් ජාතීන්ගේ සරණගත මහ කොමසාරිස්වරයා සමග මගේ සේවා කිරීමට ඇති හේතුවෙන් මට ඇති අයිතිය නිසා තොරතුරු සහ සම්පත් ආරක්ෂා කිරීමට සහ වගකීමකින් භාවිත කිරීමට කටයුතු වලදී මා විසින් නියමිත අවධානයෙන් ක්‍රියාකරමින් සරණාගතයින්, සහායක සේවකයින් සහ රාජකාරී සම්බන්ධව කටයුතු ගැන කාර්ය මණ්ඩලීය රෙගුලාසි සහ නීති රීති සහ පවත්නා නිර්නායකයන් අනුව රහස් තොරාතුරු අනාවරණය කරනු නොලැබේ.

එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස්වරයාගේ මානව, මූල්‍ය සහ ද්‍රව්‍යමය සම්පත් කාර්යක්ෂමව සහ සාර්ථකව උපයෝජනය සහ කළමනාකරණය කරමින් මේ සම්පත් සියල්ලම මහකොමසාරිස්වරයාගේ පාලනය යටතේ සරණාගතයින් සහ වෙනත් අදාල පුද්ගලයින්ගේ ප්‍රයෝජනයට ඇති බව සිත්හි දරා ගෙන ආරක්ෂා කිරීමට බැඳී සිටිමි.

7) වැළැක්වීම, විරුද්ධවීම සහ සුරාකෑම් නැතිකිරීම සහ සරණාගතයින් සහ අනෙකුත් පුද්ගලයින්ට ඇති වන අපහරණයන්ට හා අදාල වේ.

සරණාගතයින් සහ අනෙකුත් අදාල වන පුද්ගලයින්ගේ යහ පැවැත්ම සහ ඔවුන්ගේ ජිවිත සම්බන්ධයෙන් මා වෙත ඇති සද්ගුණය පිළිබඳ තත්ත්වය මත බලතල හා බලපෑමක් වැරදි ආකාරයෙන් නොයෙදවීමට වගබලා ගනිමි. සරණාගතයින් සහ අනෙකුත් අදාල පුද්ගයින් ගෙන් ආරක්ෂාව හෝ සේවා වෙනුවෙන් කිසිදු සේවයක් හෝ අනුග්‍රහයක් කොහෙත්ම ඉල්ලා නොසිටිමි. මම කිසි විටෙකත් සුරාකෑමේ සම්බන්ධතා - ලිංගික, චිත්ත වේගි, මූල්‍යමය හෝ රැකියාව හා සම්බන්ධ වූ දේවල්, සරණාගතයින් සහ අදාල වෙනත් පුද්ගලයින් වැඩවලට යොදා නොගනිමි.

අර්ථලාභියෙකු සමග සුරා නොකන සහ කැමැත්තෙන් එවන් සම්බන්ධතාවයක් ඇත්තෙකු ම විසින් සොයා ගනු ලැබුව හොත්, මෙම කරුණ සම්බන්ධයෙන් කැමැති පරිදි කටයුතු කරනවා යන අදහසින් මාගේ ඉහළ නිළධාරින්ට දැනුම් දෙමි. ම විසින් තේරුම් ගනු ලබන්නේ මාගේ උසස් නිළධාරීන්ට සහ මා යන දෙපිරිසට මේ කරුණු සම්බන්ධයෙන් සුපුරුදු උපදේශාත්මක සහ ආධාර ලබා ගැනිමේ යාන්ත්‍රණයන් ඇති බව තේරුම් ගෙන ඇත්තෙමි. සරණාගතයින් සහ වෙනත් එවැනි පුද්ගලයින් පෞද්ගලික කටයුතුවලට යොදා ගැනිමේ දී හෝ කුලියට ගැනිමේදී වගකීමකින් යුතුව කටයුතු කරමි. මෙම රැකියා නියුක්තිය පිළිබඳ ස්වාභාවය සහ නියමයන් මාගේ උසස් නිළධරින් වෙත ලිඛිත දන්වා සිටිමි.

8) අපරාධ හෝ අසද්ගුණයෙන් යුතු කටයුතු, මානව හිමිකම් උල්ලංගනය වන කටයුතු හෝ එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස්වරයාගේ ප්‍රතිමූර්තිය සහ සැලකිලි හා එක්හ නොවන කටයුතුවල නියලිමෙන් වලකිමි.

කිසිදු හිතපනුකුල නොවන සූරාකෑම හෝ අපයෝජන කටයුතු ද ඇතුළුව. උදහරණ වශයෙන් ළමා ශ්‍රමය, මනුෂපයන් සහ ද්‍රව්‍ය, නිති විරෝධි ගණු දෙනු වලට ආධාර අලුබල දීම හෝ නියලිම නොකෙරේ. එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස්වරයා ළමයින්ගේ රැකවරණය හා අභික්ෂාව පිළිබඳ ඉහළම මට්ටමින් කැපවී සිටින බැවින් මා වයස අවුරුදු 18 ට අඩු තැනැත්තන් සමග ලිංගික කටයුතුවල නියලිමක් බලාපොරොත්තු නොවන බව ගැන දැනුවත්ව සිටිමි.

(වැඩිපුර මගපෙන්වීම පාලන පරිපාටියෙහි සටහන් වල දක්වා ඇත)

9) **සේවා ස්ථානයේ දී කරදර හිරිහැර කිරීම, වෙනස්කම් කිරීම කායික හෝ වාචික අපහරණය, තර්ජනය කිරීමක් හෝ අයථා අනුග්‍රහයක් දක්වීමෙන් වැළකී සිටිමි. සේවා ස්ථානයෙහි කරදර හිරිහැර කිරීම, ලිංගික හිංසාව ඇතුළුව, බලය වැරදි ආකාරයට යෙදවීම වැනි දෙයක් සඳහා ඉඩ නොදීමට හෝ වැළකී සිටීමට වගබලා ගනිමි. කළමනාකරුවෙකු වැඩ මුලිකයෙකු වශයෙන් අයථා පක්ෂපාතිකම් වලට කාර්ය මණ්ඩලයෙන් ණය හෝ තෑගි ගැනීමිට වලින් වැලකි, ඒවාට පෙළඹවීමක් නොකිරීමට වගබලා ගනිමි. සංකේත වටිනාකමකට වැඩි නොවන අපක්‍ෂපාති අයවලුන් භාර නොගන්නෙමි. මාගේ අධීක්ෂණය යටතේ සේවය කරන අයත් සමග ලිංගික සබඳතා ඇති කර ගැනිම, විභව්‍ය ලෙස වැරදි ආකාරයට බලය යෙදවීමක් සහ සැලකිලි පිළිබඳ ආවේනික ගැටළුවක් ඇති බව මම දනිමි. ම විසින් එවන් සබඳතා සොයා ගත යුතු වන්නේ නම්, කිසිදු ප්‍රමාදයකින් තොරව එවන් ගැටළු නිරාකරණය කරන්නෙමි.**

# නෝර්වේ සරණාගත කාර්ය මණ්ඩලය (NRC) සඳහා පාලන පරිපාටය

## 1) එන්.ආර්.සී. (NRC) කාර්ය මණ්ඩලය විසින් බැඳී සිටින්නේ:

- නීතිවලට ගරු කිරීම, සේවා සලසන රටේ ආගම සහ සම්ප්‍රදායන්, සහායක සේවක පිරිස් සහ සේවය සළසන රටේ වැසියන් සමග මනා සබැඳියාවක් පවත්වා ගැනීම.

- NRC අරමුණු වලට සහ පෞද්ගලික අදහස් සහ ආගමික විශ්වාසයන්ද ඇතුලුව, NRC ආයතනය වෙනුවෙන් සේවය කිරීම සහ එහි කටයුතුවලට අහිතකර ලෙසින් බල නොපාන්නේය.

- හැකියාව, කාර්යක්ෂමතාව, සාධුගුණය පිළිබඳ උසස්ම තත්ත්වය රැකීම.

- NRC ආයතනයේ මුලය, ද්‍රව්‍යමය සම්පත් උපරිම ආරක්ෂාව ඇතිව මෙහෙයවීම, හොරකම් කිරීමට හෝ විනාශ කිරීමට එරෙහිව හැම කල්හිම ආරක්ෂා කිරීම, ඒවා නිසි පරිදි පවත්වා ගැනීම සහ නඩත්තු කිරීම, පෞද්ගලික වැරදි භාවිතයක් සිදු නොවන බව සහතික කිරීම.

- කාර්යාලයන්. NRC දේපල හෝ NRC සමග සේවය කිරීමෙන් ලබා ගන්නා ලද දැනුම පෞද්ගලික ලාභප්‍රේක්ෂා සඳහා යොදා ගැනීම, මුලය හෝ වෙනත් දේවල්, හෝ තුන්වෙනි පාර්ශ්වකරුවෙකුගේ පෞද්ගලික ප්‍රයෝජනයට, පවුල ද ඇතුළුව, යාලුවන් හෝ ඔවුන් පක්ෂපාතවන වෙනත් දේවල් සඳහා යොද නොගැනීම,

- සේවය කරනු ලබන ස්ථානයේ පවතින ආරක්ෂක මග පෙන්වීමට අනුව පවතින අතර ඒවා කාලවත් කිරීම.

- ප්‍රධාන කාර්යලයයේ හෝ නේවාසික නියෝජිතවරයාගේ අනුමැතියකින් තොරව ගෙවීම් ලබන වෙනත් වැඩ භාර ගනු නොලැබේ.

- මත් පැන් සහ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ප්‍රවේශමෙන් ක්‍රියා කිරීම.

- NRC ආයතනයට බාහිර වෙනත් කිසිදු අධිකාරයකින් උපදෙස් හෝ ගැනීම හෝ විමසීම නොකෙරේ.

- කිසිදු සම්මානයක්, පදක්කමක්, පක්ෂපාතිත්වයක් ත්‍යාගයක්, අයුතු ලාබයක් වෙනුවෙන් දීමනාවක්. හෝ මුල්‍යමය දීමනාවක් කිසිදු රජයකින්, රාජ්‍ය නොවන ආයතනයකින් හො නේවාසික නියෝජිතයාගෙන් හෝ ප්‍රධාන කාර්යාලයයෙන් අනුමැතියක් නොමැතිව භාර නොගැනීම.

- පුවත් පත්වලට හෝ වෙනත් ජන මාධ්‍ය ඒජන්සිවලට ප්‍රකාශ. ලිපි, ලේඛන, පොත් හෝ මුද්‍රණය සඳහා වෙනත් ද්‍රව්‍ය, NRC සැලකිලවලට අදල වුවත් නේවාසික නියෝජිත හෝ ප්‍රධාන කාර්යාලයෙන් පූර්ව අනුමැතියක් නොමැතිව නිකුත් නොකිරීම.

II ලිංග උපයෝජනය සහ අපහරණයට එරෙහි නිෂේධනය.

ලිංගික උපයෝජනය සහ ලිංගික අපහරණය ජාත්‍යන්තරව පිළිගත් මානව අයිතීන් සහ සම්මතයන් උල්ලංගනය කිරීම, NRC නිළධාරීන් සඳහා වන පැවැත්මට සම්පූර්ණයෙන්ම නොගැලපේ. වඩාත් අවදානමට ලක්වන මානව හිතවාදී තිරණාත්මක අවස්ථාවලදී විශේෂයෙන්ම කාන්තාවන් සහ ළමයින් සම්බන්ධව තව දුරටත් සුරකීම සඳහා පහත දැක්වෙන කල්ක්‍රියාවන් පිළිබඳ විශේෂිත සම්මුති ප්‍රකාශයට පත් කර ඇත.

- ලිංගික උපයෝජනය සහ අපහරණය NRC සේවක සේවිකාවන් විසින් සිදු කිරීම සංස්ථාපනය කරනු ලබන්නේ බලවත් අවකල් ක්‍රියාවක් ලෙස බැවින් විනායනුකූලව කටයුතු කිරීමට යටත් වන්නේය. විස්තර සම්පිණ්ඩනය කර සේවයෙන් පහකිරීමද ඇතුළත්ය.

- ළමයින් සමග ලිංගික ක්‍රියාවන් (වයස අවුරුදු 18 ට අඩු පුද්ගලියින්) බොහෝ දෙනාගේ වයස කුමක් වුවත් හෝ දේශියව හෝ වයසට කැමත්ත ප්‍රකාශ කරන්නේ වුව ද තහනම්ය. දරුවෙකුගේ වයස වරදවා තේරුම් ගැනීම ආරක්ෂාවට බලපාන හේතුවක් නොවේ.

- ලිංගිකත්වය හෝ වෙනත් ආකාර නින්ද කටයුතු සඳහා මුදල් හෝ වෙනත් දීමනා හුවමාරුව, අවමානයට පත්කිරීම හෝ උපයෝජනාත්මක හැසිරීම් තහනම් වේ. අර්ථලාභින්ට ලැබීමට නියමිත සහාය හුවමාරුකර ගැනීමද මීට ඇතුළත් වේ.

- NRC සේවක සේවිකාවන් සහ අර්ථලාභී සහායකයින් අතර ලිංගික සබඳතා ද NRC කටයුතු සම්බන්ධව විශ්වසනියත්වය සහ සාධුගුණ යටපත් කරයි. ඒවා නෛසර්ගික අසමාන ගතික මුල් කරගෙන ඇති බැවින් තරයේ අධෛර්යමත් කරයි.

- NRC කාර්ය මණ්ඩල සාමාජිකයෙකු දැඩි සැලකිල්ලක් වර්ධනය කළ හොත් හෝ ලිංගික අපචාරණය ගැන සැක කළොත් හෝ අනුගාමී සේවකයෙක් විසින් උපයෝජනය කළහොත්, එම ඒජන්සියේ හෝ නොවුවත් ඔහු/ඇය වාර්තා කළ යුතු යාන්ත්‍රණය ඔස්සේ එවන් දේ වාර්තා කළ යුතුය.

- NRC කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ කාර්යාලවල ලිංගික උපයෝජනයන්, අපහරණ වලක්වාලන පරිසරයක් නිර්මාණය කර පවත්වා ගෙන යැමට සහ ඔවුන්ගේ පාලන පරිපාටිය ක්‍රියාත්මක කර ප්‍රවර්ධනය කිරීමට බැඳී සිටී. කළමනාකරුවන් සහ සෑම තලයකම නිළධාරින් වෙත විශේෂ වගකීමක් පැවරී ඇත්තේ එම පරිසරය දියුණු කර පවත්වා ගෙන යෑමටය.

මෙහිදී "ලිංගික උපයෝජනය" යනුවෙන් විස්තර කරනු ලැබ ඇත්තේ ලිංගික කටයුත්තක් සඳහා කුමනාකාර හෝ අවදනම් සහිත අපහරණයක්, විසමතා බලයක් හෝ විශ්වාසයකින් වෙනත් ලිංගික උපයෝජනයක් දේශපාලන, සාමාජික හෝ මූලයමය වශයෙන් වාසියක් අත්පත් කරදීමද අයත් වේ. එසේ ම "ලිංගික අපයෝජනය" යනුවෙන් අදහස් වන්නේ නියම හෝ ලිංගික ස්වභාවයේ කායික බලහත්කාරකම් කිරීමක්, බලහත්කාර හෝ සමාන හෝ බලහත්කාර ආකාරයෙන් කිරීම ද අදහස් කෙරේ.

**මෙම සම්මත හය සවිස්තරාත්මක ලේඛනයක් ලෙස නොසැලකේ. වෙනත් ආකාර ලිංගික උපයෝජනයන් හෝ අපහරණයන් විනයානුකූල කටයුතුවලට යටත් වෙයි.**

---

නේවාසික නියෝජිතවරයා තමන්ගේ අභිමානය පරිදි වයස අවුරුදු 18 ට අඩු අයෙකු කාර්ය මණ්ඩලය සාමාජිකයෙකු විසින් විවහා කර ගනු ලැබුව හොත්, නමුත් වැඩිදෙනාගේ වයසට වැඩි හෝ තමන්ගෙ රටේ කැමැත්ත ඇතිව දෙදෙනාගේ අභිමාතය අනුව සිදු වුවහොත් ඔවුන් පදිංචිවී සිටන රටේ සම්මතයන් අනුගමනය කළ හැකිය.

## අවපතනය කිරීම සඳහා මෙතැන "ක්ලික්" කරන්න. සිද්ධි වාර්තා කරන පෝරමය

### සිද්ධි වාර්තා කිරීමේ පෝරුමය

වාර්තා කරන දිනය: .................................................. සිද්ධිය වූ දිනය: ..................................

සිද්ධීන් වූ ස්ථානය හෝ ඉසව්ව: ..................................................................................

යොමුව: ..................................................................................................

සිද්ධි වාර්තා පෝරමය පුරවනු ලබන නිළධාරියාගේ නම: ..................................................

සිද්ධියේ ස්වාභවය: කරුණාකර පහත දැක්වෙන එක් කොටුවක් සළකුනු කරන්න:

- ☐ මරණයක්
- ☐ උපතක්
- ☐ පැහැර ගැනීමක්
- ☐ නිවැසියන් අතර සිදුවන කායික පහරදීමක්
- ☐ ගෝත්‍රික ගැටුමක්
- ☐ දේශපාලන රැළියක්
- ☐ සිවිල් හිරිහැරයක්
- ☐ භාර්යාව විසින් පහරදීමක්
- ☐ දූෂණයක කිරීමක්
- ☐ කරදර හිරහැර කිරීමක්
- ☐ ද්වේශ සහගතව දේපල විනාශ කිරීමක්
- ☐ ගින්නක්
- ☐ ස්වාභාවික විපතක්
- ☐ වෙනත්

කරුණාකර සිද්ධිය පිළිබඳ වෙනත් තොරතුරු දක්වන්න......................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

අවශ්‍ය පසු විපරම්:...........

# 6 ළමා ආරක්ෂාව



ඇෆ්ගන් සරණාගතයින් පාකිස්ථානයේ ජලෝෂායි කඳවුරෙහි දි ලියාපදිංචි කිරීම. වැඩසටහන් සැලසුම් කිරීමේ දි කඳවුරක් තුළ සිටින ජනගහනයේ ප්‍රමාණය සහ ගති ලක්ෂණ යන දෙ අංශයම සහ තිරණාත්මක වගේම කල් පවත්නා විසඳුම් සොයාගැනීමද තිරණාත්මය. ඡායාරූපය UNCHR

# පරිච්ඡේදය 6 : ළමා ආරක්ෂාව

## හැඳින්වීම

ලොව පුරා අවතැන් වූ දරුවන් ඒකරාශි කළහොත්, ප්‍රමාණයෙන් වෙනත් අවතැන් වූ කිසිම ජනකොටසකට වඩා අඩකටත් වැඩි වේ. අවතැන්වීම ළමා වියේ සහ තාරුණ්‍යයේ ආරක්ෂිත භාවයට සංවර්ධනයට, ශාරීරික මෙන්ම මානසික සුවයට ඉමහත් තර්ජනයකි. අවතැන්වීම සමග අත්වැල් බැඳුණු යුධ වාතාවරණය, දරුවාගේ සංවර්ධනයට දිගු කාලීනව බලපෑම් ඇති කරවන සාධක වේ. දැනට සටන් පවතින සහ සටන් පැවැත්වුණු ප්‍රදේශවල ජීවත්වන දරුවන්ට මෙන්ම තරුණ පිරිස් සඳහා අවශ්‍ය අධ්‍යාපනික මෙන්ම සෞඛ්‍ය පහසුකම් සහ සේවාවන් අවම බැවින් ඔවුන් එච්.අයි.වී./ඒඩ්ස් වැනි තත්ත්වයන්හි පහසු ගොදුරක් බවට පත්වේ. දරුවන්ගේ අවශ්‍යතාවයන් සහ ප්‍රමුඛතාවයන්, වැඩිහිටියන්ගේ අවශ්‍යතාවයන්ට සහ ප්‍රමුඛතාවයන්ට වඩා වෙනස් වේ. එමනිසා කඳවුරුගත දරුවන්ගේ මෙන්ම කඳවුරුවලින් පිටත ජීවත් වන දරුවන්ගේ අවශ්‍යතාවන් විශ්ලේෂණය කිරීමේදීත්, ඔවුන්ට පහසුකම් සහ ආරක්ෂිත සේවාවන් සැපයීමේදීත් ඉහත කරුණු සැලකිල්ලට ගත යුතුවේ.

### ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වසර 1989 දී සම්මත කර ගන්නා ලදී. මෙම ජාත්‍යන්තර පිළිගත් ලියවිල්ලට අනුව ලොව වෙසෙන සියලුම දරුවන්ට ලබා දිය යුතු ආරක්ෂාව සහ සහයෝගය පිළිබඳ පෘථුල ප්‍රමිතීන් සකස් කොට ඇත. රටවල් දෙකක් හැරෙන්නට ලොව අනිකුත් සියලුම රටවල් මෙම ප්‍රඥප්තිය සඳහා එකඟත්වය පළ කරමින් අත්සන් තබා ඇත. මෙහි ප්‍රවිෂ්ටය සරල වුවද එහි අන්තර්ගතය තුළ ප්‍රධාන ප්‍රතිපත්තීන් හතරක් (04) දැක්වේ. එනම් දරුවාට වෙනසක් නොකිරීම හෝ කොන් නොකිරීම, ළමයාගේ උපරිම යහපත, දරුවාගේ පැවැත්ම සහ සංවර්ධනය සහ සහභාගිවීමේ අයිතිය. මෙම මූලධර්මයන් හතර දරුවාගේ අයිතිවාසිකම් සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රඥප්තියට පාදක වී ඇත. මෙම කෙටුම්පතට අනුව වයස අවුරුදු 18 න් පහළ සෑම කෙනෙකුම ළමයෙකු සේ සැලකේ. නීතියට අනුව අවු : 18 සීමාව නොතිබෙන්නට සෑම දරුවකුම වැඩිහිටියකු සේ සැලකීමට ඉඩ තිබුණි.

මීට අමතරව වසර 2002 දී මෙම ප්‍රඥප්තියේ කෙටුම්පත් වශයෙන් කරුණු දෙකක් ඇතුළත් විය. එනම් ළමයින්ව සටන්වලට බඳවා නොගැනීම සහ ළමයින් අපයෝජනයට ලක් නොකිරීම. දරුවන් ගණිකා වෘත්තියේ නොයෙදවීම සහ කාමුක හෝ අසභ්‍ය දර්ශන සඳහා යොදා නොගැනීමත් යන කරුණුය. කරන ලද සමීක්ෂණයන්ට අනුව දැනට ලොවපුරා දරුවන් 300,000 ක් පමණ සිය රටතුළ පවතින සටන්වලට සම්බන්ධ වී ඇති අතර, මෙම බඳවා ගැනීම් සෘජුව හෝ පැහැර ගෙන යෑම් තුළින් සිදුවී ඇත. තමාගේම පවුලටත්, තමන් ජීවත් වූ පරිසරයේ අනිකුත් ජරා කොටස්වලටත් කිසිදු පැකිළීමකින් තොරව සෘජුවම දරුණු අපරාධ කරමින් එසේත් නැත්නම් පවතින සටන්වල බිහිසුණු අත්දැකීම් ලබමින් මෙම දරුවෝ ජීවත් වෙති. එමනිසා වයස අවුරුදු 18 ට අඩු කිසිම දරුවෙකු සන්නද්ධ කණ්ඩායම්වලට බඳවා ගැනීම පිළිබඳ අනිවාර්ය තහනම් නියෝගයක් එක් විය.

### අවතැන් වූ දරුවා සහ විශේෂ අවශ්‍යතා

මන්දපෝෂණයේ රෝගාබාධ වැළඳීමේ, නොසලකා හැරීමේ සහ ප්‍රචණ්ඩත්වයේ අනිසි ප්‍රතිවිපාකයන් අත්විඳීමේ වැඩි ප්‍රවණතාවයක් අවතැන් වූ දරුවන් තුළ දක්නට ඇත. අවතැන් වූ ඕනෑම ජන කොටසක් තුළ දරුවන් සජාතීය කණ්ඩායමක් බවට පත් නොවේ. සෑම දරුවකුම පීඩාවට ලක්වීමේ තත්ත්වයක් තිබුණද සමහර දරුවන් වැඩි වශයෙන් පීඩාවට පත්වේ. ඒ අනුව අවතැන් වූ දරුවන් අතුරින් වඩාත් පීඩාවට ලක්වන්නේ සිය පවුලෙන් හෝ වෙනත් ආකාරයක රැකවරණය නොලබන දරුවන්ය. සාමාන්‍යයෙන්

දෙමාපියන්ගේ හෝ වෙනත් භාරකරුවකුගේ සහයෝගය සහ ආරක්ෂාව මෙම දරුවන්ට නොලැබෙන හෙයින් ඔවුන් නිසි අවධානයට ලක් නොවුණු වධහිංසාවට භාජනය වු පිරිසක් බවට පත් වේ. එමනිසාම මෙම දරුවන් වඩාත් පහසුවෙන් සන්නද්ධ කණ්ඩායම් වලට බඳවා ගැනීම, ලිංගික අපචාරයන්ට මෙන්ම අපයෝජනය සහ වධහිංසාව වැනි තත්ත්වයන්ට නතු වේ.

- **වෙන්වුනු දරුවන්** මෙලෙස සැලකෙන්නේ වයස අවුරුදු 18 ට අඩු තම දෙමාපියන්ගේ හෝ ඔවුන්ගේ පෙර නෛතික හෝ සම්මත මුලික භාරකරුවන්ගෙන් වෙන්වුවන්ය. සිය නෑදෑයින්ගෙන් වෙන්වීම මෙහිලා සැලකිල්ලට නොගැනේ. එවැන්නක් පවුලේ වෙනත් වැඩිහිටි ඥාතින් සමග ජිවත්වන දරුවන් සේ සැලකේ.

- **තනිවු දරුවන්** මෙලෙස හැඳින්වෙන්නේ දෙමාපියන්, ඥාතින් සහ නිතියෙන් හෝ සම්මතයෙන් කිසිම වැඩිහිටියකු විසින් රැකබලා ගැනිමට බැඳි නොමැති දරුවන්ය. (මානව අයිතිවාසිකම් කොමිසමට අනුව) එමෙන්ම කිසිදු රැකවරණයක් නොමැතිව සම්පුර්ණයෙන් තනිවම ජිවත්වන දරුවන් හුදකලා වු දරුවන් සේ හැඳින්විය හැක. දෙමාපියන්ගෙන් සහ භාරකරුවන්ගෙන් වෙන් වු දරුවන් අවතැන් වු දරුවන් සේ සැලකිම  සාමාන්‍ය තත්ත්වය වුවද, තනි වු එහෙත් වෙනත් පිරිසකගේ රැකවරණය ලබන තවත් දරුවන් කොටසක් සිටී. උදාහරණ වශයෙන් දෙමාපියන් හෝ භාරකරුවකු නොමැතිව තනිවම ගුවන් ගමනක යෙදෙන දරුවෙක්. මෙවැනි දරුවන් සමග ගමන් ගන්නා මිතුරන්, ඥාතියෙකුට හෝ නාඳුනන පුද්ගලයෙකුට හෝ අවස්ථානුකුලව දරුවාට සහයෝගය සහ රැකවරණය ලබා දිය හැක. කෙසේ වෙතත් තනිවු දරුවන්ගේ තත්ත්වයට මේ දෙකොටසම අයත් වුවත් සදාකාලිකව කිසිවකුගේ රැකවරණයක් නොමැතිව ජිවත්වන දරුවාට හුදකලා වු දරුවා යන වචනය වඩාත් උචිත වේ. මේ අතුරින් හුදකලා වු යෞවන තරුණියගේ තත්ත්වය වඩාත් භයානක වේ. තරුණියන්ව ලිංගික අපචාරයන් සහ වෙනත් අනිසි ක්‍රියාවන් සඳහා වඩාත් පහසුවෙන් යොදා ගැනිම සිදුවේ.

**වෙන්වුණු සහ තනි වු දරුවන්**

සෑම දරුවෙකුටම හිමි විය යුතු ආරක්ෂාව සහ අවධානය පිළිබඳව ඉතා පුළුල් ලෙස ව්‍යාප්ත වු ක්‍රියාවලියක් ජාත්‍යන්තර, කලාපිය හා ජාතික මට්ටමෙන් ඉටුවේ.
වෙන් වු දරුවන්ට විශේෂයෙන් අදාළවන කරුණු මෙසේ දැක්වේ.

- දරුවාට සුදුසු නමක් ලැබීම, නිතිමය අනන්‍යතාවය සහ උපත ලියාපදිංචි කිරීම.
- ශාරීරික සහ නිතිමය ආරක්ෂාව ලබා දීම.
- දෙමව්පියන්ගෙන් වෙන් නොකිරිම.
- දරුවාට ජීවත්වීම සඳහා අවශ්‍ය සුදුසු වාතාවරණය සලසා දිම.
- දරුවාගේ වයසට හා සංවර්ධන අවශ්‍යතාවන්ට සරිලන පරිදි සහයෝගය සහ අවධානය ලබා දිම.
- තමන්ගේ අනාගතය පිළිබඳ ගනු ලබන තිරණ වෙනුවෙන් දරුවා දායක විම.

- **ආබාධිත දරුවන්ට** අවශ්‍ය නිසි අවධානය අවතැන් වු තත්ත්වයන් යටතේ නොලැබේ. විශේෂයෙන් සාමාන්‍ය දරුවන්ගේ සංවර්ධනයට හා සුභ සාධනයට යෝග්‍ය, අධ්‍යාපනික සහ විනෝදාත්මක ක්‍රියාකාරකම්වලට ප්‍රවේශ විමට ආබාධිත දරුවන්ට ඇති ඉඩකඩ වඩාත් සීමිතය. මෙවැනි හේතුන් නිසා දැනටමත් යම් යම් දුබලතාවන්ගෙන් පෙළෙන දරුවන්ගේ තත්ත්වය වඩාත් බරපතල විය හැක. එබැවින්, ආබාධිත දරුවනට විවිධ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී සහ සංවිධානය කිරීමේදී ඔවුනට ඒ සඳහා අනිකුත් දරුවන්ට හා සමාන වු ප්‍රවේශයක් හා සහභාගිත්වයක් ලබා දිමේ අවශ්‍යතාව මුලික වශයෙන් සැලකිල්ලට ගත යුතුවේ.

- **ළමා සොල්දාදුවන් සේ කටයුතු කළ දරුවන්** බොහෝ විට ළමා ආරක්ෂාව පිළිබඳ පිහිට වූ ජාලයකට (රටතුළ පිහිටුවා තිබේ නම්) නතුවේ. මෙම විසුරුණු ජාලය මගින් එවැනි දරුවන් පිළිබඳ සෝදිසි කිරීම, ඔවුනට අවශ්‍ය අධ්‍යාපනික, මානසික හා සමාජයීය ක්‍රියාකාරකම සැලසුම් කිරීම හා කැපකරු භාරකාරත්වයකට දරුවාව යොමු කිරීම වැනි විශේෂ කාර්යයන් ඉටු වේ. මෙවැනි දරුවන් භාර ගැනීම සඳහා විශේෂ තාවකාලික සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවා ඇත. කෙසේ වෙතත්, ඉහත සඳහන් කළ පවුලෙන් වෙන්ව ජීවත් වන තරුණ පිරිස් මෙන්, ළමා සොල්දාදුවන් ඍජුවම අවතැන් වූ සමාජයකට අනුගත නොවේ. ඔවුන් සැමවිටම පුනරුත්ථාපනය කිරීමෙන් අනතුරුව සමානුගත කෙරේ. පවුලෙන් වෙන් වූ දරුවන් හා තරුණ පිරිසගේ අවශ්‍යතා සහ ආරක්ෂාව පිළිබඳ දැනටමත් ක්‍රියාත්මක වන වැඩපිළිවෙළ වඩාත් ශක්තිමත් විය යුතු වේ.

  විශේෂයෙන් අවතැන් වූ සමාජය තුළ මේ තරුණ පිරිසට ඇති පිළිගැනීම, සහ ඔවුන් නැවත සමාජයානුගත වීම පිළිබඳව නිරතුරු පසු විපරමක යෙදීම අත්‍යවශ්‍ය වේ. සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැති වුවහොත් මෙම දරුවන් අනිකුත් දරුවන්ට වඩා ඉතා පහසුවෙන් නැවතත් ළමා සොල්දාදුවන්ගේ තත්ත්වයට පත් වීමට ඇති ප්‍රවණතාව වැඩිය. ගැහැනු දරුවන්ට සන්නද්ධ කණ්ඩායම්වලට බඳවා ගන්නේ ලිංගික අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා වන අතර, බලහත්කාර විවාහයන්ද මේ අතර සිදුවේ.

- **දරුවන් ගෘහමූලිකත්වය දරණ නිවෙස්** තමන් පිළිබඳව සොයා බැලීමට වැඩිහිටියෙක් නොමැති බොහෝ අවස්ථාවලදී දරුවන් නිවසේ ප්‍රධානියා වශයෙන් සියලු වගකීම් දරමින් ගෘහමූලිකයාගේ තනතුරට පත්වේ. මව් පිය දෙදෙනාගෙන් කෙනෙකු රෝගාතුරවූ අවස්ථාවකදී හෝ මිය ගිය අවස්ථාවකදී වැඩිමහල් දරුවා සිය බාල සොයුරු සොයුරියන්ගේ වගකීම් දරමින් නිතැතින්ම වැඩිහිටියකුගේ තත්වයට පත්වේ. ජනතාව පීඩාවට පත්කෙරෙන ව්‍යසනයන් සහ එච්. අයි. වී. ඒඩ්ස් වැනි ආසාධිත තත්වයන්, සංවර්ධනය වෙමින් පවතින රටවල ජීවන රටාවට එල්ල කර ඇති ප්‍රබල බලපෑම් නිසා මිලියනයක් පමණ ළමයින්ගේ සහ තරුණ පිරිසගේ අර්ථවත් ජීවිත සහ සෞඛ්‍ය පරිහානියට පත්වෙමින් ඇත.

  සිදුකර ඇති අධ්‍යයනයන්ට අනුව දරුවන් ගෘහමූලිකත්වය දැරීමේදී මුහුණපාන ප්‍රධානතම ගැටලුව වන්නේ ඔවුන්ට ජීවත්වීමට අවශ්‍ය සියලු පහසුකම් සපයාදීමට සිදුවීමය එනම් නිවහනක් ආහාර, සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපනය, වෘත්තිය පුහුණුව සහ සහයෝගය මෙන්ම නිසි ආරක්ෂාව සැපයීමය බොහෝ ළමා ගෘහමූලිකයන් පාසැල් හැරගිය දරුවන් වේ.

## ළමා කඳවුරු පරිපාලන කණ්ඩායම්වල මූලික වගකීම්

රජය ළමයින්ට ආරක්ෂාව සලසන ඒජන්සි (ආයතන) ජාත්‍යන්තර රතුකුරුස සේවාව සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතින්ගේ තානාපතිවරයා, එක්සත් ජාතින්ගේ ළමා අරමුදල සතු ප්‍රධාන වගකීම වන්නේ රටතුළ අවතැන්ව සිටින සහ සරණාගත දරුවන්ට අවශ්‍ය රැකවරණ ලබාදීම වුවද, ළමා කඳවුරු පාලනය කිරීමේදී අවස්ථානුකූලව වරින් වර ළමා කඳවුරු පාලකයින් විසින් ඉටුකල යුතු ඉතා සියුම් වගකීම් රැසක්. හඳුනාගෙන ඇත. දරුවන්ගේ මතයට අහුම් කන්දීමත් එම දරුවන්ගේ වයස සහ පරිණතභාවය සැලකිල්ලට ගනිමින් ඒ අදහස් වලට නියමිත ගරුත්වය ලබාදීමත් අවශ්‍යවේ. ළමයින් වෙනුවෙන් සැලසුම්කෙරෙන අනාගත වැඩපිළිවෙළවල් පිළිබඳ ළමයා දැනුවත් කල යුතුවේ. එනම් ඔවුන් වෙනුවෙන් සකස් කෙරෙන සුබසාධන කටයුතු සහ ඔවුන් ස්ථානගත කිරීම පිළිබඳවත්, දරුවන්ගේ පවුල් පිළිබඳ සොයා බලා නැවත ස්ථානගත කිරීම් වැනි කටයුතුවේ. මෙහිදී පවුලෙන් වෙන්වීම පිටුදකිමින් ඒ පිළිබඳ මනා ප්‍රතිචාරයක් දරුවාට දැක්වීමට හැකි පරිදි ක්‍රියාශීලි වැඩසටහනක් ක්‍රියාත්මක විය යුතුවේ.

### පසුවිපරම, ලියාපදිංචිකිරීම, ලේඛනගත කිරීම සහ තොරතුරු බෙදාගැනීම

ළමා කඳවුරුතුළ දරුවාට ආරක්ෂාව සහ සුභසාධක කටයුතු ක්‍රියාත්මක කිරීමේදී, එහි පාලකයින් සහ ළමයින්ට ආරක්ෂාව සලසන ඒජන්සි, සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ තානාපතිවරයා (UNHCR) අතර මනා සහයෝගිතාවයක්, සම්බන්ධීකරණයක් සහ තොරතුරු හුවමාරු කිරීමත් සිදුවිය යුතුය. නිවැරදි පසු විපරම සහ ලේඛනගත කිරීම මත තොරතුරු බෙදාගැනීම බොහෝ විට සිදු වේ. අවතැන්වුවන් කඳවුරුතුළ ලියාපදිංචි කිරීමේ සහ ලේඛනගත කිරීමේ වගකීම එහි පාලකයින්ට මෙන්ම සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයට පැවරෙන වගකීමකි. මෙහිදී පවුලෙන් වෙන්වූ සහ තනිවූ දරුවන් ලියාපදිංචි කිරීම පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතුවේ. කඳවුරුවල සිටින රැඳවියන් පිළිබඳ නිවැරදි පසු විපරම සහ ලේඛනගත කිරීම, මුල්කාලයේ සිට සුභසාධන සහ නඩත්තු කිරීමේ කාල සීමාව අවසන්වන තුරුම සිදුකළයුතුවේ. විශේෂයෙන්ම එච්. අයි. වී / ඒඩ්ස් ආසාධිත නිවැසියන් පිළිබඳ හඳුනාගැනීම කළ යුතුය.

## ළමා කඳවුරු පරිපාලන කණ්ඩායම් සතු මූලික වගකීම්

- **දරුවන් ආරක්ෂා කිරීම සඳහා ඉදිරිපත් වී ඇති ඒජන්සි / සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා විසින් දරුවාගේ ආරක්ෂාව වෙනුවෙන් පනවා ඇති නියෝගයන් මනාව වටහාගැනීම :** අවතැන්වූ සහ සරණාගතවූ තත්ත්වයන් යටතේ දරුවන්ට සලසන ආරක්ෂක සේවාවන්, අවතැන්වූ කණ්ඩායම්වලට පමණක් ලබාදීමට සමහර ආයතන ක්‍රියා කරයි. එබැවින් ළමා කඳවුරු පාලකයින් මෙම ළමාරක්ෂක ඒජන්සිවල සහ සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්වරයා දරන නිර්නායකයන් සහ අරමුණුත්, දෙපාර්ශවයේම වගකීම් හා කාර්යභාරය පිළිබඳවත් මනා අවබෝධයක් තිබිය යුතුවේ.
- **ළමා ප්‍රඥප්තිය මනාව අවබෝධ කරගැනීම :** දරුවාට ලබාදිය යුතු නිසි ආරක්ෂාව සහ සහයෝගයට අදාළ ප්‍රමිතීන් පිළිබඳව සවිස්තරාත්මක පැහැදිලිකිරීමක් ළමා ප්‍රඥප්තියේ අඩංගු වේ. එබැවින් අවතැන්වූ දරුවන් සමග කටයුතු කරන සියලු දෙනාම මෙම ප්‍රඥප්තියේ අන්තර්ගතය පිළිබඳ මනා අවබෝධයක් ලැබිය යුතුවේ.
- **ළමා සුබසාධක කාරක සභා (කමිටු) සංස්ථාපනය කිරීම :** ළමා සුබසාධක කාරක සභා පිහිටුවීමේදී දරුවාගේ ආරක්ෂාව සලසන ඒජන්සි සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ තානාපතිවරයා සහ ප්‍රජා නියෝජිතයින් සමග සම්බන්ධීකරණය කිරීම අවශ්‍යවේ. එමෙන්ම කමිටුවේ කාර්යභාරය පිළිබඳව ව්‍යවස්ථාවක්, ළමයින්ට ආරක්ෂාව සලසන නියෝජිත ආයතනවල අනුදැනුම සහිතව සම්පාදනය කළයුතු වේ. මෙම කමිටුවේ සාමාජිකත්වය ලබාගැනීම සඳහා ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශවයම උනන්දු කරවීම අවශ්‍ය වේ.
- **පීඩාවන්ට ලක්වූ දරුවන් හඳුනාගැනීම :** මෙහිදී පීඩාවට ලක්වූ දරුවන් අතුරෙන් විශේෂ රැකවරණයකට හෝ ආරක්ෂාවකට යොමු කළයුතු දරුවන් හඳුනාගැනීමත්, ලේඛනගත කිරීමත් වැදගත් වේ. එමෙන්ම මෙම දරුවන් හඳුනාගැනීම සහ පසුවිපරම් කිරීමේ ක්‍රියාවලිය නිරතුරුවම සිදුවිය යුතු අතර, එමගින් දරුවාගේ සුබසාධන සහ නඩත්තු කටයුතු ක්‍රමානුකූලව ඉටුවේ. මෙහිදීද දරුවන්ට ආරක්ෂාව සපයන ඒජන්සිවල අදාළ නිලධාරීන් සමග සම්බන්ධීකරණය කිරීම අවශ්‍ය වේ.
- **වාර්තා කිරීමේ සහ තොරතුරු සෙවීමේ ක්‍රමවේදය :** දරුවන්ට වධහිංසා පැමිණවීම, අතවරයට ලක්කිරීම හෝ හමුදාවන්ට බඳවාගැනීම වැනි අවස්ථාවලදී, ඒ පිළිබඳව ක්ෂණිකව ලේඛනගත කොට අදාළ පාර්ශවයන් වන දරුවන්ට ආරක්ෂාව සපයන ආයතන සහ ළමාරක්ෂක නිලධාරීන්ව දැනුවත් කිරීමේ කාර්යක්ෂම වැඩපිළිවෙළක් ස්ථාපිත කළ යුතුවේ. එමෙන්ම ආධාර අවශ්‍යවුවන් නියමිත ස්ථාන කරා යොමු කරවීමට සුදුසු ක්‍රමයක්ද අවශ්‍යවේ. සමස්ථයක් වශයෙන්

ගත්කළ නියමිත ලෙස ලේඛනගත කිරීම, වාර්තා කිරීම සහ අවදානමට ලක්වූවන්ට අවශ්‍ය රැකවරණය සහ ආරක්ෂාව ලබාදෙන ආයතනයන්ට සහ නිලධාරීන් වෙතට යොමුකරවීමේ කාර්යක්ෂම ක්‍රමවේදයක් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය බව අවධාරණය කෙරේ. මේ සෑම කටයුත්තකදීම ළමයින්ට ආරක්ෂාව දෙන ආයතන සමග සමීප සම්බන්දතාවකින් කටයුතු කළයුතු අතර ක්‍රියාත්මක වන වැඩපිළිවෙළ පිළිබඳව සියලු ආයතන දැනුවත් කිරීමත්, එම ක්‍රමවේදයන් නිසිලෙස අනුගමනය කිරීමේ වැදගත්කම පෙන්වාදීමත්, මෙන්ම සිය වගකීම් හා යුතුකම් මනාව අවබෝධකරගෙන වැඩකිරීමත් ඉතා වැදගත්වේ.

- **පුද්ගලික ලියාපදිංචිකිරීම :** තනිවූ මෙන්ම පවුලෙන් වෙන්ව අතරමංවූ දරුවන්ගේ විස්තර වෙන්වෙන් වශයෙන් ලේඛනගත කොට ලියාපදිංචි කිරීම දරුවාගේ වරප්‍රසාදයක/අයිතියකි. මෙම වාර්තා නිසිලෙස පවත්වාගෙන යෑම තුළින් දරුවාට හිමිවියයුතු පහසුකම්, ආරක්ෂක සේවාවන් සහ වරප්‍රසාද නිසිලෙස නොලැබේ.
- **රහස්‍යභාවය :** ව්‍යසනයන්ට ලක්වූ, තනිවූ මෙන්ම පවුලෙන් වෙන්වූ දරුවන් පිළිබඳ රැස්කරන දත්ත සහ තොරතුරුවල රහස්‍යභාවය රැකීමත් සුරක්ෂිතව ස්ථානගත කිරීමත් අත්‍යවශ්‍යවේ.



කඳවුරු තුළ ළමා සුබසාධක කමිටු පිහිටුවීමට පියවර ගත යුතුය.

**කිරීම දරුවාගේ ආරක්ෂාවට මහෝපකාරීවේ.**

**ලේඛනගතකිරීම නිසා දරුවාට :**

- නිසි අනන්‍යතාවයක් ලැබීම
- ආහර සහ අනිකුත් ද්‍රව්‍ය ලැබීම
- සෞඛ්‍ය පහසුකම් ලැබීම.
- අධ්‍යාපන පහසුකම් ලැබීම.
- දරුවන් පිළිබඳ සොයාබැලීම් කෙරෙන වැඩපිළිවෙළට නතුවීම.

## දරුවන් කඳවුරුගත කිරීමේදී අනුගමනය කරන විකල්ප ක්‍රම

කඳවුරුගත කිරීමට නියම කෙරෙන තනිවූ හෝ වෙන්වූ දරුවන් ඇතුළු අනිකුත් දරුවන්ට තාවකාලිකව වැඩිහිටියන් සමග එකම සෙවණේ වාසය කිරීමට හදිසියේ සිදුවන අවස්ථා ඇත. එහෙත් ඉතා කෙටි කාලයක් තුළ දරුවාව සැපකරු භාරකාරත්වයකට පත්කිරීමට නොහැකිවූ අවස්ථාවකදී හෝ ඔවුන්ගේ පවුලේ තොරතුරු සොයාගැනීමට නොහැකිවූ අවස්ථාවකදී හෝ ඔවුන්ගේ පවුලේ තොරතුරු සොයාගැනීමට නොහැකිව අසාර්ථකවූ විට, වැඩිහිටියන් සමග එකම කඳවුරේ ජීවත්වන තාවකාලික තත්වය දිගුකාලීන බවට පත්වේ. මේ තත්වය කෙසේ වෙතත් තනිවූ සහ වෙන්වූ දරුවා අයාලේ යැමේ ප්‍රවනතාව වැඩි බැවින් එවැනි දරුවන්ගේ ආරක්‍ෂාව සහ පෞද්ගලිකත්වය පිණිස කඳවුරට ඇතුළත් කිරීමේදීම වෙන්කර තැබීම පිළිබඳව ප්‍රමුඛත්වය දිය යුතුය. වැඩිහිටියන් සමග දරුවන් එකට කඳවුරුගත කිරීම තාවකාලිකවූ විකල්පයක් පමණි. මෙහි අවසාන ප්‍රතිඵලය විය යුත්තේ, දරුවන් නැවතත් ඔවුන්ගේ දෙමාපියන්ට භාරකිරීමය. දෙමාපියන් නොමැති සමහර දරුවන්, ඥාතීන් සමග හෝ පළාතේ වෙනත් පවුලක් හෝ සමග ජීවත්වූ අවස්ථාවකදී දරුවාගේ කැමැත්ත පරිදි නැවතත් දරුවා ඔවුන්ටම භාර කළ හැක.

---

## ළමා කඳවුරු පාලකයින් සතු මූලික වගකීම්

---

- **වෙන්වූ සහ තනිවූ දරුවන් වෙනම ස්ථානයක රැඳවීම :** කඳවුරු පාලක නිලධාරි කණ්ඩායමේ ප්‍රධානතම වගකීම විය යුත්තේ ඉහත දරුවන් කඳවුරට භාර ගැනීමේදීම, ඔවුන්ව වෙනම ස්ථානගත කිරීම පිළිබඳව ප්‍රමුඛත්වය දී කටයුතු කිරීමය. මෙහිදී ගැහැනු සහ පිරිමි දරුවන් වෙන් වෙන්ව රඳවා තැබීමට අවශ්‍ය නිවාස, ගොඩනැගිලි, කඳවුර ආරම්භ කිරීමේදීම නිර්ණය කලයුතුවේ. මේ සම්බන්ධයෙන් අනුගමනය කළයුතු රීතීන් පිළිබඳ විස්තරාත්මක ඇමුණුමක් පරිච්ඡේදය අවසානයේ ඇත.

- **වෙන්ව පිහිටි කඳවුරුවල තත්වය සහ ආරක්‍ෂාව තහවුරු කිරීම :** මෙම දරුවන්ව රඳවාතබන තාවකාලික ස්ථානවල ඇති පහසුකම් සහ ආරක්‍ෂාව පිළිබඳව දරුවන්ට ආරක්‍ෂාව සපයන ඒජන්සි සහ ළමාරක්‍ෂක නිලධාරින්, නිරතුරු සහයෝගයකින් සහ වගකීමකින් යුතුව ක්‍රියා කළ යුතුවේ. මෙම ස්ථාන සෙසු කඳවුරුවලට ආසන්නව මෙන්ම, කඳවුරුවල ඇති සාමාන්‍ය පහසුකම් මේවාට සැපයීමට හැකිවන පරිදි කේන්ද්‍රගතවිය යුතුය. එමෙන්ම ස්ථානයේ ඇති ජල සහ වැසිකිළි පහසුකම් සනීපාරක්‍ෂක තත්වය, සහ සුරක්‍ෂිතභාවය පිළිබඳ සහතික වීම. විශේෂයෙන්ම මෙම පහසුකම් රාත්‍රී කාලයේදීත් සැපයීම. තවද පොදු මාර්ග පද්ධතියක් සහ විදුලිය නිසිලෙස සැපයීමද අත්‍යවශ්‍ය කරුණකි.

- **දරුවන්ගේ රැකවරණය සඳහා නිලධාරීන් පත්කිරීමේදී ස්ත්‍රීපුරුෂ භාවය (ලිංගිකත්වය) සැලකිල්ලට ගැනීම :** ගැහැනු ළමයින් වෙනුවෙන් නිලධාරිනියන්ද, පිරිමි දරුවන් වෙනුවෙන් නිලධාරින්ද පත්කළයුතුවේ. එමෙන්ම මෙම නිලධාරීන්ට සිය කටයුතු පිළිබඳ මනා පුහුණුවක්, ළමාරක්‍ෂණ ඒජන්සිය මගින් ලබා දිය යුතුය. මෙම නිලධාරීන්ගේ සේවය දිවා රාත්‍රී සේවාවක් වේ. කෙසේ වෙතත් ලිංගිකත්වය මත දරුවන්ට රැකවරණය දෙන නිලධාරින් පත්කළද, එමගින් දරුවන්ව ලිංගික අපචාරයන්ට ගොදුරු නොවේය යන විශ්වාසය තැබිය නොහැක.

## හදාවඩා ගැනීම (අභිවර්ධනය)

මෙයින් හැඳින්වෙන්නේ සිය පවුලෙන් පරිබාහිරව වෙනත් නිවසක රැකවරණය සහ පෝෂණය ලබන අවස්ථාවන්ය. මෙය තාවකාලිකවූ පිළියමකි. එමෙන්ම බොහෝ අවස්ථාවලදී දරුවාගේ නියම දෙමාපියන්ට භාරකාරත්වය සහ වගකීම සතුවේ. හදාවඩාගැනීමේ තත්වයට පහත දැක්වෙන වැඩපිළිවෙළ අයත්වේ.

- **සාම්ප්‍රදායික හෝ විධිමත් නොවූ හදාවඩාගැනීම් :** දරුවාට ඥාතිත්වයක් නොමැතිවූ පිටස්තර පවුලක හෝ නිවැසියකු විසින් දරුවාව හදාවඩාගැනීම. මෙහිදී තුන්වන පාර්ශවයක් සම්බන්ධ නොවුවද, ප්‍රදේශවාසින්ගේ අනුග්‍රහය සහ සහයෝගය මත, අදාළ වගකීම් සහ හිමිකම් පිළිබඳ පැහැදිලි අවබෝධයකින් යුතුව උක්ත පාර්ශවයන් කටයුතු කිරීම.

- **දරුවන් හදාවඩාගැනීම සඳහා හදිසි (ක්ෂණික) ඉදිරිපත්වීම් :** කිසිම පූර්ව සූදානමකින් හෝ සැලසුම්කළ වැඩපිළිවෙළකින් තොරව, ක්ෂණිකව ගත් තීරණ මත දරුවන්ව හදාවඩාගැනීමට සමහර පවුල් ඉදිරිපත් වේ. පවුල දරුවාගේ උපන් ජාතියටම අයත්නොවීම බොහෝවිට සිදුවන අතර සරණාගත දරුවෝ මෙවැනි තත්වයන්ට නිරන්තරවම මුහුණපාති.

- **සැළසුම් කල වැඩපිළිවෙළක් යටතේ ළමයින් හදාවඩාගැනීම :** තුන්වන පාර්ශවයක මැදිහත්වීම මත, සැලසුම් කළ වැඩපිළිවෙළක් යටතේ දරුවකුගේ භාරකාරත්වය පවුලකට පැවරීම මෙයින් හැඳින්වේ. සමාජ සුබසාධක කටයුතුවල නිරතවන රජයේ දෙපාර්තමේන්තු, ආගමික සංවිධාන, දේශීය හෝ විදේශීය රාජ්‍ය නොවන ආයතන මෙම තුන්වන පාර්ශවය ලෙස ක්‍රියා කරයි. (කෙසේ වෙතත් මෙම වැඩ පිළිවෙළ විධිමත් නීතිමය තත්වයකට ආවරණය වී හෝ නොවී සිදුවිය හැක.)

දරුවන් හදාවඩා ගැනීම සඳහා සුදුසු පවුල් සොයා බලා දරුවා යොමු කරවීම සහ ඒ පිළිබඳව පසු විපරම් කිරීම වැනි වගකීම් ළමා ආරක්ෂක ඒජන්සි විසින් දැරීම බොහෝ ළමා කඳවුරුවල දක්නට ලැබේ. එවැනි ආයතනවල සහය නොලබන ළමා කඳවුරුවල ළමා ආරක්ෂක නිලධාරීන් මෙම වගකීම භාරගත යුතුවේ. එම වගකීම් දැරීමේදී ළමා ආරක්ෂක නිලධාරීන් පහත දැක්වෙන කරුණු පිළිබඳ විශේෂවූ අවධානයක් යොමු කළ යුතුවේ.

- සුදුසු දේශීය වැඩපිළිවෙළක් තුළ දරුවන්ව දේශීයව හදාවඩාගැනීමේ හැකියාවන් වර්ධනය කරගැනීම. තවද ළමා කඳවුරුතුළ ප්‍රජා සුබසාධක කටයුතු වැඩි දියුණු කිරීම සහ දරුවන්ව හදාවඩා ගැනීමට ඉදිරිපත්වන පවුල්වලට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දීම.

- දරුවන්ව රැකබලාගැනීමට ඉදිරිපත්වන පවුල්වලට තිබිය යුතු සුදුසුකම් පිළිබඳව නිර්ණායකයන් සකස් කිරීමේදී, කඳවුරුවල සාමාජිකයින් හවුල් කරගැනීම. මේ අනුව දරුවන්ට නොසලකා හැරීම වධහිංසාවට ලක් කිරීම අවම කරගත හැකිවේ. හැම විට හැකි සැම අවස්ථාවකදීම දරුවන් සහ රැ කබලාගන්නා පවුල් එකම සමාජයකින් වීම වැදගත් වේ.

- විධිමත් නොවූ වැඩපිළිවෙළක් යටතේ වුවද, දිගින් දිගටම දරුවෙක්ව හදාවඩාගැනීමට පවුලක් එකඟවූ අවස්ථාවකදී, එම පවුල සමග ජීවත්වීමට දරුවා සතුටු නම් ඊට අවසරය ලබා දිය හැක. කෙසේ වුවද දරුවාගේ නියම දෙමාපියන් හෝ පවුල සොයාගත් අවස්ථාවකදී, දරුවාව එම නියම දෙමාපියන්ට භාරදීමට හදාවඩාගන්නා පවුල එකඟවිය යුතුය.

- සාමාන්‍යයෙන් ළමයෙක්ව හදාවඩාගැනීමට ඉදිරිපත්වන පවුල්වලට කිසිදු ගෙවීමක් කිරීම අවශ්‍ය නොවේ. කෙසේ වෙතත් මූලික අවශ්‍යතාවයන් සපුරා දිය හැක. එනම් ආහාර සලාක නිකුත් කිරීමේ කූපන් පතක් ලබාදීම ආදියයි. මෙහිදී වඩාත් යෝග්‍ය වන්නේ දරුවන් රැක බලාගැනීමට අවශ්‍ය ශක්තිමත් පසුබිමක් මෙන්ම වාතාවරණයක් ගොඩනැගෙන ආකාරයේ පුළුල් ස්ථිර ප්‍රජාමුල ක්‍රියාකාරකම් සහිත වැඩපිළිවෙළක් ස්ථාපිත කිරීමය.

## ස්වාධීනව ජීවත්වීම - නිශ්චිත ආරක්ෂක / රැකවරණ අවශ්‍යතා පිළිබඳ යොමුවීම

තනිවූ සහ අවතැන්වූ දරුවන්ව හදාවඩාගැනීමට සුදුසු පවුලක් සොයාගැනීමට නොහැකිවූ අවස්ථාවන්හිදී විකල්පයක් වශයෙන් ලිංගිකත්වය අනුව දරුවන්ව වෙන් කොට කුඩා කණ්ඩායම් හෝ පවුල් ඒකක වශයෙන් ජීවත් වීමට සලස්වයි. මෙම දරුවන්ට (සාමාන්‍යයෙන් වයස අවුරුදු 15 ට වැඩි) යම්කිසි ප්‍රමාණයක නිදහසක් දිය යුතුවේ. ස්වයං පාලනයක් කරගැනීමේ ශක්තිය තිබිය යුතුය. බොහෝ විට ළමා සොල්දාදුවන්ව සිට, දැනට යොවුන්වියේ පසුවන දරුවන් හදාවඩාගැනීම සඳහා පවුලකට භාර කිරීම අපහසුවේ. එවැනි තත්‍වයකදී වඩාත් සුදුසු වන්නේ මෙම ස්වාධීනව ජීවත්වීමේ ක්‍රමයයි. ළමාරක්ෂක ඒජන්සි සමඟ ළමා කඳවුරු පාලකයින් එක්ව රැකවරණය දිය හැකි කණ්ඩායමක් සමාජය තුළින්ම හඳුනාගෙන ඔවුන් මාර්ගයෙන් මෙම ළමා නිවැසියන්ගේ පැවැත්ම පිළිබඳ නිරතුරු පසුවිපරමක යෙදීම අවශ්‍යවේ. අනිකුත් නිවැසි ඒකකයන්ට මෙන් නොව මෙම දරුවන්ට විශේෂයෙන් ඔවුන්ගේ ආහාර වේලට සමානවූ අමතර පෝෂදායී ආහාර ලබාදීම, ආහාර නොවන ද්‍රව්‍ය එනම් දර සහ භූමිතෙල් සපයාදීම වැනි වරප්‍රසාද සැපයේ. මෙම සරල පහසුකම් සපයාදීම තුළින් පහත දැක්වෙන කරුණු අවම කරගැනීමට හෝ බැහැර කිරීමට හේතුවේ.

ළමා ශ්‍රමිකයින් වීම : විවිධ සංස්කෘතීන්ට අනුව දර කැපීම, කැඩීම, එකතු කිරීම, විකිණීම, සහ සැපයීම වැනි කාර්යයන්හි දරුවන් නිරත වීම සාමාන්‍ය දෙයකි. ඔවුන් ළමා ශ්‍රමිකයින් හෝ ළමා කම්කරුවන් ලෙස හැඳින්විය නොහැක. කෙසේවෙතත් ඉහත දැක්වූ අමතර පහසුකම් දරුවන්ට සැපයීමේ ප්‍රධාන පරමාර්ථය වන්නේ, මුදල් උපයාගැනීම පිණිස විවිධ කාර්‍යයන්හි නිරත වීමෙන් දරුවා වලක්වා ගැනීම සහ ඒ සඳහා ඔවුන් මිඩංගුකරන කාලය අධ්‍යාපන කටයුතු සහ විනෝදාත්මක ක්‍රීඩාවන් සඳහා යෙදවීමට ඔවුන්ට පෙළඹවීමයි. අනිවාර්යයෙන්ම මෙසේ අමතර පහසුකම් සපයාදීම තුළින් අසුභවාදී උපක්‍රමශීලි ආදායම් මාර්ගයන්ට ගොදුරු වීමෙන් දරුවන්ව වලක්වා ගත හැක. එනම් ගණිකා වෘත්තියේ යෙදවීම, අනතුරුදායක බර වැඩ කිරීම මින් අදහස් කෙරේ.

පාසැල් හැර යන දරුවන් : ඉහත දැක්වූ ආකාරයට අමතර පහසුකම් සලසාදීම තුළින් දරුවාට අධ්‍යාපන කටයුතුවලට සහ ක්‍රීඩාවන්ට මිඩංගු කිරීමට වැඩි කාලයක් ලැබීම.

ප්‍රබල අනාරක්ෂිත තත්‍වයන් වන එනම් අනතුරුදායක ක්‍රියාවල යෙදීම, ඉතා දුරබැහැර දුෂ්කර පළාත්වලට යෑම, දර සෙවීම පිණිස කැලෑවලට යෑම, සහ වෙළඳ භාණ්ඩ ලබා ගැනීම සඳහා ඒවා බෙදහරින ස්ථාන කරා යෑමෙන් දරුවාව වලක්වා ගැනීම.

**හමුදාවන්ට සිය කැමැත්තෙන්ම බැඳීම හෝ බලහත්කාරයෙන් බඳවා ගැනීම වලක්වාලීම. උක්ත කරුණු තුනම මේ තත්‍වය හා සම්බන්ධ වේ.**

## කඳවුරු පාලකයින්ගේ මූලික වගකීම්

- **නිදහසේ/නිදැල්ලේ ජීවත්වීමට ඇති ඉඩකඩ සහ එහි ආරක්ෂක තත්‍වය :** දරුවාට රිසි පරිදි නිදහසේ කල්ගත කිරීමට සුදුසු ස්ථානයක් කඳවුර තුළ තිබිය යුතුය. එහි ආරක්ෂාව මෙන්ම ජල සහ වැසිකිළි වැනි අවම පහසුකම්ද තිබිය යුතුය.

- **ප්‍රජාව තුල සංවේදීභාවයක් ඇති කරවීම :** මෙම ළමා නිවැසියන්ට විශේෂ අමතර ද්‍රව්‍ය සැපයීමේ අවශ්‍යතාව පිළිබඳව ප්‍රජාව තුළ සංවේදී බවක් ඇති කරවීම. මෙහිදී ප්‍රජාව තුළ බෙදහැරීමට ප්‍රමාණවත් ද්‍රව්‍ය නොතිබෙන අවස්ථාවන්හිදී පවා, දරුවන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳ ප්‍රමුඛත්වය දීමට ප්‍රජාව සංවේදී කිරීම ප්‍රධානවේ.

- **රැකවරණය ලබාදෙන පුද්ගලයින් හඳුනාගැනීම :** දරුවන්ට රැකවරණය ලබාදීමට සුදුසු පුද්ගලයින් හඳුනාගැනීමේ ක්‍රියාවලියේදී, ළමා ආරක්ෂක ඒජන්සි, සුබසාධක කමිටු සහ සරණාගතයින් පිළිබඳවූ එක්සත් ජාතීන්ගේ තානාපතිවරයා ( UNNCR ) සඳහා සහයෝගය දීම.

- **රැස්වීම් පැවැත්වීම :** කඳවුරු තුළ ළමා සුබසාධක කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කිරීමේ වගකීම කඳවුරු පාලකයින් සතු වගකීමකි. විශේෂයෙන්ම රැස්වීම්වල රහස්‍යභාවය රැකෙන පරිදි වාතාවරණයක් සහිත සුදුසු ස්ථානයක් සොයාගැනීම ඔවුන්ගේ වගකීම වේ.

- **දැනුවත් කිරීම සහ සංවේදී භාවයක් ගොඩනැගීම :** අවතැන්වූ දරුවන්ට සහ තරුණයින්ට ලැබිය යුතු විශේෂ අවධානය පිළිබඳ නිසි අවබෝධය කඳවුරු වල එකට ජීවත්වන අනිකුත් පිරිසට බොහෝවිට නොමැත. එබැවින් මෙම දරුවන්ට අවශ්‍ය අවධානය සහ සුරක්ෂිතභාවය පිළිබඳව සෙසු පිරිස දැනුවත් කිරීමේ සුවිශේෂ කාර්යභාරය නිලධාරී මණ්ඩලය සතු වේ. එමෙන්ම පුනරුත්ථාපන ක්‍රමවේදයන් සහ වැඩපිළිවෙළ නිර්මාණය කිරීමේදී අවතැන්වූ පිරිස් සහ ළමා සුබසාධක කමිටු අනිවාර්යෙන්ම සහභාගි කරගත යුතුය.

- **විකල්ප රැකවරණයන් යටතේ ජීවත්වන දරුවන් පිළිබඳ පසුවිපරම :** ස්වාධීනව ජීවත්වන දරුවන්, පවුලක් විසින් හදාවඩාගන්නා දරුවන් සහ නිශ්චිත ස්ථානයකට මාරු කරන තුරු තාවකාලිකව රැඳවුම් කුටි වල ජීවත්වන දරුවන් පිළිබඳ මනා පසු විපරමක් කළ යුතු වේ. මෙහිදී ළමා කඳවුරු පාලකයින්, ළමා සුබසාධක කමිටු සහ ළමාරක්ෂක ඒජන්සි සමඟ සම්බන්ධව ක්‍රියාකිරීම අත්‍යවශ්‍ය වේ. මේ අතුරින් ළමා සොල්දාදුවන්ව සිටි දරුවන් සහ ස්වාධීනව ජීවත්වන තරුණ ගැහැනු දරුවන් වෙත විශේෂ අවධානයක් යොමු කළ යුතුවේ. අවතැන්වූ, තනිවූ සහ විකල්ප රැකවරණ යටතේ සිටින දරුවන් පිළිබඳ පසුවිපරම් කිරීමේදී භාවිත කළයුතු ක්‍රමවේදය සහිත පත්‍රිකාවක් මෙම පරිච්ඡේදයට අමුණා ඇත. එය අධ්‍යයනය කිරීමෙන් පැහැදිළි අවබෝධයක් ලබාගත හැකි වේ.

## සොයාබැලීම සහ නැවත එකරාශී කිරීම

පවුලේ සාමය සමගිය රැකගැනීම සහ ස්ථාපිත කරගැනීම දරුවාගේ සෞඛ්‍ය සහ යහපත් පැවැත්මට අත්‍යවශ්‍යය. තනිවූ සහ අවතැන්වූ දරුවන් ඔවුන්ගේ ඥාතීන්ට හෝ නීතියෙන් හෝ සම්මතයෙන් රැකවරණ ලබාදීමට බැඳුණු පුද්ගලයින් හට භාර කිරීම කඩිනමින් සිදුවිය යුතුය. කල්ගතවීම තුළින් සොයා බැලීම සහ හඳුනාගැනීමේ ක්‍රියාවලිය සාර්ථකව ඉටු නොවේ. මෙම සොයා බැලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණ කටයුතු, ළමා ආරක්ෂක ඒජන්සි රතු කුරුස සංගමය, ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල, ජාත්‍යන්තර සංක්‍රමණිකයන්ගේ සංගමය සහ සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ තානාපතිවරයා මගින් සිදුවේ. මේ අනුව විවිධාකාරවූ සොයාබැලීමෙම් ක්‍රමවේදයන් හඳුනාගෙන තිබේ.

එකම රටතුළ පිහිටි කඳවුරු අතර සහ කඳවුරු තුළ සොයාබැලීමේ කටයුතු සිදුකිරීම. මෙය සරණාගත මෙන්ම අවතැන්වූ දරුවන් සඳහා අදාළ වන අතර ළමා ආරක්ෂක ඒජන්සි මෙහි වගකීම දැරිය යුතුවේ.

රට තුළ ජීවත්වන ඥාතීන් පිළිබඳ සොයාබැලීම. මෙය අවතැන්වූ දරුවන්ට අදාළ වන අතර එහි වගකීම ජාතික රතු කුරුස සංගමයේ සහ සෝදිසිකිරීමේ ජාතික වැඩපිළිවෙළේ වගකීම සේ සැලකේ.

මුල් රටෙන් බැහැරව, වෙනත් දේශයන්හි පිහිටි සරණාගත කඳවුරුවල සොයාබැලීම් කිරීම. මෙහි වගකීම ජගත් රතුකුරුස සංවිධානයට සහ සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ තානාපතිවරයාට පැවරේ.

- **කඳවුරු තුළ දරුවන්ව සොයාබැලීමේ සුවිශේෂ ක්‍රියාපටිපාටින් :** දරුවන් සොයායෑමේ යහපත් සක්‍රිය වැඩපිළිවෙළක් කඳවුරු තුළ ඇතිකිරීම අවශ්‍යවේ. මේ සඳහා ළමා ආරක්ෂක ඒජන්සි සහ දරුවන් සොයාබැලීමේ කටයුතු පිළිබඳ වගකීම් දරණ ඒජන්සි ඒකාබද්ධව ක්‍රියා කළයුතු වේ. මෙම සක්‍රිය වැඩපිළිවෙළට දරුවන්ගේ ඥාතීන් ලියාපදිංචි කිරීම, සොයා බැලීමේ වැඩපිළිවෙළ පිළිබඳ තොරතුරු ප්‍රචාරය කිරීම, සහ නැතිවූ මෙන්ම සොයාගත් දරුවන්ගේ ඡායාරූප කඳවුරු තුළ ප්‍රදර්ශනය කිරීම් ආදී කාර්යයන් අයත්වේ. එමෙන්ම දරුවන් සොයා බැලීමේ වැඩපිළිවෙළ සහ ඊට සම්බන්ධ අනිකුත් කටයුතුවලට පාදක වන සමහර කරුණු වල රහස්‍යභාවය රැකීමේ වගකීම ළමා ආරක්ෂක ඒජන්සි සහ දරුවන් පිළිබඳ සොයාබැලීම් කරන ඒජන්සි සතුවේ.
- **කඳවුරු තුළ පහසුකම් :** දරුවන්ව හඳුනාගැනීමේ කාර්යයේදී පවත්වන සම්මුඛ සාකච්ඡා සහ ලබාගත් තොරතුරුවල සත්‍ය අසත්‍ය භාවය තහවුරු කිරීම සඳහා කෙරෙන අභ්‍යාස ආදිය පැවැත්වීමට සුදුසු ස්ථාන සොයා බලා තෝරාගැනීම කඳවුරු පාලක කණ්ඩායමේ වගකීම වේ. මෙහිදී පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය අතිශයින්ම රැගෙන පරිසරයක් තෝරාගැනීම අත්‍යාවශ්‍යවේ.
- **සුරක්ෂිතව දත්ත පවත්වාගෙන යෑම :** දරුවන්ව සොයා බැලීමේදී රැස්කරගත් දත්ත, එමෙන්ම වෙන්වුණු සහ නැවත පවුල් හා සම්බන්ධ දරුවන් පිළිබඳ දත්ත සහ විස්තර පවත්වාගෙන යෑම ළමාආරක්ෂක ඒජන්සි සහ දරුවන් පිළිබඳ සොයාබැලීම් කරන ඒජන්සි හරහා සිදු වේ. කෙසේ වෙතත් මෙම දත්ත සහ ලිපි ගොනු සුරක්ෂිතව තැන්පත් කරතැබීම කඳවුරු පාලකයින්ගේ වගකීම වේ.
- **දරුවන් නැවත පවුල් හා සම්බන්ද කිරීමේදී අවශ්‍යවන සේවාවන් සමාලෝචනය කිරීම :** දරුවන්ව පවුල්වලට සම්බන්ද කිරීමේදී, ඔවුන් යොමුවන පවුල්වලට අවශ්‍යවන සේවාවන් සහ පහසුකම් පිළිබඳව සමාලෝචනයක්, ඊට වගකිවයුතු අංශ සමග ඒකාබද්ධව කිරීම පාලකයින්ගේ වගකීම වේ. මෙම දරුවන්ගේ අවශ්‍යතාවන් වන ආහාර සලාක, ආහාර නොවන වෙනත් ද්‍රව්‍ය , නිවහනක් සහ අනිකුත් අවශ්‍ය සේවාවන් කඩිනමින් සලසා දිය යුතුවේ.



අවතැන්වූ ඇෆ්ගනිස්ථාන දැරියක් නැවත සිය නිවස කරා යෑමට බලා සිටින අයුරු. අවතැන්වීම දරුවන්ගේ වර්ධනයට තිරනාත්මක ප්‍රතිඵල දීගුකාලීනව ගෙන දෙයි.

## සහභාගිත්වය සඳහා යොමු කරවීම

සැම දරුවෙක්ම අධ්‍යාපනික සහ විනෝදාත්මක ක්‍රියාකාර කම්හි මෙන්ම කඳවුරු තුළ පිහිටි තීරණ ගැනීමේ මණ්ඩලවලටද, සහභාගි කරවා ගැනීම අවශ්‍ය වේ. දරුවන්ගේ සහභාගිත්වය හෝ යොමුවීම, විද්‍යමානවන විනෝදාත්මක ක්‍රියාකාරකම්වල අඩියරය ඉක්මවූ එකක් විය යුතුවේ.

## ළමා කඳවුරු පාලකයින්ගේ මූලික වගකීම්

- **තීරණ ගැනීමේ ව්‍යුහය :** මෙම දරුවන් සහ තරුණ පිරිස, විවිධ මාර්ගෝපදේශක හෝ නායකත්ව කමිටුවලට සහභාගි කරවීම මෙන්ම තීරණ ගැනීමේ සහ සංවිධාන කිරීමේ කටයුතුවලදී විවෘතව හඬක් නැගීමට ඔවුන්ට අවස්ථාව සලසා දීම සහ ඒ පිළිබඳව පසු විපරමක් කිරීම පාලකයින්ගේ වගකීමයි. සමහර තරුණ පිරිස් ඔවුන්ගෙන්ම සංවිධානයවූ කමිටු හරහා යොමු කරවීම කල යුතු වේ. (3වන පරිච්ඡේදය - ප්‍රජා සහභාගිත්වය සහ 13 වන පරිච්ඡේදය - තාරුණ්‍ය සහ ක්‍රියාකාරකම්)

- **තොරතුරු විසුරුවා හැරීම :** දරුවන් වෙනුවෙන් ගන්නා සැම තීරණයක් පිළිබඳව, දරුවන්ව දැනුවත් කළ යුතුවේ. මෙය විශේෂයෙන්ම වැදගත් වන්නේ දරුවන් පිළිබඳ සොයාබැලීමේ කටයුතුවලදී සහ දරුවන් වෙනුවෙන් විකල්ප රැඳවුම් ස්ථාන සෙවීමේ කටයුතු වලදීත්ය.

### සමාන සහභාගීත්වය

කඳවුරු සමාජය තුල සැම දරුවෙකුටම අවශ්‍ය සියළු පහසුකම් සහ සේවාවන්, උදහරණ වශයෙන් සියලු අධ්‍යාපනික සහ විනෝදාත්මක ක්‍රියාකාරකම්හි සියලු නිරතවීමේ වරප්‍රසාදය සමාන ලෙස දරුවන්ට ලබා දීමට ළමාරක්ෂක ඒජන්සි සහ වෙනත් වගකිව යුතු ආයතන සමග සම්බන්ධයෙන් කටයුතු කිරීම ළමා කඳවුරු පාලක කණ්ඩායම සතු වගකීමකි. සමහර දරුවන්ට කරුණු වටහාදීම හෝ යමකට යොමුකරවීම අපහසු බව පාලක පාලිකාවන් තේරුම් ගත යුතුය. විශේෂයෙන්ම ආබාධිත, හනිවූ, තරුණ මව්වරුන්, සහ ළමා සොල්දාදුවන්ව සිටි දරුවන් මෙවැනි තත්වයන්හි පසුවේ. ඔවුන් සඳහා විවිධ උපක්‍රමශිලි ක්‍රමවේදයන් අනුගමනය කිරීමට පාලක, පාලිකාවන්ට සිදුවේ.

# මෙවලම් කට්ටලය

**වෙන්වූ සහ තනිවූ දරුවන්ට සැපයෙන විකල්ප ආරක්ෂිත වැඩපිළිවෙළ පිළිබඳ පසු විපරම් කිරීමට භාවිත කෙරෙන ආකෘති පත්‍රය හෙවත් ෆෝරමය :** මෙම ආකෘති පත්‍රය ළමා සුභසාධක මහලේකම් කාර්යාලය, සමාජසේවා අමාත්‍යාංශය සහ සියරා ලියෝන්හි පිහිටි ළමා සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ ආයතනය විසින් සකස් කරන ලදී. මේ සඳහා යුනිසෙෆ් ආයතනය, සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතින්ගේ තානාපතිවරයා, ජගත් රතුකුරුස සංවිධානය, සහ ළමා සුරැකුම් අරමුදල - එක්සත් රාජධානිය, අවශ්‍ය සහයෝගය දෙන ලදී.

- ඇමුණුම B - වෙන්වූ සහ තනිවූ බාලවයස්කාර දරුවන්ට සැපයෙන විකල්ප සමාජ සේවාවන් පිළිබඳ පසුවිපරම් කිරීමේ ආකෘති පත්‍රය.
- ඇමුණුම C - වෙන්වූ සහ තනිවූ බාලවයස්කාර දරුවන්ට ලැබෙන විකල්ප රැකවරණ සේවාවන් පිළිබඳ පසුවිපරම් කිරීමේ ආකෘති පත්‍රය.

**වෙන්වූ/තනිවූ බාලවයස්කාර දරුවන්ට රැකවරණය/සුරක්ෂිතභාවය ලබාදෙන ස්ථාන සමග එළඹෙන ගිවිසුම**

මෙය සකස් කොට ඇත්තේ ළමා සුභසාධක මහලේකම් කායර්ාලය, සමාජ සුභසාධන අමාත්‍යාංශය සහ සියරා ලියෝන්හි ළමා කටයුතු සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ආයතනයන් විසිනි. ඒ සඳහා අවශ්‍ය සහයෝගය, සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතින්ගේ සභාපතිවරයා, එක්සත් ජාතින්ගේ ළමා අරමුදල, ජයත් රතු කුරුස සංවිධානය සහ ළමා සුරැකුම් අරමුදල - එක්සත් රාජධානියේ. විසින් ලබාදෙන ලදී.

**ලයිබීරියාවෙන් වෙන්වූ දරුවන්ගේ රැකවරණය පිළිබඳවූ විකල්ප ප්‍රමිතීන්**

මෙය වසර 2000, දෙසැම්බර් මස ජගත් රතුකුරුස සංවිධානය, ළමා සුරැකුම - එක්සත් රාජධානිය, යුනිසෙෆ් සහ සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතින්ගේ තානාපතිවරයා විසින් සකස් කරන ලදී. මෙම ප්‍රමිතීන් ආරම්භයේදී ලිඛිතව සකස් කරන ලද්දේ සියරා ලියෝන්හි, වෙන්වූ දරුවන් කේන්ද්‍ර කොටගෙනය. මෙවැනි වෙන්වූ දරුවන් සඳහාවූ විකල්ප ආරක්ෂක / සුරැකුම් ක්‍රම ස්ථාපිත කිරීමේදී අනුගමනය කල යුතු ප්‍රමිතීන් මෙන්ම සංකල්පය සහ නිර්වචනයන් විස්තර කෙරේ. අවහැන්වූ පරිසරයක, විවිධ සන්ධර්භයන් තුළ මෙම ප්‍රමිතීන් සුදුසු පරිදි උපයෝගිකරගත හැක. මීට අමතරව මෙම නිර්නායකයන් විසින් අනුගමනය කළයුතු ක්‍රියා මාර්ග සහ නිවැරදි ලෙස පසු විපරම් කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ දැනුම ලබාදේ. (ළමා භාරකරු පාලක කණ්ඩායමේ සහයෝගය මත ළමා ආරක්ෂ ඒජන්සි මෙය අනුගමනය කල යුතුවේ.)

## උපකාරක මෙවලම්

**තනිවූ සහ වෙන්වූ දරුවන් පිළිබඳව, අන්තර් සංවිධාන සඳහාවූ උපදේශාත්මක ප්‍රතිපත්තීන්.**

ලොවපුරා වෙසෙන තනිවූ සහ වෙන්වූ දරුවන් සමඟ ක්‍රියා කිරීමේදී අන්තර් සංවිධාන අනුගමනය කළ යුතු ක්‍රමවේදයන් පිළිබඳ පරිපූර්ණ නවතම උපදේශාත්මක ප්‍රතිපත්ති මාලාව වසර 2003 දී කෙටුම් පත් කරන ලදී. වෙන්වූ සහ තනිවූ දරුවන් වෙනුවෙන් 1995දී ස්ථාපිත කරනලද අන්තර් සංවිධාන ක්‍රියාකාරී කණ්ඩායම් මෙම ප්‍රතිපත්ති මාලාව තවදුරටත් වැඩිදියුණු කළේය. මෙම ප්‍රතිපත්තීන් ජගත් මානව හිමිකම් නීතිය, සරණාගතයින් සහ මානව හිතවාදී නීතිය මත පදනම් වුවකි. වෙන්වූ දරුවන් පිළිබඳ ගන්නාවූ තීරණ සහ ක්‍රියා මාර්ගයන් සියල්ලම දරුවාගේ ආරක්ෂාව සහතික කරන රාමුවක් තුළ සිදුවිය යුතු අතර, පවුල් ඒකකය ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තියට ගරුකිරීම සහ සරණාගත දරුවන් සඳහාවූ ජගත් කොමිසම, සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතින්ගේ සභාපතිවරයා, යුනිසෙෆ්, ජගත් රතුකුරුස සංවිධානය, ළමා සුරැකුම - එක්සත් රාජධානිය සහ වර්ල්ඩ් විෂන් ජාත්‍යන්තර ආයතනයේ සාමුහික ප්‍රයත්නයක ප්‍රතිඵලයකි. එමෙන්ම තනිවූ සහ වෙන්වූ දරුවන් වෙනුවෙන් ක්‍රියාකරන සියලූ දෙනාම පිළිපැදිය යුතු ප්‍රතිපත්තියකි මෙය.

## අවශ්‍ය කියවීම් සහ පරිශීලන:

- ළමා අයිතින් පිළිබඳ පොදු සම්මතය - http://www.unicef.org/crc/crc.htm
- ARC 2001 ළමුන්ගෙ අයිතින් සඳහා ක්‍රියාකාරිවීම (ARC)
- SCF-UK, UNHCR, OHCHR UNICF එකාබද්ධ මුල් පිරිම
- Save the Children Fund/UK 1994 පවුල් හඳුනා ගැනිම සඳහා යහ පුරුදු මං ලන්ඩන්. SCF/UK
- Save the Children Alliance. 2000 ළමුන්ගේ අයිතින්, සමාන අයිතින් ද? විවිධත්වය, වෙනස සහ වෙනස්කම් කිරීමේ කරුණු ලන්ඩනය. Save the Children Alliance
- Save the Children Alliance. 1999 ළමා අයතින්, අලංකාරොක්තියේ යථාර්ථය? ළමුන්ගේ අයිතින් පිළිබඳ එක්සත් ජාතින්ගේ පොදු සම්මතය මුල් දස වසර: ලන්ඩනය: Save the Children Alliance
- පවුල් හඳුනා ග 1994 - සරණාගත දරුවන්, සත්කාරය සහ ආරක්ෂාව පිළිබඳ නිර්නායක. ජිනිවා UNHCR
- UNHCR/NGO Partners 2001 සරණාගතයින් සුරකිම රාජ්‍ය නොවන සංවිධාන සඳහා ක්ෂේත්‍ර මං පෙන්වීම ජිනවා - UNHCR & NGO Partners
- UNHCR 2003 - රැකවරණය සඳහා න්‍යාය පත්‍රය
- අප්පාර්ඩ්, සැන්ඩ් සහ සි පෙට්. 1998 දෙමාපියන්ගෙන් වෙන්වු දරුවන් සමග වැඩ කිරිම ක්ෂේත්‍ර මං පෙන්වීම. ලන්ඩනය Save the Children - UK
- යංග්, එම්. ඊ. 2002. මුල් ළමා වියේ සිට මානව සංවර්ධනය තෙක් USA The World Bank
- Save the Children - 2002 HIV සහ ගැටුම්: ද්විත්ව හදිසිය
- IASC 2003 හදිසි පසුබිම් තුළ HIV / Aids සඳහා මැදිහත්වීම වල නිර්නායක (www.unaids.org හි ඇත.)

- www.unhcr.ch
- www.unicef.org
- www.hrw.org/campaigns/refugees
- www.child-soldiers.org
- www.icrc.org
- www.theirc.org
- ww.savethechildren.org.uk
- www.unaids.org

## වෙන්වූ සහ තනිවූ දරුවන් සඳහා වූ විකල්ප රැකවරණ පසුවිපරම් ආකෘති පත්‍රය.

**වෙන්වූ සහ තනිවූ දරුවන් සඳහා වූ විකල්ප රැකවරණ පසුවිපරම් ආකෘති පත්‍රය.**

**ළමයා පිළිබඳ විස්තර**

1. FTR සංකේතය :__________ 2. UNCHR සංකේතය : ____________

3. ළමයාගේ මුල් නම :__________ 4. වාසගම :__________ 5. වයස :___

6. ලිපිනය : කඳවුර :__________ අදියර :__________ කූටිය :____

7. ස්ථානය පිළිබඳ: තාවකාලික සංක්‍රාන්ති කුටි හදාවඩාගැනීම ස්වාධීනව පිවත්වීම

| **නිරීක්ෂණ** | **ගත්ක්‍රියාමාර්ග** | **දිනය** |
|---|---|---|
| පෞද්ගලික සුරුකුම/රැකවරණ | | |
| සෞඛ්‍යය<br>දරුවාගේ පෙනුම? (උදා: නිරෝගි, රෝගි, වෙනත්)<br>දරුවා පීඩාවට පත්වී තිබේද? | | |
| දරුවා පාසල / ක්‍රියාකාරකම් සඳහා දක්වන ආකල්පය<br>දරුවාට නිරතුරුව පාසල්යෑමට / නිපුණතා පුහුණුවට සහභාගිවීමට අවකාශ තිබේද? දරුවාගේ ඉදිරිපත්වීම කෙසේද? | | |
| වෙනත් දරුවන් / අසල්වැසියන් / ආරක්ෂාව ලබා දෙන්නන් සමග දරුවාගේ සම්බන්ධතාව<br>අනෙකුත් කණ්ඩායම් සමඟ / අසල්වැසියන් / ආරක්ෂකයින් සමඟ දරුවාට මනා සම්බන්ධතාවක් තිබේද? | | |
| වෙනත් නිරීක්ෂන | | |

8. දරුවාගේ නම සහ අත්සන ______________ 9. ස්ථානය/දිනය_____

10. රැකවරණය ලබා දෙන්නාගේ නම සහ අත්සන ____________________

11. සංවිධානය ________________________________

12. අධීක්ෂකයාගේ නම සහ අත්සන _______________________

13. වාර්තාව භාරදෙන දිනය __________________

**අවපතනය කිරීමට මෙතැන ක්ලික් කරන්න : ඇමුණුම B**

## ඇමුණුම B

## වෙන්වූ සහ තනිවූ බාලවයස් දරුවන් සඳහා වූ සමාජ සේවා විකල්ප රැකවරණ පසුවිපරම් ආකෘති පත්‍රය

**දරුවා පිළිබඳ විස්තර**

1. FTR සංකේතය ———————————— 2. UNHCR සංකේතය——————————————

3. ළමයාගේ මුල්නම ———————————— 4. වාසගම ——————————————————

5. උපන් දිනය—————————— 6. වයස———————— 7. ස්ත්‍රී/පුරුෂ————————

8. වත්මන් ලිපිනය කඳවුර ——— අදියර ———————— කුටිය————————————

9. ස්ථානය සංක්‍රාන්ති කුටි හදාවඩා ගැනීම ස්වාධීනව ජීවත්වීම කවදා සිටද? දිනය————

10. දැනට ළමයාට රැකවරණය දෙන පුද්ගලයා/ පුද්ගලියන්ගේ නම ———————————————

11. පැමිණි අවසාන දිනය— — — — — —

12. අවසාන දිනයේ ඉදිරිපත් වූ යෝජනා පිළිබඳ ගත් තීරණ——————————————————
——————————————————————————————————————
——————————————————————————————————————
——————————————————————————————————————

| නිරීක්ෂණ (ප්‍රශ්න පහත දැක්වේ) | | යෝජනා |
|---|---|---|
| **සාමාන්‍ය පෙනුම**<br>නිවස තුළ/සමාජය තුළ: දරුවා සතුටින්ද/ක්‍රියාශීලිද/කල්පනාකාරිද? (භාරකාර මව්පියන් /අසල්වැසියන් / සමාජයෙන් / ඉදිරිපත් වූ අදහස් මත) | | |
| **සෞඛ්‍යය**<br>දරුවාගේ පෙනුම කෙසේද? (උදා: නිරෝගී/රෝගී/වෙනත්) රෝගී තත්වයක් පිළිබඳ දරුවා පවසා තිබේද? දරුවාට තුවාල වී තිබේද? | | |
| **අධ්‍යාපනය**<br>දරුවාට නිරතුරු පාසල්යාමට / නිපුණතා පුහුණුවට සහභාගිවීමට අවකාශ තිබේද?<br>පාසලේ/නිපුණතා පුහුණු ස්ථානයේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න?<br>දරුවා නිවස තුල ඉටුකරන වැඩ?<br>විනෝදාත්මක ක්‍රීඩාවන්වල නිරතවෙනවද? | | |
| **සමාජ සමෝධානය**<br>තම කණ්ඩායම් / අසල්වැසියන් සමග දරුවාට මනා සම්බන්ධයක් තිබේද?<br>දරුවා යම්කිසි සමාජ කණ්ඩායමකට අයත්වේද?<br>සමාජය තුල දරුවාගේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් වේද? | | |
| **පවුල/නිවස හා සම්බන්ධතාව**<br>හදාවඩාගන්නා මව්පියන්/නිවැසියන් සමග දරුවාට මනා සම්බන්ධතාවක් තිබේද?<br>නිවස/පවුල තුල දරුවාගේ ආරක්ෂාවට ප්‍රශ්න තිබේද?<br>දරුවා වධහිංසාවට පත්වීමට අවකාශ තිබේද? | | |

13. දරුවාගේ අත්සන ______________ 14. ස්ථානය/දිනය ________

**අවපතනය කිරීමට මෙතන ක්ලික් කරන්න : ඇමුණුම C**

## ඇමුණුම C

## තනිවූ/වෙන්වූ බාලවයස් දරුවන් සඳහා රැකවරණ දීමේ විකල්පක්‍රම පිළිබඳ පසුවිපරම් ආකෘති පත්‍රය

**ළමයා පිළිබඳ විස්තර:**

1. FTR සංකේතය__________ 2. UNCHR සංකේතය : __________

3. ළමයාගේ මුල් නම__________ 4. වාසගම__________ 5. වයස__________

6. දරුවාගේ වත්මන් ලිපිනය කඳවුර__________ අදියර__________ කුටිය__________

7. ස්ථානය: සංක්‍රාන්ති කුටි හදාවඩාගැනීම ස්වාධීනව ජීවත්වීම කවදා සිටද දිනය__________

| නිරීක්ෂණය (ප්‍රශ්න පහත දැක්වේ) | ගත් ක්‍රියාමාර්ග | දිනය |
|---|---|---|
| පෞද්ගලික සුරැකුම/රැකවරණය | | |
| **සෞඛ්‍යය**<br>දරුවාගේ පෙනුම? (උදා: නීරෝගී, රෝගී, වෙනත්)<br>දරුවාට තුවාල සිදුවී තිබේද?<br>දරුවාට වෛද්‍ය ප්‍රතිකාර/ආරෝග්‍යශාලාවට යොමුකළ යුතුවේද? | | |
| **දරුවා පාසැල/ක්‍රියාකාරකම් සඳහා දක්වන ආකල්පය**<br>දරුවාට නිරතුරුවම පාසලට / නිපුණතා පුහුණුවට යොමුවිය හැකිද?<br>සහභාගීත්වය කෙසේද? නිවසේදී අධ්‍යාපන කටයුතුවල නිරතවේද?<br>ඔහුට / ඇයට අධ්‍යාපන කටයුතුවලදී පවුලෙන් සහයෝගය ලැබේද? | | |
| **අනෙකුත් දරුවන්/අසල්වැසියන් / රැකබලා ගන්නන් සමග මනා සම්බන්ධතාවක් දරුවාට තිබේද?**<br>හදාවඩාගන්නා මව්පියන් / අනෙකුත් කණ්ඩායම් / අසල්වැසියන් / රැකවරණය දෙන්නන් සමග දරුවාට මනා සබඳතාවක් තිබේද? | | |
| **වෙනත් නිරීක්ෂණයන්**<br>අමතර සුබවාදී / අසුබවාදී හැසිරීම් රටාවන් පිළිබඳ විස්තර තිබේද? | | |

8. දරුවාගේ නම සහ අත්සන :__________ 9. ස්ථානය / දිනය :__________

10. රැකවරණ ලබාදෙන්නාගේ නම සහ අත්සන :__________ 11. සංවිධානය :__________

12. අධීක්ෂකයාගේ නම සහ ලිපිනය :__________

13. වාර්තාව භාරදෙන දිනය :__________

**අවපතනය කිරීමට මෙතන ක්ලික් කරන්න : වෙන්වූ සහ තනිවූ දරුවන් හදාවඩාගැනීම සඳහා යොමුකිරීමේදී එළඹෙන ගිවිසුම**

# වෙන්වූ සහ තනිවූ දරුවන් හදාවඩාගැනීම සඳහා යොමුකිරීමේදී එළඹෙන ගිවිසුම

1. ------------------ පිහිටි ------------------ ආයතනය, පූර්ණවූ සමාජයීය තක්සේරුවකින් අනතුරුව ---------------- මයාගේ / මියගේ රැකවරණය යටත්ව -------------------------- ස්ථානගත කිරීමට පුරවැසිභාවය ----------- ජාතිය ------ වයස ---- ස්ත්‍රී / පුරුෂ භාවය. -- ස්ථානගත කිරීම - කඳවුර -------- අදියර ---- කුටිය-- --

2. භාරදීම සිදුවුයේ ----------------------------------
මහතා / මහත්මිය බැඳී සිටිනවා :------------------------------

(අ) භාරගන්නා දරුවාට / දරුවන්ට තමන්ගේම දරුවන් සේ සැලකීමටත්, ඔවුන්ගෙන් ආර්ථික, පෞද්ගලික හෝ වෙනත් කිසිදු ලාභ ප්‍රයෝජනයක් ලබා නොගැනීමටත්.

(ආ) යම් කිසි අවස්ථාවක දරුවාගේ / දරුවන්ගේ දෙමාපියන් හෝ පවුලේ කෙනෙකු දරුවා / දරුවන් භාර ගැනීමට ඉදිරිපත්වු විටදී කිසිදු ප්‍රශ්නයකින් තොරව දරුවා / දරුවන්ව නැවත පැවරීම.

(ඇ) දරුවා / දරුවන්ට අවශ්‍ය නිසි අධ්‍යාපනය, පෝෂණය, වෛද්‍ය පහසුකම් සහ ආදරය කරුණාව ලබා දීමට.

(ඈ) පදිංචි නිවස, ස්ථානය හෝ ප්‍රදේශය වෙනස් කරනවා නම් ඒ පිළිබඳව කල්වේලා ඇතිව අදාළ ආයතන දැනුවත් කරවීමට.

(ඉ) අවශ්‍යතාවක් මතුවූ විටකදී අදාළ ආයතන / ප්‍රජානියෝජිතයන්ගෙන් අවශ්‍ය උපදෙස් සහ මගපෙන්වීම් ලබා ගැනීම.

3. ආයතනය / ඒජන්සිය බැඳී සිටිනවා :

(අ) හදාවඩගන්නා පවුලට අවශ්‍ය සහයෝගය සහ පහසුකම්, සමාජ සේවකයින් / ප්‍රජා වැඩ කටයුතු ආදිය මගින් ස්ථිර පදනමක් මත සිදුකෙරෙන නිරන්තර අධීක්ෂණය තුළ ලබාදීම (ගිවිසුමෙම් 2 වන වගන්තියට අනුකූලව)

(ආ) දරුවා / දරුවන්ගේ දෙමාපියන් හෝ කිට්ටුම ඥාතින් සොයා ගැනීම සඳහා දියත්කර ඇති වැඩපිළිවෙළේ ප්‍රගතිය පිළිබඳ, හදාවඩාගන්නා පවුල දැනුවත් කිරීම.

(ඇ) දරුවාට නිසි සැලකිලි නොලැබෙන බවට වාර්තාවු / ඔප්පුවු අවස්ථාවකදී දරුවාව එම ස්ථානයෙන් / පවුලෙන් ඉවත් කිරීම.

4. මෙම ගිවිසුම දරුකමට හදාවඩා ගැනීමේ ගිවිසුමක් නොවේ. තාවකාලික රැකවරණය ලබාදෙන ගිවිසුමකි. දරුවා / දරුවන්ගේ නියම පවුල සොයාගැනීමට කටයුතු කරන කාලය තුළදී දරුවා / දරුවන්ට තාවකාලිකව පවුලක රැකවරණය දීම පමණි.

5. දරුවා / දරුවන්ව පවුලකට පැවරීමට ගන්නාවු තීරණය, හදාවඩාගැනීමට ඉදිරිපත්වු පවුලත්, එම ආයතනයත්, දරුවා / දරුවන්ගේ පරම යහපත වෙනුවෙන් ගත යුතුය.

6. අනාගතයේදී සිදුවිය හැකි ප්‍රධාන වෙනස්කම් / වැඩි දියුණු කිරීම් ආදියට අදාළව මෙම ගිවිසුමේ කොන්දේසි සංශෝධනය විය හැක.

7. මෙම ගිවිසුමට අනුව පෙරදී මෙන් මතුවටද දරුවා / දරුවන්ව හදාවඩාගැනීමට ඉදිරිපත්වන පවුල් දැක්විය යුතු රැකවරණය සහ සහයෝගය පිළිගැනීමට සහ ඇගයීමට ලක් කෙරේ.

අත්සන් කළේ ———————————— සහ ————————————
(කැපකරු මාපිය/මාපියන්) (ආයතනයේ සමාජ සේවක)

———————————— සහ ———————————— අත්සන් කරන ලද්දේ.
(ප්‍රජා නියෝජිතයෙක්) (ආයතන අධීක්ෂක)

———————————— දිනය ————————————

අත්සන් කල දින සිට ගිවිසුමට බැඳෙන අතර ක්‍රියාත්මක වේ.

## අවපතනය කිරීමට මෙතන ක්ලික් කරන්න : ලයිබීරියාවෙන් වෙන්වූ දරුවන් සඳහා විකල්ප රැකවරණ සැපයීමේ ප්‍රමිතීන්

# ලයිබීරියාවෙන් වෙන්වූ දරුවන් සඳහා විකල්ප රැකවරණ සැපයීමේ ප්‍රමිතීන් [1]

### හැඳින්වීම.

වසර 2002 දී ලයිබීරියානු සටන් උග්‍රතත්වයකට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙස 50,000 සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ තානාපතිවරයා දෙසැම්බර් 2002 - UNHCR) කට අධික ලයිබීරියානු සරණාගතයෝ ආරක්ෂාව පතා සියරාලියෝනයට පැමිණියහ. මේ තත්ත්වය යටතේ දරුවන් විශාල සංඛ්‍යාවක් තම පවුල්වලින් වෙන්වී ඇත. සමීක්ෂණයන්ට අනුව ලයිබීරියානු ළමයින් 502 ක් පමණ පවුල්වලින් වෙන්වී ඇත. එම පවුල් සොයා [2] නැවත දරුවන් පවුල සමග එකතු කිරීම සහ දරුවන්ට විකල්ප රැකවරණ සේවාවන් ලබාදීම වැනි කටයුතු සිදුවෙමින් පවතී.

විකල්ප රැකවරණ සේවාවන් කිහිපයක් ඇත. හදිසි මාරුකිරීම් සිදුවන අවස්ථාවලදී රැකවරණ කුටිවල නැවැත්වීම, හදාවඩාගැනීම, සහ ස්වාධීනව ජීවත්වීමයි.

### 11. නිර්වචනය කිරීම / අර්ථ දැක්වීම.

වයස අවුරුදු 18 අඩු ළමයින් / බාලවයස්කාරයින් සියලු දෙනාම මිනිසුන් ලෙස සැලකීම.

වෙන්වූ දරුවන් ලෙස අර්ථ දැක්වෙන්නේ මව සහ පියා දෙදෙනාගෙන්ම වෙන්වූ හෝ නීතිමය හෝ සම්මතය අනුව රැකවරණය සැලසුවන්ගෙන් හෝ වෙන්වූ දරුවන් මිස ඥාතීන්ගෙන් වෙන්වුවන් නොවේ. එමනිසා වෙනත් වැඩිහිටි ඥාතියෙකුගේ ඇසුරට මේ දරුවන් පත්කළ හැක.

තනිවූ බාලවයස්කාර දරුවන් සේ අර්ථ දැක්වෙන්නේ දෙමාපියන්ගෙන් සහ ඥාතීන්ගෙන් වෙන්වූ මෙන්ම නීතියෙන් හෝ සම්මතයෙන් කිසිවෙකු ඔවුන්ගේ රැකවරණය සඳහා බැඳී නොමැති දරුවන්ය.

### විකල්ප රැකවරණ සංවිධානය කරන්නේ කෙසේද?

- සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ තානාපතිවරය සහ යුනිසෙෆ් ආයතනය මගින් ළමයින්ට ආරක්ෂාව සලසන ඒජන්සි / ආයතන, සැම සරණාගත කඳවුරක සහ අතරමග පිහිටුවා ඇති නවාතැන් පලවල්වල පවත්වාගෙන යයි.
- වෙන්වූ දරුවන් පිළිබඳ, වෙන්වූ පවුල් පිළිබඳ සොයාබැලීම, නැවත දරුවන් හා පවුල ඒකරාශී කිරීම, විකල්ප රැකවරණ සැපයීම සහ දරුවාගේ ආරක්ෂාව පිළිබඳව බැදුනු ප්‍රශ්න ආදිය සම්බන්ධයෙන් කඳවුරුවල ජීවත්වන ප්‍රජාව තුළ සංවේදී බවක් ඇති කරවීම.
- ආරම්භයේ සිටම ප්‍රධාන ක්‍රියාකාරී කොටස් සම්බන්ධකර ගැනීම. උදා:- නායකයින්, ආගමික කණ්ඩායම්, සංවර්ධන කමිටු සහ වෙනත් එවැනි ක්‍රියාකාරී කොටස්.
- ළමා සුබසාධක කමිටුවක් පිහිටුවා ගැනීමට අවශ්‍ය සහයෝගය දීම.

---

(1) සකස් කරන ලද්දේ වසර 2002 දී ජගත් රතු කුරුස සංවිධානය, ළමා සුරැකුම එක්සත් රාජධානිය, යුනිසෙෆ් සහ සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සරණාගත තානාපතිවරය විසින්ය.

(2) බරපතල නොවන අවස්ථාවන්හිදී විශේෂ අවසරයක් මත හැරෙන්නට, උපරිම සීමාවන් සැලකිල්ලට ගනිමින්, පවුල් සෙවීමේ කටයුතුවලදී කිට්ටුම හෝ ලේ ඥාතීන් සමග ජීවත් නොවන දරුවන් පමණක් සැලකිල්ලට ගැනේ.

- රැකවරණ ලබාදෙන්නන්ගේ තනතුරට සුදුස්සන් තේරීමේදී ළමා සුබසාධක කමිටුවල සහ ප්‍රජානායකයින්ගේ උපදෙස් ලබා ගැනීම.
- ළමා රක්‍ෂක ආයතන මගින් පහත දැක්වෙන අර්ථ දැක්වීමට අනුව, රැකවරණය ලබාදෙන්නන් සම්මුඛ සාකච්ඡාවට සහ පරීක්‍ෂාවට ලක් කළ යුතුවේ.
- දරුවාට ඇසුරු කළ හැකි අසල්වැසියකු හඳුන්වාදී, එමගින් දරුවාගේ ආරක්‍ෂාව තහවුරු කෙරෙන අතර, මෙය ළමා ආරක්‍ෂක ආයතනයේ සමාජ සේවකයින්ගේ වගකීම වේ.
- සුදුසු වාර්තා සහිත පෞද්ගලික ලිපිගොණුවක් සෑම දරුවෙකුටම විවෘත කිරීම. (උදා :- පවුල සෙවීම පිළිබඳ වාර්තා, කැපකරු මාපිය විස්තර, සමජ සේවකයින් පැමිණෙන වාර ගණන) මෙම සියලු ලිපිගොනු සුරක්‍ෂිතව කඳවුරු තුළ හෝ බෝ/කෙනෙමා කාර්යාලයේ තැන්පත් කර තිබෙන අතර, මෙම ලිපිගොණු ලබාගත හැක්කේ යුනිසෙෆ් ආයතනය, ළමා ආරක්‍ෂක ඒජන්සියට, සහ සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතින්ගේ තානාපතිවරයාට පමණි.
- කඳවුර තුළ කායශාලයක් පවත්වාගෙන යෑමට අවශ්‍ය ඉඩකඩ ළමාආරක්‍ෂක ඒජන්සියට ලබාදීම.

## 4. හදිසි අවස්ථාවකදී ස්ථානගත කෙරෙන තාවකාලික නවාතැන් කුටිවල ආරක්‍ෂාව [3]

**නිර්වචනය :** මෙය තාවකාලික විසඳුමකි. ස්ත්‍රී පුරුෂ භාවයට අනුව දරුවන් වෙන්කොට හදිසි අවස්ථාවක් මත තාවකාලිකව නවාතැන් දීම. නැවත දරුවන්ව ඔවුන්ගේ පවුල්වලට යොමුකරවන තුරු සහ විකල්ප රැකවරණයකට පවරනතුරු මෙම තාවකාලික රැඳවුම් කුටිවල ස්ථානගත කෙරේ. එමෙන්ම ගැහැනු දරුවන්ට කාන්තාවන්ගේ රැකවරණයද, පිරිමි දරුවන්ට පිරිමි පක්‍ෂයේ රැකවරණයද පැය 24 පුරාම ලැබෙනු ඇත. කෙසේවෙතත් පවතින ව්‍යුහයට අනුව මෙම දරුවන් දෙසතියකට වඩා කාලයක් මෙසේ රඳවාතිබීම නොකළ යුතුය.

හදිසි අවස්ථාවකදී තාවකාලික නවාතැන් කුටිවල ස්ථානගත කරන දරුවන් පිළිබඳ උපමාන :
සරණාගත කඳවුරකට හෝ අතර මඟ පිහිටුවා ඇති ස්ථානවලට පැමිණෙන සරණාගත දරුවෙකු ක්‍ෂණිකව හදාවඩාගැනීමේ රැකවරණයකට යොමු නොවේ. එසේ සිදුවුවහොත් හදාවඩාගැනීමේ රැකවරණය පිළිබඳ පහත දැක්වෙන ප්‍රමිතින්ට අනුකූල විය යුතුය. පීඩාවට ලක්වූ සමහර දරුවන් (උදා: අබාධිතවූ සහ ලිංගික අතරවරයට පත්වූ) ඔවුන්ගේ විශේෂිතවූ අවශ්‍යතාවයන් සපුරා ගැනීමේ ප්‍රමුඛත්වය මත ක්‍ෂණික හදාවඩාගැනීමේ රැකවරණයකට යොමු කළ යුතුවේ.

හදිසි අවස්ථා යටතේ දරුවන් තාවකාලික රැඳවුම්හල්වල ස්ථානගත කිරීම පිළිබඳ ක්‍රියාපටිපාටිය.

- **ළමාකඳවුරු පාලකයින් සමග එක්ව, මෙම රැඳවුම්හල් ගැහැනු / පිරිමි දරුවන්ට වෙන් වෙන් වශයෙන් නිර්මාණය කළ යුතුවේ.**
- **සරණාගත කඳවුරකට හෝ අතර මග පිහිටුවා ඇති මධ්‍යස්ථානයකට පැමිණෙන දරුවන්ව, ඔවුන්ගේ දෙමාපියන්ටහෝ පවුලට, එසේත් නැතිනම් හදවඩාගැනීමේ රැකවරණයකට ක්‍ෂණිකව යොමුකිරීමට නොහැකිවූ අවස්ථාවකදී, එවැනි දරුවන් මෙම තාවකාලික රැඳවුම්හල්වල ස්ථානගත කල යුතුය.**
- එකම පවුලේ දරුවන් එකට තැබීමේ ක්‍රමය පිළිගත්තද, වයස අවුරුදු 12 ඉක්මවූ, එකම පවුලට අයත් වුවද, ස්ත්‍රී පුරුෂ භාවයට අනුව වෙන් කළ යුතු වේ. මෙහිදී දරුවන්ට ඇතිවිය හැකි අවදානම් තත්ත්වයන්ට සාපේක්‍ෂකව, දරුවන්ගේ අදහස් සැලකිල්ලට ගනිමින්, මෙවැනි අවස්ථාවන් පිළිබඳ වෙන් වෙන් වශයෙන් විශ්ලේෂණය කළ යුතුවේ. ඒ අනුව යොදගත් විශේෂ වැඩපිළිවෙළකට අනුව කුඩා පිරිමි ළමුන්ට සිය සහෝදරියන් සමග කාන්තා රැඳවුම්හල්වල එකට ජීවත් වීමට අවසරය තිබේ.

---

**(3) විශාල පිරිසක් ඇතුළත්වූ අවස්ථාවකදී, වැඩිහිටියන්ද මෙම රැඳවුම් හල්වල ස්ථානගත කිරීමට සිදුවේ. මෙවැනි අවස්ථාවලදී පිළියමක් වශයෙන් ගැහැනු දරුවන් කාන්තා මූලික නිවෙස්වල ස්ථානගත කිරීම එක් පියවරකි. එසේත් නැතිනම් මෙම රැඳවුම්හල් තුළ තාවකාලික වෙන්කිරීම් ඉදිකළ යුතුවේ.**

- හඳුනාගැනීමේ සහ ස්ථානගත කිරීමේ වගකීම පැවරෙන්නේ සරණාගත කඳවුරුතුළ පිහිටි ළමා ආරක්‍ෂක ඒජන්සි වෙතය.

මෙවැනි තාවකාලික රැඳවුම්හල්වල ස්ථානගත කෙරෙන දරුවන්ගේ අධීක්‍ෂණය පිළිබඳ, රැකවරණ ලබාදෙන්නන්හට පනවා ඇති නිර්නායක.
රැකවරණයන් දීමට අපේක්‍ෂා කරන වැඩිහිටියන් පහත දැක්වෙන නිර්නායකයන් පිළිපැදිය යුතුය.

- තනිවූ බාලවයස් කරුවන්ගේ අභිවෘද්ධිය ප්‍රවර්ධනය කිරීම.
- මනාවූ මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් පසුවීම.
- දරුවන්ගේ අවශ්‍යතාවයන් හඳුනාගැනීම සහ ඒවා නිසි පරිදි සපුරාගැනීම පිළිබඳව මනා අවබෝධය.
- තනිවූ දරුවන්ට මානුෂික හැඟීමකින් යුතුව රැකවරණය දීමට ඇති කැමැත්ත.
- ළමා ආරක්‍ෂක ඒජන්සියේ අපේක්‍ෂාවන්ට අනුව දරුවන්ට, ගුණාත්මක මෙන්ම නියමිත පැය ගණනක රැකවරණ සේවාව ලබාදීමට හැකිවීම.
- දරුවන් සේ සලකා, දරුවකුට අවශ්‍යවන පරිදි ආදරය සහ සුරක්‍ෂිතතාවය ලබාදීම.
- ඔහු/ඇය නිවසින් පරිබාහිරව රැකවරණ සැපයීමේ කාර්‍යයන්හි නිරතවන අවස්ථාවන්හිදී, තම පවුලේ දරුවන්ට මෙන්ම නිවස අවට ජීවත්වන ආපදාවට ලක්වූ පුද්ගලයින්ට අවශ්‍ය රැකවරණය ලබාදීමට තිබිය යුතු සම්පත් සහ නිපුණත්වය තමාට ප්‍රමාණවත් යන්න පිළිබඳව [4]
- දරුවන්ට වධහිංසා කිරීම පිළිබඳ චෝදනා එල්ලවූ හෝ දැනට එවැනි චෝදනාවන්ට ලක් නොවීම.
- ලයිබීරියානු සරණාගතයකු වීම හෝ දැනට කඳවුරක වාසය කරන්නෙක් වීම.
- සියරා ලියෝන්හි මානව හිතවාදී සහ සංවර්ධන ක්‍රියාවන්හි නිරතවූවන්, ප්‍රජාවට සහ ප්‍රතිලාභීන්ට වගකිවයුතුව ඇති ප්‍රමිතීන් අවබෝධකරගැනීම, පිළිගැනීම සහ ඒවා වෙනුවෙන් ලිඛිතව කටයුතු කිරීමට යොමුවීම. (කරුණාකර ඇමුණුම A බලන්න)
- තනිවූ බාල වයස්කාර දරුවන් සඳහා ස්ථිර විකල්ප රැකවරණයක් සැලසීම හෝ නැවත පවුල සමග සම්බන්ධකිරීම පිළිබඳව අවබෝධයකින් යුතුව, ඒ සඳහා පරිශ්‍රමයක් දැරීම.

හදිසි අවස්ථා යටතේ දරුවන්ට තාවකාලික රැඳවුම්හල්වල ස්ථානගත කිරීම පිළිබඳ ක්‍රියා කරන සෑම ආයතනයක්ම, රැකවරණ සපයන පුද්ගලයින් සමග කිට්ටු සබඳතාවක් ගොඩනගා ගැනීම අවශ්‍යවේ. විශේෂයෙන්ම අවශ්‍ය සේවාවන් සහ දිරිගැන්වීම් පිළිබඳ සම්පව ක්‍රියා කළ යුතුවේ. සහන සේවකයින්ට ලබාදෙන පුහුණුව සහ සහයෝගය හේතුවෙන් රැකබලාගන්නා දරුවන්ගේ ආරක්‍ෂාව සහ මනාව ඇතිදැඩි කිරීම තහවුරු කෙරේ. මෙම ඒජන්සිවලට අනුයුක්ත සමාජ සේවකයින් දිනපතාම පාහේ සහන සේවකයින් සහ දරුවන් හමුවී, ඔවුන්ට අවශ්‍ය සහයෝගය ලබා දෙමින්, පසු විපරමක යෙදේ.

## හදිසි අවස්ථාවලදී ලබාදෙන තාවකාලික රැකවරණයේ කාලසීමාව

හැකි ඉක්මනින් දරුවන්ව සාමාන්‍ය තත්වයට පත්කොට, සරණාගත ප්‍රජාව හා සම්බන්ධ කිරීමේ අවශ්‍යතාව මත දෙසතියකට වඩා වැඩි කාලයක් දරුවන්ව ඉහත රැකවරණයේ නොතැබිය යුතුය. [5] මෙම කාලය තුළදී දරුවාගේ පවුල සොයාගැනීමට ක්‍රියාත්මක විය යුතු අතර, වෙනත් විකල්ප රැකවරණ ක්‍රමද සැලසුම් කළ යුතුය.

---

(4) මෙම තත්වය සහතික කිරීම සඳහා ළමා ආරක්‍ෂක ඒජන්සි එම පවුල් අධීක්‍ෂණය කළ යුතුවේ.

(5) ස්වාධීනව ජීවත්වීමට යොමුවූ දරුවන්ට, නිවසකට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට ඇති පහසුකම් මත, ඔවුන් එසේ ජීවත්වන කාලය වෙනස් විය හැක.

## මෙම රැඳවුම් කුටිතුළදී දරුවන්ට ලබාදෙන සහයෝගය

- ළමා ආරක්ෂක ඒජන්සිවල නියුතු සමාජ සේවකයින් විසින් මෙම දරුවන්ට අවශ්‍ය ආහාර නොවන වෙනත් ද්‍රව්‍යයන් කුමක්දැයි හඳුනාගැනීම සහ ආහාර නොවන එම ද්‍රව්‍ය සලාක ක්‍රමයකට අනුව ඔවුන්ට ලබා දීම කළ යුතුවේ. (6)
- සමාජ සේවකයින් විසින් මෙම දරුවන්ව, ප්‍රජා ක්‍රියාකාරකම්වල යෙදවීම සහ අවශ්‍ය පසුබිම සකස් කරදීම. උදා: අධ්‍යාපනය, නිපුනතා පුහුණුව, විනෝදාත්මක ක්‍රීඩාවල යෙදීම සහ ශාරීරික හා මානසික ක්‍රියාකාරකම්වල නිරත වීම.
- මෙම දරුවන් නිසි පරිදි, සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතින්ගේ තානාපතිවරයා සමග ලියාපදිංචි කරවීම සහ ඒ අනුව අවශ්‍ය සරණාගත හැඳුනුම්පතක් සහ සලාක කූපනයක් ලබාදීම.
- මෙම දරුවන්ට දෛනිකව දියර ආහාර ලබාදීම.
- මෙම තනිවූ බාල වයස්කාර දරුවන්ට ඇයගේ / ඔහුගේ හිමිකම්, අයිතීන්, වගකීම් සහ කඳවුරු තුළ බලපවත්නා අතුරු නීති පිළිබඳව දැනුවත් කරවීම.
- කඳවුරු වෙනුවෙන් පත්ව සිටින ඒජන්සි මගින් අධ්‍යාපන පහසුකම් සැපයේ. නමුත් ළමා ආරක්ෂක ඒජන්සි, සෘජුවම, මෙම දරුවන්ව පාසැලට ඇතුලත් කිරීමට සහ අවශ්‍ය අධ්‍යාපනික මෙවලම් ලබාදීමට කටයුතු කළ යුතු වේ.
- ප්‍රජා මෙහෙයවන්නන් විසින් මෙම බාලවයස්කාර දරුවන්ව, ප්‍රජා මුල විනෝද කටයුතුවලට සහ සංස්කෘතික වැඩසටහන්වල යොමුවීමට උනන්දු කළ යුතුය.
- දරුවන් සඳහා වෛද්‍ය පහසුකම් කඳවුර තුළ සැපයේ. නමුත් නියම කර ඇති බෙහෙත් වල ප්‍රමාණය සහ සංයුතිය පිළිබඳව විශේෂයෙන් සොයා බැලීම ළමා ආරක්ෂක සේවාවන්හි කාර්ය භාරය වේ. මීට අමතරව දරුවාට නියැමිත වේලාව අනුව නියමිත බෙහෙත් ප්‍රමාණය ලැබෙනවාද යන්න පිළිබඳවත්, දරුවාට අමතර පෝෂ්‍යදායි ආහාර අවශ්‍යද යන්න පිළිබඳවත්, දරුවාගේ නිවසටම ගොස් සොයා බැලීම් කළ යුතුවේ. හදිසියේ උද්ගතවන තත්වයන් යටතේ, කඳවුරු තුළ ඇති සෞඛ්‍ය සේවාවන් ප්‍රමාණවත් නොවුනහොත්, බාහිර ප්‍රතිකාර සඳහා දරුවන්ව යොමු කළ යුතුවේ. එමෙන්ම නේවාසිකව, බාහිර ප්‍රතිකාර ගන්නා අවස්ථාවකදී දරුවා සමග රාත්‍රිය ගත කිරීමට, ඔහුට කෑම කැවීම, නෑවීම ආදිය සඳහා වෙනමම පුද්ගලයෙක් අනුයුක්ත කළ යුතුවේ.

## අධීක්ෂණය

- ළමාරක්ෂක ඒජන්සියේ අධීක්ෂකයින් අවම වශයෙන් සතියකට වරක් හෝ මෙම තාවකාලික රැඳවුම් ස්ථාන කරා යායුතුය.
- ළමාරක්ෂක ඒජන්සියේ සමාජ සේවකයින් මෙම රැඳවුම් ස්ථානවලට දිනපතාම යායුතුවේ.
- රැකවරණය සපයන්නන් සහ දරුවන්ව අවම වශයෙන් සතියකට දෙවරක් හෝ සමාජ සේවකයින් හමුවී, මෙම ස්ථානගත කිරීම් පිළිබඳ අධීක්ෂණය කොට ඔවුන්ට අවශ්‍ය සහයෝගය ලබාදිය යුතුය.
- රැකවරණ සපයන මෙම ස්ථානවලට දිනපතා ගොස් සතියේ අධීක්ෂණයක් පිළිබඳව අදාළ ආකෘති පත්‍රය සම්පූර්ණ කොට සතිය අවසානයේදී භාරදිය යුතුවේ. (ඇමුණුම B)
- ළමාරක්ෂක ඒජන්සියේ සමාජ සේවකයින් සමාජසේවා කටයුතු පිළිබඳ අධීක්ෂණය කොට දෙසතියකට අදාළ ආකෘති පත්‍රය සම්පූර්ණ කළ යුතුවේ. (ඇමුණුම C)

---

(6) දත්ත වලට අනුව මෙම වෙනත් ද්‍රව්‍ය සඳහා මෙට්ට, ඇඳ, ඇතිරිලි ආදිය අඩංගු වේ.

- මෙම දරුවන් බාධා රහිතව අධ්‍යාපන කටයුතුවල නිරතවනවාද යන්න සොයා බැලීම පිණිස ළමා රක්‍ෂක ඒජන්සියේ සාමාජසේවකයින් ගුරුවරුන් සමග සම්පව ක්‍රියා කළයුතුවේ.
- ළමාරක්‍ෂක ඒජන්සි මේ සියලු කටයුතු පිළිබඳ මාසික වාර්තාවක් සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතින්ගේ තානාපතිවරයාට සහ එක්සත් ජාතින්ගේ ළමා අරමුදලට ඉදිරිපත් කළ යුතුය.

## හදාවඩා ගනිමින් රැකවරණ දීම

නිර්වචනය : තනිවූ බාලවයස්කාර දරුවන් තාවකාලික දෙමාපියන්ගේ රැකවරණයට පත්කිරීම මින් අදහස් කෙරේ. මෙවැනි ළමයින් නැවත පවුල හා සම්බන්ධ කරන තුරු නැතහොත් දරුවා වැඩිහිටියකු බවට පත්වනතුරු හෝ දරුකමට හදාවඩා ගැනීමට බාරගන්නා තුරු මෙම රැකවරණයේ පසුවේ. කෙසේ වෙනත් මෙම ළමයින්, දරුකමට හදාවඩාගැනීමට පැවරීමේ තීරණයට එළඹිය යුත්තේ ඔවුන්ගේ දෙමාපියන්, නෑදෑයින් සහ පවුල සොයාගැනීමට හැකි සැම උත්සාහයක්ම ගැනීමෙන් අනතුරුවය එමෙන්ම එය ඉටුවිය යුත්තේ ජාත්‍යන්තර ජාතික සහ පිළිගත් සම්ප්‍රදායික ප්‍රමිතින්ට අනුකූලවය. සරණාගත දරුවන්ගේ ආරක්‍ෂාව සහ රැකවරණයට අදාළව සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතින්ගේ තානාපතිවරයා විසින් සකස් කොට ඇති උපදෙස් සහ ප්‍රමිතින් වෙත අවධානය යොමු කරන්න ළමා කඳවුරකට හෝ අතරමගවූ මධ්‍යස්ථානයකට පැමිණෙන තනිවූ බාලවයස්කාර දරුවන්, ස්වාධීනව ජීවත්වීමේ ක්‍රියාපටිපාටියට එකග නොවන තීරණාත්මක අවස්ථාවන්හිදී හදාවඩා ගැනීම සඳහා යොමු කළ හැක.

## දරුවන්ව හදාවඩා ගැනීමේ රැකවරණයකට යොමුකිරීම හා බැඳුනු ක්‍රියාමාර්ග

- හදාවඩා ගැනීමේ පවුල් සම්බන්ධයෙන් පවතින ක්‍රියාපටිපාටින්ට අනුකූලව හදාවඩා ගැනීම සඳහා පවුල් තොරාගත යුතුවේ.
- එකම පවුලේ දරුවන් හදාවඩාගැනීම සඳහා වෙන් වෙන් පවුල්වලට යොමු නොකිරීම.
- දරුවන්ව ස්ථානගත කිරීමට පෙර හදාවඩාගන්නා මව්පියන්ට පුහුණුවක් ලබාදීම.
- ළමාරක්‍ෂක ඒජන්සිවල අනුදැනුම ඇතිව පවුල් සොයාගැනීමේ සහ දරුවන් ස්ථානගත කිරීමේ වගකීම පැවරෙන්නේ හදාවඩාගැනීමේ රැකවරණ සපයන කමිටුවලටය. (ළමා සුභසාධක කමිටුවල කොටසකි)
- ස්ථානගත කිරීමට ප්‍රථම පවුල් තෝරාගැනීම සහ සේවාකාල වාර සඳහන් ලේඛනයක් පිළියෙලු කිරීම අවශ්‍යවේ.
- ළමාරක්‍ෂක ඒජන්සිවල නියුතු සමාජ සේවකයින් ප්‍රථමයෙන්, තෝරාගත් පවුල් ජිවත්වන නිවසේ තත්වය පිරික්සිය යුතු අතර පවුලේ සියලුම සාමාජිකයින් දරුවකු රැකබලා ගැනීම පිළිබඳ මනාපයක් හෝ එකගතාවයක් පළකරනවාද යන්න සහතික වීම.
- අවස්ථාවක් තිබේනම් දරුවාව ස්ථානගත කිරීමට පෙර එම පවුල් සහ මව්පියන් සමග සහ සම්බන්ධතාවක් ඇතිකරවීමට කටයුතු කිරීම.

හදාවඩා ගැනීමට ඉදිරිපත්වන පවුල් සඳහා ප්‍රමිතින් [7] දරුවන් හදාවඩා ගැනීමට කැමැත්ත දක්වන වැඩිහිටියන් සහ නිරායාසයෙන් සිදුවන හදාවඩාගැනීම් විධිමත්ව සැලසුම් කරන පුද්ගලයින් අනිවාර්යෙන් හදිසි තාවකාලික රැඳවුම් හි ස්ථානගත කෙරෙන දරුවන්ගේ අධීක්‍ෂණය පිළිබඳ ළමාරක්‍ෂක සේවකයින්ට පනවා ඇති නිර්ණයන් පිළිපැදිය යුතුවේ. එමෙන්ම එකම ජනවාර්ගික කණ්ඩායමකට සහ ජාතියකට අයත්වීම අවශ්‍යතාවයට අනුව හඳුනාගත හැකි වෙනත් සුදුසු මාරුවීම් කිරීම මෙම ප්‍රමිතින්ට අයත්වේ.

(7) හදාවඩාගැනීම සඳහා වූ අයදුම් පත්‍ර සම්පූර්ණ කළ යුතුවේ. (ඇමුණුම D)

## හදාවඩා ගැනීම සඳහා වූ කාලය

හදාවඩා ගැනීමේ රැකවරණය මත දරුවකු තැබීමේ කාලය තීරණය වන්නේ දරුවාගේ නියම දෙමාපියන් හෝ ඥාතීන් සොයාගෙන දරුවා හා පවුල නැවත එක්කිරීමේ කාර්යක්ෂම බව සහ පවුල මෙන්ම ප්‍රජාව මේ සම්බන්ධයෙන් මැදිහත් කරුවන් වශයෙන් දක්වන උනන්දුව සහ ක්‍රියශීලිබව මතය.

## දරුවන්ට සහ හදාවඩා ගන්නා පවුල්වලට ලබාදෙන සහයෝගය.

- තනිවූ බාලවයස්කාර දරුවන්ට හිමි ආහාර සලාකයන් නියමිත පරිදි සැපයේද? ඒවා නිසිලෙස පරිභෝජනයට ගැනේද? යන්න පිළිබඳව ළමාරක්‍ෂක ආයතනවල සමාජ සේවකයින් සහ සරණාගතයින් පිළිබඳ වූ එක්සත් ජාතින්ගේ තානාපතිවරයා සහතික වීම.

- ළමාරක්‍ෂක ආයතනවල සමාජ සේවකයින් සහ සරණාගතයින් පිළිබඳවූ එක්සත් ජාතින්ගේ තානාපතිවරයා විසින් මෙම ළමයින්ට අවශ්‍ය ආහාර නොවන අනෙකුත් භාණ්ඩ එනම් පැදුරු ඇතිරිලි ආදිය පිළිබඳව සොයා බලා ඒවා නිසිලෙස බෙදා හැරීම.

- දරුවා හදාවඩා ගැනීමට පැවරෙන පවුලේ තත්වය පිළිබඳ තක්සේරුවක් කොට දරුවාට අවශ්‍ය ආහාර නොවන වෙනත් භාණ්ඩ ප්‍රමාණවත් ලෙස සැපයීම. මෙය ළමාරක්‍ෂක ආයතනවල සමාජ සේවකයින්ගේ වගකීමයි. කෙසේ වෙතත් හදාවඩා ගන්නා පවුල සතු භාණ්ඩ ප්‍රමාණය ඉක්මවා යන පරිදි වැඩිප්‍රමාණයක් භාණ්ඩ දරුවා වෙනුවෙන් නිකුත් නොකළ යුතුවේ.

- දරුවන් හදාවඩා ගැනීමේ රැකවරණ කටයුතුවලට සම්බන්ධ සියලුම ආයතන විසින් දරුවන් හදාවඩා ගනිමින් රැකවරණය ලබාදෙන පුද්ගලයින් එකරාශිව කැපකරු මාපිය සංගමයක් පිහිටුවා ගැනීම සඳහා දිරිගැන්වීම. නිරන්තරයෙන් මෙම සංගම්වල රැස්වීම් පවත්වා අමතර ආදායමක් උපයාගත හැකි මාර්ග සෙවීම ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම වැනි කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම.

- දරුවා නැවත සිය දෙමාපියන් සමග සම්බන්ධකරන අවස්ථාවන්හිදී ඊට ප්‍රථමයෙන් හදාවඩාගත් දෙමාපියන්ගේ මානසිකතත්වය සකස් කිරීම.

- තනිවූ බාලවයස්කාර දරුවන් සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතින්ගේ සභාපතිවරයා සමග නිසිලෙස ලියාපදිංචි කරවීම, සහ හැඳුනුම්පතක් මෙන්ම ආහාර සලාක කූපන්පතක් ලබාදීම.

- සෑම බාලවයස් කාර දරුවෙකුම ඔහුට/ඇයට හිමි වරප්‍රසාද, අයිතිවාසිකම්, ඔවුන් සතු වගකීම් මෙන් කඳවුර තුළ ක්‍රියාත්මකවන අතුරු නීතිරීතින් පිළිබඳව දැනුවත් කළ යුතුය.

- වෙන්වූ සෑම දරුවෙක්ම මෙහි දැක්වෙන ක්‍රියාකාරකම්හි නිරතවනවාද යන්න පිළිබඳව ළමා ආරක්‍ෂක ආයතනවල සමාජ සේවකයින් සහතික කළ යුතුවේ. ක්‍රියාකාරකම් :- අධ්‍යාපනය, නිපුණතා පුහුණුව, මානසික සමාජයීය ක්‍රියාකාරකම් සහ විනෝදාත්මක ක්‍රියාකාරකම්.

- ප්‍රජා මෙහෙයවන්නන් විසින් මෙම බාලවයස්කාර දරුවන්ව ප්‍රජාමූල විනෝද කටයුතුවලට සහ සංස්කෘතික වැඩසටහන් වලට යොමුවීමට උනන්දු කරවීම.

- කඳවුර වෙනුවෙන් යොමු කොට ඇති ආයතන අධ්‍යාපනය සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙනු ඇත.

- හදාවඩා ගන්නා දරුවන් සඳහා අවශ්‍ය වෛද්‍ය පහසුකම් කඳවුර තුළදී සැපයේ. නමුත් හදිසි අවස්ථාවලදී, අවශ්‍යතාවයට අනුව ප්‍රමාණවත් වෛද්‍ය පහසුකම් කඳවුර තුළ සැපයීමට නොහැකිවූ විට, බාහිරව පවත්වාගෙන යන ප්‍රජා මූල සෞඛ්‍ය සේවාවන්ගෙන් සහයෝගය ලබාගැනීමට ආයතනයට හැකි වේ.

**අධීක්ෂණය**

- ළමා ආරක්ෂක ඒජන්සිවල සමාජ සේවකයින් විසින්, මුල්මාසය තුලදී සතිපතාත්, ඉන් අනතුරුව විශේෂ කරුණක් නොමැතිනම්, දෙසතියකට වරක් බැගිනුත් අධීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කළයුතුවේ. සෑම අධීක්ෂණ වාරයකදීම, ඒ සඳහාවූ ආකෘති පත්‍රය (ඇමුණුම C) නිසි ලෙස පුරවා, දරුවාට අදාළ ලිපිගොනුවට ඇතුලත් කළ යුතුය.

- ළමා සුබසාධක කමිටු හෝ කැපකරු මාපිය සංවිධාන සමග ළමා ආරක්ෂක ඒජන්සියේ සමාජ සේවකයිකු මසකට වරක් හෝ රැස්වීමක් පවත්වා හදාවඩා ගැනීමේ රැකවරණයට කළ යොමු කිරීම් පිළිබඳ විශ්ලේෂණයක් කිරීම අවශ්‍ය වේ.

- ළමා ආරක්ෂක ඒජන්සිවල සමාජ සේවකයින් දරුවාට ලබාදෙන රැකවරණය පිළිබඳවත්, දරුවාට යම් කිසි වධ හිංසාවක් පමුණුවනවා නම් ඒ පිළිබඳවත් වාර්තා කිරීමට ළමා සුබසාධන කමිටු හා කැපකරු මාපිය සංවිධාන දිරි ගැන්වීම. අනතුරුව රහස්‍යභාවය රැකීම පිළිබඳ සුදුසු ක්‍රියාමාර්ගයන්ට අනුකූලවන පරිදි මෙම තොරතුරු එක්සත් ජාතින්ගේ ළමා අරමුදල වෙත සහ සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතින්ගේ තානාපතිවරයා වෙත දැනුම් දෙනු ලැබේ.

- හදාවඩා ගැනීමේ රැකවරණය සඳහා යොමුකර ඇති දරුවන්ගේ සුරක්ෂිතභාවය පිළිබඳ ගැටලුවක් මතුවූ විටදී, දරුවා එම භාරකාරත්වයෙන් මුද ගැනීම වැනි සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට ළමා ආරක්ෂක ආයතනවල සමාජ සේවකයින්ට ළමා සුබසාධක කමිටුවලට සහ කැපකරු මාපිය සංවිධානවලට හැකි වීම.

- දරුවන්ව වධහිංසාවලට ලක්වූ අවස්ථාවක් පිළිබඳව හෝ සුරා කෑමකට ගොදුරුවූ අවස්ථාවක් පිළිබඳව හෝ අතපසුවීමකට භාජනයවූ අවස්ථාවක් පිළිබඳ වාර්තා කිරීමේදී, කඳවුරු තුළදී මේ සඳහා උපයෝගි කරගන්නා සම්මත වාර්තා ක්‍රමය අනුගමනය කල යුතුය.

- **මෙම සියලු කටයුතු පිළිබඳව මාසික වාර්තාවක් ළමා ආරක්ෂ ඒජන්සිය විසින් සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතින්ගේ තානාපතිවරයා සහ එක්සත් ජාතින්ගේ ළමා අරමුදලට සපයනු ලැබේ.**

## අධීක්ෂණය සඳහාවූ දර්ශකයන්

නිවසේදී

1. අධීක්ෂණය සඳහා ගිය අවස්ථාවේදී දරුවා තුළ තිබූ පෙනුම.
2. ඒ අවස්ථාවේදී දරුවාගේ හැසිරීම සහ දැක්වූ ආකල්පය.
3. කැපකරු මාපියන් සමග කළ සාකච්ඡාවන් සහ ප්‍රතිචාර
4. කැපකරු මාපියන් පිළිබඳව දරුවා සමග කළ සාකච්ඡාවන් සහ ප්‍රතිචාර.
5. දරුවාගේ සහ සම්බන්ධතාවය
    - හදාවඩාගන්නා පවුල සමග
    - සමාන කණ්ඩායම් සමග

- ප්‍රජාව/අසල්වැසියන් සමග
- සමාජ සේවකයින් සමග

6. දරුවාගේ සෞඛ්‍ය තත්වය.
7. සමාන කණ්ඩායම්වල සහ අසල්වැසියන්ගේ ප්‍රතිචාර.

පාසැලේදී / නිපුණතා පුහුණු වියේදී

1. පැමිණීම.
2. පංතියේ වැඩ කටයුතු / අධ්‍යාපන කටයුතු
3. පාසැලේදී හැසිරෙන ආකාරය.
4. පාසැලේ සමාන කණ්ඩායම්වලින් ලැබෙන තොරතුරු
5. ඇගයීම්වල ප්‍රතිඵල
6. ගුරුවරයා ගේ / පුහුණු කරුගේ ප්‍රතිචාර.

## 5. ස්වාධීනව ජීවත්වීම

**නිර්වචනය :** සරණාගත කඳවුරක් තුළ තනිවම ජීවත්වන දරුවන් මෙයින් හැඳින්වේ. මෙම දරුවන් (15 - 17 වයසැති සහ ඊට අඩු) තනිවම හෝ තමන්ගෙන් යැපෙන්නන් සමග හෝ වෙනත් වැඩිහිටි දරුවන් සමඟ හෝ ජීවත්වෙති. අවම සහයෝගය සහිත, ස්වයං පාලනයක් කරගත හැකි දරුවන් ලෙස මෙම දරුවන්ව සැලකේ. මොවුන්ට අවශ්‍ය සහයෝගය ලබාදීමත්, ඔවුන් පිළිබඳ පසුවිපරමක යෙදීමත් ළමා ආරක්ෂක ඒජන්සිවල සමාජ සේවකයින් විසින් සහ පත් කරන ලද රැකවරණ සලසන්නෙක් විසින් ඉටු කෙරේ.

ස්වාධීනව ජීවත්වීම සම්බන්ධයෙන් වු නිර්නායකයන් : වැඩිහිටි දරුවකු ස්වාධීනව ජීවත්වීම සඳහා යොමු කිරීමේදී සහ කැපකරු මාපිය රැකවරණයකට යොමු කිරීමේදී පහත දැක්වෙන කරුණු පිළිබඳව ඇගයීමක් කිරීම ළමා ආරක්ෂක ඒජන්සි සමාජ සේවකයින්ගේ වගකීමකි.

- වයස අවුරුදු 15 - 17 අතර දරුවන්.
- ස්වාධීනව ජීවත්වීමට හෝ පවුලක රැකවරණය ලැබීමට දරුවා තුළ ඇති කැමැත්ත.
- මෑත කාලයකදී හෝ අතීතයේදී හෝ දරුවා අත්විදී කම්පනයන් පිළිබඳ විස්තර.
- ශාරීරික හෝ මානසික සැලීමක් පිළිබඳව දරුවා තුළ පෙන්නුම් කිරීමක් හෝ ප්‍රකාශ කිරීමක් තිබීම. (බියකරු සිහින දැකීම, විශේෂ වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය වීම)
- ස්වාධීන ජීවත්වීමේ හැකියාව පෙන්නුම් කරන, මුහුකුරාගිය තත්වයේ දරුවන් (උදා :- ආහාර පිළියෙල කර ගැනීමට හැකි, රෙදි පිළි සෝදාගැනීමට හැකි සහ වෙනත් කාර්යයන් කිරීමට හැකි)
- තමන්ටත්, තමන්ගේ දරුවන්ටත් රැකවරණය, තමන් විසින්ම සපයාගැනීමට හැකි මව්පදවියට පත් ගැහැනු දරුවන්.
- ගැහැනු දරුවන්ට ස්වාධීනව ජීවත්වීමට අවසරය දීම, අමතර අවදානම් තත්ත්වයන්ට හේතුවේ. එනම් ලිංගික අතවරයන්ට මුහුණ පෑම සහ ලිංගික සූරාකෑමට ගොදුරු විය හැකිය. (මේ සඳහා ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග සකස් විය යුතුය)
- සංස්කෘතික ගති පැවතුම්, සැලකිල්ලට ගනිමින් ගැහැනු දරුවන්ට, ස්වාධීනව ජීවත්විය හැකි ආරක්ෂිත වැඩපිළිවෙළක් සලසා දිය යුතුවේ.

*දරුවන්ට ස්වාධීනව ජීවත්වීමට යොමු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග.*

- එකම ලිංගිකත්වයට අයත්වන අවිවාහක දරුවන් සඳහා කාමර දෙකක් සහිත කුටියක් ලබාදීම.
- කඳවුරුවල පවතින නිත්‍ය ප්‍රමිතීන්ට අනුව, එක කාමරයකට දරුවන් දෙදෙනෙක් බැගින් සහ එක නිවහනකට දරුවන් හතර දෙනෙකු බැගින් ස්ථානගත කළ හැක. හැකි සෑම අවස්ථාවකදීම දරුවන්ට එකිනෙකා සමඟ ඇසුරු කිරීමට අවස්ථාව ලබාදීම. තමන්ගේ කාමරයේ සිටින අනිකුත් සඟයා සමඟ පමණක් ඇසුරු කිරීමේ තත්ත්වය මෙමගින් මග හැරේ.
- දරුවන්ට ගුණාත්මක බලපෑමක් ඇතිකරවීමට හැකියාවක් තිබෙන, කඳවුරුවල වාසය කරන පිරිස් සමඟ ඇසුරට දරුවා පත්කිරීම.
- කඳවුරුවලට සමීපව පිහිටි අසල්වැසි ළමා සුබසාධක කමිටු සහ සැපකරු මාපිය සංවිධාන හඳුනාගෙන ඒවා සමඟ සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම තුළින් දරුවන්ට අවශ්‍යවූ විටකදී රැකවරණය ලබාගත හැක.
- එකම පවුලේ දරුවන් වෙන් නොකළ යුතුය. වයස අවුරුදු 12ට වැඩි එකම ලිංගිකත්වයට අයත් නොවන දරුවන් මීට අයත් නොවේ. දරුවාගේ කැමැත්ත සහ ඔවුන් අයාලේ යෑමට ඇති ප්‍රවනතාවය සැලකිල්ලට ගනිමින් මෙම තත්ත්වයන් පිළිබඳව වෙන වෙනම අධ්‍යයනය කළ යුතුවේ.

ස්වාධීනව ජීවත්වන දරුවන්ට රැකවරණය දෙන්නන් විසින් පිළිපැදිය යුතු ප්‍රමිතීන් : ස්වාධීනව ජීවත්වන දරුවන්ට රැකවරණය දීමට ඉදිරිපත්වන වැඩිහිටියන් අනිවාර්යයෙන්ම සම්පූර්ණ කළයුතු ප්‍රමිතීන් වන්නේ. හදිසි තාවකාලික කුටිවල ස්ථානගත කරන දරුවන් සඳහා රැකවරණය සපයන්නන් විසින් අනුගමනය කළ යුතු ප්‍රමිතීන්මය.

*ස්වාධීනව ජීවත්වන දරුවන්ට දක්වන සහයෝගය*

- වෙන්වූ දරුවන් නිසියාකාරව සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ තානාපතිවර සමග ලියාපදිංචි කරවීම සහ ඔවුන්ට හැඳුනුම් පතක් සහ ආහාර ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා සලාක පතක් නිකුත් කිරීම ළමයින්ට ආරක්ෂාව සලසන ඒජන්සිවල සමාජ සේවකයින්ගේ වගකීමයි.
- සෑම බාල වයස්කාර දරුවෙකුටම ඔහුට/ඇයට හිමි වරප්‍රසාද, අයිතිවාසිකම්, වගකීම් සහ කඳවුරු තුළ ඇති නීති පිළිබඳව දැනුමක් ලබාදීම.
- ප්‍රජා ක්‍රියාකාරකම් සහ සංස්කෘතික වැඩසටහන් සඳහා මෙම බාල වයස්කාරීන්ව පොළඹවීම සහ යෙදවීම තරුණ ප්‍රජා මෙහෙයවන්නන් හරහා ඉටු කිරීම.
- කඳවුරට අනුයුක්ත කර තිබෙන ඒජන්සිය විසින් අධ්‍යාපනය සඳහා පහසුකම් සලසාදීම.
- මෙම දරුවන් සඳහා අවශ්‍ය වෛද්‍ය පහසුකම් කඳවුර තුළ සැපයේ. හදිසි අවස්ථාවකදී කඳවුරෙන් බැහැර වෛද්‍ය මධ්‍යස්ථානයකින් අවශ්‍ය වෛද්‍ය සේවාවන් ලබාගැනීමට ඒජන්සිය කටයුතු කිරීම. මෙහිදී කඳවුර තුළ ඇති වෛද්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවිය යුතුය.
- ළමා ආරක්ෂක ඒජන්සිවල සමාජ සේවකයින්, දරුවන්ට ආහාර නොවන වෙනත් ද්‍රව්‍ය නිසිලෙස ලැබෙනවාද යන්න පිළිබඳ පිරික්සිය යුතුය. එමෙන්ම අමතර ද්‍රව්‍ය වන දර සහ කුළුබඩු සැපයිය යුතුවේ.
- සමාජ සේවකයින් සහ රැකවරණ සපයන්නන් විසින් මෙම දරුවන්ට ජීවත්වීමට අවශ්‍ය කුසලතා වර්ධනය කළ යුතුය. එනම් ඉවුම් පිහුම් කිරීමට, රෙදි සේදීමට, සනීපාරක්ෂාව, මුදල් පරිපාලනය සහ විනෝදජනක ක්‍රීඩාවන් ආදියයි.

**පසුවිපරම.**

- සමාජ සේවකයන් විසින් සතියකට දෙවරක් මෙම දරුවන් පිළිබඳ පසුවිපරම් කොට දෙසතියකට වරක්, ඊට අදාළ ආකෘති පත්‍රය සම්පූර්ණ කළ යුතුවේ. මෙම පෝරම දරුවාට අදාළ ලිපිගොණුවට ඇතුළත් කළයුතුවේ (ඇමුණුම C)
- රැකවරණ සපයන්නන් දිනකට වරක් මෙම දරුවන් හමුවිය යුතුවේ. රැකවරණ සපයන්නන් සඳහා වූ පසු විපරම් ආකෘති පත්‍රය සම්පූර්ණ කොට දරුවාට අදාළ ලිපිගොණුවට ඇතුලත් කිරීම. (ඇමුණුම B)
- අවම වශයෙන් සතියකට දෙවරක්, තරුණ ප්‍රජා මෙහෙයවන්නන් මෙම දරුවන්ව හමුවිය යුතුවේ.

***පසුවිපරම සඳහාවූ දර්ශකයන්***

නිවසේදී

1. දරුවා මුණගැසුණු අවස්ථාවේදී ඔහුගේ පෙනුම.
2. දරුවාගේ හැසිරීම / ආකල්ප, දරුවා මුණගැසුණු අවස්ථාවේදී.
3. හදාවඩාගන්නා පවුලෙන් වෙන්ව දරුවා සමග කළ සාකච්ඡා සහ ප්‍රතිචාර.
4. දරුවාගේ සම්බන්ධතාව :
    - සමාන කණ්ඩායම්වල දරුවන් සමඟ.
    - අසල්වැසියන් / ප්‍රජාව සමඟ.
    - සමාජ සේවකයින් සමග
    - රැකවරණ සපයන්නන් සමඟ.

5. දරුවාගේ සෞඛ්‍ය තත්වය.
6. අසල්වැසියන්ගේ සහ සමාන කණ්ඩායම්වල ප්‍රතිචාර.

පාසැලේදී / නිපුණතා පුහුණුව ලැබීමේදී

1. පැමිණීම.
2. අධ්‍යාපන කටයුතු.
3. පාසැල තුළදී හැසිරීම.
4. සමාන කණ්ඩායම් වලින් ලබාගන්නා තොරතුරු.
5. ඇගයීම්වල ප්‍රතිඵල
6. ගුරුවරයා/පුහුණු කරුගේ ප්‍රතිචාර.

# 7 ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම.




ස්ත්‍රී පුරුෂ භාවය පදනම් වු (GBV) ප්‍රචණ්ඩත්වය සෑම සමාජයකම දැකිය හැකිය. වර්ගය, ආගම, සමාජ - ආර්ථික තත්ත්වයන්ගෙන් නිදහස්වු, ඡායාරූපය එඩුවාර්ඩ් කොම්තෙ වර්දගුවර්.

# පරිච්ඡේදය 7 : ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම.

## හැඳින්වීම.

ස්ත්‍රී පුරුෂභාවය (GBV) පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය යන වචනයෙන්, ලිංගික වධහිංසාවට සහ දූෂණයට වඩා පුළුල්වූ අරුතක් ආවරණය කෙරේ. මිනිසා අයත්වන විවිධ ආගම්/ජාති හා සමාජ ආර්ථික තත්වය කුමක් වුවද, මෙම ස්ත්‍රී පුරුෂ ප්‍රචණ්ඩත්වය මුළු මහත් සමාජය පුරාම පැතිර පවති. නමුත් විවිධ අවස්ථාවන්හිදී, සමහර පුද්ගලයින් මෙම වධහිංසාවන්ට වැඩි වශයෙන් ගොදුරුවීමක් දක්නට ලැබේ. කඳවුරු තුළ වාසය කරන රැඳවියන්ට සමාජයීය සහ ආර්ථික සහයෝගය, පවුලේ සහ ප්‍රජාවගේ රැකවරණය නොමැතිවීම නිසා ඔවුන් මුහුණපාන අනාරක්ෂිත තත්වය මත මෙවන් ප්‍රචණ්ඩත්වයන්ට ගොදුරුවීමේ වැඩි ප්‍රවනතාවක් ඇත.

## ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් (GBV) ප්‍රචණ්ඩත්වය නිර්වචනය කිරීම:

ස්ත්‍රීන්ට, ස්ත්‍රීභාවය නිසාත්, පුරුෂයින්ට පුරුෂභාවය නිසාත් මුහුණපෑමට සිදුවන විවිධ මට්ටමේ වධහිංසාවන් රැසක් (GBV) ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයන් ලෙස නිර්වචනය කළ හැක. මෙහිදී නිශ්චිත සමාජයීය භූමිකාවන් සැලකිල්ලට ගැනීම සහ එවැන්නවුන් තුළ ඇති අපේක්ෂාවන් පදනම් කර ගැනේ. මෙයට ඇතුලත්වන ප්‍රචණ්ඩත්වයන් රැසකි. එනම් ලිංගික ප්‍රචණ්ඩත්වය. කිට්ටුම සහකරු හෝ අඹු සැමියන් විසින් කරනු ලබන අතවර (ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයන්) චිත්තවේගී සහ මානසික අතවර, ලිංගික අපයෝජනය, බලහත්කාරයෙන් ගණිකා වෘත්තියෙහි යෙදවීම, ලිංගික සූරාකෑම, ලිංගික අතවර, හිංසාකාරී සංස්කෘතික හුරුපුරුදු (උදා කාන්තා ප්‍රජනන ඉන්ද්‍රියට සම්බන්ධව සිදුකෙරෙන ඡේදනය (FGM) බලහත් කාර විවාහයන්, බිළිඳු ගැහැනු දරුවන් ඝාතනය කිරීම) සහ ලිංගිකත්වය මත පදනම් වූ අසාධාරණකම් මෙසේ දැක්විය හැක. (1)

කෙසේ වෙතත් (GBV) ස්ත්‍රී පුරුෂ භාවය නිසා සිදුවන ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සඳහා කාන්තා ජීවිත බිලිවෙන අතර අපරාධකරු බවට පත්වන්නේ පුරුෂයෙක්ය. එමෙන්ම පිරිමින්ට සහ පිරිමි ළමයින්ට එරෙහිව ප්‍රචණ්ඩත්වයන් ප්‍රධාන වශයෙන් සිදු කරන්නේ පිරිමි පක්ෂයයි.

**ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමේදී, එහි ප්‍රධාන සංකල්පයන් පිළිබඳ මනා අවබෝධයක් සහ විග්‍රහයක් කළයුතුවේ.**

### ස්ත්‍රී පුරුෂභාවය: (Genders)

සමාජය විසින් තහවුරු කරන ලද විවිධාකාරවූ ගති ලක්ෂණයන් අනුව කාන්තාව සහ පිරිමියාව විග්‍රහ කොට ඇත්තේ ස්ත්‍රී පුරුෂ භාවය හෙවත් (Gender) යනුවෙනි. ලිංගිකත්වය යනුවෙන් හැඳින්වෙන්නේ ගැහැනියගේ සහ පිරිමියාගේ ජීව විද්‍යාත්මක ගති ලක්ෂණයන්ටය. එසේම නිශ්චිත සමාජ රටාවක් තුල ගැහැනිය සහ පිරිමියා දරණ සමාජයීය භූමිකාවන්ද, ස්ත්‍රී පුරුෂ භාවය යනුවෙන් හැඳින්වේ. මෙය තවදුරටත් විග්‍රහා කරන්නේ නම් කාන්තාව සහ පිරිමියා පිළිබඳව සාම්ප්‍රදායික වශයෙන් පිළිගත් ආකල්ප

1. ස්ත්‍රී පුරුෂ භාවය නිර්වචනය-බෙත් වැන් (2002), ස්ත්‍රී පුරුෂ භාවය පදනම් වූ හිංසනය, අවතැන් වූ ප්‍රජාවට සේවය කිරීමේ වැඩසටහන් වලින් මතු වූ කරුණු. 2001 සිට RHRC වලින් ද භාවිත කර ඇත.

සහ චර්යාවන් ඇතුලු, ඔවුන් සතු වගකීම්, වාසි සහ අවාසිදායක තත්ත්වයන්, පලදායී අවස්ථාවන් සහ සේවාවන් දැක්විය හැක. ස්ත්‍රී පුරුෂ භාවය නමැති භූමිකාව පිළිබඳව සමාජයක් හෝ සංස්කෘතියක් තුළ හඳුනාගත හැකි අතර එය වෙනස්වීම් වලට භාජනය විය හැක. ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ විශේෂ අවධානයකදී ඉස්මතුවන කරුණක් නම් කාන්තාවට, පිරිමියාට මෙන් සමාන වූ අයිතිවාසිකම් නොමැති අම්ල වූ සහ සාමාන්‍යයෙන් අවාසිදායක තත්වයන්ට ගොදුරු වන පිරිසක් බවයි.

මානව හිතවාදී සහයෝගිතාවේ දී සහ ඇහයීම් වැඩසටහන් වලදී කාන්තාවන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳ නිසි අවධානය නොලැබෙන බව විශාල වශයෙන් පිළිගැනේ. එබැවින් මානව හිතාවාදීව සහයෝගයදීමේ සන්දර්භයට අනුකුලවන පරිදි ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ප්‍රශ්න සාකච්ජා කිරීමේදී, විවිධ අවශ්‍යතාවයන් සහ රුචිකත්වයන් ගැන සිතීම, බලය පිළිබඳවූ අසමානකම් මෙන්ම ගැහැනිය සහ පිරිමියා තුළ ඇති අභ්‍යන්තර ගති පැවතුම් පිළිබඳවද නිසි සැලකිල්ලක් දැක්විය යුතුය.

## ශක්තිය/බලය (Power)

බලය අනිසි ලෙස යොදගැනීම ස්ත්‍රී පුරුෂභාවය තුළ දක්නට ලැබෙන ගති ලක්ෂණයකි. එමෙන්ම බලය සම්බන්ධයෙන් ගැහැනිය සහ පිරිමියා අතර සමාන තත්ත්වයක් නොතිබීම, විවිධ අපචාරයන්ට සහ අනිසි බලපෑම්වලට හේතුවේ. තවද බලය අසමානවීම නිසා සැමවිටම දුර්වල පුද්ගලයා ශාරීරික වධහිංසාවන්ට හෝ තර්ජනයන්ට ලක්විය හැක. බලය අනිසි ලෙස පාවිච්චි කරමින්. දුර්වල පාර්ශවයෙන් බලහත්කාරයෙන් ලිංගික ප්‍රයෝජනයන් ගැනීමද, ඒ වෙනුවෙන් යම් පොරොන්දුදීම ද, වාසි ලබාදීමට එකග වීමද ස්ත්‍රී පුරුෂ භාවය තුළ දක්නට ඇත. මෙම අසමානවූ බලය පිළිබඳ තත්වය සහ (HTV) වෛරසය පැතිරීම අතර නිතැතින්ම සම්බන්ධතාවයක් ඇත.

## ප්‍රචණ්ඩත්වය:

ප්‍රචණ්ඩත්වය යනුවෙන් හැඳින්වෙන්නේ සෘජුවම සිදුවන ශාරීරික, මානසික හෝ ලිංගික වධහිංසාවන් හෝ ඒනිසා අත්විදින වේදනාවන් සහ අඩන්තේට්ටම්/තර්ජනය කිරීමය. සෘජුවම ප්‍රචණ්ඩත්වය සේ සැලකිය නොහැකි තත්වයන් වන පුද්ගලයකු බලහත්කාරයෙන් නම්මා ගැනීම, තර්ජනාත්මක පොළඹවා ගැනීම සහ සිය අභිමතයට පටහැනිව කටයුතු කිරීමට ඔහු/ඇයට බලකිරීම වක්‍රව ප්‍රචණ්ඩත්වයට අයත් වේ. කාන්තාවන්, පුරුෂයින් පිරිමි ළමුන් සහ ගැහැනු දරුවන්, ස්ත්‍රී පුරුෂ භාවය තුල ප්‍රචණ්ඩත්වයට ගොදුරු වුවද, කාන්තාව සහ ගැහැනු දරුවා අසීමිත ලෙස ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙති. ස්ත්‍රී පුරුෂ භාවය මත වධහිංසාවලට භාජනය වන පුද්ගලයින් බොහෝවිට හැඳින්වෙන්නේ "නොනැසී ජීවත් වන්නේක් ලෙසිනි." මෙම පරිච්ජේදය තුළදී එම නාමාවලියම භාවිත කෙරේ.

## ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්වූ වධහිංසාව පිළිබඳ මගපෙන්වීමේ ප්‍රධාන ප්‍රතිපත්තීන්.

සියලුම කඳවුරු පාලක නිලධාරී මණ්ඩල මෙම ප්‍රතිපත්තීන් නිසිලෙස අවබෝධ කරගත යුතුවේ. පහත දැක්වෙන කරුණු මීට ඇතුළත් වේ.

- වධහිංසාවට භාජනයවූ පුද්ගලයාගේ රැකවරණය සහ ආරක්ෂාව තහවුරු කිරීම ප්‍රධාන වගකීමකි.
- එම පුද්ගලයාගේ අපේක්ෂාවන්ට, අයිතිවාසිකම්වලට සහ අභිමානයට නිරතුරු ගරු කිරීම.
- පුද්ගලයා පිළිබඳ සියලු තොරතුරු සහ ඔහුගේ හෝ ඇයගේ පවුලේ විස්තර පිළිබඳ රහස්‍යභාවය රැකීම. එමෙන්ම එම තොරතුරු දැනගතයුතු පුද්ගලයාගේ නිශ්චිත අවසරය සහ අනුදැනුම මත පමණක් සිදු විය යුතුය. මෙම තොරතුරු බෙදගතයුතු/අනාවරණය කළයුතු පුද්ගලයින්.
  - පොලිස් ස්ථානය.
  - ආරෝග්‍යශාලාව.
  - ආරක්ෂාව සැලසීම පිළිබඳ නිල නියෝගයක් සහිත ආයතනවල නිලධාරීන් (උදා: UNHCR UNICEF ) හෝ පීඩාවට පත්වූවන්ගේ අවශ්‍යතාවන් වෙනුවෙන් පෙනී සිටින ආයතන.
  - ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ කටයුතු කරන ආයතන.
  - සමාජ සුබසාධක අමාත්‍යාංශය.
- **රහස්‍යභාවය-** මින් අදහස් කෙරෙන්නේ සියලු තොරතුරුවල රහස්‍යභාවය රැකීමයි. ප්‍රචණ්ඩත්වයට පාත්‍රවූවන්ට සහයෝගය ලබාදීමේ අවශ්‍යතාව මත, මෙම තොරතුරු එවැනි පුද්ගලයින්ට හෝ ආයතනයන්ට අනාවරණය කිරීමට සිදුවූ විටදී ඒ සඳහා උක්ත පුද්ගලයාගේ එකඟතාවය ලබාගත යුතුවේ.
- **එකඟත්වය එලකිරීම -** මෙය අන්‍යොන්‍ය කැමැත්තය. එකඟත්වය පිළිබඳ දැනුම්දීම යනුවෙන් අදහස් කෙරෙන්නේ තමන්ගේ කැමැත්ත තේරීමට, විවෘතව සහ ස්වෙච්ඡාවෙන්, සමාන බලයක් ඇති පුද්ගලයෙකුට ලබාදීමට නමුත් ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන වධහිංසා එකඟත්වයකින් හෝ කැමැත්තකින් තොරව සිදුවේ. (වයස 18 න් පහල) දරුවන්ට, විවාහය, ලිංගික සම්බන්ධතාවන් පැවැත්වීම සහ ස්ත්‍රී ලිංගික අවයවයේ ඡේදනය කිරීම වැනි ක්‍රියාවන්ට එරෙහිව අකමැත්ත ප්‍රකාශ කල නොහැක.
- ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය, පුද්ගලයෙකුගේ පරම අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකි.
- කාන්තාවන්ට හිංසා පමුණුවන සාම්ප්‍රදායික පුරුදුවලට එරෙහිව අභියෝග කිරීමේදී සහ ඒ සඳහා ප්‍රවේශයක් ලබා ගැනීමේදී ගරුත්වයකින්, සංවේදීභාවයකින් සහ දැඩි අවධානයකින් යුතුව ක්‍රියා කළයුතුවේ.

**මූලාශ්‍රයන් :** UNHCR (2003) සරණාගතයන්ට එරෙහිව සිදුවන ලිංගික සහ ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වය, බාහිරයෙන් පැමිණෙන සහ අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්, වලක්වාලීම සහ ප්‍රතිචාර පිළිබඳ උපදෙස් : Bethvann (2002) ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වය, අවතැන්වූ ජනකොටස්වලට වැඩසටහන් දියත් කිරීමේදී උද්ගතවන මතභේදයට තුඩුදෙන කරුණු. ප්‍රජණන සෞඛ්‍ය පිළිබඳවූ සරණාගත සුසංධානය.

## කඳවුරු පාලක කණ්ඩායමේ වගකීම්:

ස්ත්‍රී පුරුෂභාවය නිසා ඇතිවන ප්‍රචණ්ඩත්වය පිළිබඳව කඳවුරු තුළ ක්‍රියා කිරීමේදී හෝ ආමන්ත්‍රණය කිරීමේදී, එම තත්වයන් ඇතිවීමට මුල්වූ හේතු සාධක සහ පාදකවූ සන්දර්භයන් මොනවාද යන්න පිළිබඳව මනා අවබෝධයක් තිබීම අවශ්‍යවේ. මෙවැනි තත්වයන් වලක්වාලීමේ ක්‍රියාපටිපාටින් අනුගමනය කළ හැක්කේ මෙම තත්වයන්ට හේතුවූ සාධක සහ බලපෑ වෙනත් කරුණු මනාව හඳුනාගැනීම සහ ඒ සම්බන්ධව සැලකිලිමත්වීම තුලිනි. ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ක්‍රියා කරන ආයතනයක් ඇතිව හෝ නැතිව වුවද, කඳවුරු පාලකයින් සතු මූලික වගකීම වන්නේ කඳවුරු සැලසුම් කොට නිර්මාණය කිරීමේදී, ප්‍රචණ්ඩත්වය වලක්වාලීමේ පියවරයන් ඇතුලත් කිරීමය. මීට අමතරව කඳවුර තුල පවත්වන සියලු ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ආරක්ෂාව ලබාදීම පිළිබඳ තක්සේරු කිරීමේ සම්පූර්ණ වගකීම කඳවුරු පාලකයින් සතුවේ. වැළැක්වීමේ ක්‍රියා මාර්ග වර්ධනය කිරීමේදී පිරිමින් මෙන්ම කාන්තාවන්ද හවුල් කරවා ගැනීම කඳවුරු පාලකයින්ගේ වගකීමකි. ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වය වැලැක්වීම සහ ඒ පිළිබඳ ප්‍රතිචාර දැක්වීමේදී HIV/AIDS තත්ත්වයන්ට සාපේක්ෂකව ගැහැනිය සහ පිරිමියා තුළ සංවේදීබවක් ඇතිකරවීම, ඉතාමත්ම වැදගත්වූ කරුණකි.



*තම දියණියගේ ඡායාරූපය අතැතිව සිටින එලිසා. මෙම වේච්නියානු ගැහැනු දැරිය වයස අවුරුදු 18 ද රුසියානු සොල්දදුවන් විසින් පැහැරගෙන ගොස්, දූෂණය කොට මරා දමන ලදි.*

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීම්

- කඳවුරු සැලැස්ම : මෙහිදී හැමවිටම කඳවුරේ ආරක්ෂක තත්වය පිළිබඳව සැලකිලිමත් විය යුතුවේ. විවිධ කණ්ඩායම්වල අවශ්‍යතාවන් සහ රුචිකත්වයන් විවිධාකාරවේ. එවැනි කඳවුරක පිහිටීම සැළසුම්කිරීමේදී සහ නිර්මාණය කිරීමේ කටයුත්තේදී කඳවුරේ සිටින සියලුම ගැහැනු, පිරිමි සහ දරුවන්ව සම්බන්ධ කර ගැනීම.

- සෙනග වැඩිවීම නිසා ඇතිවන තදබදය වලක්වාගැනීම : ප්‍රමාණය ඉක්මවීම නිසා ඇතිවින තදබදය සහ එකම නිවසේ පවුල් කිහිපයක් ජීවත්වීම වැළැක්වීම.

- පහසුකම්වලට යොමුවීමේදී ඇති ආරක්ෂක පියවර: සේවාවන් සැපයීමේදී, ඒ පිළිබඳ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව තහවුරු කිරීම. විශේෂයෙන්ම කාන්තාවන් සඳහා වෙනම වැසිකිළි සහ නා ගැනීමට ස්ථාන වෙන් කිරීම, එහි පෞද්ගලිකත්වය තහවුරු කිරීම. දැව එකතු කිරීමේ සහ බෙදා හැරීමේ ස්ථාන සහ ක්‍රීඩා පිට්ටනි ආශ්‍රිතවද සුරක්ෂිතභාවය පිළිබඳ තක්සේරුවක් කළ යුතුවේ.

- නිසිලෙස ආලෝකය (විදුලි) තිබීම : කඳවුර තුළ පිහිටි සියලුම මාර්ග සහ පහසුකම් සැපයෙන ස්ථාන සියල්ලක්ම සඳහා නිසි ලෙස විදුලි ආලෝකය ලබා දීමෙන්, ප්‍රචණ්ඩකාරී ක්‍රියා හෝ හිංසාවන් සිදුවීම වලක්වා ගත හැක.

- තනිවූ දරුවන් සඳහා වෙනමම නවාතැන් පහසුකම් සැපයීම : තනිවූ සහ වෙන්වූ ගැහැනු සහ පිරිමි දරුවන් කැපකරු මාපියන්ගේ භාරකරත්වයට යොමු කිරීමට පෙර, රඳවා තැබීම සඳහා වෙන් වෙන් වශයෙන් තාවකාලික කුටි සැලසුම් කිරීම. මෙම රැඳවුම් කුටි පිහිටි ස්ථානය සහ අවට පරිසරයේ සුරක්ෂිත භාවය පිළිබඳ සැලකිලිමත් විය යුතුවේ. විශේෂයෙන්ම වැසිකිළි සහ ස්නානය කරන ස්ථාන කරා ඇති දුර ප්‍රමාණය පිළිබඳව සැලකිලිමත් විය යුතුවේ.

## පසුබිම පිළිබඳ අවශ්‍ය දැනුම.

කඳවුරේ වාසය කරන පිරිස සහ ඔවුන්ගේ පසුබිම පිළිබඳ මනා අවබෝධයක් තිබීම අවශ්‍යම කරුණකි. මෙමගින් වඩාත් සුදුසුවූ වැලැක්වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ උපක්‍රම ස්ථාපිත කරගත හැක. මීට අමතරව අවතැන් වූවන් පිළිබඳ පෙර හා වත්මන් තත්ත්වයන් මෙන්ම කොන්දේසි පිළිබඳ දැනුවත්වීම තුළින් කඳවුරු පාලකයින්ට, ස්ත්‍රී පුරුෂභාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වය සහ සම්බන්ධ කළ හැකි විශේෂිත ආරක්ෂක ක්‍රම පිළිබඳ තේරුම් ගැනීමට සහ හඳුනාගැනීමට වඩාත් පහසුවේ.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීම්

- ***කඳවුරු පාලකයින් සතු මූලික වගකීම්:*** ජන කණ්ඩායම, තුලවූ පූර්ණ සංඛ්‍යාව පිළිබඳ දත්ත : කාන්තාවන්ට සාපේක්ෂකව පිරිමින්ගේත්, ගැහැනු දරුවාට සාපේක්ෂකව පිරිමි දරුවාගෙත් අනුපාතය සහ කාන්තාව ගෘහමූලිකත්වය දරණ නිවෙස් ප්‍රමාණයේ ප්‍රතිශතය දැනගැනීම සහ ඒ පිළිබඳ විමසුමක යෙදීම නිරන්තරයෙන්ම කඳවුරු පාලකයින් විසින් ඉටුකළ යුතුවේ.
- ***විශේෂ රැකවරණ අවශ්‍යතාවන්:*** ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට (GBV) ගොදුරුවීමට, වඩා වැඩි ප්‍රවණතාවක් ඇති පුද්ගලයින් සහ කණ්ඩායම් සඳහා විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍යවේ. කඳවුරු තුළ ජීවත්වන මෙම පුද්ගලයින් සහ කණ්ඩායම් හඳුනාගැනීමේ පහසුව සඳහා, රැකවරණ සපයන ඒජන්සිය/නිලධාරීන් සමග සම්බන්ධයකින් යුතුව කටයුතු කිරීම වැදගත් වේ. කඳවුරු පාලක කණ්ඩායම දැනුවත් කල යුතුය. එවැනි අවදානම් සහිතවූ කණ්ඩායම් පහත දැක්වේ.

  - තනිවූ සහ වෙන්වුණු දරුවන් (ගැහැනු/පිරිමි)
  - තනිවූ යෞවනියන්
  - හුදෙකලාවූ කාන්තාවන්/ගෘහමූලිකත්වය දරන කාන්තාවන්.
  - ආබාධිත කාන්තාවන් සහ ගැහැනු ළමයින් (ශරීරිකව/මානසිකව)
  - වයස්ගතවූ කාන්තාවන්.
  - ආබාධිත කාන්තාවන් සහ දරුවන්.
  - හමුදා සේවයේ සිටි කාන්තාවන් (5 පරිච්ඡේදය - රැකවරණ)

- ***පවතින සම්ප්‍රදයන් සහ කාන්තාව සහ පිරිමියා යතු භූමිකාවන්:*** ස්ත්‍රී පුරුෂ භාවය හා බැඳුණු භූමිකාවන්, සම්මතයන්, වටිනාකම්, පුරුදු සහ බලය, සම්ප්‍රදයන් වශයෙන් සරණාගත සහ අවතැන්වූ ප්‍රජාව අතර පවතින ආකාරය පිළිබඳව දැනුවත් වේ.

- ***සංක්‍රමණය හෝ පැමිණීම පිළිබඳව තොරතුරු ව්‍යාප්ත කිරීම/පතුරුවාහැරීම:*** මෙම පිරිස් සංක්‍රමණය වීමට පෙර සහ සංක්‍රමණය වන අවස්ථාවේදී පැවැති තත්වය පිළිබඳව කඳවුරු පාලකයින්ට මනාවූ අවබෝධයක් තිබීම වැදගත් වේ. සංක්‍රමණය වන, සංක්‍රමණය වීමට පෙර අවස්ථාවන් හිදී දූෂණය, ලිංගික අතවරයන්, අපචාරයට සහ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීමේ වැඩි ප්‍රවණතාවක් තිබේ. සරණාගත/අවතැන්වූවන් විවිධ අවස්ථාවන්හිදී මුහුණ දීමට සිදුවන නොයෙක් ආකාරයේ ලිංගික ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ මෙවලමක් මෙම පරිච්ඡේදයට ඇමුණුමක් වශයෙන් එක්කොට තිබේ.

## ආයතනික වශයෙන් ස්ථාපිත පියවරයන් :

(GBV ) ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට බොහෝවිට මුල්වන්නේ බලය/ශක්තිය එක හා සමාන නොවූ ස්වභාවයයි. කඳවුරු ප්‍රජාව සමග සැසඳීමේදී, මනාව සුබසාධනයේ යෙදෙන්නේ වැඩි බලතල සහිතවූ පිරිසකි. එමනිසා කඳවුරු පාලක නිලධාරී කණ්ඩායම විසින්, ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වයන් කඳවුරු තුළ සිදුවීම වැළැක්වීම සඳහා, කඳවුරු තුළ ක්‍රියාකාරී වෙනත් ඒජන්සි හා සමානවම කටයුතු කළ යුතු වේ.

- ***මෙහෙයවීම සඳහා වූ නීති සංග්‍රහය පිළිබඳ ප්‍රචාරය කිරීම සහ දැනුවත් වීම:*** UNHCR මෙහෙයවීම් පිළිබඳ නීති සංග්‍රහයේ, හරවත්වූ අගයන් සහ මහාපෙන්වීමේ ප්‍රතිපත්තීන් සියලුම UNHCR නිලධාරීන් අනුගමනය කල යුතුවේ. කඳවුරු ස්ථාපිත කිරීමේ සම කණ්ඩායමක් ලෙස ක්‍රියාත්මක කඳවුරු පාලක ඒජන්සි විසින් මෙම ප්‍රතිපත්තීන් අනුගමනය කිරීම සහ ඔවුන්ගේ ක්‍රියාකාරී නිලධාරීන් සියළු දෙනාම දැනුවත් කරවීම අවශ්‍ය වේ. රාජ්‍ය නොවන ආයතනයක් විසින් ( NRC - ජාත්‍යන්තර රතු කුරුස සේවාව) සැකසූ මෙවන් නීති සංග්‍රහයක් 5 වන පරිච්ඡේදයේ මෙවලමක් ලෙස ඇමුණුම් කොට ඇත. (5 වන පරිච්ඡේදය - රැකවරණය)

- ***හැසිරීම් සඳහාවූ නීති සංග්‍රහය වැඩිදියුණු කරමින් සම්පාදනය කිරීම :*** UNHCR සහ ජාතික රතු කුරුස සේවයේ හැසිරීම් සඳහාවූ නීති සංග්‍රහය (5වන පරිච්ඡේදයේ මෙවලම) පාදක කොටගනිමින් කඳවුරු පාලකයින් විසින් ඊට සමාන නීති පද්ධතීන් සම්පාදනය කොට, ඒවා IDP කඳවුරු පද්ධතිය තුල ක්‍රියාත්මක කිරීම සඳහා කඳවුරු පාලක කණ්ඩායම්, සියළුම ඒජන්සි, සහ කඳවුරු තුල සේවය කරන රාජ්‍ය නොවන ආයතන මෙන්ම ප්‍රජා නියෝජිතයින් පෙළඹවීම.

- ***කාන්තා නිලධාරිනියන්ගේ සහභාගිත්වය:*** කඳවුරු පාලක කණ්ඩායමට ප්‍රමාණවත් ලෙස කාන්තා නියෝජනයක් එක් කිරීම. අවම වශයෙන් 50% ක වත් කාන්තා නියෝජනයක් එක් කිරීම අරමුණක් විය යුතුය.

- ***පුහුණුවීම්:*** ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කොටගත් ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට සහ ප්‍රතිචාර දැක්වීමට නම් ප්‍රථමයෙන් ඒ පිළිබඳ දැනුම සහ අවබෝධය අවශ්‍ය වේ. එබැවින් හැකි සෑම අවස්ථාවකදීම කඳවුරු පාලක කණ්ඩායම්, මානව හිමිකම් පිළිබඳව, හැසිරීම් සඳහාවූ නීති පද්ධතීන් පිළිබඳව යන වගකිවයුතු ප්‍රමිතීන් පිළිබඳව පුහුණුවක් ලබා ගත යුතුවේ. එසේම මෙම මහාපෙන්වීමේ ප්‍රතිපත්තීන් උල්ලංඝණය කරන නිලධාරීන්ට විරුද්ධව විනයානුකූලව දඬුවම් පැමිණවීමේ ක්‍රමවේදය පිළිබඳව පුහුණුවක් අවශ්‍යවේ. හැකි සෑම අවස්ථාවකදීම, සුරැකීමේ ඒජන්සිය සහ නිලධාරීන් මේ සඳහා සම්බන්ධ කරගත යුතුය.

- ***වැළැක්වීමේ ක්‍රමවේදයන් සම්බන්ධීකරණය කිරීම:*** වගකිවයුතු ඒජන්සි, ප්‍රජා නියෝජිතයන්, සහ ක්‍රියාකාරි නිලධාරීන් වෙනුවෙන්, කඳවුරු මට්ටමෙන් නිරන්තර රැස්වීම් පැවැත්වීමට කටයුතු කිරීම. මීට අමතරව ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වයන් ඇතිවීමට හේතු සහ ඒවා වැළැක්විය හැකි ක්‍රම පිළිබඳව, UNHCR සුරැකුම් නිලධාරීන් සහ සුරක්‍ෂණ ඒජන්සි සමග ඒකාබද්ධව සම්බන්ධීකරණ කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කිරීම පාලක කණ්ඩායම් විසින් ඉටු කල යුතුවේ.
- ***GBV වැළැක්වීම සඳහා සම්බන්ධීකරණය කිරීම:*** කඳවුරු තුල සියලුම සේවාවන් නිසිලෙස ක්‍රියාත්මක වනවාද යන්න පිළිබඳව සොයාබැලීම සහ සම්බන්ධීකරණ කටයුතු කිරීම කඳවුරු පාලකයින්ගේ වගකිම වේ. එමෙන්ම කඳවුරු හා සම්බන්ධ සියලුම ඒජන්සි සමග ඒකාබද්ධව, ප්‍රචණ්ඩත්වය සහමුලින්ම වලක්වාලිය හැකි ක්‍රමවේදයක් දියත් කිරීම අවශ්‍ය වේ.

## ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය බෙදාහැරීම. (NFLs)

### කඳවුරු පාලකයින්ගේ මූලික වගකීම්

- ***පුද්ගලිකව ලියාපදිංචි කිරීම:*** කාන්තාවන් සහ කාන්තා ගෘහමුලිකත්වය දරණ කාන්තා නිවැසියන් ඇතුලු සියලුම අවතැන් වුවන් පෞද්ගලිකවම ලියාපදිංචි කිරීම සහ දත්ත රැස් කිරීම) නිවැරදි ලියාපදිංචි කිරීම හේතුවෙන් මානව සුබසාධක පහසුකම් ලබාගැනීමට හැකිවීම මෙන්ම ප්‍රචණ්ඩත්වයට සහ අපචාරයට ගොදුරුවීම අවම කරගැනීමටද හැකි වේ.
- ***සමාන සහභාගිත්වය:*** ආහාර, ආහාර නොවන ද්‍රව්‍ය සහ අනෙකුත් අත්‍යාවශ්‍ය භාණ්ඩ බෙදාහැරීමේ ක්‍රියාවලියට කාන්තා සහභාගිත්වය පූර්ණ වශයෙන් ලබා ගත යුතු වේ. කාන්තා දායකත්වය 50% ක් ලෙස පිළිගෙන ඇත. (5 වන පරිච්ඡේදය : ආරක්‍ෂාව. 9 ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය බෙදාහැරීම)

***අවදානම් තත්වයන් මගහරවාගැනීම:*** මූලික අවශ්‍යතාවන් වන ආහාර, ජලය, දර සහ ආහාර විසීම සඳහා අවශ්‍ය ඉන්ධන ආදිය කාන්තාවන්ට ලබාදීම මගින්, කාන්තාව යොමුවිය හැකි අවදානම් තත්වයන් මගහරවා ගත හැකි වේ. මෙම අවශ්‍ය ද්‍රව්‍යයන් ලබාගැනීමට අවස්ථාවක් සම්පූර්ණයෙන්ම නොලැබීම හෝ ප්‍රමාණවත් ලෙස නොලැබීම තුලින් කාන්තාවන් අවදනම් තත්වයන්ට යොමුවීමේ වාතාවරණයක් ඇති විය හැක. උද :- ජලය ගෙන ඒම සඳහා සහ දර කැඩීම සඳහා වඩා දුෂ්කර පළාත්වලට යෑම හෝ වන ලැහැබ් වලට යෑම.

- ***ආරක්‍ෂාව සහිතව පැමිණීම සහ පිටවීම:*** බෙදා හැරීමේ මධ්‍යස්ථානවලට පැමිණීමෙදී සහ පිටවීමේදී නිසි ආරක්‍ෂාව ලබදීම පිළිබඳව සැලකිලිමත්වීම අත්‍යාවශ්‍ය වේ. මෙහිදී ආරක්‍ෂාව යටතට ඇතුලත්වන එක් කරුණක් නම් රාත්‍රී කාලයේදී එම ස්ථානයන්ට ඇතුලුවන සහ පිටවන මාර්ග සියල්ලම හොඳින් ආලෝකමත් වී තිබීම.

## ප්‍රජාව සහභාගි කරවා ගැනීම සහ සංවේදීභාවය ඇති කිරීම :

ප්‍රචණ්ඩත්වය පිටු දැකීම, ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම, සහ සංවේදීබවක් ඇති කිරීම සඳහා සාර්ථක ක්‍රමවේදයන් ව්‍යාප්ත කිරීමේදී, කඳවුරු ප්‍රජාව අනිවාර්යයෙන්ම සහභාගි කරගත යුතු වේ. මෙම ප්‍රජාව නියෝජනය කරමින් විවිධ කණ්ඩායම් සහ පුද්ගලයින් සහභාගි කරවා ගැනීම පිළිබඳව සහතිකය කඳවුරු කළමනාකරු විසින් දිය යුතුය. කෙසේ වුවද ප්‍රචණ්ඩත්වයන් වැළැක්වීම සහ ඒ පිළිබඳව සංවේදී බවක්

ඇති කිරීම සඳහා, දැනුම සහ එම සිද්ධීන් පිළිබඳ අවබෝධය සහ සිද්ධියට පාදකවූ හේතු පිළිබඳ දැනුවත් බව පරණක්ම ප්‍රමාණවත් නොවේ. රට වඩා වැදගත් වන්නේ අයිති වවාසිකම් පිළිබඳ අවබෝධයක් සහ වගකීමක් කඳවුරු ප්‍රජාව මෙන්ම පාලකයින් තුළ තිබීමයි. බලය හෝ ශක්තිය පිළිබඳ සම්බන්ධතාවයේදී සමබරතාවක් නොතිබීම හේතුවෙන් ඉහත තත්වය කඳවුරුතුල බොහෝවිට දකින්නට ලැබෙන සත්‍යයකි.

## කඳවුරු පාලක කණ්ඩායම සතු මූලික වගකීම්

***සංවේදීබවක් ඇති කිරීම සහ වැළැක්වීම සම්බන්ධයෙන් වූ ඒකාබද්ධ ක්‍රමවේදයන්:*** ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ ක්‍රියාකරන ඒජන්සි/අයිතිවාසිකම් සහ වගකීම්, ප්‍රචණ්ඩත්වයන් සහ ප්‍රතිචාරයන් පිළිබඳ සංවේදීතාවයක් ගොඩනැගීම සඳහා ක්‍රියා කරන ඒජන්සි සමග සම්බන්ධතාවයකින් යුතුව ක්‍රියා කිරීම. නායකත්වය පිළිබඳ විවිධාකාරවූ ව්‍යුහයන් සහ කමිටුවල නියෝජනයන් කඳවුරුතුල ඇති කිරීම. ප්‍රචණ්ඩත්වය වැලැක්වීම සඳහාවූ ක්‍රමවේදීන් පිළිබඳ අවධිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම වැනි කටයුතු වලදී කාන්තාවන්ගේ සහ පිරිමින්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය ලබාගැනීම. ඒ අනුව වැළැක්වීම සහ සංවේදීබවක් ඇතිකරවීමේ සියලුම කටයුතු සඳහා කඳවුරු ප්‍රජාව අනිවාර්යයෙන්ම සහභාගි කරගත යුතුවේ.

***වග කිවයුතු ප්‍රමිතීන් පිළිබඳ අවබෝධය ඇති කරවීම:*** මානවහිතවාදීව උපකාර කරන පිරිසගේ වගකීම් පිළිබඳව කඳවුරු ප්‍රජාව දැනුවත් විය යුතුය. මෙය ඉටුකල හැකි එක් ක්‍රමයක් නම්, එම වගකිවයුතු ප්‍රමිතීන් ඇතුලත් අත්පත්‍රිකා හෝ දැන්වීම් කඳවුරු තුල විවිධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීමයි.

***තොරතුරු බෙදා හැරීම:*** සරණාගතයින් සහ අවතැන්වූ සියල්ලෝම තමන්ට හිමි දෑ පිළිබඳවත්, ලැබෙන වරප්‍රසාද සහ සේවාවන් පිළිබඳවත් දැනුවත් කළ යුතු වේ. කෙසේ වෙතත් සමහර පුද්ගලයින්ට කරුණු පහදාදීම අන් අයට වඩා අපහසුය. එබැවින් පාලක පිරිස් විසින්, සියලු කණ්ඩායම්වලට, පුද්ගලයින්ට සහ ආපදාවන්ට ගොදුරු වුවන්ට කරුණු අවබෝධ කරවිය හැකි ක්‍රමවේදයක් භාවිත කළ යුතුවේ.

***සමානවූ සහභාගිත්වය:*** කඳවුරු කමිටුවල ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම සමානව සහභාගිකර ගතයුතු අතර කාන්තාවන්ගේ සේවය ප්‍රජා නායකත්වයට පමණක් සීමා නොකළ යුතුය. සියළ කටයුතු සඳහා කඳවුරු ප්‍රජාවගේ දායකත්වය අවශ්‍යවේ.

රුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩත්ව තත්වයන් යටතේ සිදුවන ප්‍රබලතම ප්‍රශ්නයක් නම්, වැඩිහිටි කාන්තාවන් යම්කිසි වාසින් හෝ මුදල් ලබාගැනීම පිණිස කඳවුරු සේවකයින් සමග ලිංගික ඇසුර පැවැත්වීමයි. මෙහිදී කාන්තාවගේ එකඟතාවය තිබුනද වැඩි බලපෑමක් සිදුවන්නේ සේවක පක්ෂයෙනි. ඊට හේතුව බලවත්කම් පිළිබඳ තිබෙන අසමතා තත්වයයි. එනම් කාන්තාවන් ආධාර සහ සේවාවන් ලබාගැනීමේ දී සේවක පක්ෂයේ යැපෙන්නියන් බවට පත්වීමයි.

වරප්‍රසාද සහ මුදල් වෙනුවෙන් ලිංගික ඇසුරක යෙදීම විග්‍රහ කල හැක්කේ බලහත්කාර කමක් කිරීම ලෙසයි. එබැවින් කිසිම ආකාරයක ලිංගික ඇසුරක්, කඳවුරු, ප්‍රජාව සමග කඳවුරු පාලක සේවකයින් හෝ වෙනත් සේවාවන් සපයන්නකු විසින් පවත්වාගෙන යැමට එරෙහිව කඳවුරු තුල දැඩි රෙගුලාසි යටතේ තහනම් කළ යුතු බවය.

## ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වයට දැක්වෙන ප්‍රතිචාර :

ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම සඳහා යොදාගන්නාවූ ක්‍රමවේදය, නිරතුරුවම ප්‍රචණ්ඩත්වයට ගොදුරු වන්නාගේ රුචිකත්වයට හෝ අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිදි යොදාගැනීමට කඳවුරු ප්‍රජාව මෙන්ම, සේවක පිරිසද අවබෝධ කරගත යුතුවේ. එමෙන්ම එය කාලෝචිත විය යුතුය. වධහිංසාවට ලක්වුණු ගැහැනියකු, පිරිමියෙකු හෝ දරුවෙකු වෙනුවෙන් ප්‍රතිචාර දැක්වීමට කඳවුරු පාලකයින් ගන්නා කාලය සහ පිළිවෙත තීරණාත්මක සාධකයකි. ප්‍රධාන ඒජන්සියක් (සියලුම ප්‍රචණ්ඩ ක්‍රියාවන් උදෙසා) විසින් මේ හා බැඳි සියලුම දත්තයන් සහ පසුවිපරම් වාර්තාවන් වගකීමකින් යුතුව පවත්වාගෙන යා හැකිය. කඳවුරු හා පවතින සබඳතාවයට අනුව ඒජන්සි/ප්‍රචණ්ඩත්වයට එරෙහිව ක්‍රියා කරන රාජ්‍ය නොවන ආයතන/සෞඛ්‍ය සේවා පහසුකම් සපයන්නන්, ප්‍රචණ්ඩතාවය පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත ප්‍රජා සේවකයින් මෙම කාර්‍යයේ යෙදවිය හැක. මෙහිදී සැලකිල්ලට ගතයුතු කරුණක් වන්නේ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූවන් සඳහා සැපයෙන සේවාවන් අනුව කඳවුරුවල ස්වභාවය වෙනස්වන බවය. ප්‍රධාන ඒජන්සියක්/සේවාවක් නොලබන කඳවුරුවල, එහි පාලක කණ්ඩායම විසින්ම පහසුකම් සපයා ගැනීමේ කටයුතු ආරම්භ කළ යුතුව ඇත. කඳවුරුතුල සේවා සපයන සියලු දෙනා, ඒජන්සි සේවකයින්, ප්‍රජා නියෝජිතයින් සහ කඳවුරු පාලක කණ්ඩායම් ඇතුලු අනෙකුත් සියලු දෙනාට මානව අයිතිවාසිකම්, ස්ත්‍රී පුරුෂභාවය, ළමා අයිතිවාසිකම් සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පූර්ණ පුහුණුවක් ලබා ගැනීම ඉතා වැදගත් වෙනවා.



*ඇලිනා කඳවුරෙහි කාන්තාවක් ජලය ලබා ගැනීම. මෙවැනි ස්ථානයන්ට අවශ්‍ය ආරක්ෂාව මෙන්ම නිසි විදුලි ආලෝකය ලබාදීම තුලින්, කාන්තාවන්ට එල්ලවිය හැකි පහරදීම් වලක්වා ගත හැකි තීරණාත්මක පියවරකි.*

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීම්

- ***GBV ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ වාර්තා කිරීමේ ක්‍රමවේදය:*** ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩකාරී සිදුවීම් ලේඛණගත කිරීම සහා වාර්තා කිරීම සඳහන් ඉතා ප්‍රබල ක්‍රමවේදයක් කණ්ඩායම් විසින් සකස් කරගත යුතු අතර, ප්‍රචණ්ඩත්වයන් සඳහා ක්‍රියා කරන ඒජන්සි, රැකවරණ සලසන ඒජන්සි/නිලධාරීන් සහ සුදුසු බලධාරීන්ට මෙම වාර්තාවන් සැපයේ. මෙහිදී මේ සම්බන්ධව GBV සඳහා ක්‍රියා කරන ඒජන්සි, රැකවරණ සපයන නිලධාරීන්/ප්‍රජා සේවා නිලධාරීන් සමග සමීපව ක්‍රියා කිරීම අවශ්‍ය වේ. වාර්තා කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් කඳවුරු පාලකයින් මෙන්ම සේවාකයින්ද, කඳවුරු සම්බන්ධව ක්‍රියා කරන සියලු ඒජන්සිද දැනුවත් විය යුතුවේ.

- **පැමිණිලි කිරීම සඳහා යොදගන්න ක්‍රමවේදයන් පිළිබඳව දැනුවත් කරවීම:** පැමිණිල්ලක් හෝ චෝදනවාක් කිරීමේ ක්‍රමවේදය පිළිබඳව ප්‍රජාව දැනුවත් කළ යුතුවේ. මෙම ක්‍රමවේදයන් පිළිබඳව කඳවුරේ සිටින සියළුම රැඳවියන්, කණ්ඩායම් සහ පුද්ගලයින් මෙන්ම වඩා අවදනම් සහිත පුද්ගලයින්/පිරිස් බෙහෙවින් දැනුවත් විය යුතුය.

- ***මහපෙන්වීමේ ප්‍රධාණ මූලධර්මයන්:*** කඳවුරු පාලකයාගේ මූලික වගකීම වන්නේ, ප්‍රධාණ මූලධර්මයන් පිළිබඳ සිය සේවක පිරිස දැනුවත් කරවීම සහ විශ්වාසවන්ත භාවය ගොඩ නඟා ගැනීමේ සංකල්පය සහ කැමැත්ත ප්‍රකාශ කිරීම පිළිබඳ ඔවුන්ගේ අවබෝධය සහතික කිරීම.

- ***දිවිසුරැකුණු (Survivers) පුද්ගලයින්ගේ නියෝජිතයන්:*** "දිවිසුරැකුණු" පුද්ගලයින්ගේ නියෝජිතයන්, කඳවුරු කළමනාකරන කණ්ඩායම් තුලින්ම තෝරාගත යුතුවේ. මෙම පුද්ගලයින් (Survivers) විසින් ගැනීමට අදහස් කරන සෑම පියවරක් සඳහාම අවශ්‍ය සහාය එවන් නියෝජිතයන් (හැගැනු/පිරිමි) විසින් ලබා දෙනු ඇත. මීට අමතරව නියෝජිතයන් විසින් එම පුද්ගලයින්ගේ කැමැත්ත පරිදි සෞඛ්‍ය සේවාවන් ලබාගැනීම, පොලිස් ස්ථානයට ඔවුන් සමග යෑම, මෙන්ම වෙනත් ඕනෑම අවශ්‍යතාවයක් සඳහාත් සහයෝගය දැක්විය යුතුය. කෙසේ වෙතත් මෙම කරුණ සම්බන්ධයෙන්, ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වගකීමකින් ක්‍රියා කරන ඒජන්සි සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම අවශ්‍ය වේ.

- ***ආරක්ෂිත ස්ථාන/පසුබිම:*** "දිවිසුරැකුණු" පුද්ගලයාගේ ආරක්ෂාව සැලසීම ප්‍රථම කාර්‍යය විය යුතුවේ. ස්ත්‍රී පුරුෂ භාවය මත ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූවන් පිළිගැනීමට සහ අවශ්‍ය සේවාවෙන් සැපයීමට සුදුසු ස්ථානයක් කඳවුර තුල පිහිටුවිය. මෙම ස්ථානය තුල පෞද්ගලිකත්වයට හානියක් නොවන පසුබිමක් අවශ්‍යවේ.

- ***වෛද්‍ය සේවාවන් සඳහා ඇති ඉඩකඩ:*** මෙම පුද්ගලයින්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම් නිරතුරුවම ලබාදීම පිළිබඳව සෞඛ්‍ය ඒජන්සි සමග සාකච්ඡාකොට ඒ පිළිබඳ සහතික කර ගැනීම.

- ***සාම්ප්‍රදායික හුරුපුරුදු සඳහා දෙන සහයෝගය.:*** ප්‍රජාව තුල පවතින්නා වූ හොඳ සාම්ප්‍රදායික සිරිත් විරිත් වලට අනුබලය දීම. එනම් සාම්ප්‍රදායික පවිත්‍රතා ක්‍රම, සහ හොඳ සනීපාරක්ෂක ක්‍රම භාවිතය. කෙසේවෙතත් සෞඛ්‍ය කටයුතු පිළිබඳ වගකීම් දරුණ වෙනත් ඒජන්සි, ප්‍රචණ්ඩත්වය සහ මානසික සමාජයීය සුබසාධනය (තිබෙනවා නම් පමණක්) සතු සාම්ප්‍රදායික නොවන වෛද්‍ය සේවාවන් සඳහා යොමුකරවීම සහ උනන්දු කරවීම නිලධාරීන්ගේ වගකීම වේ.

- ***විශ්වසනියත්වය:*** සැමවිටම සේවක කණ්ඩායම විසින්, සියළු තොරතුරු හා විස්තර ආරක්ෂා කිරීමට බැඳී ඇති අතර, එම විශ්වසනියත්වය ගොඩ නගාගැනීම අවශ්‍ය වේ.

# ගෙම්වලම් කට්ටලය

***විවිධ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ පුළුල් විග්‍රහයක්. (UNHCR 2003) (සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ තානාපතිවරයා):***

මෙය ඉතා ප්‍රයෝජනවත් ලේඛනයකි. ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වයන්ගේ සැලකිය හැකි ලිංගික ප්‍රචණ්ඩත්වය, ශාරීරික ප්‍රචණ්ඩත්වය, චෛතසික සහ මානසික ප්‍රචණ්ඩත්වය, හිංසාකාරී සාම්ප්‍රදායික පුරුදු, සහ සමාජ ආර්ථික ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක් මෙහි දැක්වේ. එමෙන්ම මෙම ප්‍රචණ්ඩත්වයන් සිදුකළ හැකි සහ සිදුකිරීමට බලය ඇති අපරාධකරුවන් පිළිබඳව උදාහරණ සහිතව විග්‍රහයක් කොට ඇත.

***GBV මත සිදුවන ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමට යොදා ගන්නා පෝරමය.***

මෙම පෝරමය කඳවුරු පාලකයින් වෙනුවෙන්ම සකස් වූවකි. ප්‍රචණ්ඩත්ව සිද්ධීන් පිළිබඳ විස්තර මෙම පෝරමයට ඇතුළත් වේ. මෙම පෝරමය භාවිතා කරන්නේ මූලික තොරතුරු සඳහා පමණි. එනම් කිනම් ආකාරය ප්‍රචණ්ඩත්වයක්ද, යන වග/සිද්ධිය සිදුවූ දිනය සහ ස්ථානය පිළිබඳව / පසු විපරම් කිරීම සඳහා යෝජනා/සහ ඉදිරි පියවරයන් සඳහා යොමු වීමට ඒවා පුද්ගලයා දක්වන කැමැත්ත ආදියයි. මෙම අවම තොරතුරු මත, ප්‍රචණ්ඩත්වයට භාජනයවූ පුද්ගලයා සමග සුරැකුම් නිලධාරීන් සාකච්ඡා කොට ඉදිරි පියවරකට යොමු විය හැක. එබැවින් මෙය UNHCR පෝරමයට සමාන නොවේ. එම පෝරමය සම්පූර්ණ කිරීම සඳහා පුහුණු කාර්‍ය මණ්ඩලයක් අවශ්‍ය වේ.

***තොරතුරු නිකුත් කිරීම සඳහා අනුමැතිය: (IRC)***

මෙම පෝරමය මගින් නිර්ණය කල හැකි කාර්‍ය නම්, ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ක්‍රියා කරන සියලුම දෙනාට, ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූ පුද්ගලයා සිය තොරතුරු නිකුත් කිරීමට හෝ තොරතුරු ලබාගැනීමට තමා අනුමැතිය දෙන පුද්ගලයන් පිළිබඳ දැනගැනීමට හැකි වීම. එමෙන්ම මෙම පෝරමයේ පැහැදිළිව දැක්විය යුතු කරුණක් නම් ප්‍රචණ්ඩත්වයට පාත්‍රවූ පුද්ගලයාට ඔහුට/ඇයට තම සිද්ධිය පිළිබඳ තොරතුරු නිකුත් කිරීමට සුදුසු පුද්ගලයින් තෝරාගැනීමට හෝ තෝරා නොගැනීමට සතු අයිතියයි.

***අන්තර් ඒජන්සි ක්‍රියාපටිපාටින් සහ ප්‍රගුණ කළයුතු කරුණු පිළිබඳ අත්පොත:***

***ස්ත්‍රී පුරුෂ භාවයට පදනම් වූ ප්‍රචණ්ඩත්ව වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා සරණාගත ප්‍රජාවට සහායවීම***

"ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය" සරණාගතයින් සඳහා ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ කොංසෝටියම අත් පොතින් උපුටා ගන්නා ලද ආදර්ශ කෙටුම්පත, කඳවුරු කළමනාකාර ඒජන්සි ආයතන

වල පොදු අන්තර් ඒජන්සි අත් පොතක්, ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ප්‍රතිචාර පිළිබඳ අවතැන් වූ අවතැන් වූ අයවලුන් දැනුවත් කිරීම සඳහා භාවිතා කළ හැකිය.

GBV ප්‍රචණ්ඩත්වයන් වැළැක්වීමට සහ ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය සහයෝගය සරණාගත ප්‍රජාවට ලබාදීම. මෙම නියැදි දළ සටහන උපුටාගෙන ඇත්තේ (Roprductive Health Response in Conflict (RHRC) ග්‍රන්ථයෙනි. මෙම අත්පොත ඉලක්ක කරගෙන තිබෙන්නේ ජාත්‍යන්තර සහ ජාතික වශයෙන් ප්‍රචණ්ඩත්වයට බඳුන්ව ඇති සරණාගතයින්, අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ සහ පශ්චාත් ගැටුම්කාරී තත්වයන්ට මැදිහත් වූවන්ය. මෙම අත්පොතෙහි සඳහන් මෙවලම් සකස් කොට තිබෙන්නේ, ප්‍රචණ්ඩත්වයන් සම්බන්ධ සැලසුම්වල විවිධ පැතිකඩයන් මූලාශ්‍ර කරගනිමින්, එනම් තෝරාගනු ලැබූ ප්‍රජාව, සෞඛ්‍ය සහ සමාජ සේවාවන්, සහ නීතිමය සහ ආරක්ෂක කණ්ඩායම් සමග සම්බන්ධීකරණය කෙරෙන සහ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් පසුබිම් කොට ගෙනය. මෙම අත්පොත නිර්දේශ කොට තිබෙන්නේ GBV වැළැක්වීමට ක්‍රියාකරන සහ ඒ සඳහා ප්‍රතිචාර දක්වන මානවහිතවාදී කටයුතුවල නිරතවන විද්වතුන්ට පමණක් බව, ඔබගේ කාරුණික අවධානයට යොමු කරන්නට කැමැත්තෙමි.

***මාර්ගෝපදේශකත්වය දිය යුත්තේ කෙසේද? "ගිනියාවෙහි" ක්‍රියාත්මක වන ලිංගික සහ ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ වැඩසටහන් :***

මෙම අත්පොත (UNHCR සහ ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය IRC විසින් සකස් කරන ලද) "ගිනියා" ජනරජය විසින් සරණාගතයන් වාසය කරන ප්‍රදේශවල ක්‍රියාත්මක කරන GBV වැඩසටහන පිළිබඳ ඉතා පුළුල් ජයග්‍රහයක් කර තිබේ. මෙම අත්පොතෙන් බලාපොරොත්තු වන්නේ දැනට ක්‍රියාත්මක වන GBV වැඩසටහන් හෝ වෙනත් වැඩසටහන්වල මූලික සැලසුම් සඳහා සහාය ලබා දීමයි. මෙහිදී යොදා ගත් නිපුනත්වයන් සාරාංශ කොට දැක්වීම, එය ඉටුකළ ආකාරය සහ ක්‍රියාකාරකම් සපුරා ලීමේදී, හෙවත් ක්‍රියාවට නැංවීමේදී ලැබූ අත්දැකීම් හුවාදක්වමින් පැහැදිලි කිරීම. GBV සඳහා කැපවුණු ඒජන්සියක් නැති අවස්ථාවලදී, GBV වැඩසටහන් සම්බන්ධයෙන් පූර්ණ වගකීම් දරණ කඳවුරු පාලකයින්ට මෙම අත්පොත බෙහෙවින් උපකාරී වේ.

පුලුල් රැකවරණ සහිත සන්දර්භයක් තුළ සිදුවන ලිංගික අපයෝජනය බටහිර අප්‍රිකාවේ මනෝරිවර් පලාතේ කරන ලද ඇගයීමක්. (ලයිබීරියාව, ගිනියාව, සියරා ලියෝන්) හදිසි අවස්ථාවන් යටතේ දරුවන් සුරැකීම සහ ආරක්ෂා කිරීම පිළිබඳ, ලොවපුරා රාජ්‍ය නොවන ආයතනවල සුභසාධනය, ජාත්‍යන්තර ආපදා කමිටුව, ජාත්‍යන්තර රතුකුරුස සේවාව, ක්‍රිස්තියානි දරුවන්ගේ අරමුදල (CCF), දරුවන් සුරැකීමේ සංගමය, සැප්තැම්බර් 2002 - පිටු 1-28.

## අවශ්‍ය කියවීම් සහ පරිශීලන කියවීම්

- බෙත් වෑන් 2003. ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය: අවතැන් වූ ජනයට ප්‍රයෝජනය සඳහා වන වැඩසටහන් වලින් මතුවන කරුණු සරණාගත කොටසෝටියමය සඳහා වන ප්‍රජනතා සෞඛ්‍යය.
- UNHCR 2003. අභ්‍යන්තර අවතැන් වූ, ආපසු එන සහ සරණාගතයන්ට එරෙහි ලිංගික සහ ස්ත්‍රී පුරුෂ භාවය හා පදනම් වූ ප්‍රචණ්ඩත්වය ජිනිවා UNHCR මැයි 2003.
- NHCR, SC-UK 2001. ළමා අයිතීන් සඳහා ක්‍රියාකාරීවීම. (ARC) සුරුකෑම සහ අපයෝජනය, සම්පත් පැකේජය.
- UNHCR 2001. කඳවුරු ආරක්ෂාව සහ සරණාගත නිර්නායකයන් - අවදානමට ලක්වූ කණ්ඩායම්.
- OXFAM. හදිසි අවස්ථාවන් සඳහා කුඩා ස්ත්‍රී පුරුෂ අත්පොත හෝ සරල පොදු සංවේදනය.
- WHO, UNHCR 2002. දූෂණයවීමෙන් මිදුනු අය සඳහා සායන කළමනාකරණය. අභ්‍යන්තර අවතැන් වුවන්ගේ තත්ත්වයන් සහ සරණාගත වුවන්ගේ ප්‍රයෝජනය සඳහා මග පෙන්වීමට සංවර්ධනය කළ මුල් ලේඛනය. ක්ෂේත්‍ර විමසුම සඳහා කෙටුම්පත් කරන ලදී. ජිනිවා WHO, UNHCR
- UNHCR 1991. සරණාගත කාන්තාවගේ රැකවරණය සඳහා නිර්නායක ජිනිවා UNHCR
- UNHCR 2000. මග පෙන්වන්නේ කෙසේද? ලිංගික ස්ත්‍රී පුරුෂ ප්‍රචණ්ඩත්වය වැඩසටහන් නිරීක්ෂණය සහ ඇගයීම ජිනිවා UNHCR
- UNHCR 2000. SGBV පිළිබඳ සටහන්: අප්‍රිකාවේ ළමා සරණාගත ළමුන් සුරකීම සහ මහකොමසාරිස්වරයාගේ කාන්තාවන් වෙනුවෙන් කැප වූ පස්විධ කැපවීම් ජිනිවා UNHCR, අප්‍රිකා බියුරෝව
- ළමා සුරකුම එක්සත් රාජධානිය. UNHCR 2002. ලිංගික ප්‍රචණ්ඩත්වය සහ සුරාකෑම. සියරාලියෝන්, ලයිබීරියා සහ ගුයනාවේ සරණාගත ළමුන්ගේ අත්දැකීමේ
- IASC 2003. හදිසි පසුබිම් තුළ HIV/AIDS වලට මැදිහත්වීම පිළිබඳ නිර්නායක.
- සරණාගත කාන්තාවන් සහ ළමුන් සඳහා වන කාන්තා කොමිසම/ ISAC සරණාගයින් සහ ඒඩ්ස් මානව වාදී සමාජ කළ යුත්තේ කුමක්ද ?

- http:/www.rhrc.org/resources/gbv/index.html
- www.womenscommission.org
- www.humanitarianinfo.org/iasc/

# ලිංගික සහ ස්ත්‍රී පුරුෂ පාදක ප්‍රචණ්ඩත්ව වර්ග.

ලිංගික සහ ස්ත්‍රීපුරුෂ භාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ වර්ගීකරණය. ඉතා සුලභව සිදුවන ලිංගික සහ GBV ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ ලයිස්තුවක් පහත දැක්වේ. මෙය සවිස්තරාමකවූ, සුවිශේෂීවූ එකක් නොවේ. නමුත් මෙයට අනුව විවිධ ස්ථානවල සිදුවන ලිංගික අතවරයන් සහ GBV ප්‍රචණ්ඩත්වයන් හඳුනා ගැනීමට මෙය ප්‍රයෝජනවත් මෙවලමකි. ලිංගික අතවරයන් සහ GBV ප්‍රචණ්ඩත්වයන් කොටස් 05 කට බෙදේ.

- ලිංගික ප්‍රචණ්ඩත්වය.
- ශාරීරික ප්‍රචණ්ඩත්වය.
- චෛතසික සහ මානසික ප්‍රචණ්ඩත්වය.
- පීඩාකාරී සාම්ප්‍රදායික පුරුදු.
- සමාජ - ආර්ථික ප්‍රචණ්ඩත්වය.

# ලිංගික ප්‍රචණ්ඩත්වය

| සිද්ධිය | විස්තර / උදාහරණ. | අපරාධය සිදුකල හැකි පුද්ගලයින්. |
|---|---|---|
| දූෂණය සහ විවාහය තුළ සිදුවන දූෂණය. | ගොදුරක් බවට පත්වන අයගේ ශරීරයේ අවයවයන් ආක්‍රමණය කිරීම, හෝ අපරාධකරු විසින් ලිංගික අවයවය මගින් හිංසා කිරීම හෝ ගුද මාර්ගයේ හෝ ප්‍රජනන පද්ධතියට හෝ කිසියම් ආයුධයක උපකාරයෙන් විවෘත කිරීම හෝ ශරීරයේ වෙනත් අවයවයන් සිදුරු කිරීම, බලහත්කාරකම් කිරීම, පොළඹවාගැනීම, එවැනි පොළඹවා ගත හැකි පසුබිමකදී අයුතු ප්‍රයෝජන ගැනීම හෝ යම්කිසි කෙනෙකුට, නිවැරදි ලෙස තීරණයක් ගැනීමට හෝ කැමැත්ත ප්‍රකාශ කිරීමට නොහැකිවූ අවස්ථාවලදී. (ජාත්‍යන්තර සාපරාධී අධිකරණය) | ශක්තිය, ආධිපත්‍යය සහ පාලන බලය ඇති ඕනෑම පුද්ගලයෙකු. මෙහිදී ස්වාමියා, කිට්ටුම සගයා, රැකවරණය ලබාදෙන්නා අයත්වේ. |
| ළමා ලිංගික අපචාරය, කෙලෙසීම සහ නොමගයැවීම. | ලිංගික පිනවීම හෝ ලිංගික සතුටක් ලබාගැනීම සඳහා දරුවකු යොදාගැනීම. දරුවකු සමග පවත්නා ඇසුර සහ අන්‍යෝන්‍ය සම්බන්ධතාවය. | දරුවාට විශ්වාසවන්තයින්, දෙමාපියන් ඇතුළු, සහෝදර සහෝදරියන්, පවුලේ වෙනත් ඥාතීන්, මිතුරෙක් හෝ හාදුනන පුද්ගලයෙකු ගුරුවරයෙක්, වැඩිමහල්ලෙක්, නායකයෙකු හෝ රැකවරණ සපයන කෙනෙකු, බලය සහිත ඕනෑම පුද්ගලයෙක්, දරුවෙකු පාලනය කරන හෝ දරුවා පිළිබඳ ආධිපත්‍ය දරන්නෙක්. |
| බලහත්කාර පුංමෛථුන්‍ය / ගුද මාර්ගයට සිදුකරන දූෂණය. | මෙය බලහත් කාරයෙන්/බලයෙන් නම්මා ගැනීමකින්, ගුද මාර්ගයේ සිදුකරන සංසර්ගයකි. සාමාන්‍යයෙන් මෙය පිරිමි විසින් පිරිමින්ටද, පිරිමින් විසින් ගැහැනුන්ටද සිදු කරණු ලැබේ. | බලය, ශක්තිය ආධිපත්‍යය සහ පාලන බලය සහිත ඕනෑම පුද්ගලයෙක්. |
| දූෂණය කිරීමට උත්සහාකිරීම හෝ ගුදමාර්ගය හරහා දූෂණය කිරීමට උත්සහාකිරීම. | බලහත්කාරයෙන් / බලයෙන් නම්ම ගැනීමකින්, සංසර්ගයේ යෙදීමට උත්සහා දැරීම. මෙහිදී ඇතුලත්වීමක් සිදු නොවේ. | බලය, ශක්තිය ආධිපත්‍යය සහ පාලන බලය සහිත ඕනෑම පුද්ගලයෙක්. |

| | | |
|---|---|---|
| ලිංගික අතවර | නිත්‍ය වශයෙන් හෝ බලකිරීමකින්, කාමුක තත්ත්වයක් සඳහා ශාරීරික වශයෙන් පෙළඹවීමක් ඇති කරවීම. බලයෙන් හෝ අසමානවූ තත්වයන් යටතේ හෝ බලහත්කාර පෙළඹවීමකින් හෝ අනවශ්‍යවූ සපර්ශයන් කිරීම. | බලය, ආධිපත්‍ය හෝ පාලන බලය ඇති ඕනෑම පුද්ගලයෙකු පවුලේ හෝ ප්‍රජාවේ සාමාජිකයෙක්, එකට රාජකාරියෙ යෙදෙන සේවකයින්, අධීක්ෂකයින් ඇතුළුව, නාදුනන පුද්ගලයින්. |
| ලිංගික සූරාකෑම | ගොදුරුවිය හැකි ඕනෑම අපචාරයක්, ලිංගික අවශ්‍යතාවයන් සඳහාවූ බලය හෝ විශ්වාසයන්, ක්ෂණික වාසින් මෙයට ඇතුලත් වේ. එනම් සමාජයීය සහ දේශපාලනික වශයෙන් යම් කෙනෙකු සූරාකෑමට ගොදුරු වීම. පුද්ගලයින් නීති විරෝධීව හුවමාරු කිරීම ලිංගික සූරාකෑමේ එක අරමුණකි. (ලිංගිකත්වය ප්‍රදර්ශනය කිරීම, බලයෙන් ඇදුම් ගැලවීම හෝ නිරුවත් කිරීම, විවාහය සඳහා බලයෙන් පොළඹවා ගැනීම, බලයෙන් දරුවන් පිළිසිඳ ගැන්වී, කාම උත්තේජණය කිරීමේ කාර්යන්හි හෝ ගණිකා වෘත්තියේ නිරතවීම, සේවාවන් සැපයීම, භාණ්ඩ ලබාදීම, වාසි සහගත සහයෝගයන් ලබාදීම වෙනුවෙන් ලිංගික සූරාකෑම, ලිංගික වහල් භාවය. | බලය සහිතවූ, බලපෑම් කළ හැකි වූ, පාලනය කළහැකි වූ ඕනෑම පුද්ගලයෙක් එම පුද්ගලයින් නම් මානවහිතවාදී ක්‍රියාවන්හි නියුතු සේවකයින්, හමුදා නිලධාරීන්/ආරක්ෂක මාර්ග බාධකවල සේවයේ නියුතු නිලධාරීන්, ගුරුවරු, නීති විරෝධී ලෙස බඩු ප්‍රවාහනය කරන්නන්, නීති විරෝධී වෙළඳාම් ජාලය. (Networks) |
| බලහත්කාරයෙන් ගණිකා වෘත්තියේ යෙදවීම (මෙය ලිංගික සූරාකෑම ලෙසද හැඳින්වේ) | ලාභ ප්‍රයෝජන, සේවාවන් සහ යමක් ඉටු කර ගැනීමට අවශ්‍ය සම්පත් ලබාගැනීම සඳහා බලයෙන් හෝ බලහත් කාරයෙන් නම්මා ගැනීමකින්, ලිංගික ගනුදෙනුවක් කිරීම. මෙහිදී වඩාත් සූරාකෑමට ගොදුරු වන්නේ තමන්ට හෝ තම දරුවන්ට කිසිම පිහිටක්, හවිහරණක් නොමැති, මූලික පහසුකම් කිසිවක් ලබා ගැනීමට නොහැකි වඩාත් පහසුවෙන් අවනත කරගත හැකි කාන්තාවන් සහ ගැහැනු දරුවන්ය. | සේවාවන් සහ අවශ්‍ය සම්පත් ලබාදීමේදී බලපෑමක් කළ හැකි ධනය, බලය සහිත පුද්ගලයින්. මානව හිතවාදී සේවාවන්හි නියුතු සේවකයින්. |
| ලිංගික වධහිංසාව | බලාපොරොත්තු නොවූ, සාමාන්‍යයෙන් නැවත නැවත සිදුවන සහ පෙරලා ප්‍රතිචාර නොදක්වන ලිංගික ඉදිරි ගමන. කැමැත්තෙන් දෙන ලිංගික අවධානය. ලිංගික වරප්‍රසාද සහ ඊට අනුගතවීමට ඇති ඉල්ලුම කාමුක තත්වයක් ඇති කරවන ආකාරයේ ඇනුම්පද කීම හෝ වෙනත් වාචික හෝ ශාරීරික වශයෙන් හැසිරීම. කාම උත්තේජනය ඇති කරවන දේ ඉදිරිපත් කිරීම මෙම තත්වයන් සේවා කටයුතු සමග සම්බන්ධවූ විට එය කොන්දේසියක් බවට පත්වීම, තර්ජනාත්මකව පොළඹවා ගැනීමක් වීම, වෛර බැඳීමක් වීම හෝ රාජකාරී පරිසරය හෝ වාතාවරණය අප්‍රසන්න බවට පත්වීම. | සේවාදයකයා/හාම්පුතා අධීක්ෂකයින් හෝ තමන් හා සේවය කරන මිතුරා මිතුරියන් සහ බලය, ආධිපත්‍යය සහ පාලකයෙකු වන ඕනෑම පුද්ගලයෙකු. |

| සිද්ධිය | විස්තර / උදාහරණ. | අපරාධය සිදුකල හැකි පුද්ගලයින්. |
|---|---|---|
| ලිංගික ප්‍රචණ්ඩත්වය ශාරීරික / මානසික වධහිංසාවක් සහ යුධ අවියක් ලෙස සැලකිම. | කාමුක වාතාවරණයක් යටතේ සිදුකරන. අමානුෂික නිතිවිරොධි ක්‍රියාවක්, මෙයට දූෂණය, ලිංගික වහල් සේවය, බලහත්කාර ගබ්සාව හෝ වඳභාවයට පත්කිරීම හෝ වෙනත් ආකාරයක දරු පිළිසිඳගැනීම් වැලැක්වීම අයත්වේ. බලහත්කාර දරු පිළිසිඳ ගැනීම්, බලහත්කාර ප්‍රසූතිය, සහ බලයෙන් දරුවන් ඇතිදැඩි කරවීම. මීට අමතරව කාමුක වාතාවරණයක් යටතේ ඉතා ප්‍රබල කායික සහ මානසික වෙදනාවන් ඇති කරවන ක්‍රියාවක් හෝ තර්ජනයක් කිරීම ලිංගික ප්‍රචණ්ඩත්වය ලෙස හැඳින්වේ.<br><br>එමෙන්ම මෙසේ තර්ජනාත්මකව ලිංගික ප්‍රචණ්ඩත්වයන් කිරීමෙන් ඊට ගොදුරු වුවන්ගෙන් විස්තර ලබාගැනිම. පාපොච්චාරණය කරවීම හෝ ව්‍යසනයට පත්වුවන්ගෙන් දඩුවම් ලැබීම හෝ තුන්වන පාර්ශ්වයකින් දඩුවම් ලැබිම, ඇයට හෝ තුන්වන පාර්ශ්වයට දඩුවම් පැමිණවීම හෝ විනාශ කිරීම, සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන්, දේශිය, ජනවාර්ගික, ජාතික හෝ ආගමික කණ්ඩායම්. | බොහෝ විට මේ සඳහා යොමු වන්නේත්, අවසරය දෙන්නේත්, සහ අණකරනු ලබන්නේත්. හමුදා නිලධාරීන්, පොලිසිය, අවි ආයුධගත් කණ්ඩායම් හෝ සටන්වල නිරතව සිටින අනෙකුත් කණ්ඩායම්. |

## ශාරීරික ප්‍රචණ්ඩත්වය

| සිද්ධිය | විස්තර / උදාහරණ. | අපරාධය සිදුකල හැකි පුද්ගලයින්. |
|---|---|---|
| ශාරීරික පහරදීම | පහරදීම, තලා පෙලිම, පයින් ගැසීම, සපා කෑම, පිළිස්සීම, අංගවිකල භාවයට පත් කිරීම, හෝ මරා දැමීම, ආයුධ භාවිත කොට හෝ නොකොට, බොහෝවිට වෙනත් ක්‍රම හා සම්බන්ධවේ. එනම් ලිංගික සහ ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වයන්. | ස්වාමියා, කිට්ටුම මිතුරන්, පවුලේ කෙනෙක්, මිතුරෙක්, අදුනන කෙනෙක් හෝ අමුත්තෙක්. එමෙන්ම බලය, සහිත ඕනෑම කෙනෙක් හෝ සටන්වලට සම්බන්ධ කොටස්. |
| වෙළඳම සහ වහල් මෙහෙය | බලහත් කාරයෙන් වැඩ ගැනීම හෝ සේවාවන් ගැනීම, බලහත් කාරයෙන් ලිංගික ක්‍රියාවන් හි යෙදවීම පිණිස මිනිස් ජිවිත අලෙවි කිරීම හෝ හුවමාරු කර ගැනීම. වහල් මෙහෙය හෝ එවැනිම වෙනත් කටයුතු සඳහා මිනිසාව විකිණිම, දාසකමට හෝ වැඩකාරකමට, එමෙන්ම ශරීරයේ අවයව / ඉන්ද්‍රියයන් වෙන් කිරීම. | බලය සහ පාලකයෙකුගේ තත්වයේ සිටින ඕනෑම පුද්ගලයෙකු. |

## චිත්තවේගී සහ මානසික ප්‍රචණ්ඩත්වය

| සිද්ධිය | විස්තර / උදාහරණ. | අපරාධය සිදුකල හැකි පුද්ගලයින්. |
|---|---|---|
| අපචාරය/අපහාසය | ලිංගික අපචාරයන් නොවන වාචිකව සිදුකෙරෙන හිරිහැර එනම් අපහාස කිරීම, පහත්කොට තැකීම, අවමන් කිරීම. පෞද්ගලිකව හෝ ප්‍රසිද්ධියේ හෝ අතවරයට පත්වූ පුද්ගලයාව, අමානුෂික ක්‍රියාවන් සඳහා පෙළඹවීම. පවුලේ පැවැත්ම සඳහා අවශ්‍ය අවම වියදම්/මුදල් පවා ලබා දීමට කටයුතු නොකිරීම. | පාලන බලය, ශක්තිය ඇති ඕනෑම පුද්ගලයෙක් බොහෝවිට අපරාධකරුවන් බවට පත්වන්නේ අඹුසැමියන් කිට්ටුම සගයා හෝ පවුලේ ඥාතියෙක් පාලන බලයක් සහිත |
| රඳවාතැබීම. | යම් කිසි පුද්ගලයෙකු සිය නෑදැයින්ගෙන් සහ හිත මිතුරන්ගෙන් වෙන් කොට තැබීම, ගමන් බිමන් සීමා කිරීම, නිදහසට බාධාකිරීම, නිදහසේ හැසිරීමට තිබෙන අයිතියට බාධා ඇති කිරීම. | බලය සහ පාලනයක් ඇති ඕනෑම පුද්ගලයෙකු බොහෝවිට අඹුසැමියන් කිට්ටුම සගයන්, බලයක් සහිත පවුලේ කෙනෙකි. |

## පීඩාකාරී පාරම්පරික හුරුපුරුදු

| සිද්ධිය | විස්තර / උදාහරණ. | අපරාධය සිදුකල හැකි පුද්ගලයින්. |
|---|---|---|
| FGM ස්ත්‍රී ප්‍රජනන පද්ධතියේ ඡේදනය | කිසිම වෛද්‍යමය හේතුවක් රහිතව, ස්ත්‍රීන්ගේ ප්‍රජනන පද්ධතියේ කොටස් ඡේදනය කිරීම. සාමාන්‍යයෙන් බාලවයසේදී මෙය සිදු කෙරේ. මෙහි කොටසකට හෝ සම්පූර්ණවශයෙන් හෝ කැපීම් ඇති කිරීම, හෝ සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම, චිකිත්සක නොවන හේතුවක් මත හෝ පාරම්පරික හුරුපුරුදු මත එම කොටස් මැසීම, ජිවිත කාලය පුරා බොහෝ අවස්ථාවලදී මෙයට භාජනය වීම, උදා: දරු ප්‍රසූතියකින් පසු, ගැහැනු දරුවා/කාන්තාව ලිංගික අතවරයකට මුහුණ දුන් පසු. | පාරම්පරික ගති පැවැතුම් වලට ගරුකරන්නන්, පවුල් විසින් ආධාර කිරීම, සහයෝගය දීම සහ වන්දි ගෙවීම, ආගමික කණ්ඩාමේ, මුළු ප්‍රජාවම, සහ සමහර ප්‍රාන්තයන්. |
| බාලවයස් විවාහයන් | නීතියෙන් පිළිගත් සම්මත වයසට වඩා අඩු වයසින්, යෝජනා මගින් විවාහ කරවීම, (මෙවැනි විවාහයන් තුළ සිදුවන ලිංගික සංසර්ගය හැඳින්වෙන්නේ ව්‍යවස්ථානුකූල දූෂණයක් ලෙසිනි. ඊට හේතුව ගැහැනු දරුවාට නීතියෙන් මෙවැනි එකතුවක් සඳහා අවසරයක් නොතිබීමයි) | දෙමාපියන් ප්‍රජාව සහ රජය. |

| සිද්ධිය | විස්තර / උදාහරණ. | අපරාධය සිදුකල හැකි පුද්ගලයින්. |
| --- | --- | --- |
| බලහත්කාර විවාහ | ගොදුර බවට පත්වූ පුද්ගලයාගේ කැමැත්ත රහිතව සිදු කරන විවාහයක් බොහෝවිට දැවැද්දක් හෝ මුදලක් පවුලට ගෙවනු ලැබේ. ඊට එකඟ නොවූ විට ප්‍රචණ්ඩත්වයන් සහ වධහිංසාවන් සිදු කෙරේ. | දෙමාපියන් පවුලේ ඥාතීන් |
| ගෞරවාන්විත මරණ සහ අංගවිකල තත්වයට පත් කිරීම. | කාන්තාවන් හෝ ගැහැනු දරුවෙක් සිය කාන්තා භාවයට පටහැනි වරදක් හෝ ක්‍රියාවක් කිරීම නිසා සිය වගීයාට, හෝ පවුලට සිදුවන අගෞරවය නිසා මරණීය දඬුවම් කිරීම හෝ අංගවිකල තත්වයකට පත් කිරීම (උදා: සිය පවුල විසින් තෝරා නොදුන් පුද්ගලයෙකු හා විවාහ වීමට උත්සාහ කරන තරුණියකගේ මුහුණට ඇසිඩ් ගැසීම) පවුලේ නම්බුව රැකගැනීම පිණිස (පවුලේ පිරිමියකු විසින් කරන ලද වරදකට දඬුවම් කාන්තාව ලැබීම) | දෙමාපියන්, ස්වාමියා පවුලේ ඥාතීන්, හෝ සමාජයේ අනිකුත් පුද්ගලයන් |
| බිළිඳු ඝාතනය හෝ නොසලකා හැරීම | ඝාතනය කිරීම, ආහාර නොදීම සහ/හෝ සමාජය තුළ පිරිමි දරුවාට තරම් වටිනාකමක් ගැහැනු දරුවාට නොදීම නිසා ගැහැනු දරුවන්ව නොසලකා හැරීම. | දෙමාපියන් පවුලේ ඥාතීන් |
| ගැහැනු දරුවන්ට සහ කාන්තාවන්ට අධ්‍යාපනය නොදීම. | ගැහැනු දරුවන්ව පාසැලෙන් ඉවත් කරගැනීම ගැහැනු දරුවන්ට සහ කාන්තාවන් තාක්ෂණික, වෘත්තිමය හෝ විද්‍යාත්මක මූලික දැනුම ලබාගැනීමට ඇති අවස්ථාව අවහිර කිරීම, සහ බාධා පැමිණ වීම. | දෙමාපියන්, පවුලේ ඥාතීන්, ප්‍රජාව සහ සමහර ප්‍රාන්ත |

## සමාජ ආර්ථික ප්‍රචණ්ඩත්වය

| සිද්ධිය | විස්තර / උදාහරණ. | අපරාධය සිදුකල හැකි පුද්ගලයින්. |
| --- | --- | --- |
| අසාධාරණය සහ හෝ වරප්‍රසාදයන් සහ සේවාවන් වැළැක්වීම. | අධ්‍යාපනයට, සෞඛ්‍ය පහසුකම් වලට සහ ආදයම් මාර්ගයක් සහිත රැකියාවක් කිරීමට හෝ යොමු වීමට කාන්තාවට ඉඩ නොදී වැළැක්වීම. එමෙන්ම ඉඩ කඩම් සඳහා කාන්තාවට/ගැහැනු දරුවාට ඇති අයිතිය වැළැක්වීම. | පවුලේ සෙසු අය, සමාජය, ආයතන සහ සංවිධාන, රජයේ නිලධාරීන්. |

| සිද්ධිය | විස්තර / උදාහරණ. | අපරාධය සිදුකල හැකි පුද්ගලයින්. |
| --- | --- | --- |
| ලිංගිකත්වය අවධාරණය කරමින් සමාජයිය වශයෙන් තහනම් පැනවීම, නෙරපීම. | සේවාවන් සහ සමාජ සුබසාධනය සඳහා ඇති අයිතිය, හෝ දේශපාලන සංස්කෘතික, සමාජයිය, ආර්ථික සහ සිවිල් අයිතින් ලබාගැනීමට ඇති අවස්ථාව අක්‍රිය කිරීම, අපරාධ සඳහා දඬ/දඬුවම් නියම කිරීම, කොන්කිරීම හෝ ශාරීරික සහ මානසික හිංසනය, කොන්කිරීමේ විවිධ පුරුදු, ඉවසීම, සමලිංගික, විරුද්ධ ලිංගික හෝ කටයුතු සඳහා ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව විරුද්ධත්වය ප්‍රකාශ කිරීම. | පවුලේ උදවිය, සමාජය, ආයතන සහ සංවිධාන රජයේ නිලධාරීන් |
| බාධා සහිත නීතිමය ක්‍රියා මාර්ගයන්. | ප්‍රජා සාමාජයිය, ආර්ථික, සංස්කෘතික සහ දේශපාලන අයිතින් ව්‍යවහාර කිරීම හෝ භුක්ති විඳීමට ඇති අයිතිය සහ ඒ සඳහා යොමු වීමට ඇති අයිතිය, විශේෂයෙන්ම කාන්තා පක්ෂයට ලබා නොදීම. | පවුල, ප්‍රජාව, ආයතන සහ රජය |

# ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩත්ව සිද්ධි වාර්තා කිරීමේ ෆෝරමය.

පැමිණිලි කරන දිනය: .................................................. සිද්ධිය සිදුවූ දිනය:..................................................

සිද්ධිය සිදුවූ ස්ථානය හෝ ප්‍රදේශය:..................................................

යොමු කිරීම::..................................................

මෙම සිද්ධිය ලේඛනගත කරන නිලධාරියාගේ නම::..................................................

සිද්ධිය කුමක්ද යන්න - කරුණාකර සටහන් කරන්න (අවධානයට : ස්ත්‍රී පුරුෂ භාවය මුල්කරගත් ප්‍රචණ්ඩත්වය සිදුවන අයුරු නිවැරදිව තහවුරුකර ගැනීම සඳහා ප්‍රචණ්ඩත්වයන් සිදුවිය හැකි විවිධ ප්‍රභේදයන් පිළිබඳ කෙටි විස්තරයක්)

- ☐ ලිංගික අඩන්තේට්ටම්.
- ☐ දූෂණය
- ☐ දූෂණය කිරීමට උත්සහා දැරීම
- ☐ ළමා ලිංගික අපචාරය
- ☐ ව්‍යාභිචාරය
- ☐ ලිංගික සූරාකෑම
- ☐ බලහත් කාරයෙන් ගණිකා වෘත්තියේ යෙදවීම
- ☐ ලිංගික අතවරයන්
- ☐ ස්ත්‍රී ප්‍රජනන පද්ධතියේ ඡේදනය කිරීම
- ☐ පෙර වියේ විවාහයන්
- ☐ බලහත්කාර විවාහ
- ☐ ශාරීරික හිංසනය/අඩන්තේට්ටම්
- ☐ ආර්ථික අපයෝජනය
- ☐ රඳවා තැබීම
- ☐ වෙළඳාම සහ වහල් මෙහෙය
- ☐ සේවාවන්/වරප්‍රසාදයන් සඳහා වන අයිතිය තහනම් කිරීම සහ කොන් කිරීම.
- ☐ ගැහැනු දරුවන්ට අධ්‍යාපනය වැළැක්වීම.
- ☐ ගෞරවය රැකගැනීම සඳහා මරාදැමීම සහ හිරිහැර කිරීම.
- ☐ ළදරු මරණ සහ නොසලකා හැරීම.
- ☐ ගොඩනගාගත් නොසලකා හැරීම.
- ☐ වෙනත්.

කරුණාකර සිද්ධිය පිළිබඳ වැඩි විස්තර සටහන් කරන්න:..................................................

..................................................

..................................................

..................................................

..................................................

මෙම සිද්ධිය පිළිබඳ පැමිණිලි කර තිබේද සහ / හෝ වෙනත් අය සඳහා යොමු කර තිබේද?

..................................................

අවශ්‍ය පසු විපරම්.

# තොරතුරු නිකුත් කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම.

මෙම අවසර පත්‍රය/පෝරමය, සේවාදායකයා/සුරැකුණු පුද්ගලයාට සම්පූර්ණයෙන්ම පැහැදිලි කල යුතුවේ. මෙය ඔවුනට කියැවීමට සැලැස්වීමෙන් පසුව ඔහු හෝ ඇයගේ කැමැත්ත පරිදි පහත දැක්වෙන ආයතන තෝරාගත හැක. නැත හොත් කිසිම ආයතනයක් තෝරා නොගැනීමටද අවසරය ඇත.

1) .................................................. වන මා, විසින් සිද්ධි පැමිණිලි පෝරමය (නම - සේවාදයකයාගේ) (  ) මඟින් වාර්තා කරන ලද පැමිණිල්ල පිළිබඳවත්, සහ මාගේ වත්මන් අවශ්‍යතාවන් පිළිබඳවත් විස්තර ................ ඒජන්සිය සමග හුවමාරු කර ගැනීමට අවසර ලබා දෙමි. මෙම අවසරය ලබාදීම මගින් මට අවශ්‍ය නිසි රැකවරණය, ආරක්‍ෂාව සහ සහයෝගය ලැබෙන බව දනිමි. එමෙන්ම මෙම තොරතුරුවල රහස්‍යභාවය රැකෙන පරිදි වගකීමකින් යුතුව කටයුතු කරනු ඇතැයි සිතමි. කෙසේ වෙතත් මෙම තොරතුරු ලබාදීමට එකඟ වන්නේ, මට අවශ්‍ය සහ මා විසින් අපේක්‍ෂිත සහයෝගය ලැබෙන බව මා හට තේරුම් ගිය හෙයිනි.

පහත දැක්වෙන ආයතනවලට මාගේ විස්තර නිකුත් කිරීමට අවසරය දෙමි.

සුදුසු පරිදි සටහන් කරන්න.

☐ සමාජ සේවා ඒජන්සිය (නම).................................................................................

☐ සෞඛ්‍ය සේවා ඒජන්සිය (නම).................................................................................

☐ UNHCR සුරැකුම් නිලධාරී (නම).................................................................................

☐ පොලිස් ස්ථානය.

☐ කඳවුරු හෝ කොට්ඨාස භාර නිලධාරී (නම්).................................................................................

.................................................................................

☐ වෙනත් අය (කරුණාකර විස්තර කරන්න).................................................................................

**අත්සන හෝ මහපට ඇඟිලි සළකුණ**.................................................................................

නිලධාරිගේ අත්සන ඇඟිලි සළකුණ.................................................................................

දිනය.................................................................

# ආදර්ශ - කෙටුම්පත

නිත්‍ය පසුබිමක් මත ස්ත්‍රීපුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වයන් සම්බන්ධව ක්‍රියාකරන අන්තර් ඒජන්සි කණ්ඩායම් විසින් උපයෝගි කර ගැනීම පිණිස.

---

## අන්තර් ඒජන්සි සඳහා වූ අත්පොත ක්‍රියා මාර්ගයන් සහ අභ්‍යාස :

GBV වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා සරණාගත ප්‍රජාවට සහයෝගය දැක්වීම.
(ක්ෂේත්‍ර කාර්යාලයයේ නම හෝ අතුරු කාර්යාලය පළාත)

(රට)

---

**සංවර්ධන සඳහා සම්බන්ධ වූයේ.**

**(රාජ්‍ය නොවන ආයතන, ජාත්‍යන්තර ආයතන, අමාත්‍යාංශ සහ එවැනිමවූ ආයතන මෙම අත්පොත සැකසීමට දායකවූහ)**

*ප්‍රථම කෙටුම්පත සංශෝධනයට සහ සාකච්ඡාවට (දිනය)*
*අවසාන ප්‍රථම සංස්කරණය (දිනය)*

සංස්කරණය/සංශෝධිත මුද්‍රණය (අනාගතයේදී සංස්කරණයන් කෙරෙන දින)

## හැඳින්වීම

ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන්නාවූ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමට සහ ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමට, විවිධ කණ්ඩායම් සහ සංවිධාන, කණ්ඩායම් හැඟීමකින් යුතුව එකමුතුව ක්‍රියා කිරීම අත්‍යාවශ්‍යවේ. මෙම සංවිධානවල (මුල් පිටුවේ සඳහන්) නියෝජිතයින් විසින් එකමුතුව, අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටියක් සකස් කළ යුතුවේ. රට තුළ විවිධ ආපදාවන්ට ලක්වූ පළාත් සහ ප්‍රදේශවල පිහිටි සරණාගත කඳවුරුවල ජීවත්වන ප්‍රජාවට සිදු විය හැකි ස්ත්‍රී පුරුෂ භාවය මතවූ ප්‍රචණ්ඩත්වයන් වලක්වාලීමට සහ ඊට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය පැහැදිලි ක්‍රමවේදයන්, වගකීම් සහ භූමිකාවන් පිළිබඳ නිසි අවබෝධය, ඊට අදාළ කණ්ඩායම්, පුද්ගලයින්, ඒජන්සි සහ සංවිධානවලට ලගාවීමට සහ ඒවා සකස් කිරීමට අවශ්‍ය සාමූහික පෙළඹවීම සහ ක්‍රියාකාරීත්වය දීම ඉහත සංවිධානවල වගකීමයි.

ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ඒ සඳහා ප්‍රතිචාර දක්වන කටයුතුවල නියැලි ඕනෑම පුද්ගලයෙකුට මේ සම්බන්ධයෙන් අධ්‍යයනයක් කිරීම සඳහා උපකාරක මෙවලමක් සේ මෙම ක්‍රියාපටිපාටින් යොදා ගත හැක. ජාත්‍යන්තර සහ ජාතික සේවකයින් රටතුළ සහ රටින් රටට සේවය සඳහා මාරුකිරීම් සිදුවේ. සංවිධාන හෝ පුද්ගලයින්, පලාතෙන් හෝ රටින් බැහැර වුවත්, මෙම අත්පොතේ අන්තර්ගතව ඇති ක්‍රමවේදයන් සහ ක්‍රියාපටිපාටින් කිසිසේත් වෙනස් නොවේ. එය ස්ථිරසාර වේ.

## ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වය නිර්වචනය කිරීම.

මින් අදහස් වන්නේ, ශාරීරික, මානසික හෝ සමාජයීය (ලිංගික ප්‍රචණ්ඩත්වය ඇතුලු) වශයෙන් කරන ලද, කිරීමට තැත් කරන ලද, යම් කිසි බලයක් සහිත (එනම් ප්‍රචණ්ඩත්වය, තර්ජනය, බලහත්කාරකම්, අවශ්‍ය පරිදි හසුරුවාගැනීම, මුළා කිරීම, සාම්ප්‍රදායික බලාපොරොත්තු, අවිආයුධ, හෝ වාණිජමයතත්වය) ක්‍රියාවක් සහ එය සෘජුවම එල්ලවන්නේ යම් කිසි පුද්ගලයෙකුට ඔහුගේ හෝ ඇයගේ ස්ත්‍රී පුරුෂ භාවය මත හෝ ඔවුන් සමාජය තුල නිරූපණය කරන තත්වය මතය. GBV ප්‍රචණ්ඩත්වකාරී තත්වයක් යටතේ ඊට විරුද්ධව නැඟිසිටීමට හෝ වෙනත් පිළිවෙතක් අනුගමනය කිරීමට කිසියම් පුද්ගලයෙකු උත්සහා දැරුව හොත් ඊට විරුද්ධව සමාජයීය, කායික සහ මානසිකවශයෙන් නැගෙන ප්‍රතිවිපාක විඳීමට සිදුවේ. ස්ත්‍රීපුරුෂ භාවය මත සිදුවෙන ප්‍රචණ්ඩත්වයන් යනුවෙන් හැඳින්වෙන්නේ ලිංගික ප්‍රචණ්ඩත්වය, ලිංගික අපචාරය, ලිංගික අතරවරය, ලිංගික සූරාකෑම, පෙරවයස් හෝ බලහත්කාර විවාහ, කොන් කිරීම, වැලැක්වීම (උදා - අධ්‍යාපනය, ආහාර, නිදහස) සහ ස්ත්‍රී ප්‍රජනන පද්ධතිය ඡේදනය කිරීම. මෙම සියලුම වර්ගයේ ස්ත්‍රී පුරුෂභාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වයන්, අපරාධ හෝ නීති විරෝධී ක්‍රියාවන් ලෙස සියලුම රටවල්වල පිළිනොගැණේ.

## උපදේශාත්මක මූලධර්මයන්

**සියලුම මෙහෙයුම් කරුවන් විසින් මතු දැක්වෙන මූලධර්මයන් ඔවුන්ගේ මැදිහත්වීම, චර්යාවන් සහ සහයෝගය පිළිබඳ මාර්ගෝපදේශකයන්සේ සැලකේ. එමෙන්ම මෙහෙයුම් කරුවන් විසින් සියලුම සේවකයන් සඳහා පවත්වනු ලබන පුහුණු පාඨමාලා සහ පුහුණු සේවකයන්ට නව අත්දැකීම් ලබා දීම සඳහා පවත්වනු ලබන පුහුණු පාඨමාලාවන් මෙන්ම වගකිවයුතු හෝ විස්තර කළයුතු පියවරයන්හිදී, මෙම උපදේශාත්මක මූලධර්මයන් ප්‍රයෝජනයට ගනිමින් කටයුතු කිරීම.**

## විශ්වසනියත්වය හෝ රහස්‍යභාවය.

හැමවිටම දිවිසුරැකුණු පුද්ගලයා/පුද්ගලයින්ගේ හා ඔවුන්ගේ පවුල්වල විස්තර පිළිබඳව රහස්‍යභාවය රැකීමේ වගකීමට ගෞරවය දක්වයි. මින් අදහස් කරන්නේ ගොදුරුවූ පුද්ගලයාගේ ඉල්ලීම මත සහ

UNHCR ප්‍රතිපත්තින් සහ කාන්තාවන් එරෙහිවූ ප්‍රචණ්ඩත්වය පිටුදැකීමේ එක්සත් ජාතින්ගේ ප්‍රඥප්තියේ අඩංගු කරුණුවල සාරාංශයකි.

ඔහුගේ අවසරය මත පමණක්, අදාල තොරතුරු හා විස්තර, මැදිහත් කරුවන් ලෙස හෝ වෙනත් සහයෝගයක් ලබාදීමට කටයුතු කරන පිරිස් හා පමණක් හුවමාරු කර ගැනීමය. එමෙන්ම සියලුම ලේඛනගත තොරතුරු හඳුනාගත හැකිවන පරිදි නම්කොට, ලිපිගොනුවල සුරක්ෂිතව තැන්පත් කොට ඇත. කිසියම් වාර්තාවක් හෝ දත්ත පිළිබඳ විස්තරයක් ප්‍රසිද්ධ කිරීමට අවශ්‍යවූ විටකදී, ඒ සඳහා අනුමැතිය දීමට හෝ තොරතුරු නිකුත්කිරීමට හෝ තොරතුරු හඳුනාගැනීමට හෝ බලයදී ඇත්තේ එම සංවිධානයේ, වගකීමක් සහිතවූ එක් නිලධාරියෙකුට පමණි. (උද-නම්, ලිපිනය)

## ගරුත්වය

දිවිසුරැකුණු පුද්ගලයන්ගේ අභිලාෂයන්, අයිතිවාසිකම් සහ පෞරුෂත්වයට නියම ගරුත්වය දෙමින්, එය ගුරුකොට, ගනිමින්, හෝ මාර්ගෝපදේශයක් සේ සලකමින් මෙහෙයුම් කරුවන් ඔවුන්ගේ කාර්‍යයන් සහ ප්‍රතිචාර දැක්විම් ඉටුකරයි.

උදාහරණ වශයෙන් මෙහෙයුම් කරුවන් විසින්.

- සම්මුඛ සාකච්ඡා, පෞද්ගලිකත්වය රැකෙන පරිසරයක සිදුකිරීම.
- සම්මුඛ සාකච්ඡා හෝ පරීක්ෂණයන් සිදුකිරීමේදී කාන්තාවන් සඳහා කාන්තා නිලධාරීන් සහ පිරිමින් සඳහා පිරිමි නිලධාරීන්ව යෙදවීම. (උද- කාන්තාවක් නම් කාන්තාවක් විසින්ම සම්මුඛ සාකච්ඡාව මෙහෙයවීම. එහෙත් අවශ්‍ය සේවක ප්‍රමාණය නොමැති අවස්ථාවකදී පමණක්, මේ තත්වය වෙනස් විය හැක.
- ඉතා හොඳින් සවන් දීම හෝ ඇහුම්කන් දීම.
- දිවිසුරැකුණු පුද්ගලයා පිළිබඳව හෝ ඔහුගේ හෝ ඇයගේ හැසිරීම් රටාව පිළිබඳ නිගමනයන්ට නොපැමිණීම.
- ඉවසිලිවන්ත වීම : දිවිසුරැකුණු පුද්ගලයා තවදුරටත් සිද්ධිය පිළිබඳ අදහස් දැක්වීමට අකමැති වීම හෝ නිශ්ශබ්දව සිටීමට අවස්ථාවලදී ඔහුට/ඇයට කරුණු දැක්වීමට බල නොකිරීම.
- අදාළ ප්‍රශ්න පමණක් ඇසීම.
- සම්මුඛ සාකච්ඡා කීපයක් සඳහා එකම කථාව හෝ සිද්ධිය විස්තර කිරීමට ප්‍රචණ්ඩත්වයට ලක්වූ පුද්ගලයාට නොපැවසිය යුතුය.
- දිවිසුරැකුණු පුද්ගලයා අයිති සංස්කෘතියට, ඔහු හෝ ඇයගේ පවුලට හෝ පත්ව ඇති තත්වයට අවමානයක්
- සිදුවන ආකාරයට හැසිරීම හෝ භාෂයට ලක්කිරීමෙන් හෝ වැලකී සිටිය යුතුවේ.
- ඔහුගේ ලිංගික ජිවිතයේ අතීතය සම්බන්ධව සාකච්ඡා නොකිරීම.

## ආරක්ෂාව සහ රැකවරණය

සියලුම අවස්ථාවන්හිදී, දිවිසුරැකුණු පුද්ගලයාගේ ආරක්ෂාව තහවුරු කිරීම, මෙහෙයුම් කරුවන්ගේ වගකීම වේ. මෙහිදී මතකයේ තබාගතයුතු විශේෂ කරුණක් නම්, දිවිසුරැකුණු පුද්ගලයා හැමවිටම හියෙන් සහ නිසි ආරක්ෂාව අපේක්ෂාකරමින් ජිවත්වන බවයි. එමෙන්ම නැවත වරක් එම පුද්ගලයින් පහරදීමකට ලක්නොවන සේ රැකබලාගතයුතු වේ. අවශ්‍යවේ නම්, අමතර ආරක්ෂාව සපයා ගැනිම සඳහා කඳවුරේ ආරක්ෂක නිලධාරීන්ගේ, පොලිසියේ, ක්ෂේත්‍ර නිලධාරීන්ගේ, සුරැකුම් නිලධාරීන්ගේ, හෝ වෙනත් පුද්ගලයින්ගේ සේවය ලබා ගත හැක.

මෙම දිවිසුරැකුණු පුද්ගලයින්ට උදව් උපකාර කරන පවුලේ ඥාතීන්, යහළුවන්, ප්‍රජා සේවාවන්හි හෝ ස්ත්‍රී පුරුෂභාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ කටයුතු කරන සේවකයින්, සහ සෞඛ්‍ය සේවකයින්ව, ආරක්ෂාව සහ රැකවරණය පිළිබඳව දැනුවත් කළ යුතුවේ.

## ආරම්භක/මුල්ම පැමිණිල්ල

දිවිසුරැකුණු පුද්ගලයාට, තම සිද්ධිය පහත දැක්වෙන ඕනෑම අංශයකට පැමිණිලි කිරීමේ නිදහස සහ අයිතිය ඇත.

- ප්‍රජා නායකයින්ට (උද - කඳවුරු කමිටු, ඒකක හෝ කලාප නායකයින්, ආගමික නායකයින්, කාන්තා සංවිධානවල නායිකාවන්)
- සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ තානාපතිවරයා (UNHCR) සෞඛ්‍ය, ප්‍රජා සේවා ආයතන, GBV හෝ වෙනත් රාජ්‍ය නොවන ආයතන, (NGO).
- කඳවුර තුළ සහ ඒ අවට පිහිටි පොලිසියේ හෝ ආරක්ෂක නිලධාරීන්.
- තමාට පිහිටක් හෝ සහයෝගයක් ලැබෙනැයි, දිවිසුරැකුණු පුද්ගලයා විශ්වාස කරන පිරිස.

මෙම මුල්ම පැමිණිල්ල ලබන පුද්ගලයා හෝ ආයතනය විසින් දිවිසුරැකුණු පුද්ගලයාගේ ප්‍රශ්නය සහ අවශ්‍යතාවන් හඳුනාගෙන ඒ අනුව ක්‍රියා කරයි. ඉන්පසු අවශ්‍ය විශේෂඥ සේවාවන් එනම් සෞඛ්‍ය සඳහා, උපදේශන සඳහා ආරක්ෂාව සහ නීතිමය අවශ්‍යතාවන් සඳහා පුද්ගලයාව යොමු කිරීම සිදු කළ යුතුය. එමෙන්ම දිවිසුරැකුණු පුද්ගලයා සමග, සෞඛ්‍ය මධ්‍යස්ථානයට යෑම කාන්තා මධ්‍යස්ථාන, පොලිසිය සහ UNHCR ආයතනයට යෑම අනිවාර්යයෙන් සිදුවිය යුතුය.

## භූමිකාවන් සහ වගකීම්.

ස්ත්‍රී පුරුෂභාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වයන් වළක්වාලන සහ ඒ සඳහා ප්‍රතිචාර දක්වන්නන් සතු භූමිකාවන් සහ වගකීම් පිළිබඳ සරල විග්‍රහයක් මෙහි දැක්වේ. සේවකයින්ට සහ ස්වේච්ඡා සේවකයින්ට නිසි මාර්ගොපදේශකත්වයක් ලබා දිය හැකි, විස්තරාත්මක චාර්යාධර්ම පද්ධතියක්, නිසි ක්‍රියා පටිපාටියක්, සහ ප්‍රතිපත්ති මාලාවක් සෑම සංවිධානයකටම තිබිය යුතුය. GBV වැළැක්වීමට සහ ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමට, යෝග්‍යවූ මාර්ගෝපදේශකයන් සහ පිළිගත් ප්‍රමිතීන් අනුගමනය කිරීමටත්, ඒවා පිළිපැදීමටත් සියළුම සේවකයනි එකඟ විය යුතුය. මේවා පිළිබඳ වැඩි විස්තර සරණාගතයින් සඳහාවූ එක්සත් ජාතින්ගේ තානාපතිවරයා (UNHCR) විසින් ප්‍රසිද්ධ කරන ලද ලිපි ලේඛණ සහ ග්‍රන්ථවල අඩංගු වේ.

සියළුම සේවකයින්ට සහ ස්වේච්ඡා සේවකයින්ට අවශ්‍ය නිසි පුහුණුව ලබා දීමේ වගකීම සෑම සංවිධානයකට හෝ කණ්ඩායමකට පැවරේ. මෙමගින් ඔවුන්ට තමන්ගේ කාර්යභාරය සහ වගකීම් මනාව තේරුම් ගත හැකි අතර උසස් සේවාවක්ද සැපයිය හැකි වේ.

## සරණාගත ප්‍රජාව

**ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට සහ ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමට ගන්නා උත්සාහයන්හිදී නායකත්වය ලබාදෙන්නේ සරණාගත ප්‍රජාවයි. බොහෝ සරණාගත කණ්ඩායම් සහ සංවිධාන දියත්කර ඇති සහ යොමුවී ඇති. ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ සහ සරණාගතයින්ව ඒ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලෙන් අපේක්ෂා කෙරන්නේ ආකල්පිය වෙනසක් සහ හැසිරීම් රටාවේ වෙනසක් ඇතිකරගැනීමට උනන්දු කරවීමයි. (උද - ආගමික, කරුණු. ස්ත්‍රීන් සහ පුරුෂයින්ගේ කණ්ඩායම්, සහ පාසැල් වැඩසටහන්) ස්ත්‍රී පුරුෂභාවය මත සිදුවන ප්‍රචණ්ඩකාරී සිදුවීම පිළිබඳව, සරණාගත ප්‍රජාව දක්වන ප්‍රතිචාර විවිධාකාර වේ. එනම් එම සිද්ධිය පිළිබඳ සිය සංවේගය ප්‍රකාශ කිරීම, දුක බෙදාගැනීමට ඉදිරිපත් වීම සහ සිද්ධියට සම්බන්ධවූ සහ වගකිවයුතු පුද්ගලයන්ව අල්ලාගැනීමට කටයුතු කිරීම ආදියයි.**

සරණාගත ප්‍රජාව තුළ, පහත දැක්වෙන කණ්ඩායම් දෙකට GBV කටයුතු පිළිබඳව නිත්‍ය වගකීම් පැවරී ඇත.

## කඳවුරු කමිටු.

- "දිවිසුරැකුණු" පුද්ගලයින්ට අවශ්‍ය ආරක්ෂාව සහ සහයෝගය ලබාදීමේදී ක්‍රියා කළයුතු ආකාරය පිළිබඳව සහ දැක්වියයුතු ආකල්පයන් පිළිබඳව ප්‍රජාවට උපදේශන දීම. එමෙන්ම වරදකරුට, වරදට සරිලන සහ සාධාරණ දඬුවම් ලබාදීම තහවුරු කිරීම.

- ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ නඩු විභාග කිරීම සහ විනිශ්චය දීම අනුමැතියට යටත්ව සිදුකිරීම. නමුත් සමහර වර්ගයේ නඩු (උදා - පුද්ගලයන් ජීවත්වන රටේ පවතින තත්වයට අනුව ස්ථාපිතවූ සහ පිළිගත්) දේශීය නීතියට අනුකූලවන පරිදි පොලිසියට හෝ රැකවරණ නිලධාරීන්ට යොමු කළ හැක.

- සම්ප්‍රදායික නීතිය ක්‍රියාත්මක කිරීමේදී සහ විනිශ්චය දීමේදී සියළුම පාර්ශවයන්ගේ මානව අයිතීන්ට ගරුකළ යුතුය.

## කාන්තාවන්ගේ කණ්ඩායම්.

"දිවිසුරැකුණු" පුද්ගලයින් පිළිබඳවූ පැමිණිලි ලබාගැනීම සඳහා, කාන්තා සංවිධාන මඟින්, පුහුණු ස්වේච්ඡා සේවකයින් යොදා ආවරණය කෙරෙන පුලුල් වැඩපිළිවෙලක් දියත් කොට ඇත. (කාන්තා මධ්‍යස්ථානවල හෝ ප්‍රජා සාමාජිකයින් හරහා) සහ ඔවුන් සමඟ දුක බෙදාගනිමින් මානසිකව සහය දීම, විශේෂඥ සේවාවන්ට යොමු වීමට ඇති අවකාශය, සහතික කිරීමේ වගකීම මෙම කණ්ඩායම්වලට පැවරේ.

## ප්‍රධාන සංවිධානය (නිශ්චිත/විශේෂිත)

සියළුම කඳවුරුවල ක්‍රියාත්මක වන ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වය පිළිබඳ සියලු ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ කටයුතුවලදී නායකත්වය දෙමින් මෙම ප්‍රධාන සංවිධානය, සරණාගත ප්‍රජාවට සහයෝගය දක්වයි. එය :-

- ප්‍රචණ්ඩත්ව සිද්ධීන් පිළිබඳ පැමිණිලි කිරීමේදී සහ අවශ්‍ය උපදෙස් සහ සේවාවන් ලබා ගැනීමේ ක්‍රියාවලියේදී තිබිය යුතු සුරක්ෂිත භාවය සහ රහස්‍යභාවය තහවුරුවන පරිසරයක් හෝ ස්ථානයක්, කාන්තා මධ්‍යස්ථානවල පිහිටුවීම සහ පවත්වාගෙන යෑමට අවශ්‍ය පහසුකම් සලසාදීම.

- අවශ්‍යවූ විටදී උපදේශනය, සහයෝගය ලබාදීම සහ දිවිසුරැකුණු පුද්ගලයින්ට පක්ෂව කථා කිරීමට හෝ ඉදිරිපත් වීම (රට තුළ GBV සඳහා විශේෂ වැඩපිළිවෙලක් තිබේ නම්)

- ප්‍රජා මූලික, වැළැක්වීමේ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම. මේ සඳහා, දැනුවත් කිරීමේ වැඩපිළිවෙළවල්, සහ GBV වැළැක්වීම සඳහා පිරිමින්ගෙන් සමන්විතවූ කණ්ඩායම් පිහිටුවීම ආදි කටයුතු ඇතුලත් වේ.

- GBV සිද්ධීන්ට අදාළ සියලු බහු ආංශික දත්ත සහ තොරතුරු නිශ්කාශනය කරන ස්ථානයක් ලෙස ක්‍රියාකිරීම.

- කඳවුරු තුළ සිදුවන GBV ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ කථා ඇතුළත් තොරතුරු, නඩු විභාගවල විස්තර, සහ සිද්ධීන් පිළිබඳ පැමිණිලිවල දත්තයන් එක්රැස්කිරීම, ඒවා සම්පාදනය කිරීම සහ පසුව බෙදාහැරීමට කටයුතු කිරීම.

## මනෝවිද්‍යාත්මක සමාජයීය වැඩසටහන්.

මෙවැනි වැඩසටහන් වලට ප්‍රජා සේවාවන්, මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන්, සමාජයානුගත කිරීම, වෘත්තිය පුහුණුව, සහ ආදායම් උපදවන වැඩසටහන් ඇතුලත් වේ. එමෙන්ම මෙවැනි වැඩසටහන් මගින් "දිවිසුරැකුණු" පුද්ගලයින්ට අවශ්‍ය මානසික සුවය සහ සමාජ සමෝධානගත වීම සෘජුවම ලැබේ. එමෙන්ම මෙම වැඩසටහන් වලින් ඉටුවන තවත් මෙහෙයක් නම්, වඩාත් අවදනම් සහිතවූ සරණාගතයන් එවැනි තත්වයන්ගෙන් මුදගැනීම සඳහා ඉලක්ක කරගැනීම සහ අවශ්‍ය සහයෝගය ලබාදීමය.

## සෞඛ්‍ය සේවා ස්ථානයක් හෝ සෞඛ්‍ය මධ්‍යස්ථානයක්.

මෙම සෞඛ්‍ය පහසුකම් මගින් වෛද්‍ය පරීක්ෂණයන් කිරීම, ප්‍රතිකාර කිරීම, පසුවිපරම් කිරීමේ සේවාවන්, මානසික සහනසේවා සැලසීම, සහ අවශ්‍ය විශේෂඥ සේවාවන් ලබාදීම ආදිය සිදු කෙරේ, නිතිමය කටයුතු සඳහා අවශ්‍ය වන, තුවාල හෝ පහරදීම් පිළිබඳ වෛද්‍ය වාර්තාවන් සැපයීමද මෙම සෞඛ්‍ය සේවකයින් විසින් ඉටුකෙරේ.

## UNHCR සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතින්ගේ තානාපතිවරයා විසින් ලබාදෙන රැකවරණ.

රැකවරණ සපයන නිලධාරීන් විසින්, GBV ප්‍රචණ්ඩත්වයට අදාළ සියලු කටයුතු හා සම්බන්ධ ආරක්ෂක හා රැකවරණ වැඩපිළිවෙළ සම්බන්ධීකරණය කරනු ලැබේ. ඔහු හෝ ඇය විසින්, පොලිසියේ සහ උසාවියේ සිදුවන සියලුම නිතිමය කටයුතු පිළිබඳ අධීක්ෂණය කරනු ලැබේ. ඔවුනට අවශ්‍ය සහයෝගය, උපදෙස් සහ ගොදුරක් බවට පත්වූ සරණාගතයින්වූ අවස්ථාවලදී සහයෝගය දැක්වීම. එමෙන්ම ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ නවු විභාගයන්හිදී, වඩාත් සුදුසුම ආකාරයට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය හැකියා වර්ධනය ලබාදීමේ පුහුණු පාඨමාලාවන් වෙත, සරණාගත කඳවුරු කමිටුවල නියෝජිතයින් යොමු කරවීම සිදුකෙරේ. තවද, මානව අයිතිවාසිකම් පිළිබඳවූ ප්‍රමිතින්ට අනුකූලවීම, සහ සරණාගතයින්ට, ජාතික සහ ජාත්‍යන්තර නිතිය පිළිබඳ පුහුණුව සහ අවශ්‍ය දැනුම ලබාදීම.

## UNHCR සෞඛ්‍ය හෝ ප්‍රජනන සෞඛ්‍ය :

සෞඛ්‍ය සම්බන්ධීකාරක විසින් අවශ්‍ය පුහුණුව, සම්පත් දයකත්වය සහ ඊට අදාල මෙවලම් ලබාදීම, ආධාර කිරීම සහ සෞඛ්‍ය සේවා දියත් කරන හවුල් කරුවන්ට අවශ්‍ය සහයෝගය ලබාදීම වඩාත් ඵලදායි, සහ කාර්යක්ෂම විශේෂඥ ක්‍රම, විවිධ මට්ටමේ සෞඛ්‍ය සේවාවන් හා සම්බන්ධ කිරීම පිළිබඳ සම්පුර්ණයෙන්ම සොයා බැලීම සහ සහයෝගය දීම. විවිධ සෞඛ්‍ය දත්ත / තොරතුරු පිළිබඳ අධීක්ෂණය (ප්‍රචණ්ඩත්වය (GBV) පිළිබඳ සෞඛ්‍ය වාර්තා ඇතුළුව) ලබාදී ඇති ප්‍රතිකාර පිළිබඳව, සහ ප්‍රතිඵල : එමෙන්ම දැනුවත් කිරීමේ වැඩසටහන්ව සහ වැළැක්වීමේ කටයුතු සඳහා සහභාගිත්වය.

## UNHCR ක්ෂේත්‍ර නිලධාරීන්/සහායකයින්.

ප්‍රජාව අතර දක්නට තිබෙන ප්‍රශ්න සහ මතභේදයන්ට තුඩු දෙන කරුණු පිළිබඳ අධීක්ෂණය, මෙම ක්ෂේත්‍ර නිලධාරීන් සහ සහායකයන් අතින් සිදුවේ. ආරක්ෂාව පිළිබඳ මතභේදයට තුඩුදුන් කරුණු පිළිබඳ සහය දැක්වීම. GBV ප්‍රචණ්ඩත්වය හා බැදුනු පරිපාලනමය ගැටලු සඳහා විසදුම් සෙවීම, සහ කඳවුර තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් වලට සහභාගි වීම.

## UNHCR ප්‍රජා සේවාවන් :

ප්‍රජා සේවා නිලධාරීන් සහ සහායකයන් විසින් අවශ්‍ය පුහුණුව, සම්පත්දායකත්වය, ආධාර සහ මානසික සමාජයීය තත්වයන් පිළිබඳ කටයුතු දියත් කරන හවුල් කරුවන්ට අවශ්‍ය සහයෝගය ලබාදීම. වැළැක්වීමේ කටයුතුවලට සහ මනෝසමාජයීය ප්‍රතිචාරයන් පිළිබඳ වැඩිදියුණු කිරීමේ සහ සම්බන්ධීකරණ කටයුතු ඉටුකිරීම. එමෙන්ම දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වැළැක්වීමේ වැඩ කටයුතු සඳහා සහභාගි වීම.

## පොලිසිය/ආරක්‍ෂක නිලධාරීන්.

පොලිසිය විසින්, ජාතික නීතියට සහ ප්‍රතිපත්තීන්ට අනුව GBV ප්‍රචණ්ඩත්වයන් සඳහා ප්‍රතිචාර දැක්වීම සහ වාර්තා කිරීම සිදු කෙරේ. GBV අන්තර් ඒජන්සි කණ්ඩායම් විසින් ස්ථාපිත කර ඇති, මග පෙන්වීමේ ප්‍රතිපත්තින් දිගටම පවත්වාගෙන යෑම.

## අධිකරණ ක්‍රමය:

ජාතික නීතියට හා ප්‍රතිපත්තීන්ට අනුව GBV ප්‍රචණ්ඩත්ව අපරාධයන් පිළිබඳව ජාතික උසාවිය කටයුතු කරයි. මෙහිදී ප්‍රමාදවීම අවම කර ගැනේ. අන්තර් ඒජන්සි කණ්ඩායම් විසින් ස්ථාපිත කරගන්නා ලද මූලික ප්‍රතිපත්තින් දිගටම පවත්වාගෙන යනු ලැබේ.

138 ආදර්ශ දළ කෙටුම්පත - අන්තර් ඒජන්සිවල ක්‍රියාමාර්ග සහ පිළිවෙත්.

## ප්‍රතිචාර : පැමිණිලි කිරීම සහ විශේෂඥයන් වෙත යොමු කිරීම.

"දිවිසුරැකුණු" පුද්ගලයා සිද්ධිය පිළිබඳ මුල්ම පැමිණිල්ල ඕනෑම පුද්ගලයෙකුට ඉදිරිපත් කරයි.
(ප්‍රජානායකයින් සහ/හෝ ආරක්‍ෂකයින් සම්බන්ධ විය හැක/නොහැක)

(.......................................................................) විසින් දිවිසුරැකුණු පුද්ගලයාව, කාන්තා මධ්‍යස්ථානයකට හෝ සෞඛ්‍ය සේවා ස්ථානයකට හෝ ඔහු හෝ ඇයගේ කැමැත්ත පරිදි අවශ්‍ය ස්ථානයකට යොමු කිරීම හෝ රැගෙන යෑම සිදුකෙරේ.

**කාන්තා මධ්‍යස්ථාන**

- උපදේශනය සැපයීම, ආරක්‍ෂාව තහවුරු කිරීම.
- සෞඛ්‍ය මධ්‍යස්ථාන වෙත යොමුකිරීම.
- සිද්ධි පැමිණිලි කිරීමේ පෝරමය සම්පූර්ණ කිරීම. එහි පිටපතක් UNHCR රැකවරණ සේවාව වෙත සීල් කරන ලද ලිපි කවරයක දමා යොමුකිරීම.
- දිවිසුරැකුණු පුද්ගලයාට, තිබෙන උපකාර සේවාවන් පිළිබඳ දැනුම්දීම, අවශ්‍ය සේවාවන් සහ නීතිමය උපකාර

**සෞඛ්‍ය සේවාස්ථාන සහ මධ්‍ය ස්ථාන.**

- වෛද්‍ය පරීක්‍ෂණ කිරීම සහ ප්‍රතිකාර දීම.
- ලේඛනගත කිරීම.
- කාන්තා මධ්‍යස්ථානවලට යොමු කිරීම.

**පොලිසියේ ක්‍රියා මාර්ග ඉදිරියට ගෙනයෑමට "දිවිසුරැකුණු" පුද්ගලයට අවශ්‍යනම් දිවිසුරැකුණු පුද්ගලයා හෝ බාල වයස් කරුවෙක් නම්. රැකවරණය සහ ආරක්‍ෂාව හෝ ක්‍ෂණික අවදානමක් තිබීම.**

එවැනි අවස්ථාවකදී කාන්තා මධ්‍යස්ථානය විසින් හෝ සෞඛ්‍ය සේවාස්ථානය විසින් දිවිසුරැකුණු පුද්ගලයා පොලිසියට යොමුකොට, එහි රැගෙන යෑම සිදු කෙරේ.
(හෝ ඥාතියෙකුට හෝ මිතුරෙකුට පොලිසිය වෙත රැගෙන යා හැක)

**පොලිස් ස්ථානය.**

- පොලිසිය විසින් ප්‍රකාශන සටහන් කරගනිමින්. වෛද්‍ය සාක්‍ෂි පොරමය "දිවිසුරැකුණු" පුද්ගලයාට ලබාදේ.
- දිවිසුරැකුණු පුද්ගලයා සහ ඔහුගේ සඟයා විසින් මෙම පෝරම සෞඛ්‍ය සේවා ස්ථානයට එය සම්පූර්ණ කිරීම සඳහා යොමු කෙරේ.
- දිවිසුරැකුණු පුද්ගලයා සම්පූර්ණ කළ පෝරමය පොලිසියට නැවත භාර දේ. (කාන්තා කායඝිංශය හෝ GBV සේවකයින් මෙම පෝරමය පිරවීමට පොලිසියට සහ සෞඛ්‍ය සේවා ස්ථානයන්ට උදවි කෙරේ.
- පොලිසිය පරීක්‍ෂණ පැවැත්වීම්, අපරාධකරුවන් අල්ලා ගැනීම සහ උසාවියේ නඩු පැවරීම.

**දිවිසුරැකුණු පුද්ගලයාගේ රුචිකත්වයමත පහත දැක්වෙන ඕනෑම ක්‍රමවේදයක් සහයෝගය සහ පසුවිපරම සඳහා යොදා ගත හැක.**

## ප්‍රජාව

- ප්‍රජාවගේ සහයෝගය සහ පිළිගැනීම උනන්දුකරවීම.
- ප්‍රජාව සමඟ නැවත එකතුවීම සඳහා දිවිසුරැකුණු පුද්ගලයාට උපකාර කිරීම (බොහෝවිට බලපෑම් කිරීමෙන්) සමාජානුගතවීම.

## මනෝ විද්‍යාත්මක වැඩසටහන්

- ද්‍රව්‍යමය වශයෙන් උපකාර කිරීම, ඇඳුම්, ආහාර සහ අත්‍යාවශ්‍ය පිරිස් සඳහා ආහාර නොවන ද්‍රව්‍ය සැපයීම.
- දිවිසුරැකුණු පුද්ගලයා සාමාන්‍ය පරිදි සමාජයේ හැසිරෙනවාද යන්න පිළිබඳ සෙවීම, අවශ්‍ය උපදේශන සේවාවන් සහ සහයෝගය දීම.
- සමාජානුගතවීම උනන්දු කරවීම සහ ස්වෝත්සාහයෙන් නැගී සිටීම උනන්දු කරවීම/ආදායම් - ලබන වැඩසටහන්.

## සෞඛ්‍ය සේවා ස්ථාන

- අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම සහ පසු විපරම.

## UNHCR (සුරැකීම, ක්ෂේත්‍ර, ප්‍රජා සේවාවන්, සෞඛ්‍ය)

- පරිපාලන ගැටළු විසඳීමට උපකාරී වීම සහ පසු විපරම (උදා: වෙනත් කඳවුරකට යැවීම, නැවත පදිංචි කරවීම, වෙන් කිරීම/අලුත් ලෝකයක් නිකුත් කිරීම, නව නිවාස සඳහා ස්ථාන)
- **සුරැකීම යනුවෙන් අදහස් කෙරෙන්නේ නීතිමය ක්‍රියාපටිපාටින්ගේ තත්වය අධීක්ෂණය, අවශ්‍ය පරිදි නීති උපදෙස් දීම, නීතිඥ සේවාව ලබාදීම, සහ උසාවි යෑම සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම සහ අවශ්‍ය සේවාවන් සපයාදීම මෙය පැමිණිකරුට සහ සාක්ෂිකරු යන දෙදෙනාටම සැපයේ.**

## පොලිස් ස්ථානයේ/ආරක්ෂක සේවාවන්.

- ආරක්ෂාව පිළිබඳ ගැටළු නිරීක්ෂණය : දිවිසුරැකුණු පුද්ගලයාගේ සහ ඔහුට සහය දෙන පුද්ගලයින්ගේ සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම. අවශ්‍යතාවයන් අනුව සහය දීම සහ මැදිහත්වීම.

## අධිකරණය.

- නීතිමය පියවරයන් ක්‍රියාත්මක කිරීම, නඩු විභාග කිරීම, තත්ත්ව පරීක්ෂණයන් කිරීම, අවම ප්‍රමාදය සහිතව නඩු තීන්දු දීම.

| ක්‍රියාවන් සහ ප්‍රතිඵල පිළිබඳ දැක්වූ ප්‍රතිචාර නිරීක්ෂණය සහ ඇගයීම. |
|---|

## සතිපතා කඳවුරු මට්ටමෙන් පැවැත්වෙන GBV ප්‍රචණ්ඩත්ව උපදේශක මාණ්ඩලික රැස්වීම්.

- සියලුම සිද්ධීන්ට අදාළ දත්ත, තොරතුරු සහ නඩු විභාගවල තීන්දු සමාලෝචනය කොට ලේඛනගත කිරීම. (සොයා ගැනීමට නොහැකි තොරතුරු)
- සමාලෝචනය, සාකච්ජා කිරීම සහ පැහැදිලි කර ගැනීම, සහ වගකීම් මෙන්ම සම්බන්ධීකරණය පිළිබඳ භූමිකාවන් ශක්තිමත් කිරීම.
- පුහුණුව අවශ්‍ය අංශයන් සොයාබලා නිසි පුහුණුව ලබා දීම.

## GBV වැඩසටහන් (හෝ මූලික ඒජන්සි)

- සියලුම කඳවුරුවල ඇති, සිද්ධි වාර්තා හා දත්ත මෙන්ම නඩු තීන්දු රැස්කර ලේඛනගත කොට එක් මාසික වාර්තාවක් සකස්කිරීම. (සොයාගැනීමට නොහැකි තොරතුරු)

## මාසිකව පැවැත්වෙන පළාත් මට්ටමේ GBV අන්තර්ඒජන්සි සම්බන්ධීකරණ රැස්වීම්.

- සෑම කඳවුරකින්ම, එහි ඇති සිද්ධි වාර්තා හා දත්ත සහ නඩුතීන්දු විස්තර එක ලේඛනයකට සකස් කොට සමාලෝචනය කිරීම.
- සමාලෝචනය, සාකච්ජා කිරීම්, පැහිදිලි කරගැනීම් සහ වගකීම් මෙන්ම දරන තනතුරු හෝ භූමිකාවන් ශක්තිමත් කිරීම.
- හඳුනාගැනීම, සාකච්ජා කිරීම සහ ප්‍රශ්න විසඳීම : සාර්ථකත්වය පිළිබඳ සමාලෝචනය සහ විශ්ලේෂණය කිරීම.
- අවශ්‍ය පුහුණුවීම හඳුනාගැනීම සහ අවශ්‍යතාවයන්ට අනුව පුහුණු කටයුතු සැලසුම් කිරීම.
- **විශේෂඥ සේවාවන් සහ සම්බන්ධීකරණ කටයුතු සඳහා භාවිතා කෙරෙන ක්‍රමවේදයන් සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම.**

## ජාත්‍යන්තර මට්ටමේ GBV අන්තර් ඒජන්සි සම්බන්ධීකරණ රැස්වීම.

- ක්ෂේත්‍ර සහ අතුරු කාර්යාලවලට වාර්තාවන සිද්ධි (GBV) පිළිබඳව සහ නඩු වාර්තා සමාලෝචනය.
- ක්ෂේත්‍ර වැඩසටහන්වලට අදාළ ප්‍රශ්න හඳුනාගැනීම, සාකච්ජා කිරීම සහ සමාලෝචනය කිරීම.
- ප්‍රශ්න විසඳීම, ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ මට්ටමින් මගපෙන්වීම, අධාර ලබාගැනීම සඳහා සාකච්ජාකිරීම,
- ක්‍රියා මාර්ගයන් නිර්දේශකිරීම, සහ වෙනත් ආකාරයේ ආධාර ක්ෂේත්‍ර මට්ටමින් සිදුවන GBV ක්‍රියාකාරකම් සඳහා ලබාදීම.

## වැළැක්වීම.

වැළැක්වීමේ ක්‍රියාවලියට අයත්වන අංශයන් නම් සිද්ධි පිළිබඳ අධීක්ෂණය, සහ එහි ප්‍රතිඵල සොයාබැලීම, දැනුවත් බව ඇති කිරීම, සහ ආකල්පිය වශයෙන් සහ හැසිරීම් රටාවන් පිළිබඳ වෙනස්වීම් සඳහා උනන්දු කරවීම.

## සියල්ල ක්‍රියාකරවන්නන්.

ස්ත්‍රී පුරුෂභාවය මත (GBV) සිදුවන ප්‍රචණ්ඩත්ව වර්ගයන් සහ ප්‍රමාණය පිළිබඳ නිති අවබෝධය. එමෙන්ම මෙම ප්‍රචණ්ඩත්වයන්ට හේතුවන කරුණු සහ ඊට පාදක වන සාධකයන්. සහ ප්‍රජාව ඇතුළු සංවිධානවල සේවක මණ්ඩලයේ ආකල්ප දැනුම සහ හැසිරීම් රටාව සියලුම වාර්තාගත සිද්ධීන් අධීක්ෂණය කිරීම සහ විශ්ලේෂණය කිරීම මෙන්ම සිද්ධිය හා බැඳි වෙනත් අතුරු තොරතුරු හුවමාරු කර ගැනීම සහ සරණාගතයින්ගේ මෙන්ම සේවක මණ්ඩලයේ නිරීක්ෂණ මගින් ප්‍රජාවට ලබාදෙන. සහයෝගය.

වැළැක්වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදයන් වැඩිදියුණු කරගැනීම සඳහා ප්‍රශ්න සහ අවදානම් තත්වයන් හඳුනාගැනීම්, නිරන්තර සංවර්ධනය, ක්‍රියාවට නැංවීම, සහ ක්‍රමවේදයන් සමාලෝචනය කිරීම අවශ්‍ය වේ.

දැනුවත් කිරීමේ වැඩසටහන් වලට දයකවීම, පුහුණුව, ප්‍රජා අධ්‍යාපනය, මෙය GBV පිළිබඳ වාර්තා කිරීම, දැනුම වෙනස්වීම, ආකල්ප, සහ ස්ත්‍රී පුරුෂ භාවය, සහ ඒ සම්බන්ධ ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ උනන්දුකරවීම, සෘජුවම එල්ලකර ඇත.

## සරණාගත ප්‍රජාව, මානසික සහ සෞඛ්‍ය පිළිබඳ ක්‍රියාකරන රාජ්‍ය නොවන ආයතන:

උපලේඛනයන් හෝ කාර්‍ය සටහන් පිළිබඳ සම්බන්ධීකරණය සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. GBV ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ වෙනස්වන දැනුම, ආකල්ප, සහ හැසිරිය යුතු ආකාරය පිළිබඳව මෙන්ම, එම ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ වාර්තා කිරීම හෝ පැමිණිලි කිරීම උනන්දු කරවීම පිණිස පුහුණුව සහ ප්‍රජාවට අධ්‍යාපනයක් දීමේ වැඩපිළිවෙල, දියත් කිරීම.

## UNHCR සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ තානාපති වරයා, මගින් සැපයෙන සුරක්ෂිතභාවය, සෞඛ්‍ය සහ ආරක්ෂක තත්ත්වයන්:

**සෞඛ්‍ය, ආරක්ෂක සහ නීතිය පිළිබඳ සාධාරණය ඉටුකිරීම් සම්බන්ධයෙන් ක්‍රියාකරන ආයතන සඳහා පුහුණු පාඩමාලා පැවැත්වීම හෝ ඔවුන්ව යොමු කිරීම. (සරණාගත කඳවුරුවල ප්‍රජාවද අයත්වේ). මෙහි අභිප්‍රාය සහ ඉලක්කය වන්නේ GBV ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ වෙනස් වන දැනුම ලබාදීම, ආකල්ප සහ ඒ පිළිබඳව දක්වන හැසිරීම් රටාවන් වෙනස් කිරීම පිළිබඳ ප්‍රතිචාර දැක්වීම වඩා ප්‍රබල කිරීමයි.**

## සම්බන්ධීකරණය, පසුවිපරම සහ ඇහයීම.

ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා (GBV) පිළිබඳ ක්‍රියා කරන සියලුදෙනා අතර තොරතුරු හුවමාරුකරගැනීම, සම්බන්ධීකරණය සහ ප්‍රතිචාර දැක්වීම සඳහා නිරන්තරයෙන්ම රැස්වීම් පැවැත්වීම සහ පැමිණිලි/වාර්තා ලිවීම අවශ්‍ය වේ.

## සම්බන්ධීකරණ සමිති:

### *කඳවුරු මට්ටමෙන් පැවැත්වෙන - GBV සඳහා උපදෙස් දෙන මාණ්ඩලික රැස්වීම්.*

නිතිපතා දින නියමකරගත් පරිදි රැස්වීම් (දෙසතියකට වරක් සතිපතා හෝ මාසිකව) සෑම කඳවුරකම පැවැත්වීම. මෙම රැස්වීම් සඳහා සහභාගිවන සියලු දෙනාම GBV ප්‍රචණ්ඩත්ව කටයුතු පිළිබඳව ක්‍රියා කරන්නන් විය යුතුය: සෞඛ්‍ය, ප්‍රජා සේවාවන්/මානසික වැඩසටහන් ක්‍රියා කරන්නන්, GBV කටයුතු (වෙනමම වැඩ සටහනක් තිබේ නම්) UNHCR, පොලිසිය/ආරක්‍ෂක සේවා, සරණාගතයින්ගේ නායකයින් සහ කණ්ඩායම්. මෙම රැස්වීම්, හඳුනාගෙනගත් සිද්ධි පිළිබඳ විස්තර හුවමාරු කරගැනීමට, සාකච්ඡා කිරීමට සහ ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ විසඳ නොගත් නිශ්චිත අවදානම් සහිත ප්‍රශ්න සඳහා ප්‍රතිචාර දැක්වීමට, ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම, සහ වැළැක්වීම ශක්තිමත් කරගැනීම වැනි අංශයන් පිළිබඳ කතා බහ කිරීමට සුදුසු සංසදයකි. සෑම කඳවුරකම, මෙම රැස්වීම් සඳහා දින නියම කර ගැනීම සහ සෑම රැස්වීමකම වාර්තාවන් සියළුම දෙනාට ලැබීමට සැලස්වීම වැනි කාර්යයන් භාරව සෑම කඳවුරකම නිශ්චිත පුද්ගලයෙක් සිටිය යුතුය.

### *GBV ප්‍රචණ්ඩත්වයන් සම්බන්ධීකරණය කෙරෙන ප්‍රාදේශිය මට්ටමේ රැස්වීම්:*

සෞඛ්‍ය සංවිධානයන්හි, ප්‍රජා සේවාවන්හි/මනෝවිද්‍යාත්මක වැඩසටහන්හි, UNHCR (ප්‍රධාන අංශ හතරම) රැස්වීම් පවත්වන ප්‍රදේශයේ ආරක්‍ෂක සේවාවන්හි, සහ අධිකරණ බලධාරීන්හි, GBV ප්‍රචණ්ඩ කටයුතු සම්බන්ධීකරණ කෙරෙන නිශ්චිත නිලධාරීන් වෙනුවෙන් මාසික රැස්වීම් පැවැත්වීම. මෙම රැස්වීම් වලදී අවධානයට ලක්වන අංශ නම්, GBV ප්‍රචණ්ඩත්ව පිළිබඳ වාර්තාවී ඇති සිද්ධි සමාලෝචනය කිරීම, (ප්‍රතිඵල ඇතුලුව) මත භේදයන්ට තුඩු දෙන කරුණු සාකච්ඡා කොට විසඳුම් ලබාදීම, සියලු ක්‍රියා පටිපාටීන් සම්බන්ධීකරණය කිරීම, සහ වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම පිළිබඳ කරුණුය. GBV සිද්ධි පිළිබඳ හඳුනාගෙනගත් තොරතුරු බෙදාගැනීම, පසුවිපරම් කිරීම්, නඩු තීන්දු පිළිබඳව, ප්‍රවනතාවන්, හේතූන් සහ බලපාන කරුණු පිළිබඳ විස්තර හා තොරතුරු මෙම රැස්වීම්වලට සහභාගිවන සියලු දෙනා විසින් හුවමාරු කර ගැනේ. මෙම රැස්වීම්වල සහභාගීත්වය සහ පැමිණීම උපරිමය කර ගැනීම සඳහා, රැ ස්වීම්වල න්‍යාය පත්‍රය සහ අරමුණ ඉතා සරල පැහැදිලි එකක් විය යුතුය. ප්‍රධාන හෝ නායකත්ව ඒජන්සිය විසින් රැස්වීම පැවැත්වීමට අවශ්‍ය වාතාවරණය සහ පසුබිම සකස් කර දෙන අතර, රැස්වීම් වාර්තා සියල්ල නිසි ලෙස බෙදා හැරීමේ වගකීමද ඔවුන්ට භාර වේ.

ප්‍රදේශිය කොට්ඨාස පිහිටුවිය යුතුය. බොහෝ රටවල් අදහස් කරන්නේ මෙම ප්‍රාදේශිය මට්ටමේ රැස්වීම් අනු කායභිල මට්ටමෙන් පැවැත්විය යුතු බවය.

### *ස්ත්‍රී පුරුෂ භාවය මත පටගන්නා ප්‍රචණ්ඩත්වයන් පිළිබඳව ජාතික මට්ටමෙන් සම්බන්ධිකරණය කෙරෙන රැස්වීම්:*

UNHCR සුරැකුම සහ ප්‍රධාන GBV ඒජන්සි විසින් නිරන්තරයෙන් (මාස දෙකකට වරක්), රටේ සියලුම ප්‍රාදේශිය කොට්ඨාසයන්හි, GBV ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ කටයුතුවල නිරතව සිටින සංවිධානවල නායකයින් සමග රැස්වීම් පවත්වනු ලැබේ. මෙම රැස්වීම් වලදී අවධානයට ගැනෙන කරුණු නම්, සියලුම ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය, ප්‍රශ්න හඳුනාගැනීම සහ විසඳුම් ලබා දීම සහ නිරන්තරයෙන් පවත්වාගෙන යා හැකි වැඩසටහන් දියත් කිරීම ආදියයි. එමෙන්ම රැස්වීමට සහභාගි වන පුද්ගලයින්ගේ සාකච්ජාවට බඳුන්වන ප්‍රධානම කරුණු වන්නේ. එකරැස් කොට සකස් කර තිබෙන සියලුම සිද්ධි වාර්තා, දත්ත සහ නඩු තීන්දු, ප්‍රවණතාවන් විශ්ලේෂණය කිරීම, ක්ෂේත්‍ර මට්ටමෙන් ඉදිරිපත් කෙරෙන නිර්දේශයන් සහ ක්‍රියා මාර්ගයන් සඳහා ප්‍රතිපත්තිමය මට්ටමින් සහයෝගය ලබාදීමේ තත්වයක් ස්ථාපිත කිරීම.

## ප්‍රතිඵලයන් වන දර්ශකයන් සහ වාර්තාවන්.

සෑම අංශයක්ම (සෞඛ්‍ය, මනෝසමාජයිය, ආරක්‍ෂක, සහ අධිකරණ) GBV වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා තමන්ටම ආවේණිකවූ දර්ශකයන් වැඩිදියුණු කරගනිමින් අධීක්‍ෂණය සඳහා යොදා ගැනේ. එමෙන්ම මෙම දර්ශකයන් හරහා වැඩසටහන් ක්‍රමානුකූලව පාලනය කරගැනීමට සහ නිවැරදි අධීක්‍ෂණයන් කිරීමට අවශ්‍ය දත්ත විශ්ලේෂණය කිරීම සහ එක්රැස් කිරීමද සිදුවේ.

සිද්ධි වාර්තා පෝරමයට අනුව, මාසික GBV සංඛ්‍යාලේඛන එක්රැස් කර වාර්තා ගත කිරීම ප්‍රධාන ඒජන්සිය ඉටු කරයි. UNHCR සුරැකුම, සෞඛ්‍යයෙන්, පොලිසිය/ආරක්‍ෂක යන අංශවලින් ලබාගන්නා අමතර තොරතුරු, එනම් නඩු වාර්තා මේ සියල්ල මාසික දත්ත සාරාංශයක් ලෙස සකස් කළ හැක.

මෙම වාර්තාවේ පිටපත් සියලුම නිශ්චිත කාර්යභාරය නිලධාරියාව (කේන්ද්‍රීය පුද්ගලයා) (කඳවුරු මට්ටමින් සහ ප්‍රාදේශිය මට්ටමින්) මාසික සම්බන්ධීකරණ රැස්වීම්වලදී බෙදා දෙනු ලැබේ. එමෙන්ම ජාතික මට්ටමේ සම්බන්ධීකරණ කණ්ඩායම්වල සාමාජිකයින් අතරට මෙම වාර්තාවේ පිටපත් බෙදහරිනු ලැබේ.

## විවරණය:

සමාජසේවා සන්දර්භය තුළ GBV සිද්ධීන් වර්ගීකරණය කිරීම සඳහා යොදාගන්නා පාරිභාෂිතයන් විග්‍රහ කෙරෙන කෙටි ශබ්ද කෝෂයක් හෝ විවරණයක් ලෙස මෙය හැඳින්වේ. එනම් UNHCR සහ NGO (රාජ්‍ය නොවන ආයතන) සමග වැඩසටහන් පිළිබඳ වාර්තාවන් සැකසීමේදී, ප්‍රජා සේවාවන්, සෞඛ්‍ය සහ GBV සඳහා ක්‍රියා කරන කාර්‍ය මණ්ඩල උපයෝගි කරගන්නා පාරිභාෂිතයන් හෝ වචන ආදිය වේ. කෙසේ වෙතත්, පොලිසිය, අධිකරණය සහ රජයේ බලධාරීන් විසින් භාවිත කෙරෙන නීතිමය අර්ථදැක්වීම් සහ අපරාධ චෝදනා පිළිබඳ පාරිභාෂිතයන්, මෙම විවරණයට ඇතුළත් නොවේ.

**අපරාධකරු හෝ පහර දෙන්නා :-** දෝෂදර්ශනයට ලක්වුනු ප්‍රහාරකයා.

**දිවිසුරැකුණු පුද්ගලයා :-** GBV සිද්ධියකට හෝ අපරාධයකට ගොදුරුවූ තැනැත්තා.

**සිද්ධිය :-** ස්ත්‍රී පුරුෂභාවය (GBV) මත සිදුවන ප්‍රචණ්ඩත්වය.

**නඩුව :-** උසාවි නඩුව සමහරවිට UNHCR විසින් ප්‍රචණ්ඩත්වයකට ගොදුරුවූ පුද්ගලයා හැඳින්වීමට යොදා ගැනේ.

**ක්‍රියාකරවන්නන් භූමිකාව සිදු කරන්නන් :-** GBV වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීමේ කටයුතුවල නිරතව සිටින සංවිධානයක සේවකයෙක් හෝ ප්‍රජා සේවකයෙක්.

**බාල වයස්කාර දරුවන් :-** වයස 18 අඩු පුද්ගලයින්.

## ස්ත්‍රී පුරුෂ භාවය මත සිදුවන ප්‍රචණ්ඩත්ව (GBV) ප්‍රභේදයන් :

(ඔබගේ කොන්දේසි සහ නිර්වචනයන් මෙහි ඇතුලත් කරන්න. RHRC GBV මෙවලම් අත්පොතට (මුද්‍රණය අවිනිශ්චිත) ලෝකයේ සෑම තැනකම ජීවත්වන අවතැන්වූ ජනතාවට සේවා සපයෙන පරිස්ථිතිය හෝ පසුබිම තුළ භාවිතා කෙරෙන නිශ්චිත කොන්දේසි සහ නිර්වචනයන් ඇතුලත් වේ. සෑම රටකම වැඩපිළිවෙළට, මෙම කොන්දේසි සංශෝධනය කොට ඇතුලත් කිරීමට යෝජනා වී ඇත.)

## GBV - නොවන සිද්ධීන්.

ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් නොවු ප්‍රචණ්ඩත්ව සිදුවීම් සමහර අවස්ථාවලදී GBV සේවකයින්ට වාර්තා වේ. නමුත් මෙම සිදුවීමේ GBV ප්‍රචණ්ඩත්ව සිද්ධීන් ලෙස හැඳින්වෙන්නේ, ඊට සම්බන්ධවු පුද්ගලයින් බොහෝවිට ස්ත්‍රී පුද්ගලයින් වීම නිසායි. මෙම සිද්ධීන් GBV සිද්ධීන් ලෙස වර්ගීකරණය කල යුතු නොවේ. නමුත් වැඩසටහනේ ක්‍රියාකාරීත්වය සහ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා කිරීමේදී විශේෂයෙන් වැළැක්වීම වැනි විෂයයන් සම්බන්ධව විස්තර කිරීමේදී මෙවැනි සිද්ධීන් වෙන් කොට දැක්විය හැක. උදා :-

- ළමා අපචාරය (ශාරීරික හෝ මානසික හිරිහැර GBV ලෙස නොගැනේ)
- පවුල් ආරාවුල් එනම් සලාක පත සම්බන්ධව හෝ ආහාර නොවන ද්‍රව්‍ය සම්බන්ධයෙන් සිදුවන බහින් බස් වීම.
- ගෘහස්ථ ප්‍රශ්න සහ වාද විවාද (උදා :- බහු භායර්‍යා හෝ සමාගාමී සේවනය දරුවන්ගේ චර්යාවන් හෝ හැසිරීම් රටා පිළිබඳ ප්‍රශ්න)
- ප්‍රජනන සෞඛ්‍ය ප්‍රශ්න, උදා - නිසරු භාවය, බෙලහීන කම්, අනවශ්‍ය ගැබ් ගැනීම, ආදිය.

## ගිවිසුම සහ අත්සන.

අපට අදාළවන සංවිධානවල නියෝජිතයන් ලෙස පහත අත්සන් තබන අපි, මෙම ලේඛනයේ සඳහන් වන ක්‍රියාපටිපාටින් සහ ප්‍රමිතින්ට අනුකූලවන පරිදි කටයුතු කිරීමට එකගත්වය පල කරන්නේමු. එමෙන්ම මෙම වාතාවරණය යටතේ අප සංවිධාන හා සම්බන්ධවන, GBV වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා ක්‍රියා කරන්නේ සහ වගකීම් දරන සියලුම සේවකයන්ට මෙම පත්‍රිකාවේ පිටපත් බෙදාහැරීමට එකඟත්වය පළකරමු. ඒ අනුව ඕනෑම සේවකයෙකුගේ සේවා කාලයට නියමිත කොන්ත්‍රාත්තු අවසන් වුවද, මෙම ක්‍රියාපටිපාටින් නොකඩවා පවත්වාගෙන යෑමට ආධාරයක් වන බවට සහතික වේ.

| | | |
|---|---|---|
| .............................. (සංවිධානයේ නම) | .............................. දිනය | .............................. අත්සන |
| .............................. (සංවිධානයේ නම) | .............................. දිනය | .............................. අත්සන |
| .............................. (සංවිධානයේ නම) | .............................. දිනය | .............................. අත්සන |
| .............................. (සංවිධානයේ නම) | .............................. දිනය | .............................. අත්සන |
| .............................. (සංවිධානයේ නම) | .............................. දිනය | .............................. අත්සන |
| .............................. (සංවිධානයේ නම) | .............................. දිනය | .............................. අත්සන |

# 8 කඳවුරු ආරක්ෂාව



බුරුන්ඩිහි අවතැන් වූවන්ගේ කඳවුරක් ආරක්ෂා කිරීමට උදව්වීම -
ඡායාරූපය : විලියම් මිකෙල්සන්

# 8 වන පරිච්ඡේදය : කඳවුරු ආරක්ෂාව

## හැඳින්වීම

කඳවුරක වෙසෙන සරණාගතයින් සහ අභ්‍යංතර අවතැන් වුවන්ගේ පෞද්ගලික ආරක්ෂාව ජාත්‍යංතර රැකවරණය අනුව අත්‍යවශ්‍ය අංගයකි. කඳවුරු වැසියන්ගේ මූලික අයිතිවාසිකම්, මිනිසුන් ලෙස, ජීවත්වීමට ඇති නිදහස සහ පුද්ගලයාගේ ආරක්‍ෂාව සුරක්ෂිත නොවේ නම්, වෙනත් අයිතින් සහ ප්‍රයෝජන ජාත්‍යංතර ආයතන සහ නෛතික ප්‍රතිපත්ති හෝ ජාතික නීතියෙන් ඇත්තේ අල්ප ප්‍රයෝජනයකි.

පුද්ගල ආරක්ෂාවට ඇති තර්ජනය කෙසේ වුවද අවතැන් වී කඳවුරු වල වෙසෙන්නන්ට අනන්‍ය සාධාරණ නොවේ. නමුත් ප්‍රචන්ඩත්වය පිළිබඳ ගැටළු විදහා පෑම, බලය අයුතු ලෙස පාවිච්චි කිරීම, සහ සියලු ජන සමාජයන් හිංසනයට ලක් කෙරෙන නොඉවසීම ද වේ. ඔහුගේ හෝ ඇයගේ රජයේ ආරක්‍ෂාව බුක්ති නොවිඳින, ලියකියවිලි නොමැති, අඩු සම්පත් පමණක් ඇති දේශීය පුරවැසියෙකු හෝ විදේශීයයෙකු ලෙස මුලිනුපුටා දමන ලද තමන්ගේම අවදනමින් අවතැන් වු සරණාගතයින් සහ අවතැන් වුවන් සම්බන්ධයෙන් මෙම හිරිහැර නිතරම උග්‍ර බවට පත් කරනු ලැබේ. සාම්ප්‍රදායික පවුලේ ව්‍යුහයන්, ගෝත්‍රය සහ ජන සමාජය නිතරම අවුලට පත් කරයි. මේ වන විටත් ප්‍රචණ්ඩත්වය පලවා හැරීමට බලකර හෝ ඔවුන්ගේම රටේ හෝ උපන් ස්ථානයේ මානව අයිතින් අයුතු ලෙස භාවිත කිරීම, තවදුරටත් බොහෝම දෙනෙකු රැකවරස්ථානයකට යන අතරතුර අනතුරට මුහුණ දෙයි.

තවද, සරණාගතයින් සහ අවතැන් වුවන් නිතරම අර්බුදකාරී තත්වයන්ට ගොදුරු වු සංජානනය කළ වුවන් පමණක් නොවේ. (එනිසාම සරණාගත තත්වයක් හිමිවිය යුතු) නමුත් එසේම තමන් විසින් ම ආරක්‍ෂාවට තර්ජනයක් වීමට අවකාශ ඇති සහ අභ්‍යංතර සහ ජාතික මාඉම් ඉක්මවු අර්බුදයන් වල සාධකයක් ද වෙයි. සරණාගතයින් පිළිබඳ වු මේ සංජානනය සහ අවතැන් වුවන් මහා පරිමානයෙන් අවතැන් වු ජනයා අතර සමහර අවස්ථාවල හමුදමය සාධක, කුලී හේවායන් සහ සටන් වදින්නන් වගේ ම යහ දිවියක් සොයා ගෙන සංක්‍රමණය වන්නන් විසින් ද උග්‍ර බවට පත් කර ඇත. අවතැන් වීමේ බොහෝ අවස්ථාවන්හි දිග්ගැසීමේ ස්වභාවය නිතරම වාගේ "අනුකම්පාවේ අධික වෙහෙස" ට යොමු කරන්නේ ය. එසේම සරණාගතයින් සහ අභ්‍යංතර අවතැන් වුවන් විසින් අත්විඳින ලද ආරක්‍ෂාවට අවහිර බාධා එකතු කරයි.

සරණාගතයින් සහ අභ්‍යංතර අවතැන්වු අයගේ ප්‍රශ්න, ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න සමග එකතු වු අවස්ථාවලදී, ඉතාමත් වැදගත් වන්නේ සටානගතයින් සහ අභ්‍යංතර අවතැන් වුවන් ඔවුන් විසින්ම මානව හිමිකම් උල්ලංගනයට ගොදුරු වුවන් බව සිහිපත් කිරීමයි.

## කඳවුරු සහ ආරක්ෂාව

කඳවුර ස්ථානයක් සඳහා සාකච්ජා කිරීමේදී සරණාගතයෙකු/අවතැන් වුවෙකු සම්බන්ධ ආරක්ෂාව ගැන සැලකිය යුතුවේ. ජාත්‍යංතර දේශ සීමාවන් හෝ අභ්‍යංතර සිවිල් අරගල පවතින ප්‍රදේශ හමුද ප්‍රහාරයන්ට පහසුවෙන් ගොදුරුවිය හැකිය. ඒ වගේම හමුදා කණ්ඩායමක් මගින් හොර රහසින් අව්‍යාජ බවින් සරණාගත හෝ අවතැන් වු ජන කොට්ඨාශයකට ඇතුළුවීමත් කඳවුරකට කෙරෙන ප්‍රහාරයක් ලෙස ඇවිස්සිය හැකිය. තවදුරටත් කඳවුරක ප්‍රමාණය, සැළැස්ම සහ භෞතික පිහිටීම කඳවුරු වැසියන්ගේ ආරක්ෂාවට බලපෑ හැකිය. (වැසිකිළි වැනි පොදු පහසුකම්. ජල කරාම ආදිය ප්‍රහාර, බලහත්කාරකම් හෝ අපචාරයන් වැලැක්වීමට සුදුසු පරිදි සුදුසු ස්ථානවල පිහිටුවිය යුතුවේ) ඊට අමතරව රාජ්‍ය බලධාරීන් සමහර විට අපොහොසත් වෙයි, නැතහොත් කඳවුර තුළ සිටින සිවිල් වැසියන් වෙනුවෙන් ආරක්‍ෂාව පිළිබඳ වගකීම ක්‍රියාත්මක කරන්නට නොහැකි තත්ත්වයකට පත්වෙයි. නොඑසේ නම් කඳවුරේ සිවිල් සහ මානව හිතවාදී ස්වභාවය වෙනුවෙන් ගරුත්වය ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගැනීමට නුපුලුවන් වේ. තවදුරටත්, කඳවුර තුළ විවිධ කණ්ඩායම් අතර සහ/හෝ දේශිය ජනයා අර්බුද, පොදු අපරාධ සහ කොල්ලකෑම් සමස්ථ අනාරක්‍ෂිත බවට පාදක වන අමතර හේතු විය හැකිය. අඩු දිමනා ලබන අය සේවයෙහි නියුතු කිරීම සහ නොහික්මුණු පොලිසිය සහ ආරක්ෂක හමුද යෙදීමෙන් මෙම ප්‍රශ්න සම්මිශ්‍රණය විය හැකිය.

බලන්න දෙවන පරිච්ඡේදය : කඳවුරු පිහිටුවීම සහ 5 ආරක්ෂව (රැකවරණය)

# ආරක්ෂාව ගැන විශේෂ උනන්දුවක් දක්වන්නෝ

## රාජ්‍ය / ප්‍රාදේශීය බලධාරීන්

ප්‍රශ්ණ කළ නොහැකි ලෙසම අභ්‍යංතර අවතැන් වුවන් සහ සරණාගතයින් සහ ආගන්තුක ප්‍රජාවන් ආරක්ෂා කිරීම පිළිබඳ මූලික වගකීම සහ මහජන විෂය සහතික කිරීම, අභ්‍යංතර සහ බාහිර තර්ජනවලින් ආරක්‍ෂා කිරීම රජය වෙත පවතී. වැළැක්වීමේ සහ නිවරදි කිරීමේ ක්‍රියාකාරීත්වය බලධාරීන් අත ඇති බැවින් අධිෂ්ඨානශීලීව සැලකිල්ලට ගත යුතුවේ. අභ්‍යංතර අවතැන් වුවන්ට සහ සරණාගතයින්ට එරෙහි සාපරාධී ප්‍රහාර සහ මංකොල්ලකාරී වැඩවලට කටා කළ යුත්තේ රටේ සිවිල් බලධාරීන් සහ ආරක්‍ෂක හමුදාවන්ය. බොහෝ අවස්ථාවන් හිදී, කෙසේ වුවත්, සම්පත් වල සීමා සහිත බව, දේශපාලන, ආර්ථික සහ රටේ සමාජික බලවේග සහ අරබුදකාරී ප්‍රමුඛතා සහ න්‍යායපත්‍ර මෙම කාර්ය බෙහෙවින්ම අපහසු කරවයි. නූතන ඉතිහාසය පෙන්වා දෙන්නේ රජය සම්බන්ධ මට්ටම් සහ පිඩාවන් බෙද හද ගැනීමේ පුළුල් විවිධත්වයක් ඇති බවයි.

අවශ්‍ය වන විට සහ හැකි වුවොත් බලධාරීන් කෙරෙහි පීඩනය ගෙන එන හැක්කේ මේ පිළිබඳව ඔවුන්ගේ වගකීම් සපුරා ගැනීම පිණිසය. සරණාගතයින්ට සහ අවතැන් වූ ජනයා සඳහා ප්‍රමාණවත් ආරක්‍ෂාවක් සැළසීමට සමහර විට මෙයද ප්‍රමාණවත් බව තහවුරු කළ හැකිය. එවන් අවස්ථාවන්හිදී කඳවුරු කළමනාකරන කණ්ඩායම් විසින් සහාය, නීතිය පවත්වා ගැනීමට සම්පත්, විනය සහ ආරක්ෂාව, කඳවුර තුළ හා අවට සාධනය කළ යුතුවේ.

## කඳවුරු වැසියන්

සරණාගතයින් සහ අවතැන් වුවන් ගැන ආරක්ෂාව සහතික කිරීමේ මූලික වගකීම රජය මත තිබියදී, සරණාගතයින් සහ අවතැන් වුවන්ගේ වගකීම් ඔවුන් අත ද ඇති බව සත්කාරක රටේ නීතිය අනුව අවධාරණය කිරීම වැදගත් මෙන්ම යුක්ති යුක්තිය. 1951 පොදු සම්මතයේ 2 ජේදය සඳහන් කරන්නේ තමන් විසින්ම සොයා ගනු ලැබූ රට වෙනුවෙන් සෑම සරණාගතයෙකු සතු කාර්යයන් ඇත බවය. එයින් විශේෂයෙන් අවශ්‍ය වන්නේ ඔහු රටේ නීතියට හා රෙගුලාසිවලට, වාගේ ම නීතිය හා විනය පවත්වා ගැනීමට ගනු ලබන පියවරවලට අනුකූල විය යුතු බවය. ඔවුන් රැකවරණය ලබමින් සිටිත් ද, විශේෂයෙන්ම සත්කාරක රටේ හෝ සරණාගත ප්‍රජාවගේ ආරක්ෂාව අන්තරාවට පත් කරනා ආකාරයේ වෙනත් කටයුතු වලින් සහ හමුදාවන් කටයුතුවලින් වැලිකි සිටීමට උපදෙස් දිය යුතුය.

කඳවුරු වැසියන් හැකි තාක් දුරට කළමනාකරණයට අදල තිරණ ගැනීම සහ ආරක්ෂාව ගැන සම්බන්ධ විය යුතුය. පෞද්ගලික ඕනෑකම් සහ හිමිකම් පිළිබඳව අදහසක් හිතේහි දරාගෙන කඳවුර මුලින් ම පිහිටුවා, ඉදි කරන අවස්ථාවෙ සිට කඳවුරු වැසියන්ගේ උදව් ඇතිව ආරක්‍ෂ කිරීම සුදුසුය. අදල කණ්ඩායම් විසින් නොගැලපෙන පාලන කිරීම් ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. එසේම රටේ පාලනයෙන් පරිබාහිරව කොදෙව්වක් නොවීම වැදගත්වේ. එමගින් ආරක්‍ෂාවට අදල කටයුතු පාලනය කිරීමට ඇති හැකියාව අවම කරනු ඇත.

තවදුරටත් තෝරා ගන්නා ලද කඳවුරු නියෝජනය අවශ්‍යයෙන්ම අතුරු නීති මගින් දිරි. ගන්වන ලද ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් සකසා ප්‍රවර්ධනය කිරීම අවශ්‍යය. මෙම අතුරු නීති ප්‍රජාව විසින් අනුගමනය කොට පවත්වා ගෙන යෑම පිළිබඳ පාලනය හා කල්ක්‍රියාව පවත්වාගනු ඇත. එක්සත් ජාතින්ගේ සරනාගත මහ කොමසාරිස්වරයා සහ දේශිය නීති ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් මෙම අතුරු නීති සමාලෝචනය කිරීම පිණිස දයකවීම අත්‍යාවශ්‍යය. උපකමිටු කිහිපයක සහයෝගය ඇති විධායක කමිටුවකින් කඳවුරු නියෝජනය වන බව (ආහාර, සෞඛ්‍ය, "වටිසන්" ආදි) අදහස් කෙරේ. ඉන් එකක් දුක්ගැනවිලි කමිටුවක් විය යුතුය. එවන් කමිටුවක් අතුරු නීති උල්ලංගනය වන අවස්ථා පිළිබඳව ඇහුම්කන් දීමට සතිපතා රැස්විය යුතුවේ. එවන් අවස්ථාවල දඬ නියම කළ යුත්තේ මුදලින්, රදවා තබා ගැනීමෙන් හෝ පහත හෙලීමේ ප්‍රජා සේවා ක්‍රමයකින් ද යන්න ගැන මුල දීම එකගත්වයකට එළඹිය යුතුය. අතුරු නීති වලින් ආවරණය වන සහ දුක් ගැනවිලි කමිටුවට ඉහළින් උල්ලංගනය වන වෙනත් සියල්ලක්ම ප්‍රදේශයේ පොලිස් බලධාරීන් වෙත යොමු කළ යුතුවේ.

## එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්වරයා:

ද්‍රව්‍යමය සහාය සමග රැකවරණය, ආරක්‍ෂාව ගැන එක්, එක් අවයවයක් ලෙස සැළකිය යුතු වන්නේ මානව හිතවාදී මෙහෙවරේ එක් ඌනපූරක කොටසක ලෙසිනි. රටේ බලධාරින්ගේ කැමැත්ත පරිදි එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස්වරයා හදිසි අවස්ථා මෙහෙයුම ක්‍රියාත්මක කිරීමට වගකීම භාර ගත් අවස්ථාවේදී, හැකි තාක් ඉක්මනින්ම ලියාපදිංචි කිරීමේ කාර්ය පැවැත්විය යුතුවේ. අවතැන් වුවන්ගේ ආරක්ෂාව සම්බන්ධ මූලික මෙහෙයක් වන්නේ විශේෂයෙන් අවධානමට ලක්වූ කණ්ඩායමේ, ළමුන් සහ කාන්තාවන් ලියාපදිංචි කිරීමත්ය. (බලන්න හතරවන පරිච්ඡේදය ලියා පදිංචි කිරීම සහ තොරතුරු රැස් කිරීම) ආරක්ෂාව තහවුරු කළ පසුව ඉක්මනින්ම, තත්වය නිරීක්ෂන කරන්නට කටයුතු කල යුතු වීම සහ සරණාගතයින්ගේ අයිතිවාසිකම්වලට ගරුකිරීම පවත්වාගෙන යෑම තහවුරු කළ යුතුවේ. එක්සත් ජාතින්ගේ සරණාගත ආයතනය මෙහෙයුමේ ප්‍රධාන ඒජන්සිය ලෙස වෙනත් ස්වදේශිය හෝ ජාත්‍යංතර ආයතනයකට කඳවුරු කළමනාකරණය භාර ගැනිමට පවරයි. ඔවුන් විසින් එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස් වරයාගේ රැකවරන නිළධාරියාට (නිළධාරීන්ට) අදල අයගේ ආරක්ෂාව පිළිබඳ කරුණු වාර්තා කරනු ලැබේ. කඳවුරට සම්බන්ධ සියලුම ඒජන්සි ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන වෙත අනිශ්චිත තත්ත්වයන් සඳහා වු සැලැස්මක් තිබිය යුතුය. මෙම් සඳහා පහසුකම් සැලසීම පිණිස කඳවුර කළමනාකාරවරයා, සහ එකසත් ජාතින්ගේ මහකොමසාරිස් වරයාගේ ක්ෂේත්‍ර සුරකුම් උපදේශකවරයා සමග සමිප සම්බන්ධතාවක් තබාගත යුතුවේ.

සරණාගත කඳවුර කළමනාකරණ කාර්යන් වලදී එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස් වරයා ක්‍රියාත්මක කිරීමේ පාර්ශ්වකරුවන් සමග ප්‍රධාන ආයතනය ලෙස හදිසි අවස්ථාවලදී ප්‍රමාණවත් සංනිවේදනයන් ලබාදිය යුතුවේ. හදිසි අවස්ථාවන්හි ආරක්‍ෂාව සඳහා අවශ්‍ය තොරතුරු සංනිවේදනය කිරීමට පමණක් නොවැ පොදු සම්බන්ධිකාරක කටයුතු සඳහා ද අධිලච්ච සංඛ්‍යාත සහ උච්ච සංඛ්‍යාත ගුවන් විදුලි ක්‍රම (ස්ථානිය සහ ජංගම) පිහිටුවිය හැකිය.

## කඳවුරු කළමනාකරන ඒජන්සි ආයතන/රාජ්‍ය නොවන සංවිධාන :

කුමනාකාර අවිචලය දුෂ්කර තත්ත්වයන් තුළ වුවත් පුලුවන්තරම් දුරට අවදානමෙන් තොර වාතාවරනයක් ලබා දිම. සඳහා සෑම උත්සාහයක්ම දැරිම කඳවුර කළමණාකරන ඒජන්සි ආයතනය සතු නිසැක වගකිමක් ඇත්තේය. දෙනු ලැබූ කුමන පසුබිමක් තුළ වුවත් කඳවුරු ප්‍රජාව විසින් මුහුණ පාන තර්ජන වෙනස් වේ. අමුණා ඇති එක් මෙහෙවර කට්ටලයක බොහෝ විට සිදුවිය හැකි පොදු සිද්ධි පෙළගස්වා ඇත. කඳවුරු කළමණාකරන ඒජන්සි ආයතන මගින් ඒවායින් රැකගැනිම සඳහා සිදුවිය හැකි සංයුත්ත තර්ජන වඩාත් සුදුසු ක්‍රියාමාර්ගයක් නියම කරනවා ඇත. සටන් වදින හමුද බලවේග බලෙන් කඩා වැදිම, බලෙන් බඳවා ගැනිම සහ ආහර සහ ආහර නොවන ද්‍රව්‍ය සහනාධාර මෙම කණ්ඩායම් විසින් සොරා ගැනිම හෝ බලෙන් පැහැරගැනිම කඳවුරට පිටින් ඇතිවිය හැකි තර්ජන හඳුනා ගැනිමට වඩාත් සුදුසු පරිදි කඳවුරු පාලක ඒජන්සිය නිතරම ඔවුන්ගේ තත්වයන් තුළින් පිහිටුවිය යුතුවේ.

තර්ජන විශ්ලේශනය කොට රැකවරන ඒජන්සියට / නිලධාරියාට එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස්වරයාගේ ක්ෂේත්‍ර ආරක්‍ෂක උපදේශක සහ /හෝ සුදුසු ප්‍රදේශිය බලධාරීන්ට/පොලිසියට වාර්තා කළ යුතුවේ. ආරක්‍ෂක තත්වයන් පිළිබඳව ඉක්මනින්ම ලේඛන ගත කිරිම, කඳවුර කලමනාකරන ඒජන්සියට අවශ්‍ය මෙහෙවරක් වන්නේ සිද්ධි වර්තා කිරීමය. සිද්ධිය වු වහාම එය සම්පුර්න කර, පිටපත්කර අදල පර්ශව වෙත (සාමාන්‍යයෙන් එක්සත් ජාතින්ගේ සරණාගත මහා කොමසාරිස්වරයා / රැකවරනය, ක්ෂේත්‍ර ආරක්‍ෂක උපදේශක හෝ ප්‍රදේශිය පොලිසියට) ඉදිරිපත් කල යුතුවේ. කුමණාකර හෝ කල් මැරීමක් නිසා විපතට පත් වුවන්ට භයානක ප්‍රතිඵල උදකළ හැකිවේ. එසේම කඳවුරු කලමනාකරන එජන්සිය නිතරම සංවේදි තොරතුරු ප්‍රවේශමෙන් ත්‍රිකෝණ කිරිමට උත්සාහ කළ යුතුවේ. එසේ කිරිම මගින් නිරවද්‍ය නොවන දෑ අතරින් වැදගත් තොරතුරු හඳුනා ගැනිමට උදවුවෙනවා ඇත.

කඳවුර කලමනාකරන ඒජන්සිය තමන්ගේ කාර්ය මණ්ඩලය සහ කඳවුරු ප්‍රජාව යන දෙකොට්ඨාසයේම වගකිම බාර ගත යුතුවේ. කාර්ය මණ්ඩල ආරක්‍ෂන අවශ්‍යතා වන්නේ පදනම, අපේක්‍ෂා කළ හැකි තර්ජනවල ප්‍රවේග ලක්‍ෂය විශ්ලෙෂනය කිරීමක් වියයුතුය. කාර්ය මණ්ඩල නිලධාරීන් මුහුණ පාන අවදානම මැනිය යුත්තේ ඔවුන්ගේ මෙහෙවර මගින් ලැබෙන්නා වු ප්‍රතිලාබ අනුවය. භාර ගන්නා ලද වැඩවලින් ලැබෙන ප්‍රතිලාභ අවදනම් (එම අවදනම විසින් හෙලිදරව් වන සිදුවිය හැකි වැදගත්කම්)

වැදගත් කමින් වැඩි වේ. තමන්ගේ කාර්ය මණ්ඩලය විසින් කළ යුතු සහ අපේක්ෂා කරන තත්ත්වයන් කඳවුරු කළමනාකරණ ඒජන්සිය මගින් සමාලෝචනය කළ යුතු වේ. මේ ඇස්තමේන්තු සහ තත්සේරු කිරීම් තත්ත්ව වෙනස්වන ආකාරය සහ ආතතිය වර්ධනයවීම සහ අඩුවීම අනුව සමාලෝචනය කළ යුතුය.

බලපෑම් ඇතිවන විට ඒවාට සාර්ථකව ප්‍රතිචාර දැක්වීමට හැකිවන පරිදි පුහුණුව සහ සම්පත් ප්‍රමාණවත් පරිදි, කාර්ය මණ්ඩලයට ආරක්ෂණ සැළසුම්, සිදුවන ආරක්ෂක සිද්ධිවලින් තමන් විසින්ම ආරක්ෂාවීමට ආරක්ෂණ සැලසුම් සපයා දිය යුතුවේ. ද්‍රව්‍ය බෙදා හැරීමේ දී ඇතිවිය හැකි අරගල අවස්ථාවලදී කාර්ය මණ්ඩලයට විය හැකි අවදානම් සහගත අවස්ථාවලින් ඉවත්වීම වැනි දෙයක් නිතරම අදහස් කෙරේ. මෙම කාර්ය කළ යුත්තේ කෙසේ දැයි යන්න පිළිබඳව පූර්ව සැළසුම් කිරීම අත්‍යාවශ්‍යය. හදිසි අවස්ථාවන් සඳහා ගබඩා සහ සැපයුම් කල් තබා ස්ථාන ගත කළ යුතුවේ. සියලුම කාර්ය සැලසුම් සහ ද්‍රව්‍ය ඇති තැන් පිළිබඳව දැනුවත් වීම සඳහා පුහුණු කිරීමේ සහ විස්තර සැපයීම නිතරම කළ යුතුවේ. ඕනෑම අවස්ථාවක මුහුණ දීමට සිදුවිය හැකි තත්වයන්ට මුහුණදීමට සුදුසු පරිදි ප්‍රයෝගික පුහුණුවක් දීම හොඳ ක්‍රියාමාර්ගයකි.

## ප්‍රාදේශිය ප්‍රජාව

කඳවුරෙන් පිටත සිටින ප්‍රාදේශිය ප්‍රජාව බොහෝ විට ආරක්ෂක කරුණු වලට සම්බන්ධ විය හැකිය. ඔවුන් නිසා ඇතිවිය හැකිය. නැතහොත් ඔවුන්ට බලපෑ හැකිය. මෙවැන්නක් විශ්වාස නැතිකම, විනිවිද භාවය සහ තොරතුරු නිසා පැන නැගිය හැකිය. කඳවුරේ ආරක්ෂාවට අනර්ථදායක ලෙස බලපෑ හැකි ඉහත කරුණු අවම කර ගැනීම පිණිස ප්‍රාදේශිය නායකයින් සහ බලගතු පුද්ගලයින් ගෙන් උපදෙස් ගැනීම සහ විමසීම සුදුසුය. කඳවුර සහ සත්කාරක ප්‍රජාව අතර ඇතිවන අර්බුද පහළ මට්ටමේ කතාබහ මගින් සහ පුද්ගල සබඳතා මත මගහැරවිය හැකිය. එවන් උත්සාහයන් කල් ඇතිව කටයුතු කර වළක්වා ගත යුතු පරිදි ක්‍රියා කළයුතුය. කඳවුරු කළමනාකරණ ඒජන්සි ආයතනය එම කතාබහා සම්බන්ධීකරනය කිරීමට ප්‍රධාන මෙහෙවරක් කළ යුතුය. ඒ සඳහා දෙපාර්ශවයටම වැදගත් වන කරුණු කඳවුරු ප්‍රජාවට නිරූපණය කරමින් අත්සන් තබන ලද ගිවිසුමක් ඇති කිරීමට පියවර ගත යුතුවේ. උදහරණ ලෙස පවතින ස්වාභාවික සම්පත් (නිවාස හෝ ඉන්ධන) නිතරම, ඉක්මනින් වෙනස් වන සුළු කරුණක් බවට පත්වේ. මෙම කරුණ කඳවුර පිහිටුවීමේ දී සමථයකට පත් කළ යුතුය. (බලන්න, පරිච්ඡේදය 16 සාමය ගොඩනැගීම සහ ප්‍රතිසන්ධානය)

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම් :

කඳවුරක වෙසෙන්නන්ගේ රැකවරණය සහතික කිරීමේ මූලික වගකීම පවතින්නේ රාජ්‍ය බලධාරීන් වෙතය. මෙම වගකීම පවතින ප්‍රාදේශිය පොලිසිය සහ ආරක්ෂක අංශ විසින් භාරගත හැකි වුවද, කඳවුර තුළ සහ ඉන් පිටත රැකවරණයට කැපවූ පොලිසියක් හෝ ආරක්ෂක බලකායක් විසින් නියුතු කිරීමෙන් ලබා ගත යුතුවේ. අවස්ථා කිහිපයකදී කඳවුරු රැකවරණය අන්තර්ජාතික සාමය පවත්වන්න වූ හමුදාවල සහභාගීත්වයෙන් සපුරා ගෙන ඇත. කෙසේ වුවද කඳවුරු කළමනාකරන කණ්ඩායමට කඳවුර තුළ හා පිටත ආරක්ෂාව හා රැකවරණය වෙනුවෙන් සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ නිරීක්ෂණය කිරීම පිණිස වගකීමක් පවතී. විවිධ කඳවුරු කමිටු, කඳවුරු වැසියන් ඔවුන්ගේ නියමුවන් / නියෝජිතයින්ගේ සහ නියමකර ගනු ලැබූ විවිධ ඒජන්සි ආයතන වගේම ප්‍රාදේශිය අධිකාරී සහ ප්‍රජාවගේ සහයෝගයෙන් හොඳින් කළ හැකිය. කඳවුරු පිහිටුවීමේදී ආරක්ෂක කටයුතු පිළිබඳව වැඩි අවධානයක් යෙදවීම කඳවුරු වැසියන්ගේ සහ මානව උපදේශක කටයුතු ගැන වැඩ කටයුතු කරන පුද්ගලයින්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් අත්‍යාවශ්‍යය.



ප්‍රාදේශිය පොලිසියේ මගපෙන්වීම යටතේ කොසෝවේ, ඇල්බේනියානු සරණාගතයින් මැසිඩෝනියානු දුම්රිය මාර්ගයක් හරහා යෑම. සරණාගතයින් සහ අභ්‍යන්තර අවතැන්වුවන් පමණක් අර්බුදවලදී විපතට පත්වුවන් ලෙස නොසැලකේ. නමුත් ආරක්‍ෂකයින්ටද තර්ජනයකි. ජායා රූපය: UNHCR

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ මූලික වගකීම්.

- **ආරක්‍ෂාව පිළිබඳ අවධානය:** බලධාරීන් සහ වෙනත් අදාල ක්‍රියාකාරීන් සමග ඇති සබඳතාවලදී කඳවුර කළමනාකාර කණ්ඩායම නිතරම කඳවුරේ ආරක්‍ෂාව සිය න්‍යායපත්‍රයෙහි ඉහළින්ම තබා ගත යුතුය.

- **බැහැරින් ඇතිවිය හැකි තර්ජන :** කලහකාරී බලවේග කාන්දුවීම, බලෙන් බඳවා ගැනීම සහ ආහාර හා ආහාර නොවන ද්‍රව්‍ය මෙම කණ්ඩායම් විසින් හොරෙන් ගැනීම හෝ බලහත්කාරයෙන් ගැනීම වැනි බැහැරින් ඇතිවිය හැකි තර්ජන හඳුනා ගැනීමට කඳවුර කළමනාකාර කණ්ඩායමට මූලික කාර්යක් ඇත. මෙවන් තර්ජන විශ්ලේෂණය කර ආරක්‍ෂන ඒජන්සියට / නිලධාරියාට එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස්වරයාගේ ක්‍ෂේත්‍ර ආරක්‍ෂා උපදේශකට සහ/හෝ සුදුසු ප්‍රාදේශිය බලධාරීන්ට/පොලිසියට වාර්තා කළයුතුය. සිද්ධි වාර්තාව එවන් ආරක්‍ෂක තත්වයන් ගැන ඉක්මනින් ලේඛනගත කිරීම සඳහා අවශ්‍ය මෙහෙවරකි.

- **ආරක්‍ෂක අවිනිශ්චිතතා සැලැස්ම:** ආරක්‍ෂාව සහ අවශ්‍ය වුවහොත් කාර්ය මණ්ඩලය ඉවත් කර ගැනීමට සැලැස්මක් සකසා ගැනීම සහ පසුවිපරම් කිරීම කඳවුර කළමනාකරණ කණ්ඩායම සතු වගකීමකි. ආරක්‍ෂක සැලැස්ම ගැන කාර්ය මණ්ඩලය නිත්‍ය පදනමක් මත පුහුණු කිරීම හා අලුත් කළ යුතුය.

- **ප්‍රජාතාන්ත්‍රිකව තෝරාගත් කමිටු :** ප්‍රජාතාන්ත්‍රිකව පත් කර ගන්නා ලද නායකත්ව කමිටු දිරිමත් කළ යුතුය. මෙම කමිටු අතර දුක් ගැනවිලි කමිටු නියෝජනයක් තිබිය යුතුය. (බලන්න 3 පරිච්ඡේදය : උදහරණයක් ලෙස දුක් ගැනවිලි කමිටු ප්‍රජා සහභාගිත්වය) එම කමිටුවල කාන්තා සහභාගිත්වයක්, වඩාත් සුදුසු ලෙස 50% ක් තිබිය යුතුය. මෙම පරිච්ඡේදයේ “විශේෂ උනන්දුවක් දක්වන්නන්” යන්න බලන්න.

- **අතුරු නීති ක්‍රම :** ප්‍රජාතාන්ත්‍රිකව සකසා ගන්නා ලද අතුරු නීති ක්‍රමයක් තොරාපත් කරගන්නා ලද කඳවුරු නියෝජනය මගින් ක්‍රියාත්මක කළ යුතුය. කඳවුරු වැසියන්ට කඳවුරු නීති, අයිතිවාසිකම් සහ යුතුකම් ගැන තේරුම් ගැනීම පිණිස දැනුවත් කළ යුතුය. මේ ආකාරයෙන් අපේක්ෂාවන් පැහැදිලි කළ හැකිය.

- **ප්‍රජාපාලනය සහ ආරක්ෂාව පිළිබඳ පුහුණුව :** මුලාරම්භයෙ පටන් කඳවුරු ප්‍රජාවට හැඳින්වීමක් හෝ ප්‍රජාපාලන අධ්‍යාපනය සහ ආරක්ෂාව ගැන පුහුණු කළ යුතුය.

- **අසල්වාසීන් මුරකිරීමේ, ක්‍රම :** මේ ආකාර නිරායුද මුර සංචාරයක් යෙදීමෙන් රාත්‍රි කාලයේදී ඕනෑකමින් හෝ ද්වේශ සහගතව දේපල විනාශ කිරීම හෝ පැහැර ගැනීම අධෛර්මත් කළ හැකිය. නමුත් එම කණ්ඩායම් ක්‍රියා කාරී විය යුත්තේ වැරදි ආකාරයෙන් භාවිතය වැළක්වීමට සුදුසු වන පරිදියි. කණ්ඩායම් මැනවින් පුහුණු කළ යුතුය. එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්වරයාගේ ක්ෂේත්‍ර ආරක්ෂක උපදේශක, සහ මාසික දීමනාවක් ලැබීම උදහරනයකි. (උදාහරණ ඝානාවේ බුදුබුරාම් සරණාගත කඳවුරනි. පහත කොටුව බලන්න.)

- **මැදිහත් වීමේ ප්‍රයත්න:** කඳවුරු වැසියන් අතර අභ්‍යන්තර අර්බුද ඇති වුවහොත්, කණ්ඩායම් විසින් මූලික වශයෙන් ප්‍රජා මැදිහත්කරවීම මගින් සිදුකිරීම දිරිමත් කළ යුතුය. බොහෝ විට සාම්ප්‍රදයික අර්බුද නිරාකරණය කිරීමේ ක්‍රම යොද ගැනීම සුදුසුය. එම ප්‍රයත්නය අසාර්ථක වන අවස්ථාවන්හි කණ්ඩායම බලධාරීන්ට හෝ අදල රටේ පොලිසියට අර්බුද විසඳීමට ඉල්ලීමක් කළ හැකිය.

- **ප්‍රාදේශීය ප්‍රජාව සමග නිතිපතා රැස්වීම:** ප්‍රාදේශීය ප්‍රජාව සහ කඳවුරු වාසි අවතැන් වුවන් සමග නොසන්සුන්තාව සහ අර්බුද ඇතිවීමට ඉඩ ඇති අවස්ථාවන්හි ඔවුන්ගේ අදල නියෝජිතයන් සමග නිතිපතා රැස්වීම් පැවැත්වීම උනන්දු කළ යුතුය.

- **මත්පැන් සහ මත්ද්‍රව්‍ය අනිසි ලෙස භාවිත කිරීම.:** අනිසි ලෙස මත්පැන් සහ/හෝ මත්ද්‍රව්‍ය භාවිතා කිරීම වෙහෙස කරන, විෂාදියෙන් පෙළෙන සහ මානසික ආතතිය, නිසාවෙන් පවුල හෝ ඔවුන්ගේ ප්‍රජාව තුළ ප්‍රචණ්ඩකාරී ස්වභාවයක් ඇතිවීමට පුලුවන. එවැනි තත්වයන් වැළැක්වීමට පියවර ගත යුතුය.

- **කාර්ය මණ්ඩලය තාවකාලිකව ඉවතට ගැනීම:** හමුද අර්බුද හෝ ප්‍රචණ්ඩත්වයට යොමුවිය හැකි නොසන්සුන්තාව, වැනි අවස්ථාවලදී කාර්ය මණ්ඩලය තාවකාලිකව ඉවතට ගැනීම අවශ්‍යය.

- **සත්කාරක රජය සමග සම්බන්ධකරණය:** සම්බන්ධිකරණය/සම්බන්ධතාව සත්කාරක රජය මගින් සිදුවිය යුත්තේ හමුද ආරක්ෂාව ලබාදීම, අවශ්‍ය අවස්තාවලදී/කඳවුරු පිහිටුවීම සඳහා මාරුවීමේ දී යන අවස්තාවලදිය.

- **හදිසි අවස්ථාවන් සඳහා සහායක රථයක් තබා ගැනීම:** ඇතොත්, සහයක රථයක් හදිසි අවස්ථා සඳහා ප්‍රයෝජනයට තබගත යුතුය. බොහෝ විට හදිසි අවස්ථා සිද්ධ වන්නේ රාත්‍රි කාලයේදී සහ කඳවුරු කළමනාකරණ කාර්ය මණ්ඩලය නොමැති සති අන්තවල දීය.

- **දේශසීමා හරස් කිරීමේ රැස්වීම් :** කඳවුරක් වැසීමේදී කඳවුරු ප්‍රජාව ආරක්ෂාව සහිතව සහ ගෞරවයකින් යුතුව ආපසු යෑමට සුදනම්වීමේදී දේශසීම හරහා යෑමේ රැස්වීම්වලට කණ්ඩායම් සහභාගී විය යුතුය.

## අසල්වැසි මුර කිරීමේ කණ්ඩායම :

(ගානාහි බුරිබුරාම් සරණාගත කඳවුර උදාහරණයකට ගනිමු)

බුදුබුරාම්හි ප්‍රාදේශිය පොලිසියේ සීමාන්තික හේතුවෙන්, කඳවුරේ අධික තදබදය, සන්නද්ධ හොරකම්, පහරදීම් ද ඇතුළුව අපරාධ සිදුවීම්වල වර්ධනයක් ඇති වීම හේතුවී ඇත. මහ අක්‍රා පුරාම බුදුබුරාම් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ අපරාධ වැඩි අප්‍රසන්න තැනක් වශයෙනි. මීට ප්‍රතිචාරයක් වශයෙන් කඳවුරු වැසියන් විසින් පොලිසියේ ප්‍රමාණය බලගතු කිරීම සඳහා රාත්‍රිකාලයේ මුර සංචාරයක් සකසන ලදි. එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් විසින් ඉටුකෙරේ. මෙය කඳවුරේ ආරක්‍ෂක කරුණු, වැඩිවන අසුබවාදි ප්‍රසිද්ධිය මර්දනකර සරණාගත ක්‍රියාවන්ට සහායවීමට සුදුසු අවස්ථාවක් ලෙසිනි. ආරම්භයේ සිටම, කඳවුරු කලමණාකර කණ්ඩායම සහ පොලිසිය විසින් බලවත් ලෙස දිරිමත් කරන ලදි.

අසල් වැසි මුර සංචාර කණ්ඩායම ස්ත්‍රී, පුරුෂ 200 කගේ ස්වේච්ඡා සමාජික පිරිසකගෙන් සමන්විතය. මුරසේවයට කාන්තා ස්වේච්ඡා සහභාගිත්වය කාන්තාවන්ට විශේෂ රැකවරණයක් ඇති කිරීම සහ ඔවුන්ගේ උත්සාහය මුර සේවයේ වඩාත් අගය කරන ලද අංගයකි. ලිංගික මෙහෙවර සහ ලිංගික මූලික ප්‍රචණ්ඩත්වය පිළිබඳව කණ්ඩයම් සමාජිකයින් පුහුණු කිරීම මුර සේවයේ නියුතු නියුතු කාන්තාවන්ගේ කාර්ය භාරය තහවුරු කරන්නට උදව් වෙයි. හැම සමාජිකයෙකුගේම මෙහෙවර සහ වගකීම් විස්තර කෙරෙන ව්‍යවස්ථාවකින්, සියල්ලම සංවිධානයක් ලෙස, කන්ඩායමට මග පෙන්වනු ලබයි. ගානා පොලිස් සේවය මගින් ව්‍යවස්ථාව පිළිගනු ලැබූ අතර පිරික්සීමට ලක් කොට අසල්වැසි මුරසේවා සාමාජිකයෝ පුහුණු කරනු ලැබූහ. තවදුරටත් සහායක මූල පිරිමි එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස් (UNHCR) විසින් සියලුම සාමාජිකයින්ට පිට ඇදුම්, වැහි කබා, විදුලි පන්දම්, විසිල්, ලී බැටන් පොලු, බූට් ආදිය ලබා දෙනු ලැබීය. එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් මගින් ලිංගික ප්‍රචණ්ඩත්වයක් වැලැක්වීමට සහ ප්‍රතිචාර දැක්වීමට පුහුණුවක් ද ලබා දෙනු ලැබීය.

(තොරතුරු ලබාදෙනු ලැබුවේ සර්ප් රැකවරණ ව්‍යාපෘතිය මගිනි. වැඩිපුර තොරතුරු සඳහා http://www.theire.orq)

# මෙවලම් කට්ටලය

**සිද්ධි වාර්තා කිරීමේ පෝරමය** IRC
බලන්න මෙහෙයුම් කට්ටලය පරිච්ඡේදය 05

**ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිද්ධි වාර්තා කිරීමේ පෝරමය :**
බලන්න මෙහෙයුම් කට්ටලය 07

**අපරාධ වර්ග සහ සිදුවිය හැකි ප්‍රතිචාර :**
මෙම ලේඛනය සකසන ලද්දේ කඳවුර කළමනාකරණ ව්‍යාපෘතිය මගිනි. එය සිදුවිය හැකි අපරාධ ගැන සවිස්තරාත්මක නොවන චිත්‍රයක් ලබා දෙයි. එසේම කඳවුරු කළමනාකරණ කණ්ඩායම කඳවුරේ දෛනික කටයුතු ගැන ක්‍රියා කරනවා ඇත. තවද, ඒවාට ප්‍රතිචාර දැක්වීමට යම් මාර්ග ද යෝජනා කරයි.

**ආරක්‍ෂාව පිළිබඳ අභ්‍යාස සැලැස්මක් පිහිටුවීම සඳහා හරි වැරදි බැලීමේ ලේඛනය**
අභ්‍යාස ආරක්‍ෂක සැලැස්මක් කිරීමේදී සලකා බැලිය යුතු, අවශ්‍ය ප්‍රශ්න සහ නිර්දේශ, කඳවුර කළමනාකරණ කණ්ඩායම් විසින් හරි වැරදි බැලීමේ ලේඛනයකින් සකසා ඇති අතර එය ඔවුන්ගේ ප්‍රධාන වගකීමක් ද වේ.

**බුදුබුරාම් අසල්වැසි මුර සංචාරක කණ්ඩායමේ ව්‍යවස්ථාව (සර්ජ් රැකවරණ ව්‍යාපෘතිය)** IRC
අසල්වැසි මුර සංචාරක කණ්ඩායම පිළිබඳ අදහස සැලසුම් කොට ක්‍රියාත්මක කරනු ලැබුවේ සර්ජ් එලදයි මෙහෙයුම් සමාජිකයින් විසින් කඳවුරු කළමනාකාර කණ්ඩායමේ සහ බුදුබුරාම් සරණාගත කඳවුරු නිවැසියන්ගේ සහයෝගයෙන්, ඝානාවේ දී 2003 වසරේදීය. මෙම ව්‍යවස්ථාව කඳවුරු නිවැසියන්ට තමන් විසින්ම ආරක්‍ෂක කණ්ඩායම් වශයෙන් ක්‍රියාකාරීවීම පිළිබඳ උදාහරණයක් ලෙස ගත හැකිය.

## අවශ්‍ය කියවීම් සහ සමුද්දේශ :

- UNHCR 2003 සුරක්ෂිත බව සහ රැකවරනය EC/53/SC/CRP.5
- ODI විදේශ සංවර්ධන ආයතනය කොෂන්රාඩ් වාන් බ්‍රාබාන්ට් 2000 ප්‍රචණ්ඩකාරී වාතාවරණ තුළ ආරක්‍ෂණ කළමනාකරණ මෙහෙයුම, හොඳ පුහුණු විවරණය 8, මානව උපදේශන ක්‍රියා මාර්ග ජාලය / විදේශ සේවා සංවර්ධන ආයතනය, ලන්ඩන්.
- UNHCR 2003 හදිසි අවස්ථා සඳහා අත්පොත
- UNHCR 2004 ලියාපදිංචි කිරීම සඳහා අත්පොත.
- UNHCR 2001 සරණාගත රැකවරණය ජාත්‍යන්තර සරණාගත නිතිය සඳහා මග පෙන්වීමක්. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා අත්පොත. ජිනිවා - UNHCR
- UNHCR 1991 සරණාගත කාන්තාවන් ආරක්‍ෂා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ ජිනිවා - UNHCR
- UNOCHA 1998 අභ්‍යන්තර අවතැන්වූවන් ගැන මාර්ගෝපදේශ ප්‍රතිපත්ති - ජිනිවා
- UNOCHA 1999 අභ්‍යන්තර අවතැන් වන්නන් ගැන මාර්ගෝෂදේශ ප්‍රතිපත්ති අතුළත් අත්පොත. ජිනිවා - UNOCHA
- නෝර්වීජියානු සරණාගත කවුන්සිලය (NRC) ජගත් අවතැන්වූවන් පිළිබඳ සමීක්ෂණය, 1988 - "හිමිකම් වෙනුවෙන් සීමා මායිම් නැත. ලොව වටා අභ්‍යන්තර අවතැන්වීම." ජිනිවා - NRC
- වින්සන්ට්, බී. / රෙප්ස්ලුන්ඩ් සොරෙන්සන්, B (EDS) NRC 2001, දේශ සීමා අතර අල්ලාගන්නා ලදි. අභ්‍යන්තර අවතැන්වූවන් පිළිබඳ ප්‍රතිචාර උපක්‍රම, ජිනිවා - ඔස්ලෝ.
- UNHCR 2002 ආරක්‍ෂක උපක්‍රම සැලසුම් කිරීම සහ මැනීමේ ප්‍රගතිය: එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් කාර්ය මණ්ඩලය සඳහා හරි වැරදි බැලීමේ ලේඛනය

- www.unchr.ch
- www.odi.orq.uk
- www.reliulweb.int/ocha oi

# අපරාධ වර්ග සහ වියහැකි ප්‍රතිචාර

| අපරාධය/අදාල වන්නේ<br>කඳවුරු ප්‍රජාව තුළ සිදුවන සුළු අපරාධ | විභව්‍ය ප්‍රතිචාරය |
|---|---|
| • සුළු හොරකම්<br>• කායික පහරදීම්<br>• ගෘහස්ත සුළු ප්‍රචණ්ඩ ක්‍රියා<br>• පහළ හමුද නිලධාරි දඩුවම්<br>• බීමත්කම<br>• මත්ද්‍රව්‍ය භාවිතය<br>• සූදු කෙළිම<br>• ද්වේශ සහගත පැහැර ගැනිම්<br>• සිවිල් ආරවුල්<br>• කිසියම් හෝ බලධාරියෙක් (එක්සත් ජාතින්ගේ ඒජන්සියක් සහ රාජ්‍ය නොවන සංවිධාන) ගෙන් සරණාගතයින්ට විය හැකි නිහතමානි සුරාකැමක් සහ නොමනා හැසිරීමක්. | • ප්‍රජා සහායක උපක්‍රම ක්‍රියාත්මක කිරීම<br>• හැසිරීම් චර්යා පටිපාටිය පිළිබඳ කඳවුරු වැසියන් දිරිමත් කිරීම පිණිස සාකච්ඡා කිරීම.<br>• සරණාගතයින් ස්වයං පාලකයන් සහ ස්වයං මෙහෙයුම් ක්‍රමවේදයක් සඳහා දිරිමත් කිරීම.<br>• සරනාගත ප්‍රජාවගේ අර්බුද විසඳිමේ යාන්ත්‍රනයක් වගේම සාමයෙන් විසිමේ සහ සාමය ගොඩනැගිමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.<br>• ආදේශ කිරීම සහ/හෝ ප්‍රජා මුර සේවා යාන්ත්‍රණයක් ප්‍රවර්ධනය.<br>• එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස් සහ රාජ්‍ය නොවන සංවිධාන සහභාගිත්වය දියුණුකිරීම<br>• රැකවරණ නිරීක්ෂණය, විශ්ලේෂනය සහ ප්‍රතිචාර දැක්විමේ යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම. |
| **සත්කාරක ප්‍රජාව සහ කඳවුරු වැසියන් අතරවන සුළු අපරාධ**<br>• සුළු පහරකැම්<br>• කායික පහරදීම්<br>• ගෘහස්ත සුළු ප්‍රචණ්ඩ ක්‍රියා<br>• පහළ හමුද නිලධාරි දඬුවම්<br>• බීමත්කම<br>• මත්ද්‍රව්‍ය භාවිතය<br>• සූදු කෙළිම<br>• ද්වේශ සහගත පැහැර ගැනිම්.<br>• දේපල ගැන තර්ක විතර්ක<br>• බලෙන් විවහා කිරීම<br>• පාරිසරික අපරාධ/ස්වභාවික සම්පත් අධිකව භාවිතය<br>• සිවිල් ආරවුල්<br>• කිසියම් හෝ බලධාරියෙකු (එක්සත් ජාතින්ගේ ඒජන්සියක් සහ රාජ්‍ය නොවන සංවිධාන) ගෙන් සරණාගතයින්ට විය හැකි නිහතමානි සුරාකැම් සහ නොමනා හැසිරීමක් | • ප්‍රජා සහායක උපක්‍රම ක්‍රියාත්මක කිරීම.<br>• සරණාගත/සත්කාරක ප්‍රජා ජාලය සහ සේවක කණ්ඩායම් සබඳතාව දිරිමත් කිරීම.<br>• ස්ථානගත ප්‍රජාවගේ අර්බුද විසඳිමේ යාන්ත්‍රණයක් වගේම සාමයෙන් විසිමේ සහ සාමය ගොඩ නැගිමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.<br>• දේශිය සංමාධානය දිරිමත් කරණ වැඩසටහන් උනන්දු කිරීම.<br>• ආදේශ කිරීම සහ/හෝ ප්‍රජා මුරසේවා (පොලිසි යාන්ත්‍රනයක්) ප්‍රවර්ධනය කිරීම.<br>• රැකවරණය නිරීක්ෂණය කිරීම. විශ්ලේසනය සහ ප්‍රතිචාර දැක්විමේ යාන්ත්‍රනය සවිමත් කිරීම.<br>• සලකාබැලිම/QIP වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මේවා සත්කාරක ප්‍රජාවට ප්‍රයෝජනවත් වේ. |

| | |
|---|---|
| **කඳවුරු ප්‍රජාව තුළ  ිදුවන බරපතල අපරාධ**<br><br>• ළමා අපයෝජනය<br>• ස්ත්‍රී පුරුෂ සහ කාමුක පහරදීම්.<br>• හොරකම් (සන්නද්ධ හෝ වෙනත්)<br>• ද්වේෂ සහගතව දේපල ගිනි තැබීම<br>• කැරලි ගැසීම<br>• කොල්ලකෑම<br>• වංචා<br>• හොර අත්සන් තැබීම සහ හොරට ලියවිලි සැකසීම.<br>• බරපතල පහරදීම් සහ අඩන්තේට්ටම් කිරීම.<br>• මිනී මැරීම සහ/හෝ අත්වැරද්දක් නොවන ඝාතන<br>• බලෙන් ස්ත්‍රී දූෂණය<br>• බලෙන් විවහා කිරීම (යෝජිත විවහායට විරුද්ධව)<br>• නීති විරෝධී ගෙන්වීම්/පිටකිරීම්.<br>• නීති විරෝධී මානව ගනුදෙනු<br>• නීති විරෝධී මත්ද්‍රව්‍ය ගනුදෙනු<br>• ආයුධ (ගෙන යෑම)<br>• කඳවුරු ක්‍රියාකාරීත්වය යටපත් කරන ආකාරයට අකීකරුවීම | • අත් අඩංගුවට ගැනීමට සහ අපරාධකරුවන් රඳවා තැබීමට වගේම ප්‍රාදේශිය උසාවියට නඩුදැමීම සඳහා විශේෂඥයෙකුව යොමු කිරීම.<br>• නිලධාරී මට්ටමේ මානව ආරක්ෂණ තනතුරක් පිහිටුවීමට සලකා බැලීම (HSO)<br>• ප්‍රාදේශිය බලධාරීන්/ජාතික රජයෙන් වැඩි සහායක් ඉල්ලා සිටින්න.<br>• මානව උපදේශන සේවා පහසුකම් දියුණු කිරීම<br>• ආරක්ෂා ප්‍රමාණ ශක්තිමත් කිරීම<br>• සරණාගතයින්ට ස්වයං පාලනය සහ නොපසුබටව ක්‍රියාකිරීමේ හැකියාව දියුණු කිරීම.<br>• සරණාගත ප්‍රජාවගේ අර්බුධ විසඳීමේ යාන්ත්‍රනයක් වගේම සමගියෙන් එකට විසීමෙම් සහ සාමය ප්‍රවර්ධන කිරීමේ ව්‍යාපෘති පිහිටුවීම.<br>• ප්‍රජා ආරක්ෂක සේවා යාන්ත්‍රනයක් පිහිටුවීම සහ/හෝ උනන්දු කිරීම.<br>• එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්වරයා සහ රාජ්‍ය නොවන සංවිධාන සහභාගිත්ව පැමිණීම වැඩි දියුණු කිරීම.<br>• ආරක්ෂාව නිරීක්ෂණය කිරීම, විශ්ලේෂණය සහ ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලින් ශක්තිමත් කිරීම. |
| **කඳවුරු වාසීන් සහ සත්කාරක ප්‍රජාව අතර මානව හිතවාදී සහ මානව හිමිකම් උල්ලංඝනයවීම**<br>• ස්ත්‍රී දූෂණය (ඉලක්කගත, දරුණු, සංවිදනාත්මක)<br>• මිනිසුන්, ගැහැනු, පිරිමි දරුවන් සහ ගැහැනු දරුවන් උපයෝජනය<br>• මානව හිතවාදී සහය වළක්වා තබා ගැනීම.<br>• බලෙන් පැහැර ගැනීම<br>• වහල් මෙහෙයේ යෙදවීම<br>• වදහිංසා කිරීම.<br>• යුද අපරාධ | • ප්‍රාදේශිය පොලිසිය හෝ UNCIVPOL වලදයි ලෙස මෙහෙයවීම.<br>• ජාතික මානව හිමිකම් කොමිසමට අන්තර්ජාතික අපරාධ උසාවිවලට වරදකරුවන් සහ විශේෂඥ උපදෙස් අවශ්‍ය අය මුද හැරීම.<br>• මානව හිතවාද සහායක සේවා දියුණු කිරීම.<br>• ආරක්ෂක කටයුතු ප්‍රමාණිකව ශක්තිමත් කිරීම.<br>• ප්‍රජා සේවා ශක්තිමත් කිරීම<br>• සරණාගත ස්වයං පාලනය සහ නොපසුබටව මුහුණ දීමේ ක්‍රමවේදයන් ශක්තිමත් කිරීම.<br>• සරණාගත ප්‍රජාවගේ අර්බුද විසඳීමේ ක්‍රමවේද වගේම සමගියෙන් ජිවත්වීම සහ සාමය දියුණු කිරීමේ මං දියත් කිරීම. |

| | |
|---|---|
| **කඳවුරු යුදකාමී කරනය:**<br><br>• සන්නද්ධ හමුද කඳවුරේ විසීම<br>• අවි ආයුද එළිමහනේ ප්‍රදර්ශනය<br>• තර්ජනය කිරීම සහ/හෝ බලෙන් නම්මවා ගැනිම<br>• සහනාධාර සැපයුම් හමුද කටයුතු සඳහා හැරවීම.<br>• හමුද භටයින් විසින් කඳවුර හමුද කඳවුරු ලෙස භාවිතය.<br>• බදු පැනවීම සහ සන්නද්ධ අසවලුන් විසින් සරණාගතයින් ගෙන් සම්පත් එකතු කිරීම.<br>• පැහැර ගෙන යාම සහ/හෝ ප්‍රාණ ඇපයට ගැනිම<br>• බාහිර කාටාව විසින් සහ ප්‍රහාර (සන්නද්ධ)<br>• අංගෝපාංග කපා දැමීම සහ ඝාතනය | • ක්‍රියාත්මක කිරීම සහ/හෝ ප්‍රජා මුර සේවා ක්‍රමයක් දිරිමත් කිරීම<br>• එක්සත් ජාතීන්ගේ සරණාගත මහා කොමසාරිස් සහ රාජ්‍ය නොවන සංවිධාන සහභාගිත්වයට පැමිණිම.<br>• ආරක්‍ෂක නිරීක්‍ෂණය, විශ්ලේෂණය සහ ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේද.<br>• සත්කාරක ප්‍රජාවට ප්‍රයෝජනවත් QIP ව්‍යාපෘති ගැන සලකා බලන්න.<br>• පුහුණු කිරීම (ගමක් සඳහා හැකියාව වැඩිම) පොලිසිය/ප්‍රාදේශීය බලධාරීන්.<br>• වැරදකරුවන් වන අය වගේම විශේෂඥ උපදෙස් අවශ්‍ය වන අය අත් අඩංගුවට ගැනිම සහ රඳවා තබා ගැනිම, වැඩි කිරීම සහ පැවැරීම දඬුවම් පැමිණවීමට උසාවියේ භඩු පැවැරීම.<br>• මානව ආරක්‍ෂක නිලධාරියෙකුගේ (HSO) තනතුරක් ඇති කිරීම සලකා බැලිම.<br>• ප්‍රාදේශීය ආරක්‍ෂක සේවාවන්ගේ ශක්තිය දියුණු කිරීම.<br>• ආරක්‍ෂක තත්ත්වය දියුණු කිරීම<br>• ප්‍රජා සේවා ශක්තිමත් කිරීම<br>• සරණාගතයින්ගේ ස්වයංපාලනය සහ නොපසුබන්සා මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම<br>• සරණාගත ප්‍රජාවගේ අර්බුද විසඳීමේ ක්‍රමවේද වගේම සමගියෙන් ජීවත්වීම සහ සාමය දියුණු කිරීමේ මං දියත් කිරීම.<br>• මානව හිතවාදී සහායක සේවා තත්ත්ව දියුණු කිරීම.<br>• අනුගත කිරීම සහ/දිරිමත්, හෝ කිරීම ප්‍රජා මුර ක්‍රමයක්.<br>• එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් වරයා සහ රාජ්‍ය නොවන සංවිධාන සහභාගිත්වය දියුණු කිරීම.<br>• වැරදිකරුවන් වන අය වගේම විශේෂඥ උපදෙස් අවශ්‍ය වන අය අත් අඩංගුවට ගැනිම සහ රඳවා තබා ගැනිම වැඩි කිරීම සහ දඬුවම් පැමිණවීම සඳහා උසාවියට යොමු කිරීම.<br>• මානව ආරක්‍ෂක නිලධාරියෙකුගේ (HSO) තනතුරක් ඇති කිරීම සලකා බැලිම.<br>• UNCIVPOL හෝ ප්‍රාදේශීය පොලිසියක් නියුතු කිරීම.<br>• වැරදිකරන්නන් සහ විශේෂඥ උපදෙස්, සඳහා යොමු කළ යුක්තන් ජාතික මානව හිමිකම් කොමිෂම, ජාත්‍යංතර.<br>• DPKO හෝ ප්‍රාදේශීය යුද හමුදවක් පිහිටුවීම<br>• භටයන්/සන්නද්ධ අය වෙන් කර තැබීම.<br>• රඳවා තබා ගැනීමේ කඳවුරු පිහිටුවීම. |

# ආරක්ෂක අවිනිශ්චිතතා සැලැස්මක් සඳහා හරි වැරදි බැලීමේ ලේඛනයක් සැකසීම :

එවන් සැලැස්මක් සකසා පසු කටයුතු කිරීම කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීමකි. අවිනිශ්චිතතා සැලැස්මක් පිළියෙල කිරීමට පෙර අවශ්‍යයෙන්ම සැලකිය යුතු හරි වැරදි බැලීමේ දී සලකා බැලිය යුතු ප්‍රශ්න :

√ කඳවුරට පොලිසියේ පැමිණීමට හැකියාවක් ඇද්දැයි ස්ථාපනය කිරීම. (පැය විසිහතර පුරා) පැය විසිහතර පුරා පොලිසියේ පැමිණීමක් ඇතිව හෝ නොමැතිව රඳවා තබා ගැනීම් පහසුකමක් පවත්වා ගැනීම.

√ ආරක්ෂාව පවත්වා ගැනීමට අවශ්‍ය සම්පත් ප්‍රමාණය පිළිබඳව දැනුවත්ව සිටීම

√ සිදුවිය හැකි ප්‍රචණ්ඩත්වය පිළිබඳ අනතුරු හැඟවීමේ සළකුණු මොනවාද?

√ ප්‍රචාන්ඩත්වයක් ඇති වුවහොත්, එක්සත් ජාතීන්ගේ සරණාගත මහා කොමසාරිස්, රජයේ ආරක්ෂක සේවා, කඳවුරු කළමනාකරණ ඒජන්සියේ මූලස්ථානයට දැනුම් දීමට යොදා ඇති විධිවිධාන මොනවාද?

√ අදාල ප්‍රශ්නයේ පාර්ශ්වකරුවෙක් බවට පොලිසිය පත්වන විට යෙදවීමට අවශ්‍ය වන විකල්ප ක්‍රියා මාර්ග අවශ්‍යවේ.

√ ජාතික ආරක්ෂක බලධාරීන්ට දැනුම් දීමේ යම් අවශ්‍යතාවක් තිබේ ද?

√ ප්‍රචණ්ඩත්වය නිෂ්ක්‍රිය කිරීමට යෙදවිය හැකි ක්‍රමවේදයක් තිබේ ද.

√ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගත හැකි පියවර මොනවා ද?

- ආරක්ෂක සැලැස්ම?
- කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම, අදාල පුද්ගලයින් සම්බන්ධ කර ගැනීමට යොදනු ලබන මාර්ග?
- අනතුරු ඇඟවීමේ උපකරණ (විසිල්, සයිරන්, හෝන්, සංඥා)
- ගැලවීමේ මාර්ග, කාර්යාලය සහ පිටවීමේ ගේට්ටු අතර දුර
- කාර්යාලයයේ ආරක්ෂාව (දොර යතුරු, ජනෙල් ආරක්ෂාවන්)
- පවතින සංනිවේදන පහසුකම් (සැටලයිට් ෆෝන්, රේඩියෝ)
- පැමිණීමේදී හා පිටවීමේදී කාර්ය මණ්ඩලය ලියාපදිංචි කිරීම
- ලිපි ගොනු කැබිනට් වසාදැමීම
- කාර්ය මණ්ඩලයේ මානසික අසහනය දුරුකිරීමට උදව්විය හැකි විධිවිධාන මොනවා ද?
- අත්හැර දමා පිටවීම පිළිබඳ තිරණය කරනු ලබන්නේ කවුරුන් ද? එය ක්‍රියාත්මක කරනු ලබන්නේ කෙසේ ද?
- ආරක්ෂිත ස්ථානයක් යලි ස්ථානගත කිරීමට යොදනු ලබන ප්‍රවාහන පහසුකම් කුමක් ද?

**නිර්දේශ :**

- කඳවුරු ප්‍රජාව මගින් පිළිගනු ලැබූ අවස්ථාවලදී හැම කඳවුරකටම පොලිසියේ පැමිණීම ස්ථිර කළ යුතුය. (පොලිසිය අපක්ෂපාති අංශයක් බව සැළකිය යුතුය.)
- පොලිස් නිවස්නයන් (කාර්යාලය සහ නවාතැන්) කඳවුර තුළ ගොඩනැගිය යුතුය.
- රජයට අවශ්‍ය සම්පත් නොමැති අවස්ථාවලදී සහය විය යුතුය (එක්සත් ජාතීන්ගේ ඒජන්සි මගින්)

- ස්වේච්ඡා ආරක්‍ෂාවන් කඳවුර තුළ සංවිධානය කළ යුතුය.
- පොලිසිය සහ ස්වේච්ඡා ආරක්‍ෂකයන් අතර සමීප සබඳතාවක් සඳහා දිරිමත් කරන්න.
- නිත්‍ය පදනමෙන් මත ස්වේච්ඡා ආරක්‍ෂකයින් සඳහා මෙහෙයුම් පරිපාටින්, ලිංගික කරුණු ආදිය පිළිබඳ පුහුණු වක් ලබාදිය යුතුය.
- ස්වේච්ඡා ආරක්‍ෂකයින්ගේ හැකියා වර්ධනය පිළිබඳව දිරිමත් කළ යුතුවේ.
- ආරක්‍ෂාව ක්‍රියාත්මක කිරීමේදී මෙහෙයුම් පරිපාටියට ගරු කටයුතුය. (කඳවුරට හමුද පුද්ගලයින් පැමිණීමේදී)
- සම්පත් ඇති නම් ආරක්‍ෂණ උපකරණ ලබාදීම වැදගත්ය.
- කඳවුරට ඇතුළුවන ප්‍රධාන දොරටුව ඇත්තේ මාර්ගයක් දිගේ නම් කඳවුරට වාහනවලින් පැමිණෙන හා පිටව යන අය පරීක්‍ෂා කිරීමට පරීක්ෂණ බාධකයක් පිහිටුවිය යුතුය. මේ මගින් ආහාර, අවිආයුධ හෝ පුද්ගලයින් පිටකිරීම අධෛර්යමත් කිරීම පිළියමක් වේ. මාර්ග පිරික්සුම් බාධකය රාත්‍රී කාලයේ දී හෝ එකග වූ වෙලාවක් තුළ එලිවන තුරු වසා දැමිය යුතුය.

# බුදුබුරාම් අසල් වැසි මුර සේවා කණ්ඩායමේ ව්‍යවස්ථාව

හැඳින්වීම:

ලයිබීරියාවේ යුද වැදී සිටින කල්ලි අතර ඇතිවී ඇති බියජනක, අමානුෂික සන්නද්ධ අරගල හේතුවෙන් අපගේ නිජබිම වන ලයිබීරියාවෙන් පලාගිය අවස්ථාවේ සිට සර්වබලධාරී දෙවියන්ගේ ආශිර්වාදය ලැබේ.

ස්වකීය වර්ගයාට එරෙහි එල්ල වී ඇති දරුණු මිලේච්ඡ ක්‍රියාවන් වලින් ලබන ලද අතර දැකිම් සහ ලබා ඇති අවබෝධය ඇතිව

ගානාවේ හිතෛෂී ජනතාව සහ රාජ්‍ය මගින් එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් වරයාගේ (UNHCR) සහයෝගයෙන් සලසන ලද මානව හිතවාදී සේවාවන් සහ වෙනත් මානව හිතවාදී ආයතන මගින් සලසන ලද සත්කාර ඇතිව ගානාවේ මධ්‍ය ප්‍රදේශයේ ගොමොවා දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති බුදුබුරාම් කඳවුර ආසන්න වශයෙන් (22000ක්) විසි දෙදහක් ලයිබීරියානු සරණාගතයින්ට රැකවරණය සැලකිල්ලට ගනිමින් අපගේ සමාජයේ ගෙවල් බිඳුම්, ස්ත්‍රී දූෂණ, සන්නද්ධ හොරකම් යලි ඇතිවීම අවම කිරීම හෝ වැලැක්වීම පිණිස ආරක්‍ෂාව බලගැන්වීම විචක්ෂණයෙන් යුතුව කල යුතු බව, අපගේ කඳවුරේ ආරක්‍ෂාව සැපයීමට සත්කාරක රජයේ පරම වගකීම පිළිගනිමින් :

බුදුබුරාවේ අසල්වැසි මුරසේවා කණ්ඩායම, රාජ්‍ය නොවන, දේශපාලනික නොවන ප්‍රතිලාභ නොලබන සංවිධානයක් ලෙස අපගේ කඳවුරේ සහ ප්‍රජාවගේ ආරක්‍ෂාව සොයා බලන සත්කාරක රජයට ස්වේච්ඡාවෙන් සේවය කිරීමට බැඳී සිටින සංවිධානයක් ලෙස අධිෂ්ඨානය කරගෙන සිටිමු.

## පළමුවන වගන්තිය : අරමුණු සහ අභිප්‍රායයන්

අසල්වැසි මුර සේවා කණ්ඩායමේ අරමුණ වන්නේ ප්‍රජා සංවිධානය මගින් කඳවුර තුළ ආරක්‍ෂාව වැඩි දියුණු කිරීමය. අසල් වැසි මුර සේවා කණ්ඩායම ක්‍රියාත්මක වන්නේ ස්වේච්ඡා යෝජනා ක්‍රමයක් ලෙස රාත්‍රි කාලයේ මුර සේවයේ නියුතුවීමයි.

## අසල්වැසි මුරසේවා කණ්ඩායමේ විශේෂිත අභිප්‍රායයන්

(අ) රාත්‍රි කාලයේ සහ ඇඳිරි නීතිය ක්‍රියාත්මක වන හෝරාවන් තුළ කඳවුරේ එහි මෙහා යෑම් නිරීක්ෂණය කිරීම (ඇඳිරි නීතිය අවශ්‍යතාව, ක්‍රියාත්මක වන වේලාව, තීරණය කරනු ලබන්නේ කඳවුරු පොලිසිය සහ කඳවුරු පරිපාලනය සහගාමීවය)

(ආ) සංචලනයන් ලේඛනගත කොට වාර්තා කිරීම වගේම කඳවුරේ ප්‍රජා විනයට බාධවන සිද්ධි ද ලේඛනගත කොට වාර්තා කළ යුතුය.

(ඇ) කඳවුරු වැසියන්ගේ හෝ ඔවුන්ගේ දේපල වල ආරක්‍ෂාවට අන්තරායකාරීවන සිදුවීම් ගැන අවධානයෙන් සිටීම සහ පොලිසියේ සහ / හෝ කඳවුරු කළමනාකරනයේ සහාය සෙවීම.

(ඈ) රාත්‍රි කාලයේ සිදුවිය යුතු සංචලනයන් (අළුතෙන් පැමිණෙන අය) වලදී කඳවුරේ පොදු පැවැත්මට කරදරයක් නොවීමට වගබලා ගත යුතුය. එසේම ඇඳිරි නීතිය පවතින වේලාවේ/රාත්‍රි කාලයේ උදව් ඉල්ලා සිටින අයට සුදුසු සහාය සහ උපදෙස් ලබාදීම සහතික විය යුතුය.

## දෙවන වගන්තිය : ශික්ෂාව සහ ආචාරශිලිබව :

අසල්වැසි මුරසේවා කණ්ඩායමේ සමාජිකයින් හැම කල්හි සැමට ආචාරශිලි බව, ශික්ෂාව සහ ගෞරවාන්විත වෙනවා ඇත.

අසල්වැසි මුර සේවා කණ්ඩායමේ සමාජිකයින් විසින් ගානාවේ නතර වී ඉන්නා කාලය තුළ සහ කඳවුර තුළ ඉන්නා විට ආචාර සම්පන්නව සිටීමට තරයේ බැඳී සිටිනවා ඇත.

අසල් වැසි මුර සේවා කණ්ඩායමට අයත් සාමාජිකයින් වැළකී සිටිමට එකඟවේ:

කටකතා පැතිරවීමෙන්, බොරු කීමෙන් සහ වැරදි තොරතුරු ඉදිරිපත් කිරීමෙන්, සේවසේ නියුතුවීමට පෙර හෝ නියුතුවීමෙදී බීමත්වීමෙන්, නිළ ඇඳුම් ඇද සිටියදී දුම් බීමෙන්, නිළ ඇඳුමෙන් නැටීමෙන්, රාජකාරී වෙලාවේ නිදා ගැනීමෙන්, රාජකාරී වෙලාවේ දෙදෙනා බැගින් අහර ගැනීමෙන්, සුදු කෙළිමෙන්, කලහ කිරීමෙන් අසැබි බසින් කථා කිරීමෙන්, වෛශ්‍යා සේවනයේ යෙදීමෙන්, ගානාවේ දේශපාලනයට සම්බන්ධ වීමෙන්, ගෝත්‍රික දේපොලනයේ නියළීමෙන්, අල්ලස් ගැනීමෙන්, කප්පම් ගැනීමෙන්, නිවාඩු නොලබා නොපැමිණීමෙන්, වැළකී සිටිමට එකගවේ.

ඉහත නියමයන් උල්ලංගනය කරන සමාජිකයින් උපදේශනය මගින් විනයානුකූල කිරීම, තාවකාලිකව සේවය නතර කිරීම සහ/හෝ කණ්ඩායමේන් ඉවත් කිරීම, වැරදි ක්‍රියාවේ බරපතලකම අනුව සලකා බලා කරනු ඇත.

කිසියම් හෝ නීති විරෝධි ක්‍රියාවකට හෝ පැවැත්මක් සම්බන්ධව කණ්ඩායමේ සාමාජිකයින්ට බලපැවැත්වෙන ජාතික නීතියට සහ ඒජන්සියේ නිතියට යටත් විමට සිදුවේ.

**තුන්වන වගන්තිය : සමාජිකත්වය**

සරණාගතයෙක් ලෙස කඳවුරක වෙසෙන ඕනෑම අයෙකුට ස්වේච්ජා සේවකයෙක් ලෙස බුදුබුරාම් අසල්වැසි මුරසේවා කණ්ඩායමේ සාමාජිකත්වය ලබා ගැනීමට ඉඩකඩ තිබේ. ඒ අනුව මේ විට ගැහැණු පිරිමි දෙපිරිසම ඇතුළු ස්වෙච්ජා සමාජික සංඛ්‍යාව 200 ක් පමණ වේ.

ගානා පොලිසිය විසින් අසල්වැසි මුර සේවා කණ්ඩායමට අයත් සාමාජිකයින් සියලු දෙනාම, පිළිබඳ තොරතුරු සොයා බලන අතර යම් අපරාධයකට සම්බන්ධ බවට වාර්තාවන අය සමාජිකත්වය ලැබීමට නුසුදුසු වේ.

**හතර වන වගන්තිය : සංවිධානත්මක ව්‍යුහය :**

අසල්වැසි මුරසේවා කණ්ඩායමේ විධායක කමිටුව මුලිකත්වය ගනු ලැබේ.

විධායක කමිටුව කණ්ඩායමේ මුලිකයා ද ඇතුළුව, නියොජ්‍ය කණ්ඩායම් නායක, ක්‍රියාකාරි සම්බන්ධිකරක, විමර්ශන සම්බන්ධිකාරක, මුර සේවා සම්බන්ධිකාරක සහ උපදේශක යන හය දෙනෙකුගෙන් සමන්විත වේ.

අසල්වැසි මුර සේවා කණ්ඩායමේ විධායක කමිටුව ඉහළම මට්ටමේ. සාකච්ජා සහ තිරණ ගැනීමේ අංගයයි.

**විස්තෘත නායකත්වය :**

**අසල්වැසි මුර සේවා කණ්ඩායමේ විස්තෘත නායකත්වයට සියලුම කලාපිය අසල්වැසි මුර සේවා කණ්ඩායම් නායකයින් වගේම කාන්තා උපස්ථම්භක නියෝජිතයින් ද අයත් වේ.**

**ක්‍රියාකාරීන් :**

සෑම කලාපයක්ම නිර්හිත පිරිමි සහ කාන්තාවන් දාහතකින් (17) සමන්විතය. (කලාප කණ්ඩායම් මුලික සහ නියෝජ්‍ය මුලික ද ඇතුළුව)

එහෙයින් කලාප එකොළහක් (11) ක් අසල්වැසි මුර සේවා කණ්ඩායම් ක්‍රියාකාරීන් ලෙස හඳුනාගනු ලැබේ.

## පස්වන වගන්තිය : මෙහෙවර සහ වගකීම් :

### අසල්වැසි මුරසේවා කණ්ඩායමේ මුලිකයා :

අසල්වැසි මුර සේවා කණ්ඩායමේ මුලිකයා කණ්ඩායමේ සම්පූර්ණ බලධාරියා බවට පත්වේ. අසල් වැසි මුර සේවා කණ්ඩායම නිල නියෝග අනුව පවත්වා ගෙන යැමට සහතික විය යුතුය. කණ්ඩායමේ මුලිකයා අසල්වැසි මුරසේවා කණ්ඩායම කාර්යක්ෂම සහ සාර්ථකව පවත්වා ගෙන යන බවට සහතික විය යුතු විම සහ සමාජිකයින් ඔවුන්ගේ රාජකාරී ඉටු කිරීමේදී වෘත්තිමය වන බවට සහතික විය යුතුය. ඒවගේම කණ්ඩායම් නායකයා නිතිරිති උල්ලංගනය කරන සමාජිකයින් නියමාකාරයෙන් හැසිරිවිමටද සහතික විය යුතුය. කණ්ඩායම් මුලිකයා විසින් ලයිබිරියනු සුභසාධක කවුන්සලයේ ආරක්‍ෂක සම්බන්ධිකාරක වෙත වාර්තා කළ යුතුවේ.

### අසල්වැසි මුරසේවා කණ්ඩායමේ නියෝජ්‍ය ප්‍රධානි :

අසල්වැසි මුරසේවා කණ්ඩායමේ නියෝජ්‍ය ප්‍රධානි දෙවන බලධාරියාවේ. ඔහු අසල් වැසි මුරසේවා කණ්ඩායමේ මෙහෙයුම් ක්‍රමවේද සුමටව පවත්වා ගෙන යැමට ඔහු සහතික විය යුතුය ඔහු විසින් කළාපිය නායකයින් විසින් එවනු ලබන වාර්තා විමසුමට ලක් කොට දෛනික පදනමක් මත කණ්ඩායම් මුලිකයාගේ කාර්යාලයට ඉදිරිපත් කළ යුතුවේ. විවිධ කලාපවල අසල් වැසි මුර සේවා කණ්ඩායම්, සමාජිකයින්ගේ සේවා පුරුදු පිළිබඳව පෞද්ගලිකව සොයා බැලිය යුතුවා සේම ඔවුන් කාර්යක්‍ෂමව සහ සාර්ථකව සහ ගෞරවයෙන් යුතුව සරණාගතයින්ගේ හිමිකම් වෙනුවෙන් ක්‍රියාකරන්නේ දැයි සොයා බැලිය යුතුය.

### විමර්ශන සම්බන්ධිකාරක :

විමර්ශන සම්බන්ධිකාරක විසින් කඳවුරු වැසියන්ගේ ආරක්‍ෂාව සහ ඔවුන්ගේ දේපල පිළිබඳ අඛණ්ඩව තොරතුරු එක්රැස් කිරීමට සහතික විය යුතුය.

### මුරු සේවා සම්බන්ධිකාරක :

මුරසේවා සම්බන්ධිකාරක රාත්‍රි මුර සේවාය බාධා කරදර රහිතව පවත්වා ගැනිම තහවුරු කළ යුතුය. මුර සේවාවට හැම කලාප කඳවුරකින්ම එක් ක්‍රියාකාරකයෙකු බැගින් ඇතුළත් විය යුතුය. මුරසේවා ආරම්භ විය යුත්තේ කඳවුරේ පිවිසුමේ දීය. කලාප අසල්වැසි මුර කණ්ඩායම්වල හදිසි අවස්ථාවක කැඳවුමකදී ප්‍රථමයෙන්ම ප්‍රතිචාර දැක්විය යුත්තේ මුර සේවාවය.

### උපදේශකවරයා :

උපදේශකවරයා අසල්වැසි මුරසේවා කණ්ඩායම් මුලිකගේ කාර්යලයේ දිනපතා පරිපාලනයට, සන්නිවේදනය, සැලැසුම් සංවිධානය හා සම්බන්ධිකරණය පිළිබඳව සහාය විය යුතුය සැලසුම් කර ඇති පරිදි අසල් වැසි මුර කණ්ඩායම ලිඛිත වාර්තා සහ සන්නිවේදන ගැන ඔහු සහතික විය යුතුය.

### කාන්තා උපස්ථම්භක ප්‍රධානි :

කාන්තා උපස්ථම්භක ප්‍රධානි, විස්තෘත අසල්වැසි මුරසේවා කණ්ඩායමේ සමාජිකයෙකු වශයෙන් සිටින්නේය. ඇය නියෝජනය කරනු ලබන්නේ කාන්තා සාමාජිකාවන්ගේ අභිලාෂයන්, ඕනෑ එපාකම් සහ අදහස්ය. ඇය විසින් සරණාගත කාන්තාවන්ගේ ඕනෑ එපාකම් අනුව ආරක්‍ෂාව වගේම ඔවුන්ගේ අවශ්‍යතාවන් පිළිබඳව මග පෙන්විය යුතුවේ.

## හයවන වගන්තිය : නායකත්ව පත්කිරීම්

(අ) නම් කිරීමෙන් පසුව කඳවුරු කළමනාකරුගේ කාර්යාලය සහ ලයිබේරියානු සුභ සාධක කවුන්සලයේ කළමනාකරිත්වයේ මැදිහත් විමෙන් විධායක සමාජිකයින් හය දෙනා පත් කළ යුතුය.

(ආ) වෙනත් සියලුම පත්වීම් කරනු ලබන්නේ ලයිබීරියානු සුභසාධක කවුන්සලයේ ආරක්‍ෂක සම්බන්ධීකරක විසින් සංගාමිව සහ අසල් වැසි මුරසේවා කණ්ඩායමේ නායකත්වය මගින්, අසල් වැසි මුර සේවා කණ්ඩායමේ විස්තෘත නායකත්වයේ නම් කිරීමෙන් පසුවයි.

## හත්වන වගන්තිය : රැස්වීම්,

(අ) අසල්වැසි මුර කණ්ඩායම් සියලුම සමාජිකයින් කැඳවනු ලබන සියලුම රැස්වීම්වලට සහ පෙරටේටුවලට පැමිණීමට බැඳී සිටී.

(ආ) හොඳින් සැලසුම් ගත න්‍යායපත්‍රයකට අනුව සෑම රැස්වීමක්ම පැවැත්විය යුතුය.

(ඇ) එසේම සියලුම විධායක සමාජිකයින් සහ කාර්ය මණ්ඩලය සෑම විධායක කමිටු රැස්වීම් සහ සැසිවලට පැමිණීමට බැඳී සිටී. අවශ්‍ය විට කලාපීය සුපිරින්ටෙන්ඩන්වරුන්ට සහ කලාප කමාන්ඩර්වරුන්ටද පැමිණෙන ලෙස ඉල්ලා සිටිය හැකිය.

## අටවන වගන්තිය : එක්සත් ජාතින්ගේ සරණාගත මහා කොමසාරිස්වරයාගේ වෙනත් මානව හිතවාදී සංවිධාන සහ ගානා රජයේ සහාය.

(අ) අසල්වැසි මුර සේවා කණ්ඩායම මගින් එක්සත් ජාතින්ගේ සරණාගත මහා කොමසාරිස්වරයා, වෙනත් මානව හිතවාදී සංවිධාන සහ ගානා රජයේ සහාය ඔවුන්ගේ කටයුතුවලදී ලබාගනී.

(ආ) සියලුම සමාජිකයින්ට සිය මෙහෙවර පවත්වාගෙන යෑමට පවරන ලද ද්‍රව්‍ය අසල් වැසි මුර කණ්ඩායමේ අරමුණුවලට අනුව භාවිතා කළ යුතු අතර බුදුබුරාම් ප්‍රජාවගේ දේපල ලෙස අසල්වැසි මුර සේවා කණ්ඩායමේ මූලික පරිපාලනය සහ ද්විතියික ලයිබීරියානු සුභ සාධක කවුන්සලේ පාලනය යටතේ පවත්වනවා ඇත.

## නමවන වගන්තිය : කාන්තා ආරක්‍ෂිකාවන්ගේ මෙහෙවර

(අ) අසල්වැසි මුරසේවා කණ්ඩායම් බුදුබුරාම් කඳවුරේ වෙසෙන සරනාගත කාන්තාවන් සම්බන්ධයෙන් වන්නා වූ විශේෂිත ලිංගික ආරක්ෂාව සහ කාන්තා ආරක්ෂිකාවන්ගේ මූලික මෙහෙවර සම්බන්ධයෙන් වන්නා වූ කටයුතු භාර ගනු ලැබේ.

(ආ) අසල් වැසි මුර සේවා කණ්ඩායම කාන්තා ආරක්‍ෂිකාවන්ගේ තරාතිරම්, නායකත්වය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය ගැන බැඳී සිටී.

## දහවන වගන්තිය : වාර්තා කිරීම

**අසල්වැසි මුර සේවා කණ්ඩායමේ සමාජිකයින් ඔවුන්ට පවරා අති රාජකාරී අනුව කඳවුරු වැසියන්ට හෝ ඔවුන්ගේ දේපලවලට යම් තර්ජනයක් හෝ ආරක්‍ෂාවට තර්ජනයක් සිදුවන විට කඳවුරු පරිපාලකට සහ/හෝ පොලිසියට දැන්විය යුතුය.**

අසල්වැසි මුර සේවා කණ්ඩායම විසින් ලයිබීරියානු සුභ සාධක කවුන්සලයේ ආරක්‍ෂක සම්බන්ධීකාරකවරයාට කලින් කලට ලිඛිත වාර්තා ඉදිරිපත් කළ යුතුය.

නිතිපතා වාර්තා කිරීමේ මාර්ගවලට බාධා ඇතිවී ප්‍රමාණවත් ප්‍රතිචාර නොලැබෙන විට අසල්වැසි මුරසේවා කාණ්ඩයමේ මූලිකයා විසින් කඳවුරු කලමනාකරුට පොලිසියට හෝ/සහ එක්සත් ජාතින්ගේ සරණාගත කොමසාරිස්වරයාට හදිසි කරුණු ගැන කෙලින්ම වාර්තා කළ හැකිය.

2002 ජනවාරි 27

# 9 ආහාර හා ආහාර නොවන ද්‍රව්‍ය බෙදා හැරීම



*ලයිබීරියාවේ විල්සන් කඳවුරෙහි දැරියක් සිය ආහාර වේල නිම කරයි. ආහාර යනු නිසි ලෙස කළමනාකරණය නොකළ හොත් පහසුවෙන් අලෙවි කළ හැකි සහ කඳවුරුවාසීන් මෙන්ම ආධාර සපයන්නවුන් සහ සටන්කාමීන් විසින් වැරදි ලෙස භාවිතා කළ හැකි ද්‍රව්‍යයකි. ඡායරූපය : ටොරිල් ස්කජෙටිනේ N.R.C.*

# පරිච්ඡේදය 9 : ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය බෙදා හැරීම

## හැඳින්වීම:

කඳවුරුවාසීන්හට ආහාර සහ නිසි පෝෂණය ලබාදීම සහතික කිරීම කවර කඳවුරකදී විශේෂයෙන්ම හදිසි අවස්ථාවක පිහිටුවන කඳවුරක දී - වුව සිදුවිය යුතු ප්‍රමුඛ අවශ්‍යතාවයන් ගෙන් එකකි. අවතැන් වූ පුද්ගලයන් තම තමන්ට අවශ්‍ය ආහාර රැගෙන ඒමට පැවති කාලය, තිබුණු හැකියාව සීමා වුවා පමණක් නොව බොහෝ අවස්ථාවල දී ඔවුන් ඊට පෙර ජීවත්ව සිටින්න ඇත්තේ ආහාර ඇතුළු සිය පෝෂණ අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි පරිසරයක විය හැකිය. මෙ නිසා බොහෝ සරණාගතයන් හා අවතැන්වූවන්ගේ පවුල් කඳවුරු කරා පැමිණෙන්නේද මන්දපෝෂණයෙන් පෙළෙමිනි.

කඳවුරු තුළ දී එහි වාසීන්ගේ පෝෂනීය සුභ සාධනය කඳවුරෙහි වෙනත් ක්ෂේත්‍ර හා සමඟ සම්පව සබැඳෙයි. ජලය, සනීපාරක්ෂාව, සෞඛ්‍යය, රැකවරණය සහ ආරක්ෂාව යන සියල්ලම ආහාර සුරක්ෂිතභාවය හා බැඳි විවිධ අංගයන් වෙති. ඉහත කී අංග වල සේවා සැපයීම මේ වගකීම උසුලන විවිධ ආයතනයන්හට සෞඛ්‍යය, ආහාර සහ පෝෂණ්‍ය අතර පවත්නා අන්තර් සබඳතාවයන් මැනවින් අවබෝධ කර ගැනීමට සැලැස්වීම කඳවුරු කළමනාකරණ ආයතනයෙහි වගකීමක් වෙයි. මන්දපෝෂණයට පසුබිම් වන හේතු බොහෝ විමට මෙම අන්තර් සබැඳියා සාධක වල ඒකාරාශිවීමකි. මෙයට අමතරව ආහාර ද්‍රව්‍ය වල උග්‍ර හිඟකම, අහිතකර සනීපාරක්ෂාව, ජල පහසුකම් හිඟකම, අවශ්‍ය සත්කාරය නොලැබීම සහ ප්‍රමාණවත් නොවන සෞඛ්‍ය සේවා සැපයුම ආදිය ජනතාවගේ සමස්ත පෝෂණ මට්ටම හා සෞඛ්‍යය කෙරෙහි බලපානු ලබන වැදගත් සාධක වෙති. (ආහාරමය නොවන ද්‍රව්‍ය සඳහා 177 පිටෙහි මෙම පරිච්ජේදයෙහි දෙවන කොටස බලන්න)

## සංකල්පය සැකිල්ල:

සරණාගතයින් සහ අභ්‍යන්තරික වශයෙන් අවතැන් වූ පුද්ගලයන් යන දෙපිරිස සඳහාම ප්‍රධාන අහාර සැපයුම්කරුවකු / සැපයුම් මාර්ගයක් වනනේ ලෝක ආහාර වැඩ සටහනය. මේ අතර එක්සත් ජාතීන් ගේ සංවිධාන පද්ධතියට අයත් නොවන අන්තර් ජාතික ආයතන කිහිපයක් ද මෙම වගකීම දරයි. බොහෝ විට ආහාර සපයන ඒජන්සිය මගින් සපයන ආහාර කඳවුරු තුළ බෙදා හැරීමේ භාරකාරත්වය දරනුයේ ආහාර බෙදා හැරීමේ හවුල්කරුවකු (බොහෝ සෙයින් රාජ්‍ය නොව සංවිධානයන්) විසිනි. ආහාර කඳවුරු කළමනාකරනය බෙහෙවින් මතභේදයට තුඩුදෙන්නක් ලෙස සැලකෙයි. සැපයූ ආහාර ප්‍රමාණයෙන් මෙන්ම ගුණාත්මක බව අතින් ද නොසෑහෙනවා පමණක්ව නොව සපයන සලාකය තුළ අවතැන් වූ ජනාතව නොදන්නා ආහාර වර්ග පැවතීමට ද ඉඩ තිබේ. කඳවුරු නේවාසිකයින් තමන්ට සැපයූ සමහර ආහාර සකස් කර ගන්නා හැටි නොදැන සිටිය හැකිය. එසේ නැතිනම් එම ආහාර රසවත් කිරීමට යෙදිය යුතු කුළු බඩු ආදිය ඔවුන්ට නොසපයා තිබීම හෝ සොයා ගත නොහැකිවීමට හෝ ඉඩ ඇත. ආහාර පහසුවෙන් අලෙවි කර ගත හැකි ද්‍රව්‍ය නිසාම කඳවුරු වාසීන්, ඔවුනට මානවවාදී උදව් උපාකර කරන කණ්ඩායම් සහ ආරක්ෂාව හමුදා සාමාජිකයන් සැපයූ ආහාර වැරදි ලෙස භාවිතයට පෙළඹීමට ද පුලුවන. බටහිර අප්‍රිකාවෙන් මෑතකදී ලද වාර්තාවලට අනුව ආහාර ආධාර උපයෝගී කර ගෙන කඳවුරු පරිසරයන් හිදී කාන්තාවන් හා දරුවන් ලිංගික සූරාකෑම වලට ලක් කිරීමට ද සිදුව ඇත. එම නිසාම ලැබෙන ආහාර නිසි පරිදි හා නිසා අවස්ථාවේදී විමර්ශනයට ලක් කිරීමෙන් තමන්ට ලැබෙන ආහාර අයිතවාසිකම් - ප්‍රමාණයන් හා විවිධ ද්‍රව්‍ය ලෙසින් (උදා: සලාකයට අඩංගු දෑ) - පිළිබඳ කඳවුරුවාසීන්

දැනුවත් කිරීම කඳවුරු කළමනාකරණය කණ්ඩායමේ සමීප සහයෝගිතාව ඇතිව ආහාර බෙදා හැරීමේ හවුල්කරු විසින් ඉටු කළ යුතු අත්‍යවශ්‍ය වගකීමක් බවට පත්වෙයි. එසේම අවතැනුවූ ප්‍රජාව වඩාත් නතු විය හැකි කණ්ඩායම් සඳහා පරිපූරක ආහාර / හා සලාකය වැඩිකිරීම වැනි තත්වයන් හි අවශ්‍යතාවය ගැන දැනුවත් කිරීම තුළින් ඇති විය හැකි නොන් කිරීම හා පිළිකුල් සහගත තත්ත්වයන් වළක්වා ලිය හැකිය.

**ආහාර බෙදා හැරීමට කටයුතු කළ යුත්තේ කා සමඟද?**

- ආහාර සපයන ආයතන (ලෝක ආහාර වැඩ සටහන ආදී)
- ආහාර බෙදා හැරීමේ හවුල්කරු (සාමාන්‍යයෙන් රාජ්‍ය නොව සංවිධාන)
- කඳවුරු නේවාසිකයින්
- සරණාගත කාර්යයන් හි ලෝක ආහාර වැඩ සටහන හා එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිෂම හා ආහාර බෙදා හැරීම හවුල්කරුවන් 2002 ජුලි මාසයේ දී අත්සන් කළ ඒකාබද්ධ අවබෝධතා ගිවිසුමෙන් බැඳී සිටිති. (ආශ්‍රිත මෙවලම් බලන්න.)

කඳවුරු කළමනාකරණ ආයතනය සතුව ආහාර අවශ්‍යතාවන්හි දී අවම ප්‍රමිතීන් පිළිබඳ පැහැදිලි දැනුවත් තිබීම, ආහාර බෙදා හැරීමට, ආහාර ද්‍රව්‍ය ඇණවුම් කිරීම පහසු කිරීමට සමත් වෙයි. කඳවුරු කළමනාකාරීත්වය ආහාර බෙදා හැරීම පිළිබඳ වගකීම දැරීමට වඩා වෙනත් රාජ්‍ය නොවන සංවිධානයක් හෝ ආයතනයක් හෝ වෙත එම මූලික වගකීම පැවරීම සුදුසුය. කඳවුරු කළමනාකාරීත්වය සහ ආහාර බෙදා හැරීම එකම ආයතනයක් වෙත පැවරීමට වඩා ආයතන දෙකකට පැවරීම එකම ආයතනයක් වෙත මුළු බලයම ඒකරාශි වීම වැළැක්වීමට හැකිවෙයි.

හදිසි අවස්ථාවක මුල් අවස්ථාවේදී සැලසුම් කිරීමේ දී එක් පුද්ගලයකුගේ සාමාන්‍ය දෛනික ශක්ති අවශ්‍යතාවය කිලෝ කැලරි 2100 ක් ලෙස සැලකීම සුදුසුය. මෙම සංඛ්‍යාවන් පසුව පවත්නා ප්‍රාදේශීය තත්ත්වයන්, ජනතාවගේ සත්‍ය පෝෂණ අවශ්‍යතා සහ ආහාර ලබා ගැනීමටද, පවත්නා හැකියාව ආදිය මත සංශෝධනය කළ හැකිය. ක්ෂුද්‍ර පෝෂක සඳහා ඔවුන්ගේ ඇති අවශ්‍යතාවය ද සැලකිල්ලට ලක් කළ යුතුය.

විවිධ සලාක ද්‍රව්‍ය වල වර්ග සහ ප්‍රමාණයන් තීරණය කිරීමේදී, පෝෂණ අගයයන්, ආහාර ලැදියාව, බලා ගත හැකි ආහාර ද්‍රව්‍ය වලට පවත්නා පිළිගැනීම, භාවිතයේ පහසුව, ඉන්ධන ලබා ගැනීමේ හැකියාව, කෙටීම, වියදම, නැවත ද්‍රව්‍ය අලෙවි කිරීමේ දී ලබා ගත හැකි මිළ ගණන් යනාදිය ගැන සැලකිල්ලක් දැක්විය යුතුය. ආහාර මල්ලට ඇතුලත් වන ද්‍රව්‍ය පිළිබඳව එකඟත්වයට පැමිණි පසු අවශ්‍ය මුළු ආහාර ද්‍රව්‍ය අවශ්‍යතා ප්‍රමාණයන් ගණනය කළ යුතුය.

සලාකයේ ප්‍රධාන කොටස් යුක්ත වන්නේ හුරුපුරුදු ධාන්‍ය (මේස්, හාල් හෝ සෝගම්) බෝංචි, පිස්, ලෙංටිල්ස්, සහ මේද (එළවලු තෙල් හෝ කෑමට ගත හැකි මේද වර්ග) ඊට අමතරව ධාන්‍ය වර්ග ලෙසින් හෝ පිටි වශයෙන් පෝෂ්‍ය පදාර්ථයන් එක් කිරීම කළ යුතු වෙනවා වැළැක්වීමට සලාක ශක්තියෙන් 10-20% ක් ප්‍රෝටීන (නමුත් 15% කට අඩුවෙන්) මිස යුතුය ශක්තියෙන් 17% ක් අවම වශයෙන් මේදය ලබාදිය යුතුය.

**ආහාර ද්‍රව්‍ය මත යැපෙන ජනතාව සඳහා දෛනික ආහාර සලාකය පිළිබඳ උදාහරණයක්.**

(ලෝක ආහාර වැඩ සටහනේ හදිසි ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සඳහා ක්ෂේත්‍ර අත් පොතින් උපුට ගැනින.)

| | | | | |
|---|---|---|---|---|
| සහල් / ඉරිඟු / තිරුඟු | 400 | 420 | 350 | 420 |
| බෝංචි | 60 | 50 | 100 | 11 |
| එළවළු තෙල් | 25 | 25 | 25 | 30 |
| ටින්වල ඇසුරූ මස් / මාළු | - | 20 | - | 30 |
| බලකරණය කළ මිශ්‍ර ආහාර | 50 | 40 | 50 | - |
| සීනි | 15 | - | 20 | 20 |
| ලුණු | 5 | 5 | 5 | 5 |
| දිනකට මුළු ග්‍රෑම් ප්‍රමාණය | 555 | 560 | 550 | 565 |
| **ඉහත සලාකයේ පෝෂණ අගය** | | | | |
| ශක්තිය (කි. කැලරි) | 2,113 | 2,106 | 2,087 | 2,092 |
| ප්‍රෝටීන් ප්‍රමාණය (ග්‍රෑම් සහ % ග්‍රෑ. කි. කැලරි) | 58ග්‍රෑ./11% | 60ග්‍රෑ./11% | 72ග්‍රෑ./14% | 45ග්‍රෑ./9% |
| මේද (ග්‍රෑම් සහ %) ග්‍රෑ. | 43ග්‍රෑ./18% ග්‍රෑ. | 47/20% ග්‍රෑ. | 43ග්‍රෑ./18% ග්‍රෑ. | 38ග්‍රෑ./16% |

ධාන්‍ය වර්ග කෙටීමේ දී හා පැසීමේ දී සිදුවන හානිය සැලකිල්ලට ගත යුතුය.

දිනකට පුද්ගලයකුට අවශ්‍ය කි. කැලරි ප්‍රමාණය 2100 ක් ලෙස සලකා ආහාර සලාක සකස් කළහොත් එක් පුද්ගලයකු සඳහා දිනකට ග්‍රෑම් 500 ක් ලැබිය යුතුය. මෙය 10,000 ක් දෙනාට නම්

- දිනකට - මෙ. ටොන් 5.6
- සතියකට - මෙ. ටොන් 39.2
- මාසයකට - මෙ. ටොන් 188 ක් වෙයි. (දින 30 කට)

ආහාර මැදිහත්වීම් වල මූලික අරමුණ වනුයේ කඳවුරු තුළ වෙසෙන සියළු දෙනාගේ ම ආහාර පිළිබඳව පවත්නා මූලික අයිතිය තහවුරු කිරීමත්, මන්දපෝෂණය හේතු කොට කඳවුරු ප්‍රජාව තුළ ඇතිවිය හැකි රෝගීවීම් සහ මරණ පහළ හෙළීමත් ය. එනිසා ආහාර ලබාදීම සඳහා වන මැදිහත්වීම් මෙසේ සාරාංශ ගත කළ හැකිය.

- ආහාර සලාක ලැබීමට අයිතිය ඇති කඳවුරු වාසී සියළු දෙනාටම මූලික මනා පෝෂක ඇතුලත් දිනකට / එක් පුද්ගලයකු හට කිලෝ කැලරි 2100 ක් අවම ලෙස සැපයෙන ආහාර සලාකයක් ලබාදීම. මෙයට අමතර අවශ්‍ය ක්ෂුද්‍ර පෝෂක (උදා:- විටමින් සහ ඛණිජ පෝෂක) ලබා ගැනීමේ හැකියාව (කඳවුර වැසියන්ගේ උදව් කරන ප්‍රජාවගේ ආධාරයෙන් හෝ බෙද හරින සලාකය බලකරණය බැගින්) තිබිය යුතුය.)
- කඳවුරු වාසීන් තුළ මන්දපෝෂණය පවතින ප්‍රමාණය සහ මන්දපෝෂිත අයහට ප්‍රතිකාර ලබාදීම මගින් මන්දපෝෂණය නිසා ඇතිවන මරණ ප්‍රමාණය අඩු කිරීම මෙන්ම අවදානම් සහිත පුද්ගලයන් මන්දපෝෂණයට පත්වීම වැළැක්වීමට පියවර ගැනීම.

## ආහාර ලබාදීමේ දී විශේෂිත වැඩ සටහන්:

ආහාර ලබාදීමේ විශේෂ (උදා:- ප්‍රතිකර්මය /පුරිපූරක ආහාර ලබාදීමේ) වැඩ සටහන් ලෙස හැඳින්වෙන්නේ හදිසි අවස්ථාවල දී වඩාත්ම නතුවිය හැකි සහ තදින්ම මන්දපෝෂණයට ලක්ව සිටින කණ්ඩායම් උදෙසා වන අතිරේක වැඩ සටහන්ය. මෙවැනි වැඩ සටහන් බොහෝ විට ආහාර බෙදා හැරීමේ හවුල්කරුවන්ට අමතරව ඉදිරියෙන් එන වෙනත් ආයතනය (උදා: එම්. එස්. එෆ්. සහ යුනිසෙෆ් ආදී) හා කණ්ඩායම් මගින් සපයනු ලබයි.

- **පරිපූරක ආහාර ලබාදීමේ වැඩසටහන්:** ගර්භනී මව්වරුන්, දරුවකුට කිරි දෙන මව්වරුන් සහ මධ්‍යම වශයෙන් මන්දපෝෂණය ලක්වූ වැඩිහිටියන් හා දරුවන්ට ඔවුන් ලබන සාමාන්‍ය සලාක සැපයුමට අමතරව අතිරේක පරිපූරක ආහාර ලබාදීමේ වැඩ සටහනන්ය.
- **ප්‍රතිකාරමය ආහාර ලබාදීමේ වැඩසටහන්:** මෙම වැඩසටහන් ඉලක්ක කරනුයේ උග්‍ර ලෙස මන්දපෝෂණයට ලක්ව සිටින අයය. එහිදී වෛද්‍යමය හා පෝෂණමය ප්‍රතිකාරයන් හි සංකල්පයන් යොදා ගනියි. මෙම වැඩ සටහන් සුවපත් කිරීම සඳහා මෙන්ම සාමූහික වශයෙන් වැළැක්වීම සඳහා ද යොදා ගත හැකිය.

## එච්. අයි. වී ඒඩ්ස් සහිතව ජීවත් වන පුද්ගලයින්: (PLWHA)

සාධක රැසක් හේතු කොට එච්. අයි. වී / ඒඩ්ස් සහිතව ජීවත් වන පුද්ගලයන් මන්දපෝෂණයට ලක්වීමට වැඩි අවදානමක් පවතියි. මෙයට ආහාර රුචිය අඩුවීම නිසා හෝ ආහාර ගැනීමේ දුර්වලතා නිසා ඇතිවන, ගන්නා ආහාර ප්‍රමාණය අඩුවීම, පාචනය හේතු කොට පෝෂක අවශෝෂණය පහළ වැටීම, කුඩා අන්ත්‍ර තුළ පරපෝෂිතයන් (පණුවන්) සිටීම හෝ බිත්ති වල සෛල තුවාලවීම, පරිවෘත්තියමය වෙනස්කම්, කල්පවත්නා අසාදනය සහ රෝග තත්ත්වයන් සහ එච් අයි වී / ඒඩ්ස් හේතු කොට ඇති වන ආතතිය හා පිළිකුල් සහගත බව යනාදී හේතු රාශියක් මුල්වෙයි. එච් අයි වී ආසාදනය පවත්නා අදියර අනුව මෙම පුද්ගලයන් තුළ ශක්ති අවශ්‍යතා වෙනස් වන බවට සාක්ෂි ලැබී තිබේ. ප්‍රතිශක්ති ක්‍රියාදාමය/ප්‍රතිශක්ති පද්ධති නිසි ලෙස පවත්වා ගෙන යමින් ඔවුන්ගේ ජීවිත සුරැකීමට ක්ෂුද්‍රපෝෂක ලැබීම අතිශයින්ම වැදගත්ය. එච් අයි වී ආසාදිතව ජීවත් වන අය ඒඩ්ස් තත්ත්වයට පත්වීම පමා කිරීමට නම් ඔවුන් හැකි පමණ මනා සෞඛ්‍යයෙන් හා නිසි පෝෂණයෙන් යුතුව විසිය යුතුය. ඔවුන්ට ප්‍රමාණවත් ආහාර වේලක් ලැබෙන බවට සහතික වීම සඳහා වන ක්‍රමෝපාය අතර ඔවුන්ට සැපයෙන ආහාර බලකරණය කිරීම, මිශ්‍ර කිරීම යනාදිය ඇතුලත්ය. සමහර අවස්ථාවල දී ඔවුන්ට ලැබෙන සමස්ත ආහාර සලාකයේ ප්‍රමාණය වැඩි කිරීම වුව උචිතය.

## ගබඩා කිරීම:

මෙම කොටස වලංගු වන්නේ තමන්ගේම කඳවුරු සඳහා ගබඩා පහසුකම් සහිත කඳවුරු වලට පමණය. අවතැන්වීම් සිදුවූ බොහෝ අවස්ථාවලදී ආහාර බෙදා හැරීමේ වගකීම් දරන හවුල්කරු කඳවුරෙන් බැහැර පොදු ගබඩාවක් යොදා ගනියි. (තාවකාලික වශයෙන් කඳවුර තුළ ආහාර ගබඩා කළ විට එම වගකීම ආහාර බෙදා හැරීමේ හවුල්කරු සතුවෙයි.)

කඳවුර තුළ ගබඩාවක් පිහිටුවීම (ආහාර ද්‍රව්‍ය සඳහා මෙන්ම ආහාරමය නොවන ද්‍රව්‍ය සඳහා ද) කඳවුර සතු ඉඩ ප්‍රමාණය මත රැඳෙයි. සැලකිය යුතු ඉඩකඩ පවත්නා අවස්ථාවලදී බෙදා හැරීමේ මධ්‍යස්ථානය සහ ගබඩා කඳවුර මධ්‍යයේ සුදුසු ස්ථානයක පිහිටවීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉඩකඩ වඩාත් සීමිත කඳවුරක් නම් ගබඩාව සහ බෙදා හැරීමේ මධ්‍යස්ථානය ආරක්ෂක හේතූන් සලකා කඳවුර පරිපාලන ප්‍රදේශයට ආසන්න ස්ථානයක පිහිටුවිය හැකිය. එසේම කඳවුරට ද්‍රව්‍ය රැගෙන එන වාහන කඳවුරෙහි ජනාකීර්ණ ප්‍රදේශ ඔස්සේ ගමන් කරන විට විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය. ශබ්දය, දූවිලි සහ

දරුවන්ට මෙන්ම පදිකයන්ට සිදුවිය හැකි අනතුරු යනාදිය කඳවුරු ගබඩා පිහිටුවීමේ දී සිත්හි තබා ගත යුතු කරුණු අතර වෙයි. (පරිච්ඡේදය 2 බලන්න්. කඳවුරු පිහිටුවීම සහ සත්කාරය සහ නඩත්තු 5 ආරක්ෂාව) සරණාගත කඳවුරු සඳහා ලෝක ආහාර වැඩ සටහන සහ එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසම අතර 2002 ජුලි මාසයේ දී අත්සන් කළ අවබෝධතා ගිවිසුමෙහි ආහාර බෙදා හැරීමේ මධ්‍යස්ථාන සහ අවසාන බෙදා හැරීමේ මධ්‍යස්ථානය පිහිටුවීම ගැන සවිස්තරාත්මකව විස්තර කර ඇත.

සියළු සෘතු වෙනස්කම් වලට ගැලපෙන පරිදි ආහාර සහ ආහාරමය නොවන ද්‍රව්‍ය ගබඩා කළ හැකි ඉඩකඩ සැපයීම සැලසුම් කළ යුතුය. දින 1-3 දක්වා වන කෙටි කාලීන ගබඩා කිරීමේ සඳහා රෙදි යොදා ගත හැකිය. දීර්ඝ කාලීන ගබඩා කිරීම් සඳහා තට්ටු ඇසුරුම් කළ යුතුය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්:

### දත්ත එක් රැස් කිරීම / ලියාපදිංචි කිරීම:

ආහාර ආධාර සැපයීමේ දී කඳවුරු කළමාකරණ කණ්ඩායමේ පළමු වගකීම වනුයේ කඳවුරු වාසීන් හෝ සියලූ අදාල තොරතුරු සහතික පරිගණක ගත මධ්‍යම දත්ත සමුදායක් කළමානාකරණය කිරීමය. ලියාපදිංචි වු එක් එක් ප්‍රතිලාභ ලබන්නා ඔහු හෝ ඇයට හිමි නිවැරදි ආහාර සලාකය ලැබුණ බව විමසා බැලීමට මෙම ප්‍රජා විද්‍යාත්මක තොරතුරු අවශ්‍ය වෙයි. සරණාගත තත්වයන් හිදී දත්ත බැංකු කළමණාකරනය එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිෂම සමඟ සම්බන්ධීකරණය කරනු ලබයි.

ආහාර සහ ආහාරමය නොවන ද්‍රව්‍ය ආධාර ලැබීමට අයිතිය ඇති සෑම සරණාගතයකුට හෝ අවතැන් වුවකුට සලාක පත්‍රයක් හිමිව තිබීම බෙහෙවින් වැදගත්ය. ප්‍රධාන ලැයිස්තුවක්ට ඇතුලත්ව සිටීම සහ ආහාර සහ ආහාරමය නොවන ද්‍රව්‍ය ලැබීම රැඳෙනුයේ සලාක පත්‍රයක් හිමිව තිබීම මතය. සලාක පත්‍රයක වටිනාකම නිසා එය වංචාවන්ට, වැරදි භාවිතයට, අනු පිටපත් සැලසීමට මෙන්ම සොරකම් කිරීමටද භාජනය වේ. සලාකා පත්‍ර වැරදි ලෙස භාවිතය වළක්වාලීම ආහාර බෙදා හරින හවුල්කරුවන්ගේ වගකීම වුවත් සරණාගත තත්වයන්හි දී එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසමට සහ කඳවුරු කළමනාකරණ ආයතනයට එහිදී සලාකා පත්‍ර අපයෝජනය හෝ අපයෝජනය වැලක්වීම හෝ ගැන සැකයක් ඇති විට විමර්ශනය කිරීමේ හා වාර්තා කිරීමේ සහායක කාර්යභාරයන් පැවරෙයි.

### කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ මූලික වගකීම වාර්තා තැබීම

- ***වර්තා තැබීම:*** කඳවුරුවාසීන් අතර සිදුවන උපත් සහ මරණ, පිටවීම් සහ ඇතුලත්වීම් පිළිබඳව යථාවත් කළ වාර්තා තබා ගැනීම අතිශයින්ම වැදගත්ය. ආහාර සලාකය නිගමනය වනුයේ පවුලේ සාමාජික සංඛ්‍යාව (එනම් පෞද්ගලික වු සලාක) මතය. එනිසා ඇති වන වෙනස්කම් කඳවුරු වාසීන්හට ලබා දෙන සහන කෙරෙහි සෘජු ලෙසම බලපායි. පහසුවෙන් විමසා බැලීම සඳහා මෙම වාර්තා නිවැරදි ලෙස සකස් කරන සහ ආහාර සපයන ආයතන වලට තොරතුරු සැපයීමට පහසුවෙන් ලබා ගත හැකි මධ්‍යස්ථානයක තැබිය යුතුය අවුරුදු 6 ට අඩු දරුවන්ට සාමාන්‍යයෙන් ආහාර ද්‍රව්‍ය බෙදා දෙනු නොලැබෙයි. ඒ හැර අන් සියලූ දෙනා හට එක සමාන සලාකයක් ලැබිය යුතුය.

- ***වංචා වැළැක්වීම:*** සලාක පත්‍ර සඳහා අනුමත අංක ක්‍රමයක් සංවර්ධනය කර ගැනීම වැදගත්ය. ආහාර බෙදා හැරීමේ හවුල්කරු/සැපයුම්කරු සමඟ සබඳතා ඇති කර ගනිමින් වංචා වැළැක්වීමටත් දූෂණ තත්ත්වයන් හා සලාක අලෙවි කිරීම් ඉක්මනින් සොයා ගැනීමටත් ඉඩ සලසා ගත යුතුය. එක් යෝජනාවක් වනුයේ සංකේත පද්ධතිය නේවාසිකයන් කඳවුරුට පැමිණි විට සහ ඔවුන් පදිංචිව සිටින ස්ථානයට සම්බන්ධ කිරීමය

- ***පුද්ගලයන් ලියාපදිංචි කිරීම්:*** කාන්තාවන් විශේෂයෙන්ම කාන්තා ගෘහ මූලිකත්වයන් සහිත නිවස සහ දෙමාපියන් නොමැති දරුවන් නිසි ආකාරයේ ලියාපදිංචි කිරීම සහ වාර්තා ගත වීම සිදුවන බවට සහතික විය යුතුය. (පරිච්ඡේදය ලියාපදිංචි කිරීම සහ 5 ආරක්‍ෂාව බලන්න) ආහාර හා ආහාරමය නොවන ද්‍රව්‍ය පුද්ගලයන්හට ලබා ගැනිමට හැකිවීම ආරම්භ කිරීම සහතික කිරීමට ඇති කාර්යක්ෂම ක්‍රමය වනුයේ ලියාපදිංචි කිරීම සහ ඔහුගේ හෝ ඇයගේ හෝ නමට සලාක පත්‍රයක් නිකුත් කිරීමය. ආහාර ප්‍රමාණයන් ගණනය කරනුයේ පුද්ගලයන් සංඛ්‍යාව මතය. බෙදා හැරීම සිදුවනුයේ නිවාස මට්ටමිනි. එක් අයකු පමණක් සිටින නිවාසයන් බොහෝ විට නිවාස ඒකක ලෙසට ඒකරාශි කරමින් ආහාර බෙදා හැරීමේ අවශ්‍යතා සිදුකරනු ලබයි.

## විමර්ශනය, වාර්තා කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම :

ආහාර තක්සේරුව, සැපයීම, ප්‍රවාහනය, ගබඩා කිරීම සහ බෙදා හැරීම යනාදිය ආහාර සපයන ආයතනයේ එක්සත් ජාතින් ගේ සරණාගත කොමිෂමේ සහ ආහාර බෙදා හැරීමේ හවුල්කරු යන අයගේ ප්‍රධාන වගකීම් අතර වෙයි. හදිසි අවස්ථාවක මුල් අදියරයේ දීම පළ පුරුදු පෝෂණවාදීන් විසින් ජනගහනයේ පෝෂණ තත්ත්වය පිළිබඳ තක්සේරුවක් කරනු ලබයි. මේ සියළු ක්‍රියාකාරකම් සඳහා ප්‍රමිතිරි සංවේදීත්වයෙන් යුත් එච්අයිවී/ඒඩ්ස් පර්යාලෝකනයකින් යුක්ත විය යුතුය. සත්කාර සහ නඩත්තු කිරීමේ තත්ත්වයන් තුළ කඳවුරු වාසීන්හට කිසියම් අසාධාරණයක්, අඩුපාඩුවක් සිදුවේ නම් හෝ ඔවුන් ගේ පෝෂණ තත්වයේ (සමහර කණ්ඩායම් වල වුව) වෙනසක් සිදුව ඇත්නම් ඒ පිළිබඳව විමර්ශනයන් සිට වාර්තා කිරීම මගින් කඳවුරු කළමනාකාරීත්වයට මෙහිදී දායකත්වයන් දැක්විය හැකිය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීම්

***ආහාර සපයන ආයතනයට ලබාදී ඇති වරම පිළිබඳව හොඳින් දැනුවත්වීම:*** කඳවුරට ආහාර සපයන ආයතනය, ආහාර සැපයුම් කළ සහ ආහාර බෙදා හැරීමේ හවුල්කරු යනු මේ සියල්ලටම ලබාදී ඇති පැවරුම පිළිබඳව සවිස්තරාත්මකව දැන සිටිය යුතුය.

***ආහාර මල්ල පිළිබඳ දැනුම:*** කඳවුරු වාසීන්හට ලබා දෙන ආහාර මල්ලේ නිවැරදි ප්‍රමාණය සහ අඩංගු විවිධ ආහාර ද්‍රව්‍ය පිළිබඳව කඳවුරු කළමනාකරු දැන සිටිය යුතුය.

***අවබෝධතා ගිවිසුම පිළිබඳ දැනුම:*** සාමාන්‍යයෙන් ආහාර බෙදා හරින හවුල්කරු සහ ආහාර සපයන ආයතනය/ආහාර සැපයුම්කරු (උදා: එක්සත් ජාතින් ගේ සරණාගත කොමිසම/ලෝක ආහාර වැඩ සටහන) අතර ඇති කර ගන්නා අවබෝධතා ගිවිසුමේ පිටපතක් කියවා දැන සිටීම වැදගත්ය.

***ආහාර සම්බන්ධ පැමිණිලි:*** ආහාර පිළිබඳව මෙන්ම ආහාර වල ගුණාත්මක භාවය පිළිබඳව කඳවුරු වාසීන් ගෙන එන පැමිණිලි වලට සවන් දීමටත්, ඒවා සම්බන්ධව ක්‍රියාමාර්ග ආහාර කමිටුව සමග සම්බන්ධීකරණය කිරීමටත් හැකි වන වැඩ පිළිවෙලක් කඳවුරු කළමනාකරණ කණ්ඩායම මගින් සංවිධානය කළ යුතුය. මෙම පැමිණිලි ලිඛිතව සටහන් කළ යුතු අතර ඒවා ආහාර බෙදා හැරීමේ හවුල්කරුට, ආහාර සැපයුම්කරුට සහ/හෝ එක්සත් ජාතින් ගේ සරණාගත කොමිසමට වාර්තා කළ යුතුය.

බෙදා හැරීමේ ආයතනය විසින් ආහාර සැපයුම් කරු (උදා: ලෝක ආහාර වැඩ සටහන) ගෙන් එම ආහාර ද්‍රව්‍ය වලට ගත යුතු ක්‍රියාමාර්ගය විමසිය යුතුය. එකඟවූ ආකාරයට ආහාර එම ස්ථානයේ දීම විනාශ කිරීමට පෙර හෝ ආහාර සැපයුම්කරුට ඒවා ආපසු යැවීමට පෙර සාමාන්‍යයෙන් ඒ සඳහා රසායනාගාර පරීක්ෂණයක් කිරීමට සිදුවෙයි. මේ ක්‍රියාමාර්ග පිළිබඳව ඇති කර ගත් අවබෝධතා ගිවිසුමෙහි සඳහන් විය යුතුය.

***ආහාර කමිටුවක් පිහිටුවීම:*** කඳවුරු තුළ ආහාර පිළිබඳ කමිටුවක් හෝ කමිටු පිහිටුවීමට අනිවාර්යයෙන්ම උදව් උපකාර කළ යුතුය. ඒ සඳහා ස්ථාවර පරිසරයක් කඳවුරු තුළ පැවතිම අවශ්‍යය. මෙම කමිටු තුළ සියළු පාර්ශවයන් හා කණ්ඩායම් නියෝජනය විය යුතුය. කාන්තාවන්, පිරිමි, තරුණයන්, ආබාධිතයන්, වයස්ගත පුද්ගලයන් සහ එච්අයිවි/ඒඩ්ස් සහිතව ජිවත්වන පුද්ගලයන්, ගෘහයන් හෝ (හැකිනම්) ඔවුන් ගේ නියෝජිතයන් මෙම කමිටු නියෝජනය කළ යුතුය. සලාකය හා ආහාර බෙදා හැරීම පිළිබඳ කරුණු සාකච්ඡා කර ආහාර සපයන ආයතන යේ අවධානයට ලක් කළ යුතුය. කඳවුරු කළමනාකරු ආහාර කමිටුව සමඟ නිරතුරු සබඳතා පැවැත්විය යුතුය. ආහාර කමිටුව තුළ කාන්තා නියෝජනය 50% ක් දක්වා ගෙන ඒම ඉලක්කය වෙයි.

***වාර්තා කිරීමේ මාර්ග ඇති කිරීම:*** ආහාර බෙදා හැරීම සහ සත්‍ය වශයෙන් ආහාර ලැබී ඇති අතර පවත්නා අසාධාරණ වූ හා වෙනස්කම් පිළිබඳව ආහාර බෙදා හරින හවුල්කරුට දැන්වීම සඳහා නිසි වාර්තාකරණ යන්ත්‍රණයක් බිහි කිරීමට ක්‍රියාකිරීම අත්‍යවශ්‍යය. ආහාරමය හුරුපුරුදු බොහෝ විට සංස්කෘතිකමය වශයෙන් තීරණය වන නිසා බලපෑම් කිරීම අසීරුය. අවතැන්වූ තත්ත්වයන් යටතේ වඩාත් නතුවිය හැකි කණ්ඩායම් ආහාර ලැබීම් විෂමතාවට ලක් කිරීමට ආහාර පවුල් තුළ බෙදී යන ආකාරය සහ ආහාර බෙද ගන්නා ආකාරයේ වෙනස්කම් හේතු විය හැකිය.

***වෙනත් සේවා සපයන අය හා සම්බන්ධිකරනය:*** ආහාර පිළිබඳ පවත්නා අසාධාරණ තත්වයන් හෝ බෙදා හරින ආහාර ලබා ගැනීමේ දී ඇතිත පවත්නා අසමානකම් පිළිබඳව වෙනත් වගකිව යුතු ආයතන සමඟ තොරතුරු හුවමාරු කර ගැනිම වැදගත්ය. මෙම කාරණයේදී ආහාර බෙදා හැරීමේ හවුල්කරු සමඟ ද සම්බන්ධතා පවත්වා ගත යුතුය.

***සලාක පත්‍ර පිළිබඳ අයිතීන් හා වගකීම් පිළිබඳව ප්‍රජාව සංවේදීකරණය කිරීම:*** තම සලාක පත තමන් සන්තකයේම තබා ගැනීමේ ඇති වැදගත්කම හා අයිතිය පිළිබඳව කඳවුරු වාසීන් දැනුවත් කර සංවේදී බවට, පත්කළ බවට, කණ්ඩායම සහතික විය යුතුය. මානව සුභවාදීව ක්‍රියාකරන පුද්ගලයකුහට මෙම සලාක පත්‍රය කිසිවෙකුගෙන් ලබා ගැනීමේ අයිතියක් නොමැත. කඳවුරුවාසීන්ටද මෙහිදී යම් වගකීම් සමූහයක් ඇත. සලාක පත සුපරීක්ෂාකාරීව තබා ගැනිම, කිසියම් වංචාවක් - දූෂණයයක් සිදුවේ නම් ඒ දැනුම් දීම ආදිය එම අයිතීන්ය. සලාක පත හා ආහාර පිළිබඳ දූෂණ, වැරදි ලෙස භාවිතා කිරීම් යනාදිය පිළිබඳව ක්‍රියා කළ යුත්තේ හා ඒ හා සම්බන්ධව වගකීම් පැවරී ඇත්තේ ආහාර බෙදා හැරීම සම්බන්ධ හවුල්කරුට බව කඳවුරු ප්‍රජාව අවබෝධ කර ගත යුතුය.

***අහිමි වූ සලාක පත් පිළිබඳව ක්‍රියා කිරීම:*** නැතිවූ සලාක පත් පිළිබඳව ආහාර බෙදා හැරීමේ කළමණාකරුට හා වාර්තා කිරීම කිසියම් සන්නිවේදන මාර්ගයක් ඇති කළ යුතුය. මේ හා සම්බන්ධව ආහාර බෙදා හැරීමේ හවුල්කරු සමඟ සම්බන්ධව ක්‍රියා කිරීම අත්‍යාවශ්‍යය.

***අපක්ෂපාතීත්වය:*** සලාක පත්‍ර යනු වැදගත් භාණ්ඩයකි. එනිසා ඒවා හා සම්බන්ධව ක්‍රියා කරන විට බොහෝ උණුසුම් අවස්ථා ඇති විය හැකිය. සලාක පත්‍ර අනිසි ලෙස භාවිතා කිරීම සහ වංචා කිරීම හා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී සැම විටකම අපක්ෂපාතිව කටයුතු කරන බවට සහතික විය යුතුය. අනිසි ලෙස භාවිතා කිරීම හා වංචා සහගත තත්ත්වයන් මෙන්ම එසේ සැක කරක තත්ත්වයන්ද වහාම ආහාර බෙදා හැරීමේ හවුල්කරුට දැන්විය යුතුය. ආහාර සැපයුම්කරුවන්ද එවැනි තත්ත්වයන් හිදී නිරතුරුව යථාවත් කළ යුතුය.



*සියරා ලියෝන් හි ජෙම්බේ කඳවුරෙහි දී ආහාර සැපයුම් බෙදා හරින අන්දම: කවර පරිසරයක වු ද කඳවුරක දී නිසි පෝෂණය සැපයීම ප්‍රමුඛතාවයකි. ඡායාරූපය: රෝආල්ඩ් හොව්රිං NRC*

## බෙදා හැරීමේ පද්ධතිය:

සියළු ඉලක්ක ගත බෙදා හැරීමේ පද්ධතියක මූලික ඒකකය වනුයේ ගෘහස්තවය, සෑම විටම මුළු සලාකයම පවුලේ නියෝජිතවරයාට ලබාදීම අවශ්‍ය නොවුවවද, ජනගහනයේ සමාජ ව්‍යුහයන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් පැවතිමද, බෙදා හැරීමේ පද්ධතිය සැලසුම් කිරීමේදී කඳවුරු වාසීන්ගේ (ගැහැණු/පිරිමි) සහයෝගය ලබා ගැනිම ද වැදගත්ය. බොහෝ රටවල නිවෙස් තුළ ආහාර පිළිබඳ වගකීම් දරනුයේ කාන්තාවන්ය. මෙහිදී වයස්ගත වුවන්, ආබාධිත වුවන්, සහ එච්අයිවී/ඒඩ්ස් වලට ලක්වුවන්/නිවැසියන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීම්

***ආහාර මල්ල පිළිබඳව කඳවුරු වාසීන්හට තොරතුරු සැපයීම:*** තමන්ට ලැබිය යුතු ආහාර ද්‍රව්‍ය කවරේද? කොපමණ ප්‍රමාණයක්ද? කවදාද? කෙසේද? යන කරුණු පිළිබඳව කඳවුරු වාසීන් පූර්ණ වශයෙන් තොරතුරු ලබා දි දැනුවත් විය යුතුය. මෙම කාර්යය බොහෝ විට සිදු කරනුයේ ආහාර ද්‍රව්‍ය හැරීමේ කාර්යය පැවරෙන හවුල්කරුය. මෙම තොරතුරු කඳවුරු නේවාසිකයන්හට ඔවුන් ගේ නායකයන් හරහා නොව ඍජු ලෙස ඔවුන් වෙතට ලබාදීම වඩාත් සුදුසුය. සමහර පුද්ගලයන් වෙත සමීප වීම, අනෙක් පුද්ගලයන් වෙත සමීප වීමට වඩා අසීරු විය හැකි බැවින් ආහාර බෙද හැරීමේ හවුල්කරුවන් හට කඳවුර තුළ වෙසෙන අවදානම් පුද්ගලයන්ද ඇතුළු විවිධ කණ්ඩායම් සහ විවිධ පුද්ගලයන් වෙත අදාල තොරතුරු ලැබෙන බවට කඳවුරු කළමනාකරණ කණ්ඩායම සහතික කළ යුතුය.

***බෙදා හැරීමේ චක්‍රයේ පැවතිය හැකි අක්‍රමිකතා අඩු කිරීම :*** අක්‍රමිකතා සිදු වුවහොත් කඳවුරු නේවාසිකයන් තුළ පවත්නා විශ්වාසය බිඳී යා හැකිය. කඳවුරු කළමනාකාරිත්වය අපක්ෂපාතීව හා විනිවිද භාවයකින් යුතුව කටයුතු කරන බව නේවාසිකයන් හට හැඟී යායුතුය. එවිට බිහිකර ඇති බෙදා හැරීමේ පද්ධතියට එරෙහිව යාමේ අවශ්‍යතාවයක් ඔවුන්ට මතු නොවනු ඇත.

***බෙදා හැරීමේ ස්ථානයන්ට ආරක්ෂාව ලබාවීමට සහ පිටව යාමට හැකියාව:*** බෙද හැරීමේ මධ්‍යස්ථාන වලට පහසුවෙන් ළඟා විය හැකි සහ විවෘත ස්ථාන බවට සහතික විය යුතුය. විශේෂයෙන්ම මෙම බෙදා හැරීමේ මධ්‍යස්ථානවලට පවත්නා දුර සහ ඒවාට ළඟාවීමට ඇති ගමන් මාර්ගයෙන් ආරක්ෂාව ආදී අංග කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය. මෙම ස්ථාන හා මාර්ග හොඳින් ආලෝකමත් කර තිබිය යුතුය.

***අවදානම් සහිත පුද්ගලයන්හට විශේෂ පේලි:*** කඳවුරු කළමනාකරි කණ්ඩායම මගින් වඩාත් අවදනම් සහිත පුද්ගලයන් හට විශේෂ පෝලිම් ඇති කළ යුතු අතර ඔවුන්ට ප්‍රථමයෙන් සේවා සැපයිය යුතුය. මෙම පෝලිමේ ඒම සඳහා ප්‍රමුඛතාව වයස, ආබාධිත තත්වයන්, රෝගී භාවය, ගර්භනී භාවය ආදිහේතුන් මත බොහෝ වේලා පෝලිම් වල සිට ගෙන සිටිය නොහැකි හැමට ලැබිය යුතුය. හොඳින් නිසි උපදෙස් ලද සෞඛ්‍ය හසුරුවන්නන් හට මෙවැනි පුද්ගලයන් හඳුනා ගෙන විශේෂ පෝලිම් දෙසට ඔවුන් යොමු කළ හැකිය. මෙම කාර්යයන්හිදී ආහාර බෙදා හැරීමේ හවුල්කරු සහ එක්සත් ජාතීන් ගේ සරණාගතයින් සඳහා වන කොමිසමේ ආරක්ෂක නිලධාරීන් සමඟ සම්බන්ධතාවය රැක ගත යුතුය.

***නතුවිය හැකි කණ්ඩායම් සඳහා බෙදා හැරීමේ පද්ධතිය:*** සහභාගිත්ව ක්‍රමවේදයන් සහිත බෙදා හැරීමේ පද්ධතියන් සංවිධානය කිරීම මගින් ආබාධිතයින්, වයස්ගතවූවන් සහ දැරුණු ලෙස රෝගීව සිටින පුද්ගලයන්හට, ඔවුන් ගේ නිවෙස් වලට ආහාර ගෙනයාම සඳහා උදව් කිරීම අත්‍යවශ්‍යය. මෙම කාර්යයේදී ආහාර බෙදා හැරීමේ හවුල්කරුවන්ගේ ආරක්ෂිත නිලධාරි/ප්‍රජා සේවා නිලධාරි යන අය හා මේ කරුණු ගැන සම්බන්ධතා පවත්වා ගෙන යා යුතුය.

***ප්‍රජා සහභාගිත්වය:*** ආහාර රැස් කිරීමේ දී සැකසීමේ දී හා බෙදා හැරීමේදී කාන්තාවන් සතු සුවිශේෂ තත්වය හේතු කොට මෙම ආහාර බෙදා හැරීමේ කටයුතු සංවිධානය විමර්ශනය සහ බෙදා හැරීම කටයුතු වලදී කාන්තාවන් ගේ සහ සහභාගිත්වය ලබා ගැනීම් ද අතිශයින් වැදගත්ය.

***කාන්තා සහභාගිත්වය:*** ආහාර රැස් කිරීමේදී, සැකසීමේදී හා බෙද හැරීමේදී කාන්තාවන් සතුව හා සුවිශේෂ තත්වය හේතු කොට මෙම ආහාර බෙදා හැරීමේ කටයුතු සංවිධානය, විමර්ශනයට සහ බෙදා හැරීම් කටයුතු වලදී කාන්තාවන්ගේ සම සහභාගිත්වයට ලබාගැනීම අතිශයින්ම වැදගත්ය.

# පරිපූරක ප්‍රජා ව්‍යාපෘති :

## ගෙවතු වගා/සුළු පරිමාණ සත්ව පාලන :

ලෝක ආහාර වැඩ සටහන සහ වෙනත් ආහාර ආධාර සපයන ආයතන ලබා දෙන මූලික සලාකයන් ක්ෂුද්‍රපෝෂක (විටමින් සහ ඛනිජ) හා සම්බන්ධ සියළු අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් නොවනු ඇත. එයට අමතරව සාමාන්‍යයෙන් සපයන සලාකය ආහාර වේල තුළ විවිධත්වයක් ඇති කිරීමට අසමත්ය. එනිසාම කඳවුරුවාසින් තුළ ආහාර අරුචියක් ඇතිවීමට ඉඩ තිබේ. ක්ෂුද්‍ර පෝෂක අවශ්‍යතාවයන් සපයා දීමට බලකරණය කරන ලද ආහාර සලාකයට එක් කිරීම තුළින් කළ හැකිය. ඒ විශේෂයෙන්ම අවු : 5 ට අඩු දරුවන්, ගර්භනී සහ කිරි දෙන මව්වරුන් එච්අයිවී/ඒඩ්ස් බලපෑමට ලක්වූ නිවෙස් වාසින් ආදී අවදානමට ලක්වූ කණ්ඩායම් සඳහා වඩාත් උචිතය එහෙත් කළ යුතු හොඳම දෙය වනුයේ අවතැන්වූවන් හට තමන් විසින්ම වගා කළ ආහාරයන් සිය ආහාර වේලට එක්කර ගැනීමට සැලැස්වීමය. මෙමගින් පෝෂණය දියුණුවනවා පමණක් නොව එම අවතැන්වූවන් කිසියම් ප්‍රයෝජනවත් කාර්යයකට යොමු කිරීමක් ද පැතිර යාම අරුමයක් නොවේ.

## ආදායම් උපදවන ව්‍යාපෘති :

තම පරිභොජනය සඳහා ධාන්‍ය හෝ එළවළු හෝ සතුන් ඇති කිරීමට අමතරව වෙළඳපොලක් අසල තිබේ නම් හෝ කඳවුරට සේවා සැපයීමේ හැකියාව ඇත්නම් මෙම ද්‍රව්‍ය අලෙවි කර ආදායම් උපදවා ගැනීමට ද පුළුවන.

ආදායම් ඉපදවීම සඳහා යොදා ගත හැකි වෙනත් ව්‍යාපෘති අතර එහි සිටින නිපුනතා සහිත පිරිමි - ගැහැණු (උද : වඩුකාර්මිකයන් ආදි) අයට අවශ්‍ය අමු ද්‍රව්‍ය ලබාදී භාණ්ඩ නිෂ්පාදන හෝ අලෙවිය සඳහා යම් යම් දේ නිපදවන ආකාරය කඳවුරු වාසීන්හට ඉගැන්වීමය. (ජීවන වෘත්තිය නංවාලීමේ ක්‍රමෝපායයන් - පරිච්ඡේදය 12 බලන්න) විශාල වශයෙන් ධාන්‍ය බෝග වගා කිරීම සඳහා ප්‍රමාණවත් කුඹුරු වැනි ඉඩම් නොමැතිවුවද, තමන් පදිංචි ප්‍රදේශය අවට එළවළු පාත්ති දැමීමට හා කුකුලන් කිහිප දෙනෙකු ඇති කිරීම වැනි සත්ව පාලනමය කාර්යයන් ඉටු කළ හැකිය.

පෝෂණමය අධ්‍යාපන ද මෙහිදී වඩාත් වැදගත්ය. තමන්ට පුරුදු නුපුරුදු පරිසරයන් තුළ පෙර මෙන් වෙළඳපොලෙන් ලබා ගන්නා මාළු, කිරි, පලා, වර්ග නොමැතිව තම දරුවන්ට කෙසේ ආහාර ලබා දිය යුතුද යන්න ඔවුනට ගැටළුවක් විය හැකිය.

කඳවුර තුළදී කඳවුරුවාසීන්හට තමන්ට නුපුරුදු ආහාර ද්‍රව්‍ය ලැබීමටද හැකියාව ඇත. එනිසා ඒ ආහාර සඳහා හුරු කිරීමේ සංවේදිතා වැඩ සටහන් ද අවශ්‍යය. එහිදී එම ආහාර ද්‍රව්‍ය කවරේ ද?එය සකස් කළ යුත්තේ කෙසේද? ආහාරයට ගත යුත්තේ කෙසේ ද යන්න එයට ඇතුලත් විය යුතුය. සමහර විට නුසුදුසු නොදන්නා ආහාර ලබා දුන් විට එම ආහාර වලට විස කවා ඇති බවට සහ පිරිමින් සහ ගැහැණුන් වඳභාවයට පත් කළ හැකි බවට ආදී වශයෙන් දුෂමාන කටකතා පැතිරිය හැකිය.

## ආහාරමය නොවන ද්‍රව්‍ය:

අවතැන් වූ තත්වයන් සිදුවූ හැමවිටම පාහේ පෞද්ගලික දේපල නැතිවීම සිදුවෙයි. මෙවැනි අවස්ථාවන් වලදී බොහෝ දෙනෙකු නිවෙස් හැර යන්නේ ඇඳ සිටින ඇඳුම් පමණක් සහ තමන් අතර හසුවන යමක් සමහ පමණය. මෙ නිසා කඳවුරු වාසීන්හට ආහාර ද්‍රව්‍ය වලට අමතරව තම පැවැත්ම සඳහා ආහාරමය නොවන ද්‍රව්‍ය සමහරක් ද අවශ්‍ය වෙයි. පැදුරු, පොරවන බ්ලැන්කට්, ප්ලාස්ටික්(ඉටි) රෙදි යනාදිය නිදා ගැනීමට මෙන්ම සීතලෙන් උණුසුම්වීම සඳහා සහ ඉතා අහිතකර කාලගුණ හා පරිසරමය තත්ත්වයන් ගෙන් ආරක්ෂාවීම සඳහා ඔවුනට අවශ්‍යය. හැලි වළං, පිඟන් කෝප්ප, හැඳි යනාදිය ආහාර පිසීමට සහ ආහාර ගැනීමට සෑම පවුලකටම අවශ්‍යය. තම පෞද්ගලික ස්වස්ථතාවය රැක ගැනීම සඳහා ජලය එක්රැස් කර ගැනීමට වසා තැබිය හැකි ප්ලාස්ටික් භාජන වැනි දෑ අවශ්‍යය. මෙම මූලික අවශ්‍යතා සපුරාලීමෙන් පසුව ජීවිත සුරැකීමට අවශ්‍ය නොවන වෙනත් ද්‍රව්‍ය සැපයීය ආරම්භ කළ හැකිය.

**ආහාරමය නොවන ද්‍රව්‍ය, මෙයට සම්බන්ධ විය යුත්තේ කවුරුන්ද?**

- ආහාරමය නොවන ද්‍රව්‍ය සපයන හා බෙදා හරින සංවිධාන
- කඳවුරු කළමනාකාරිත්වය
- කඳවුරු නේවාසිකයින්

ජීවිත සුරැකීම සඳහා නොවන සැපයුම් අතරට සටහන් පොත්, පෑන් පැන්සල් ඇතුළු පාසල් දරු දැරියන් සඳහා වන කට්ටල, කෘෂි කාර්මික මෙවලම්, බීජ ඇට වර්ග ආදිය ඇතුලත්ය. මෙම වර්ගයන්ට අයත් ද්‍රව්‍ය බෙදා හැරීමේ අදියර ඇරඹෙනුයේ හදිසි අදියර නිමවීමෙන් පසුවය. මෙම අවස්ථාවේදී ආහාර වේල ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව වර්ධනය කර ගැනීමට මෙන්ම අධ්‍යාපනික සහ විනෝදාත්මක ක්‍රියා ප්‍රවර්ධනයට ද උදවු වෙයි.

අවශ්‍ය ආහාරමය නොවන ද්‍රව්‍ය, සංස්කෘතිය සහ පවත්නා පසුබිම අනුව වෙනස් විය හැකිය. එනිසා ඒවා අදාල ජනගහනයේ සංස්කෘතික පසුබිමට ඔබින සහ ඔවුන්ගේ අවශ්‍යතා වලට ගැලපෙන සේ වෙනස් විය යුතුය. ආහාරමය නොවන ද්‍රව්‍ය කට්ටල ඒවා සපයන්නන් ගෙන් සපයන්නන්ට වෙනස් වෙයි. එසේම ඒවා ඒ් ඒ් කාලයට සහ ආයතන අතර වෙනස් වෙයි. බොහෝ ස්ථාන සඳහා වන ආහාරමය නොවන ද්‍රව්‍ය කට්ටල තුළ සනීපාරක්ෂක තුවා සහ කාන්තාවන්ගේ ස්වස්තථාව සඳාහ වන ද්‍රව්‍ය තිබීම සම්මතයකි. මැලේරියාව පවත්නා ප්‍රදේශවල නම් කෘමිනාශක ගැල්වූ මදුරු දැල්ද මෙම ලැයිස්තුවෙහි අත්‍යාවශ්‍ය අංගයක් වනු ඇත.

ආහාරමය නොවන ද්‍රව්‍ය අවශ්‍යතා බොහෝ විට ගණනය කරනුයේ ගෘහස්ත මට්ටමේදීය. මෙම ද්‍රව්‍ය බොහෝ විට බෙද දිය යුත්තේ කාන්තාවන්ටය. බහු-භාර්යා සේවනය අනුමත කළ සමාජ වල දී මෙය විශේෂයෙන්ම වැදගත්ය. සමහර විට ආහාරමය නොවන ද්‍රව්‍ය කට්ටලයක් ලෙස අසුරා බෙදා හරිනු ලබයි. කඳවුරට පැමිණි විට ද්‍රව්‍ය කට්ටල ලබා දෙන අතර ඒ පළමුව පැමිණෙන්නා හට පළමුව ලබාදීමේ පදනම මත අවතැන් වූ පවුලේ ප්‍රමාණයට ලබාදීම සිදුවෙයි. එසේම තමන් පැමිණි පළාතට නැවත ආපසු යන සහ කඳවුරු හැර යන අයහට ද ආහාරමය නොවන ද්‍රව්‍ය කට්ටලයක් සැපයීම නිරතුරුව සිදුවෙයි.

## ආහාරමය නොවන ද්‍රව්‍ය පිළිබඳව කඳවුරු කළමනාකරණයේ වගකීම් :

කඳවුරු තුළ ආහාරමය නොවන ද්‍රව්‍ය බෙද හැරීම සිදුවනුයේ ජනතාව පැමිණීමෙන් පසුව හෝ ඉන් ඉක්බිතිව ආහාරමය ද්‍රව්‍ය තිබෙන ආකාරය අනුවය. මෙනිසා ආහාරමය නොවන ද්‍රව්‍ය බෙදා හැරීම් වගකීමක් කඳවුරු කළමනාකාරීත්වය සතු වුවද, නොවුවද මෙම ද්‍රව්‍ය සාධාරණ ලෙස බෙදා හැරීම සඳහා පහසුකම් සැපයීමේ මූලික වගකීම් රාශියක් කළමනාකාරීත්වය සතුවෙයි.

### කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීම්

***තම අයිතීන් පිළිබඳ කඳවුරු නේවාසිකයින් හට තොරතුරු සැපයීම:*** තමන්ට ලැබිය යුතු ද්‍රව්‍ය කවරේද? කොපමණ ප්‍රමාණයන් ද කවදා තෙක් ලැබිය යුතුද යන තොරතුරු පිළිබඳව කඳවුරු වාසීන් හොඳින් දැනුවත් වන බවට කඳවුරු කළමණාකාරීත්ව කණ්ඩායම සහතික විය යුතුය. මෙම තොරතුරු ඔවුන් ගේ නායකයන් හරහා නොව කඳවුරු වාසීන් වෙත කෙළින්ම ලබාදිය යුතුය. වැඩියෙන්ම අවදානම් අය ඇතුළු සියළු විවිධ කණ්ඩායම් සහ පුද්ගලයන් වෙත තොරතුරු ගලා යන ක්‍රමෝපායයන් සංවර්ධනය කළ යුතුය.

***ආහාරමය නොවන ද්‍රව්‍ය පිළිබඳ වාර්තා තබා ගැනීම:*** බෙද හරින ලද සහ ගබඩා තුළ ඇති සියළු ද්‍රව්‍ය පිළිබඳ සාර්ථක වාර්තා තැබීමක් හා දත්ත පදනමක් ගොඩ නැගීම ඉතා වැදගත්ය. ආහාරමය ද්‍රව්‍ය සපයන හා බෙදා හරින අය බොහෝය. මෙනිසා සියළු ආහාරමය නොවන ද්‍රව්‍ය බෙද හැරීම පිළිබඳ වාර්තා තබා ගැනීම කඳවුරු කළමනාකාරීත්වයට වැදගත් වෙයි. බෙදා හැරීමෙන් පසුව වාර්තාව විමර්ශනය කිරීම මගින් එම ද්‍රව්‍ය භාවිතා කරන ආකාරය සොයා බලා පෙළී නොවන අවශ්‍යතා හදුනා ගත යුතුය.

***බෙදා හරින ස්ථාන වලට ආරක්ෂිතම පැමිණීමට සහ පිටවීමට හැකිවීම:*** බෙදා හැරීමෙමි මධ්‍යස්ථාන වලට ළගා වීමට ඇති මාර්ග වල ආරක්‍ෂාව පිළිබඳව සොයා බැලීම වැදගත්ය. මෙම ස්ථානවලට පහසුවෙන් හා නිදහසේ ආරක්ෂාකාරී ලෙස ළඟා විය හැකි විය යුතු ඇතිවය ගැටළු හා ප්‍රශ්න වලට මුහුණ දීම සඳහා උචිත කාර්ය මණ්ඩලයක් ද සිටීම ද වැදගත්ය. බෙදා හැරීමේ කටයුතු නිසි පරිදි සිදුවිය. රැස්වන ජනතාව පාලනය කිරීමද වැදගත් නිසා කල්තබාම ජනතාව පෝලිම් කැඩීම වැළැක්වීමට අවශ්‍ය පුද්ගලයන් තෝරා බේරා ගත යුතුය.

***කාන්තාවන් ගේ සහභාගිත්වය:*** ආහාරමය නොවන ද්‍රව්‍ය බෙදා හැරීමේදී හා සංවිධානය කිරීමේ දී ඒ සඳහා කාන්තා සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම ඉතා වැදගත්ය. සහභාගි වන අයගෙන් අඩු තරමින් 50% ක් වත් කාන්තාවන් විය යුතුය.

***වඩාත් අවදානම් කණ්ඩායම් සඳහා වෙනම පෝලිම් සකස් කළ යුතුය:*** ආහාරමය ද්‍රව්‍ය බෙදා හැරීමේදී මෙන්ම මෙහිදී ද වයස, ආබාධිත තත්වයන්, රෝගීභාවය, ගර්භනීභාවය ආදී හේතූන් මත පෝලිමේ බොහෝ වේලාවක් සිට ගෙන සිටිමට අපහසු පුද්ගලයන් හට මෙවැනි අවදානම් පුද්ගලයන් හඳුනා ගැනීමට හැකිවිය යුතුය.

***ආරක්ෂිත ගබඩා පහසුකම්:*** කඳවුර තුළ සුදුසු සහ ආරක්‍ෂිත සහිත ගබඩා පහසුකම් පැවතිය යුතුය.

***ආහාරමය නොවන ද්‍රව්‍ය පිළිබඳ පැමිණිලි:*** ආහාර සලාක වලදී මෙන්ම ආහාරමය නොවන අඩංගු කට්ටල බෙදා හැරීම හා සම්බන්ධව ද පැමිණිලි ඉදිරිපත් කිරීමේ හැකියාව කඳවුරු නේවාසිකයන් සතුවිය යුතුය. ආහාර කමිටුවක් සමග සම්බන්ධීකරණයෙන් යුතුව පැමිණිලි ඉදිරිපත් කිරීමේ පද්ධතියක් සංවිධානය කළ යුතුය. ලැබෙන පැමිණිලි ලේඛන ගත කිරීමත්, අවශ්‍ය පරිදි එම ද්‍රව්‍ය බෙදා හරින අයට සහ ඒවා නිෂ්පාදනය කරන අයටත් මෙන්ම උචිත නම් සරණාගත කඳවුරු වල සිටින එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසමේ නියෝජිතයන් හටද දැන්විය හැකිය.

***සකසුරුවම් ලෙස ඉන්ධන භාවිතය සහ පරිසර හිතකාමී උදුන් භාවිතය:*** සකසුරුවම් ලෙස ඉන්ධන භාවිතය මෙන්ම දර අඩුවෙන් භාවිතා කර ඉන්ධන සකසුරුවම් කරන පරිසර හිතකාමී උදුන් භාවිතා කිරීම උනන්දු කල යුතුය. කඳවුරු නේවාසිකයින්හට මේවා හඳුන්වා දී ක්‍රියාත්මක කිරීමේ වගකීම් දැරීමට කැමති අය සිටිති. ඒවා ලබාදීමට සුදනම් ආයතන බොහෝ පැවතිය හැකිය. සමහර අවස්ථාවල දී ලෝක ආහාර වැඩසටහන තම අයවැය තුළට මෙවැනි උපකරණ ද ඇතුලත් කරනුයේ ද එහෙයිනි.



*බෙවන් හි අභ්‍යන්තරව අවතැන්ට වු පුද්ගලයන් සැපයුම් ලබාදීම බ්ලැන්කට්, පැදුරු සහ මුළුතැන් ගෙයි උපකරණ ආදී ආහාරමය නොවන ද්‍රව්‍ය ද කඳවුරු ජිවිතය සඳහා අවශ්‍ය මුලික ද්‍රව්‍ය අතර වෙයි. ඡායාරූපය රොආල්ඩ් හොව්රිං NRC*

# මෙවලම් කට්ටලය

### ආහාර බෙදා හැරීම පිරික්සුම් ලෙඛනය:-

මෙම ලේඛනය බෙදා දීමේ ආකාරය ඇගයීමේ නිරීක්ෂන පෝරමයකි. එය පරිපූරන වුවක් නොවුවද කඳවුරු කළමනාකරුවන්ට සහ ආහාර බෙදා දෙන්නන් යන දෙපිරිසටම උපකාර වෙයි. එය ස්වස්ථතා විද්‍යාව, කාර්ය මණ්ඩල සංවිධානය, බොදා හැරීමේ ඉසව් සංවිධානය, නම් සාක්‍ෂාත් කිරීම සහ අවදානමට ලක් වුවන් යනාදි අංශ ආවරණය කරයි.

### ආහාර නොව ද්‍රව්‍ය බෙදා හැරීමේ වාර්තාව:

මෙම පෝරමය සරල ශේෂ පත්‍රිකාවක් ලෙස වාර්තා තබා ගැනිම් කාරිය සඳහා වගකිව යුතු ඒජන්සි, ආහාර නොවන ද්‍රව්‍ය බෙදා හැරීම සහ ගබඩා කිරීම සඳහා කඳවුරු කළමනාකරණ ඒජන්සිය භාවිතා කරයි. හරියාකාරව සහ නවීකරණය කළ විට මෙම ශේෂ පත්‍රය පහසුවෙන් ද්‍රව්‍ය බෙදා දුන් සහ සේවා සැපයූ නියම නිවාස සංඛ්‍යාව අතර ඇති ඕනෑම විසංගතතාවක් මතු කර පෙන්වයි.

### ආහාර නොවන ද්‍රව්‍ය (NFI) බෙදා දීමෙන් පසු නිරීක්ෂණ පෝරමය (සියරා - ලියෝන් "කෙයාර්" වලින් අනුවර්තනය කරන ලද)

කඳවුරු වැසියන් විසින් ආහාර නොවන පැකේජයේ සමස්ත භාවිතය තක්සේරු කිරීම පිණිස මෙම පිටු දෙකේ නිරීක්ෂණ පෝරමය ප්‍රයෝජනවත්ය (ද්‍රව්‍ය විකුනුවා හෝ හුවමාරු කළත්) එමගින් කඳවුරු වැසියන්ගේ, අයිතම පිළිබඳ තත්ත්වය සහ ප්‍රයෝජනවත් බව ගැන සංජානනය දත හැකිය. මෙම පෝරමය සියරා - ලියෝන්හි කෙයාර් සංවිධානය පවත්වා ගෙන ගිය ආකාරයට ආහාර නොවන ද්‍රව්‍ය පැකේජය ඒජන්සිය මගින් බෙදා හැරිය ආකාරයට යොදා ගනී. කෙසේ වුවද කඳවුරු කළමනාකරණ සහ පැමිනිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී මෙය වැදගත් මෙහෙවරක් සළසයි. සන්දර්භය අනුව කඳවුරු කළමානකරු විසින් ආහාර නොවන ද්‍රව්‍ය බෙදා හැරීමට පසු නිරීක්ෂණය ගැන ප්‍රධාන කාරියක් ඉටු කළ යුතුවේ මෙම තක්සේරුව ඉටු කිරීමේදී කණ්ඩායම කඳවුරු විවිධ කමිටු සමග (විශේෂයෙන් ආහාර කමිටුව) සම්බින්ධිකරණය කළ යුතුය.

### අවතැන් වූ ජනයාට ආහාර බෙදා හැරීමේදී ඇතිවිය හැකි බල කිරීම. ක්ෂේත්‍ර පිරික්සුම් කරන ලද උපක්‍රම සහ ප්‍රතිචාර (WFP)

මෙම ලියවිල්ල බෙහෙවින් පොදු විවිධ වර්ග, (නමුත් නිතර නොදන්නා) ආහාර බෙදා දීමේ බල කිරීම්, කඳවුරු නිවැසියන්ට එවැනි පිවිසුම් කිරීම, වැඩි ලේඛනගත කිරීම්, බලහත්කාරයෙන් පැහැර ගැනීම සහ බලෙන් නම්මවා ගැනීම, ලිංගික අපයෝජනය සහ තවත් බොහෝ දේ විදහා දක්වයි. සෑම බලපෑම් වර්ගයක් සඳහාම ගැටලු අවම කිරීම සඳහා උපක්‍රම සලසා දෙයි. මේ සියල්ලක්ම ලෝක (WFP) ආහාර සංවිධානය මගින් ක්ෂේත්‍රයේදී පිරික්සා ඇත. සිදුවිය හැකි අවදානම් හා සීමාවන් සඳහා එකිනෙක උපක්‍රම ද ලබා දෙනවා ඇත. කඳවුරු කළමනාකරුවන්ට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාකාරීත්වයේදී පැහැදිලි මෙහෙවරක් ඇත. එසේම ආහාර සහායක සහ බෙදා හැරීමේ ගැටලු ඇතිවිය හැකි බොහෝ දේ ගැන අවබෝධයෙන් සිටිය යුතුයි.

## ආශ්‍රේය කට්වල

***ආහාර ආධාර පිළිබඳ රාජ්‍ය නොවන සංවිධානවල (NGO) මෙහෙවුර සංග්‍රහය සහ ආහාර ආරක්ෂාව:*** (www.aidworkers.net)

යුරෝපා සංගමයට සම්බන්ධ සියලුම සංවර්ධන NGO වල සම්බන්ධීකාරක කමිටු සාමාජිකයන් විශාල සංඛ්‍යාවක් NGO විසින් පිටු හතරක් වූ මෙම මෙහෙවර සංග්‍රහය 1995 දී අනුවරතනය කර ගන්නා ලදී. මෙම මෙහෙවර සංග්‍රහයේ ආහාර ආරක්ෂාව (සෞඛ්‍ය සම්පන්න, ප්‍රමාණවත් ආහාර ප්‍රමාණයක් ක්‍රියාකාරීව සිටීමට හැම ජනතාවටම හැම කල්හි ප්‍රවේශ විය හැකි.) ගැන විස්තර කර පැහැදිලි කර තිබේ. රාජ්‍ය නොවන සංවිධාන වලට සම්බන්ධ බොහෝ වගකීමේ ද විදහා දැක්වේ.

***UNHCR සහ WFP අතර ආවබෝධතා ගිවිසුම (ජුලි 2002)***

මෙම අවබෝධතා ගිවිසුම (MOU) මගින් UNHCR සහ WFP අතර වගකීම් බෙදා හැරීම සහ අරමුණු දක්වා තිබේ. එසේම ක්‍රියාකාරී පර්ශ්වරුවන් සහ සරනාගත තත්ත්වයක දී ආහාර බෙදා හරින ආකාරය ද දැක්වේ.

***ආහාර සහ පෝෂණය පිළිබඳ නිර්නායක (UNHCR, UNICEF, WFP සහ WHO):***

UNHCR, UNICEF, WFP සහ WHO එකාබද්ධ වී මෙම නිර්නායක ආහාර සහ පෝෂණ තක්සේරු කිරීමේ, ගණන් බැලීමේ සහ නිරීක්ෂනය කිරීමේ ප්‍රායෝගික කට්ටලයක් ලෙස සකසන ලදී. හදිසි අවස්ථාවලදී ප්‍රජාවට අදාල වේ. මෙම නිර්නායක මූලික ආහාර සලාක, හදිසි තත්ත්වයන් මුහුණ දුන් ප්‍රජාවට බෙදා හරින සහ සැලසුම් කරන ක්ෂේත්‍ර නිලධාරීන්ට අදාලවේ. නමුත් කඳවුරු කළමනාකරුවනට ද භාවිත කළ හැකිය.ආහාර බොදා හැරීම පිරික්සුම් ලේඛනය:-

මෙම ලේඛනය බෙදා දීමේ ආකාරය ඇගයීමේ නිරීක්ෂන පෝරමයකි. එය පරිපූරන වුවක් නොවුවද **කඳවුරු කළමනාකරුවන්ට සහ ආහාර බෙදා දෙන්නන් යන දෙපිරිසටම උපකාර වෙයි. එය ස්වස්ථතා** විද්‍යාව, කාර්ය මණ්ඩල සංවිධානය, බොදා හැරීමේ ඉසව් සංවිධානය, නම් සාක්ෂාත් කිරීම සහ අවදානමට ලක් වූවන් යනාදී අංශ ආවරණය කරයි.

## අවශ්‍ය කියවීම් සහ පරිශීලන:

- UNHCR 1997 භාණ්ඩ බෙදා හැරීම, ක්ෂේත්‍ර නිලධාරීන්ට ප්‍රායෝගික මග පෙන්වීමකි. ජිනීවා -UNHCR
- කෙයාර් ජාත්‍යන්තරය, සියරා ලියෝන් 1997. හදිසි අවස්ථාවලදී භාණ්ඩ කළමනාකරනය ගැන මඟ පෙන්වීමක්. CARE සියරා ලියොන්.
- UNHCR 2000 හදිසි අවස්තා සඳහා අත්පොත (15 පරිච්ඡේදය, ආහාර සහ පෝෂණය) ජිනීවා UNHCR
- UNHCR 2000 සෞඛ්‍ය, ආහාර සහ පෝෂණ කට්ටලය: මෙවලම් සහ ආශ්‍රේය ද්‍රව්‍ය, සෞඛ්‍ය, ආහාර සහ පෝෂණය ඇගයීම සහ කළමනාකරණ වැඩසටහන ජිනීවා
- Medecins Sans Frontieres (MSF). 1995 පෝෂණ නිර්නායක
- The Sphere Project. 2004 මානව හිතවාදී ප්‍රඥප්තිය සහ ව්‍යසන වලට මුහුණ දීම සඳහා අවම ප්‍රමිති. ලන්ඩන්, Oxfam ප්‍රකාශන
- IASC. 2003 හදිසි වටපිටාවක HIV/ Aids මැදිහත්වීම් වලට නිර්නායක
- Oxfam හදිසි තත්ත්වයකදී HIV/ Aids සමෝධානය සහ ප්‍රවණතාව
- අන්තර් ජාතික ගලවා ගැනීමේ කමිටුව: 2003 අනාගතය සුරකිම: HIV වැළැක්වීම, සත්කාරය සහ යුද්ධයේ බලපෑම සහ අවතැන් වූ ප්‍රජාවට සහායවීම

- www.refugeceamp.org
- www.wfp.org
- www.aidworkers.net
- www.sphereproject. org
- www.oxfam.org.uk
- www.theirc.org

# ආහාර බෙදා හැරීම නිරීක්ෂණ පිරික්සුම් ලේඛනය

## ආහාර බෙදා හැරීම නිරීක්ෂණ පිරික්සුම් ලේඛනය:

### බෙදා හැරීම් ක්ෂේත්‍ර සංවිධානය:

- ජනයා පිළිගත් පේලියකට නැවැති සිටිද?
- ආහාර බෙදීම හොඳින් මෙහෙයවයිද? මලු විවෘතව හෝ ආහාර බිම විසිරී තිබේද?
- ආහාර බෙදා හරින ක්ෂේත්‍රය හොඳින් ආවරණය කර තිබේ ද?
- ආහාර බෙදා දෙන තැන පිරිසිදු ද? කර තිබේද?
- ක්‍රමානුකූලව බෙද හැරීම පිණිස ඇතිතරම් ආරක්ෂාව සලසා තිබේද?
- සෙනඟ පාලනයට ප්‍රමාණවත් පිරිසක් සිටිද?
- ස්ථානය ලනු හෝ ප්ලාස්ටික් ඇද පැහැදිලිව වෙන් කර තිබේද?

### බෙදා හැරීමේ ක්‍රියාවලින් සහ නම හඳුනා ගැනීම:

- සලාක පත්‍රය හිමියා හඳුනා ගැනීමට අනන්‍යතා පත පිරික්සුවේද සහ හිමියාගෙ නම ප්‍රතිලාභි ලැයිස්තුවේ තිබේද?
- බෙදා හැරීමේ තැනට පිවිසෙන විට සලාක පත සලකුනු කර හෝ පන්ච් කර තිබේ ද / ආහාර ලබා ගැනිමේ දී.
- ඒජන්සිය පරිගණක ගත කළ ප්‍රතිලාභි ලේඛනයක් යොද ගනි ද?
- ආහාර බෙද දෙන කාර්ය මණ්ඩලයේ සියලූ දෙනාම අත් වැසුම් පැළඳි ද? (එසේම සනිපාරක්ෂක නිති පිළිපදි ද)
- සියලුම ප්‍රතිලාභින් සලාක ලබා ගත් බවට අත්සන් තබන්නේ ද?
- ආහාර බෙද දෙන විට පවුලේ සංඛ්‍යාව වැඩවී තිබේ ද?
- ප්‍රතිලාභින් කැඳවීමට ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරනු ලැබේ ද?

### බෙදා හැරීමේ සාධාරණත්වය සහ අවදානම් සහිත ප්‍රතිලාභින්:

- අවදානම් සහිත අයවලුන්ට පහසුවෙන් පැමිණිය හැකි පෝලිමක් තිබේ ද?
- අවදානම් සහිත පුද්ගයින්ට සලාකය ලබා ගැනිමට සහායවීමට කාර්ය මණ්ඩලය සිටි ද?
- වඩාත් අවදානම් සහිත අයගේ පෝලිම නිරීක්ෂණයට නිලධාරින් සිටි ද?

- ලැයිස්තුවේ නැති අයට ආහාර ලබා දෙනවා ද? ඔවුන් ලේඛනයට ඇතුළත් නොවුයේ ඇයිදැයි සොයා බැලිමට පියවර ගනු ලැබි ද?

- සියල්ලන්ටම එකහ වු ආහාර සලකාය ලැබෙනවා ද?

**හැඳි වැනි උපකරණ භාවිතා කරනු ලැබේ ද?**

- භාවිත හැඳි ප්‍රමිතින්ට අනුව තිබේ ද?

- හැම උපකරණයක්ම පැහැදිලිව සටහන් කර තිබේ ද? (හරියටම ප්‍රමාණය දැක්වීමට)

- එකම හැන්ද විවිධ ආහාර අයිතම සඳහා යොදා ගනී ද?

- ආහාර බෙදීම සිදුවන අතර හැන්ද මාරු කරන්නේ නම් ඒ ගැන ප්‍රතිලාභීන්ට පැහැදිලි කරනු ලැබේ ද?

**බෙදා හැරීම පිළිබඳ තොරතුරු බෙදා ගැනීම:**

- සියලුම ප්‍රතිලාභීන්ට ආහාර බෙදා දෙන දවස් ගැන දැනුවත් කර තිබේ ද? එසේම ඔවුන්ට ලැබෙන ආහාර වල තත්ත්වය ගැන

- හැන්දකට (උපකරණයට) අල්ලන ආහාර ප්‍රමාණය ගැන සියලුම ප්‍රතිලාභීන් දැනුවත් කර තිබේ ද?

- ආහාර සලාකයේ කරන ලද වෙනස්කම් ගැන සියලු ප්‍රතිලාභීන් දැනුවත් කර තිබේ ද?

- තොරතුරු පතුරුවා හරින්නේ කෙසේ කවද ද?

- වඩාත් අවදානමට ලක්වී ඇති / විශේෂ තත්ත්වයන් මුහුණ පා ඇති අයට දැනුම් දීමට වෙනත් ක්‍රම යොනු ගනී ද? (ළදරුවන්, අන්ධ අය, වයසක අය ආදිය)

- ක්‍රියාකාරීකරන සහායකයා, වගකීම පිළිබඳව ප්‍රමිතීන් පෙන්වා දෙනු ලැබේ ද?

**බෙදා හැරීමේ කාලීන බව:**

- බෙදා හැරීම වෙලාවට සිදුවේ ද?

- ක්‍රියාත්මක කිරීමේ පාර්ශ්වකරු වෙලාවට පැමිණේ ද?

- ආහාර පැටවීම, බෑම ආරක්ෂාකාරීව සිදු කෙරේ ද?

- බෙදා හරින මුලු කාලය තුළ WFP, හෝ UNHCR ක්‍රියාත්මක කිරීමේ පාර්ශ්වයන් රැඳී සිටී ද?

# ආහාර නොවන ද්‍රව්‍ය බෙදීමේ වාර්තාව

කඳවුර　　　　　　　　　　අංශය　　　　　　　　　　කලාපය

| ප්‍රජා/අංශ කැටිය | ආහාර නොවන භාණ්ඩ වර්ග සහ | ලැබුනු ආහාර නොවන කට්ටල සංඛ්‍යාව | බෙදා හැරි කට්ටල සංඛ්‍යාව | ශේෂය | සේවා සැපයු ගෘහ මූලික ගණන |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

බෙදා හැරි නිලධාරියාගේ නම/අත්සන:　　　　　　　　දිනය:

අධීක්ෂකයාගේ නම/අත්සන:　　　　　　　　දිනය:

කඳවුරු කළමනාකරුගේ නම/අත්සන:　　　　　　　　දිනය:
(ඉහත ඒවාට වෙනස් නම්)

* විෂමතාවක් වේ නම් පැහැදිලි කරන්න

# ආහාර නොවන ද්‍රව්‍ය බෙදා දුන් පසු නිරීක්ෂණ පෝරමය

ආහාර නොවන ද්‍රව්‍ය බෙදා දුන් පසු නිරීක්ෂණ පෝරමය

කඳවුර:
බෙදා දෙන ස්ථානය:
බෙදා දෙන දිනය:
බෙදා දීමේ ලේඛනයට අනුව ගෘහ මූලික නම:

ප්‍රතිලාභී ප්‍රශ්නාවලිය

1. ගෘහ මූලිකයා සම්මුඛ පරීක්ෂණයට පැමිනියේ ද?

ඔව් ☐

නැහැ ☐

"නැත්තම්" ඔහු/ඇය ඉන්නා තැන පැහැදිලි කරන්න.

.................................................................................................................................

.................................................................................................................................

2. මෙම ගෘහයේ කී දෙනක් ජීවත්වේ ද?.......................................................................................

කරුණාකර පැහැදිලි කරන්න

| වයස | පි. | ස්. |
|---|---|---|
| 0-5 | | |
| 6-17 | | |
| 18-50 | | |
| 50 + | | |

3. ඔබගේ පවුලට NFI පැකේජයක් ලැබුනේ ද?

ඔව් ☐

නැහැ ☐ (ලැබුනේ නැත්තම් ඇයි දැයි පැහැදිලි කරන්න.)

.................................................................................................................................

.................................................................................................................................

4. ලැබුන අයිතම මොනවා ද? ඒවාට කළේ කුමක් ද?

| අයිතම | ලැබුනා | ප්‍රමාණය | තම ප්‍රයෝජන තැබුවා | විකිණා | හුවමාරු කළා | වෙනත් | තත්වය විස්තර කරන්න |
|---|---|---|---|---|---|---|---|
| ප්ලැස්ටික තහඩු | | | | | | | |
| කුස්සි කට්ටල | | | | | | | |
| පැදුරු | | | | | | | |
| බ්ලැන්කට් | | | | | | | |
| ජෙරි ටින් 1 බඳුන් | | | | | | | |
| සබන් | | | | | | | |
| සනීපාරක්ෂක තුවා | | | | | | | |
| ලන්තෑරුම් | | | | | | | |
| ................ | | | | | | | |
| ................ | | | | | | | |

තත්වය විස්තරකරන්න: G = හොඳයි R = සාධාරණයි P = දුර්වලයි

**විකුණු හෝ හුවමාරු කළ අයිතම ගැන:**

5. විකුණු අයිතම වල ආදයම් පහදන්න

.......................................................................................................

6. හුවමාරු කළ අයිතම කුමකටද? (අර්ථලාභියාගේ පෙළඹීම හුවමාරුව ගැන පහදන්න)

.......................................................................................................

7. කරුණාකර අයිතම වල වෙනත් ප්‍රයෝජන පහදන්න

.......................................................................................................

8. අයිතම වල තත්ත්වය ගැන: අයිතම වලින් එකක් හෝ වැඩි සංඛ්‍යාවක තත්වය "දුර්වල" ලෙස දැකිවී නම් හේතු පහදන්න.

.......................................................................................................

9. සම්මුඛ සාකච්ඡාකරුගේ විවේචන

.......................................................................................................

10. සම්මුඛ සාකච්ඡාකරුගේ නිරීක්ෂණ

.......................................................................................................

සම්මුඛ සාකච්ඡාකරුගේ නම:.................................................... දිනය:....................................


# අවතැන් වූ ජනයාට ආහාර බෙදා දීමේ දී ඇතිවිය හැකි බලකිරීමේ ක්‍රියා. ක්ෂේත්‍ර - පිරික්සුම් ක්‍රමවේද සහ ප්‍රතිචාර

| බලපෑම් වර්ගය | බලපෑම් අවම කිරීමට WFP මගින් යෙදූ ක්ෂේත්‍ර පිරික්සුම් ක්‍රමවේද | අවදානම් /සීමා |
| --- | --- | --- |
| **ජීවිසුම:** ජනයාට ස්වාන යනුවෙන් අදහස් වන්නේ නිදහසේ එහා මෙහා යෑමට සහ කතාබහට ඇති නිදහසය | • අදාල මානව හිතවාදී ප්‍රතිපත්ති වලට බලකා සංවේදීකිරීම<br>• කැරලි කරුවන්ට අන්තර් ජාතික නීතිය යටතේ ඇති වගකීම් පිළිබඳ උපකාරක නීතිමය සටහන් ලබා දෙන්න.<br>• ස්ථානීය බලධාරීන් සමග අන්‍යෝන්‍ය ගෞරවයන් සහ විශ්වාසයක් ඇති කර ගැනීම<br>• ප්‍රජාවන් තුළට පිවිසීමට හොඳම මග ගැන උපදෙස් ගන්නා<br>• ගිවිස ගැනීමේදී සාමය ගොඩනැගීමේ කමිටු සහ ප්‍රජාව සම්බන්ධ කර ගන්න<br>• "ප්‍රතිලාභී ක්‍රියාපරිපාටි" අත්සන් කිරීමේදී සියලුම පාර්ශ්වයන් යෝජනා කරන්න<br>• රජය සමග ගිවිස ගැනීමේදී ආධාර කරන්නන් සම්බන්ධ කරගන්න<br>• බෙදා හැරීමට පෙර කැමැත්ත ගන්න | • මූලිකත්වය ගන්නේ කවරෙක් ද සහ ඔවුන්ගේ ගති ලක්ෂණ දැන ගැනීම දුෂ්කරය<br>• බලධාරීන් ය සහ මධ්‍යස්ථ දැයි පිළිගන්නේ ද?<br>• කැලිකාර කණ්ඩායම් වලට නිත්‍යනුකූල බව දිය යැකිය. |
| **වැඩිපුර ලියාපදිංචි කිරීම:** බලවතුන් විසින් ව්‍යාජ ප්‍රතිලාභීන් ඇති කිරීම සහ/හෝ ගම්වැසියන්, ගලා එන පවුල් ප්‍රමාණ සහ අවතැන් වූ කාණ්ඩ නිර්මාණය කරමින්: | • ගිවිසුම් කනිකාවලට සහාය දැක්වීමට ජාත්‍යන්තර වාණිජ අංශ දිරිමත් කරන්න<br>• බෙදා හැරීමේ ප්‍රතිපත්ති පහදන්න<br>• සත්‍යාපන ව්‍යායාම: පැහැදිලිව හඳුනාගත් ඉලක්ක ගත නිවාස ලියාපදිංචිය (වියපත්, ඌන-පෝෂිත, (IDPS) අභ්‍යන්තර අවතැන් වූ: ආබාධිත, ජනවාර්ගික සුළු ජාතීන්)<br>• නිරීක්ෂකයින් සංඛ්‍යාව වැඩි කරන්න<br>• බෙදා හැරීමේදී ප්‍රතිලාභියාට පවුලේ සියලුම සමාජිකයින් නම් කරන්න දන්වන්න. සසඳ බැලීමේ ලේඛනය සමග සමානදැයි බලන්න. | • ජංගම ප්‍රජාව ලියාපදිංචි කිරීම සංචලන වැඩිවේ.<br>• තම ඥාතීන්ගෙන් බලපෑම් වැඩියෙන් ඇති ස්ථානීය නායකයින්, හමුදා බලධාරීන්, වඩාත් බලවත් |

| | | |
|---|---|---|
| **ප්‍රතිලාභීන්ගේ ඉවත් කිරීම අවතැන් වූ:** සමාජික සහ දේශපාලිනික වශයෙන් කොන් කරන ලද කණ්ඩායම් (ආපසු එන්නන්) මේ කාණ්ඩවලට ලියාපදිංචිවීමට ඉඩ නොදෙයි. | • සලාක පතේ කාන්තාවන්ගේ නම් සලකුණු කරන්න.<br>• ප්‍රතිලාභීන් සහ අවතැන්වූවන්, බලධාරීන් සමග "ලියාපදිංචි කමිටු" සංවිධානය කරන්න.<br>• ස්වයං- ඉලක්ක ගත ක්‍රියාකාරකම් වල යොමු වන්න. (FFW කුඩා සෝදිසි තොග පමණක් නම්)<br>• පියපත් ප්‍රජාව ලියාපදංචි කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ කර ගන්න.<br>• ඉලක්ක ගත සහාය<br>• කුඩා ඒකක වලට සහ ඌන පෝෂිතයින්ට සෘජුව බෙදදීම<br>• අධි ඌන පෝෂිත ප්‍රජාවට සලාක දෙකක් දීම.<br>• අඩු කැමැත්තක් ඇති ආහාර බෙදීම (ළමා ආහාර ද) | ස්ථානිය බලධාරීන් බෙද හැරීම හසුරුවයි. (නිවරදි ප්‍රතිලාභීන් බෙද දීමට වලට නොපෙන්වයි) |
| **බෙදා හැරීම හසුරුවීම:** සාවද්‍ය තොරතුරු සහ සම්පත් යොමුකර ගැනීමට ඌන පෝෂිත කණ්ඩායම් නඩත්තුවට යොමුවීම, ඒජන්සි එකිනේකා කෙරෙහි කොටවීම | • ප්‍රජාවට ඇති හිමිකම් පිළිබඳ දන්වන්න. පිසින ලද ආහාර බෙදීම. (උපරීම අංශ පමණක්)<br>• බෙදීම අවතැන් වූ අසල්වාසින් සම්පයට කිට්ටුව කරන්න.<br>• ආපසු එන අයට බෙදා දීමට ඉඩදීමට ගිවිසුම් අත්සන් කරන්න. | • ඉහත අංක බලන්න<br>• ස්ථානිය බලධාරීන් හමුදා අධිකාරීන්ගේ උපරීම බලපෑමට ලක්වේ. වඩාත් බලවත් සහ ඥාතින් |
| **නොනිසි නායකයින් විසින් පවත්වනු ලබන ආහාර බෙදීම:** වැඩිකිරීමට සහ/හෝ ජනතාව කෙරේ ඒ අයගේ බලපෑම පැවැත්වීමට. | • පැහැදිලිව හඳුනාගත් ඉලක්ක ගත කණ්ඩායම් ලියාපංදිචි කිරීම (5 ගැබිනි සහ කිරි දෙන කාන්තාවන්)<br>• **නිදහස් නිරීක්ෂණය ගැන සහතික වන්න.**<br>• **පරිවර්තකයින් (තෝල්කයින්) මාරු කරන්න.**<br>• **ඒජන්සි වලට බල ප්‍රදේශ බෙදා දීම සහ ආහාර බාස්කට් සම්බන්ධිකරණය / බෙදාදීමේ විරාම** | • ඉහත පරිදිය |
| • හොරකම<br>• කොල්ලකෑම<br>• ප්‍රහාර | • ස්ථානිය ප්‍රජාවට තමන්ට හිමි ආහාර ගැන දන්වන්න<br>• ළමා ආහාර බෙදා දෙන්න (උදා :CSB) හෝ මුදු තබන්න බිස්කට් "කාන්තා" ආහාර ලෙස<br>• කෙලින්ම ගෙදරට බෙදාදීම හෝ ප්‍රජාව මගින්<br>• සලාකය ගෙදර ගෙනයාම ඉඩ සලසන්න | • ප්‍රහාරකයින් මැනවින් අධික්ෂකයින්ගෙන් රාජකාරි ගැන පැහැදිලි නියෝග ලබා නොගන්න.<br>• ඉහත දැක්වූ කරුණු ගැන බලන්න. |

| | |
|---|---|
| • වෙනත් මගකට හැරවීම<br>• බෙදාදීමට බාධකිරීම<br>• කාන්දුවීම<br>• වංචාවෙන් අත්කර ගැනීම<br>• බෙදු දුන් පසු බදු අයකිරීම. | • අවදානමට ලක් වු කණ්ඩායම්වලට සලාකය සෘජුව ලබා දීමට කණ්ඩායම් සකසන්න.<br>• අර්ථ ලාභින්ට පැමිණිලි කිරීමේ ක්‍රමයක් ඇති කරන්න.<br>• ආහාර බෙදා හැරීමේ වැඩ සටහනක් පවත්වා ගෙන යැමේදී ප්‍රතිලාභීන්ගේ අදහස් විමසන්න.<br>• ප්‍රාදේශිය මට්ටමින් හොඳ සම්බන්ධතාවක් තබා ගන්න.<br>• විශාල ප්‍රමාණයෙන් තොග ගබඩා කිරීම හෝ බෙදීම නොකරන්න.<br>• ජනතා අවධානය බෙදා හැරීම ගැන වැලක්වීම සඳහා විමධ්‍යගත කරන්න.<br>• ප්‍රවාහනයේදී සලාක හොරකම් කිරීම, නැතිවීම රජයෙන් වාණිජ එකඟත්වයක් ලබා ගනන්, ගෙවීමට |
| **ලිංගික ප්‍රචණ්ඩත්වය** | • බෙදීම් කරන අතර/ හා පසුව කාර්ය මණ්ඩලයට (ජාත්‍යන්තර හෝ ස්ථානිය) පැමිණි සිටීම<br>• නිතර නිතර කුඩා ප්‍රමාණවලින් බෙදා දෙන්න.<br>• වැඩි අවධානයක් නැති භාණ්ඩ වලට යොමුවන්න<br>• බෙදා දෙන දිනය කල්තබා දැනුම්දීම හෝ කොහෙත්ම දැනුම් නොදී සිටින්න. |
| **බලෙන් නම්මවා ගැනීම /බලෙන් පැහැර ගැනීම:** ලෝක ආහාර වැඩසටහනට (WFP) බලකිරීම, සහ/හෝ අභ්‍යන්තර අවතැන්වුවන්ට ඔවුන්ගේ කැමැතිව එරෙහි යමකට තර්ජනය කිරීම. | • පිසින ලද ආහාර වැටෙන් පිටතදී ලබාදෙන්න<br>• ස්වයං ඉලක්කගත කටයුතු වැඩිකරන්න.<br>• කාන්තාවගේ කණ්ඩායම් වශයෙන් යැමට උගන්වන්න.<br>• "ප්‍රතිලාභි නිති" සියලු පාර්ශ්වයින් ලවා අත්සන් කිරීමට යෝජනා කරන්න.<br>• බිම තණ කොළ කපා පාර පැහැදිලි තබන්න.<br>• අසල්වැසි මුර සේවා ඇති කරන්න.<br>• සම්පත් පොලිස් පරීක්ෂකවරයා සමග යන්න. නිවරදි ක්‍රියාමාර්ග ගන්න.<br>• ස්වදේශිය කාර්ය මණ්ඩල වෙනත් ප්‍රදේශවලට යලි යොදවන්න.<br>• ස්ථානිය/සව්දේශිය නායකයින් සමග සාකච්ඡා කරන්න.<br>• පරිසරත් ඊට සුදුසු වන තෙක් බෙදීම නොකරන්න. |

# 10 ජලය සහ සනීපාරක්ෂාව



*වේවිනියානු කාන්තාවන් වතුර පොම්පයක් අසල. කඳවුරු වැසියන් අතර රෝග සහ බෝවෙන රෝග වැලක්වීම, කඳවුරු ආරම්භයේදීම අරක්ෂිත ජලය ලබාදීම සනීපාරාක්ෂාව සඳහා තීරණාත්මක වේ. ඡායාරූපය : UNHCR*

# පරිච්ඡේදය 10 : ජලය සහ සනීපාරක්ෂාව

## 10.1 හැඳින්වීම

හදිසි ආපද අවස්ථාවන්වලදී සහ කඳවුරු ආශ්‍රිතවද දැකිය හැකි කැපීපෙනෙන සෞඛ්‍ය ප්‍රශ්නයක් නම්, ජලය සහ සනීපාරක්ෂාව සම්බන්ධ රෝග තත්ත්‍යවන්ය. නිසි සනීපාරක්ෂාව නොමැති අවස්ථාවන් වන, වැසිකිළි පහසුකම් ප්‍රමාණවත් නොවීම, අනාරක්ෂිත ලෙස අපද්‍රව්‍ය මුදාහැරීම සහ සෞඛ්‍ය හුරුපුරුදු ඉතා පහළ මට්ටමක තිබීම ආදිය නිසා ජල මූලාශ්‍රයන් අපිරිසිදු වී, විෂබීජ තැන්පත්වීමේ අවදානම වැඩිවේ. පාචනය, අතිසාරය වැනි රෝගයන්ට ප්‍රධානම හේතුවක් වන්නේ මෙම ජල මූලාශ්‍ර, මිනිස් මලපහ මිශ්‍රවීමෙන් අපිරිසිදු තත්ත්වයට පත්වීමය. හොඳ සෞඛ්‍ය හුරුපුරුදු වලට යොමුවීම උනන්දු නොකළහොත්, සනීපාරක්ෂාව සහිත පිරිසිදු ජලය ලබාදීමට නොහැකි වේ.

සනීපාරක්ෂක සේවාවන් සැපයීම සහ ලෙඩ රෝග පැතිරවීම වැළැක්වීම සඳහා ඇති ප්‍රධාන බාධකයක් නම් කාලයයි. මෙසේ කාලය ප්‍රධාන ගැටළුවක් වන අවසථාවක් නම්, හදිසි ආපදවන් යටතේ අවතැන්වූ ජන සමූහයක්, පහසුකම් නොමැති ප්‍රදේශයට යැවීම හෝ මාරුකිරීම සහ නාගරික ප්‍රදේශවල ව්‍යුහය තුළ හෝ යටිතල පහසුකම් වල විනාශකාරී තත්ත්වයක් ඇතිවීම [1] වැනි අවස්ථාවන්ය. සරණාගත කඳවුරුවල සහ අභ්‍යන්තර අවතැන් වූ තත්ත්වයන් යටතේ බොහෝවිට සිදුවන දෙයක් නම් සියලුම පුද්ගලයින් මහා පරිමාණයෙන්, තවමත් ප්‍රමාණවත් පහසුකම් නොමැති පළාත්වලට මාරුකර යැවීමයි.

මෙම පරිච්ඡේදයෙන්, ජලය සහ සනීපාරක්ෂාව සෞඛ්‍ය සහ පෝෂණය වැනි වැඩසටහන් පිළිබඳ තාක්ෂණික කරුණු ඉදිරිපත් කිරීමට අදහස් නොකෙරේ. එමෙන් මෙම පරිච්ඡේදය තුල ජාත්‍යන්තරව පිළිගත් නිශ්චිත අවම සම්මතයන් හෝ ප්‍රමිතින් පිළිබඳව කරුණු දැක්වීමක් සිදු නොවේ. සම්මතයක් භාවිතා කෙරෙන අවස්ථාවන්හිදී, ඊට අනුකූලව අවශ්‍ය පරිදි, සුදුසු ලෙස යොද ගැනේ. විශේෂඥ ඒජන්සි විසින් මෙම අවශ්‍ය සේවාවන්, එම අංශයන්ට ලබාදීම සාමාන්‍යයෙන් සිදුකෙරේ. මෙ පරිච්ඡේදයේ අරමුණ වන්නේ එම සේවාවන් හා බැඳුණු මෙන්ම ඊට සාපේක්ෂකව. කඳවුරු පාලකයින්ගේ භූමිකාව සහ ඔවුන්ගේ වගකීම් පිළිබඳව හඳුනා ගැනීමට උත්සාහයක් දැරීමය. මෙම පරිච්ඡේදයට පදනම් වන කරුණු පිළිබඳ පුළුල් අධ්‍යයනයක් කිරීම සඳහා, කියැවීමට නිර්දේශිත පොත පත සහා ලේඛන පිළිබඳ විස්තරයක් පරිච්ඡේදය අවසානයේ ඇති අත්‍යාවශ්‍ය කියවීම යනුවෙන් වෙන් කොට ඇති කොටසෙහි ඇතුලත් කොට තිබේ.

(ඡේද 7.3 සහ 7.4 හි) පහත දැක්වෙන අංශයන් පිළිබඳ කඳවුරු කළමනාකාරීත්වය සතු වගකීම් පිළිබඳ පූර්ණ විග්‍රහයක් දැක්වේ. එනම්: ජලය බෙදාහැරීම, සනීපාරක්ෂක පහසුකම් ඉදිරිකිරීම, සෞඛ්‍ය හා පිරිසිදුකම් ප්‍රවර්ධනය කිරීම, ප්‍රජාව මනාව සංවිධානය කිරීම, සීමා රහිතව රට හැරයෑම ඝන අපද්‍රව්‍ය සහ රෝගාකාරක පරපෝෂිතයින් සීමා කිරීම සහ මළකඳන් ඉවත් කිරීම ආදියයි. මෙම සියළු අංශයන්ගෙන් විද්‍යාමාන වන සනීපාරක්ෂක කටයුතු හා බැඳුණ සියළුම සේවාවන්ට අදළ කටයුතු යොමුකිරීමේ පහසුව මත වෙන් වෙන් නායකත්වයන් යටතට පත්කොට ඇත. (7.5) ඡේදයේදී සාකච්ඡාවට බඳුන් වන්නේ කඳවුරු ආශ්‍රිත සෞඛ්‍ය සේවා පහසුකම් ඇතුලු ප්‍රජනන සෞඛ්‍ය, සෞඛ්‍ය අධ්‍යාපනය, සෞඛ්‍ය පිළිබඳ පිරික්සීම සහ මානසික සුරැකීම වැනි අංශයන්ය (7.6) ඡේදයේදී සාකච්ඡාවට යොමුවන්නේ පෝෂණය පිළිබඳ වැඩසටහන් සහ කඳවුරුවල පෝෂණය පිළිබඳ කෙරෙන නිරන්තර ඇගයීම් ආදිය පිළිබඳවය (7:6:1) ඡේදයෙන් දැක්වෙන්නේ (7.7) ඡේදය පිළිබඳ සංක්ෂිප්ත උපදේශාත්මක සටහනකි. මෙම පරිච්ඡේ දයට අදළ මෙවලම් කාණ්ඩය (7.8) ඡේදයට ඇමුණුමක් ලෙස එක්කොට තිබේ. (නිවැරදිව තහවුරු කරගත් යුතුවේ.)

---

[1] **See: 'Emergency Sanitation', by P. Harvey, S. Baghri, B.Reed, The Water, Engineering and Development Centre (WEDC), p. 60, 2002.**

## 10.2 භූමිකාවන් සහ වගකීම්.

හදිසි ආපදා තත්ත්වයන් යටතේ සිදුවන කරදරකාරී තත්ත්වයන්ට සහ සෞඛ්‍ය අවදනම් තත්ත්වයට එරෙහිව ගත හැකි මූලික ආරක්ෂාව පියවර වන්නේ අවශ්‍ය ප්‍රමාණයට ජලය සැපයීම සහ නිසි සනිපාරක්‍ෂක කටයුතු සැලැස්වීමය. කෙසේ වෙතත් අවශ්‍ය ප්‍රමාණයට ජලය සැපයීම සහ නිසි සනිපාරක්‍ෂක කටයුතු සැලසීම යන කරුණු දෙකෙහිදීම විශේෂඥ යොමුවක් හෝ එළැඹීමක් අවශ්‍ය වේ. කඳවුරක පැවැත්ම. වෙනුවෙන්, මෙම අංශයන්හි ඇති විශේෂත්වය නිසාම කඳවුරු කළමණාකරීත්වයට සම්බන්ධීකරණය, පසුවිපරම සහ පිරිස් සංවිධානය වැනි අංශයන් පිළිබඳ ප්‍රධාන භූමිකාවක් ඉටුකිරීමට පැවරී තිබේ. මෙම අංශයන් පිළිබඳව කඳවුරු පරිපාලකයින්ගේ වගකීම්, විවිධාකාරවූ. ස්ථානයන්ට අනුව විශාල වශයෙන් වෙනස් වේ. ග්‍රාමීය ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය මුදාහැරීමේ කාර්යය අනිවාර්යෙන්ම කඳවුරු පරිපාලකයින් විසින් ඉටු කළයුතු අතර, නාගරික ප්‍රදේශවල අපද්‍රව්‍ය මුදහැරීමේ කාර්‍ය්‍යයේ ප්‍රධාන භූමිකාවක් ඉටු කරනු ලබන්නේ ප්‍රාදේශිය අධිකාරිය විසින්ය

විශාල වශයෙන් අවතැන්වීම් සිදුවූ අවස්ථාවන්හිදි, සනිපාරක්‍ෂක කටයුතු සම්බන්ධයෙන් විවිධ ඒජන්සි මැදිහත්වී කටයුතු කරන අතර ඔවුන්ගේ භූමිකාවන් සහ වගකීම් පිළිබඳ පැහැදිලි තත්ත්වයක් නොමැති බැවින් සනිපාරක්ෂක කටයුතු පිළිබඳ ක්‍රියාකරන ඒජින්සි සහ කඳවුරු පරිපාලකයින් විසින් දරණ විවිධ වගකීම් සහ භූමිකාවන් පිළිබඳ නිශ්චිත අවබෝධයක් සියළු දෙනාටම ලබා දීමේ වගකීම සහතික කිරීම කඳවුරු පාලකයින්ට භාරවේ. වගකීමට ඉටුකිරීමට බැඳී සිටටින ඒජන්සි සමග සමහර සැලසුම් විධිමත් කිරීම අත්‍යවශ්‍යවේ. ජලය, සනිපාරක්ෂාව, සෞඛ්‍ය, රැකවරණය සහ ආහාර සපයන විවිධ ඒජන්සි සමග ස්ථිරසාර සම්බන්දතාවක් ගොඩනගා ගැනීම අත්‍යවශ්‍යවේ. එමෙන්ම සෞඛ්‍ය අමාත්‍යංශ සහ බලධාරින් සමග සැලසුම් කිරීම, කඳවුරු පාලකයින් තවදුරටත් කළයුතු අතර, ප්‍රාදේශිය සහ දේශිය ක්‍රියා මාර්ගයන් අනුගමනය කිරීම, සහ ප්‍රාදේශිය දැනුම යොදා ගැනීමද සිදු කළ යුතුය. අවතැන්වූ ප්‍රජාව හැකිතාක් ප්‍රමාණයකින් යථාර්ථවාදිව සුදුසු අන්දමින් යොමුකරවීම තුළින්, සනිපාරක්‍ෂාව සඳහා දියත් කරන කටයුතු ප්‍රතිඵලදායි කරගැනීමට ඇති එකම මාර්ගය වේ.

## 10:2:1 පසුවිපරම සහ පරීක්‍ෂාව කථාකිරීම

එක පිට එක වැටෙන සේවාවන් සහ ඇති පරතරය හෝ ඉඩකඩ කඳවුරු පාලකයින් විසින් හඳුන්වා ගත යුතුවේ. සම්බන්ධිකරණය සහ පසුවිපරම පමණක්ම ප්‍රමාණවත් නොවේ. සනිපාරක්‍ෂාව නොමැති හෝ ඒ සඳහා ඉඩකඩ ඇති අවස්ථාවන් හඳුනාගත්විට කඳවුරු පාලකයින් විසින් මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා අමතර ඒජන්සිවලට පෙළඹවීම් කරන පුළුල් ක්‍රියාශිලි කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම අවශ්‍ය වේ. සියලුම ජල සහ සනිපාරක්‍ෂාව පහසුකම් පිළිබඳ පසුවිපරම් කිරීමේදි ප්‍රමාණය, ගුණාත්මක බව සහ ආවරණය මෙන්ම අනිකුත් ද. පිළිබඳව වාර්තා කිරීම සඳහා සුදුසු පරිදි යොදාගත හැකි වාර්තා කිරීමේ පත්‍රිකාවක් කඳවුරු පාලකයින් විසින් භාවිත කළ යුතුවේ. වඩාත් පහසුවෙන් යොමු කළ හැකි විවිධාකාරවූ පසුවිපරම් කිරීමේ ආකෘතින් මෙම පරිච්ජේදයට අමුණා ඇත. "මෙවලම්" (NCA 2005) සේවාභාර සපයාගැනීමේදි ප්‍රධාන වශයෙන් බාධාවන් පැමිණි අවස්ථාවන්හිදි, කඳවුරු පරිපාලකයින් විසින්, අධාර සපයන දේශිය ආයතන වන DFID, USAID සහ ECHO, සමග සම්පව, සාකච්ඡා කොට ඔවුන් ඒ සඳහා පොළඹවා ගැනීම කළ යුතුවේ. [2] හදිසි අවස්ථාවන්හිදි ආධාර එකතුකරගැනීමේ කාර්‍ය්‍යය සම්බන්ධිකරණය කිරීමේ උත්සාහයේදි එක්සත් ජාතින්ගේ ඒජන්සි වන OCHA සහ UNHCR ආයතනවල සහයෝගය ලබාගත යුතුයි.

---

[2] **UK Dpartment for Interrcational Development : us Agency for International Development: Humanitarian Aid Department of the European Commission**

**පසු විපරම:**

කඳවුරු පාලකයින් විසින් සේවා සැපයීම / බෙදාහැරීම පිළිබඳ විමසිලිමත් විය යුත්තේ හරියට මුරකිරීමට යොදාගෙන සිටින සුනඛයින් ලෙසිනි. එමෙන්ම ජලය සහ සනීපාරක්ෂක සේවාවන්ගේ තත්ත්වය සහ නිසි වේලාවට එම සේවාවන් බෙදා හැරීමේ කටයුතු ඉටුකිරීම පිළිබඳ වගකීම දරණ ඒජන්සි සම්බන්දයෙන්ද අධීක්ෂණය කළ යුතුවේ. WATSAN ඒජන්සිය විසින් සපයන ලද, ප්‍රගමනය සහ තත්ත්වය පිළිබඳ වාර්තාව මනාව විමසා බලා, බෙදාහැරීමේදී සිදුවිය හැකි අඩුපාඩුකම්, සිදුවිය හැකි පරතරයන් හෝ අයුක්තීන් හඳුනාගත යුතුවේ. හඳුනාගතයුතු සමහර ප්‍රධාන විෂය පථයන් නම්:

- ප්‍රමාණය සහ පරිමාව: එක වැසිකිළියක් පාවිච්චි කළ හැකි සංඛ්‍යාව ? එක් පුද්ගලයෙකුට දිනකට අවශ්‍ය ජලය ලිටර් ප්‍රමාණය කොපමණද? මොනතරම් වේගයකින් වැසිකිළි පිරෙනවාද යන්න පිළිබඳව? පිරුණු වැසිකිළි නියමිත කාලයේදී වසාදමා සීල් තබනවාද යන්න පිළිබඳව?
- ආවරණය සහ ප්‍රවේශය : සැම අංශයකටම සේවාවන් එක සමානව ලැබෙනවද? මෙම සේවාවන් විශේෂ පළාත්වලට පමණක් සාන්ද්‍රනය වනවාද යන්න? ආසන්නයේම පිහිටා ඇති ජලය ලබාගන්නා ස්ථානයට යායුතු දුර ප්‍රමාණය B කොට්ඨාසයේ සිට තිබෙන දුරට වඩා A කොට්ඨාසයේ සිට තිබෙන දුර ප්‍රමානය වැඩිවීම.
- ජලය රැස්කිරීම: නිශ්චිත කාර්‍ය සටහනකට අනුව ජල රැස්කරන්නන් විසින් ජලය බෙදාහරිනවාද? WATSAN ඒජන්සිය මේ පිළිබඳව නිරීක්ෂණයක යෙදෙනවාද? මෙම ජල සපයන්නන් සියළු අංශවලට සමානව ජලය සපයනවාද?
- ප්‍රජා සහභාගිත්වය : ප්‍රජා සහභාගිත්වය සහතික කරන්නේ කෙසේද? වැසිකිළි නිර්මාණය කිරීමේදී කාගෙන්ද (මොනා කණ්ඩායමෙන්ද) අවශ්‍ය උපෙදස් ලබා ගත්තේ? කොයිතරම් දුරට අවතැන්වූවන්, මෙම වැසිකිළි ගොඩනැගීමේදී, ඒවා නඩත්තුකිරීමේදී සහ පසුවිපරම් කිරීමේදී සහයෝගය දක්වනවාද? සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු සඳහා අවතැන්වූ කණ්ඩායම් කොයිතරම් දුරට දායකවනවාද? ප්‍රජාව සමග මොන ආකාරයේ වැඩකටයුතු සැළසුම්කර තිබේද?
- අනාගත සැලසුම්: හදිසි අවස්ථාවකදී එනම් පොම්ප ක්‍රියා විරහිත විම, ජල නල හෝ ටැංකි වල දෝෂයක් ඇතිවීම ආදියේදී කාඩිනමින් පියවර ගැනීමට සුදුසු වැඩපිළිවෙළක් WATSAN ඒජන්සිය සතුව තිබේද යන්න.

## 10:2 ජලය සහ සනීපාරක්ෂාව

එකට විසඳාගත යුතුවන පරිදි බැඳුණු, ජලය සහ සනීපාරක්ෂාව යන තත්ත්වයන් දෙක සාමාන්‍යයෙන් WATSAN යනුවෙන් හැඳින්වේ. ඉතාමත්ම සරල පිළිවෙතකින් ජලය විසින්ම නිෂ්පාදනය කෙරෙන අපද්‍රව්‍ය සහිත ජලය හෝ අපිරිසිදු ජලය සනීපාරක්ෂාව පිළිබඳ ගැටලු මතු කරවන්නකි. හදිසි අවස්ථා තත්ත්වයක් යටතේ මෙන්ම සාමාන්‍ය තත්ත්වයක් යටතේ වුවද ඇතිවන ප්‍රධාන සෞඛ්‍ය ගැටලු අවම කර ගැනීමට හැකිවන එක් හේතුවක් නම් අවශ්‍ය ප්‍රමාණයට ජලය සහ සනීපාරක්ෂාව පහසුකම් සපයාදීමය. කඳවුරුවල දෛනික වැඩකටයුතු සහ ජිවන රටවන් සඳහා ජලය සහ කඳවුරුවල දෛනික වැඩකටයුතු සහ ජිවන රටවන් සඳහා ජලය සහ සනීපාරක්ෂාව අත්‍යවශ්‍යම අංගයක් වන බැවින්, එම අංගයන් පිළිබඳ නිපුන තත්ත්වයක් ඇති පුද්ගලයන්ගේ සේවා නිරන්තරයෙන්ම ලබාගැනීමට හැකිවන පරිදි සකස් විය යුතුය.

ජලය සහ සනීපාරක්ෂාව පිළිබඳ විශේෂඥයන්ගේ සේවාව කඳවුරු පාලකයින්ට ලබාදීම අත්‍යාවශ්‍ය වේ.

## 10:4 ජලය

පිරිසිදු පානීය ජලය ලබාගැනීමට ඇති අවකාශය අත්‍යවශ්‍ය අවම මානව අයිතිවාසිකමකි. හදිසි අවස්ථාවන්හිදී මෙන්ම කඳවුරු වලද, පානයට සුදුසු පානීය ජලය ප්‍රමාණවත් ලෙස සැපයීමට වහාම කටයුතු කිරීමට ප්‍රමුඛත්වය දිය යුතුය. කෙසේ වෙතත් (WHO) ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්දේශ කොට ඇති ජලයේ තත්ත්වය හෝ පිරිසිදු භාවය සහිත ජලය හදිසි අවස්ථාවන්හිදී සැපයීමට නොහැකිවේ. ජලයේ තත්ත්වයට වඩා ප්‍රමාණය වැදගත් වන බව පිළිගත් සම්මතයකි: ඉතාම උසස් තත්ත්වයේ ජලය සුළු පුමැණයක් ලැබෙනවාට වඩා සාමාන්‍ය තත්ත්වයේ ජලය විශාල ප්‍රමාණයක් ලැබීම, ප්‍රයෝජණවත් වේ.[3] ඉතාමත්ම සුළු ප්‍රමාණයක් ජලය අවශ්‍ය වීම. විවිධ හේතූන් යටතේ සිදුවේ. එමෙන්ම කාලගුණික තත්ත්වයන් සහ විවිධ ඒජන්සි භාවිත කරන ප්‍රමිතින්ට අනුකූලව මෙය වෙනස්වේ.

සැපයෙන සහ භාවිත කෙරෙන ජලය පිළිබඳ විස්තරය භූමිය තේරීම සහ කඳවුරු නිර්මාණය කිරීම ඇතුලත් 4 වන පරිච්ඡේදයේ 4.5 ඡේදයේ ඇතුලත්වේ.

> ජලය සහ සනිපාරක්‍ෂාවන් සැපයීමේදී උපයෝගිකරගන්නා මූලික අවශ්‍යතා හඳුනාගැනීමේ සහ තක්සේරු කිරීමේ ලේඛනය, මෙම පරිච්ඡේදයේ මෙවලම් කට්ටලයට අමුණා ඇත. (විෂය ක්ෂේත්‍රය 2004)

කඳවුරුවලට අවශ්‍ය ජලය සැපයෙන්නේ මතුපිට ජලාශ්‍ර වලින්, එනම් ගංගාවලින් සහ වැව් වලින්ය. එසේත් නැත්නම් භූගත ජලයෙහි, එනම් ළිංවලින්, හාරන ලද වලකින් හෝ දිය ඇලිවලින් ජලය ලබාගැනේ. ජල සැපයුම අවිනිශ්චිත වුවද, සමහර අවස්ථාවලදී වැසි ජලය ඉතා ප්‍රයෝජණවත්, බලාපොරොත්තු නොවූ අවස්ථාවලකදී ලැබෙනා අගනා සැපයුමකි. සාමාන්‍යයෙන් මතුපිට ජලය අපිරිසිදු සේ පිළිගැනෙන අතර ඒ සඳහා පිළියම් කළ යුතුවේ. සෘතු අනුව මතුපිට ජලයේ ප්‍රමාණය වෙනස් විය හැකි. සියලුම නොගැඹුරු මතුපිට තිබෙන ජලය එනම් මීටර් 03 කට වඩා අඩු ගැඹුරක පිහිටි ජලය බොහෝ විට අපිරිසිදුවී තිබිය හැකි බැවින් මතුපිට ජලය මෙන් එය පිරිසිදු කළ යුතුවේ. ගැඹුරු ජල මූලාශ්‍රවල ජලය සාමාන්‍යයෙන් පිරිසිදු හා හොඳ තත්ත්යකින් පවති. ඊට හේතුව එම ජලය ස්වාභාවිකවම පෙරහනයවීමය (FILTER) කෙසේ වෙතත් සියලුම ජල මූලාශ්‍රයන් අපිරිසිදු විය හැකි බවට සිතිය හැකි. ජලය විශාල පරිමාණයෙන් පිරිසිදු කිරීම සඳහා විශේෂඥ සේවාවන් අවශ්‍ය වේ. එමෙන්ම මෙම සේවාවන් නිසි ලෙස ඉටු කිරීම පිළිබඳව කඳවුරු කළමනාකරණය සහතික විය යුතුය. සාමාන්‍ය වශයෙන් පිරිසිදු කිරීමේ ක්‍රියාවලියන් සහ ළිංවල ජලයේ විෂබීජ අපහරණය කිරීම වැනි කාර්යයන් සඳහා විශේෂඥ දැනුම අවශ්‍ය නොවේ.

> ළිංවල සහ ඛණිත ලද වලට වල්වලට ජලය හදිසි අවස්ථාවකදී පිරිසිදු කිරීම සහ විෂබීජ අපහරණය කිරීම, ඉතා සරළ ක්‍රම දෙකක් මගින් පියවරෙන් පියවරට ඉටුකරන ආකාරය ඇතුලත් පත්‍රිකාවක් මෙම පරිච්ඡේදය අවසානයේ ඇති මෙවලම් කට්ටලයට අමුණා ඇත. (WHO Technical Notec # 1& 2, 2005)

හදිසි අවස්ථාවක, මුල් කාලය තුළදී ප්‍රයෝජනයට ගත හැකි එකම ජල මූලාශ්‍රය විය හැක්කේ මතුපිට ජලය පමණි. අනිකුත් ජල මූලාශ්‍රයෙන් පිළිබඳ ක්‍ෂණික තීරණ ගැනීම අවශ්‍යවේ. එනම් ළිං ආදිය කැපීම හෝ වළවල් හෑරීම ආදි කටයුතුය. නගර ආශ්‍රිතව පිහිටා ඇති කඳවුරුවලට හදිසි අවස්ථාවක් යටතේ ජලය අවශ්‍යවූ විටකදී, දැනට පවතින ප්‍රධාන ජල බෙදාහැරීමේ පද්ධතිය හරහා අලුතෙන් ජල නළ සවිකොට අවශ්‍ය ජලය අවස්ථානුකූලව ලබා ගැනේ. කෙසේවුවද ප්‍රබල ආපදාවන් සහ භූමිකම්පාවන් වැනි තත්ත්වයන් යටතේ මෙම නාගරික ජල බෙදාහැරීමේ පද්ධතින්ට විශාල වශයෙන් විශාල වශයෙන් හානි

---

හදිසි අවස්ථා පිළිබඳ අත් පොත බලන්න. UNHCR, P 217, 2000

සිදුවීමට ඉඩ ඇත. මෙවැනි හදිසි අවස්ථාවල මුල් අවධියේදී අනුගමනය කළ හැකි එකම විකල්ප මාර්ගය වන්නේ, ජලය බෙදා හරින ස්ථානයකරා ට්‍රක් මාර්ගයෙන් ක්ෂණිකව ජලය සැපයීම පමණි. එනමුත් මෙම ක්‍රමයන් යුහුසුලුවම සෙවීම ආරම්භ කළ යුතුය එමෙන්ම මතු ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ජලය පරිවර්තන ටැංකිවල රැස්කර තැබීමේ ක්‍රමයක් අනුගමනය කළ යුතුය. ජලය. සලාක ක්‍රමයක්

යටතේ බෙදාහැරීමේ සමහර විටකදී අවශ්‍යවන මුත් එය මනාව කළමනාකරණය කිරීම ඉතා වැදගත් වේ. මේ සඳහා ආරක්ෂක පියවර ගත යුතුවේ. කෙසේ වෙතත් දැනටමත් කොන්වී සිටින කණ්ඩායම් වලට ජලය ලබාගැනිමට මෙම ක්‍රමය බාධාවක් විය හැකිය.

**සීමා කිරීම (සලාක ක්‍රමය)**

ජලය ප්‍රමාණවත් ලෙස නොමැති අවස්ථාවන්හිදී පහසුවෙන් ගොදුරක් බව පත්විය හැකි නිවාසයන්ට, ජලය ලබාදීම සඳහා ප්‍රමුඛත්වය දිය යුතුවේ.

√ භූමියක් තේරීමේදී ප්‍රමාණ වශයෙන් සැලකිල්ලට ගතයුතු කරුණක් වන්නේ එම ස්ථානයේ ජලය තිබේද යන උපාමානයයි. (භූමිය තේරීමේ සහ කඳවුරු නිර්මාණය කිරීම පිළිබඳ 4 වන පරිච්ජේදයේ 4.3 ජේදය බලන්න.)

√ වඩාත් සුදුසුම ජල පද්ධතියක් සැපයීමත්, එම ක්‍රමය සංස්කෘතික වශයෙන් පිළිගැනිමත් යන කරුණු සහතික කිරීම කඳවුරු පලාකයින්ගේ වගකිමයි. දිගුකාලිනව නඩත්තු කිරීම සහතික කළ හැක්කේ, දේශිය වශයෙන් අමතර කොටස් ලබාගැනිමේ පහසුව ඇතිතාක් පමණි.

√ අවතැන් වූ පුද්ගලයින් අතරින්ම තෝරාගත් කණ්ඩායමක්, සනිපාරක්ෂක කටයුතු සම්බන්ධයෙන් පුහුණු කොට සංවිතයක් පිහිටුවිම කඳවුරු පාලකයන්ගේ වගකිම විය යුතුය. එමෙන්ම මෙම අවතැන්වූ පිරිස අතරින්ම තොරාගත් කණ්ඩායමක්. නඩත්තු සහ මෙහෙයුම් කටයුතු සඳහා පුහුණු කරවීමට WATSAN ඒජන්සිය උනන්දුකරවීම කඳවුරු පාලකයින්ගේ වගකිම් වේ.

√ ජලය ලබාගැනිම සහ පරිහරණය කිරීම හා බැඳුණු ස්ත්‍රී පුරුෂ වගකිම් පිළිබඳව සහ ජලය නිකුත් කිරීමේදී ඇතිවිය හැකි ගැටලු මෙන්ම පහසුවෙන් ගොදුරක් බවට පත්විය හැකි තත්ත්වයන් වැනි මත භේදයට තුඩු දෙන කරුණු පිළිබඳ පැහැදිලි අවබෝධයක්, සනිපාරක්ෂක කටයුතුවල නිරතවන සේවක පිරිස තුළ තිබිය යුතුය (6 වන පරිච්ජේදය - සහභාගිත්වය සහ ප්‍රජා හවුල්වීම)

√ සනිපාරක්ෂක සේවකයින්ගේ අධීක්ෂණයට ලක්විය යුතු කරුණු කිහිපයකි. එනම් ප්‍රමාණවත් ජලය නොතිබෙන අවස්ථාවන්හිදී ඇතිවිය හැකි තරගකාරීතත්වය සහ පෝලිම් පිළිබඳ, එමෙන් ජල මුලාශ්‍ර කරා යොමුවිය හැකි ආකාරය පිළිබඳව නිවෙස්වලට ගොස් නිවැසියන්ට ප්‍රමාණවත් ලෙස ජලය තිබේද යන්න පිළිබඳව මෙන්ම වඩා ප්‍රමාණවත් වඩාපහසුවෙන් ගොදුරක් බවට පත්විය හැකි නිවැසියන්ට ජලය රැස්කර තබාගැනිම සඳහා විකල්ප ක්‍රම තිබේද යන්න පිළිබඳ සෘජුවම සොයා බැලිම කළ යුතුවේ.

√ තරගකාරීත්වය වැඩි අවසථාවන්හිදී, කඳවුරු පාලකයින් විසින්, පහසුවෙව් ආපදාවකට ලක්විය හැකි කොටස් වන ගර්භණී කාන්තාවන්. වයෝවෘද්ධ පුද්ගලයින්, ආබාධිත පුද්ගලයින් සහ කායික දුබලතාවයන්ගෙන් පෙලෙන අක්‍රිය පුද්ගලයන් සඳහා වෙනම පෝලිමක් සකස් කිරීම. මෙහිදී ආරක්ෂක පියවර සේ සැළකිය යුතු කරුණු නම්:

## 10:4:1 විෂවීම වැළැක්වීම

ජලය ලබාදීමෙන් අනතුරුව මුලිකත්වය දියයුතු ප්‍රධානතම කරුණ වන්නේ එම ජලය ආරක්ෂාකිරීමය. සනීපාරක්ෂක කටයුතුවලින් ජලය වෙන්කිරීම මුලික පියවරයි. මතු පිට ජලය ආරක්ෂාකිරීම, භූගත ජල මූලාශ්‍ර වන ළිං ජලය, සහ කණින ලද වලවල්වල ජලය ආරක්ෂා කිරීමට වඩා අපහසුවේ. පානිය ජලය ආරක්ෂා කිරීම වඩාත් ඵලදායි වන්නේ අවතැන්වූ පුද්ගලයන් විසින්ම, ජලය ආරක්ෂා කිරීමේ වටිනාකම තේරුම් ගත් අවස්ථාවේදිය. එබැවින් ජලය විෂවීම හෝ විෂබීජ එකතුවීම වැළැක්වීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වන අතර අනාරක්ෂිත ජලමූලාශ්‍ර භාවිතයට ගැනීම අවම කරගැනීම සඳහාද මෙය ප්‍රයෝජනවත් වේ.

√ ළිං තුළට සතුන් වැටීම වැලැක්වීම සඳහා ළිඳ වටකොට වැටවල් බැඳීමේ ආරක්ෂාව පියවර කඳවුරු පාලකයන් WATSAN ඒජන්සිය සමග ඒකාබද්ධව ඉටු කළ යුතුවේ. සතුන්ගේ ප්‍රයෝජනය සඳහා ජලය ලබා දෙන්නේ නම් ඒ සඳහා කොන්ක්‍රිට් වලින් තැනූ කෘත්‍රිම ඇළක් මාර්ගයෙන්, ආරක්ෂා සහිත දුර ප්‍රමාණයකට ජලය නිකුත් කළ යුතුවේ.

√ භාජනයක් භාවිතයෙන් ජලය ගන්නා ළිං සඳහා, ළිඳටම සවිකල භාජනයක් / බාල්දිය පමණක් භාවිතා කිරීමත්, වෙනත් භාජණයක් භාවිතා නොකිරීමටත් කඳවුරු පාලකයින් වගබලා ගත යුතුය. ජලය විෂවීම් දිගටම පැවතිම අනතුරු සහගතය. එබැවින් ජලමූලාශ්‍රවල සිට ආරක්ෂිත දුරකින් ජලය එක්රැස් කොට බෙදාහැරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කළ යුතුවේ.

√ දිය උල්පත් කොටුකර, ආවරණය කළයුතුය. එසේම ඉන් පිටවන ජලය කානු මාර්ගයෙන් ගෙනගොස් එක්රැස් කළ යුතුය. මෙම ළිං කණින ලද වළවල් සහ වෙනත් ජල මූලාශ්‍ර නිරතුරුවම අධීක්ෂණය කිරීම සඳහා මුරකාරයින්ව සේවයේ යෙදවීම කඳවුරු පාලකයින් විසින් ඉටු කළයුතුවේ.

කෙසේ වෙනත් ජලය එක්රැස් කළ අවස්ථාවේ සිට පරිභෝජනය කරන අවස්ථාව දක්වා අතරතුර කාලය තුළදී ඕනෑම අවස්ථාවකදී අපිරිසිදුවීමට හෝ විෂවීමට අවකාශ තිබේ. ආරක්ෂිත පානිය ජලය අපිරිසිදුවීමට හෝ විෂවීමට ප්‍රධානම හේතුවක් වන්නේ නිවැසියන්ගේ සෞඛ්‍ය පුරුදු ඉතා පහළ මට්ටමක තිබීමය. එබැවින් නිරන්තරයෙන්ම නිසි සෞඛ්‍ය අධ්‍යාපනයක් ලබාදීම. සහ සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ පූර්ණ විස්තරයක් 7.4.4 ඡේදයේ දැක්වේ.

ජලය ගැනීම සඳහා අනාරක්ෂිත භාජන භාවිතාය, වෙරි කදන් භාවිතය සහ බාල්දි භාවිතය. ජලය විෂවීමට ප්‍රධනම සාධකයන් වේ.

√ පිරිසිදු මෙන්ම සුදුසු ජල භාජනයන්ගේ අවශ්‍යතාවය පිළිබඳව කඳවුරු පාලකයින් තහවුරු කළයුතු වේ. භාජනයන් බෙදා හැරීම සඳහා ප්‍රමුඛත්වය දිය යුතුය. සෑම නිවාසියෙකුට ජලය ආරක්ෂිත සහිතව සහ පිරිසිදුව එකතුකර ගැනීමට ඉන්පසු එම ජලය රැස්කොට තැබීමටත් අවශ්‍ය භාජනය ප්‍රමාණවත් පරිද තිබිය යුතුය. භාජනවල වර්ගය පිළිබවද සැලකිලිමත් විය යුතුය දරුවන් ජලය රැගෙනයෑම බොහෝ පරිසර තුළ දක්නට ලැබේ. එබැවින් මෙම භාජන කාන්තාවන්ට මෙන්ම දරුවන්ට ද රැගෙන යා හැකි තත්ත්වයේ සැහැල්ලු භාජන විය යුතු අතර සෑම භාජනයකටම ආවරණයක් / මූඩියක් තිබිය යුතුය.

## 10:5 සනීපාරක්ෂාව

ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සනීපාරක්ෂාව යනුවෙන් අර්ථ දක්වන්නේ සිය සනීපාරක්ෂාව හෝ මනා සෞඛ්‍ය තත්ත්වයන් පිළිබඳ ප්‍රජාව උනන්දුකරවීම සහ අවශ්‍ය ප්‍රමාණයට වැසිකිළි පහසුකම් සැපයීම තුලින් මිනිස් අපද්‍රව්‍ය (මළපහ) එනම් මුත්‍රා සහ අසූචි ආරක්ෂා සහිතවම බැහැර කිරීම මනාලෙස

කළමනාකරණය කිරීමයි. පාරිසරික සනීපාරක්‍ෂාව යනුවෙන් දැක්වෙන්නේ පුළුල් අර්ථයකි. එනම් ගැටළු සහගත ප්‍රශ්න වන, ජලයේ තත්ත්වය ආරක්‍ෂාකිරීම, මිනිස් මළපහ බැහැර කිරීම, අපතේ යන ජලය සහ කැළි කසල ඉවත්කිරීම, කෘමීන් සහ මූෂික වර්ගයේ සතුන් පාලනය, ආහාර පරිභෝජනය පිළිබඳ පුරුදු සහ ජලය බැසයැමේ ක්‍රම ආදියයි. මේ සියලුම සේවාවන් ඒකරාශිකොට සෞඛ්‍ය ආරක්‍ෂාව සේ සැලකිල්ලට ගත යුතුය. හදිසි අවස්ථාවන් යටතේ බොහෝ විට ඇතිවන පාචනය වැනි රෝග තත්ත්වයන් අවම කර ගැනීම සඳහා පවතින සනීපාරක්ෂක වැඩසටහන් ප්‍රමාණවත් නොවේ. එබැවින් හදිසි අවස්ථාවකදී සනීපාරක්‍ෂාව යන පදය නිරන්තරවම භාවිතාවේ.

> හදිසි අවස්ථාවල සනීපාරක්‍ෂාව පිළිබඳ විකල්පයන් ඇතුළත් තාක්‍ෂණික විස්තරයක් මේ පරිච්ඡේදය අවසානයේ "මෙවලමට" ඇතුළත් කොට ඇත. (WHO TECHMICAL NOTE # 14,2005

කොළරාව, පාචනය සහ අතිසාරය වැනි විවිධාකාරවූ සෞඛ්‍ය ප්‍රශ්න වලට ප්‍රධානම හේතුවක් වන්නේ මිනිස් අපද්‍රව්‍ය මඟින් ජලය විෂවීම හෝ අපිරිසිදු වීමය එබැවින් කඳවුරක් ආරම්භ කරන මුල්ම අවධියේ සිටම මිනිස් අපද්‍රව්‍ය නිසියාකාරව අපහරණය කිරීමට වැඩපිළිවෙළක් සකස් කළ යුතුය. සාමාන්‍යයෙන් හදිසි අවස්ථාවලදී, කඳවුරුවල සහ ග්‍රාමීය ප්‍රදේශවල, මිනිස් අපද්‍රව්‍ය අපහරණය වඩා පහසුවන අතර ලාබදායී කාරයක්ද වේ ඒ සඳහා වළවල් සහිත වැසිකිළි හෝ කාණු සහිත වැසිකිළි භාවිත කෙරේ. මෙම වැසිකිළි දෙවර්ගය පිළිබඳ විස්තර පරිච්ඡේදය අවසානයේ ඇති ඇමුණුම I සහ II (MSF2003) හි දැක්වේ. නමුත් හදිසි අවස්ථාවකින් පසුව වාතාශ්‍රය සහිත වල වැසිකිළි (VIP) සෑදීම යෝග්‍ය වන අතර දුර්ගන්ධය සහ මැස්සන් අවම කර ගතහැකිවන සේ වැසිකිළිය නිර්මාණය කළ යුතුවේ. VIP හෙවත් වාතාශ්‍රය සහිත වැසිකිළි ඉතා හොඳ තත්ත්වයේ විකල්පයක් වුවද, ගොඩනැගීම සහ නඩත්තු කිරීම අපහසු කාර්යයකි. VIP වැසිකිළි පිළිබඳ විස්තරයක් ඇමුණුම් III හි සඳහන් වේ (MSF, 2003) වඩාත් සුදුසුම විකල්පය වන්නේ වතුර ගසා පිරිසිදු කෙරෙන වැසිකිළි වන අතර මෙම වැසිකිළි වල අසූචි, පිරිසිදු කිරීමට වතුර ස්වල්පයක් භාවිතා කෙරේ. වතුර ගසා පිරිසිදු කෙරෙන වැසිකිළි ශරීර කෘත්‍යයෙන් පසු වතුර පාවිච්චි කර පිරිසිදු කිරීම සඳහා යෝග්‍ය වේ. එහෙත් ජලය අඩු අවස්ථාවලදී මෙම ක්‍රමය සාර්ථක නොවන අතර. ඝන ද්‍රව්‍ය පවිත්‍රතාවය සඳහා යොදා ගැනීමේදී ඒවා රැඳීමෙන් හිරවීමක් හෝ අවහිරයක් ඇති වේ. [4]

## 10:5:1 නිර්මාණය සහ ගොඩනැගීම

**කළමනාකරණය කිරීමේ පිළිවෙත් එනම් 7:3:3 යටතේ දැක්වෙන වැසිකිළි වර්ග ප්‍රයෝගික විය යුතු අතර, සංස්කෘතීන්ට ගැළපෙන පරිදි තිබීමත් සහ අවතැන්වූ ප්‍රජාවගේ සහයෝගයෙන් දියුණු කිරීමද සිදු විය යුතුය. පහසුකම් හැකිතාක් දුරට සාම්ප්‍රදායික පුරුපුරුදුවලට සමාන වීම අවශ්‍ය වේ. එනම් මළපහ කරන ක්‍රම, ශරීරකෘත්‍යයෙන් පසු පිරිසිදු කිරීමේ පුරුදු, වාඩිවීමට කැමති ඉරියව්ව (වාඩිවීම හෝ ඇණ තබා වාඩිවීම) සත්‍රීන් සහ පුරුෂයින් වෙන්කර තැබීම, හෝ නිශ්චිත සංස්කෘතියක් හෝ ආගමික සම්මතයන්, භාවිතය සඳහා බලපෑ හැකිය.**

√ වැසිකිළි භාවිතයේදී පෞද්ගලිකත්වය සහ ආරක්‍ෂාව, විශේෂයෙන්ම රාත්‍රී කාලයේදී අවශ්‍යම කරුණකි. ස්ත්‍රීන්ට සහ පුරුෂයින්ට වෙන් වශයෙන් වැසිකිළි තැනිය යුතුවේ. කාණු සහිත වැසිකිළි තැනීමේදීත් ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන්කිරීම ඉතා වැදගත් වේ. වැසිකිළි භාවිතයේදී කාන්තාවන් සහ ගැහැනු දරුවන්ට මුහුණදීමට සිදුවිය හැකි ප්‍රබල අවදානම් තත්ත්වයන් මඟහරවාගැනීම සඳහා වැසිකිළි තැනීමට යොදා ගන්නා ස්ථානය සහ පරිසරය කාන්තාවන් කණ්ඩායමක් විසින් අනුමත කිරීම යෝග්‍යවේ. එමෙන්ම වැසිකිළි වලට යැමට ඇති මාර්ග දෙපස සහ අවට කැලෑ එළිපෙහෙළි කොට ශුද්ධ කිරීම කඳවුරු පාලකයින්ගේ වගකීම වේ. එමෙන්ම හැකි නම් මෙම මඟ දෙපසට විදුලි අලෝකය සැපයිය

**[4] See- Emergency Sanitation, by P. Harvey, S. Boghri, B. Reed, The Water Engineering & Development Centre (WEDC) P P. 69-72,2002.**

යුතුවේ. එමෙන් ආබාධිත සහ එක්තැන්වූ පුද්ගලයින්ට වැසිකිළි නිර්මාණය කිරීමේදී හා තැනීමේදී ඒවායේ දිගුකාලීන නඩත්තුව පිළිබඳවද සැලකිලිමත් විය යුතුය. එබැවින් දේශීය දැනුම උපයෝගි කර ගැනීමත්, පොදු සෞඛ්‍ය සේවා ඉංජිනේරුවන්ගේ විශේෂඥ දැනුම උපයෝගි කර ගැනීමට වඩා සුදුසුයැයි යෝජනා වී ඇත.

√ ඉසව්ව ඉතාමත්ම වැදගත්වේ. සමතල භූමිවල ඉදිකෙරෙන වැසිකිළි, වර්ෂා කලයේදී උතුරා යෑමට ඉඩ ඇත. වැසිකිළියේ ආකෘතිය තීරණයවූ පසු, කඳවුරු පාලකයින්ගේ වගකීම වන්නේ අවතැන්වූ ප්‍රජාව අතුරෙන්ම තෝරාගත් කණ්ඩායමක්, වැසිකිළි තැනීම පිළිබඳව සහ නඩත්තුව පිළිබඳව පුහුණු කිරීමය. හැකිතාත් දුරට ප්‍රජාව මෙම කටයුතු සඳහා උනන්දු කිරවීම WATSAN ඒජන්සියේ කාර්යභාරය වේ. එමෙන්ම කුසලතා සහිත සහ කුසලතා නොමැති ශ්‍රමිකයන් පිළිබඳවද සැලකිල්ලක් දැක්වීම අවශ්‍යවේ.

√ සැම විටම විශේෂ අවධානයකට ලක් කළයුතු කරුණක් වන්නේ, වැසිකිළි සහ ජල මූලාශ්‍ර අතර පිහිටි දුර ප්‍රමාණයයි. වැසිකිළි සහ ජලමූලාශ්‍ර අතර තිබිය යුතු අවම දුර ප්‍රමාණය සහ අවම ප්‍රමිතීන් පිළිබඳ විස්තරයක් 4 වන පරිච්ඡේදයේ ස්ථානය තේරීම සහ කඳවුරු නිර්මාණයට අදළව 4:5 ඡේදයන්හි ඇතුළත් වේ.

√ තනා නිම නොකර ඇති වැසිකිළි වලවල් දේශී අමුද්‍රව්‍ය යොදාගෙන කොටු කිරීම අවශ්‍ය වේ. මෙමගින් කුඩා දරුවන්ට ඇතිවය හැකි අවදනම් තත්ත්වයන් වළක්වාලිය හැක.

## 10.5.2 සේදීම සහ ස්නානය කිරීම

වැසිකිළි පහසුකම් වලට අමතර සේදීමට සහ නෑමට අවශ්‍ය පහසුකම් සැපයිය යුතුය. සේදීමේ පහසුකම් ලබාදීමේදී වඩා ඉඩ ප්‍රමාණයක් සහ පෞද්ගලිකත්වය රැගෙන පරිසරයක් අවශ්‍යවේ. විශේෂයෙන්ම කාන්තාවන් සහ ගැහැනු දරුවන්ට නෑමට, රෙදි සේදීමට, ආහාර පිසීමට ගන්නා භාජන සේදීමට සහ වේලාගැනීමට ඉඩකඩ අවශ්‍ය වේ. මේවා වඩාත් ප්‍රබලව උපයෝගි කරගන්නා පිරිස එනම් කාන්තාවගේ අදහස් සැලකිල්ලට ගනිමින් ස්ථාන නිර්මාණය කිරීම, එහි ආරක්ෂකව තත්ත්වය පහසුකම් පුද්ගලිකත්වය රැකීම, ඉඩකඩ සහ සංස්කෘතික යෝග්‍යතාව පිළිබඳ තීරණ ගැනීම අවශ්‍යවේ.

එක් වැසිකිළියක් භාවිත කරන පිරිස සහ සේදීමේ පහසුකම් පාවිච්චි කරන පිරිස කුඩා කණ්ඩායමකට සීමාවූ විටදී භාවිත වඩාත් පහසුවන අතර නඩත්තු කිරීමද පහසුවන බව පිළිගත් සිද්ධාන්තයකි. බොහෝ විට පවුලක් සඳහා වැසිකිළියක් වෙන්කිරීම පිළිබඳ කැමැත්තක් පෙන්නුම් කරන අතර මෙය සංස්කෘතික අවශ්‍යතාවයකි, නමුත් හදිසි අවස්ථාවකදී මෙම තත්ත්වයන් තාත්වික නොවේ. හදිසි අවස්ථාවකදී වඩාත් යෝග්‍ය වන්නේ කාණු සහිත වැසිකිළිය මතුපිට භූමි ප්‍රමාණය ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හිදී පොදු වාසිකිළි තැනීම සුදුසුම විකල්පය වේ.

**නිර්මාණය, ආරක්ෂාව සහ අභිමානය**

කාන්තාවන් සහ පුරුෂයින් සඳහා වැසිකිළි සහ සේදීමේ පහසුකම් සුදුසු පරිදි වෙන්කිරීමේදී, මෙම පහසුකම් වඩාත් ප්‍රබල ලෙස පාවිච්චි කරන ස්ත්‍රී සහ පුරුෂ දෙපක්ෂය අදහස් විමසීම සහ අනුමැතිය ලබා ගත යුතුවේ. මෙම ගොඩනැගිලිවල නිර්මාණයේදී සහ තැනීමේදී මෙන්ම අවට පරිසරය ආශ්‍රිතව ආරක්ෂාව මෙන්ම දිවා රාත්‍රී කාලය තුළ, කුඩා දරුවන්ට, ආබාධිත පුද්ගයින්ට, එක්තැන්වූ, පුද්ගලයින්ම, මානසිකව රෝගින්ට, කාන්තාවන්ට සහ ගැහැනු දරුවන්ට මෙම ස්ථාන කරා යෑමට ඒමට සුදුසු වතාවරණයක් තිබීම සහිතක විය යුතුය. එමෙන්ම කාන්තාවන් මාසික ඔසපස්වීමේ කාලය තුළදී, එම රෙදි පිලි සනීපාරක්ෂව සහතිව සෝදා පිරිසිදු කර ගැනීමට අවශ්‍ය ප්‍රමාණවත් ඉඩකඩ සහ පෞද්ගලිකත්වය රැකෙන පරිසරයක් අවශ්‍යවේ. එසේ නොමැතිනම් සනීපාරක්ෂක තුවා හෝ අපහරණය කළ හැකි සෞඛ්‍ය ආරක්ෂිත ද්‍රව්‍ය ලබා දිය යුතුවේ (Harvey, Baghri, Reed 2002)

## 10:5:3 නඩත්තු කිරීම

වැසිකිළි කඩාවැටීම සහ අක්‍රිය වීම, විවිධ රෝග තත්ත්වයන් ඇතිකරවීමට සහ වෛරස පැතිරීමට හේතුවන ප්‍රබල අවදානම් තත්ත්වයකි. වැසිකිළි අපිරිසිදු තත්ත්වයක පවතින විට, කැලෑ හෝ පඳුරු එම කාර්යයන් සඳහා යොදාගැනීමට මිනිසුන් පෙළඹේ. එබැවින් දිනපතාම වැසිකිළි පිරිසිදු කළ යුතු අතර, නඩත්තු කටයුතු නිරන්තරයෙන්ම සිදු කළ යුතුවේ. මෙම පහසුකම් කුඩා කණ්ඩායමක් විසින් හෝ එක් පවුලක් විසින් ප්‍රයෝජනයට ගන්නා අවස්ථාවන්දී නඩත්තු කටයුතු වඩාත් කාර්‍යක්ෂමව ඉටු කළ හැක.

| |
|---|
| ප්‍රජා අවශ්‍යතාව මත පොදු වැසිකිළි සඳහා විශේෂිත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක විය යුතුයි. |

* වැසිකිළිවල පවිත්‍රතාව, මැස්සන් වැසීම සහ දුගඳ වහනයවීම, පිළිබඳව දිනපතා සොයාබැලීම කිරීම සහ අධීක්ෂණය කිරීම් වැනි කටයුතු කඳවුරු පාලක පවිත්‍රතා කණ්ඩායම විසින් ඉටු කළ යුතුවේ. WATSAN ඒජන්සිය සමඟ තොරතුරු බෙදාගැනීම සහ කිට්ටුවෙන් වැඩ කිරීම අත්‍යාවශ්‍ය කරුණකි.

* ආරම්භයේ සිටම ප්‍රජාව, පිරිසිදුකිරීමේ සහ නඩත්තු සේවන්හි දක්වන දායකත්වය මත එම කටයුතුවල සාර්ථකත්වය රඳා පවතී. පොදු වැසිකිළි පිරිසිදු කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් කඳවුරු පාලකයින් විසින් දියත් කළ යුතු අතර එපා නඩත්තු සේවාවන් ප්‍රජාව විසින් ඉටු කිරීමේ. වගකීම සහතික කළ යුතුවේ. මේ මුරකරුවන් සඳහා වේතනයක් හෝ දීමනාවක් ලබාදිය යුතු අතර තම වැසිකළි පිරිසිදු කරන ප්‍රජාවට කිසිදු ගෙවීමක් නොකළ යුතුවේ.

**සම්බන්ධීකරණය:**

පරතරයන් පිළිබඳ ක්‍රියාකිරීමේදී WATSAN ඒජන්සිය කටයුතු සමඟ සම්බන්ධීකරණය කිරීම වැදගත් වේ. සමහර අංශවලට අදාළ භූමිකාවන් පිළිබඳ පැහැදිලි නොවන අවස්ථාවන්හිදී, ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතුවේ. ව්‍යාකූල තත්ත්වයන් සහ වැරදි වැටහීම් වලක්වාලීම සඳහා වගකීම විධිමත් කළ යුතුය. උණුසුම්කාරී වාතාවරණයක් ඇතිවීමට හේතුවුවද සමහර වගකීම් හා බැඳුණු අංශයන් පිළිබඳ අවධානය යොමු කිරීම අවශ්‍ය කරුණකි. එබැවින් කඳවුරු පාලකයින් සහ WATSAN ආයතනය අතර ඇති සම්බන්ධීකරණයන් පැහැදලිව වෙන්කර ගත යුතු අතර එහිදී පහත දැක්වෙන අංශයන් සැලකිල්ලට ගත යුතුවේ.

- **කඳවුර නිමාර්ණය කිරීම සහ WATSAN ආකෘතිය :** ජලය සහ සනීපාරක්ෂක ආකෘතින් බොහෝ විට තීරණය වන්නේ කඳවුරේ ව්‍යුහය මතය. කෙසේ වෙතත් සේවාවන් සම්බන්ධීකරණය සහ අනාගතයේ ස්ථාන පිහිටුවීම් පිළිබඳ සැලසුම්කිරීම වැනි කටයුතු පිළිබඳ වගකීම කඳවුරු පාලකයින් විසින් දරනු ලැබේ. විශේෂයෙන්ම මෙම අංශය පිළිබඳව කඳවුරු පාලනයේ WATSAN ඒජන්සියේ සම්බන්ධිතාවය පැහැදිලි සහ පිළිගත් හැකි එකක් විය යුතුවේ.
- **ප්‍රවේශය තහවුරු කිරීම සහ අවදානම් සහිත කණ්ඩායම් :** වැසිකිළි ප්‍රමාණය සහ ජලය ලබාගැනීමට ඇති ඉඩකඩ සහ ඇති සමාන අයිතිය පිළිබඳව ප්‍රමුඛත්වය දීම WATSAN ඒජන්සියේ කටයුත්තකි. අවසානයේදී, මෙම පහසුකම් සඳහා අවදානම් සහිත කණ්ඩායම් වලට ඇති යොමුව සහතික කිරීමේ වගකීම දරන්නෙ කවුරුන්ද? මානුෂික තත්ත්වය මත, අවදානමට ලක්වීම ගැන සැලකිලිමත්වීමේ වගකීම් WATSAN ඒජන්සියට තිබුනාද, හදිසි අවස්ථාවන්හිදී ප්‍රමාණය වැඩිවීම නිසා මෙය වෙන්කර දැක්වීම අපහසුවේ. එබැවින් මෙම අවදානම් සහිත කණ්ඩායම් වලට ප්‍රවේශයක් ලබාගැනීම වැඩකිරීම සඳහා භාවිතා කළ හැකි උපක්‍රම ආරම්භ කොට සම්බන්ධීකරණය කිරීමේ වැඩපිළිවෙල කඳවුරු පාලකයින් විසින් WATSAN ඒජන්සිය සමග දියත් කළ යුතුවේ.

- **පොදු පහසුකම් පිළිබඳ WATSAN ආකෘතිය :** කවුරුන් විසින් කුමක්, කුමන ස්ථානයකට ලබා දෙන්නේද? පාසැල්වල සහ ආරෝග්‍යශාලාවල අවශ්‍ය ප්‍රමාණයට වැසිකිළි තැනීමේ වගකීම දරන්නේ කුමන ඒජන්සිය විසින්ද? අමතර ජලය සපයන්නේ කුමන ඒජන්සිය විසින්ද? ඒජන්සි කිහිපයක් විසින් ජලය හා සනීපාරක්ෂාව එසේත් නැත්නම් මෙම දෙඅංශයම සපයන අවස්ථාවන්හිදී කඳවුරු පාලකයින්ගේ වගකීම විය යුත්තේ ප්‍රජා පහසුකම් වල ඇති අඩුපාඩු හඳුනාගෙන ඒ සඳහා නිසි පිළියම් යෙදීමය.

- **බාහිර සම්බන්ධතාවන් :** පවතින දේශීය ජල මූලාශ්‍ර ප්‍රයෝජනයට ගන්නා අවසථාවන්හිදී ඒවා ස්ථාපිත කිරීමට සහ නඩත්තු සේවාවන් සඳහා බාහිර සම්බන්ධිතාවය අවශ්‍යවේ මෙහිදී WATSAN ඒජන්සියට වගකීමත් තිබේ. එනමුත් කඳවුරු පාලකයින්ට අවසානයේ ඇති වගකීම නම්, කඳවුරු නියෝජිතයෙක් ලෙසත්, කඳවුරු සහ එහි ප්‍රජාව අතර සම්බන්ධීකරණය කෙරෙන මැදිහත්කරුවකු සහ පෙනිසිටින්නෙකු සේ ක්‍රියා කිරීමය. බාහිර සම්බන්දතාවන් කළමනාකරණය කිරීමේ භූමිකාවන් මනාව අවබෝධ කර ගැනීමත්, නිශ්චිත ලෙස වෙන්කර ගැනීමටත් අවශ්‍ය වේ. එමෙන්ම බාහිර සම්බන්ධතාවයන්ට, විවිධ ඒජන්සි විසින් දෙනු ලබන පණිවුඩ එකම විය යුතු අතර එය එකිනෙකාට වෙනස් පණිවුඩ නොවන බවට සහතික වීම කඳවුරු පාලකයන්ගේ වගකීමයි.

## 10:5:4 වැසිකිළි හිස්කිරීම:

දිගුකලක් භාවිත කිරීමෙන් අනතුරුව වැසිකිළි වළවල් හිස් කළ යුතුය. ද්‍රව්‍යමය සහ මෘදු අංගු/ කොටස් ඉවත් කිරීම සඳහා රික්ත බවුසර යොදාගත හැක. නමුත් සමහර අවස්ථාවලදී, මෙම ටැංකි හෝ බවුසර අවශ්‍ය පිරිදී නොතිබීම සහ වැසිකිළි ආසන්නයටම සෑමට නොහැකි වීම වැනි ප්‍රශ්න මතුවිය හැක. බොහෝ විට එවැනි පිරුණු වැසිකිළි වසා දමා අලුත් වැසිකිළි තැනීම හොඳම විකල්පය වුවද, මේ සඳහා අවශ්‍ය ඉඩ ප්‍රමාණයක් තිබීම වැදගත් වේ. වසර දෙකක් හෝ ඊට වැඩි කාලයක් මේ පිරුණු වැසිකිළි වසාදැමීමෙන්, අපද්‍රව්‍ය ඝනවී, පොහොර බවට පත්වේ. එවිට පහසුවෙන් මිනිස් ශ්‍රමය යොදා ඉවත් කළ හැක. අවතැන්වූ ප්‍රජාව තුලින්ම ලබාගන්නාවූ කම්කරුවන් යොදා විල්බැරෝ ආධාරයෙන් මෙම වියළුණු අපද්‍රව්‍ය ඉවත් කළ හැක. එමෙන්ම එම ඉවත ලන අපද්‍රව්‍ය. නවාතැන් වලට සහ වෙනත්පහසුකම් සහිත ස්ථානයන්ට ඈතින් තැන්පත් කිරීම වැදගත්වේ.

සමහර ස්ථානවල, මෙම වියැළුණු මිනිස් අපද්‍රව්‍ය පොහොර ලෙස භාවිතා කෙරේ. සියලුම වැසිකිළි හිස් කළ නොහැක. සමරහර වැසිකිළි කල්යැමේදී දිරාපත්වී කඩාවැටෙන තත්ත්වයට පත්වේ. එවැනි වැසිකිළි ස්ථිරවශයෙන්ම වසාදැමිය යුතුය.

## 10:5:5 නාගරික ප්‍රදේශ

නාගරික ප්‍රදේශවල විශාල වශයෙන් සිදුවන අපාදාතත්ත්වයන්ට සහ අවතැන්වීමේ අවසථාවන් සඳහා අනුගමනය කළ යුත්තේ වෙනත් පිළිවෙතකි. ජනාකීර්ණ නාගරික ප්‍රදේශවල, මලපහ විෂවීම නිසා ඇතිවන සෞඛ්‍යමය ප්‍රශ්න ඉතා ප්‍රබලවේ. මෙහදී පොදු සෞඛ්‍ය සේවා බලධාරීන් විශාල වගකීමකින් යුතුව කටයුතු කෙරේ. සනීපාරක්‍ෂක පද්ධතිවල විශාල වශයෙන් සිදුවිය හැකි බරපතල හානි හේතුවෙන් නාගරික ප්‍රදේශවලට සෞඛ්‍ය තර්ජනයක් ඇති විය හැක. මෙහිදී ක්‍ෂණිකව දැක්විය යුතු ප්‍රතිචාරය නම් අපද්‍රව්‍ය (මුත්‍රා මළපහ) එක් රැස් කිරීමය. මෙහිදී පොදු පහසුකම් සඳහා යොමුවීම එනම් පාසැල් සඳහා පහසුකම්

---

(5) See: Enviornmental health in emergencies and disasters: a practical guide; World Health Organizetion (WHO) Eds: B. Wisher, J. Adams, PP 128 - 130, 2002.

(6) See: 'Emergency Sanitatio', by P. Harvey, S. Baghri, B. Reed, The Water, Engineering and Development Centre (WEDC), p 64, 2002.

ලබාදීම, විශාල ප්‍රමාණයකට මෙම පහසුකම් ප්‍රමාණවත් නොවේ. මීට අමතරව පොදු වැසිකිළි එනම් රසායනික වැසිකිළි තිබේනම් පමණක් සැපයීම. එමෙන්ම වල සහිත වැසිකිළි භාවිතය, මෙහිදී මළපහ සෑදුවම කාණු පද්ධතියට එක්වේ, එය ක්‍රියාත්මක වන්නේ නම් හෝ නොවේ නම් දිනකට දෙවරක් හෝ තෙවරක් වතුර දමා පිරිසිදු කළ හැක. ස්ථිරසාර සනීපාරක්ෂක පහසුකම් සැපයීම පිළිබඳව සහ මිනිස් මළපහ ඉවත්කිරීමට වැඩපිළිවෙලක් සකස් කිරීම පිළිබඳව සෞඛ්‍ය බළධාරීන් සමඟ සම්පව කටයුතු කිරීමේ පහසුව සඳහා අසල්වැසියන් සමග සෞඛ්‍ය කමිටු සථාපිත කිරීම අවශ්‍යවේ. [5]

## 10:5:6 ප්‍රසිද්ධයේ මළපහ කිරීම

ප්‍රසිද්ධියේ මළපහකිරීම බොහෝ විට සිදුවන්නේ වැසිකිළි පහසුකම් ප්‍රමාණවත් නොවුනු අවස්ථාවලදීය. හදිසි අවස්ථාවලිදී අවශ්‍ය ප්‍රමාණවත් නොවුනු අවස්ථාවලදීය. හදිසි අවස්ථාවලදී අවශ්‍ය ප්‍රමාණයට වැසිකිළි තැනීම අතර අඩුපාඩු තිබිය හැකි බැවින් ක්ෂණිකව සිදු කළ යුත්තේ ශරීර කෘත්‍ය සඳහා පහසුකම් සලසාදීමය, මේ සඳහා නිශ්චිත ස්ථානයක් / පිටියක් හඳුන්වාදිය යුතු අතර එම භූමිය ජල පද්ධිතින්, ආහාර ගබඩා කර ඇති ස්ථාන සහ වාසය කරන නවාතැන්වලට අවම දුරකින් පිහිටා තිබිය යුතුය.

√ අවශ්‍යවූ විටදී කඳවුරු පාලකයින්, ජලය හා සනීපාරක්ෂාව සම්බන්දයෙන් ක්‍රියා කරන ප්‍රධාන ඒජන්සි සමග ඒකාබද්ධව මෙම ස්ථාන (ශරීර කෘත්‍ය) හඳුනාගත යුතුවේ. මෙම භූමිය හෝ පිටය කොටුකර පැහැදිලිවම වෙන්කළ යුතුය. ජලය රැස්වී තිබීම හෝ ජල ගැල්මකට භාජනය විය හැකි පහත් බිම් ප්‍රදේශ මේ සඳහා කිසිසේත් යෝග්‍ය නොවේ. ප්‍රජා මෙහෙයවන්නන් සහ සෞඛ්‍ය ප්‍රවර්ධකයින් විසින්, ප්‍රසිද්ධ මළපහකිරීම් පිළිබඳ දැනුවත් කිරීමේ කටයුතුවල යෙදෙමින්, මළපහ කිරීමට එම ස්ථානවලට යෑමට පෙර දැනුම ලබාදිය යුතුවේ. මේ සඳහා දරුවන්ව සහභාගි කර ගතහැකි වන්නේ දෙමාපියන්ව සක්‍රිය ලෙස සහභාගිකර ගැනීම තුලින් ශරීර කෘත්‍යය සඳහා වෙන්වුනු පලාත් සඳහාය:

- ප්‍රසිද්ධ ගොඩනැගිලි සහ මහා මාර්ගවලින් දුරස්තව පිහිටීම.
- මිනිස් පරිභෝජනය සඳහාවූ වගා බිම්වලට හෝ කුඹුරුවලට ආසන්න නොවීම
- ආහාර ගබඩාවලට සහ ආහාර නිෂ්පාදනය කෙරෙන ස්ථාන වලට දුරස්වවීම
- ජලය එක්රැස් කොට තිමෙන ස්ථාන සහ ජලය පිරිසිදු කෙරෙන ස්ථානයන්ට ආසන්න නොවීම. [6]

√ ප්‍රසිදධියේ මළපහකිරීම ස්ථානියකරණය කිරීම සහ ජලය අපවිත්‍රවීම වැළක්වීම කඳවුරු පාලකයින්ගේ කාර්යභාරය වේ. විශේෂයෙන්ම දරුවන් ඕනෑම ස්ථානයක මළපහකිරීමට පුරුදුව ඇත. සමහර අවස්ථාවන්හිදී පහසුකම් තිබියදීත් සහ ඒවා භාවිතයට ගන්නා අවස්ථාවන්හිදීත් පවා ප්‍රසිද්ධියේ මළපහ කිරීමට පුරුදුවූ පිරිසක් ද සිටිති. එබැවින් සෑම අවස්ථාවකදීම තිබෙන පහසුකම් ප්‍රයෝජනයට ගැනීමට ප්‍රජාව උනන්දුකරවීමේ සක්‍රිය සෞඛ්‍ය අධ්‍යාපනයක් සහ සනීපාරක්ෂක කටයුතු ප්‍රවර්ධනය කිරිමේ වැඩසටහන් දියත් කළ යුතුවේ. එමෙන්ම මෙම ප්‍රසිද්ධ මළපහ කරන ස්ථානවල, කාන්තාවනට සහ ගැහැනු දරුවන්ට අවශ්‍ය ආරක්ෂාව තිබිය යුතුය. මෙවැනි විවෘත ස්ථාන භාවිතයේදී විශේෂයෙන්ම කාන්තාව පහරදීම් වලට සහ අවදානමට ලක්වීමේ ප්‍රවානතාව වැඩිවේ.

**මළපහකිරීම සම්බන්ධ අභියෝග**

සාම්ප්‍රදායිකව මළපහ කිරීම සඳහා යොදාගන්නා ක්‍රමයන්ට වඩාත් සම්පවු සනීපාරක්‍ෂක සේවාවන් අනුගමනය වැදගත් වේ. කෙසේ වෙතත් මහා පරිමාණයෙන් සිදුවන අවතැන් වීමේ අවස්ථාවන්හිදී, ඊට අනුකූලවන පිරිදි පරාම්පාරික ක්‍රම භාවිතය වෙනස් කිරීම තුලින් විශාල වශයෙන් සෞඛ්‍ය ගැටළු වලට මුහුණදීමට සිදුවන අවදානම අවමකරගත හැකි. එළිමහන් ස්ථානවල, ඇළ, දොලවල් වල සහ කැලෑ ආශ්‍රිතව මළපහකිරීමේ ප්‍රාථමික පුරුදුවලට ඇබ්බැහි වී සිටන ප්‍රජාවට සනීපාරක්‍ෂක සේවාවන් සැපයීම අභියෝගයකි. හුරුපුරුදු වලට යොමුකර වීම සහ වැසිකිලි භාවිතයට ප්‍රජාව උනන්දු කරවීම සඳහා ඉතා ප්‍රබල සනීපාරක්‍ෂාක ප්‍රවර්ධන ක්‍රියාවලියක් අවශ්‍යවේ. මළපහ කිරීම සඳහා අමතර භූමියක් සමහර අවස්ථාවන්හිදී අවශ්‍ය වේ.

## 10:5:7. අවදානම් සහිත කණ්ඩායම්

අපිරිසිදු හෝ විෂබීජ සහිත ජලය නිසා ඇතිවන රෝග තත්ත්වයන්ට ගොදුරුවීමේ වැඩි අවදානමක් ඇත්තේ. වයස අවුරුදු පහට අඩු දරුවන්ය. අවුරුදු පහට අඩු වයසැති දරුවන්ට ඇතිවන මන්දපෝෂණ තත්ත්වය, දරුවාට සංක්‍රමණික (බෝවන) රෝග වැළඳීමේ අවදානමක් ඇති කරවයි. විශේෂයෙන්ම පාචන තත්ත්වයන්ට ගොදුරුවන මන්දපෝෂිත දරුවන්ට සහ අවදානම් සහිත වැඩිහිටියන්ට අවසාන කාලයේදී එනම් ඉතා දුර්වල මහළු වියක් අත්වේ. පාචනයට ප්‍රධානතම හේතුව වන්නේ අපිරිසිදු ජලය සහ සනීපාරක්‍ෂක තත්ත්යන් ඉතා පහල මට්ටමක තිබීමත්ය. සෑම වසරකම පාචනය හේතුවෙන් දරුවන් මිලයන 1,6 ක් මියයන බවට ඇස්තමේන්තු කොට තිබේ. [7] මිනිස් අපද්‍රව්‍ය ස්පශවීම නිසා ඇතිවන භයානක සෞඛ්‍ය අවදානම පිළිබඳ දරුවන් තුළ නිසි අවබෝධයක් නොමැත.

√ සෞඛ්‍ය අධ්‍යාපනය සහ සනීපාරක්‍ෂක ප්‍රවර්ධන වැඩසටහන් සඳහා නිරන්තරයෙන්ම දරුවන් සහභාගී කරගත යුතුවේ. දරුවන්ට සමීප දෙමාපියන්, ගුරුවරුන්, රැකවරණ සපයන්නන් සහ අනිකුත් පුද්ගලයින් ලවා දරුවන්ට සෞඛ්‍ය පිළිබඳව දැනුම ලබාදීමට උනන්දු කළ යුතුයි.

√ සනීපාරක්‍ෂක වැඩසටහන් ආරම්භ වු තැන් සිටම, කාන්තා කණ්ඩයාම් තරුණ කණ්ඩායම් සහ අනිවාර්යනේම ප්‍රජානායකයින්, සෞඛ්‍ය අධ්‍යාපනික වල කටයුතු නිරත විය යුතුය.

බොහෝ සමාජයන් තුල ඉතා විශාල වශයෙන් පිළිගෙන තිබෙන කරුණක් නම් ජලය ගෙනඒම කාන්තාවගේ කායභාරය බවය, සමහර අවස්ථාවලදී එය දරුවන්ටත් පැවරේ. එබැවින් ප්‍රමාණවත් ලෙස ජලය නොතිබීම කාන්තාවන්ට සහ දැරුවන්ට මහත් කරදරයකි, එමෙන්ම මෙම හේතුව නිසා ඔවුන්ට නිවසේ වෙනත් කටයුතු සඳහා මිඩංගු කිරීමට තරම් ප්‍රමාණවත් කාලයක්ද ඉතුරු නොවේ. ජලය ලබා ගැනිම සඳහා බොහෝ වේලාවක් රැඳිසිටීමට සිදුවීම හේතුවෙන් තරඟකාරීත්වය සහ සිත් තුල ආතතියද ඇතිවීමට බලපාන අතර, වෙනත් ජල මුලාශ වලින් බොහෝ විට අපිරිසිදු වූ ජලය ලබා ගැනිමට යොමුවේ. එමෙන්ම පාසැල් වලට ප්‍රමාණවත් ලෙස ජල, සැපයුම නොලැබෙන අවස්ථාවන්හිදී, එහි ප්‍රතිඵලයක් වශයෙන් දරුවන්ගේ පැමිණීම අඩු විය හැක. මෙය ගැහැනු දරුවන්ට විශේෂයෙන් ලබාන කරුණකි. [8]

## 10.6 ඝන අපද්‍රව්‍ය

ඝන අපද්‍රව්‍ය ලෙස හැඳින්වෙන්නේ දියර නොවන අපද්‍රව්‍යන්ය. එනම් නිවෙස්වලින්, සෞඛ්‍ය සේවාස්ථාන වලින්, වෙළඳ සැල් වලින්, ආහාර බෙද හැරීමේ මධ්‍යස්ථානය සහ වෙනත් ස්ථානවලින් මුදා හරින ඝන

---

[7] **World Health Organizetion (WHO), 2004**

[8] **See: The Gender and Water Development Report 2003; Gender Perspectives on policies in the water section; Gender and water allience (GWA), 2003.**

අපද්‍රව්‍යය. මළපහ සහ අපද්‍රව්‍ය ලෙස හැඳින්නොවේ. මෙම අපද්‍රව්‍යය නිසිලෙස කළමනාකණය කිරීම තුලින්. ජල මූලාශ්‍ර සහ ආහාර විෂවීම මෙන්ම මූෂික වර්ගයට අයත් සතුන් සහා සෘෂුද්‍ර ජීවන් බෝවීම පාලනය කළ හැක. මෙම අපද්‍රව්‍ය, මියන්ව ආකර්ෂණය, කරන අතර මියන් නිසා මිනිසුන්ට හානිකරවූ නයි වැනි උරගයින් බෝවීමද සිදුවේ.

**අධෛර්‍යමත් කිරීම**

මිනිසුන්ගේ මානසික ශක්තිය හා ධෛර්‍යය කෙරෙහි මෙම අපද්‍රව්‍ය කිසියම් බලපෑමක් ඇති කරයි. විවිධාකාර දෛනික අභියෝගයන්ට මුහුණදෙන අවතැන්වූ පුද්ගලයන්ට ඔවුන් ජීවත්වන කඳවුරු පරිසරය අපිරිසිදු, දුර්ගන්ධයක් වහනය වන, සහ සනීපාරක්‍ෂාව නොමැතිව අහිතකර ස්ථානයක් නම් ඔවුන් තුල මානසික වැටීමක් සහ අධෛර්‍යමත් වීමක් ඇතිවේ.

අප ද්‍රව්‍ය එක්රැස්කිරීමේ ක්‍රියාවලිය මනාව සංවිධානය විය යුත්තකි. අපද්‍රව්‍ය නිසි පරිදි එකතු කර විනාශ කිරීමේ වගකීම පැවරෙන්නේ කඳවුරු පාලනයටය. අප ද්‍රව්‍ය තාවකාලික ක්‍රම භාවිතයෙන් කඳවුරෙන් ඉවත් කළ යුතු අතර කඳවුරෙන් පිටතදී ස්ථිර ක්‍රමයක් අනුගමන කළ යුතුවේ.

හදිසි අවසථාවන් යටතේ ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳ තාක්‍ෂණික සටහනක් මෙම පරිච්ඡේදයේ අවසානයේ ඇති මෙවලම් කට්ටලයට අමුණා ඇත (WHO, technical note # 7, 2005)

√ ඉවතලන අපද්‍රව්‍ය රැස්කිරීම සඳහා භාජන හෝ පෙට්ටි ප්‍රමාණවත් ලෙස සැපයීම පිළිබඳ කඳවුරු පාලකයන් සොයා බැලිය යුතුය එමෙන්ම ජන සමූහයකට (80 දෙනෙකුට) එක භාජනය බැගින් හෝ ප්‍රමාණවත් ලෙස තිබෙන අවස්ථාවලදී පවුලකට එක බැගින් හෝ සැපයිය යුතුවේ. තමන්ගේ පවුලට ලැබී ඇති භාජනය පිරිසිදුවට තබා ගැනීම පවුල විසින් කළ යුතු අතර මෙමගින් පවුලේ සහ ගේදොර සනීපාරක්‍ෂාව නිසිලෙස පවත්වාගෙන යෑම සඳහා ඔවුන්ව උනන්දු කිරීමක්ද වේ. එමෙන්ම අපද්‍රව්‍ය එක්රැස් කොට ගෙනයෑම සඳහා විල්බැරෝ භාවිතා කළ යුතුවේ. මෙය අත්‍යාවශ්‍යම කරුණකි. අපද්‍රව්‍ය අපහරණය සඳහා ඇති අවම ප්‍රමිතීන් පිළිබඳ විස්තරයක් 4 වන පර්විච්ඡේදයේ 4.5 ඡේදයේ ඇතුලත් වේ සනීපාරක්‍ෂාව ප්‍රවර්ධනය කිරීමට මැදිහත් වීමේදී, සුදුසු කුණු භාජන සහ පෙට්ටි භාවිතය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරවීම වැදගත්වේ.

√ අපද්‍රව්‍ය නිසි පරිදි එක්රැස් කිරීම සඳහා කුණු බාල්දි, කන්ටේනර්, කුණු වලවල්, තෙල් බැරල් සහ පොදු වලවල් භාවිතා කළ හැකි අතර මෙම වලවල් ආරක්‍ෂිත වැටකින් වටකළ යුතුවේ. දුගඳ හැමීම, මැස්සන් බෝවීම සහ වෙන සතුන් බෝවීම වැළැක්වීම සඳහා මෙම කුණු භාජන සහ වලවල් නිසිලෙස ආවරණය කළ යුතුවේ [9]

√ අපද්‍රව්‍ය එකතු කිරීම සංවිධානය කළ යුතුවේ මේ සඳහා කඳවුරු පාලකයින්, එනම් අපද්‍රව්‍ය එකතු කිරීම සහ අපහරණය කිරීම සඳහා WATSAN ඒජන්සිය සමඟ සම්පව කටයුතු කළ යුතුවේ. එක ගොඩනැගිලි පද්ධතියකට හෝ එක් කොටසකට පවිත්‍රතා කණ්ඩායම් අනුයුක්ත කොට (1,250 හෝ 5,000 පුද්ගලයින්) [10] ඔවුන් විසින් සනිපතා අපද්‍රව්‍ය එක් රැස්කොට එම භූමියෙන් පිටතට ඉවත් කිරීම කළ යුතු අතර කුණු බක්කි හෝ භාජන නිසිපරිදි ප්‍රයෝජණයට ගන්නාවාද යන්න පිළිබඳවද අධීක්‍ෂණය කළයුතුවේ.

---

[9] See: 'Emergency Sanitation', by P.Harvey, S. Baghri, B. Reed, The Water, Engineering and Development Centre (WEDC), p. 110, 2002.

[10] See: chapter 4 on site selection and camp design.

√ ආරෝග්‍යශලාවලින් ඉවත දමන අපද්‍රව්‍ය සඳහා මනාව ආවරණයවූ විශේෂිත කුණු භාජන හෝ බාල්දි පාවිච්චි කළයුතුවේ.

## 10:6:1 කඳවුරු පරිසරයෙන් පරිබාහිරව අපද්‍රව්‍ය ඉවත දැමීම

ඝන අපද්‍රව්‍ය අපහරණය සඳහා ප්‍රධාන ක්‍රමවේදයන් 03 ක් අනුගමනය කෙරේ. එනම් වල දැමීම, ගිනි තැබීම සහ පොහොර නිෂ්පාදනය. විශාල වලවල් වල සහ කපන ලද කානුවල වල දැමීම පහසුවුවද මෙහිදී සුදුසු ආරක්ෂාව පියවරයන් අනුගමනය කළ යුතුවේ. ජල මූලාශ්‍රයන් අපිරිසිදු හෝ විෂවීමට වැළැක්වීම සඳහා නිසි කාණු පද්ධතියක් අවශ්‍ය වේ. මෙම කාණු පද්ධතින් ප්‍රමාණවත් නොවූ අවස්ථාවන්හිදී අපද්‍රව්‍ය රැස්වන වලවල් සහ කාණු, ඉක්මනින්ම හෝ කල්ගතවී හෝ ඉතා අප්‍රසන්න රෝගකාරක වගුරු බවට පත්වේ.

පිළිස්සීම කළ යුත්තේ පිහිටි ස්ථානයෙන් දුරස්ථවය. නැතහොත් ගින්දර සහ දුම නොයෙකුත් භයානක තත්ත්වයට හේතුවේ. වලදැමීම සඳහා ප්‍රමාණවත් භූමියක් නොතිබෙන අවස්ථාවලදී එකම විසඳුම වන්නේ ගිනි තැබීමය. ආරෝග්‍ය ශාලාවලින් ඉවත් කෙරෙන අපද්‍රව්‍ය අනිවාර්යයෙන්ම ගිනිතැබිය යුතුය. එසේ නොවුවහොත් විෂවීමට ඉඩ කඩ ඇත. [11] හදිසි අවස්ථා යටතේ පොහොර බවට පත්වීම හිරු රශ්මිය මත තීරණය වන්නකි. එබැවින් නිසි කළමනාකරන්ණයක් සිදු නොවුවහොත්, විශාල සෞඛ්‍ය තර්ජනයක් විය හැක. නමුත් හියුමස් පොහොර සඳහා කාබණික අපද්‍රව්‍ය, ගෙවත්තේදීම පොහොර බවට පත්කර ගැනීම සාපේක්ෂකව හානි රහිතවේ.

## 10:7 ජලය බැස යෑමේ පද්ධතින්

ජලය අපවිත්‍රජලය නිෂ්පාදනය කරයි. නිවැසියන් විසින් කෑම පිසිමේදී සහ පිඟන් කෝප්ප සේදීමේ ඉවත් කරන ජලය, එසේත් නැත්නම් රෙදි සේදීමට ගන්නා ජලය සහ වෙනත් සනීපාරක්‍ෂක කටයුතු සඳහා පාවිච්චි කරන ජලය අනතුරුව අපවිත්‍ර ජලය ලෙස හැඳින්විය හැක. මෙම අපිරිසිදුවූ ජලය ශුද්‍ර ජීවීන් විශාල වශයෙන් ඇතිවේ. බොහෝවිට මිනිස් මලපහ මඟින් මෙම තත්ත්වය ඇතිවිය හැක. [12] එමෙන්ම ජලය එකතැන තිබීම මදුරුවන්ගේ බෝවීමට හොඳ පරිසරයක් ගොඩනැගේ. එබැවින් කඳවුරු පාලකයින්, WATSAN ඒජන්සිය සහ අනෙකුත් සෞඛ්‍ය ඒජන්සි සමග එක්වී අපවිත්‍ර ජලය සහ එකතැන රඳා තිබෙන ජලය අවම කර ගැනීමට අවශ්‍ය සරල උපක්‍රම සොයාගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ.

නිවෙස්වෙලින් නිකුත් කෙරෙන අපිරිසිදු ජලය ප්‍රමාණාත්මකව සුළු බැවින් ඇතිවිය හැකි, සෞඛ්‍ය තර්ජනයන් ද අවම වේ. මේ තත්ත්වය පවතිනනේ නිවෙස්වලින් පිටකරන අපිරිසිදු ජලය නිසි ලෙස ගලායෑමට සැලසුම් කරන තාක් කල් පමණි. ජලය එක්රැස් කෙරෙන ස්ථානවලින්, අපිරිසිදු ජලය බවට පත්වන ප්‍රමාණය ඉතා සීමිතය. ලෝන්ඩ්‍රි අවට ස්ථානවලින් විශාල වශයෙන් අපිරිසිදු ජලය නිකුත්වෙන අතර මෙම ජලය සමග මලපහ මිශ්‍රවීමට ඉඩකඩ තිබේ. කඳවුරුවල යොදගෙන ඇති ඉතා සරල තාක්‍ෂනික ක්‍රමයන් නම් ජලය උරාගැනීමට සැලැස්වීම, මිනිසුන් විසින් කපන ලද ජලය බැසයන කාණු පද්ධති, හෝ ජලය කාන්දුවීමේ කාණු සහ වලවල් ආදියයි. වඩාත් සුදුසුම ක්‍රමය අනුගමනය කිරීම සඳහා කඳවුරු පාලකයින්, ප්‍රජාව සහ WATSAN ඒජන්සිය සම සම්බන්ධව ක්‍රියාකළ යුතුය. වැසිකිළි වල හා සම්බන්ධ අවම ප්‍රමිතින් පිළිබඳ විස්තරය 4 වන පරිච්ඡේදයේ ජේද 4.5 ඉසව් තෝරාගැනීම සහ කඳවුරු නිර්මාණය කිරීම යටතේ දැක්වේ.

√ ජලය බැසයෑම සඳහා වඩාත් යෝග්‍ය වූ ඉසව්වක් සොයගැනීමත් ඊට අනුකූලවන පරිදි භූමියේ සැලැස්ම සකස් කිරීමත් ආදිය ඉතා සියුම් තත්ත්වයන් වේ. භූමියේ පිහිටීම සහ පසේ තත්ත්වයන්

---

[11] Sce: MSF - USA Refugee Camp Project

[12] See: MSF - USA Refugee Camp Project

මත ජලය කාන්දුවීමේ ක්‍රියාවලිය වෙනස්විය හැකි. වතුර කන්දුවීමට සැලැස්වීම නිතර සිදුවුවද, එය සුදුසුම ක්‍රමය නොවේ. සමහර පරිසරයන් වල, පසට කාන්දුවීම ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී වලවල් වලට කාන්දුවීමට සැලැස්වීම අහිතකර ප්‍රතිඵල දෙන්නකි. [13] සමතල භූමිවල ජලය බැස යැමට සැලැස්වීම අපහළුවේ. මේ කාර්‍යය WATSAN ඒජන්සියේ කටයුත්තක් ලෙස පිළිගත්ත ද, එහි වගකීම අනිවාර්යයෙන්ම කඳවුරු පාලකයින් සතුවේ. මෙහිදී දේශිය දැනුම උපයෝගි කර ගැනීම වැදගත් වේ.

√ ජලය බැසයන ඇලමාර්ග හෑරීමේ දී හෝ යන්ත්‍ර සූත්‍ර භාවිතා නොකර අතින් කැපීමේ දී ප්‍රජාවගේ සහයෝගය ලබාගැනීම සැමවිටම කළ යුතුවේ. කාණු සහ ඇලමාර්ග සඳහා සුදුසුම ස්ථානය සහ කැපිය යුතු ආකාරය පිළිබඳ ඉතා හොඳ ප්‍රායෝගික දැනුමක් සහ අවබෝධයක් අවතැන්වූ පුද්ගලයින් සතුවේ. මේ සඳහා අවශ්‍ය උපකරණ එනම් පස් කැපීමට, අවශ්‍ය උදළු ආදිය ලබාදීම කඳවුරු පාලකයින්ගේ වගකීමකි.

**සරල ශිල්පියක්‍රම භාවිතය**

ඉස්සව්වෙන් හෝ භූමියෙන් පිටතට අපවිත්‍ර ජලය ගෙනයැම සඳහා කුඩා ඇලමාර්ග තැනීම. මෙහිදී ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් විය යුතුය. කඳවුරුවල පිහිටා ඇති නිවෙස් අතරින් මෙම විවෘත ඇල මාර්ගයන් වැටී තිබීම, කුඩා දරුවන් එම අපිරිසිදු ජලයේ සෙල්ලම් කිරීමට පෙළඹවීමක් ඇති කරවයි. එමෙන් ජලය හිඟ කාල වලදී සමහර නිවැසියන් මෙම අපිරිසිදු ජලය ගෙදරදෙර කටයුතු සඳහා පාවිච්චිකිරීමට උත්සාහයක් දැරීමද සිදුවිය හැක. (MSF - USA)

## 10:8 සනීපාරක්ෂව ප්‍රවර්ධනය කිරීම

ඉතා අත්‍යාවශ්‍ය කරුණකි. එනම් ප්‍රවර්ධනය මෙන් සනීපාරක්ෂක හුරුපුරුදු ඇතිකරවීම තුලින් පාචනය වැනි ලෙඩ රෝග වැළැක්විය හැකිය. සනීපාරක්‍ෂ ප්‍රවර්ධන කටයුතු වලට ඇතුලත් විය යුතු තවත් අංගයක් නම් වැසිකිළි පහසුකම් නිසි ලෙස භාවිතා කිරීම සහ ඒවා නඩත්තු කිරීම පිළිබඳ උනන්දුව ඇතිකිරීම. වැසිකිළි භාවිතය සහ සනීපාරක්‍ෂක වැඩසටහන්වල සාර්ථකත්වය පවතින්නේ ප්‍රජා සහභාගිත්ත්වය මතය. මෙහිදී කාන්තාවන් සහ දරුවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

සනීපාරක්‍ෂක ප්‍රවර්ධනය පිළිබඳ බොහෝ විට ක්‍රියා කරන්නේ ජලය සහ වැසිකිළි පහසුකම් සපයන ඒජන්සිය විසින්ය. කඳවුරු පාලකයින්ගේ වගකීම වන්නේ මෙහි නිසි අධීක්‍ෂණය කිරීම සහ විවිධ ආයතනයන් මේ හා සමානම පණිවුඩ ප්‍රචාරය කරනවාද, යන්න පිළිබඳ සොයා බැලීමත්ය. මෙහිදී වඩාත් සැළකිල්ලට ගතයුතු කරුණු වන්නේ, මලමුත්‍රා නිසිලෙස ඉවත් කිරීම සහ පහසුකම් භාවිතය පිළිබඳව මෙන්ම එළමහනේ මලපහ කිරීම වැනි විකල්පයන් පිළිබඳවය. හදිසි අවස්ථා තත්වයන්හිදී විශේෂයෙන් සැළකිල්ලට ගතයුතු කරුණු නම් මලපහ කිරීමේන් පසු අත් සෝදා පිරිසිදු කරගැනීම සහ ආහාර පිසීමට පෙර මනාව අත් පිරිසිදු කරගැනීම, පිරිසිදු ජලය රැස්කිරීම සහ භාවිතය සහ පරපෝෂිතයන් ඇතිවීම වැළැක්වීම ආදියයි. කඳවුරු තුල සතුන් මෙන්ම ගොවිපළවල යොදාගන්නා සත්තු ජිවත් වේ නම්, ඔවුන්ගේ අපද්‍රව්‍ය නිසිලෙස මුදාහැරීම, මිනිස් අපද්‍රව්‍ය මුදාහැරීම තරම්ම වැදගත් සේ සැලකිය යුතුවේ. මේ සම්බන්ධව ක්‍රමවේදයන් සකස්කිරීමෙ දී දේශිය හෝ ප්‍රාදේශිය මට්ටමෙන් බලධාරීන් සම්බන්ධ විය යුතුය. දේශිය දැනුම, විශේෂයෙන්ම, ජාත්‍යන්තර සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉතා ප්‍රයෝජනවත් වේ.

√ ප්‍රජාවට මනා සනීපාරක්ෂක තත්ත්වයන් පවත්වාගෙන යැමට අවශ්‍ය වන මූලික සනීපාරක්ෂක

---

[13] **See: Emergency Sanitation; by P Harvey, S. Bhagri, R. Reed. The Water, Engineering and Development Centere (WEDC) P, 144, 2002.**

පහසුකම් වන නෑමට සහ රෙදි සේදීමට අවශ්‍ය සබන් වර්ග, මාසික ඔසප්වීම් සඳහා භාවිතා කෙරෙන සනීපාරක්ෂ තුවා සහ සෝදාගත හැකි නැප්කින් (සාම්ප්‍රදායිකව භාවිතා වේ නම්) [14] පිළිබඳව මුලින් හඳුනාගත යුතුවේ. අත්සේදීම සඳහා අවශ්‍ය ජලය සහ සබන් වැසිකිළි අසලම තිබිම යුතුය. මෙම අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණවත්ව නොතිබෙන අවස්ථාවලදී කඳවුරු පාලකයින් වහා යුහුසුළුව එම අවශ්‍ය ද්‍රව්‍ය බෙදාහැරීම උනන්දු කරවීම ඒවා බෙදා හැරීම හෝ සනීපාරක්‍ෂක කට්ටල බෙදාහැරීම හෝ කළ යුතුයවේ.

| |
|---|
| පවුල් සනීපාරක්‍ෂක කට්ටලයක් සහ ඊට අඩංගු ද්‍රව්‍ය පිළිබඳ නිදර්ශනයක් මේ පරිච්ඡේදය අවසානයේ ඇති මෙවලමට ඇතුලත් වේ. (oxfam 2003) |

√ WATSAN ඒජන්සිය මගින් කෙරෙන සනීපාරක්‍ෂක ප්‍රවර්ධන කටයුතුවලට HIV / AIDS පිළිබඳව ඇති වැරදි මතිමාතාන්තර වලට විරුද්ධ අදහස් ද ඇතුලත් විය යුතුය. සාමාන්‍යයෙන් පවතින වැරදි මතිමතාන්තර නම්:

- එකම ජල මුලාශ්‍ර බෙදාගැනීමේ දී විෂ පැතිරීම.
- මිනී පිට්ටනි අසල පිහිටි භූගත ජලය විෂබීජ සහිත බව [15]

## 10:8:1 ප්‍රජ සහභාගීත්වය සහ සනීපාරක්‍ෂාව ප්‍රවර්ධනය කිරීම

ක්‍රියාශීලි ප්‍රජා සහභගිත්වයක් නොමැතිවූ විට සනීපාරක්‍ෂක ප්‍රවර්ධන කටයුතු අසාර්ථක වේ. කෙසේ වෙතත් සියලුම දෙනා වෙත සම්පවීම ඉටුකළ නොහැකි අභියෝගයකි. නිශ්චිත කණ්ඩායම් එල්ලකරගනිමින් අනිකුත් පිරිසට ලඟා විය යුතුවේ.

√ අවතැන් ප්‍රජාව තුළින් තෝරාගත් කණ්ඩායම් ප්‍රජා සේවාවන් සඳහා පුහුණු කර, ප්‍රජා සේවා ක්‍රියාකරවන්නන්සේ යෙදවීම පිණිස WATSAN ඒජන්සි උනන්දු කරවීම කඳවුරු පාලකයින්ගේ වගකීම වේ. සනීපාරක්‍ෂක ප්‍රවර්ධන කටයුතු සිදුවිය යුත්තේ සමාජ සුභසාධන ව්‍යපෘති ලෙසය.

√ කාන්තාවන් සහ දරුවන් නිශ්චිතව ඉලක්ක කරගැනීම වඩාත් කාර්‍යක්‍ෂම වේ. දරුවන්ට ලඟාවීම. අත්‍යාවශ්‍ය වේ. මලපහවල ඇති භයානක තත්ත්වයන් පිළිබඳ දරුවන්ට නිසි අවබෝධයක් නොමැති නිසා ඕනෑම තැනක මලපහකිරීමට දරුවන් පෙළඹේ. දරුවන්ට ආමන්ත්‍රණය කිරීමේදී පාසැල, ක්‍රීඩා පිටිය, ගුරුවරු, දෙමාපියන්ගේ සංගම්, ළමා සුබසාධක සංගම් හා කාන්තා කමිටු සතු ප්‍රධාන භූමිකාවක් හා වගකීමක් තිබේ. දරුවව්ව සජීවිකරණ ශිල්පීන් ලෙස යොදගැනීම, අනිකුත් දරුවන්ට ලඟාවිය හැකි ප්‍රතිඵලදයි ක්‍රමයක් බැවින් WATSAN ආයතනය ඒ සඳහා පෙළඹවීම අවශ්‍යවේ.

√ ආබාධිත පුද්ගලයින්ට, ආසාධ්‍ය ලෙඩුන්ට සහ HIV / AIDS ආසාධිතයින්ට විශේෂ අවශ්‍යතා තිබේ. මෙම කණ්ඩාය මේ සහ ඔවුනට ඇප උපස්ථානය කරන පිරිසගේ සෞඛ්‍ය හුරුපුරුදු තක්සේරුවට ඇතුලත් කිරීම පිළිබඳ සහතිකය කඳවුරු පාලකයින් දිය යුතුය. ඔවුනගේ තත්ත්වය, පහසුකම් පාවිච්චි කිරීම සඳහා ඇති හැකියාව සහ පෞද්ගලික සනීපාරක්‍ෂක හුරුපුරුදු වැඩිදියුණු කර ගැනීම ආදි තත්ත්වයන් පිළිබඳව වෙනම මැදිහත්වීම අවශ්‍ය වේ.

---

**[14] See: Sphere Hand Book ; 2004**

**[15] See : Guide lines foe VIV/AIDS intervention in emergency settings; Inter Agency standing commited (IASC), P, 42, 2004'**

## 10:9 රෝගකාරක පරපෝෂිතයින් මර්ධනය කිරීම

පර්පෝෂිතයින් රෝග වාහක ජිවින්ය. මෙ ජිවින් විවිධාකාර වේ. කෘමින් වැනි මදුරුවන්, මැස්සන්, මැක්කන් සහ ඇඳ මකුනන් සිට මූෂික වර්ගයේ සතුන් වන මියන් දක්වා අයත්වේ. මෙම රෝග කාරක පර්පෝෂිතයින් විවිධාකර ලෙස රෝග පතුරුවයි. එනම් මැලේරියාව, නැවත නැවත උණ ඇතිවීම, ටයිෆස් නම්වූ බෝවන උණ සහ පාචනය සම්බන්ධ රෝග තත්ත්වයන්ය. සුදුසු ජල සහ සනීපාරක්‍ෂක වැඩසටහන් සමග මෙම පර්පෝෂිතයිනගෙන් මුල් වූ රෝග තත්ත්වයන් මර්ධනය කිරීම සම්බන්ධ කළ යුතුය. එමෙන්ම ඝන අපද්‍රව්‍ය සහ මිනිස් අපද්‍රව්‍ය සහ මිනිස් අපද්‍රව්‍ය ඉවත් කිරිමේ වැඩසටහන්ද මෙයට ඒකාබද්ධ කළ යුතුවේ. මෙම මර්ධනය කිරිමේ කටයුතු සමඟ ක්‍රියා කිරීමට විශේෂඥ දැනුම සහිත පොදු සෞඛ්‍ය සේවාකයන් අවශ්‍යවේ. එමෙන්ම ඔවුන්ගේ සහයෝගය ලබා ගත යුතු අතර රසායනික ද්‍රව්‍ය භාවිතයද කළ යුතුය. මිට අමතරව ඉතා සරු නමුත් ප්‍රබල බලපෑමක් කළ හැකි ක්‍රමවේදයන් ක්‍ෂණිකවම අනුගමනය කළ හැක.

√ වැසිකිළි අනිසිලෙස භාවිතා කිරීම සහ එළිමහනේ මලපහ කිරීම් වැනි තත්ත්වයන් හඳුනාගැනීම සනීපාරක්‍ෂක අධීක්‍ෂණ කණ්ඩායම කළයුතුවේ. කාර්‍යක්‍ෂමව දියත් කෙරෙන සනීපාරක්‍ෂක ප්‍රවර්ධන කටයුතු මඟින් රෝගකාරක පරපෝෂිතයින් වන මැස්සන් බෝවීම සහ වැළැක්වීම කළ හැක.

√ පරිසරය පිළිබඳව කටයුතු කිරීමේදී අවධානය යොමුවිය යුතු අංශයන් වන්නේ, භූමිය සමතලා කිරීම, රැඳී තිබෙන ජලය බැසයෑමට සැලැස්වීමට සහ සුන්බුන් ඉවත් කිරීම, මෙන්ම පොකුණු හා කලපු ආශ්‍රිතව වැඩෙන ජලජ පැලෑටි ඉවත් කිරීම ආදියයි. [16] රෝගකාරක පරපෝෂිතයන්ගෙන් පැතිරෙන්නාවූ රෝගීතත්ත්වයන් නිසා ඇතිවන තර්ජන අවම කර ගත හැකි පරිසරයක් තෝරාගැනීම අපහසු කාර්‍යයකි. මැලේරියා මදුරුවන් බෝවන ස්ථානයන් වන වගුරු බිම් සහ වැව් ආශ්‍රිත පෙදෙස් යොදගැනීමෙන් වැළකියයුතුවේ. වඩා පහසුවෙන් ජලය එක් රැස්වෙන තැනිතලා භූමි ද සුදුසු නොවේ. [17] මලපහ සඳහා වූ භූමි ප්‍රදේශ, ආහාර හෝ ආහාර ගබඩා කෙරෙන ස්ථාන සහ ජලය ලබාගන්නා ස්ථාන වලින් ඈත්ව පිහිටීම අවශ්‍යවේ.

√ මැලෙරියා තර්ජන ඇති ප්‍රදේශවලට, නිසි කාලය තුලදී කෘමිනාශකයන් වන මදුරුදැල්, බලැන්කට්, ඇඳරෙදි සහ කුඩාරම් ලබාදීම කඳවුරුවල එම කුඩාරම්වලට කෘමිනාශක බෙහෙත් විදීම සෞඛ්‍ය සේවාකයින් විසින් සිදු කිරීම තවත් ක්‍රමයකි. කඳවුරු ආවරණය කිරීම සඳහා කැන්වස් රෙදි භාවිතා කෙරේ. එම කැන්වස් රෙදිවලටද කෘමිනාශක වර්ග ඉසිය හැකි. කෘමිනාශක බෙහෙත් වර්ග සහිත පදම් කළ රබර් ෂීට් (ITPS) භාවිතය පිළිබඳ තවමත් පර්යේෂණ කරමින් පවති. [18] එබැවින් WHO සහ UNHCR වැනි ඒජන්සි වලින් සුදුසු පරිදි උපදෙස් ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

### 10:9:1 රෝගකාරක පර්පෝෂිතයන් මර්ධනය සඳහා බලපාන ක්‍රමවේදයන්

මෙම ක්‍රමවේදයන් විශේෂයෙන්ම ඉලක්ක කරගත යුක්තේ පරපෝෂිත සංඛ්‍යාව ප්‍රමාණයෙන් සහ ඝනතත්ත්වයෙන් අඩු කිරීමය එමෙන්ම මිනිසාත්, පරපෝෂිතයාත් අතර සම්බන්ධවීම අවම කිරීම සහ පරපෝෂිතයන්ගේ බෝවීමේ ස්ථාන අවම කිරිම. [19] මෙම ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම සඳහා දේශිය දැනුම අවශ්‍යවේ. මෙම දැනුම වඩාත් ප්‍රයෝජන වන්නේ, ඍතු අනුව බෝවන රටාවන්, නියම පරපෝෂිත

---

[16] See: Envisonmental Health in Emergencies and disasters: WHO, P 163, 2002

[17] See Chapter (4) on site selection and camp Desingn

[18] See: Medical and veterinary Entomology: volume 16, Issue 4 P 404, 2002

රෝග තත්ත්වයන්, සහ බෝවන ස්ථාන හඳුනාගැනීම සඳහාය. මෙම රෝගකාරක පරපෝෂිතයන් දේශිය වශයෙන් අඩු කර ගැනිම පිළිබඳ අත්දැකිම් බහුල වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශ වලට සහ වෙනත් දේශිය සෞඛ්‍ය ඒජන්සි වලට ලැබී ඇත.

√ වඩාත් සුදුසුම ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීමේ කටයුත්තේ දී, කඳවුරු පාලකයින්, WATSAN ඒජන්සිය සමඟ සහ අවතැන්වූ ප්‍රජාව සමග වඩාත් සම්පව ක්‍රියා කල යුතුවේ. පරපෝෂිතයින් සම්පූර්ණයෙන්ම විනාශ කල හැක්කේ බෝවන ස්ථාන සහා ආහාර සැපයෙන ස්ථාන විනාශ කිරීම තුලිනි. මෙම පරපෝෂිතයන් බෝවන ස්ථාන හඳුනාගැනිම මෙන්ම පරපෝෂිතයන්ට වඩාත් යෝග්‍ය වන ස්ථාන හඳුනාගැනිම සහ එම ස්ථාන පිළිබඳව තක්සේරුවක් කළ යුතුවේ.

√ පොදු පහසුකම් වන ආහාර සහ බිම වර්ග මිලදී ගන්නා ස්ථාන, මේවා නිෂ්පාදනය සහ අලෙවිකෙරෙන ආපනශාලා, මාර්කට් සහ කඳවුරු තුළ පිහිටා ඇති ආහාර පිණිස සතුන් ඝාතනය කරන ස්ථානවල තත්ත්වයන් පිළිබඳ නිසා අධිකෂණයක් කිරීම කඳවුරු පාලකයින්ගේ වගකිම වේ.

√ අවතැන්වූ පුද්ගලයින් විසින් ඇතිකරනු ලබන සතුන්ට නිසිලෙස ප්‍රතිශක්තිකරණය ලබා නොදීම නිසාද රෝග කාරක පරපෝෂිතයන් බිහිවීම ඒ හරහා ලෙඩ රෝග පැතිරිය හැක. එබැවින් කඳවුරු පාලකයින් ප්‍රජා නායකයින් සමග ඒකාබද්ධව මෙම ගොවිපළ සතුන් රාත්‍රි කාලයේදී ගාල් කිරීම සඳහා වෙනමම ස්ථාන හඳුනාගත යුතු අතර මෙම ස්ථාන තණබිම් වලට අමතර විය යුතුයි.

**අවධානය**

සමහර අන්තර් ක්‍රියාවලියන්හි ප්‍රතිවිරුද්ධ ප්‍රතිවල ඇතිවියි හැක. විශේෂ අවධානයක් යොමුකල යුතු එක් කටයුත්තක් නම් ඒජන්සි විසින් සමහර අවස්ථාවලදී වේතනයන් ගෙවා සේවාවන් ලබා ගැනිම. උදා - මියන්ගේ මළකුණු එකතු කොට ආරක්ෂා සහිතව ඉවත් කිරීමේ කාර්‍යය මෙවැනි අවිස්ථාවලදී ඉවත් කිරීමේ කටයුතු හොඳ ආදායම් මාර්ගයක් සේ සිතන්නට පෙළඹුනහොත් මුදලට මුල් තැන දෙමින් සේවාව ප්‍රමාණවත්සේ ඉටු නොකිරීමෙන් මූෂික වර්ගයේ සතුන්ගේ බෝවීම වඩාත් ඉහල යැමට ඉඩ කඩ තිබේ.

## 10:10 මළකඳන් ඉවත් කිරීම.

සාමාන්‍යයෙන් සිතන පරිදි, මළ මිණීවලට නිරාවරණය වීම සැලකියයුතු සෞඛ්‍ය තර්ජනයෙක් නොවේ. මෙහිදී ලෙඩ රෝග බෝකරන රෝග වාහකයන් වන්නේ මළ මිනියේ ඇති විෂබීජ සහිත කුඩා කෘමීන් සහ මැස්සන්ය. යම් කිසි පුද්ගලයෙක් වර්රස් බෝවන උණ, කොළරාව, මහමාරිය සහ එබෝලා වැනි මොලේ උණ රෝගවලින් [20] මියගියවිට ඒ මළ මිනියේ වසන කෘමීන් සහ මැස්සන්ගෙන් වසංගත ලෙස රෝග පැතිරීමේ අවදානම ඇත. ආපදාවලින් සිදුවන මරණ වල ශාරීරික සෞඛ්‍ය තර්ජනයක් නොමැති. එමෙන්ම ආපදාවලින් සිදුවන මරණවල, මලකඳන්, විෂවීමක් හෝ ආසාදන තත්ත්වයන් ඇති කිරීමේ අවදානමක් නොමැත (WHO 2004) [21]

මළකඳන් ඉවත් කිරීමේ කාර්‍යය සංවිධානාත්මකව සිදුවිය යුතුය. පලාතේ බලධාරින්ව, මේ සම්බන්දව ගන්නා සෑම ක්‍රියාමාර්ගයකදීම සම්බන්ධකර ගැනිම අවශ්‍යම වේ. සෞඛ්‍ය සේවා ඒජන්සිවල ප්‍රධානම

(19) See: Sphere Handbook P, 80, 2004

(20) See: Hand Book for Emergancies, UNHCR, P 242, 2000 & Wmerganvy Sanitation, by p. Harvey S. Bhagrc, B. Reed, P, 135, 136, 2002

(21) See: Management of Dead Bodies in Disaster Situations, (WHO) Pan Amevican Health Organizetion (PAHO), P, xi 2004

වගකීමක් සහ භූමිකාවක් වන්නේ මළගිය පුද්ගලයින්ව ලියා පදිංචි කිරීම සහ මිය යෑමට හේතුවූ රෝග තත්ත්වය හඳුනා ගැනීමටය. තමන්ට ලැබෙන ආහාර සලාක ප්‍රමාණය අඩුවෙතැයි හෝ කපා හැරියැයි. යන බියෙන් බොහෝ දෙනෙක් මියයන සිය ඥාතීන් පිළිබඳ වාර්තා නොකර සිටීමට තීරණය කිරීමට පෙළඹෙන අතර මෙමගින් වාර්තා ගත නොවී මිය ගිය සංඛ්‍යාව ඉහළ යා හැකිය මළකඳන් භූමදානය කිරීම සුදුසුම ක්‍රමය වේ. ආදාහනය කිරීම හෝ මළකඳන් පුළුස්සා දැමීම, සෞඛ්‍යට හිතකරයැ"යි ස්ථිර වශයෙන්ම කිව නොහැකි එමෙන්ම පිළිස්සීම සඳහා ප්‍රමාණවත් ලෙස තෙල් හෝ දර නොතිබේ නම් ආදාහනය කිරීම සෞඛ්‍යයට හිතකර නොවේ, සම්ප්‍රදායික ආදානය සහ භූමදාන පිළිවෙත් අවබෝධකර ගනිමින්, හැකි සෑම අවස්ථාවකදීම එම වත් පිළිවෙත් අනුව අවමංගල චාරිත්‍ර වාරිත්‍ර ඉටුකිරීමට අවශ්‍ය සහයෝගය ලබාදීම කඳවුරු පාලකයින්ගේ සහ අනිකුත් ඒජන්සිවල වගකීම විය යුතුය. එමෙන්ම වැරදි අවබෝධය නිසා අනවශ්‍ය ගැටළු සහ නොහොඳ නෝක්කාඩු තත්ත්වයන් පැන නැඟිය හැක. පුළුල්වූ සන්දර්ශයක් තුළ යැපෙන්නෙන් සිටයද, කඳවුරු පාලකයින් පහත දැක්වෙන කරුණු පිළිබඳ නිසි අවබෝධයක් යොමු කළ යුතුවේ.

√ ජාතික හා ප්‍රාදේශීය වත් පිළිවෙත් වලට අනුකූලවන පරිදි මළ සිරුර ආදාහන හෝ භූමදාන කිරීමට සුදුසු ස්ථිරසාර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක විය යුතුවේ. කඳවුරු භූමිය හා ස්ථානය සැළසුම් කිරීමේදී කඳවුරු පාලකයින්ගේ වගකීම වන්නේ අවමංගල කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩකඩ වෙන් කිරීම, සහ අවශ්‍යවූ විටකදී ඉඩ ප්‍රමාණය ව්‍යාප්ත කරගත හැකිවන පරිදි හිස් ඉඩ ප්‍රමාණයක් තබාගනිමින් කටයුතු කිරීමය. ප්‍රාදේශීය බලධාරීන් සහ අවතැන්වූ පිරිස් සමග සාකච්ජා කළ යුතුවේ. විවිධ චාරිත්‍ර වාරිත්‍ර සහ ආගම්වලට අනුව සුසානභූමි සඳහා බිම් වෙන් කිරීමේදී ඒ භූමිය පිළිබඳ විශේෂ කැමැත්තක් දැක්වීමට ඉඩ තිබේ. එමෙන් එකට කඳවුරේ ජීවත්වන විවිධ ජාති හා ආගම්වලට අයත් පිරිස් ඒ අනුව සුසාන භූමිය වෙන් කිරීම පිළිබඳවද කැමැත්තක් දක්වනු ඇත. කෙසේ වෙතත් සුසාන භූමිය, වාසස්ථාන වලට හා ජල මූලාශ්‍ර වලට අවම දුරකින් හෝ පිහිටීම වැදගත්වේ. 04 වන (හතරවන) පරිච්ඡේදයේ 4,5 ඡේදයන් යටතේ, සුසාන භූමියක සහ මිනිවලවල්වල තිබිය යුතු ප්‍රමිතීන් පිළිබඳ සටහනක් දැක්වේ.

හදිසි අවස්ථාවන් යටතේ මළසිරුරු ඉවත් කිරීම පිළිබඳ තාක්ෂණික සටහනක්. මෙම පරිච්ඡේදයේ අවසානයේ ඇත. මෙවලම් කට්ටලයට අමුණා ඇත. (WHO, Technical Note # 8 2005)

**භූමදාන කටයුතු සඳහා සහයෝගය දීම**

පලාතට ආවේනිකවූ සම්ප්‍රදායන්ට අනුව මිනියකට අවශ්‍යවන සම්ප්‍රදායික අංගයන් එනම් මිනී පෙට්ටිය හෝ මිනියට අන්දවන ඇඳුමක් හෝ ආවරණයක් ලබා දීමට කටයුතු කිරීම ගැන කඳවුරු පාලකයින් සැළකිලිමත් විය යුතුය. මෙවැනි යම්කිසි ආධාරයක් දීම තුලින්, මිනිසුන්, පුද්ගලයකු මිය ගිය විට ඒ බව දැනුම්දීමට උනන්දු කරවීමක් සිදුවේ. මෙමගින් මළගිය පුද්ගලයින් හඳුනාගැනීමටත්, මළගිය පුද්ගලයා ලියාපදිංචි කිරීම සහ මිය යෑමට හේතු සහ රෝග තත්ත්වයන් පිළිබඳ තොරතුරු රැස්කරගැනීමත් පහසු කරවයි. යම් කිසි පුද්ගලයකු මිය ගිය විට මිය යෑමට හේතු පිළිබඳ පැතිරෙන කට කථා ඇතුලත් පෝරමයක් මගින් මිය යෑමට හේතුවූ රෝග තත්ත්වයන් පිළබඳ සැක සහිත තොරතුරක් ලබාගත හැකි, මෙම වාර්තා මගින් සෞඛ්‍ය සේවකයින් නොවන සේවකයිනට, වළදමන ලද මිනී පිළිබඳ විස්තර ලබා ගැනීම හෝ මළසිරුරු ලියා පදිංචි කිරීම, සහ සමහර අවස්ථාවලදී මිය යෑමට පෙර තිබූ රෝග පීඩාවන් පිළිබඳවද කරුනු දැනගැනීමට අවස්ථාව සැලසේ. මෙම පර්ච්ඡේදයේ මෙවලම් කට්ටලයට පෝර්මය ඇතුලත් කොට තිබේ (MDM 2004) භූමදාන කටයුතු සඳහා ලබාදෙන සහයෝගය මත තවදුරටත් විශ්වාසය, ගරුත්වය සහ සම්බන්ධතාව වැඩිදියුණු කර ගත හැකි වේ.

√ අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයන් ඇතිකළ යුතුවේ. මිණීවලවල් ගණන් කිරීම තුළින් මළගිය සංඛ්‍යාව පිළිබඳ දත්තයන් සකස් කර ගැනීමට මෙන්ම මිය යෑමට හේතුන්ද පිළිබඳ විස්තර රැස්කර ගැනීමට පහසුවේ. මේ සම්බන්ධයෙන් කඳවුරු පාලකයින් සෞඛ්‍ය සංවිධාන සහ ඒජන්සි සමග සමීපව කටයුතු කිරීම අවශ්‍යවේ.

√ මළගිය පුද්ගලයා අපරාධයක ගොදුරක් හෝ අධිකරණ ප්‍රශ්නයකට තුඩු දෙන හේතුවක් නිසා මිය ගියේනම් එවැනි මරණ පිළිබඳ සැලකිල්මත් විය යුතුවේ. [22] එවැසනි අවස්ථාවකදී අපරාධයට අවශ්‍ය සාක්ෂි රැස් කරගැනීම පිණිස පලාතේ නීතිය ක්‍රියාකරනවන ආයතනවලට සහ සෞඛ්‍ය ඒජන්සිවලට අවශ්‍ය කටයුතු සඳහා දැනුම් දිය යුතුවේ.

බොහෝ අවස්ථාවලදී හැකි ඉක්මනින් මළසිරුරු භූමදන හෝ ආදාහන කිරීම සිදුවේ. විශාල වශයෙන් සිදුවන ආපදා අවස්තාවන්හිදී මළසිරුරු හඳුනා ගැනීමේ අවශ්‍යතාව මත මළසිරුරු තැන්පත් කර තැබීම සඳහා මෘත ශරීරාගාර එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් තැනීමට, කඳවුරු පාලකයින්ට සිදුවේ. එවැනි හදිසි ආපදාවන් නොවුන අවස්ථාවකදී මියගිය පුද්ගලයාගේ ඥාතීන්ට අවමංගල චතාවන් සිදු කිරීමට හා ඔවුන්ගේ ශෝකය ප්‍රකාශකිරීමේ අවස්ථාවන් සඳහා ද එක් මෘතශරීරාගාරයක් ප්‍රමාණවත් වේ. මෘත ශරීරාගාරයක් ඉතා ශක්තිමත් ගොඩනැගිල්ලක් විය යුතු අතර එය කොටස් 04 කින් සමන්විත විය යුතුය.

- පිළිගැනීමේ ශාලාවක්/ කාමරයක්
- ප්‍රදර්ශන කාමරයක්
- ප්‍රදර්ශනය සඳහා තැබිය නොහැකි මළසිරුරු තැන්පත් කර තැබීමට සුදුසු ගබඩා කාමරයක්.
- වාර්තා සහ පෞද්ගලික බඩුමුට්ටු තැන්පත් කර තැබීමට කාමරයක්.

## 10.3 උපදේශාත්මක සටහන්

ඉහත ජේදයන්වල ඇතුලත් ප්‍රධාන පණිවුඩ අලලා සැකසුණු සරළ සෘජු සාරාංශයක්.

## 10.4 මෙවලම් කට්ටලය සවිරව තහවුරු කරගැනීමට ඇති.

☐ ජල සැපයුම සහ සනිපාරක්ෂාව, මූලික අවශ්‍යතා තක්සේරු කිරීමේ පිළිබඳ පිරික්සුම් ලේඛනය Sphere, 2004

☐ තාක්ෂණික සටහන අංක 1 හදිසි අවස්ථාවලදී පිරිසිදු කිරීම සහ විෂ බීජ නාශක ළිං WHO, 2005 (සංක්ෂිප්ත පැහැදිලි කිරීම)

☐ තාක්ෂණික සටහන අංක 2, හදිසි අවස්ථාවලදී පිරිසිදු කිරීම සහ විෂ බීජ නාශක වලවල් WHO, 2005

☐ තාක්ෂණික සටහන් අංක 14, හදිසි සනිපාරක්ෂාව - තාක්ෂනික මනාපය - WHO, 2005

☐ තාක්ෂණික සටහන් අංක 7, හදිසි අවස්තාවලි ඝන අපද්‍රව්‍ය විනාශ කිරීම WHO, 2005

---

[22] See: 'Sphere Handbook, p.269, 2004.

- ☐ පවුල් සෞඛ්‍ය කට්ටලය Oxfam, 2003
- ☐ තාක්ෂණික සටහන අංක 08, හදිසි අවස්ථාවලදී මළ මිනී විනාශ කිරීම WHO. 2005
- ☐ MDM ආරංචි පෝරමය
- ☐ ගෙවල් සංචාර පිරික්සුම් ලේඛනය IRC
- ☐ වෙනස්වන නිරීක්ෂණ ආකෘති ඇන්ඩර්ස් හා ලැන්ඩි වලින් NRC

අත්‍යවශ්‍යයෙන්ම කියැවිය යුතු සහ පරිශීලනය කළ යුතු සටහන්

# 11 අධ්‍යාපනය



මේ වන විට ඇප්ගනිස්තානයේ ගැහැනු ශිෂ්‍ය සංයුතිය 1/3 කි. 11 හැවිරිදි අලියා සර්වාරි පකිස්තානයේ සිට මෑතක දී ඇප්ගනිස්තානයට පැමිණ ඇත. ඇය කාබුල්හි පාසැලකට යති. ජායාරූපය N බෙහෙරිගේ UNHCR

# පරිච්ඡේදය 11 : අධ්‍යාපනය

## හැඳින්වීම.

සැම දරුවකුටම අධ්‍යාපනය සඳහා අයිතියක් ඇත.මේ අයිතිය නිවෙස්හි වෙසෙන, අවතැන්වූ, රැකවරණ සොයන හෝ සරණාගත ආදී කවරම දරුවකුටම එකසේ සාධාරණ වෙයි. ළමා වර්ධනයේ හා නව යොවුන් වර්ධනයේ හැම අංගයක් කෙරෙහිම අත්‍යවශ්‍ය වන අතර විශෙයෙන්ම කඳවුරු තත්ව යටතේ අවශ්‍යම ආරක්ෂක අවියකි. අධ්‍යාපනය, අවතැන්වූ දරුවන්ට සහ නවයොවුනනට දිගු කාලින ඵලවත් කිරීමක් සහ යොග්‍ය හැකියාවන් සඳහා උනන්දු කිරීමක් කරවන අතර සාමාන්‍ය තත්වයක් පිළිබඳ හැඟීමක් ඇති කරයි. හමුදාවලට බඳවා ගැනීම,ලිංගික අපචාර ,අපයෝජනය සහ ගණිකාකමට මෙහෙයැවීමෙන් ආදියෙන් වැළක්වීම සඳහා ප්‍රධාන කාර්ය භාරයක් අධ්‍යාපනය ඉටු කරන අතර ක්ෂණික අත්දැකීම් සමනය සඳහා ළමයින්ට පිහිටක් සපයයි. බිම් බෝම්බ අන්තරා පිළිබඳ ඉගෙන ගැනීමටත් HIV/AIDS පිළිබඳ දැනුවත් කිරීමටත් මානව අයිතිවාසිකම් ,අන්‍යොන්‍ය ඉවසීම ,අහිංසාව පදනම්කර ගත් ගැටුම් නිරාකරණය ආදිය වර්ධනය කරගැනීම සඳහාත් පාසල් හොඳ තෝතැන්නක් වෙයි.

කඳවුරු තත්ව යටතේ ළමයින්ට අධ්‍යාපන ක්‍රියාකාරකම් ලබාදීම සඳහා බොහෝවිට බාධා රැසක් පවතියි. සමහර විටෙක සත්කාරක රජයට තමන්ගේම ළමා ජනගහනය සඳහා සෑහෙන අධ්‍යාපන අවස්ථා සැපයීමට ඇති නොහැකියාව නිසා පිටුවහල්ව ආ දරුවනට අධ්‍යාපනය නොසලසයි.යටි තල පහසුකම නොමැතිවීම, සම්පත් හිඟකම සහ පුහුණු ගුරු හිඟය අනෙක් සමහර පොදු ගැටලුවෙයි. මේනිසාම පිටුවහල්ව ඇති දරුවනට ලැබෙන අධ්‍යාපනය බොහෝ විට ගුණ හින වෙයි.පාසල් උපකරණ හිඟ විය හැක.පාසල් කාලය ලුහු වෙයි. බොහෝ විට කඳවුරු මට්ටමෙන් දිය හැකසේ ප්‍රාථමික අධ්‍යාපන අවස්ථාවක්ම පමණි.

මෙවැනි අභියෝග මැද්දේ වුවත් අධ්‍යාපන වැඩ සටහන් වල අරමුණ හැකි තරම් ළමයින් සංඛ්‍යාවකට පාසල් අවස්ථා ඇති කර දීමයි. පාසල් වයසේ වූ සියලු ළමයින්ට සමාන අවස්ථා සැලසීම සහතික කිරීම කඳවුරු කළමනාකරුවකුගේ වගකීම වෙයි.

**වැඩ කළ යුත්තේ කවුරුන් සමගින්ද?**

- ප්‍රජානායකයින්
- දෙමාපියන්
- සිසුන් හා යොවුන් නායකයින්
- දෙමාපිය හෝ ප්‍රජාගුරුවර සමිති
- අධ්‍යාපනය සපයන්නන්
- UNHCR
- UNICEF
- අධ්‍යාපන අමාත්‍යාංශය

අවතැන්වූ ළමයින්ගේ අධ්‍යාපන සඳහා ඇති බාධක අභිභවන්නට සියලු දායකකාරකාදීන් සියල්ලන්ම එකටඑක්ව කටයුතු කරන බව සහතික කරගැනීමට උදව් වීමට, ප්‍රබෝධනයෙන් හා අධීක්ෂණයෙන් කඳවුරු කළමනාකරණ කණ්ඩායමට හැකිවනු ඇත..

හදිසි අවස්ථාවක වුවද මුල් අවදි පියවා ගැනීමට තාවකාලික පන්ති කාමර තනා දීමෙන් ළමයින්ට අධ්‍යාපන අවස්ථා ඇතිකර දීමට කඳවුරු කළමනාකරණ ඒජන්සියට හැකි වනු ඇත. විශේෂයෙන්ම ස්ථාපිත අධ්‍යාපනය අධිකාරියක් නැති තැන්වලදී ස්වෙච්ඡාවෙන් පන්ති සංවිධානය සඳහා දෙමාපියන් සහභාගිකර ගැනීමෙන් ළමයින්ට ඔවුන්ගේ අධ්‍යාපනය ඉක්මනට යළි අරඹා ගන්නට පිහිට වීමට කඳවුරු කළමනාකරුවන්ට හැකිය. කඳවුරට පිවිසීමේදී කරණ සෝදිසි විමසුමේම කොටසක් වශයෙන් ගුරුවරු හා පන්තිකාමර සහායකයින් ලියා පදිංචි කර ගත හැක. මෙය කඳවුරේ ප්‍රජාව මෙහෙයවුන ප්‍රථම ස්වයං උපකාරක කර්තව්‍යය වනු ඇත.අධ්‍යාපනයට ප්‍රමුඛතාවයක් දීමෙන් ළමා සුබසාධනය සඳහා කඳවුරු කළමනාකරුට සැලකිය යුතු සුවිශේෂ දායක වීමක් කළ හැක.

- ප්‍රමුඛතාවය විය යුත්තේ සියලු දෙනාටම ප්‍රාථමික අධ්‍යාපන අවස්ථා ඇතිකර දීමයි.
- විශේෂ වශයෙන් සැලකිල්ලට ගත යුත්තේ බොහෝ දරුවන් දැනටමත් අධ්‍යාපනය අතින් වරප්‍රසාද අහිමිවන් බවයි.
- පුළුවන් හැකි තරම් ප්‍රමාණයකට අවතැන් ජනකායේ සමාජිකයන් සමග අධ්‍යාපන ක්‍රමය සංවිධානය කරගෙන නිසි සහාය ඇතිව ඔවුන් විසින්ම පවත්වා ගන යා යුතුය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්

### යටිතලය සහ සැකසුම

බොහෝ කඳවුරු තත්ව යටතේ අධ්‍යාපනය සම්බන්ධයෙන් කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ මුඛ්‍ය වගකීම වනුයේ මූලික කඳවුරු යටිතල ව්‍යුහ තැනීමයි. ආරම්භයේදීම පිළිගැනුම් මධ්‍යස්ථාන තනන විටම හදිසි තාවකාලික පාසල් ද තැනිය යුතුය, යෝග්‍ය සිසු ගුරු අනුපාත පවත්වා ගැනීම සඳහා කඳවුරේ සම්පූර්ණ ධාරිතාව සිහි තබා ගැන්ම වැදගති. සමුච්ජ සැලැස්මේ අඩු තරමින් එක් ක්‍රීඩා පිටියක් වත් ඇතුළත්ව තිබිය යුතුය, පරමාදර්ශ වශයෙන් විෂය බාහිර ක්‍රියා කාරකම් සඳහා අතුළුගේ හා බැහැරී ගේ යනුවෙන් එක්රැස් විය හැකි දෙතැනක් විය යුතුය. නාට්‍ය හා සංස්කෘතික සමිති,පාපන්දු හා පැසිපන්දු කණ්ඩායම් ආදිය කාන්සිය ආතතිය අවම කර ගැනීමට සහ ළමයින් පාසල කෙරෙහි උනනදුවක් ඇතිකිරීමට ද වැදගත් මාර්ග වෙයි. මේ පහසුකම් පාසල් බිමෙහිම හෝ කඳවුරේ ක්‍රීඩා භූමියේ ඇති කළ හැක. තවද නවයොවුනනට/පශ්චාත් ප්‍රාථමික අධ්‍යාපනයක් ලබා ඇති අයට අධ්‍යාපන හා විවේක කාල කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා ද අවධානය දිය යුතුය,

- **අධ්‍යපන සේවා සැපයුවාගේ බලතල ගැන දැනුවත්ව සිටීම:** මේ අධිකාරය කුමක් සඳහා සැලසුම්කර ඇත්දැයි කණ්ඩායම දැන සිටිය යුතුය. කඳවුරු කළමනාකරන කණ්ඩයම හා අධ්‍යාපන සැපයු යන දෙපක්සයම ඔවුනොවුන්ගේ වෙනස් කාර්ය භාරය හා වගකිම් ගැන දැනවත්ව සිටිය යුතුයි. සේවාවන් අපේක්ෂිත තත්වයට වඩා පහත වැටුන වහාම අදාළ අධිකාරය හා සම්බන්ධිකරණය ඇතිකර ගැනිම වැදගති.


- **උසස් තත්වයේ පාසල් තැනීම් සඳහා වැය ප්‍රතිපාදන:** පවත්නා තත්වය යටතේ මේවා තාවකාලික (ප්ලාස්ටික්) අර්ධ තාවකාලික (කොන්ක්‍රිට් බිම හා ස්ථිර වහළ) ස්ථිර ඒවා විය හැකියි.. කඳවුරු තත්වය දිගු කාලයක් පැවතිය හැකි නම් කඳවුරේ තැනීම් පටන් ගන්නා විටම (එක්කෝ සත්කාරක ප්‍රජාවගේ පාසල් වලට යැමට හැකිවේ නම් ඒ පාසල් වැඩිදියුණු කිරීමට හෝ කඳවුර තුල පාසල් තැනිම සඳහා) ස්ථිර ගොඩනැගිලි .තැනිම සඳහා අය වැය සැලැසුම් සකස් කර ගත යුතුය.

- **පාසල් උපකරණ රැස්කර ගැනීම :** අධ්‍යාපන සැපයුම්කරුගෙන් නොලැබෙන්නේ නම් පාසල් ලිබඩු කළුලෑලි ආදි අත්‍යවශ්‍ය උපකරණ එක් රැස්කර ගැනිම වැදගත්ය.

- **කඳවුරු පහසුකම්වල ආරක්ෂාව :** සේදීම් හා වැසිකිළි පහසුකම පාසල් පරිශ්‍රවලට ආසන්නයේ පිහිටුවා ඇති බවටත් ඒවා වෙත යැම ඊම ආරක්ෂා සහිත බවටත් කාන්තාවන්ට හා දැරියන්ට නිසි නිස්කලංකය සහතික කෙරෙන බවටත් වගබලා ගත යුතුය., ගැහැණු ළමයින්ට හා පිරිමි ළමයින්ට වෙන වෙනම වැසිකිළි තිබිය යුතුවා මෙන්ම ගැහැණු /පිරිමි ආචාර්ය දෙගොල්ලන්ට වෙන වෙනම වැසිකිළි තිබිය යුතුය. මනා ආලෝකය තිබීම අතිශය වැදගත්ය. ක්‍රීඩා පිටි වෙන්කර දිමේදි ද මේ හා සමාන ආරක්ෂා අංග ගැන සැලකිල්ල යොමු කළ යුතුය. (පරිච්ජේදය 5 ආරක්ෂාව, පරිච්ජේදය 6, ළමා ආරක්ෂාව සහ පරිච්ජේදය 7 ලිංග මූලික ප්‍රචණ්ඩත්වය)

## ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධ කරුණු පිළිබඳ සැලකිල්ල

හැම අධ්‍යාපන මට්ටමකම අවතැන් පිරිමි සහ ගැහැණු ළමයින් දෙගොල්ලන්ගේම සමාන සහභාගිත්වය සහතික කළ යුතුය. තවද අධ්‍යාපනය සඳහා කළමණාකරන ඒජන්සියට වගකීමක් නොමැති විට, පාසල්වලට ගැහැණු ළමයින් ඇතුළත් කර ගැනිම වැඩිකිරීම සඳහා ගුරුවරියන් සහ වෙනත් පාසල් සේවිකාවන් බඳවා ගැනිම සඳහාද උනන්දු කිරීමෙන් කළමණාකාර කණ්ඩායමට සැලකිය යුතු සේ දායක විය හැක. ලිංග සංවේදී HIV/AIDS දෘෂ්ටි කෝණයක් අධ්‍යාපනයේ සියළු අංගවලදී අවධාරණය කළ යුතුය.



කොංගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජන රජයේ පාසල් දරුවන් අවධානයකින් යුතුව අධ්‍යාපනය උගෙනී. සෑම මානව හිතවාදී සහායකත්වයකම අවශ්‍යම අංගයකි. ජායාරූපය : එරික් සෙවුරිං NRC

## කඳවුරු කළමණාකරන කණ්ඩායමේ මුඛ්‍ය වගකීම්

- **ගැහැණු ළමයින් බඳවා ගැනීම:** පාසල්වලට ගැහැණු ළමයින් බඳවා ගැනීම් අධීක්ෂණය සඳහා අධ්‍යාපනය සපයන්නාට කණ්ඩායම සහාය විය යුතුය.අකල් පාසල් හැරයාම් වලට හේතු සොයා බැලීම වැදගත් වන අතර අකල් හැර යාම් වහාම වාර්තා කළ යුතුය. මේ කරුණ සම්බන්ධයෙන් අධ්‍යාපනය සපයන්නා හා ප්‍රජා සම්බන්ධීකරණ නිලධාරියා සමග සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතුය. (පරිච්ඡේදය 6 ළමා ආරක්ෂාව බලන්න)

- **ප්‍රජාව සංවේදීකරණය:** කාන්තා හා ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනයේ වැදගත්කම සම්බන්ධයෙන් ප්‍රජාව සංවේදී කළ යුතුය.මෙවැනි දැනුවත් කිරීමේ කාර්ය සඳහා සහාය විය හැකි ආදර්ශමත් පුද්ගලයින් හඳුනා ගත යුතුය. ගැහැනු ළමයින්ගේ අධ්‍යාපනය හා බැඳි ආකල්ප හා චර්යා වෙනස් කිරීමට කඳවුරු කළමණාකාර කණ්ඩායමට සහාය විය හැක. කළමණාකාරවරු ගුරු දෙගුරු සමිති හා සම්බන්ධ විය යුතුය.

- **අතිරේක සහාය කාර්ය:** පාසල් යාම සඳහා ගැහැනු ළමයින් උනන්දු කිරීම සඳහා කළයුතු කාර්ය සැලකිල්ලට ගත යුතුය. අකල් බැහැරවීම් අධෛර්ය කිරීම සඳහා ඉගෙනීමේ කටයුතුවලින් හා විෂය බාහිර කටයුතුවල දස්කම් පෑ අය දිරිමත් කිරීම සඳහාද සැලකිල්ල යොමු කළ යුතුය.

- **කාර්ය මණ්ඩලයේ කාන්තාවන් සිටීම:** ගුරුවරියන් හා පන්ති කාමර සහයිකාවන් බඳවා ගැනීමට අනුබල දිය යුතුය,කාන්තාවන් සිටීම ගැහැනු ළමයිනට වැඩි රැකවරණක් ලබාදීම සඳහා ගුරුවරුන්ට සහායක් වෙයි.ඒ අතරම අධ්‍යාපන කාර්ය කෙරෙන තැන්වල වැඩිපුර කාන්තාවන් සිටීම දෙමව්පියන් තුළ වඩා සැනසිලි දායක හැඟීම් ඇති කරනු ඇත.

- **චර්යා පද්ධතිය:** ළමයින් සමඟ මෙවුන්දම් තහනම් කෙරෙන චරියා පද්ධතිය ගැන ගුරුවරුන් දැනුවත් කළ යුතුය. ගුරු පුහුණුවේදී මේ කරුණු සාකච්ජාවට ගත යුතුය.

සමහර ළමයින්ට හා නවයොවුනනට අධ්‍යාපන ප්‍රවේශවීම් වඩා සීමාසහිත වෙයි. විශේෂයෙන්ම ගැහැනු ළමයි හා ආබාධිතයෝ අධ්‍යාපනයක් ලැබීමේදී වඩා දුෂ්කරතාවන්ට මුහුණ දෙති. සියලුම ළමයින් සඳහා සමාන අයිතිවාසිකම් ඇතිකරීම සඳහා ක්‍රියා කිරීමේදී කලංකනය, සංස්කෘතික හෝ සමාජ ආකල්ප  ආදිය කෙරෙහි  විමසිලිමත්ව යොමුවීම අතිශයෙන් වැදගති.

## ප්‍රජා සහභාගිත්වය

අධ්‍යාපනය සඳහා වගකීම දරණ අධිකාරයක් ඇති විටද සමස්තයක් වශයෙන් දෙමාපියන්ට හා ප්‍රජාවට තම දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් විශාල වගකීමක් ඇත. තම ළමයින්ගේ අධ්‍යාපනය ගැන යෙදීමට ප්‍රජාවට සහාය වීමට කළමණාකරන කණ්ඩායමට කීප ආකාරයකින් හැකිය.

## කඳවුරු කළමණාකරන කණ්ඩායමේ මුඛ්‍ය වගකීම්.

- **අධ්‍යාපන කමිටු පිහිටුවීම:** කඳවුර තුළ අධ්‍යාපන කමිටු පිහිටුවීමට කණ්ඩායම සහාය විය යුතුය. ගුරුවරු,දෙමාපියන්, කඳවුරු කඳවුරු වැඩිහිටියන්, සහ ගුරු/දෙගුරු සමිති වලට වේදිකා සකස් කර දීම අවශ්‍යයි. තොරතුරු බෙදා දීමට හා සාකච්ජා කිරීමටද අධ්‍යාපන ඕනෑ එපාකම් හඳුනා ගැනීමටද වැඩ මුලු හොඳ ක්‍රමයකි. ද්‍රව්‍ය හා භාණ්ඩ බෙදා දීම පාසල් ඒම සඳහා ළමයින් උනන්දු කිරීමට හොඳ උපක්‍රමයකි. බෙදා දීම සඳහා විශේෂයෙන් ළමයින් සඳහා වූ ඉගෙනුම් උපකරණ, ඇඳුම් පැළඳුම් හෝ සෙල්ලම් බඩු ආදී දේ කළමනාකරුවකු වෙත තිබේ නම් ඒවා පාසල් වෙලාවේදීම බෙදා හැරිය යුතුය.

- **ගුරුවරුන්ගේ සමිති :** විෂයමාලා, අරමුණු සහ බඳවා ගැනීම් ආදියගැන සාකච්ජා කළ හැකි ගුරු සමිති පිහිටුවා ගැනීමට සහාය දීම වැදගත්ය. ගුරුසමිතියක ප්‍රජා සාමාජිකයන්ද ස්ථානිය ප්‍රජාවේ ගුරුවරන්ද සිටීම මැනවි.

- **සත්කාරක ප්‍රජා සහභාත්වය:** කඳවුරු පාසල්වලට ස්ථානිය ළමයින් අතුළත් කරගැනිම හා කඳවුරු ළමයින් ස්ථානිය පාසල් වලට ඇතුළත් කිරීම සඳහාත් ඇති ඉඩ ප්‍රස්තා සලසා ගැනීමේ හැකියාව සම්බන්ධව අධ්‍යාපන සැපයු සහ සත්කාරක ප්‍රජා නියෝජිතයින් සමග සම්බන්ධතාවක් ඇතිකර ගැනිම වැදගත් වෙයි. අධ්‍යාපන වැඩ සටහන් සකස් කර දීමේදී සත්කාරක රජයේ/ ප්‍රජාවගේ විෂයමාලා හා අරමුණු පිළිබඳ මූලික අවබෝධයක් කළමණාකරණ කණ්ඩායමට තිබිය යුතුයි.

- **ඉගැන්විය යුතු අළුත් විෂයය:** බිම්බෝම්බ අවදානම සහ HIV/AIDS පිළිබඳ දැනුවත්කිරීම ආදී අදාළ අළුත් විෂයයන් ඉගැන්විය යුතුය. මේ විෂයයන් ගුරු පුහුණුවටද ඇතුළත් කළ යුතුය. උදාහරණ වශයෙන් අධ්‍යාපන හා විනෝද ක්‍රීඩා කට්ටලවලට යෝග්‍ය උපකරණ ගුරුවරුන්ට සැපයීම වැදගති.

- **ළමයින් සඳහා විශේෂ අධිකාරියක් නොමැති නම්:** සමහර විටෙක අධ්‍යාපනය සඳහා විශේෂ අධිකාරියක් නොතිබිය හැකිය. එවැනි අවස්ථාවක් වෙයි නම් විවිධ අධ්‍යාපන අවශ්‍යතා විමසා බලා සපුරා ලීමට කඳවුරු කළමනාකරන ඒජන්සිය විවෘත ප්‍රවේශයකට යොමුවීම වැදගති.

> දරුවන් පාසලට පැමිනීම උනන්දු කිරීමට ද්‍රව්‍ය බෙදා දීම හොඳ මගකි . ළමයින්ට විශේෂිත ඉගෙනීමේ ද්‍රව්‍ය, ඇඳුම් හෝ සෙල්ලම් බඩු ඇති කඳවුරු කළමනාකරුවන් විසින් පාසල් කාලය තුළ දී ඒවා බෙදා හැරිය යුතුය .

- **අධ්‍යාපනය සඳහා සාකච්ඡා සංසද?** අධ්‍යාපන වැඩසටහන් හා පහසුකම් ද අදල වෙනත් විශේෂ කරුණු සාකච්ඡා කිරීම සඳහා යොවුන් නායකයින් කඳවුරු නායකයින් ගුරු දෙගුරු සමාගම් විශේෂ තත්ත්වයන් හා අධ්‍යාපන වැඩසටහන් සහ පහසුකම් සම්බන්ධව ඇමැතිය යුතුයි වැඩ මුලු ආදිය තොරතුරු බෙදා හැරීමට යොදා ගත හැකියි .

## කඳවුරු කළමණාකරණ කණ්ඩායමේ මුඛ්‍ය වගකීම්.

- **සැලසුම් සංවිධානය:** සිසුන්ට භාග සඳහා යාමටද විෂය බාහිර කාර්ය සඳහා සහභාගිවීමටද ප්‍රවහන පහසුකම් සැපයීමට කණ්ඩායම මැදිහත් විය යුතුය.

- **ප්‍රජාව සංවේදීකරණය:** අධ්‍යපනය සඳහා වගකිම් දරණ අධිකාරියක් නොමැති විටෙක තම දරුවන්ගේ අධ්‍යාපනය හරහා පැතිරී රැකවරණ අංගයන් සම්බන්ධයෙන් කුඩු මහත් කඳවුරු ජනතාව සංවේදීකරණය කිරීම කෙරෙහි කඳවුරු කළමණාකාර ඒජන්සියට වඩාත්ම අධික වගකිමක් පැවරෙයි. රැකවරණ පිළිබඳ කරුණු කෙරෙහි විශේෂයෙන්ම ගැහැණු ළමයින් හා කාන්තාවන්/ ආබාධිතයන් ආදීන්ගේ බඳවා ගැනීම හා සබැඳි රැකවරණය පිළිබඳ කාරණා කෙරෙහි අධ්‍යාපන කමිටු රැස්වීම්වලදී යොමු විය අතර විවිධ ගුරු සමිතිවල යොමුවීමද කඳවුරු කළමණාකරු සහතික විය යුතුය. මේ කරුණ සම්බන්ධයෙන් ආරක්ෂා නිලධරයා හෝ ඒජන්සිය සමග සම්බන්ධීකරණයක් ඇතිකර ගැනීම වැදගත්වෙයි.

- **අධ්‍යාපන දීමනා:** ද්විතිය හා තෘතිය අධ්‍යාපනයක් සඳහා ඇතුළුවීමට දීමනා හෝ උපදේශනය මගින් කඳවුරු කළමනාකරණ ඒජන්සියට කඳවුරු සිසුනට පිහිට විය හැක. කඳවුර සමීපයේ පිහිටි සත්කාර ප්‍රජාවගේ පාසලවලට හෝ තුන්වන රටකට ශිෂ්‍යත්ව සැපයීම ආදී විකල්ප ගැන

අවධානය මෙහෙය විය යුතුය. සම්පයේ කොපමණ අවස්ථා ඇත්ද, ඒවා ලබාගන්නේ කෙසේද යන ප්‍රශ්ණ සම්බන්ධයෙන් අදාළ තොරතුරු කට්ටල සූදාමනම්කර ලබාදීමට කඳවුරු කළමණාකාර ඒජන්සියට පිළිවන.

- **ස්වේච්ජා සේවය හා උනන්දු කිරීම්:** කඳවුරු තුළ ගන්නා ස්වේච්ජා ප්‍රයත්නයන්හි සාමයයක් ඇති කළ යුතුය. දෙමාපියන් අධ්‍යාපනය සපයන්නේ නම් (ස්වයං උපකාරක) ඔවුන්ගේ ප්‍රයත්න වල වගකීම් පමණ සලකා ඔවුන්ට දිරිගැන්වීමේ දීමනා දිය යුතුය. කඳවුර පුරා සියලු අංශ හරහා සාධාරණ ප්‍රමිතියක් පවත්වා ගැනීම සඳහා කඳවුරු සහාය සපයන වෙනත් අංශවල ඒජන්සි සමග එකට කටයුතු කිරීම වැදගත්ය. (පරිච්පෙදය 3 ප්‍රජා සහභාගිත්වය බලන්න)

## කඳවුරු කළමණාකරණ කණ්ඩායම හා හඳුනාගත් අනෙක් ඒජන්සීන් සමග සහයෝගය

**සෞඛ්‍යය:**

**සේවා සංයෝජනය:** පාසල් යන කාලය තුළ ළමයින්ට උපදෙස්දීමට හා ප්‍රතිකාර ලබාදීමට වෛද්‍ය සේවා සැපයීමේ වගකීම දරණ ඒජන්සිය හා ස්ථානිය සායන ආයතනයක් හා සමග එක්ව කළමණාකරන කණ්ඩායම කටයුතු කළ යුතුය. අධ්‍යාපන අධිකාරීන් හා ගුරු සංගම් (හා එක්ව) හා සමග ප්‍රතිශක්තිකරණ කටයුතු (ප්‍රතිශක්තිකරණ ව්‍යාපාර හා ප්‍රතිශක්තිකරණය) සම්බන්ධිකරණය කිරීම අතිශයෙන් වැදගති. මේ මගින් පාසැල් වැරීමට හේතුවන ලෙඩ රෝග ඇතිවීම වළක්වා ගත හැකි වනු ඇත.

**ප්‍රතිකාර සඳහා ප්‍රමුඛතාව:** සේවා සංයෝජනයකට අවකාශ නොමැති නම් පාසැල් නොපැමිණීම වළක්වා ගැනිම සඳහා සායන වලදී ගුරුවරන්ට හා ළමයින්ට ප්‍රමුඛත්වයක් ලබා දිය හැකි දැයි කළමණාකාර කණ්ඩායම සොයා බැලිය යුතුය.

**සෞඛ්‍ය අධ්‍යාපනය:** පාසල්වල සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් ඇතිකළයුතුය. මේ මගින් සෞඛ්‍ය තොරතුරු ළමයින් අතට පත්කිරීම පහසුවෙන්ම කළ හැක.

**ආහාර බෙදාදීම:**


**අහර සලාක බෙදී දීමේ විකල්ප මාර්ග:** ගුරුවරුනට පාසල් කාලයෙන් පසු , ආහාර සලාක ලබා දීමේ ක්‍රමයක් සංවිධාන කළ යුතුය. එසේත් නොවේ නම් පාසල් කාලය තුළ ඔවුන්ගේ වැඩට බාධා නොවන ආකාරයේ පිළිවෙළක් සකස් කිරීම වැදගත්ය.

**පාසල් ආහාරය:** පාසල් කාලය තුළ දිවා ආහාර සැපයිම කෙරෙහි සිත් යොමු කළයුතුය. විශේෂයෙන්ම ආහාර නොමැති කම නිසා ළමයින් පාසල් ගමන අත්හැර දැමීමට පෙළඹෙන්නේ නම්.

## ජලය හා සනීපාරක්ෂාව

- **ජලය සහ වැසිකිළි පහසුකම්:** මේ පහසුකම් තාවකාලික පාසල් නිවහන් වලටද ඇතුළු පාසල විසින් තනා දිය යුතුය.වඩා හොඳ සනීපාරක්ෂාවක් සඳහා උනන්දු කිරීම පිණිස අර්ධ-ස්ථිර පාසල් වලට හොඳ වැසිකිළි ලබා දිය යුතුය ග්‍රාමීය ජනගහනයක් නිසාම කඳවුරු පාසල්වල වැසිකිළි භාවිතය සඳහා උනන්දු කරවීම මගින් වැසිකිළි භාවිතය හා එහි වැදගත්කම පෙන්වා දිය හැකිය.

- **සනීපාරක්ෂාව සඳහා උනන්දුකරවීම** අත් පා සේදීම්ද ඇතුලුව හොඳ සෞඛ්‍ය පුරුදු ද අන්තර්ගත සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් පාසල්හි ආරම්භ කිරීම සඳහා උදව් දීම අවශ්‍යය. සනීපාරක්ෂාව සඳහා උනන්දුකිරීම්වලට ළමයින් ඉලක්ක කර ගැනීම බෝහෝවිට ඉතා දුෂ්කර වුවද ඉතාමත්ම තීරණාත්මකය.මේ කණ්ඩායම් වෙතට යොමුවීම සඳහා පාසල් හා ක්‍රීඩා පිටි ඉතාමත්ම ඵලදායී මාර්ගයෙකි. පරිච්ඡේදය 10 ජලය සහ සනීපාරක්ෂාව බලන්න)



ඇෆ්ගන් අභ්‍යන්තර අවතැන් වූ ළමුන් පකිස්ථානයේ කඳවුරු පාසලක හදිසි තත්ත්වයකදී වුවත් කඳවුරු කළමනාකරණ කණ්ඩායමට මූලික අධ්‍යාපනය ලබා දිය හැකිය. තාවකාලික ගොඩනැගිලිවල පන්ති කාමර පවත්වා දෙමාපියන් ගුරුවරුන් ලෙ යොදා ගත හැකිය. ඡායාරූපය: අමාර් බොක්හාරි NRC

## ආගමික ආයතන

- **පාසල් කාල වේලා යෝග්‍ය පරිදි වෙනස් කර ගැනීම:** රජයේ හෝ කඳවුරු පාසල් කාල වේලා හා නොගැටෙන පරිදි තමන්ගේ පාසල් කාල වේලාවන් සකස් කර ගන්නා සේ ආගමික පාසල් විදුහල්පතින් සමග එක්ව කටයුතු කරන සේ කඳවුරු කළමනාකරණ කණ්ඩායමට යෝජනා කෙරෙයි. මේ සඳහා බොහෝ දැනුවත් කිරීම් අවශ්‍ය වනු ඇත.එහෙත් කඳවුරු කළමනාකරු

වැදගත් පුද්ගලයෙකු සේ පිළිගැනීමක් ඇත්තෙකු හෙයින් ආගමික හා රජයේ සම්මත විෂයයන් ඇතුළත් අධ්‍යාපනයක් යන දෙකම හැම පාසලකම තිබීමේ වැදගත්කම දෙමාපියනට හා ළමයින්ට යන දෙපක්ෂයටම ඒත්තු ගැන්වීමට උදව් විය හැක.

- **ආගමික ප්‍රජාවන්ගේ අවශ්‍යතා.** කඳවුරේ සිටින සියලු ආගමික ප්‍රජාවන්ගේ අවශ්‍යතා කෙරෙහි අවධානය දිය යුතුය.

# මෙවලම් කට්ටලය

**අධ්‍යාපන තක්සේරු මාතෘකා:**

ගැහැණු පිරිමි ළමා අනුපාත ;ගැහැණු-පිරිමි පුහුණු-නුපුහුණු ගුරු අනුපාත,පවතින ජල සහ සනිපාරක්ෂක පහසුකම්,පාසල් නොයන ස්ථානීය අවතැන් වූ ළමයින් සහ ගුරුවරුන්ගේ තත්වය තක්සේරුවට හා අධීක්ෂණයට අත්‍යවශ්‍ය මෙවලම්. කළමනාකරණ කණ්ඩායමට අධ්‍යාපනය සපයන අධිකාරිය(එවැන්නක් ඇත්නම්) හා සම්බන්ධීකරණය වී අනුපාතයන්හි වෙනස්වීම් අධීක්ෂණයට හා සමාන පාසල් අවස්ථා ඇතිකිරීම වැනි රැකවරණ ප්‍රශ්න කෙරෙහි යොමු වීමට මෙහි සඳහන් මාතෘකා භාවිත කළ හැක.

**පාසල් බිම්/ පරිසර තක්සේරුව- පිරික්සුම් ලේඛණය (INEE)**

මේ සෝදිසි ලේඛණය හදිසි අවස්ථා සඳහා අධ්‍යාපන අන්තර ඒජන්සි ජාලයෙන් (INEE) ගත්තෙකි.එය පාසල් බිම් තක්සේරුව සඳහා ප්‍රයෝජනවත් පසුබිම් තොරතුරු ලබා දෙයි. පාසල් තැනීම,ආවරණය හා ඉඳුම් හිටුම් පහසුකම්, ආරක්ෂාව (පිවිසීම හා පිටවයාම/රැකවරණ) සම්බන්ධ අංග සහ ස්ථානීය ද්‍රව්‍ය භාවිතය හා ප්‍රමිතීන් ආදිය කෙරෙහි අවධානය දෙයි. මේ ලේඛණයේ දෙවන කොටසින් පාසල් පිහිටුවීමේදී සැලකිල්ලට ගත යුතු සියලු කරුණු දක්වන මහෝපකාරී සොදිසි ලේඛණයක් සැපයෙයි.

**යෝජිත බොදාහැරීම් සූත්‍ර (IRC Sierra Leone)**

පාසල් හා සම්බන්ධ යෝජිත ද්‍රව්‍ය හා පහසුකම් ප්‍රමාණ මෙහි දැක්වෙයි. IRC ය සියරා ලියෝන් තත්ව සඳහා මේ සූත්‍ර භාවිත කෙරෙයි. එහෙත් වෙනස් තත්ව යටතේ මේවා වෙනස් වනු ඇත. පාසල් බිම් , ගුරුවරන් හා පන්ති කාමර සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා පහසුකම් සම්බන්ධ අදහසක් ලබා ගැනීම සඳහා ආශ්‍රේය මිම්මක් සේ මේවා භාවිත කළ හැක.

**ගුරුවරුන්/පුහුණුකාරකයින් ආදීන් තෝරාගැනීමද ඇතුලුව ලබාගැනීමේ පිළිවෙත්කම හා හැකියාව තක්සේරුව (INEE)**

මේ ලේඛණය හදිසි අවස්ථා සඳහා අධ්‍යාපන අන්තර ඒජන්සි ජාලයෙන්(INEE) ගත්තෙකි.අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම් සඳහා ප්‍රයෝජනවත් පසුබිම් තොරතුරු ඉන් සැපයෙයි. අධ්‍යාපනවේදීන් හඳුනා ගැනීමටත් (තෝරාගැනීම හා තක්සේරුව ද ඇතුලුව) ඔවුන්ට අවශ්‍ය වන උපකාරක ද්‍රව්‍ය හා පුහුණුව සඳහා සහාය කෙරෙහිත් එහි අවධානය යොමුව ඇත.

**යුනෙස්කෝ ගුරුවර හදිසි අවස්ථා පැකේජය (TEP)**

යුනෙස්කෝවේ TEPයේ ලුහුඩු විස්තරයක්.

**යුනිසෙෆ් 2000 හදිසි අවස්ථා කට්ටල.**

අධ්‍යාපන හා විනෝද කාර්යාංග කට්ටල ඇතුලුව අන්තරගත කරුණුවල පොදු සමාලෝචනයක්.

**UNHCR ප්‍රාථමික අධ්‍යාපන සැපයුම්**

ප්‍රාථමික අධ්‍යාපනය සඳහා සැපයුම් පිළිබඳ උදාහරණ. කුමණ භාණ්ඩ කවර ප්‍රමාණයකින් අවශ්‍ය වන්නේ ද යන්න පිළිබඳ අවබෝධයක් මෙයින් ලබා ගත හැක.

## ආශ්‍රේය මෙවලම්.

**හදිසි අවස්ථාවන්හි අධ්‍යාපනය සඳහා අවම ප්‍රමිතීන් (INEE)**

නව අවම ප්‍රමිතීන් සකස්කරගන යනු ලබන අතර 2005 මුල් භාගයේදී http//www.ineesite.org වෙබ් අඩවියෙන් ලබාගත හැකිවනු ඇත .

## අවශ්‍ය කියවීම් ලැයිස්තුව හා ආශ්‍රේයයන්

- රෙස්ලර් , එවරීම්, එම්. ජොආන් මාරියා ටොර්ටොරිසි සහ ඇලෙක්ස් මාර්සිලියන්, යුදවන් විට දරුවෝ: සේවා සැලසීම සඳහා මග පෙන්වීමක්, යුනිෂෙෆ් සඳහා අධ්‍යයනයකි. නිව්යෝර්ක්, UNICEF

- UNHCR 1992 සරනාගතයින් සඳහා අධ්‍යාපන සහාය ලබාදීම පිණිස නිර්නායකයින් පිනිවා UNHCR

- UNHCR 1998 හදිසි අවස්තාවන්වලදී සරණාගත දරුවන්ට ප්‍රාථමික අධ්‍යාපනය සංවිධානය ක්ෂේත්‍ර කළමනාකරුවන් සඳහා නිර්නායකි පිනිවා NHCR, PRSS

- UNICEF 1992 ගැහැනු ළමයින්ගේ අධ්‍යාපන ප්‍රවර්ධනය සඳහා ක්‍රමවේද නිව්යෝර්ක් UNICEF

- UNHCR/NGO පාර්ශ්වයන් 2001 සරණාගතයින් ආරක්‍ෂා කිරීම රාජ්‍ය නොවන සංවිධාන සඳහා මග පෙන්වීමක් පිනිවා UNHCR හා NGO Partners

- UNHCR 1994 සරණාගත දරුවන් රැකවරණය සහ සත්කාරය පිළිබඳ නිර්නායක පිනිවා UNHCR

- UNHCR 2003 ආරක්ෂාව සඳහා න්‍යායපත්‍රය

- IASC 2003 හදිසි තත්වයකදී HIV/AIDS සඳහා මැදිහත්වීමට නිර්නායක

- අන්තර්ජාතික ගලවා ගැනීමේ කමිටුව 2003 HIV වැළකම්ම යුද්ධයෙන් බලපැම් වු සහ අවතැන් වු ජනයාට සහායවීම සහ සත්කාරය

- www.ineesrle.org (Inter-Agency Network for Education in Emergencies)
- www.unicef.org
- www.sauethechiletren.org.uk
- www.unhcr.ch
- www.theire.org

# අධ්‍යාපන තක්සේරු මාතෘකය

දිස්ත්‍රික්කය　　　　කොට්ඨාශය　　　　නගරය/ගම

පාසලේ නම

| ශ්‍රේණිය | ශිෂ්‍ය | | ගුරුවරු | | |
|---|---|---|---|---|---|
| | පිරිමි | ගැහැනු | පිරිමි | ගැහැනු | මුළු |
| පන්තිය 1 | | | | | |
| පන්තිය 2 | | | | | |
| පන්තිය 3 | | | | | |
| පන්තිය 4 | | | | | |
| පන්තිය 5 | | | | | |
| පන්තිය 6 | | | | | |
| | | | | | |
| මුළු | | | | | |

| පාසලින් බැහැර ළමයින්ගේ තත්ත්වය 6-9 අවුරුදු | පිරිමි | ගැහැනු | මුළු |
|---|---|---|---|
| අවතැන් | | | |
| සරණාගත | | | |
| ස්ථානිය | | | |
| වෙනත් | | | |
| මුළු ගණන | | | |
| | | | |
| | | | |

| පාසලින් බැහැර ළමයින්ගේ තත්ත්වය 10-15 අවුරුදු | පිරිමි |
|---|---|
| අවතැන් | |
| සරණාගත | |
| ස්ථානිය | |
| වෙනත් | |
| මුළු ගණන | |
| | |
| | |

| පුහුණු ගුරු තත්ත්වය | පිරිමි | ගැහැනු | මුළු | | |
|---|---|---|---|---|---|
| අවතැන් | | | | | |
| සරණාගත | | | | | |
| ස්ථානිය | | | | | |
| වෙනත් | | | | | |
| මුළු ගණන | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

| පුහුණු ගුරු තත්ත්වය | පිරිමි | ගැහැනු | මුළු |
|---|---|---|---|
| අවතැන් | | | |
| සරණාගත | | | |
| ස්ථානිය | | | |
| වෙනත් | | | |
| මුළු ගණන | | | |
| | | | |
| CTA ක්‍රියාකාරීත්වය | | | |
| | | | |

| ගුරු තත්ත්වය | පිරිමි |
|---|---|
| ස්වේච්ඡා | |
| ගෙවීම් ලබන ගුරුවරු | |
| ගුරුවරු | |
| පුහුණු/සුදුසුකම්ලත් | |
| මුළු | |
| | |
| | |

| WATSAN/වර්ගය | |
|---|---|
| වැසිකිළි | ජල සැපයුම් |
| | |

ප්‍රකාශ

# INEE

**Interagency Network for Education in Emergencies**

**හදිසි අවස්ථා  අධ්‍යාපනය සඳහා අන්තර්ඒජන්සි ජාලය.**

*තක්සේරුව අධීක්ෂණය සහ ඇගයීම*

## පාසල් බිම්/ පරිසර තක්සේරුව

හදිසි තත්ව යටතේ කළයුතු මුල්ම තීරණවලින් එකක් නම් අධ්‍යාපන කටයුතු ඇරඹිය යුත්තේ කොතැන්හිද යන්නයි. ගොඩනැගිලි නොමැති තැන්හි රැක් සෙවනෙහි ළමයින්  බිම හිඳ ගැනීමට සලස්වා ප්‍රජාව බොහෝවිට අධ්‍යාපන කටයුතුවලට මුල පුරයි.මෙවැනි අවස්ථාවලදී ළමයින්ට අව්වෙන් වැස්සෙන් රැකවරණ සැලසීම සඳහා හැකි ඉක්මනින් සෙවනක් ලබාදිය යුතුවෙයි. තව පිළියමක් නම් ස්ථානියව පවත්නා පාසල්වලට ළමයින් අන්තර ග්‍රහණය කිරීමයි. එසේත් නැතිනම් ඇති වෙනත් ගොඩනැගිලි අවශ්‍ය පරිදි සකස් කර  පාවිච්චියට ගැනීමයි. අවසාන පිළියමක් වශයෙන් අළුත් පාසල් ගොඩනැගිලි තැනිය යුතු වන අතර ආබාධිතයන් ඇතුළු කර ගැනීම සඳහා විශේෂ ප්‍රයත්නයක් දැරිය යුතුයි. සුලුතර කොටස් වලට හා ලාබාල ළමයින්ට පාසල් යාම පහසුවන තැනෙක පාසල් පිහිටු විය යුතුයි.

### උපක්‍රම

- **පාසල් හා අධ්‍යාපන පරිශ්‍ර  ළමයින්ට ආරක්ෂා සහිත බව තහවුරු කළ යුතුයි.**
  හදිසි තත්ව පවත්නා බොහෝ තැන්වල ගැටුම් කාලය මුළුල්ලේම පාසල් අවට බිම් බෝම්බ අටවා ඇතිවා වෙන්ම පාසල් සටන් ඉලක්කද වෙයි. පාසලට පිවිසෙන මාර්ගද, පාසලද ආරක්ෂා සහිත බවත් බෝම්බ හා වෙනත් යුද අවි වලින් තොර බවටත් අදාල බලධාරීන්ගෙන් විමසා සෑහීමකට පත්වීම තක්සේරු කණ්ඩායම අනිවාර්යයෙන්ම කළ යුතුයි. අනතුරුකාරී දේවල් ඉවත් කළ පසු පරිශ්‍රය රැහැන් හෝ ප්ලාස්ටික් ටේප් වලින් මායිම් සලකුණු කොට වෙනත් අනතුරුකාරී දේවලින් විමුක්තව ඇත්දැයි පරීක්ෂා කළ යුතුයි

- **පාසල් ඉඩකඩ හා අවට පරිශ්‍රය තක්සේරුවට භාජන කරන්න.**
  බොහෝ විට පාසල් හා අධ්‍යාපන පරිශ්‍ර ළමයින් පයින් යා හැකි දුරින් විය යුතුයි. සාමාන්‍යයෙන් බාල දරුවන්ට පාසලට පයින් යෑම පහසුවන සේ බොහෝ ප්‍රජාවන්හි කුඩා ප්‍රාථමික පාසල් බොහෝ සංඛ්‍යාවක් තිබීම මින් අදහස් වෙයි. ලොකු ළමයින්ට වඩා කේන්ද්‍රියව පිහිටි ද්විතිය හෝ උසස් පාසල්වලට පයින් යෑමට හැකියි. විශාල ළමයින් සංඛ්‍යාවක් ඇති පහසුකම් අඩු ස්ථාන වල උදය හා හවස වශයෙන් වාර දෙකක් පාසල් පැවැත්විය හැකිදැයි විමසා බැලිය යුතුයි.

- පාසල් ලී බඩු, පාසල් සඳහා ගොඩනැගිලි සකසා ගැනීම හා අළුත් ගොඩනැගිලි සෑදීම් ආදියේ දී ස්වානිය ප්‍රමිතීන් භාවිත කරන්න.

  ගොඩනැගිලි හා ලි බඩු ආදිය ප්‍රදේශයේ ප්‍රමිතීන්ට අනුව විය යුතුයි. ලෝකයේ බොහෝ ප්‍රදේශවල සම්මතය තහඩු හෝ කොළ සෙවිලි වහලින් හා මැටි බිත්තිවලින් සෑදූ පන්ති කාමර වෙයි. තවත් තැනෙක ගොඩනැගිලි තැනීමේදී ප්‍රදේශයේම තනා ගන්නා ගඩොල් භාවිතය සම්මතය වෙයි. ඒ ලෙසම බිම ඉඳ ගැනීම ළමයින්ගේ සාමාන්‍ය පුරුද්ද වන අතර සමහර තැනෙක ඩෙස් බංකු සම්මතය වෙයි. රජයයන් බොහෝවිට ගොඩනැගිලි හා ලි බඩු සඳහා උපදෙස් මාලා සකස් කර ඇත. බොහෝවිට මේවා පරමාදර්ශී ඒවා මිස යථා තත්ව පදනම් කර ගත් ඒවා නොවෙයි. ඒ නිසා මනාව රජයෙන් නඩත්තු වන ග්‍රාමීය පාසලක් ආදර්ශය වශයෙන් ගැනීම වඩා මැනවි.

## සෝදිසි ලේඛණය

තක්සේරුව සඳහා අවශ්‍ය / වෘත්තිය පසුබිමක් සහිත පුද්ගලයින් ඇතුළත්ද? නිවහන් ඉංජිනේරුවෙක් ඇතුළත් ද? ජලය සහ සනිපාරක්ෂාව පිළිබඳ අත්දැකීම් ඇත්තෙක් ද? සමාජ සේවකයෙක් ආදීන් ඇතුළත් ද?

## පාසල් හෝ ගොඩනැගිලි නැති තැන්.

- ළමයින් දැන් ඉගෙන ගන්නේ කොතැන්හි ද? රුක් සෙවනකද? මොන ගොඩනැගිල්ලක ද?
- ඉඩකඩ සඳහා අවසර දුන්නේ කවරෙක් ද? මෙය ස්ථිර ද? තාවකාලිකද? ලිඛිත අවසරයක් ද?
- කෘලගුණයෙන් ළමයින්ට ආරක්ෂාව තිබේ ද? වැස්සේ ඉන්නවාද? අව්වේ ඉන්නව ද? ඔවුන් සීතලේ ද?
- ළමයින් ඉඳගන්නේ මොනවා මත ද?
- පාසලක් ගොඩ නැගීමට ඇත්තේ කුමණ ද්‍රව්‍ය ද? සම්ප්‍රදායික පාසල තනා ඇත්තේ මොනවායින් ද? උණ ගස් වලින්? මැටයෙන්?

## පාසල් ගොඩනැගිලි ඇත.

- පාසල සුරක්ෂිත ද? බිම් බෝම්බ හා වෙනත් පුපුරණ ද්‍රව්‍ය වලින් නිදහස් ද?
- ගැටුම් නිසා පාසලට හානි සිදුවී ද? බෝම්බ වලින්? ගිනි ලෑමෙන්?
- මොන විදියේ පාසලක්ද?පෙර පාසලක්? ප්‍රාථමික පාසලක්? ද්විතීය පාසලක්? කවර පෙළක් දක්වා පාසලේ පන්ති තිබේ ද?
- පාසල තැනුවේ කවර අවුරුද්දේද?පාසලේ බිම් පිඹුරු තිබේද?පාසලට කවර විටෙක වත් හානි සිදුවිද?ගොඩනැගිලි තනා ඇත්තේ කවර ද්‍රව්‍යවලින් ද?
- බිත්තිවල තත්වය කුමක් ද? බිම තත්වය?
- පන්ති කාමර කොපමණ ඇත් ද?හැම පන්තියකටම කළුලෑලි තිබේ ද? හැම පන්ති කාමරයකම සෑහෙන ආලෝකය තිබේ ද? ළමයි සංඛ්‍යාවට සෑහෙන තරම් පන්ති කාමර තිබේ ද?
- පාසලේ මහල් කොපමණ තිබේ ද?

- මේ පාසලට ඒමට ළමයින්ට කොපමණ දුරක් පයින් යා යුතු වෙයි ද? පාසලට ඈතින් ඉන්නා ළමයින් පයින් යාමට ඇති දුර නිසා පාසල් ඒමෙන් වැළකී සිටී ද?
- පාසල් ගොඩනැගිලි පාවිච්චියට යෝග්‍යද? වහලේ තත්වය කෙසේ ද? තෙමෙන තැන් කවරක් හෝ ඇත්ද? ජනේල නිසි ලෙස තිබේ ද?
- ගුරුවරුන් සඳහා කාමරයක් ඇත් ද? ගුරුවරුන් සඳහා සෑහෙන පමණ ලී බඩු තිබේ ද? පාසල් ද්‍රව්‍ය සුරුක්ෂිතව තැබීමට තැනක් තිබේද?ළමයින් පුද්ගලිකව හමුවීම සඳහා පෞද්ගලික කාමරයක් තිබේ ද?
- පිටපත් කිරීමේ යන්ත්‍රයක් තිබේ ද?
- විදුලිය තිබේ ද? විදුලි ආලෝක උපකරණ හොඳ තත්වයෙන් ඇත් ද? විදුලි බුබුළු සෑහෙන පමණ ඇත් ද?
- ළමයි රාත්‍රියෙහි පාඩම් කිරීමට හෝ ඉගෙනීමට පාසල් එන්නේද? ලන්තෑරුම් තිබේ ද?
- ජලය තිබේ ද? ජලව බීමට සුදුසු ද? එය ඔබ දන්නේ කෙසේද?ළිඳක් තිබේ ද? එය අන්තිමට ඉස පිරිසුදු කළේ කවරදාද? නල ජලය තිබේ ද? පාසල තුළ ද? පිටතින් ද? ජලය සඳහා පාසල ගෙවීමක් කළ යුතු ද?
- මුළුතැන් ගෙයක් තිබේ ද?
- සනීපාරක්ෂක පහසුකම් තිබේ ද? පිටත වැසිකිළිද, නැත්නම් ගෙතුළ නාන කාමර ද? ගැහැනු ළමයින්ට හා පිරිමි ළමයින්ට ඒවා සෑහේ ද? ගුරුවරුනට වෙනම වැසිකිළි ඇත් ද?
- පාසල උණුසුම් කෙරෙන්නේ කෙලෙෂ ද? දර? ගල් අඟුරු? තෙල්? උදුන් නම් කොපමණ ඇත් ද? කොපමණ තව අවශ්‍ය ද? ඉන්ධන සඳහා ගෙවීම කරන්නේ කවුරුන් ද? ශීත කාලයට කොපමණ ඉන්ධන අවශ්‍ය වෙයි ද?
- පාසල වැටකින් ආරක්ෂිත ද? ආදාළ මාර්ග වල මාර්ග සංඥා ඇත් ද?
- ක්‍රීඩා පිටි ඇත්ද?පාපන්දු? පැසි පන්දු? වොලිබෝල්?
- ආබාධිතයන්ට පාසලට පිවිසීම පහසු ද? රෝද පුටු හා අත් කරු වලට සෑහෙන පමණ දොරවල් පළල්ද?සෝපාන තිබේනම් අත්වැට සහිත ද? රෝද පුටු හෝ අත්කරු භාවිත කරණ ළමයින් සඳහා වැසිකිළි දොර සෑහෙන තරමට පළල ද?
- ළමයින්ට ඇත්තේ බංකු ද? පුටු ද? නැත්නම් ඉඳ ගන්නේ බිමද?සාමාන්‍ය වශයෙන් පුරුදු කුමකට ද? ආසන ප්‍රමාණය සෑහේ ද? ළමයින්ගේ සිරුරු තරමට ආසන යෝග්‍ය ද?

## ප්‍රජා දායකත්වය

- මෙතෙක් කල් පාසලේ පැවැත්මට ප්‍රජාව කුමක් කර ඇත් ද?
- පාසල නැවත සාදා ගැනීමට/ නැවත සකස්කර ගගැනීමට ප්‍රජාවට අවශ්‍ය සම්පත් මොනවාද? ආයුධ මෙවලම්? සිමෙන්ති? ජේන්ටි?
- අළුත් වැඩියා/පිළිසකර කිරීම් ආදිය සඳහා තාක්ෂණික ශිල්පීන් ප්‍රදේශයේ ඇත් ද? ඔවුන්ගේ සේවය ලබා ගැනීමට හැකිවෙයි ද?
- පිළිසකර කිරීම්/සකස් කිරීම් ආදියට ප්‍රජාවට ශ්‍රමය ලබා දිය හැකි ද? ශ්‍රමය? බැලි හෝ දිය ගෙනැවිත් දීම?

# අවපතන ය කිරීම සඳහා මෙතැන ක්ලික් කරන්න.
# යෝජිත බෙදා හැරීමේ රටාව

## යෝජිත බෙදා හැරීමේ රටාව

| පෙර පාසල | | | |
|---|---|---|---|
| # | ද්‍රව්‍ය | ඒකක | ප්‍රමාණය |
| 1 | හුණු | කූරු | 10 |
| 2 | ගල් ලෑලි | | 1 |
| 3 | ස්පොන්ජර් | | 1 |

| පන්තිය 1 | | | |
|---|---|---|---|
| # | ද්‍රව්‍ය | ඒකක | ප්‍රමාණය |
| 1 | හුණු | කූරු | 5 |
| 2 | ගල් ලෑලි | | 1 |
| 3 | ස්පොන්ජර් | | 1 |
| 4 | අභ්‍යාස පොත් | | 2 |
| 5 | පැන්සල් | | 1 |
| 6 | පැන්සල් උල්කරණය | | 1 |
| 7 | මකන කෑලි | | 1 |

| පන්තිය 2-3 | | | |
|---|---|---|---|
| # | ද්‍රව්‍ය | ඒකක | ප්‍රමාණය |
| 1 | රූල්සහිත පිටු 100 අභ්‍යාස පොත් | | 3 |
| 2 | මකන | | 1 |
| 3 | පන්සල් උල්කරණය | | 1 |
| 4 | පැන්සල් | | 2 |
| 5 | කළු/නිල් පෑන් | | 2 |
| 6 | ප්ලාස්ටික් බෑග් | | 1 |
| 7 | අඩි රූල් | | 1 |

| පන්තිය 4-6 | | | |
|---|---|---|---|
| # | ද්‍රව්‍ය | ඒකක | ප්‍රමාණය |
| 1 | අභ්‍යාස පොත් කොටු රූල් | | 1 |
| 2 | රූල්සහිත පිටු 100 අභ්‍යාස පොත් | | 4 |
| 3 | මකන | | 1 |
| 4 | පැන්සල් උල්කරණ | | 1 |
| 5 | පැන්සල | | 2 |
| 6 | කළු - නිල් පෑන් | | 2 |
| 7 | ප්ලාස්ටික් බෑග් | | 1 |
| 8 | අඩිරූල් | | 1 |

| JSS 1 - SSS 3 | | | |
|---|---|---|---|
| # | ද්‍රව්‍ය | ඒකක | ප්‍රමාණය |
| 1 | අභ්‍යාස පෙත් රූල් සහිත පිටු 100 | | 4 |
| 2 | අභ්‍යාස පෙත් කොටු රූල් | | 1 |
| 3 | මකන | | 1 |
| 4 | පැන්සල් උල්කරණ | | 1 |
| 5 | පැන්සල් | | 2 |
| 6 | කළු - නිල් පෑන් | | 2 |
| 7 | ප්ලාස්ටික් බෑග් | | 1 |
| 8 | ජ්‍යාමිතිකක කට්ටලය | | 1 |
| 9 | අඩි රූල් | | 1 |

| ගුරුවරු | | |
|---|---|---|
| # | ද්‍රව්‍ය | ඒකක |
| 1 | සුදු හුනු කූරු 100 | පෙට්ටි |
| 2 | අභ්‍යාස පොත් රූල් සහිත පිටු 100 | |
| 3 | මකන | |
| 4 | පැන්සල් උල්කරණ | |
| 5 | පැන්සල් | |
| 6 | කළු/නිල් පෑන් | |
| 7 | රතු පෑන් | |
| 8 | ප්ලාස්ටික් බෑග් | |
| 9 | අඩි රූල් | |

| පාසල් | | |
|---|---|---|
| # | ද්‍රව්‍ය | ඒකක |
| 1 | පාට හුනු | පෙට්ටි |
| 2 | ඩුප්ලිකේටින් කඩදාසි | රීම් |
| 3 | අභ්‍යාස පොත් | |
| 4 | ස්ථිර මාකර් පෑන් | පැකට්ටු |
| 5 | පා පන්දු | |
| 6 | මැනිලා කවර | |
| 7 | කඩදාසි ගම් | |
| 8 | නිල්/කළු පෑන් | |
| 9 | රතු පෑන් | |
| 10 | වැන්ගාර්ඩ් | |
| 11 | තද ප්ලාස්ටික් | |
| 12 | පාසල් ඔරලෝසුව | |
| 13 | පාසල් සීනුව | |
| 14 | ස්ටේපර් | |
| 15 | ස්ටේපර් කටු | |
| 16 | වොලිබෝල් | |
| 17 | වොලි බෝල් දැල | |
| 18 | ලේජරය | |

*පාසල් නාමලේඛන අධ්‍යාපන අමාත්‍යංශය*

| ද්විතියක පාසල් සඳහා පමණි | | |
|---|---|---|
| # | ද්‍රව්‍ය | ඒකක |
| 1 | කොම්පස් | පෙට්ටි |
| 2 | පළල ලෑලි | |
| 3 | ප්‍රෝටේක් වගු කළු ලෑල්ල | |
| 4 | රූල් කළු ලෑල්ල | |

**යෝජිත බෙදාහැරීම් සෝදිසි සූත්‍ර.**

**හදිසි අවස්ථා අධ්‍යාපනය සඳහා අන්තර් ඒජන්සි ජාලය.**

*තක්සේරුව, අධීක්ෂණය සහ ඇගයීම, සෝදිසි ලැයිස්තුව*

**ගුරුවර/සුසාධ්‍යකාරක ඇති නැති බව, ලබා ගැනීමේ හැකියාව සහ තෝරාගැනීම තක්සේරුකිරීම**

හදිසි තත්ව යටතේ අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා, ප්‍රජාවගේ ප්‍රායෝගික හැකියාව පිළිබඳ නිශ්චිත අවබෝධයක් තිබීම අත්‍යවශ්‍යය.සාමාන්‍යයෙන් අර්බුදකාරී තත්ව පවත්නා ප්‍රදේශවල බොහෝ විට පුහුණු ගුරුවරු සංඛ්‍යාව සීමිතවන හෝ නොමැතිවන අතර ඉන්නා අය පවා පශ්චාත් ගැටුම් පරිසරයක ජීවත්වන ළමයින්ට ඉගැන්වීමට යෝග්‍ය දැනීම හෝ හැකියාවන් නැත්තන් වන අතර් අදාළ අවශ්‍යතාවන් පිරිමැසීමට අපොහොසත් වන්නන් විය හැක. ඒ නිසා තක්සේරුවකදී පළමුවෙන්ම යොමුවිය යුත්තේ ඉන්නා අධ්‍යාපන වේදීන් හඳුනා ගැනීමටත්, අවශ්‍ය උපකාරක ද්‍රව්‍ය හා පුහුණුවීම සඳහා කවර ආකාරයක සහාය ඔවුන්ට අවශ්‍යවේද යන්නත්, නිශ්චය කරගැනීමටත්ය.

දෙවනුව නුපුහුණු ගුරුවරුන්ගේ අවශ්‍යතාවන් හා පුළුවන් හැම විටක ඔවුන් පුහුණු ගුරුවරුන් හා සම්බන්ධකිරීම සඳහා තක්සේරුව යොමුවිය යුතුය.කණ්ඩායම් දෙකම සම්බන්ධයෙන්, හොඳ ඉගැන්වීම් භාවිත හා ළමයින් සඳහා මනෝ-සමාජමය සහාය, වැඩි වයස් ළමයින්ට හා අධික ශිෂ්‍ය සංඛ්‍යාවක් සහිත පන්තිවලට ඉගැන්වීමේ උපාය මාර්ග ආදී සුවිශේෂ අධ්‍යාපන ප්‍රශ්ණ ගැන දැනීම මෙන්ම බිම් බෝම්බ පිළිබඳ දැනුවත්කම, සනිපාරක්ෂක ප්‍රශ්ණ, සහ HIV/AIDS ආදී ජීවන කුසලතා පිළිබඳ ඔවුන්ගේ දැනීම ගැනද අවබෝධයක් ලබා ගැනීම අවශ්‍යය.

තවද ගුරුවරුන් වැඩකරන අධ්‍යාපන ක්‍රමයේ තත්වයද සැලකිල්ලට ගෙන ගුරුවරුන් දෙස බැලිය යුතුය, මතු දක්වන වැටිසන් තුන සැලකිල්ලට ගත යුතුය.

- **අධ්‍යාපන ක්‍රමයක් නොමැතිවීම** (උදාහරණ:අර්බුදයට පාත්‍ර ජනගහනයේ ස්වයංඋපකාරක මෙහෙයවීම්, අවතැන් කඳවුරු හෝ පශ්චාත් ඝට්ටන ආපසු යැවීම් තත්ව) පුහුණු ගුරුවරු හා සුසාධකයින් හඳුනා ගත යුතුය, සමහර තැනෙක පාසල්වලට හා අධ්‍යාපන කාර්ය වලට ඔවුන් සංවිධාන කර ගත යුතුය. හිඟපාඩු ඇත් නම් නුපුහුණු පුද්ගලයින් තෝරාගෙන පුහුණු කර ගත යුතුය.

- **තරමක අධ්‍යාපන හැකියාවන් ඇත:** (උදාහරණ: හදිසි අධ්‍යාපනය සඳහා සත්කාරක රජයට සීමිත හැකියාවන් ඇති තැන්,පශ්චාත් ඝට්ටන තත්වයන්හි අළුතෙන් ස්ථාපිත අමාත්‍යාංශවල සීමිත හැකියාවන් ඇති තැන්) හදිසි අධ්‍යාපන සංවිධාන, ගුරුවරුන් යොදවා ගැනීමට,අඩුපාඩු හඳුනා ගැනීමට,රජයට සහාය විය යුතු අතර ගුරු පුහුණුව සඳහාද රජයට සහාය දිය යුතුය.

* **මනාව සංවිධානය වූ අධ්‍යපන සැලසීම් හැකියාවන් ඇ.ත.:** (උදාහරණ: දිගු කලක් තිස්සේ පවත්නා අවතැන් වැඩසටහන්,මනාව ස්ථාපිත අධ්‍යාපන ක්‍රමයක් හා හදිසි අධ්‍යාපනය ගැන දැනීමක් ඇති සාමය පවත්නා රටකට අවතැන්වූවන්ගේ ගැල්ම) අර්බුද හා බැඳුනු ප්‍රශ්ණ සඳහා යොමුවීමට හෝ ඔවුන්ගේ පන්ති කාමර ඉගැන්වීම් සාර්ථක කර ගැනීම වැඩිදියුණු කරගැනීමට හෝ ගුරුවරුනට සුවිශේෂ කාලෝචිත පුහුණුවක් හදිසි අධ්‍යාපන සංවිධාන ලබාදෙයි.

## උපාය මාර්ග.

* **කල් ඇතිව පුහුණු කාර්ය මණ්ඩල හඳුනාගැනීම.**
  හැකි ඉක්මනින් පුහුණු හා සුදුසුකම් ලත් ගුරුවරු, පාසල් පරිපාලක, සහ අධ්‍යාපන වේදීන් හඳුනාගෙන අවශ්‍ය සංඛ්‍යාව හා සසඳා ගත යුතුයි. පෙර පැවති ක්‍රමය ක්‍රියාත්මක වු ආකාරය-, සංවිධාන ව්‍යුහය සහ සේවක අනුපිළිවෙල, ආවරණය වූ විෂය කරුණු හා පුහුණු කාලයද ඇතුළුව ඔවුන්ගේ පුහුණුව,සහතික මට්ටම්- (උදාහරණ වශයෙන් සමහර ප්‍රදේශවල ප්‍රාථමික සහ ද්විතිය ගුරුවරන්ගේ සහතික ඩිප්ලෝමා/උපාධි වශයෙන් වෙනස් විය හැක)ආදිය පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීම අවශ්‍ය වෙයි.

### හඳුනාගැනීමේ උපාය මාර්ග

* **කටින් කට:-** පාසල්වල වැඩ කළ අය පිළිබඳ තොරතුරු යමෙක් දන්නේදැයි විමසා බලන්න. නුපුහුණු අධ්‍යාපන ක්‍රියාකාරි සේවකයන් අඳුනා ගැනීමේදී ක්‍රිඩා පුහුණු කරුවන්,මව්වරුන් හා තරුණ නායකයින් සැලකිලට ගැනීම වැදගත්ය.

* **දැන්වීම්-** ෆෝටෝ කොපි කළ දැන්වීම් ආරක්ෂාවන පරිදි ප්ලාස්ටික් ඇවුරුම්හි බහා පොදු තැන්වල ප්‍රදර්ශණයට තැබිය හැකිය. පුවත්පත් හා රේඩියෝ ඇත්නම් ඒවායේ මාර්ගයෙන්ද දැන්වීම් පළ කළ හැක.

* **උපරිම හැකියා ශක්තිමත් කිරීම හා කැපවීම සඳහා පැහැදිලි කාර්ය භාර හා වගකීම් ස්ථාපිත කිරීම:** බොහෝ හදිසි අවස්ථාවලදී ගුරුවරුන් හා පරිපාලකයින් ඔවුන් විසින්ම වැඩ පවරා ගත් හෝ ප්‍රජාව විසින් වැඩ පවරනු ලැබුවන් හෝ විය හැක. ආරම්භයේදී මෙය ප්‍රායෝගික වුවද දිගු කාලීනව සලකන විට කවරෙක් කුමක් සඳහා වගකියන්නේද යන්න පැහැදිලි කර ගැනීම සඳහා කිසියම් සංවිධාන ගත ව්‍යුහයක්ද වාර්තා කිරීම සඳහා ව්‍යුහයක්ද වර්ධනය කර ගැනීම අවශ්‍යවෙයි. පුහුණු ගුරුවරුන් නොමැති විටෙක ළමයින් සමග වැඩ කිරීමේ අදාළ අත්දැකීම් ඇති නුපුහුණුවන් හඳුනා ගෙන පුහුණුකර ගත යුතුයි.

* **ගුරුවරුන්ගේ හා සුසාධකයින්ගේ මනෝ සමාජමය හා භෞතික අවශ්‍යතා තක්සේරු කර ගන්න.**
  ළමයින් සඳහා අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ ඇති වැටහීම නිසා ගුරුවරු හා සුසාධකයින් තමන්ගේ මනෝ සමාජමය හා භෞතික අවශ්‍යතා නොතකා හැරීමට පෙළඹීම පාසල්

නොපැමිණීමට, සවිය ක්ෂය වීමට හෝ සේවයෙන් ඉවත්වීමට මෙහෙයවීමෙකට තුඩු දිය හැක. මෙය වළක්වා ගැනීම සඳහා ගුරුවරුන්ට හා සුසාධකයිනට තමන්ගේ රාජකාරි කටයුතු සඳහා නිසි ශක්තිය හා කාලය ලබා ගැනීමට උපකාරීවෙන ක්‍රමෝපායයන් හඳුනාගත යුතුය. සමහරුන් සඳහා නිවහන් ද්‍රව්‍ය ආහාර සහ ජලය ආදී මූලික සම්පත් සපුරාලීමට විශේෂ විධිවිධාන සකසා ගැනීම අවශ්‍ය වනු ඇත. තවද ගුරුවරුන්ට හා සුසාධකයිනට ඔවුන්ගේ අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා කාලයක් වෙන් කළ දිය යුතුය. සාකච්ජා සඳහා වු මේ කාලය තක්සේරු ක්‍රියාවලිය ,පුහුණුවීම් හා වැඩසටහන් සමග ඒකාබද්ධ කළ යුතුය.

**අවශ්‍ය ගුරු සංඛ්‍යාව ගණන් බැලීම:** අවශ්‍ය ගුරුවර සංඛ්‍යාව ගණන් ගැනෙන්නේ මූලික වශයෙන් ශිෂ්‍ය සංඛ්‍යාව පාදක කරගන වෙයි. හදිසි අවස්ථාවකදී විශේෂයෙන්ම ළමයින් සම්බන්ධ අධ්‍යාපන සංඛ්‍යලේඛණ ලබාගැනීම දුෂ්කර වනු හෝ මුළුමනින්ම නොහැකි විය හැකිය. ඒ නිසා රැස්කරගත හැකි විවිධ තොරතුරු ආදිය බුද්ධි ගෝචර අනුමාන මගින් තුලනය කර කොපමණ ළමයින් සංඛ්‍යාවක් සිටිත්දැයි තිරණය කළ යුතුවෙයි. යොදාගත හැකි ක්‍රමෝපාය අතර (1) පවත්නා සංගණන ලේඛණ සොයා බලා ලබා ගැනීම, අවතැන් ප්‍රදේශවල ඔහ්‍යසසෘ මගින් කරන ලද ගණන් ගැනීම් හෝ ලෝක ආහාර වැඩසටහන (WFP) යටතේ ආහාර බෙදා හැරීමේ වාර්තා (2) ප්‍රජාවේ නිවාස සාම්පල සමීක්ෂණයක් (3) යොමු ප්‍රජා කණ්ඩායම් උපයෝගි කර ගෙන පහත දැක්වෙන පරිදි බෝන්චි තේරීමේ ක්‍රමවැන්නකින් සහභාගිත්ව සමීක්ෂණ ආදියද වෙයි. සාමාන්‍ය සංඛ්‍යවක් වශයෙන් පාසල් යා යුතු වයසේ ළමයින් සංඛ්‍යාව ජනගහනයෙන් සියයට 20 - 25 අතර ප්‍රමාණයක් සේ ගත හැකිය.

**සහභාගිත්ව තක්සේරු ක්‍රමෝපා උදාහරණයක්:** කුඩා යොමු කණ්ඩායමකට බෝන්චි කරල් 100ක් ළමයින් 100ක් සේ සලකන සේ තේරුම් කර දෙන්න. ඒ බෝන්චි 100ය පාසල් යන හා නොයන වශයෙන් අනුපාතික ගොඩවල් වලට වෙන් කරන්නැයි කණ්ඩායමට කියන්න. ඊට පසු ඒ ඒ ගොඩ ගැහැණු පිරිමි, වයස් කාණ්ඩ, වත් පොහොසත්කම්, සුලුතර බහුතර වර්ග හෝ සරණාගත/ ස්ථානිය/ අභ්‍යනතර අවතැනුන (aIDP) ආදි වශයෙන් වෙන් වෙන් ගොඩවලට තොරන්න කියන්න. බෝන්චි 100 යොදා ගත්තේ පර්යේෂකයින්ට හා කණ්ඩායම් සාමාජිකයින්ට සියයට ප්‍රමාණ අනුව සිතිමට සැලැස්වීම සඳහායි. එසේ වුවද මෙවැනි ගණනයන් සංඛ්‍යාලේඛනාත්මකව නිරවුල්ම නොවේ.

ගුරුවරුන්/ සුසාධකයින් ගණනය කරන්නේ ළමයින්ගේ මුළු සංඛ්‍යාව, පන්තියක සම්මත කරගත් පන්ති ශිෂ්‍ය ගණනින් (උදාහරණ වශයෙන් 40 ක් ) බෙදා ගැනීමෙනි. ඒ හැරුන විට ගුරුවරුන් දවසකට/ සතියකට කොපමණ පැය ගණනක් උගන්වන්නේද, උගන්වන් ශ්‍රේණි මට්ටම්, සුදානම් කර ගත යුතු පන්ති කාමර සංඛ්‍යාව ආදි වශයෙන් සැලකිල්ලට ගත යුතු වෙනත් බොහෝ කරුණු ඇත.

| ද්‍රව්‍ය හා භාණ්ඩ | උදාහරණ | ගණන ක්‍රමයී |
|---|---|---|
| ගුරු උපකරණ | ඇක්සයිස් පොත්,පෑන්, පෑනසල්,නාම ලේඛන | පන්ති කාමර ගණනට |
| ගුරු දිරි දීමනා | මුදල්- ද්‍රව්‍යවලින් උදා: ආහාර | ගුරු සංඛ්‍යාව,දීමනා |
| පන්ති කාමර ද්‍රව්‍ය | රටහුණු, කළුලෑලි | පන්ති සංඛ්‍යාවට සමානව ගුරුවරයෙකුට මේසයක් හා පුටුවක් |
| පාසල් ලිබඩු | ළමා ඩෙස් සහ ගුරු තනි ඩෙස් නම් ලි බඩු | ළමයෙකුට එකබැගින් නැත්නම් ආසනයක ඉඳ ගන්නා සංඛ්‍යාව ළමයින් සංඛ්‍යාවෙන් බෙදා |

**ආරක්ෂාව : සටහනක්: ප්‍රජාවක උගත් නායකයින් වශයෙන් ගුරුවරු /සුසාධකයින් අර්බුදකාරී තත්ව යටතේ බොහෝ විට ඉලක්ක කරගැනෙයි.ඒ නිසා ඔවුන්ගේ ආරක්ෂා අවශ්‍යතා සැලකිල්ලට ගත යුතුවෙයි.ගුරුවරුන් සම්බන්ධ තොරතුරු ලිංගික වශයෙන්, මෙන්ම අදාළ තැන්හි වර්ගය,ප්‍රජාවගේ පැත්තෙන් ඔවුන්ගේ දේශපාලනමය බැඳීම, ආදී වශයෙන් විශ්ලේෂණය කර ගැනීම වැදගති**

## සෝදිසි ලැයිස්තුව

### ඇතියාව

- පාසල්වල දැන් ඉගැන්වීම කරන්නේ කවුරුන්ද? ඔවුන්ට ගෙවීම් කරන්නේ කවුරුන්ද? ඔවුන් ස්වේච්ඡාසේවකයින්ද?
- දැනට ඉගැන්වීමේ යෙදී නැති පලපුරුදු ගුරුවරු ප්‍රජාව අතරේ සිටිත්ද? එසේනම් ඔවුන් ඉගැන්වීමේ යෙදෙන්නේ නැත්තේ මන්ද?
- ප්‍රජාවට අයත් අයගේ අධ්‍යාපන මට්ටම කුමක්ද? ප්‍රාථමික? ද්විතිය? ඩිප්ලොමා ධාරීන්? උපාධිධරයින්?
- පාසල් නොයන ළමයින්ට/තුරුණුවන්ට/ වැඩිහිටියනට අධ්‍යාපන හා විනෝදාත්මක වැඩසටහන් පවත්වා ගන යන්නේ කවුරුන්ද? ඔවුන්ගේ පසුබිම හා පුහුණුව කවර ආකාරද?
- ප්‍රජාව අතරේ උගත්( (ප්‍රාථමික, ද්විතිය,සරසවි) අය ලබාගැනීමට ඇතිද?
- ගුරුවරු/සුසාධකයින් රාජකාරිය සඳහා නොපැමිණ සිටිද? ඇයි? ඔවුන් තමන්ටත් තමුන්ගේ පවුලේ අයටත් අතිරේක ආදායම් හෝ ද්‍රව්‍යමය දීමනා සොයමින් සිටිනවාද? ඔවුන්ගේ මේ කටයුතු වලදී යම් ආකාරයකින් උපකාර වශයෙන් යමක් කිරීමට හැකිවෙයිද? සරණාගත කඳවුරක නම් බෙදා හැරීමේ කාරිය සඳහා වේලාවල් ගුරුවරුන් සැලකිල්ලට ගෙන වෙනස් කළ හැකිද

## ගුරුවර හැකියා පොදු ඉගැන්වීම් කුසලතා.

- ගුරුවරුන් කුමණ විෂයයන් ඉගැන්වීම සඳහා වගකියන්නේද? ඔවුන්ට කවර මට්ටමේ අධ්‍යාපන සුදුසු කමක් (අවම සුදුසු කමක්) ලබා තිබිය යුතුද? ඉගැන්වීම සඳහා අවම සුදුදුකම් ඔවුන්ට ඇත්ද? ඔවුන්ගේ අධ්‍යාපන පසුබිම කුමක්ද?
- ඔවුන්ට අවුරුදු කීයක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇත්ද? ගුරුවරුනට තිබිය යුතුයැයි අපේක්ෂිත අවම අධ්‍යාපන හා පුහුණු මට්ටම් කුමක්ද? ගුරුවරුන් කී දෙනෙක් මේ තත්ව ලබා ඇත්ද?
- ගුරුවරුන්ගෙන් කොපමණ සවිස්තර පාඩම් සැලසුම් කිරීමක් හා සූදානම් වීමක් අපේක්ෂා කෙරෙන්නේද? විෂයමාලාවෙන් කවර ප්‍රමාණයක පාලනයක් ගුරුවරයෙකු සතුද?කොපමණ ප්‍රමාණයක් ඔවුන්ට පවරා ඇත්ද? ගුරුවරයෙකුගේ භාවිතය සඳහා කිසියම් සුවිශේෂ ආකෘතියක් හෝ සැකැස්මක් යෝජිතද?
- පහත දැක්වෙන ක්ෂේත්‍රවල ගුරුවරුන් ගේ හැකියාවන් හා දුබලකම් කවරේද? ලිවීම, ඉගෙනුම් අරමුණු,ඉගැන්වීමේ උපකරණ සකස්කර ගැනීම,පාඩම් මෙහෙයවීමේ වේගය, සංකල්ප හා ශිල්පක්‍රම පෙළගැස්ම?
- ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ශිල්පක්‍රම අවබෝධය හා භාවිතය කවර තරම් පරාසයක වෙයිද? දේශනා,ප්‍රශ්නෝත්තර,පාඩම් දීම්(සජ්ඣායනා සහ පුහුණු ඇබෑසි,කුඩා කණ්ඩායම් වැඩ,ක්ෂණ සාකච්ඡා,වෙස් දැරීම, නාට්‍ය සහ සංගීත, ක්ෂේත්‍ර චාරිකා,පුද්ගල ඉගෙනීම්, ශිෂ්‍ය ව්‍යාපෘති.)
- පිළිගත් විනය රීති කවරේද? පරිපාලන ප්‍රවේශ මොනවාද? ගුරුවරුන්ගේ පන්ති කාමර ශෛලීන් මොනවාද?
- ශිෂ්‍ය ඉගෙනුම් ඇගැයෙන්නේ කවර ආකාරයටද?

## මනෝසමාජමය හා ජීවන කුසලතා

- අර්බුදයට පාත්‍රවූ ශිෂ්‍යයන්ගේ මනෝසමාජමය අවශ්‍යතා පිළිබඳ කවරම හෝ පුහුණුවක් ගුරුවරුන් ලබා ඇත්ද? එසේ නම් කා වෙතින්ද? කවරදාද? කොපමණ දිගු කලකටද? පසුවිපරමක් විද?
- HIV/AIDSදැනුමලත් ද්‍රව්‍ය අපචාරය, මත්පැන්, බිම් බෝම්බ, සම්බන්ධ ප්‍රශ්ණ, නායකත්වය, භාවනාව ආදී ජීවන කුසලතා සම්බන්ධ කරුණු පිළිබඳව පුහුණුවක් ලත් ගුරුවරුන් ඇත්ද? එසේ නම් පුහුණු කරණු ලැබුයේ කවුරුන් විසින්ද? කවරදාද? කොපමණ දිගු කාලයකටද? පසුවිපරමක් විද?

## පුහුණු හැකියා හා සහාය.

- පුහුණු ගුරුවරයෙකු වීම සඳහා අන්ගමනය කළ යුතු විෂය මාලාව කුමක්ද? කවර තරම් කාලයක් ඒ ඒ විෂයයට ගතවේද? පුහුණු කාලය කොතරම්ද? ඒ ඒ ශ්‍රේණි සඳහා වෙන වෙන සහතික මට්ටම් තිබේද? සහතික සඳහා පාඨ මාලා හා උපාධි සඳහා පාඨමාලා තිබේද? කවර

ශ්‍රේණිවල ඔවුන්ට ඉගැන්විය හැකිද? එක එක පාඩමාලාවකට ගතවෙන කාලය කොපමණද? ඇතුළත්වීමේ සුදුසුකම් මොනවාද?

- ප්‍රදේශයේ ගුරු පුහුණුකරුවන් ඇත්ද? ඔවුන්ගේ පසුබිම කුමක්ද? ඔවුන් කොපමණ කලක් ගුරුවරුන් පුහුණු කිරීමේ නිරතව සිටියේද?
- ප්‍රදේශයේ පුහුණු පහසුකම් තිබේද?
- ගුරුපුහුණුව මෙහෙයවූයේ කවුරුන්ද? රජය? NGO විසින්? ගුරු වෘත්තිය සමිති?
- සේවාස්ථ පුහුණු කාල අන්තරය කොපමණද? කුමණ විෂය මාතෘකා ආවරණය කෙරිනිද?

### ගුරුසහාය සේවා

- ගුරු ඉගැන්වීම් නිරීක්ෂණය කෙරිනිද? අධීක්ෂණය කලේ කවුරුන්ද? ප්‍රමිතකරන ලද ඇගැයුම් ආකෘති පත්‍රයක් තිබේද? පසුපෙවුම් දෙන ලද්දේ කවර ලෙසින්ද?.

- ගුරුවරුන්ට විෂය මාලා පිටපත් ලබා ගැනීමට හැකිද? පාඩම්වලට සූදානම් වීම සඳහා ගුරුවරුනට පෙළ පොත් හෝ ආශ්‍රේය පත පොත ආදිය ලබා ගත හැකිද? පාඩම් පිළියෙළ කර තැනීම සඳහා ඇත්සයිස් පොත් ගුරුවරුනට ලබා ගත හැකිද?

- ශිෂ්‍යයින් ඇගැයීමට / පිරික්සීමට අවශ්‍ය දේ තිබේද? පිටපත් කිරීමේ කවරම හෝ උපකරණ පාසලේ තිබේද?

- කළුලැල්ලක් තිබේද? ඇය සෑහෙන තරම් විශාලද? හොඳ තත්වයෙන් තිබේද?
- පාසල රටහුණු සපයනවාද නැත්නම් ගුරුවරුන් විසින් මිළ දීගත යුතුද? පන්ති වාර්තා පොත් හා නාම ලේඛණ?

- කවරම හෝ ඉගැන්වීමේ උපකරණ පාසලේ තිබේද?සිතියම්? බිත්ති චාට්?

## යුනෙස්කෝ හදිසි අවස්ථා ගුරු පැකේජය.

TEPය හඳුන්වා ඇත්තේ ඒක්ෂණ ප්‍රතිචාර ස්වයංපරියාප්ත පන්තිකාමරය යනුවෙනි.

ප්‍රායෝගික මට්ටමකින් පංතියක ශිෂ්‍යයන්ට හා ගුරුවරයෙකුට තනි වරුවකට (ගොඩනැගිලි නැති තැනකදී වුවත්) අවශ්‍ය සියළුම ද්‍රව්‍ය එහි අන්තර්ගතයි.

### කට්ටලයට ඇතුළත් දේ.

- ගල්ලෑලි 40ක් , රටහුණු පෙට්ටි 7 ක්.

- ඉරේසර සහිත පැන්සල් 40ක්, සහ ඇක්සයිස් පොත් 80ක්.

- හිස් ස්ක්‍රැබල් සෙට් 10ක් ළමයින් 4 දෙනෙකුට එක බැගින් භාෂා හා සංඛ්‍යා ක්‍රීඩා සඳහා.

- රෙදි හෝඩිය චාට් එකක්, සංඛ්‍යා චාට් එකක් සහ ගණිත චක්‍ර චාට් එකක්.

- පෙළගැස්වූ දෛනික පාඩම් සටහන් හා ගුරු උපදෙස් මාලාවක්, භාෂාව සහ ගණිතය සඳහා.

- පාඩම් සටහන් හා එකට යන ක්‍රියාකාරකම් පොතක්.

- ගුරුවරයා විසින් ළමයින්ට කියවීම සඳහා කතාන්දර පොත් කට්ටලයක්.

- ස්ක්‍රැබල් සෙට් ලකුණු කිරීම සඳහා මාරකර් (Marker) පෑන්

- සුදු හා පාට රටහුණු, ඩස්ටරයක්ද ඇතුළුව.

- හුණුලෑලි (chalkboard) පේන්ට් ටින් එකක් , පින්සලක් හා ටේප් පටියක් හුණුලෑල්ලක් සකස්කර ගැනීමට.

- වාර්තා පොතක්, නාම ලේඛණයක්,පෑන් අමතර පැන්සල් , ඉරේසර හා කටරයක්

ගුරුවරු, නුපුහුණු හෝ අර්ධ පුහුණු වුවත් වුවත් ආරම්භක සාක්ෂර හා සංඛ්‍යා ඉගැන්වීම්වලට හැකියාව සැලසෙන පරිදි පෙළ ගැස්වූ පාඩම් සටහන්, උපකාරක මට්ටමකින් ගුරු උපදෙස් පොතින් ලබාදෙයි. ඒ අතරම කට්ටලය භාවිතය සඳහා අවශ්‍ය පුහුණු වැඩ සටහන්ද ගුරුවරු අනුගමනය කරති.

එවැන්නක් නොවන්නට කිසි ලෙසකින් වත් ළමයින්ට ලැබිය නොහැකි ස්ථායි පරිසරයක් මනෝවිද්‍යාත්මක / චිත්තවේගී මට්ටමකින් එය ලබා දෙයි

# හදිසි අවස්ථා අධ්‍යාපන කට්ටල - යුනිසෙෆ් 2000

හදිසි අවස්ථා අධ්‍යාපන කට්ටල - යුනිසෙෆ් 2000

## 1 අධ්‍යාපන කට්ටලය

| | |
|---|---|
| ගුරු උපකරණ | |
| | |
| විස්තර | |
| අත් බෑග | 1 |
| බෝල් පොයින්ට් පෑන් කළු | 2 |
| බෝල් පොයින්ට් පෑන් රතු | 2 |
| බෝල් පොයින්ට් පෑන් නිල් | 2 |
| ත්‍රිකෝණ චෝක් බෝර්ඩ් 30/60/90 | 1 |
| ත්‍රිකෝණ චෝක් බෝර්ඩ් 45/90 | 1 |
| රටහුණු පාට | 3 |
| රටහුණු සුදු | 3 |
| ඇක්සයිස් පොත් | 2 |
| ලි ඔරලෝසුව | 1 |
| ෆෙල්ට් පෑන් | 2 |
| කතුරු | 1 |
| ටෙප් පටිය | 1 |
| පේන්ට් කළු චෝක් බෝර්ඩ් | 2 |
| පේන්ට් බුරුසු චෝක් බෝර්ඩ් | 1 |
| ලෝහ/ප්ලාස්ටික් පෙට්ටි - ද්‍රව්‍ය බහාලීමට | 1 |
| පෝස්ටර් ලැමිනේට් කළ හෝඩිය සංඛ්‍යා ගණිත චක්‍ර | 1 |
| කොම්පසය | 1 |
| කෝදුව අඟල් සෙන්ටිමිටර | 1 |
| ප්ලාස්ටික් ආවරණය කළ ලි කැට | 1 |
| ලකුණු ලේඛණය | 2 |
| ඩස්ටරය | 1 |
| | |
| | |
| ශිෂ්‍ය උපකරණ | |
| | |
| විස්තරය | |
| ක්‍රේයෝන් පෙට්ටි/8 | 40 |
| ඉරේසර් | 100 |
| ඇක්සයිස් පොත් කොටු රූල් | 100 |
| ඇක්සයිස් පොත් රූල් | 100 |
| පැන්සල් කටරය | 100 |
| පැන්සල් ගල්ලෑලි වලට | 144 |
| පැන්සල් | 144 |
| බෑගය | 80 |
| රූලරය ප්ලස්ටික් | 10 |
| ළමා කතුරු | 40 |
| ගල්ලෑල්ල ශිෂ්‍ය | 50 |
| | |
| | |

## 2 විනෝද ක්‍රීඩා කට්ටලය

| | |
|---|---|
| ගුරු ද්‍රව්‍ය | |
| | |
| විස්තරය | |
| නෝට් පොත් | 3 |
| පෑන් බෝල් පොයින්ට් | 12 |
| හුණු පවුඩර් කළ | 1 |
| අත් පන්දු ලොකු | 2 |
| අත් පන්දු කනිෂ්ඨ | 3 |
| විසිල් | 2 |
| හුලං ගැසීමේ උපකරණ | 2 |
| ටෙප් පටිය මීටර 5 | 1 |
| ගල්ලැල්ල | 2 |
| රට හුණු | 3 |
| අත් බෑගය ලොකු කළ හැකි | 1 |
| ටී ෂර්ට් | 1 |
| කැප් | 1 |
| | |
| | |
| ළමා උපකරණ | |
| | |
| විස්තර | |
| සංගීත උපකරණ (ප්‍රදේශය භාවිත කරණ) | |
| පාට (හඳුනා ගැනීමේ) උඩු කය කබාය | 20 |
| ස්කිට්ල් | 20 |
| වොලිබෝල | 2 |
| වොලිබෝල දැල් | 1 |
| වොලිබෝල කණු | |
| පා පන්දු | 2 |
| කුඩා බෝල | 5 |
| පිකට් කරු කොඩි සමග | 6 |
| පැඩ්ලොක් සහිත ලෝහ පෙට්ටියක් | 1 |
| | |
| | |

# ප්‍රාථමික අධ්‍යාපන උපකරණ සැපයුම

උදාහරණ

සැපයුම් සමස්තය

| ද්‍රව්‍ය | ඒකක |
|---|---|
| ඩෙස්ක් 120 සෙන්ටිමීටර | 2000 |
| ස්ටූල් / පුටු | 4000 |
| කළුලෑලි | 230 |
| කළුලෑලි ස්ටැන්ඩ් | 230 |
| කැබිනට් | 230 |
| ගුරුමේස | 230 |
| ගුරුපුටු | 230 |
| ගුරු උපකරණ | 330 |
| ළමා උපකරණ | 6000 |


ගුරු කට්ටලය

| ද්‍රව්‍ය | ඒකක |
|---|---|
| චෝක්බෝඩ් මකනය | 2 |
| රටහුණු සුදු | 10 |
| පෑන් කළු | 6 |
| පෑන් නිල් | 6 |
| පෑන් රතු | 6 |
| පැන්සල | 10 |
| පැන්සල ශාපන | 2 |
| කළුලෑලි රූලරය | 1 |
| කතුරු | 3 |
| සිතියම් ලෝක/රට | 3 |
| සටහන් පොත් | 10 |

ළමා කට්ටලය

| ද්‍රව්‍ය | ඒකක |
|---|---|
| පෑන් කළු | 5 |
| පැන්සල උල්කරණය | 5 |
| පැන්සල ශාපනර | 2 |
| පැන්සල මකනය | 2 |
| කෝදුව | 1 |
| පාට පැන්සල් | 5 |
| පොත් බෑග | 1 |
| සටහන් පොත් | 18 |
| | |

# 12 ස්වාධීනව නැගී සිටීම සඳහා ජීවන ක්‍රමෝපායන් වර්ධනය කර ගැනීම.



අම්මා කෙනෙක් ඇගේ දරුවන් සමග සියරා ලියොන්හි ජෙම්බේ කඳවුරේ ඔවුන්ගේ වෙළඳසැළෙහි. දිවිපෙවෙත් සඳහා ක්‍රමෝපායයන් වැඩිදියුණෙහි වෙළඳපොළ සහ වෙළඳාම් පහසුව සැලසීම වැදගත් කාරියෙකි. ඡායාරූපය එඩුවාර්ඩ් කොම්තෙ වර්දගුවර්

# පරිච්ඡේදය 12 : ස්වාධීනව නැගී සිටීම සඳහා ජීවන ක්‍රමෝපායන් වර්ධනය කර ගැනීම.

## හැඳින්වීම.

අවතැන් වුවන්ගේ ජිවිත අතිශය අවදානම් සහිත වෙයි.කඳවුරුවල සලාක හා වෙනත් ආහාර නොවන ද්‍රව්‍ය (NFIs) ආදී මූලික අවශ්‍යතා සැපයුනද ඒවා ප්‍රමාණවත් නොවිය හැකිය. සොරකමට ලක්විය හැකියි. එසේත් නැත්නම් ස්වාභිය රසගුණ හා අකැප විය හැකියි. අවතැන්වූවෝ වෙනත් හැම අයවලුන් මෙන්ම අති පුළුල් පරාසයක පැතිරි ක්‍රියාකාරකම් ඔස්සේ තමන්ගේ දිවි පෙවෙත රැකගැණිමට, වැඩි දියුණු කර ගැනිමට උත්සාහ දරත්. බොහෝ කඳවුරු තත්ව යටතේ සරණාගතයින් හා අභ්‍යන්තර අවතැන්වූවෝ (IDPs) තමන්ගේ ආහාර හා අහර නොවන අනෙත් දේවල් උපයා ගැනිම සඳහා ගවේශනයක නිරතව බොහෝ විට බැහැරින් සහායක් නොමැතිව නොයෙක් මාර්ග සොයා ගනිත්. ජනකායගේ සමස්ත ජිවන තත්ව වැඩිදියුණු කිරිම හා ස්වයං පෝෂණය නගා සිටුවිම සඳහා කඳවුරු කළමණාකරුවනට දායකවිමට පිළිවන්කම් එමට ඇත.ස්වානිය ජනගහනයේ හා සරණාගතයින්ගේ සමාජ ආර්ථික තත්ව විශ්ලේෂණයන් පාදක කර ගෙන කුසලතා පුහුණුව හා ආදායම් උපදවන ව්‍යාපෘති සැපයිමට හැකි අදාළ ඒජන්සීන් හඳුනා ගෙන ඔවුන්ට ඒ සඳහා ආරාධනය කිරීමෙන් කඳවුරු කළමණාකරුවනට දායකත්වයක් සැපයිය හැක. මෙවැනි ක්‍රියාකාරකම් නැති විටක දීත් ධනාත්මක ජීවන ක්‍රමෝපායයන් වඩා පහසුවෙන් සුසාධනය සඳහා වූ කඳවුරු පරිසරයක් ඇතිකිරීම කළමණාකරු විසින් සහතික කළ යුතුය.

ධනාත්මක ජිවන ක්‍රමෝපායනයන් අතරෙහි (ගෙවතු) වගාවන්, සුළු පරිමාණ සත්ව පාලනය, වෙළහෙළඳාම, කුඩා පරිමාන ව්‍යාපාරඝ අත්කම් භාණ්ඩ නිෂ්පාදනය සහ කුලිවැඩ ආදිය ඇතුලත් කළ හැක. රිණාත්මක ජිවන ක්‍රමෝපායන් අතරෙහි ලා ගණිකා වෘත්තිය, සොරකම, හෝ දූෂණයෙන් හා කපටිකමෙන් දේවල් ලබා ගැනීම් සැලකිය හැකිය.වෙනත් රිණාත්මක ක්‍රමෝපායන් අතරෙහි ලා දිවිපෙවෙත පවත්වා ගැනිම සඳහා ආහාර, සුව සේවා ආදී මූලික අවශ්‍යතා පිරිමසා ගැනිමට තමන් සතු ආදායම් උපදවන වත්කම් විකිණිමට බලකෙරෙන ක්‍රියා මාර්ගවලට පෙළඹිම් ගිණිය හැක. පුද්ගලයින් තෝරා ගන්නා ක්‍රමෝපායයන් ප්‍රජාවේ සංස්කෘතිය, හැකියාවන්, සම්පත්, සමාජ යාන්ත්‍රණ ආදියත්, කඳවුරු ප්‍රතිපත්ති හා ලැබිමට සලස්වන හා මෙහෙයවන අවස්ථා මත රඳා පවති..

ස්ව ශක්තියෙන් නැගී සිටීම සඳහා ජිවන ක්‍රමෝපායයන් ප්‍රවර්ධනය සඳහා සුවිශේෂ දක්ෂතාවන් කාණ්ඩයක් අවශ්‍යවනු ඇත. එවැනි මැදහත්විම් සඳහා නිරත විමට යොග්‍ය කුසලතාවන් ඇති කාර්ය මණ්ඩලයක් අදාළ ඒජන්සියෙහි වෙතැයි තහවුරු කිරීම සඳහා කඳවුරු කළමනාකරුවන්ට දායක විය හැකිය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්

### වෙළඳ පොළ පහසු කිරීම.

විශේෂඥතාව ඇති ඒජන්සියක දායකත්වයක් නැතිව වුවද, කඳවුරුවල දිවිපෙවෙත වැඩි දියුණු සඳහා වූ ක්‍රමෝපායයන්ට හැමවිටම මුලපිරිය යුත්තේ අවශ්‍යතා, සම්පත්, හැකියාවන්, සමාජ ආර්ථික හා දේශපාලන/නීතිමය පසුබිම ආදියේ පරිපූර්ණ තක්සේරුවකින් පසුවය. ජනගහනයේ ආදි හා වර්තමාන ජීවන ක්‍රමෝපායයන්, මිනිසුන් කොතැනක කවරලෙසකින් ඉතිරි කිරීම් කරන්නේද, සමහර භාණ්ඩ හා සේවාවන් සඳහා ස්ථානීය ඉල්ලුම, සහ කඳවුරු ජනගහනය හා සත්කාරක ප්‍රජාව අතර පවත්නා ආර්ථික සම්බන්ධයන් ආදිය කඳවුරු කළමනාකරු විසින් දැන සිටිය යුතුය

විවිධාකාර හේතූන් නිසා බොහෝවිට ඈත ප්‍රදේශවල කඳවුරු පිහිටුවනු ලැබෙයි. එනිසා කඳවුරු ජනගහනයට, ස්ථානීය වෙළඳපොළට පිවිසීම වඩා දුෂ්කර වෙයි., පොලිසියෙන් , නීතිමය තත්වයක් නොමැති කමින් හෝ රජයේ ප්‍රාදේශිය පරිපාලන ප්‍රතිපත්ති මගින් සමහර විට ජංගමය හා පිවිසීම තවත් සීමා කෙරෙයි. බැහැර වෙළඳපොළට දායක වීම සීමාකෙරෙන විට අවතැන්වූවන්ට කඳවුර තුළ ලාභදායී ලෙස ව්‍යාපාර කළමණාකරණය කරගත යාම දුෂ්කර වෙයි. සැලකිල්ලට ගත යුතු තවත් කරුණු නම් ස්ථානීය ජනගහණයේ දරිද්‍රතා මට්ටම සහ සරණාගත/අභ්‍යන්තර අවතැන් (IDP) ප්‍රදේශයේ ආර්ථික සංවර්ධන මට්ටමයි.

---

### ▷▷▷ කඳවුරු කළමණාකරන කණ්ඩායමේ මුඛ්‍ය වගකීම්.

---

- ***ප්‍රජා අවස්ථා ,හැකියාවන් සහ සම්පත් හඳුනා ගැනීම:*** කළමණාකරණ කණ්ඩායම ප්‍රජාවේ අවශ්‍යතා කවරේද,ඒවා දරාසිටීම සඳහා අනුගමනය කරණ ධනාත්මක ක්‍රමෝපායයන් කවරේද,ප්‍රජාව තුළ හා අවටින් මේ අවශ්‍යතා පිරිමසා ගැනීමට ඇති කුසලතා හා සම්පත් කවරේද යන්න, විවිධ දායක කාරකාදීන් හා අවතැන්වූ ප්‍රජාව හා සමග සම්බන්ධීකරණයකින් හඳුනා ගත යුතුය.

- ***පොදු වෙළඳපොළක් වෙන් කරදීම:*** විකිණුම්කරුවන්ට හා ගැණුම්කරුවන්ට මුණ ගැහිය හැකි පොදු වෙළඳ පොළක් කඳවුර තුළ වෙන් කර දිය යුතුය. මේ ස්ථානය දිව රෑ ආරක්ෂාව හා පිවිසීමේ පහසුව, විශේෂයන්ම දරුවන්ට හා කාන්තාවන්ට තිබීම සහතික කිරීම අත්‍යවශ්‍යය.. වෙළඳපොළ හා පිවිසුම් මාර්ග රාත්‍රියේ මනාව ආලෝකවත් විය යුතුය. හැකි නම් සමාජ හා ආර්ථික සුහද හුමමරුව සඳහා දිරිදීම පිණිසත් වෙළඳාමේ අවස්ථා හා භාණ්ඩ හා සේවා ඉල්ලුම් පුළුල් කර ගැනීම සඳහාත්,කඳවුරු නිවැසියන්ට හා ස්ථානීය ජනගහණය යන දෙගොල්ලන්ටම පහසුවෙන් පිවිසිය හැකි තැනක වෙළඳපොළ පිහිටුවිය යුතුය.

- ***මූලික වෙළඳපොළ යටිතල පහසුකම් සැලසීම:*** මේ යටිතල පහසුකම් අතර ආවරණය., සම්ප තැනෙක වැසිකිළි. හා කසළ බැහැර ලිම සඳහා පහසුකම් ද තිබිය යුතුය.

- ***කඳවුරු වෙළඳපොළ කමිටුවක් පිහිටුවීම.*** කඳවුරු වෙළඳපොළ කමිටුවක් පිහිටුවීමට අනුබල දිය යුතුය. වෙළඳපොළ සැලසුම් කිරීම,සංවර්ධනය හා කළමණාකරණය විශේෂයෙන්ම කසළ බැහැර ලීම හා සනීපාරක්ෂාව (විශේෂයෙන්ම ආහාර විකුණන ස්ථාන වල) ආදී කරුණු සම්බන්ධයෙන් මේ කමිටුව වගකීම දැරිය යුතුය. අවතැන්වූවන් සහ සත්කාරක ප්‍රජාව යන දෙගොල්ලන් අතර ව්‍යාපාර සහ ආශ්‍රිත කරණු සාකච්ජා කිරීම සඳහා වේදිකාවක් කමිටුව විසින් සකස් කර දිය යුතුය.සමාන කාන්තා නියෝජනයක් තිබීම කමිටුව විසින් සහතික කළ යුතුය.

- ***ස්ථානිය අවස්ථා තක්සේරුව.*** ස්ථානිය වෙළඳපොළ තත්ත්වය තක්සේරුව සඳහා කණ්ඩායම සත්කාරක ප්‍රජා නියෝජතයින්, ප්‍රාදේශිය රජයේ නිලධාරීන්, සංවර්ධන කාර්ය නියැළියන් වෙත් නම් ඔවුන්, අදාළ තන්හි UNHCR ය සමග සම්බන්ධීකරණයක් ඇතිකරගත යුතුය.

- ***ආර්ථික සබඳතාවනට අනුබලදීම:*** කඳවුරු ප්‍රජාව හා ප්‍රාදේශිය ප්‍රජාව අතර ආර්ථික සබඳතාවනට දිරිදීම ඉතා වැදගත්ය. ප්‍රාදේශිය වෙළඳපොළට ප්‍රවේශය හා ව්‍යාපාර අවස්ථා සාකච්ජාවට සත්කාරක ප්‍රජා නියෝජිතයින් හා කඳවුරු වෙළඳපොළ කමිටු සාමාජිකයින් එකට මුණගැස්වීම සඳහා පොදු වේදිකාවක් සංවිධාන කළ යුතුය.වෙළඳපොළ බදු සම්බන්ධ කරුණු නිරවුල්ව පහදා ගැනීම හා සැමට සාධරණ ප්‍රමිති ක්‍රමයක් පිහිටුවා ගැනීම වැදගත්ය.

- ***ඉඩම් ඇතියාව තක්සේරුව.*** සුළු පරිමාන වගාවන් සඳහා ඉඩම් ඇති නැති බව තක්සේරු කර ගන්නාමෙන් යෝජනා කෙරෙනු ලැබෙයි. සත්කාරක ප්‍රජා නියෝජිතයින්, බලධාරීන්, UNHCRය හා අවතැන් ප්‍රජාව සමග සම්බන්ධීකරණයක් තිබිය යුතුය.

- ***ශ්‍රමය වෙනුවෙන් ආහාර/ මුදල් දීමනා වර්ගයේ වැඩ සටහන් ක්‍රම සැලකිල්ලට යොමු කළ යුතුය.*** ශ්‍රමය සඳහා ආහාර/ මුදල් දීමනා වැඩ සටහන් සලකා බැලිය යුතුය.මෙවැනි වැඩ සටහන් කඳවුරු යටිතල හෝ සේවා සඳහා උපයෝගී කර ගත හැකියි. ඒවා විශේෂයෙන්ම වෙළඳපොළ, ප්‍රජා මධ්‍යස්ථාන, පාසල් ආදී ප්‍රජා සේවා සංවර්ධනය කරගැනීම් සඳහා ප්‍රජා මෙහෙයුම් හා අයිතිය පැවරීම් ආදී ප්‍රයත්න වලට හානිකර නොවිය යුතුය. මෙවැනි වැඩ සටහන්වලට සත්කාරක ප්‍රජාව සම්බන්ධ කර ගැනීමේ මාර්ග විමසා බැලිය යුතුය.තවද මෙවා කුසලතා සංවර්ධන වැඩ සටහන් හා බොහෝ විට සම්බන්ධ කර ගත හැක.

## කුසලතා පුහුණුව හා ආදායම් උත්පාදනය.

කුසලතා පුහුණුව හා ආදායම් උත්පාදන වැඩ සටහන් වෘත්තිය බැහැරි සේවා සඳහා වගකීම් දරන ඒජන්සියක් මගින් බොහෝ විට කඳවුරු තුළ සැපයෙයි. පුහුණු හා ආදායම් උත්පාදන වැඩසටහන් වර්ග, කඳවුරු ජනගහණය ,සංස්කෘතිය හා සමාජ ආර්ථික පරිසරය ආදිය අනුව සෑහෙන පමණ විවිධ වෙයි. රැකියා අයිතිය, බදු, සංචලනය සඳහා ඇති නිදහස, ආර්ථික අවස්ථාවනට ප්‍රවේශය ආදිය හා බැඳි නිතිමය කරුණුද ආදායම් උත්පාදන මට්ටම කෙරෙහි බලපෑමක් කෙරෙයි. පුහුණුවේ හා ආදයම් උත්පාදනයේ කෙටි කාලින මෙන්ම දිගු කාලින ලාභ ප්‍රයෝජන ඇත. පුහුණුව මගින් පුද්ගලයින්ට පල ප්‍රයෝජන ඇති ක්ෂේත්‍රයන්හි අදාළ දැනුම ලබාගැනීමටත් හැකියාවන් හා වෙසෙසියාව වර්ධනය කරගැනීමටත් පුළුවන්කම ලබා දෙයි. පුහුණුව මගින් අළෙවි කළ හැකි හැකියා

වර්ධනය කළ යුතුය.. පුහුණුවෙන් පසු ඉදිරි මාස කිපය තුළ භාවිත නොවන හැකියාවන් ඉතා ඉක්මනින් ක්ෂයවී යන බව ඔප්පුවී ඇත. සුදුසුකම් ඇති අවතැන්වූවන් හෝ පෙදෙසියන් යටතේ ආධුනිකත්වය, රැකියා කරන අතරේ පුහුණුව, සම්මන්ත්‍රණ හා වැඩමුළු, එසේත් නොමැති නම් වඩා විධිමත් පුහුණුව ආදී වශයෙන් හැකියා පුහුණුව විවිධ ස්වරූප ගනියි. කාන්තාවන්ට හා තුරුණුවන්ට ඒවාට ඇතුළත් වීම සහතික කිරීම සඳහා ක්‍රමෝපායන් සකස් කර ස්ථාපනය කළ යුතුය. ආදායම් උත්පාදන වැඩ සටහන්වලට ක්ෂුද්‍ර මූල්‍ය සේවා හෝ ප්‍රදාන සම්බන්ධව ඇති අතර බොහෝ විට ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පුහුණුක් ද ඒ සමග එක්ව යයි. පුහුණුව හා ප්‍රදාන හෝ මූල්‍ය සේවාවල නිසි සංයෝජනය කෙටි කාලීනව ලාභදායී ක්ෂුද්‍ර ව්‍යාපාර සංවර්ධනය පහසු කරන අතර සමහර කණ්ඩායම් ආපදා ගෝචරවීමට ඇති ඉඩ අඩු කරයි. ක්ෂුද්‍ර මූල්‍ය සේවා සැපයෙන විට පුද්ගලයින්ට,ණය පරිහරණය කරන හැටි, ඉතිරි කරන හැටි, ආයෝජන කරන හැටි හා ආපසු ගෙවීම් කරන හැටි අනුපූරක ව්‍යාපාර පුහුණුව උගන්වයි. සාර්ථකවීමට නම් පළපුරුදු හවුල්කරුවන් විසින් උසස්ම ක්ෂුද්‍ර මූල්‍ය ආයෝජන භාවිත අනුව මූල්‍ය සේවා සැපයීම අතිශය තීරණාත්මක වෙයි. වාණිජ කටයුතුවලට හා ස්වයං රැකියාවන්ට පෙළඹවීම අවතැන්වූවන්ට හා සත්කාරක ප්‍රජාව යන දෙපිරිසටම ලාභදායී වනු ඇත. සමහර පුහුණු විධි සුවිශේෂ වශයෙන් වන කළමනාකරණය හෝ මාර්ග තැනීම වැනි, සත්කාර ප්‍රදේශයේ පරිසර සංවර්ධනයට දායකවීමට ඍජුවම ඉලක්ක කර ගත් ඒවා වෙයි. කඳවුරු තත්ව යටතේ පුහුණු හා ආදායම් උත්පාදන කාර්ය සාමාන්‍ය තත්වයක් යළි උදාව ඇතැයි යන හැඟීමක් ඇති කිරීමට ආධාර වන අතර ආතතිය හා ක්ෂතිය අඩු කිරීම කෙරෙහි ධනාත්මක අනුබලයක්ද වනු ඇත. පුහුණුවක හෝ කුඩා පරිමාන ව්‍යාපාරවල යෙදී සිටීම මිනිසුන් හමුදාවට බලහත්කාරයෙන් බඳවා ගැනීමෙන් හෝ ස්වේජාවෙන් බැඳීමෙන් වළක්වා ගැනීමේ තවත් උපක්‍රමයක් වනු ඇත.

**හැකියා පුහුණුව සම්පූර්ණ කළ කඳවුරු වැසියන්ට පුහුණුකරුවන් වීමේ අවස්ථා ලබා දිය යුතුය. පුහුණුකරුවන් පුහුණු කිරීම කෙටි කාලීනව හා දිගු කාලීනව ප්‍රජාවට වලදායී වැදගත් ආයෝජනයක් වනු ඇත.**

අවසානයේදී මේ දෙයාකාර සැලසීම තමන්ගේ හැකියාවන්ට හා අත්දැකීම්වලට සම්බන්ධ වැඩපල සොයා ගැනීම සඳහා මිනිසුන් දිරිගැන්වීමකට හේතු වනු ඇත. ඒ අතරම හැකියා පුහුණුව, ව්‍යාපාර පුහුණුව, සහ ආදයම් උත්පාදන කාර්ය වලින් ලත් අත්දැකීම් තමා ප්‍රභවය වූ ප්‍රදේශය හෝ රට තුළ ඔවුන්ගේ සමාජ ආර්ථික ප්‍රතිසංකලනය පහසු කරවනු ඇත. අප්‍රිකාවේ ගෙවතු වගා, සහ භෝග වගා වැනි සුවිශේෂ ගැමි හැඩගැස්මකින් යුත් පුහුණුකිරීම්, නාගරිකරණය කෙරෙහි නැඹුරුවීම වැඩිවීමේ ප්‍රවණතාවයට ප්‍රතිචාරයක් වශයෙන්, ගැමි දිවිපෙවෙතකට මිනිසුන් ආපසු මෙහෙයවීම අරමුණු කර ගත්තක්ද වෙයි.

පුහුණුවේ වර්ගය හා සන්දර්භය අනුව පුහුණු කාල සීමා වෙනස් වෙයි.. සීමිත කාල වකවානුවක් තුළ පුද්ගලයින් හැකි තරම් විශාල සංඛ්‍යාවක් බඳවා ගැනීම සඳහා කඳවුරු තත්ව තුළ පුහුණු කාල සීමාව මාස තුනකට හෝ හයකට සීමා කෙරෙයි.

## කඳවුරු කළමනාකරන කණ්ඩායමේ මුඛ්‍ය වගකීම්.

- ***හැකියා පුහුණුව සඳහා අවශ්‍යතා හඳුනාගැනීම.*** පුහුණු/ආදායම් උත්පාදන කාර්ය වල කවර ක්ෂේත්‍රයන්හි අවශ්‍යතා ඇත්දැයි හඳුනා ගැනීම සඳහා වගකීම් දරණ ඒජන්සි හා අවතැන් ප්‍රජාව හා සම්බන්ධිකරණයක් කණ්ඩායම විසින් ඇති කර ගත යුතුය. ප්‍රජාව සමග යොමු සාකච්ජා මාර්ගයෙන් මෙය කළ හැක. මේ සාකච්ජා මගින් වෙළඳපොළේ යථා ස්වරූපය හා ප්‍රජාවගේ විශේෂඥ දැනිමට හා සංස්කෘතික හරයනට අනුරූපි, පවත්නා මෙන්ම අළුත් අවස්ථාද හඳුනා ගත යුතුය.

- ***සමාන සහභාගිත්වය*** පුහුණුවීම් සහ ආදායම් උත්පාදන කාර්ය වල කාන්තා සම සහභාගිත්වය අතිශයෙන් වැදගත්ය. මේවැනි කාර්යයන්හි කාන්තාවන් සහභාගිවීමේ අවශ්‍යතාව පිළිබඳ දිගටම පවත්වාගෙන යන සංවේදි කිරීමක් සහතික කිරීම වැදගත් වෙයි.

- ***ප්‍රජාපාදක දිවා දාරකාගාර සංවර්ධනය:*** අඛණ්ඩ කාන්තා සහභාගිත්වය තහවුරු කර ගැනිම සඳහා දිවා දාරකාගාර හෝ ළමයින් රැක බලා ගැනිම සඳහා හෝ විකල්ප වැඩ පිළිවෙළක් ආරම්භ කර සංවර්ධනය කර ගත යුතුය.

ආර්ථික වශයෙන් දැන් හෝ ඉදිරියේදි සක්‍රිය වීමට කුසලතාවන් ඇති ආපදා ගෝචර කණ්ඩායම් කෙරෙහි අවධානය යොමු කිරීම අතිශය වැදගත්ය. කාන්තා මූලික ගෙවල නිවැසියන්, HIV/AIDS වලට භාජන වූ පුද්ගලයින්/ගෙවැසියන්, තුරුණුවන්, ආබාධිතයන් වැනි විශේෂ වශයෙන් වැඩි අවදානම් තත්ව වලට ලක් විය හැකි කණ්ඩායම් වෙනුවෙන් පුහුණුව හෝ ආදායම් උත්පාදන කාර්ය සංවිධානය සඳහා වගකිය යුතු ඒජන්සි සමග සම්බන්ධිකරණයක් ඇති කර ගත යතය.

- ***අතිරේක පාසල් අධ්‍යාපනය සැලසීම:*** ස්වයංරැකියා අරමුණු කරගත් හැකියා පුහුණුව සාර්ථක වීමට නම්, පුද්ගලයින්ට සාක්ෂරතාව හා සංඛ්‍යා හැකියාව මෙන්ම, යෝග්‍යතා අධ්‍යයන, පිරිවැය ගණනය, අලෙවිය සහ/ හෝ මුදල් පරිපාලනය, සහ පොත්තැබීම ආදිය පිළිබඳ මූලික දැනීමක් දෙන ව්‍යාපාර කළමනාකාර ඉගෙනුමක් , එකට එක්ව යා යුතුය.

- ***වෙළඳපොළ අවස්ථා හා සම්පත් පිළිබඳව සොයා බැලීම:*** භාණ්ඩ හා සේවාවන් සඳහා ස්ථානිය ඉල්ලුම සහ ස්වාභාවික සමපත් හා අමුද්‍රව්‍ය ඇතිනැතියාව තක්සේරු කරන විට අදාළ වගකීම් දරන ඒජන්සිය සමග සම්බන්ධිකරණය අතිශය වැදගත්ය.



*පුහුණුව හා ආදායම් උත්පාදන ව්‍යාපෘති මගින් කඳවුරු කළමණාකාර කණ්ඩායමට ස්වයං රැකියා සඳහා ප්‍රබෝධනයක් ඇති කළ හැක. සියරා ලියෝන්හි වෘත්තිය පුහුණු කිරීම් අතර ඇඳුම් මැසීම ජනප්‍රියයි. ඡායාරූපය: ටොරිල් ස්කෙජන්නෙ NRC*

- ***ප්‍රවේශයන් ප්‍රමිතිකරණය:*** දිරි ගැන්වීම්,භාණ්ඩ සැපයුම, සහතිකකරණය, සහ පුහුණු කාලය ආදියේ ප්‍රවේශ මාර්ග ප්‍රමිතිකරණය හා ද්විත්විකරණය (එකම දෙවරක් කිරීම) වළක්වා ගැනිම සඳහා අදාළ ඒජන්සින් සමග සම්බන්ධිකරණයක් ඇති කර ගැනිම අත්‍යවශ්‍යය.
- ***සුවිශෙෂ නිෂ්පාදන සන්දර්භය:*** ගොඩනැගිලි හා හෝ කෘෂි තාක්ෂණය ආදියේ විෂයබද්ධ නව නිෂ්පාදන හා තාක්ෂණ භාවිතය සංවර්ධනය සඳහා ඇති අවස්ථා සොයා බැලිය යුතුය.
- ***සාධාරණ තෝරා ගැනිම:*** කඳවුරු නිවැසියන් තෝරා ගැනිම සාධාරණ විය යුතුය. කඳවුරු නිවැසියන් අතරින් පුහුණුව සඳහා යෝග්‍ය අය හඳුනාගැනිම පැවරුණු ඒජන්සියට සහායවීම ඉතා වැදගත්ය.
- ***සත්කාරක ප්‍රජා සහභාගිත්වය.*** සමහර පුශුණු හා ආදායම් උත්පාදන වැඩසටහන් වලට පුහුණු කරුවන් හෝ පුහුණුවන්නන් වශයෙන් සත්කාරක ප්‍රජාව සහභාගි කර ගැනිමට දිරිගැන්වීම අතිශය වැදගත්ය.
- ***පුහුණුකරුවන් සඳහා මිඩංගු වීම:*** අදාල වගකිම ඇති ඒජන්සියක් සමග සම්බන්ධීකරණයක් ඇතිකර ගත සමස්ත හැකියා පුහුණු වැඩසටහන්හි පුහුණුකරුවන් පුහුණු කිරීමද ඇතුළත් කිරීමට අනුබල දීම අවශ්‍යය.
- ***පුහුණුව සඳහා පහසුකම්:*** සෑහෙන පමණ පුහුණු කුටි සහ ගබඩා පහසුකම් හඳුනාගත පැවරිය යුතුයි.
- ***ආරක්ෂා සහිතව ගබඩා කිරීම.*** මෙවලම්, උපකරණ , භාණ්ඩ හා ද්‍රව්‍ය ආරක්ෂා සහිතව ගබඩා කර තැබීමට කළමණාකරන කණ්ඩායම සහතික විය යුතුය

# මෙවලම් කට්ටලය

- *තක්සේරු සෝදිසි ප්‍රශ්ණාවලිය:* සේවා සපයන්නෙක් එකවිටම නොමැති වුවත් ධනාත්මක දිවි පෙවෙත සඳහා උද්යෝගි කිරීම හා උදව්දීම කවරම කළමනාතරුවකුගේ හෝ කාරියෙකි.පරිපූර්ණ අවශ්‍යතා තක්සේරුවක් අවශ්‍යවෙයි. (සියරා ලියෝන්හි ළමා අයිතිවාසිකම් සඳහා කාර්ය ARC වැඩසටහන් අනුග්‍රහයෙන් ලැබුන) මේ සෝදිසි ලැයිස්තුව, අවශ්‍යතා,පසුබිම/අත්දැකීම්,ස්ථානිය (සත්කාරක ප්‍රජාවගේ) ආර්ථික කටයුතු, ස්ථානිය ඉල්ලීම්, කඳවුරු ජනගහනය හා සත්කාරක ප්‍රජාව අතර පවත්නා (හෝ විභව) ආර්ථික සම්බන්ධතා ආදිය තක්සේරු කිරීම සඳහා කඳවුරු කළමනාකරුට පිහිට වෙයි.

- *හැකියා පුහුණුකරුවන්ට සෝදිසිය, අධීක්ෂණය හා ඇගයීම සඳහා පත්‍රිකාව:* ඒ ඒ ඒජන්සි හා කඳවුරු අතර දිවිපෙවත් ක්‍රමෝපායයන් සඳහා උද්යෝගි කිරීම පිණිස කඳවුරු කළමනාකරණ ඒජන්සින්හි නිරතවීමේ මට්ටම මහත්සේ විවිධ වෙයි. කඳවුරු කළමනාකරණ කාර්ය භාරය සහායවීමට සීමා වූ එකක් වන තැනෙක වුවද, කඳවුර තුළ කෙරෙන විවිධ කාර්ය සෝදිසි කර බැලීම කඳවුරු කළමනාකරුගේ වගකීම් වලින් එකකි.පුහුණුකරුවන් පුහුණු කිරීම දිගු කාලීනව හා කෙටි කාලීනව වැදගත් ආයෝජනයක් නිසා ඒ සඳහා දිරිගැන්විය යුතුය. හැකියා පුහුණු පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කළ අවතැන් පුද්ගලයිනට තමනුත් පුහුණුකරුවන් වීමේ අවස්ථා දිය යුතුය. මේ ඇගයීම් පත්‍රිකාව අළුතෙන් පුහුණුවූ පුහුණුකරුවන්ගේ සාධන ඇගයීම සඳහා පාවිච්චි කරනු ලැබෙයි.

- *අවබෝධතා ගිවිසුම (MoU)* කඳවුරු කළමනාකරණ ඒජන්සියක් (CMA) සහ ස්ථානිය හැකියා පුහුණු සපයන්නකු (STP) අතර MOU වක ආදර්ශ ආකෘතියක්. මේ උදාහරණයේ කඳවුරු කළමනාකරණ ඒජන්සිය විසින් මිලට ගන්නා උපකරණ සඳහා ගිවිසුමක් දක්වෙයි. එහි කඳවුරෙහි හැකියා පුහුණු මධ්‍යස්ථානය තුල පාවිච්චිය හා කඳවුරු කළමණාකරන ඒජන්සිය මගින් හැකියා පුහුණු උපදේශකවරුන්ට ගෙවන දිරිදීමනා සඳහා ද අදාල කොන්දේසි (ToR) දක්වෙයි.

## අවශ්‍ය කියවීම් සහ ආශ්‍රේයයන්

- අන්තර් ජාතික කම්කරු කාර්යාලය (ILO) 1997 හඳුනාවෙන් ඉවත් වුවන් සඳහා රැකියා අවස්තා සහ පුහුණු කිරිමේ අත්පොත ILO ජිනිවා
- අන්තර්ජාතික කම්කරු කාර්යාලය (ILO) 1992 ආබාධිත සේවකයින් මාර්ග වාරිමාර්ග කෘෂි කටයුතුවල නියුතු කිරිමේ නිර්නායක (ILO) ජිනිවා
- ILO – UNITCR පුහුණු අත්පොත 2003 අර්බුදයට මුහුණ දුන් ප්‍රජාවගේ ක්‍ෂුද්‍ර මුල්‍ය සඳහා හැඳින්වීම
- ලවුන්සෙ එස් 1996 ජිවිත සහ දිවි පෙවෙත රැකිම දිවිපෙවෙත ක්‍රමවේදයේ පාදක ට්යුප්ට් විශ්ව විද්‍යාලය
- වින්සන්ට් එම් රෙජ්ලුන්ඩ් සොරොන්සන් බි (eds) NRC 2001 දේශ සිමාව අතර අල්ලා ගන්නා ලදි අභ්‍යන්තර අවතැන්වුවන්ගේ ප්‍රතිචාර ක්‍රමවේද NRC ඔස්ලො/ජ්ලුචෝ ප්‍රෙස් ලන්ඩනය
- ස්පියර් ව්‍යාපෘතිය දිවිපෙවෙත ක්‍රමවේද සඳහා ඇමැතිමේ කාලවත් කරන ලද නිර්නායක (2003)
- ලාර්සන් ඩි අර්බුදවලින් පසුව ක්‍ෂුද්‍ර මුල්‍ය Micro Finance Best Practions Briel
- නාගරාජන් ජි 1999 ක්‍ෂුද්‍ර මුල්‍ය කරා යොමු කෙරෙන ප්‍රතිපත්ති ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO)
- මැක්කලින් එම් 1995 සමාජ යලි සමෝධානගත කිරිම සහ කායික සහ මානසික සුව සාධනය ප්‍රවර්ධනය ළමුන් සම්බන්ධයෙන් හමුද අරගල බලපෑම පිළිබඳ කරුණු සඳහා (UN) එක්සත් ජාතින් විසින් සකසන ලද පත්‍රය UNICEF – ජිනිවා
- අන්තර් ඒජන්සි ස්ථාවර කමිටුව (IASC) 2003 හදිසි පසුබිම් තුළ HIV/Aids මැදිහත්වීම් සඳහා නිර්නායක
- අන්තර්ජාතික ගැලවීමේ කමිටුව 2003 අනාගතය සුරකිම Hivl වැළැක්වීම සත්කාරය සහ අවතැන් වුවන් සහ යුද්ධය බලපෑ ප්‍රජාවට සහාය

- www.ilo.org
- www.sphereproject.org
- www.unhcr.ch
- www.theirc.org

# තක්සේරු සෝදිසි ප්‍රශ්ණාවලිය

## 1 සරණාගත/අවතැන් පුද්ගල ව්‍යාපාර හා හැකියාවන්.

- දිවිපෙවෙත රැකගැනිම සඳහා අවතැන් පුද්ගලයින් විශ්වාසය රඳවා සිටින මූලය ධන වර්ගය (උදාහරණ වශයෙන් මිනිස්, මූලයමය, භෞතික, ස්වාභාවික, හා සමාජමය) හඳුනාගන්න.
- අවතැන් ජනගහනය අතර ඇති ව්‍යාපාර හැකියාවන් හඳුනා ගන්න.
- පුද්ගලයින් යෙදී ඉන්නා ව්‍යාපාර (උදාහරණ: වෙළඳාම,නිෂ්පාදනය,සේවාවන්, අත්කම්) හඳුනා ගන්න.
- අවතැන්වූවන් දැනිම/ අත්දැකිම් ලබා ගැණිමට බලාපොරොත්තුවන කාර්ය ක්ෂෙත්‍ර හඳුනා ගන්න.
- පුද්ලගයින් භාවිත කරණ ඉතිරි කිරීම් ක්‍රම හඳුනා ගන්න.

## 2 විකල්ප දිවි පෙවෙත් ක්‍රමෝපායය.

- කඳවුරේ ආරක්ෂා මට්ටම තක්සේරු කර ගන්න.
- ගණිකා වෘත්තිය, සොරකම් වැනි විකල්ප ක්‍රමෝපායයනට ඇති හැකියාව හඳුනාගන්න.

## 3 කඳවුරු වෙළඳපොළ

- නිෂ්පාදන මිලදී ගන්නා හා විකුණන තැන් හඳුනා ගන්න
- කඳවුරේ මධ්‍යම වෙළඳපොළ
- වෙළඳපොළ පහසුකම් වලට නිසි ආවරණයක් ඇත්දැයි විමසා බලන්න.
- ඉඩකඩ ගැන සොයා බලන්න.
- සාධාරණව වෙළඳ කුටි බෙදා දිමට පොළඹවන්න.
- වෙළඳපොළ අසළ සෑහෙන පමණ වැසිකිළි හා කසළ බැහැර කිරීමට නිසි පහසුකම් තැනිය යුතුය.
- කඳවුරේ ඉන්නා ව්‍යාපාරිකයන් කෙසේ සංවිධානය වී ඇත්දැයි දැනගන්න. දැනටමත් වෙළඳ කමිටුවක් ඇත්දැයි සොයා බලන්න.

## 4 ස්ථානිය වෙළඳපොළ

- අවතැන් වුවන් පිළිබඳ ස්ථානිය අයගේ අදහස් හා ආකල්ප මොනවාදැයි දැනගන්න.
- අවතැන් වූවන් සම්බන්ධයෙන් ස්ථානිය ව්‍යාපාරිකයින් හා ප්‍රාදේශිය නිලධාරීවන් ගේ ආකල්ප මොනවාදැයි දැනගන්න.
- අවතැන්වූවන්ට/අභ්‍යන්තර අවතැනුන් (IDPs) වුවන්ට ප්‍රදේශයේ වෙළඳපොළට යාමට ඇති හැකියාව සොයා බලන්න. බාධක යමක් වේ නම් හඳුනා ගන්න.
- ප්‍රදේශයේ ව්‍යාපාරිකයන් බඩු මිළ දී ගැනිම සහ විකිණිම සඳහා කඳවුරට එන්නේදැයි විමසා බලන්න. එසේ නොපැමිණෙන්නේ නම් පැමිණිමට ඇති බාධක මොනවාදැයි සොයා බලන්න.

## 5 ශ්‍රම වෙළඳපොළ

- කඳවුරු නිවැසියන්ට කවර ආකාරයේ ස්ථානීය රැකියා(දවස් වැඩ) අවස්ථා ඇත්දැයි සොයා බලන්න.
- අවතැන්වූවන්ට හා IDP යනට ස්ථානීයව උපයාගත හැකි සාමාන්‍ය වේතනය කොපමණ වේ දැයි සොයා බලා දැන ගන්න.
- අවතැන්වූවන් (IDP) යන්ගේ සාමාන්‍ය වේතනය ප්‍රදේශයේ ප්‍රජාවගේ වේතන මට්ටම හා සසඳා බලන්න.
- ආහාර හා ආහාර නොවන සහනාධාර සැලකිල්ලට ගෙන කඳවුරෙහි සාමාන්‍ය වේතනය කොපමණ විය යුතුදැයි සේවා සපයන්ගෙන් විමසා දැන ගන්න..

## 6. කෘෂිකර්මය

- ගොවිතැන සඳහා ඉඩම් ඇත්දැයි සේවා සපයන්නන්ගෙන් /UNHCR යෙන් /ප්‍රාදේශිය නිලධාරීන්ගෙන් විමසා සොයා දැනගන්න.
- ගොවිතැන සඳහා ඇති ජලය ප්‍රමාණය තක්සේරු කරගන්න.
- කෘෂි නිෂ්පාදන අලෙවිය සඳහා ප්‍රදේශිය වෙළඳපොළේ සහ කඳවුරු වෙළඳපොළේ ඇති ඉඩකඩ හා බැරි පුළුවන්කම (හැකියාව) තක්සේරු කරගන්න.
- අවතැන්වූවන්/IDP යන් ඔවුන්ගේ මුල් රටේ හෝ ප්‍රදේශයේ වගා කළේ මොනවාදැයි සොයා දැනගන්න.
- සත්කාරක ප්‍රජා පරිසරයේ සම්ප්‍රදායි වගාවන් කවරේදැයි සොයා දැන ගන්න.

## 7. සැලැසුම

- කඳවුරු තුල ඇති NGO ආදායම් උත්පාදනය/හැකියා පුහුණුව/ කෘෂි වැඩසටහන් වර්ග මොනවාදැයි සොයා බලා දැනගන්න.
- කලින් තුබූ වැඩසටහන් මොනවාදැයි දැනගන්න.සාර්ථක වූයේ මොන වැඩසටහන් ද? අසාර්ථක වූයේ මොන වැඩසටහන් ද? එසේ වූයේ කවර හේතුන් නිසා ද කියා සොයා බලා දැනගන්න.
- කඳවුරුවල දැන් ඇති NGO මොනවාද,? ඒවායේ හැකියාවන් මොනවාද ?.
- **අවතැන්වූවන්/ශෘජයන් ඉල්වා සිටින්නේ 'කවර වර්ගයේ පුහුණුවීම්/ආදායම් උත්පාදන පුහුණු වැඩ සටහන්ද කියා සොයා දැනගන්න.**

# හැකියා පුහුණුකරුවන් සෝදිසිය, අධීක්ෂණය හා ඇගයීම.

## හැකියා පුහුණුකරුවන් සෝදිසිය, අධීක්ෂණය හා ඇගයීම.

සාධන ඇගැයුම් පත්‍රිකාව.

පුහුණුකරුගේ නම..............................................................................

පංතිය තනතුර ..........................................................................

හැකියා පුහුණු ක්ෂේත්‍රය..........................................................................

පහත සඳහන් නිරීක්ෂණ ඔස්සේ ඇගයීම කෙරෙය

| | හොඳයි | සතුටුදායකයි | දියුණුවිය යුතුයි |
|---|---|---|---|
| පුහුණු අපේක්ෂා සහ අරමුණු පැහැදිල කරදීම | | | |
| පාඩම ඉදිරිපත් කිරීම | | | |
| පෙළ/පුහුණුව සංවිධානය | | | |
| ද්‍රව්‍ය හා උපකරණ ඉදිරිපත් කිරීම | | | |
| සහභාගිවන්නන් හා සංනිවේදනය | | | |
| විෂය දැනුම | | | |
| ආරක්ෂාව ප්‍රවේශය සහ දැනුවත්බව | | | |
| එක් එක් පුද්ගලයින් කෙරෙහි අවධානය ඇස් බැල්ම | | | |
| පාඩම් අන්තර්ගතය | | | |
| සහභාගිවන්නන්ගේ අවබෝධ මට්ටම | | | |
| ඉවසීම සහ නම්‍යතාව | | | |
| කාලෝචිත බව. | | | |
| සමස්ත විමර්ෂණය | | | |

පුහුණුකරුගේ වැඩ පිළිබඳ අතිරේක සටහන :

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

ඇගයුවේ.................................................................................................................

දිනය ......................................................................................................................

පසුවිපරම් සඳහා යෝජනා ......................................................................................

# අවබෝධතා ගිවිසුම

## අවබෝධතා ගිවිසුම

කඳවුරු කළමණාකරණ ඒජන්සිය හැකියා පුහුණු සැපයුම්කරු.

මේ අවබෝධතා ලිපිය, පුහුණු උපකරණ සැපයීමට හා සරණාගත/IDP කඳවුරේ හැකියා පුහුණු මධ්‍යස්ථානයේ ඒවා පාවිච්චිය සඳහා, කඳවුරු කළමණාකරණ ඒජන්සිය (CMA) සත්කාරක ප්‍රජාවගේ හැකියා පුහුණු සැපයුම්කරු (STP), සහ සරණාගත/IDP(අභ්‍යන්තර අවතැන්) කඳවුර අතර,ලිඛිත කොන්ත්‍රාත්තුවක් ඇතිකර ගැනීමට වෙයි. කඳවුරේ කරන සේවා සඳහා CMA යෙන් දීමනා ලබන පුහුණු කරුවන්ට අදාල කොන්දේසි ද කොන්ත්‍රාත්තුවේ ඇතුලත් කොට ඇත.

CMA ය විසින් STP ය සඳහා උපකරණ ලබාගැනීම, පාවිච්චිය, නඩත්තුව, පුහුණුව සපුරාලීම සහ අවසානයේ උපකරණ බැහැරලීම ආදිය සඳහා මේ කොන්ත්‍රාත්තුව යෙදේ. ඊට අමතරව මධ්‍යස්ථානයෙහි සේවය කරන දීමනා ලබන පුහුණුකරුවන් මෙයට සහයෝගය දැක්විය යුතු අතර මේ මෙමොරැන්ඩමේ සඳහන් ප්‍රමිතීන්ට අනුගාමී වීමද අපේක්ෂිතයි. යට දැක්වෙන පිළිවෙත් වලට එකඟවීම සහ සහයෝගය දැක්වීමද, STP ය මගින් නිවැරදි වාර්තා තබා ගන යාම ද මත CMA ය හා STP ය අතර සම්බන්ධය දිගට පවත්වා ගන යාම තිරණය වෙයි. මේ කොන්ත්‍රාත්තුවේ සඳහන් කොන්දේසි කඩ තුළ හොත් මේ කොන්ත්‍රාත්තුව අවසන් කිරීමටත්, උපකරණ ආපසු ගැනීමටත් කවරම විටෙක දීරි දීමනා අත්හිටුවීමටත් CMAයට අයිතිය ඇත.

මේ ගිවිසුම හැකියා පුහුණු මධ්‍යස්ථානය සඳහා CMA ය විසින් ගනු ලැබූ උපකරණ වලටත් හැකියා පුහුණු කරුවන්ගේ දීරි දීමනා අරමුදල් සම්බන්ධයෙනුත් යෙදෙයි.

**මෙවලම් හා උපකරණ වලට අදාළ කොන්දේසි.**

1. ව්‍යාපෘති මෙවලම් හා උපකරණ CMA ය විසින් ඉතාමත්ව සුදුසු යැයි තිරණය කරනු ලබන කවර හෝ පාර්ශවයකට විධිමත්ව පවරාදෙන තෙක් ඒවායේ අයිතිය CMA ය වෙත වෙයි.

2. CMA ය විසින් අත්සන් කළ පසු සරණාගත/IDP කඳවුර UNCHR සහ රජයේ සංවිධානයකින්, හෝ සමකාලීනව දීමනා ලබන්නන් හා CMA ය අතර අන්‍යොන්‍ය එකඟතාවකින් හෝ සරණාගත/IDP කඳවුර වසා දමන තෙක් ව්‍යාපෘති උපකරණ විකිණීම, බෙදා හැරීම, හෝ බෙදාගැනීම හෝ නොකළ යුතුය.

3. ව්‍යාපෘති මෙවලම් හා උපකරණ ලියා පදිංචි පුහුණුකරුවන් හා පුහුණුවන්නන් සඳහා පමණි. බාහිර වාණිජමය පාවිච්චිය සඳහා අවසර නැත.

4. CMA විසින් ප්‍රදානය කරණ ලද මෙවලම් හා උපකරණ නිල වශයෙන් ලියා පදිංචි සහභාගිවන්නන්ට පමණක් ලබා ගැනිමට අවසරදෙනු ලැබේ

5. වෙනත් ඒජන්සියක් වෙත උපකරණ හා මෙවලම් ප්‍රතිදාන සඳහා කරන ඉල්ලීම්, සේවා හා ප්‍රතිදාන ද්විත්ව වීම වැළැක්වීම සඳහා CMA ය සම්බන්ධිකරනය කරනු ඇත

**පංති, ශික්ෂණය, හා පුහුණුකරු දීරි දීමනා සම්බන්ධව වැඩසටහනට අදාල කොන්දේසි.**

1. පංති විෂයය වැඩසටහට සම්බන්ධ වූවන්ගේ හැකියා මට්ටමට ගැලපිය යුතුය. පංති කාලය අවම වශයෙන් පැය තුනක් විය යුතු අතර සඳුදා සිට සිකුරාදා දක්වා දින පහක් සත්කාරක/IDP කඳවුරේ පුහුණු මධ්‍යස්ථානයේ පැවැත් විය යුතුය. මේ පන්ති ජුනි 1 දා ආරම්භ වන අතර අගෝස්තු 30න් අවසන්වන තුන් මාසය තුළ පැවැත් වෙනු ඇත. අළුත් පන්ති සඳහා ගිවිසුම් ඇතිකර ගැනිමත් අවබෝධතා ගිවිසුම ඇගයීමට භාජන කිරීමත් එවිට සිදුවනු ඇත.
2. හැම පන්තියක සම්පූර්ණ ඇතුලත්වූවන්ගේ ප්‍රමාණයෙන් අඩු තරමේ සියයට හැත්තෑවක් සව් හි ලියා පදිංචි සරණාගත/IDP ලේඛණ ගත අයවළුන්ගෙන් විය යුතුය. ඇතුළත්වීම සඳහා, තනි ගෙමූලික නිවැසියනට,ආපදා ගෝචර විය හැකියනට, තනිවූ තුරුණුවනට, සහ අන්තරා ඉලක්ක පුද්ගලයින්ට ප්‍රමුඛතාව දිය යුතුය.
3. හැම සති අන්තයකම පුහුණු චාර අත්සන් නාම ලේඛන ප්‍රජා සේවා සම්බන්ධිකාරකට බාර දිය යුතුයි.
4. වාර්තා තබා ගැනිම හා අත්සන් ලේඛන සම්පූර්ණ කිරීම සහතික කිරීම සම්බන්ධයෙන් පුහුණුකරුවන් වගකීම දැරිය යුතුය.කවරම විටෙක හෝ අත්සන් ලේඛන නිසි ලෙස සම්පූර්ණ කර නොතිබුන හොත් හෝ වංචා සහගත ලෙස පුරවා ඇතැයි දැනුන හොත් හෝ සෝදිසියකදී පන්ති නොපවත්වන බව පෙනුන හොත් CMA ය ගෙවීම් අත්හිටුවනු ඇත.
5. ආරක්ෂාව හා සම්බන්ධ කරුණු, විධිමත් චරියා හා පිළිගත් ප්‍රතිපත්තිද, CMA යේ ප්‍රතිලාභීන් අනිසි පෙළඹීම් වලට ගොදුරු විය හැකි සම්බන්ධකම් වලින් වළක්වා ගැනිමද ඇතුළුව ඔවුන්ගේ ආරක්ෂාවද CMA ය වෙනුවෙන් පවත්වා ගත යෑමට හැම පුහුණුකරුවෙක්ම පොරොන්දු විය යුතුය.

| | |
|---|---|
| CMA ය වෙනුවෙන් | STP ය වෙනුවෙන් |
| අත්සන් කළේ | අත්සන් කළේ |
| ____________ | ____________ |
| ස්ථානය | දිනය |
| ____________ | ____________ |

# 13 යෞවනයන් සහ විනෝදාංශ



*නැගී එන ඇමෙරිකන් පාපන්දු ක්‍රීඩකයෝ. උදාසීන බව දුරු කිරීමට යොවනයින් නිර්මාණාත්මක කටයුතුවල නියුතු වෙමින්, නමුත් සුළු අපරාධා, ලිංගික ප්‍රචණ්ඩත්වය, මත්ද්‍රව්‍ය, මත්පැන් අනිසි ලෙස භාවිතය වැනි කරුණු වලින් ආරක්ෂාවීම. එය විනෝදජනක ද වේ. ඡායාරූපය වර්ජි මාරෝ* NRC

# පරිච්ඡේදය 13 : තරුණයින් සහ විනෝදාංශ

## හැඳින්වීම:

යෞවනයින් සහ නව යොවුන් පිරිස අවතැන් වූ අවස්ථාවලදී විශේෂයෙන් අවදානමට ලක් වෙන්නේ මක්නිසාද යත් ඔවුන් අනුන්ගෙන් යැපීම සහ අවදානම් සහිත බව නිසාවෙනි. වැඩිහිටියන්ට මෙන් නොවැ ඔවුන් තවමත් වැඩෙමින් සිටින නිසා වෙනස් අවශ්‍යතා සහ ප්‍රමුඛතා ඇත. අවතැන් වන අවස්තාවන්හිදී, පවුල් සහ ප්‍රජාව නිරන්තරයෙන් තෝරා ගත හැකි දෙයක් නැති නමුත් ඔවුන්ගේ සාමාන්‍ය සමාජ ගතවීම සහ ඔවුන්ගේ යෞවනයින්ට ඉගැන්වීම අතහැර දමනු ලැබේ. තරුණයින් සහ නව යොවුන් තරුණයන් අවතැන්වීමේදී ඇති වන එක් ප්‍රතිඵලයක් වන්නේ සාමාජික සහ මානසික වර්ධනය බරපතල ලෙස අවහිරවීමය. මෙම බාධකය නිසා සාමාජික සහ මානසික වර්ධනය බරපතල ලෙස අවහිරවීමය. මෙම බාධකය නිසා සාමාන්‍ය සංවර්ධනය බලවත් ලෙස නව යොවුන් පිරිසෙන් වැඩිහිටියෙකු බවට පත්වීන විට හා ඔවුන්ගේ අවශ්‍ය සමාජ ප්‍රවනතා, ආකල්ප සහ සිතන පතන ආකාරය කෙරෙහි බලපවත්වනු ඇත.

මිනිසෙකුගේ වැඩීමේ විවිධ අදියර හඳුනා ගැනීමට වයස සාධකයක් ලෙස සලකනු ලබන නමුත් "යෞවනය" හෝ " නව යෞවනය" විස්තර කිරීමට නිශ්චිතව දෙන ලද වයසක් නිතරම නොමැත. වයසට අමතරව වෙනත් කරුණු කාරනා ළමයෙකු, තරුණයෙකු හෝ වැඩිහිටියෙකු බව තිරණය කිරීමට තිබේ. සමහර සමාජවල ස්ත්‍රී පුරුෂ බව, විවාහය, සම්ප්‍රදායයන් හෝ ආර්ථික හැකියාව වයසට වඩා සලකනු ලබන සාධකයෝ වෙති. කිසියම් හෝ සංස්කෘතික නිර්මාණයන්ගෙන් නිදහස්ව නව යොවුන් බව සහ තරුණ්‍යය සලකනු ලබන්නේ වයස අවුරුදු 18න් පහල සහ තවද තවදුරටත් නියමිත මග පෙන්වීම සහ අවධානය සඳහා අවශ්‍යය. (බලන්න 6 වන පර්ච්ඡේදය: දරුවා රැකීම සඳහා දරුවා යන්නට අර්ථ කථනය) ළමයන් හා නව යෞවනයන් අතර වෙනස හඳුනා ගැනීම වැදගත්ය. ඔවුන්ගේ වැඩීම අනුව කඳවුරු වටපිටාවේ යෞවනයන් මුහුණ පාන ගැටළු ළමයින්ගේ ගැටළුවලට සමාන වුවත් බොහෝ කරුණු අතින් යොවුන් ජීවිතය ළමයින්ගේ ජීවිතයෙන් බෙහෙවින්ම වෙනස් ය. තරුණයින් සහ නව යොවුන් තරුණයන්ගේ විශේෂිත අවශ්‍යතා සහායක වැඩසටහන් වලදී නිතරම සැලකිල්ලට නොගැනේ.

**කඳවුරුවල වෙසෙන තරුණ හා නව යොවුන් තරුණයන් වැඩිපුරම ගොදුරු විය හැක්කේ:**

- බලෙන් හෝ ස්වේච්ජාවෙන් බඳවා ගැනීමට
- බලෙන් වැඩට ගැනීමට.
- අධ්‍යාපනය ලැබීමට ඇති දුලබ බව
- ලිංගික ප්‍රචණ්ඩත්වය සහ උපයෝජනය
- එච්.අයි.වී./ඒඩ්ස් සහ වෙනත් ලිංගිකව බෝවෙන රෝගවලට ගොදුරුවීම (STIS)
- ගර්භනී බවට පත්වීම.
- ප්‍රජනන සෞඛ්‍ය සහ වෙනත් සෞඛ්‍ය රැකවරණ හා පහසුකම් වලට ඇති ඉඩ අල්ප වීම.
- ප්‍රමාණවත් සහයෝගයක් නොමැතිව වැඩිහිටියන් විසින් කරනු ලබන ආකාරයේ වගකීම් වලට මුහුණ පෑම
- අපරාධ
- මත්පැන් සහ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීම.

තරුණයින් විනෝදාත්මක සහා වෙනත් කඳවුරු ක්‍රියාවන් වල ක්‍රියාකාරිව නියුතුවීමේ බොහෝ වාසි ඇත. යෞවනයින් සඳහා කටයුතු ප්‍රවර්ධනය කරන පසුබිමක් තුළ මෙම කණ්ඩායම මෙකී වැඩසටහන් දියුණු කිරීමට ක්‍රියාත්මකව සම්බන්ධ වන අවස්ථාවලදී, යෞවනයින් කඩා කප්පල්කාරී කටයුතු වල සහ කඳවුරු මෙහෙයුමට සහ ස්ථාවරත්වයට හානිකර, අසුබවාදී ක්‍රියාවල නියුතුවීම අවම කරයි. පරිපූර්ණ යොවුන් වැඩසටහනක් මගින් අලස බව සහ උදාසීනත්වය අවම කෙරේ. සුළු අපරාධ, හොරකම්, ලිංගික ප්‍රචණ්ඩත්වය, එච්.අයි.වී./ඒඩ්ස්, එස්. ටී. අයි. වගේ ම මත්ද්‍රව්‍ය සහ මත්පැන් භාවිතයේ ආදීනව යනාදී කරුණු සම්බන්ධයෙන් යොමු කෙරේ. යොවුන් වැඩසටහන් මගින් සත්කාරක ප්‍රජාව සමග ධනාත්මක ආකාරයෙන් අන්තර් ක්‍රියාකාරීත්වයක් ඇති කිරීමට පිළිවන. ඒ මගින් සාමය ගොඩනැගීමට සහ අර්බුද විසඳීමට ද පිළිවන් වේ.

මේ කරුණු අනුව කඳවුරු පසුබිමක් තුළ යොවුන් වැඩසටහන් පැවැත්වීම ඉතා වැදගත් වේ. සාමාන්‍යයෙන් පවුල සහ සමාජය විසින් අනුමත කරණු ලබන තරුණයින් සම්බන්ධවන, ඔවුන්ට ප්‍රයෝජනවත් වන වැඩසටහන් අවශ්‍යයෙන්ම සංවර්ධන කටයුතු සහ සහයෝගය නිරන්තරයෙන්ම සපයනු ලබයි. විධිමත් යොවුන් වැඩසටහන් මගින් නව යොවුන් තරුණයින්ගේ කායික රැකවරණය සහ මානසික සංවර්ධනය ලබා දෙනවා ඇත.

**යොවුන් වැඩසටහන් සැකසීමේ දී පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගත යුතුය. ප්‍රජනන සෞඛ්‍ය**

- යොවුන් නායකත්වය සහ බලය පැවැරීම
- අර්බුද නිරාකරණය
- සාක්ෂරතාව සහ සමීප වන පරිදි පැවැත්වීම
- හසුරු කෞශල්‍ය පුහුණුව
- සමාජ, සංස්කෘතිය සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් සහ ක්‍රීඩා.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්

### කඳවුර සැළසුම සහ වැඩසටහන් ගත කිරීම.

කඳවුරු වල ළමයින්ට සහ තරුණයින්ට වැඩීමට, සොයා ගැනීමට සහ සෙල්ලම් කිරීමට නිදහස් ඉඩකඩ අවශ්‍ය වේ. හැම කඳවුරකම කළමනාකරුවෙකු විසින් සැලසුම් කිරීමේදී ප්‍රමාණවත් ඉඩකඩක් සෙල්ලම් කිරීමට සහ විනෝදවීමට සැපයිය යුතු වන අතර ඒවාද හැදීමේදී තරුණ හා ළමා නියෝජිතයින්ගේ සමීප සහභාගිත්වය ලබා ගත යුතුය. එවන් තැන් සඳහා ඉඩ සැලසීම හා සංවර්ධනය කිරීමේ දී සුරක්ෂිත බව සහ ආරක්ෂාවට ප්‍රමුඛත්වයක් දිය යුතුය. ලිංගික - සංවේදී එච්.අයි.වී./ඒඩ්ස් සඳහා ඇති සාපේක්ෂක වැදගත්කම සිත්හි තබා ගත යුතුය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීම්

- ***පහසුකම් සම්බන්ධ සුරක්ෂිතතාව:*** කණ්ඩායම මගින් ක්‍රීඩාපිටි වල සුරක්ෂිතාව සම්බන්ධ සෑම අංශයක් ගැනම සහතික විය යුතුය. පිවිසුම් මාර්ග සහ නිවෙස්වලට ඇති දුර ගැන සලකා බැලීම ද, මීට ඇතුළත් වේ. පරිශ්‍රයට ඇත පිවිසුම් මාර්ග රාත්‍රි කාලයේ මනාව ආලෝකවත් කළ යුතුය. ක්‍රීඩා සහ රංග පිටිවලයි ප්‍රමාණත්ව ජලය සැපයීම කළ යුතුය. ආරක්ෂාකාරී පිවිසුම් මාර්ග සහිතව, කිට්ටුව පාන බීමට, සේදීමට ජලය සහ වැසිකිළි පහසුකම් තිබිය යුතුය. නිතරම ගැහැණු ළමයින් සඳහා ප්‍රමාණවත් පෞද්ගලික භාවයක් සැලකිල්ලට ගත යුතුය. (බලන්න 5 වන පරිච්ජේදය: රැකවරණය: 6 වන පරිච්ජේදය: ළමා රැකවරණය 7 වන පරිච්ජේදය: ලිංගික ප්‍රචණ්ඩත්වය)

- ***බහුකාර්ය පරිශ්‍ර ගැන අවධානය:*** විනෝදවීමට ඉඩකඩ නැතිකම් "මධ්‍යස්ථාන වල" විවිධ ක්‍රීඩා සහ ක්‍රියාවන්ට අවස්තා සැලසිය යුතුය.

- ***ළමා සුරක්ෂිතතා පහසුකම්:*** විනෝදවීමට ඇති පරිශ්‍රයට කිට්ටුව දිවා සුරකම් මධ්‍යස්ථානයක් සාදවා දියුණු කිරීම ඉතා වැදගත් වේ. විශේෂයෙන් එක්ව නොපැමිණි නව යොවුන් මව්වරුන් විනෝදත්මක ක්‍රියාවන්වලට සහභාගිත්වයට උනන්දු කළ යුතුය.

- ***පරිශ්‍ර නීතිරීති:*** පරිශ්‍රය නඩත්තුව සඳහා නීතිරීති, සම්මත සහ නිසියාකාරව භාවිතය තහවුරු කළ යුතුය. මෙම නීතිරීති විවෘත තිබිය යුතු වේලාවන්, කුමණ ක්‍රියාවන්ට කුමන වොලවක ඉඩ දිය යුතු ද, වෙන් කරවා ගැනීමේ පහසුකම් වගේම නඩත්තුව සහ පවිත්‍ර කිරීමේ විධිවිධාන වලට ද අවධානය යොමු විය යුතු වේ.

- ***සමාන සහභාගිත්වය:*** සෑම තරාතිරමකම තරුණ පිරිස් වැඩසටහන් සැලසුම්වල දි නියෝජනය විය යුතුය. අබාධිත නව යොවුන් තරුණයින් සැලසුම් කිරීමේ සෑම අදියරකදීම සහ විවිධ කටයුතුවල දී ඇතුළත් වීම වැදගත්ය. අවශ්‍ය අවස්ථාවන්හිදී ක්‍රියාවන් වලට අබාධිත තරුණයන් සම්බන්ධකර ගැනීමට පෙළඹිවීමට සුදුසුවන පරිදි සකසා ගත යුතුවේ.

- ***වයස සහ ස්ත්‍රී පුරුෂ බව පිළිබඳ සලකා බැලීම:*** බොහෝ සංස්කෘතියන්හි පිරිමි ළමයින් සමග සසදා බැලීමේ දී ගැහැණු ළමයින්ගේ අභික්ෂාවන් වෙනස්ය. විශේෂයෙන්ම නව යොවුන් තරුණියන් ගෙදර දෙර වැඩකටයුතු සඳහා ගෙදරම තබා ගනී. කාන්තාවන් ඉලක්ක කරගත් ක්‍රීඩා සංවිධානය කිරීමෙන් නවයොවුන් තරුණියන්ගේ සහභාගිත්වය සමානව ලබා ගත හැකිය. මේ අවශ්‍යතාව සපුරා ගැනීම වගකිය යුතු ඒජන්සි ආයතන (ඇති අවස්ථාවලදී) ප්‍රජා සේවා නිළධාරි සහ කඳවුරේ විවිධ කමිටු මගින් කළ හැකිය. ඊට අමතරව වැඩිහිටි සහභාගිත්වය මගින් විවිධ පරම්පරාවන් එකට එක් කිරීම සුදුසු ක්‍රියා මාර්ගයක් වෙයි.

- ***ප්‍රජ සංවේදීකරණය:*** ගැහනු ළමයින් සහභාගිවීමට උනන්දු කරන කටයුතු නිතරම ප්‍රජා සංවේදීකරණය සමග බද්ධ කළ යුත්තේ මෙය වැදගත් වන්නේ ඇයි ද යන්න නිසාය. වගකිව යුතු ඒජන්සි ආයතනය / ප්‍රජා සේවා නිළධාරි සමග මේ කරුණු පිළිබඳව සම්බන්ධිකරණයක් තිබිය යුතුය. සුරක්ෂිතතා කරුණු සහ ස්ත්‍රී පුරුෂයන් වෙන් කර තැබීමේ. ඉඩකඩ (සමහර සංස්කෘතික පසුබිම් තුළ) කාන්තා සහභාගිත්වය ප්‍රර්වධනය කිරීමේදී ප්‍රවේශම් සහිතව සංවේදීකරණ ක්‍රමෝපායයන් සැකිසීමේදී සලකා බැලිය යුතුවේ

**කඳවුරු කළමනාකරණ කණ්ඩායම අවතැන්වූ ප්‍රජාවගේ විශේෂිත ජාතික නිවාඩු දින, උත්සව, පොළපාලි වගේම ජගත් නිවාඩු දින ද සැමරිය යුතුවේ. තමන්ගේ රටින් බැහැරව සිටින ජනයාට තමන්ගේ සම්ප්‍රදායන් ආරක්ෂා කිරීමට මෙය විශේෂයෙන් වැදගත්වේ. මෙම සැමරුම් උත්සව විවිධ විනෝදාත්මක සිද්ධි සහ ක්‍රීඩාවලට සම්බන්ධ කළ හැකිය.**

## තරුණයන්ගේ සහභාගිත්වය

සාර්ථක තරුණ වැඩ සටහන් බෙහෙවින් ම රඳා පවත්නේ තරුණයින් හා නව යොවුන් තරුණියන් සංවිධානය හා සැලසුම් කිරීමේ සෑම අවස්ථාවකදීම සම්බන්ධ කර ගැනීම මතය. ඔවුන්ගේ සම්බන්ධතාවය මගින් ඔවුන්ගේ අවශ්‍යතා තේරුම් ගැනීම, දැනුම සහ කඳවුරු කළමනාකරණ කණ්ඩායම සමග ධනාත්මක අන්‍යෝන්‍ය ප්‍රතික්‍රියාවන් සංවිධානය කළ හැකිවේ. කඳවුරු වැසි යෞවනයන්ගේ සෑම විවිධ කණ්ඩායමක්ම මේ වැඩසටහන් සැකසීමේදී හඬක් තිබිය යුතුය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ මුඛ්‍ය වගකීම්

- ***තරුණ නායකත්වය දිරි ගැන්වීම:*** කඳවුරේ දැනටමත් ඇති තරුණ නායකත්ව ව්‍යුහයන් සමග කණ්ඩායම් වැඩ කළ යුතුය. එසේ එවැන්නක් නොතිබේ නම් තරුණ කමිටුවක් පිහිටුවීම (තරුණයන් විසින් තරුණයන් වෙනුවෙන් පවත්වන) උනන්දු කළ යුතුය. මෙම කමිටුව වෙනත් කමිටු සහ නායකත්ව ප්‍රජාව විසින් පිළිගනු ලබන බව සනාථවිය යුතුය.

- ***සාකච්ඡා මණ්ඩප සඳහා දිරි ගැන්වීම:*** බොහෝ කඳවුරු වල තරුණයන්ගේ හැඟීම් නොසලකා හරිනු ලබන බව ප්‍රකාශවෙයි. විශේෂිත යොවුන් අවධානයන් සහ කරුණු සලකා බැලීම, මනා සම්බන්ධීකරණයක් සහ සම්බන්ධතාවක් ඇති කිරීම උදෙසා තරුණ නායකත්වය සහ කඳවුරු වැසි වැඩිහිටියෝ සමග විශේෂිත මණ්ඩලයක් නිර්මාණය විය යුතුය. තොරතුරු බෙදා හැරීම සහ සාකච්ඡා කළ යුතු දේවල් හඳුනා ගැනීම පිණිස තවත් හොඳ මගකි වැඩ මුළු පැවැත්වීම.

- ***තරුණයන් අද්විතිය ශික්ෂකයින් ලෙස:*** මැනවින් පුහුණු කරන ලද අද්විතිය ශික්ෂකයින් සාර්ථක මගකි. (තරුණයින් විසින් අනෙක් තරුණයන් දැනුවත් කිරීම) උදාහරණයක් ලෙස එච්. අයි. වි. / ඒඩ්ස් නිවාරණය සහ වෙනත් සුරක්ෂිතතාවන් ගැන සාර්ථකව දැනුවත් කිරීම සඳහා යොදා ගත හැකි මගකි. බොහෝ තරුණයින්ට, ඔවුන්ගේ අද්විතියන් ලිංගික කරුණු සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමේ ප්‍රධාන මාර්ගයක් ලෙස ක්‍රියාකාරීවෙයි. අද්විතිය ශික්ෂකයින්ට එක් එක් පුද්ගලයන් සහ වැඩි අවදානමක් ඇති කණ්ඩායම් කරා සාර්ථකව ළඟාවීමට පුලුවන්කම තිබේ.

**සියලුම දරුවන්ට සහ තරුණයින්ට ක්‍රීඩා කිරීමට සහ විනෝදාත්මක කටයුතු වල නියුතු වීමට අයිතියක් තිබේ. තමන්ට රුචිකර ක්‍රීඩා කටයුතු තෝරාගෙන පුහුණුවීමට ඉඩ කඩ තරුණියන්ට ලැබිය යුතුය. හරියාකාර මග පෙන්වීම සහ නායකත්ව පුහුණුව මගින් යොවුන් කණ්ඩායමයට, සැලසුම් කිරීම, සංවිධනය සහ විශේෂිත කටයුතු ක්‍රියාවට නැගීමට සහ ඔවුන් විසින්ම උත්සවශ්‍රීයෙන් ඉහළින් සැමරීමට හැකියාව තිබේ.**

# වෙනත් වගකිව යුතු ඒජන්සි ආයතනය සමග සම්බන්ධවීම:

- ***කටයුතු සුසංගතකිරීම සහ සම්බන්ධීකරණය:*** තරුණයන් සමග බහුවිධ ඒජන්සි ආයතනය කටයුතු කරන බැවින් සුසංගත කිරීමක් සහ එක සමානවීම වැලැක්විය යුතුය. මෙය විශේෂයෙන් වැදගත් වන්නේ අධ්‍යාපනය ලබා සහ සම්බන්ධවය. පාසල් කටයුතු වලින් අනතුරුව දෙන ඒජන්සි සමග සම්බන්ධකරණය කළයුතුය.

- ***සත්කාරක ප්‍රජාවගේ මැදිහත්වීම:*** සත්කාරක ප්‍රජාවගේ මැදිහත්වීම සහ අනෙකුත් කඳවුරු විනෝදාංග සහ තරගකාරි ක්‍රීඩා සඳහා උනන්දු කළ යුතුය. සත්කාරක ප්‍රජාවගේ තරුණ කණ්ඩායම් වලට සම්පවීම ඒකාබද්ධ වැඩසටහන් සාර්ථක වීමට අවශ්‍ය සහ ක්‍රමෝපායයන් ප්‍රවර්ධනය කිරීමටද අත්‍යාවශ්‍ය වේ.

- ***ප්‍රවාහනය සඳහා පහසුකම් සැළසීම:*** කඳවුරෙන් පිටත තරඟ සංවිධානය කරන අවස්ථාවලදී යාමට සහ ඒමට ප්‍රවාහන පහසුකම් සැලසීම අවශ්‍යය.



*ඉන්ගැස්හේතියානි ඇලිනා කඳවුර ගැහැණු ලමයින් තරුණ සමාජයෙහි ප්‍රසංගයන් ඉදිරිපත් කරන අවස්ථාව. ජායාරූපය රොආල්ඩ් හොව්රිං - NRC*

# මෙවලම් කට්ටලය

මෙවලම් කට්ටලය

***ඇගයීම් කට්ටලය: වයස අවුරුදු 13 - 17 අතර නවයොවුන් තරුණයින් සමග අර්ධ ව්‍යුහගත ප්‍රශ්න:*** මෙම ප්‍රශ්න මාලාව (ඇංගෝලා ළමා සුරකුම් ඇගයීමෙන් අනුවර්තනය කරගන්නා ලදි) අවතැන් වු වයස අවුරුදු 13 - 18 අතර නව යොවුන් තරුණයන්ගෙන්, සෞඛ්‍ය ක්‍ෂෙත්‍රය, ආරක්ෂාව, බලපොරොත්තු සුරක්‍ෂිත බව, සහභාගිත්වය පිළිබඳ ආකල්ප සහ අදහස් එක්රැස් කිරීමට ප්‍රයෝජනවත් වේ. මෙම ප්‍රශ්න මාලාව කඳවුරක් පිහිටුවන මුල් අවස්ථාවේදී අදල කණ්ඩායම ගැන තවමත් ඇත්තේ අල්ප දැණුමක් නිසා උදව් වේ. මෙම වයස් කණ්ඩය වෙනුවෙන් මෙවැන්නක් අරමුණු කර ගන්නේ, වැඩසටහනක් සැකසීමේදී කරුණු සහ අවශ්‍යතා හඳුනා ගැනීම පිණිසය. එමගින් තරුණ කමිටුවක් සඳහා ඇති අවශ්‍යතාව තේරුම් ගැනීම සහ තරුණ කමිටු සමාජිකත්වයට අවශ්‍ය තොරතුරු දැන ගැනීමට යොද ගත හැකිය. (හසුරු කෞශලයතා, පසුබිම, අවශ්‍යතා, ආදිය) මත්ද්‍රව්‍ය හා වෛශ්‍යා සේවනය වැනි සංවේදී කරුණු කෙරෙහි යොමු වු ප්‍රශ්නාවලිය හොඳින් උපදෙස් දෙනු ලැබූ අයවලුන් විසින් භාවිත, කළ යුතු ලේඛනගත කිරීමෙන් විචක්ෂණයෙන් හා රහස්‍ය බවකින් යොද ගත යුතුවේ. කඳවුරු කළමනාකරු විසින් කඳවුර තුළ ඇති අත්සන් ලබා දෙනු ලබන ඒජන්සි ආයතනය හෝ සමත් සේවකයන් සම්බන්ධ කර ගත යුතුවේ. (ඇති අවස්ථාවලදී) ප්‍රජා සත්කාරක නිළධාරියා හරි උපදෙස් ලබාදිය යුත්තේ කෙසේ දැයි යන්න පිළිබඳව සම්බන්ධ කරගත යුතුය.

***සරණගත කඳවුරු පිහිටුවීමේදී යොවුන් වැඩසටහන් වල සම්පත් සහ යහ පුරුදු - (IRC)*** අධ්‍යාපනය, විනෝදංශ, හසුරු කෞශලයතා පුහුණුව සහ කඳවුරු පිහිටුවීමේ සත්කාරක ප්‍රජා සහභාගිත්වය වැනි දැවෙන ක්ෂේත්‍රවල ඉතාමත් ප්‍රයෝජනවත් අදහස් සහ තරුණයන් බලගැන්වීම ප්‍රවර්ධනය කිරීමේ සම්පත් ලබා දෙනවා ඇත. මෙම ලියවිල්ල සකසනු ලැබ ඇත්තේ සියාරා ලියෝන්හි අධ්‍යාපනය, විනෝදංශ සහ තරුණියන් සම්බන්ධ අයි.ආර්.සි. (IRC) කටයුතු කිරීමේ අනු කණ්ඩායම විසිනි.

***පාපන්දු, වොලිබොල් සහ බාස්කට්බෝල් පිට්වල පළල සහ ප්‍රමාණය: අයි.ආර්.සි. (IRC) යොවුන් වැඩසටහන.*** පාපන්දු, වොලිබෝල් සහ බාස්කට්බෝල් පිටි සැළසුම් කිරීමේ දි නිවැරදි පරිමිතයන් මෙම සටහන්වලින් ලබා දෙයි.

# අවශ්‍ය කියවීම් සහ පරිශීලනය කළ යුතු ලේඛන

- **ක්ලින් එස් 1999,** "ක්‍රියාකාරී තරුණියන්ට" කෙසේ මග පෙන්විය යුතුද සරණාගත නව යොවුන් තරුණියන්ට ක්‍රියාකාරකම්, **ජාත්‍යන්තර ගලවා ගැනීමේ කමිටුව සඳහා (IRC) සන්නද්ධ අරගල වැඩසටහන්වල නියුතු ළමුන්.**
- **තරුණියන් සඳහා උපදේශන 1995,** ජිවිත සැලසුම් අධ්‍යාපනය, තරුණ සංවර්ධන පිළිබඳ වැඩ සටහනක් **වොෂින්ටන්**
- **සියරාලියෝන්හි සරණාගත කාන්තාවන් සහ දරුවන් සඳහා වන කාන්තා කොමිසම, නව යොවුන් සහ තරුණ සහභාගීත්ව පර්යේෂණ අධ්‍යාපනය, 2002,** වටිනා සම්පත් සියරා ලියොන්හි නව යොවුන් තරුණයන් පුනරුත්ථාපනය.
- ජිවන සැලසුම් කුසලතා: අප්‍රිකාවේ තරුණියන් සඳහා විෂය මාලාවක්, **1996. සෞඛ්‍ය සම්බන්ධ තාක්ෂණය සඳහා සුදුසු වන වැඩසටහන (Path)**
- **ජෙවිකස්, ආර් කෝන්වෝල් ඒ.** ජිවන කුසලතා සාම අධ්‍යාපන විෂයමාලා සම්බන්ධ ප්‍රජනන සෞඛ්‍ය විෂය මාලාව පියවර තැබිම. **දකුණු අප්‍රිකාව, (CERSA) වෛද්‍ය පර්යේෂණ කවුන්සිලය, දකුණු අප්‍රිකාවේ සැලසුම්ගත මාපිය සමාජය (PPASA) රිකායල් ජෙවිකස් සහ ඇන්ඩ්‍රියා කෝන්වේල් විසින් අනුවර්තනය කරන ලදී.**
- **IASC 2003.** හදිසි පසුබිමක් තුළ එච්.අයි.වී./ඒඩ්ස් මැදිහත්වීම් සඳහා නිර්ණායක.
- **සේව් ද චිල්රන් (Save the Children) එක්සත් රාජධානිය 2002.** එච්.අයි.වී. සහ අර්බුදය ද්විවිධ හදිසි අවස්ථාවක්
- www.righttoplay.com
- www. unhcr.ch
- www. unicef.org
- www. womencommission.org
- www. child-soldiers.org
- www. icrc.org
- www.theirc.org
- www. savechildren.org.uk

අවපතනය කිරීම සඳහා මෙතැන "ක්ලික්" කරන්න.
අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සඳහා ප්‍රශ්න

## අ. පොදු

වගඋත්තරකරු පිරිමි ළමයෙකි ☐ ගැහැනු ළමයෙකි ☐

1. ඔබේ වයස කීයද?

2. ඔබ පැමිණියේ කොහි සිටද?

3. ඔබ පැමිණියේ ඔබේ දෙමාපියන් / පවුලේ සාමාජිකයෙකු සමග ද?

4. ඔබ පැමිණි ගමන විස්තර කරන්න පුලුවන් ද?

5. ඔබ කොපමණ කලක් මෙහි ඉන්නවා ද?

6. තරුණයින් තවමත් මෙහි එමින් සිටිත්ද? ඔවුන් එන්නේ කොහි සිටද?

7. මෙහෙන් තරුණයින් අත්හැර යනවාද? ඔවුන් යන්නේ කොයිබට ද?

8. ඔවුන්ගේ දෙමාපියන්ගේ දරුවෝ ලෙස ගෘහ මූලික ලෙස කටයුතු කරන කවුරු හෝ තරුණයෙකු සිටිද?

## ආ) නියෝජනය

1. නායකත්ව ව්‍යුහය තුළ කවුරු හෝ තරුණ නියෝජනයක් තිබෙනවාද? පිලිතුර "ඔව්" නම් කොපමණ සංඛ්‍යාවක් සිටි ද? ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය කුමක්ද? පිළිතුරු "නැහැ" නම් තරුණයන්ට අදාල කරුණු යොමු කරන්නෙ කෙසේ ද?

2. එහි තරුණ කණ්ඩායමක් තිබේ ද? "ඔව්" නම් කොපමණ සංඛ්‍යාවක් ද? ඔවුන් කරන්නෙ කුමක් ද ?

## ඇ) ආරක්ෂාව

1 සන්නාරක ප්‍රජාවගේ කණ්ඩායම් එහි සිටිද / කඳවුරේ තරුණයින්ගෙ අනාරක්ෂිත බවක් පෙනේ ද? "ඔව්" නම් කොහේ ද? කුමක් නිසා ද?

2 ඔබට සුරක්ෂිත බවක් ආනාරක්ෂිත බවක් (කොටස් වශයෙන්) කඳවුරු තුළ දැනේ ද?

3. තරුණයින් සම්බන්ධයෙන් සැලකිල්ලට ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර මොනවාද? ඇයි?

4. මෙම ප්‍රදේශයේ බිම් බෝම්බ තිබේ ද?

5. ඒවා ස්ථාන ගත කර ඇත්තේ කොහි ද?

6. එවා කිනම් ආකාරයේ ඒවා ද?

7. ගෙවී ගිය 12 වසර තුළ බිම් බෝම්බ නිසා මිය ගිය ළමයින් ගැන ඔබ දන්නවා ද? පිළිතුරු "ඔව්" නම් කිනම් ආකාරයේ ඒවා ද?

8. බිම් බෝම්බයකින් ළමයෙක් මිය ගිය හෝ තුවාල වූ අවස්ථාවල ඔවුන් කළේ කුමක්දැයි ඔබ දන්නවා ද?

## ඇ) බලාපොරොත්තු / සිහින

1. ඔබ දේවල් දෙකක් ගැන ප්‍රාර්ථනා කරන්නෙ නම් ඒ මොනවාද?

2. ඔබ රාත්‍රි කාලයේ දකින්නේ කුමන සිහිනයක් ද?

3. අනාගතයේ දී ඔබ කරන්නෙ අපේක්ෂා කරන්නේ කුමක් ද? එය සපුරා ගන්නට අපේක්ෂා කරන්නේ කෙසේ ද?

4. ඔබට හැකිනම් දැන් ඔබේ ජීවිතයේ අත්විඳීමට කැමැති වෙනස කුමක් ද?

## ඉ) මානසික

1. අනාරක්ෂිත ලිංගික කටයුතු සහ මත්ද්‍රව්‍ය භාවිතය වැනි අවදානමට ලක්වන කටයුතුවල නියැලෙන තරුණයන් ඉන්නේදැයි ඔබ දන්නේ ද? පිළිතුරු "ඔව්" නම් කොපමණ සංඛ්‍යාවක් (වයස සහ ස්ත්‍රී පුරුෂ බව) ද?

2. තරුණයින් මත්ද්‍රව්‍ය ගනි නම්, ඔවුන් එය පටන් ගන්නා විට වයස කුමක් ද සහ ඔවුන් භාවිතා කරන්නේ කුමන මත්ද්‍රව්‍ය ද?

3. මෙම සමාජයේ තරුණයින් විසින් මුහුණපාන ගැටළු මොනවා ද?

4. **"යම්" ගැටළුවක් හෝ ඕනෑකමක් ඇති විට තරුණයින් යන්නේ කා වෙත ද?**

5. **තරුණයිනන් සඳහා මේ සමාජයේ ඇති සේවා/ක්‍රියාකාරකම් මොනවා ද?**

6. විවේකයට ඔබ කරන්න කැමැති කුමක් ද? විනෝදවීම ද? (ප්‍රජාව සිටින ස්ථානයේ කටයුතු වලට සහභාගිවීම)

7. ඔබ වැරදි යමක් කරන විට ඔබේ දෙමාපියන්, කැපකරු මාපියන්, ආරක්ෂකයින් කරන්නේ කුමක් ද?

## ඊ) සෞඛ්‍යය

1. ගැහැනු ළමයින් විවාහ වන්නේ කිනම් වයසේ ද? පිරිමි ළමයින් කිනම් වයසේ ද?

2. ගැහැනු ළමයින් ඔවුන්ගේ පළමු දරුවා ලබන්නේ කිනම් වයසේ ද?

3. මෙම සමාජය තුළ විවාහ නොවූ එහෙත් දරුවන් සිටින ගැහැනු ළමුන් සිටී ද?

4. මෙම සාමජයේ තුළ නිත්‍යානුකූලව විවාහ නොවූ මවුවරුන් සහ තරුණ මව්වරුන්ට සහායවන යම් සේවාවක් තිබේ ද?

5. තරුණයන් සඳහා බලපාන ප්‍රධාන සෞඛ්‍ය ගැටළු මොනවා ද?

6. තරුණයින් අසනීප වූ විට යන්නේ කොයිබටද?

7. තරුණයින්ට පාසැල් වලදී ප්‍රජනන සෞඛ්‍ය ලැබේ ද? එසේ නොවේ නම් ඔවුන්ට ප්‍රජානන සෞඛ්‍ය පිළිබඳ තොරතුරු (එච්.අයි.වී./ඒඩ්ස්, ආරක්ෂිත ලිංගික සේවනය ආදිය) වෙනත් තැනකින් ලැබේ ද? (සායන, දෙමාපියන්, වැඩිහිටියන්) කරුණාකර පැහැදිලි කරන්න.

8. තරුණ කොටස් අතර ස්ත්‍රී දූෂණය හා ලිංගික අපයෝජනය පවතී ද? පිළිතුරු "ඔව්" නම් කරුණාකර ව්‍යාප්තිය පැහැදිලි කරන්න.

## ළ) අධ්‍යාපනය

1. ඔබ පාසල් යන්නේ ද? පිළිතුරු "ඔව්" නම් කුමක් නිසා ද? අධ්‍යපන ලබන්නේ කුමන ශ්‍රේණියේ ද? කොපමණ කාලයක් තුළ ද? නොමැතිනම් හේතුව කුමක් ද?

2. තරුණයින් අඛණ්ඩව පාසල් නොයැමට හේතුව කුමක් ද? තරුණයින් පාසැල් යැම වළක්වාලන බාධාවක් තිබේ ද?

3. යාබදව පාසලක් තිබේ ද?

4. පාසැල් එන අය මුහුණ පාන ගැටළු ඇතිනම් ඒ මොනවා ද?

5. ගැහැනු ළමයින්ට ගුරුවරුන්ගෙන් හෝ පාසලේ වෙනත් ශිෂ්‍යයන්ගෙන් විශේෂිත ප්‍රශ්න තිබේ ද?

6. පාසැල්වල විනෝදාංශ තිබේ ද? ඒවා කුමක් ද? ඔබ ඒවාට සහභාගිවන්නේ කුමක් නිසා ද? සහභාගි නොවේ නම් ඒ ඇයි?

## ළු විනෝදාංශ

1. කඳවුරට පැමිනිමට පෙර ඔබ විසින් කරන ලද ක්‍රියාකාරකම් මොනවා ද?

2. ඔබ සහ ඔබගේ මිතුරන් දැනට කඳවුරු තුළ කරනු ලබන ක්‍රියාකාරකම් මොනවා ද?

3. මෙම කඳවුර තුළ ඔබ විසින් කිරීමට කැමැති ක්‍රියාකාරකම් කුමක් ද?

4. ඔබට සහ ඔබේ මිතුරන්ට ක්‍රීඩා කිරීමට/නිතර යැමට/විනෝදවීමට අවස්ථාවන් ඇතැයි සිතන්නේ ද?

5. මේ වාගේ ක්‍රියාකාරකම් කිරීම සඳහා ප්‍රමාණවත් විවේකයක් තිබේ ද?

6. ඔබ වැනි තරුණියන් වෙනුවෙන් මේ කඳවුරේ දියුණු කළ යුත්තේ කුමක් ද?

7. ඔබට / ඔබේ වයසේ ගැහැනු ළමයින්ට මෙම ක්‍රියාකාරකම් සහ ක්‍රීඩා සඳහා ඒ අකාරයෙන් ම අවස්තාවන් තිබේදැයි හිතන්නේ ද?

## චු) අවදානම් සහිත බව

1. විශේෂිත අවශ්‍යතා ඇති තරුණ කණ්ඩායම් මෙහි සිටිද? පිළිතුරු "ඔව්" නම් ඒ කවුරුන් ද? කුමනාකාර ද?

2. මෙම සමාජයේ තරුණයින්ට බෙහෙවින් ම බලපාන ගැටළු සහ කරුණු මොනව ද? (කරුණාකර පහත සඳහන් ප්‍රතිචාර රවුම් කර දක්වන්න.)
   - අනාථ වී ඇත
   - සටන් වැද සිටින හමුදාවන්ට බඳවා ගැනීම
   - පැහැරගෙන යෑම
   - බලෙන් වැඩ ගැනීම
   - කායික හිරිහරයට ලක්විම
   - ලිංගික හිංසනය
   - වෙනත් ....................................... (කරුණාකර විස්තර කරන්න)

3. ඔබගේ වයසේ සිටින කඳවුරේ යම් තරුණයෙක් අතුරුදහන්වී ඇති බව ඔබ දන්නෙහිද ? (සංඛ්‍යාව /ස්ත්‍රී පුරුෂ බව)

4. පිළිතුරු "ඔව්" නම් හේතුව කුමක්දැයි ඔබ විශ්වාස කරන්නේ ද?

5. ඔවුන් දැනට ඉන්නෙ කොහිදැයි ඔබ හිතන්නේ ද?

6. වෙනත් තැනක වැඩට ගිය තරුණයින් සිටි ද?

7. ඔවුන් එම වැඩ සොයා ගන්තේ කෙසේ ද?

8. ඔවුන් ඒ සඳහා කවරෙකුට හෝ ගෙවීමක් කරන ලද ද? නැතහොත් යම් වැඩක් ලබා ගැනීමට යම් මුදලක් ලැබුනේ ද?

9. යම් පිරිමි ළමයෙක් හෝ ගැහැනු ළමයෙක් වෛශ්‍යා සේවනයෙහි යෙදුන බවක් ඔබ දන්නේ ද?

10. පිළිතුරු "ඔව්" නම් පිරිමි ළමයින් කිය ද? ගැහැනු ළමයින් කිය ද? ඔවුන්ගේ සාමාන්‍ය වයස් කිය ද?

11. ඔබේ වයසේ ගැහැනු ළමයින්ට මෙම කඳවුරේ ජිවත්විම දුෂ්කරද? පිළිතුර "ඔව්" නම් එසේ වන්නේ ඇයි?

## ඒ) හුදකලාව පැමිණි අය

1. කඳවුරට තනිව ආ තරුණයින් සිටද? කී දෙනක් ද? (වයස ස්ත්‍රී පුරුෂ බව)

2. ඔවුන් වෙසෙන්නේ කොහි ද? ඔවුන් ගැන බලන්නේ කවුරුන් ද?

3. ඔවුන්ගෙන් කවරෙකු හෝ කඳවුරෙන් පිට වෙසෙන්නේ ද?

4. ඔවුන්ගේ දෙමාපියන් /රැකවලුන් අහිමි වුයේ කෙසේදැයි ඔබ දන්නේ ද?

## ඔ) ළමා ශ්‍රමිකයින්

1. ඔබ වැඩ කරන්නේ ද? පිළිතුරු "ඔව්" නම් ඔබ කරන වැඩය කුමක් ද?

2. ඔබ ලබන ප්‍රතිලාභය කුමක් ද?

3. ඔබගේ වයසේ තවත් තරුණයින් වැඩවල නියුතු වෙනවා ද?

4. ඔබ කරන්නේ කුමනාකාර වැඩක් ද? කොයිබ ද? කොපමණ කාලයක් ද ? කා සඳහා ද? (ගෙදර වගකීම් ගැන ද විමසන්න)

5. තරුණයින් වැඩ කරන්නේ ඇයි?

6. එය පවුලට ඵලදායක වන්නෙ කෙසේ ද?

7. ඔබට සහ ඔබගේ වයසේ අයට මෙලෙස වැඩ කිරීම සඳහා අත්හැරිය යුත්තේ කුමක් ද?

## ක) ආබාධිත

1. මෙම ප්‍රජාව අතර කායිකව සහ මානසිකව ආබාධිත වූ අය සිටිදැයි ඔබ දන්නේ ද? (කොපමණ පිරිසක් ද සහ ස්ත්‍රී පුරුෂ බව)

2. ඔබ ඔවුන් දුටුවේ කොහේ ද?

3. ඔවුන්ට ඇති ආබාධිත බව කුමණාකාර ද?

4. මේ ආබාධිත යම් තරුණයෙක් පාසැල් හෝ විනෝදාංශවලට/ප්‍රජා ක්‍රියාකාරකම් වලට පැමිණෙන්නේ ද? පිළිතුරු "ඔව්" නම් කුමනාකාර ක්‍රියාකාරකම් වලට ද? පිළිතුරු "නැත" නම් එසේ වන්නේ ඇයි ද?

5. ආබාධිත තරුණයින්ට කුමන සේවාවන් සපයනු ලබන්නේ ද? ආබාධිත තරුණියන්ගේ පවුල්වලට කුමනාකාර සේවාවන් සපයනු ලබන්නේ ද?

## කා) වෙන් වූ දරුවන්/කැපකරු දරුවන්

1. මෙම සමාජය තුළ දෙමාපියන් හෝ රැකවලුන් ගෙන් වෙන් වූ යම් තරුණයෙක් සිටී ද? පිළිතුරු "ඔව්" නම් කොපමණ සංඛ්‍යාවක් ද? (වයස සහ ස්ත්‍රී පුරුෂ වශයෙන්)

2. මෙම තරුණයින් වෙසෙන්නේ කොහි ද? කා සමග ද?

3. තරුණයින් එම ස්ථානය පිවිත්වීමට සොයාගනු ලැබුවේ කෙසේ ද?

4. මේ වෙන්වූ / කැපකරු දරුවන් සහ කැපකරු පවුල් සඳහා සහාය සලසන වැඩපිළවෙලක් හෝ කණ්ඩායමක් තිබේ ද? පිළිතුරු "ඔව්" නම් ස්වරූපය, ඉලක්කගත පිරිස සහ සපයනු ලබන සේවාවන් මොනවා ද?

## කැ) අර්බුදයට ලක් වූ දරුවන් පිළිබඳ නීතිය

1. නීතිය සම්බන්ධයෙන් අර්බුදයට ලක් වූ තරුණයින් මෙම ප්‍රජාව තුළ සිටී ද? පිළිතුරු "ඔව්" නම් කොපමණ සංඛ්‍යාවක් ද? ඔවුන්ගේ වයස සහ ස්ත්‍රී පුරුෂ බව)

2. කුමනාකාර හෝ අපරාධ සම්බන්ධයෙන් තරුණයින් අත් අඩංගුවට ගෙන තිබේ ද?

# ජාත්‍යන්තර ගලවා ගැනීමේ කමිටු - තරුණ වැඩසටහන

## සරණාගත කඳවුරක තරුණ වැඩසටහන්-සම්පත් සහ යහ පුරුදු

කඳවුරු කළමනාකරණය පිළිබඳ මෙහෙයුම් ව්‍යාපෘතිය යටතේ සකසන ලදි

අධ්‍යාපනය, විනෝදාංශ සහ තරුණියන් පිළිබඳ උප - ක්‍රියාකාරී කණ්ඩායම.

සරණාගත කාන්තාවන් සහ ළමයින් (කාන්තා කොමිෂම සඳහා වන කාන්තා කොමිෂම මගින් කරන ලද අධ්‍යයන ප්‍රයෝජනයට ගත හැකි අභාවිත සම්පත් : සන්නද්ධ අරගලවලින් බලපෑමට ලක් වූ නව යොවුන් තරුණ වැඩසටහන් විශ්ලේෂණය සහ ප්‍රතිපත්ති, සන්නද්ධ අර්බුද හෝ සරනාගත තත්ත්වයන් යටතේ නව යොවුන් තරුණයින්ට බලපාන විශේෂිත අවදනම් සම්බන්ධව පහත දැක්වෙන තොරතුරු හඳුනා ගනු ලැබ ඇත.

- හමුදා සේවයට බඳවා ගැනීමේ අවදනම වැඩිවී ඇත.
- පාසැල් වලට පැමිණීම අඩුවීමක් ඇත.
- ආර්ථික සුරාකෑමේ සිද්ධි වල වැඩිවීමක් ඇත.
- කාන්තාවන් අතර ලිංගික අපයෝජනය පිළිබඳ සිද්ධි වැඩවීමක් ඇත.
- එච්. අයි. වී. / ඒඩ්ස් හා ලිංගික ආසාදනවලට ගොදුරුවීමේ වැඩි අවදනමක, ගැබිනි බවට පත්වීමේ සහ ස්ත්‍රී දූෂණ සිද්ධි වැඩිවීම.
- ප්‍රජන සෞඛ්‍ය හා වෙනත් සෞඛ්‍ය ආරක්ෂිත තොරතුරු ලබා ගැනීමට ඇති අවකාශය අඩුබව. වෘත්තියක් ඉගෙනීමට ඇති අවකාශය අඩු බව
- බාල වයස්කාර එකම දෙමාපියන්ගේ ලේ නෑයන් ගැන සොයා බැලීමේ වගකීම ද ඇතුළුව ප්‍රමාණවත් සහයොගයක් නොමැතිව වැඩිහිටියන්ගේ වගකීම් වැඩිවීම.

මෙම හේතුව නිසා කඳවුර තුළ තරුණයින්ගේ සුබවිහරණයට වඩා ආරක්ෂාව අවශ්‍ය වන්නේය. ජාත්‍යන්තර ගලවා ගැනීමේ. කමිටුවේ යොවුන් වැඩසටහන් අග්නිදිග සියරා ලියෝන්, බටහිර අප්‍රිකාව, ගෙරහුන්, ගොංඩමා සහ ජෙම්බේ වල සරණගත කඳවුරු තුනක ක්‍රියාත්මක කර ඇත. මෙම ලියවිල්ල මගින් "යහ පුරුදු", තරුණ වැඩසටහන් සැකසීමේ දී වගේ ම එසේ කිරීමට යම් පාදක තොරතුරු, මග පෙන්වීමක් ලෙස ඉදිරිපත් කිරීම අදහස් කෙරේ. "යහ පුරුදු සහ මෙහිදි සැලකිල්ලට ගෙන ඇති සම්පත් මගින් ඉහත දැක්වූ අවදනම් සහ යෝජිත ක්‍රමවේද කෙරෙහි යොමු කිරීමට සහ අවදනම් අවම කිරීම පැහැදිලි කර ඇත.

## වැඩසටහනට සම්පවීම - යොවුන් බලගැන්වීම

කාන්තා කොමිෂම, තරුණයින් බල ගැන්වීම, හෝ සැලසුම් කිරීමේදී නව යොවුන් තරුණයින් ක්‍රියාකාරීව සම්බන්ධ කර ගැනීම, ක්‍රියාත්මක කිරීම සහ ඔවුන් වෙනුවෙන් මැදිහත්වීම ඇගයීම, ළමයින් සහ නවයොවුන් තරුණයින් වෙනුවෙන්, තීරණ ගනු ලබන අයවලුන් විසින් සම්පවීමක් ලෙස බෙහෙවින් හඳුනාගෙන ඇත. තරුණයින් බල ගැන්වීම පිළිබඳ සංකල්පය විවිධාකාරයෙන් ක්‍රියාත්මක කළ හැකිය.

- තරුණ නායකත්වය ප්‍රවර්ධනය කිරීම: කඳවුරු වල තරුණ නායකත්ව ව්‍යුහයන් සමග කටයුතු කිරීම දැනටමත් පිහිටුවා ඇත. (උදා:- තරුණ විධායක කමිටුව)

- තරුණ ක්‍රියාකාරීත්ව කණ්ඩායම්, කමිටු හෝ තරුණ අවශ්‍යතා හඳුනා ගනු ලැබූ සමාජ පිහිටුවීම. ඔවුන්ගේ කමිටුවට පවරා ඇති අවශ්‍යතා ගැන අමතනු ලබන ක්‍රමවේද ඉදිරිපත් කිරීම සහ ප්‍රමුඛ අවශ්‍යතා පිළිබඳ වගකීම තරුණයින්ට තිබිය යුතුය. (උදා:- තරුණ අධ්‍යාපන සමාජ, තරුණ කුසලතා පුහුණු කිරීමේ, සමාජ, තරුණ සංවර්ධනය පිළිබඳ කැපවන සමාජ, තරුණ විනෝද කමිටු.)

- අවධාරණය ඉවත් කිරීම හෝ දිරි ගැන්වීමේ නිර්මාණාත්මක භාවිතය අතීතයේ දී නිර්මානය කරන ලද යොවුන් වැඩසටහන් අවධාරණය කර ඇත්තේ තරුණ සහභාගිත්වය ලබා ගැනීම පිණිස දිරගැන්වීම යොදා ගැනීම හෝ යම් නිශ්චිත ක්‍රියාකාරකමක් සඳහා පහසුකම් සැලසීමය. දිරි ගැන්වීම පවත්වා ගෙන යා නොහැක. තමන් විසින්ම වැඩසටහන් ගත කොට සැලසුම් ක්‍රියාත්මකට කිරීමට තරුණයන්ගේ හැකියාව ගොඩනැගීම ඔවුන් විසින්ම පවත්වාගෙන යා හැකිය. සේවායෙහි දී උගැන්ම (සේවය මගින් උගැන්ම සහ හැකියා වර්ධනය) සහ ප්‍රජා සේවා හිමිකම පිළිබඳ ආදර්ශයක් ලෙස යොදා ගැනිමට පුලුවන් වගේම අදල තරුණයින්ට ඇමැතිමේදී වගකීම ලෙස ගත හැකිය.

- ආදයම් ජනනය දිරිමත් කිරීම - කුසලතා හුරුව තමන්ටම දැරිය හැකි මගක් ලෙස දැකිය හැකිය. කුමන හැකියාවක් පුහුණු කළ යුතුදැයි තීරණය කිරීමේ දී, කුමන වෘත්තියක් මගින් ආදයම් ජනනය කිරීම උදෙසා හේතුවේදැයි තීරණය කිරීම පිණිස වෙළඳ පොළ පිළිබඳ විශ්ලේශනයක් කළ යුතුය. පහසුකම් සලසන්නන්ට වෘත්තිය යොදගෙන ඔවුන් විසින් ම ආදයම් ජනනය කිරීමට හැකියාව තිබිය යුතුය. නිෂ්පාදන වියදම් සහ ව්‍යාපාරික හැකියා කළමනාකරණය ප්‍රවර්ධනය කිරීමට වැඩසටහන් මගින් සහාය ලබාදිය යුතුය.

තරුණ බල ගැන්වීම / තක්සේරු කිරීමේ මෙහෙයුම් සම්පත්:

* **ඇංගෝලාවේ ළමා සුරකුම මැන බැලීමේ කොංසෝටියමය.**

  - **ඔවුන්ගේ අවශ්‍යතා මැනබැලීම පිණිස ඔවුන්ගේ ම දෘෂ්ටි කෝණයෙන් නව යොවුන් තරුණයන් සමග සම්මුඛ සාකච්ජාවට අර්ධ ව්‍යුහාත්මක ප්‍රශ්ණ මාලාවක් - අමුණුම බලන්න.**
  - ප්‍රජාව සමග සම්මුඛ සාකච්ජාව සඳහා අර්ධ ව්‍යුහාත්මක ප්‍රශ්ණ සහ/හෝ තරුණ නායකත්වය- ඇමුණුම බලන්න.

# වැඩසටහන් සංරචක

## අධ්‍යාපනය

- ***අධ්‍යාපනික සහාය:*** සේවා පුහුණු ආකෘතිය යොද ගෙන ස්වේච්ජා ගුරුවරුන් බඳවාගෙන කුඩා කණ්ඩායම් මගින් තරුණයන්ට පුහුණුව ලබා දී, සහාය විය හැකිය. ස්වේච්ජා ගුරුවරුන්ට ප්‍රතිලාභ වශයෙන් පරිපූර්ණ සහතිකයක් සහ ද්විතියක පාසල් වලට ශිෂ්‍යත්ව ලබාදීමෙන්, සේවාදායක වැඩසටහනක් සඳහා ඉල්ලුම් කළ හැකිය.

* ***පාසැල්වලට පැමිණීම නිරීක්ෂණය කිරීම:*** දේශීය ගුරුවරුන්ගේ සහයෝගයෙන් දෙමාපිය සංගම් හෝ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේ පාර්ශ්වකරුවන්ට සහ පාසල් ක්‍රම, වැඩසටහන් කාර්ය මණ්ඩලයට, පාසල් නොයන තරුණයින් ගැන පසු විපරම් කිරීම සහ උපදේශනය පැවැරිය හැකිය.
* ***උසස් ද්විතියික සහ ප්‍රාන්ත ආයතනවලට ඇතුළුවීම උනන්දු කිරීම***: ප්‍රදේශියව ද්විතියික පාසල් නොමැති නම් උසස් ද්විතියික නේවාසික පාසල්වලට යැම සඳහා ශිෂ්‍යත්ව ලබා දීමට ප්‍රතිපාදන ලබාදිය හැකිය. විශ්ව විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා ශිෂ්‍යයන් "වස්සි" (WASCE) විභාගයට සුදුසුකම් කිරීම පිණිස දුරස්ථ අධ්‍යාපන පාඨමාල තිබේ. කඳවුරු ප්‍රජාවට සේවය සැළසීමේ නියුතු තරුණයින්ට නිර්මාණාත්මක දිරිදීමක් වශයෙන් ශිෂ්‍යත්ව ලබාදීම සහ විභාග ගාස්තු ලබාදීම මගින් උසස් අධ්‍යාපනයට පිවිසීම දිරිමත් කළ හැකිය.

## අධ්‍යාපනික සම්පත්

* ජාත්‍යන්තර ගලවා ගැනීමේ - කොමිසම පන්ති කාමර සහායක සුරකුම් පුහුණු කිරීමේ මෙහෙවර අත්පොත දැනට අයි. ආර්. සි. IRC උපදේශක ඇන් පිට්ස්පෙරාල්ඩ් විසින් සකසමින් පවතී. (2003 මැයි) මෙම විෂයමාලාව මගින් හැකියාව ඇති තරුණයින්ට ගුරුවරුන් ලෙස පුහුණු කිරීමට යොදා ගත හැකිය.

* ඒඩිඊඕ (ADEO) WASCE විභාගයට තරුණයින් සුදනම් කිරීම පිණිස දුරස්ථ ඉගැන්වීමට අවකාශ සලසන කෙන්යාවේ රාජ්‍ය නොවන සංවිධානයක් අමතන්න : පෙලිඩා අසාවා මහත්මිය, අධ්‍යාපන සම්බන්ධිකාරක, 10, ස්වාරේ විදිය, කණේමා. සියරා - ලියෝන්

## කුසලතා පුහුණුව

* ප්‍රජා විශ්ලේෂණදායින් සහ සම්පත් යොද ගැනීම- කුසලතා සම්පන්න දේශීය ප්‍රජා සමාජිකයින් සහ සංවිධාන හෝ කුසලතා පුහුණු කිරීමේ නියුතු වුවන් හඳුනා ගැනීමට ප්‍රජා සාමාජිකයින්ට ද්‍රව්‍ය ද යොද ගෙන කුසලතා පුහුණු වැඩසටහන් පවත්වා ගෙන යැමට හැකියාව ඇත. (උදා:- උපකරණ හා මෙවලම් ආදිය.) ආදයම් ජනනය කරන ව්‍යාපෘතිය ඇති කිරීම පිණිස ද්‍රව්‍යමය උදව් සහ සහාය සැපයීම වස් වැඩසටහන සහ සංවිධානය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ හැකිය.

## කුසලතා පුහුණුව සඳහා සම්පත්

* IRC ජාත්‍යංතර ගලවා ගැලීමේ කොමිෂමේ තරුණ වැඩසටහන් සාම්පලය "අවබෝධතා ගිවිසුම" කුසලතා පුහුණුව ලබාදීම පිණිස ප්‍රජා කණ්ඩායම් සම්බන්ධ කර ගැනීමට යොද ගත හැකිය. ඇමුණුම බලන්න.

* ඒ.ආර්.සි. (ARC) ජාත්‍යන්තරය - කුඩා ප්‍රමාණයේ ණය පහසුකම් සලසන අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධානයකි. වෙළඳ පොළ සමීක්ෂණය ඇතුළුව ව්‍යාපාරික කළමනාකරණ කුසලතා පුහුණුව ලබාදිය හැකි ආයතනයකි. සරණාගත ප්‍රජාවට කුඩා ණය වැඩසහන විවෘතව නැත. අමතන්න: මාර්සෙලා විල්ස් කුඩාණය වැඩසටහන සම්බන්ධිකාරක 16, රිවර්සයිඩ් ඩ්‍රයිව්, කිංස් හරමින් පාර, පිටත, බෲක්පිල්ඩ්ස්, ෆ්‍රීටවුන් සියාරා- ලියෝන්

## විනෝදංශ / සංස්කෘතිය

* ***ක්‍රීඩා කිරීමට ඇති අයිතිය:*** සියලුම ළමයින්ට සහ තරුණයින්ට විනෝදාත්මක ක්‍රියාකාරකම් වල නියැලීමට හිමිකමක් ඇත. තරුණයින්ට තමන් කැමැති ක්‍රීඩා තෝරා ගෙන නියැලීමට ඉඩ සලසන්න. නියම මග පෙන්වීම සහ තරුණ නායකත්ව පුහුණුව, තරුණ විනෝදංශ කමිටුව හෝ සමාජයට විශේෂිත වැඩසටහන් සහ උත්සව සැලසුම් කිරීම, සංවිධානය සහ ක්‍රියාත්මක කිරීම පිණිස හැකියාව තිබේ.

## විනෝදාත්මක සම්පත්

* "ක්‍රීඩාවට අයිතිය" කලින් මෙය හැඳින් වුයේ "ඔලිම්පික් ඒඩ්" නමිනි. 2003 මැයි වල සියරා-ලියෝන්හි කෙනෙමාවල විවෘත කරන ලද උප කාර්යාලයකි. මෙම සංවිධානයට තරුණයින් ක්‍රීඩා කටයුතු සඳහා පුහුණුව සහ ද්‍රව්‍යමය සහාය ලබාදීමට හැකියාව ඇත. "අර්බුද විසඳුම" සහ "මනා ක්‍රීඩාකාරීත්ව ප්‍රවර්ධනය" පිළිබඳ විෂය මාලවක් ද ඇත.

## ජීවන කුසලතා / සාම අධ්‍යාපනය

- ***කාර්ය සැසි සහ සංවේදීකරණ ව්‍යාපාර ප්‍රවර්ධන:*** - තරුණයින්ට අදාල කරුණු සම්බන්ධ විවිධ විෂයමාලා ගණනාවක් ඇත. මෙම තොරතුරු බෙදා හැරීමට කාර්ය සැසි සහ සංවේදීකරණ ප්‍රවර්ධන වැඩසටහන් යොදා ගත හැකිය.

## *ජීවන කුසලතා / සාම අධ්‍යාපනය විෂය මාලා සම්පත්දායකත්ව:*

* ප්‍රජනන සෞඛ්‍ය විෂය මාලාවක් සඳහා පියවර තැබීම, CERSA මගින් දකුණු අප්‍රිකාවේ වෛද්‍ය පර්යේෂන කවුන්සලය සහ දකුණු අප්‍රිකාවේ, සැලසුම්ගත මාපිය සමාජය (PPASA) මගින් ප්‍රකාශයට පත් කරන ලදුව, රේකල් ජෙම්කස් සහ ඇන්ඩ්‍රියා කෝංවෙල් විසින් අනුවර්තනය කරන ලද්දකි.

  " ක්‍රියාකාරී තරුණයෝ" කෙසේ මග පෙන්විය යුතුද/සැම් ක්ලේයින් විසින් සකසා ලියන ලද සරණාගත නව යොවුන් තරුණයන් සඳහා ක්‍රියාකාරකම්. ඔහු සන්නද්ධ අර්බුද වැඩසහටනට අයත් දරුවන් පිළිබඳව IRC උපදේශක වරයෙකි. 1999 ජුනි.

* ජීවන සැළසුම් අධ්‍යාපනය-තරුණ උපදේශණය මගින් සකසන ලද තරුණ සංවර්ධන වැඩසටහන-වොෂින්ටන් DC - ඇමෙරිකා එක්සත් ජනපදය.

* ජීවන සැලසුම් කුසලතා : අප්‍රිකාවේ තරුණ පිරිස් සඳහා වන විෂය මාලාවකි. ගැලපෙන සෞඛ්‍ය වැසටහනක් සඳහා වන ව්‍යෘපෘතිය (PATH) 1996 දෙසැම්බර්

## කඳවුරු සහ සත්කාරකයා සමග සම්බන්ධීකරණය

- ***සත්කාරක ප්‍රජාවගෙ තරුණ කණ්ඩායම් සහ නායකත්වයට සමාජ කැපවීම සඳහා බලකිරීම-*** **සත්කාරක ප්‍රජාවට සමාජ කැපවීම සහ සංවේදීකරණයවීම අත්‍යාවශ්‍ය වේ. කඳවුරු තරුණයින් වෙනුවෙන් සකස්කර ඇති සැම වැඩ පිලිවෙලකටම සත්කාරක ප්‍රජාවේ සහභාගීත්වය දිරි ගැන්විය යුතු.**

## ~~වෙනත් සම්පත්~~

* ***වටිනා සම්පත්:*** සියරා-ලියෝන්හි නවයොවුන් තරුණයන් පුනරුත්ථාපනය/සරණාගත කාන්තාවන් සහ ළමයින් සඳහා වන කාන්තා කොමිෂම, නව යොවුන් තරුණයින් සහ යෞවනයින් සඳහා වන සහභාගිත්ව පර්යේෂණ අධ්‍යාපනය 2002 අප්‍රියෙල් - ජුලි

---


1) සරණාගත කාන්තාවන් සහ ළමයින් සඳහා වන කාන්තා කොමිෂම: / අභාවිත, පාවිච්චියට ගත හැකි සම්පත්: සන්නද්ධ අරගලවලින් බලපෑමට ලක්වූ නව යොවුන් තරුණයින් - වැඩසටහන් සහ ප්‍රතිපත්ති විශ්ලේශනය 2000 ජනවාරි.

2) එම.


P.E. 1.1

# ක්‍රීඩා පිටිය


# The Field of Play



PE. 1.4




PE. 2.1




A 'New Combe' Court

**නව කොම්බ් පිටිය**

PE. 1.2



PE. 1.3




වොලිබෝල් පිටිය

# 14 සෞඛ්‍ය සත්කාරය සහ සෞඛ්‍ය අධ්‍යාපනය.



මෙඩිසිනේ සැන් ප්‍රන්ටියර්ස් (එම්.එස්.එෆ්) සංවිධානයේ වෛද්‍යවරයකු විසින් කොලොම්බියානු දරුවකු පරීක්ෂා කරයි. කඳවුරු කළමනාකරණ කණ්ඩායම සෞඛ්‍ය කටයුතු වල නියැලි රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රදේශයේ වෛද්‍ය කාර්ය මණ්ඩල සමඟ එකමුතුව කඳවුරු නේවාසිකයින් වෙත අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා සැපයීම සහතික කළ යුතුය. ඡායාරූප : ජුආන් කාලොස් ටොමාසි (එම්.එස්.එෆ්) ගේ ඡායාරූපය.

# පරිච්ඡේදය 14 : සෞඛ්‍ය සත්කාරය සහ සෞඛ්‍ය අධ්‍යාපනය

## හැඳින්වීම

කඳවුරු පරිසරයක් තුළ සෞඛ්‍ය සත්කාර පහසුකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා කඳවුරු කළමනාකරු විසින් කඳවුරේ නේවාසික සෑම සියලු දෙනා වෙත සෞඛ්‍ය සත්කාර පද්ධතියක අත්‍යවශ්‍ය සේවා සම්ප වන බව සහතික කළ යුතුය. ලෝක සෞඛ්‍ය සංවිධානය සෞඛ්‍යය නිර්වචනය කර ඇත්තේ "රෝග තත්ත්ව හෝ ආබාධිත තත්ත්ව නොපැවතීම පමණක් නොවන කායික, මානසික, සමාජයීය වශයෙන් පූර්ණ යහපත් භාවයක පැවැත්මය" යනුවෙනි. සරණාගතයින් සමඟ කටයුතු කරන විට සිය රට/ප්‍රජාව වෙත සැපයෙන ජාතික සෞඛ්‍ය සේවාවන් වෙත කඳවුරෙහි වෙසෙන්නන් හට සම්ප විය හැකිද යන්න කඳවුර කළමනාකාරිත්වය විසින් සොයා බැලිය යුතුය. සමහර විට විශේෂිත පරිපූරක සෞඛ්‍ය යාන්ත්‍රණ බිහි කිරීම අවශ්‍ය වෙයි. කඳවුරු කළමනාකරණය අනෙකුත් අංශයන් හිදි මෙන්ම කාන්තාවන් ගේ/සහ දරුවන්ගේ සුවිශේෂිත සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලිමට විශේෂ උත්සාහයක් දැරිය යුතුය.

**සේවය කළ යුත්තේ කා සමඟද?**

- සෞඛ්‍ය ක්ෂේත්‍රයන්හි නියැලි රාජ්‍ය නොවන සංවිධාන, ස්වස්ථතාවය නංවාලන රාජ්‍ය නොවන සංවිධාන.
- ඒ් ප්‍රදේශයන්හි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් හා දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරින්.
- ලෝක සෞඛ්‍ය සංවිධානය, යුනිසෙප්, සරණාගතයන් සඳහා වන එක්සත් ජාතින් ගේ මහ කොමසාරිස් සංවිධානය.
- කඳවුරෙහි නේවාසිකයන්.

සෞඛ්‍ය සේවා සපයන්නේ කවුරුන්ද යන්න පිළිබඳව තැකීමකින් තොරව කඳවුර පරිසරයෙහි පවත්නා සුවිශේෂ සෞඛ්‍ය අවදනම් හඳුනා ගත යුතු අතර ඒවා සඳහා උචිත ආවරණ ක්‍රමෝපායයන් යෙදිය යුතුය. අවතැන් වූ ජනගහනය තුළ වයස අවුරුදු 05 ට අඩු දරුවන් 15 - 20% ක් පමණ සිටින අතර වැඩිම අවදනම් කණ්ඩායම වන්නේ ද ඔවුහුය. කඳවුර ජනගහනය තුළ ඇති වන විශේෂ අවදානම් වලට ප්‍රධාන වශයෙන්ම හේතු වන්නේ අධිගහණය, අසතුටුදායක පෝෂණය, ආරක්ෂිත නොවූ ජලය, අසතුටුදායක සනිපාරක්ෂක පරිසරය / අනතුරු / මූලික ප්‍රතිශක්තිකරණ වැඩසටහන් නතරවීම හෝ අවුල්වීම නිසා සරම්ප, පෝලියෝ, කක්කල් කැස්ස, පිටගැස්ම, ගලපටලය, ක්ෂයරෝගය හා හෙපටයිටිස් - බී වැනි රෝග ඇතිවීම සහ ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන රෝග බහුලවීම යනාදිය ය. විශේෂයෙන්ම එච්. අයි. වී. ආසාදිත හෝ ඒඩ්ස් රෝගී පුද්ගලයන් හා පවුල් කෙරෙහි විශේෂ පියවර හඳුන්වාදීම අපහසු වනුයේ ඔවුන්ට කැළලක්වේය හෝ කණ්ඩායම තුළ කොන්වීමට ලක්වේය හෝ යන තත්ත්වය මතය. එවැනි පියවර හඳුන්වා දීමට පළමුව කඳවුරු ජනගහනය දැනුවත් කිරීමට සංවේදි කිරීම කළ යුතුය.

මෙහිදී මතුවන අවාසනාවන්ත කරුණ නම් කඳවුර ජනගහනයට ප්‍රමාණවත් වෛද්‍ය සේවාවන්ට සම්පවීමේ අවස්ථාව නොමැති නම් කවර ආකාරය සෞඛ්‍ය සත්කාර ව්‍යුහයන් පැවතියද, වෛද්‍යවරු සිටිය ද කඳවුරු වාසින් ගේ සෞඛ්‍ය ආරක්ෂාව කළ නොහැකිවීමය. කඳවුර වාසීන්හට සෞඛ්‍යමය අයිතිවාසිකම්

තමන්ට ද ඇති බව අවබෝධ කර ගැනීමට සහාය විය යුතුය. මෙම අයිතිය හිමි කර ගැනීමේ අවස්ථාව කඳවුරු වාසීන්හට ලබා ගැනීමට උපකාරී වීමට කඳවුරු කළමනාකාරිත්වයට පුළුවන. ඒ තෝරාගත් ආයතන වලට ප්‍රජා-පාදිත ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවා සැපයීමට ඉඩකඩ සලසා දීමෙන්, ප්‍රජාව තුළ සන්නිවේදනය ප්‍රවර්ධනය කිරීමෙන්, අවදනම් තත්ත්වයන් විමර්ශනයට ලක්කිරීම සහ අන්තර් සම්බන්ධිත අංශ වල රෝග වළක්වන මැදිහත්වීම් ආරම්භ කිරීම ආදිය මගිනි.

කඳවුරු කළමනාකරණ කණ්ඩායම විසින් ඉටු කළ යුතු වඩාත් වැදගත් මෙහෙයන් දෙක වනුයේ.

1. සියලු කඳවුරු වාසීන් වෙත උචිත සෞඛ්‍ය සේවා පහසුකම් සැලසෙන බවට වග බලා ගැනීම.

2. සරණාගතයා/අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයා ගේ එම හදිසි අවතැන්වීම් සිදුවූ අවස්ථාව ආරම්භයේදීම පිළිගත හැකි සෞඛ්‍යමය තක්සේරුවක් සහ විමර්ශන යාන්ත්‍රණයක් එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිෂම හෝ වෙනත් ජාත්‍යන්තර සෞඛ්‍ය ආයතනයක් මගින් ඇති කරන බවට වගබලා ගැනීම යන කරුණු දෙක ඉටු කර ගැනීමය.

සෞඛ්‍ය කළමනාකරණයේ දී මූලික දත්ත එකතු කිරීම, සෞඛ්‍යමය අවදානම් නිගමනය, උචිත ක්‍රියාමාර්ග විස්තර කිරීම සහ වසංගත තත්වයන් ආරම්භවීම පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම දැක්වීමට වසංගතවේදීය ආවේක්ෂණයන් අවශ්‍ය වෙයි. තම කඳවුරෙහි සෞඛ්‍ය කටයුතු තුළ පැන නැගිය හැකි කිසියම් වසංගත තත්වයන්ට වහා ප්‍රතිචාර දක්වා මුහුණ දීමට සුදානම්ව, අවශ්‍ය මෙවලම් හා සැලසුම් අතැතිව සිටින බවට කඳවුරු කළමනාකාරිත්වය සහතික විය යුතුය.

හදිසි අවස්ථාවන්ට පසුව ක්‍රියාත්මක වන අවතැන් වූ පුද්ගලයන් සඳහා වන සෞඛ්‍ය වැඩසටහනක (එනම් දීර්ඝ කාලයක් පැවතිය හැකි ස්ථායි කඳවුරක්) පවත්නා වෛද්‍ය පහසුකම් තුළට පහත දැක්වෙන ක්‍රියාකාරකම් ද එක්විය යුතුය.

- ව්‍යාප්ත කළ ප්‍රතිශක්තිකරණ වැඩ සටහනේ ක්‍රියාකාරකම් සහ ළමා වියේ ඇති වන සුලබ රෝග පාලනය සඳහා ඒකාබද්ධ වැඩ සටහන්
- පෙර ප්‍රසව සත්කාරය, ප්‍රසව පහසුකම් සහ පසු ප්‍රසව සත්කාරය, පවුල් සැලසුම් ක්‍රම, ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන රෝග සහ එච්.අයි.වී./ඒඩ්ස් වැළැක්වීම, ප්‍රතිකාරය සහ සත්කාරය ඇතුලත් පරිපූර්ණ ප්‍රජනක සෞඛ්‍ය වැඩසටහනක්
- ජාතික ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයට අනුකූලවූ ක්ෂය රෝග මර්දන වැඩසටහන්
- පසු-ක්ෂතික ආතති රෝග සහ පුම්තිරි බව පාදක කළ කෝලාහල වැළැක්වීම සඳහා වන වැඩසටහන් ද ඇතුළත් මනෝ සමාජයීය සහ මානසික සෞඛ්‍ය වැඩසටහනක්
- විශ්වාසදායී සෞඛ්‍ය තොරතුරු පද්ධතියක්

## ස්වස්ථතා ප්‍රවර්ධනය සහ සෞඛ්‍ය අධ්‍යාපනය.

කඳවුරු ජනගහනය උදෙසා සෞඛ්‍ය සත්කාර සපයන තරමටම ස්වස්ථතා ප්‍රවර්ධනය සහ සෞඛ්‍ය අධ්‍යාපනය වැදගත්ය. ආරම්භයේ සිටම කඳවුර තුළ ස්වස්ථතා ප්‍රවර්ධනය/සෞඛ්‍ය අධ්‍යාපනය සඳහා අවස්ථාව පැවතීමට සහතික වීම මෙවැනි වැඩ සටහන් තුළට හොඳ අදහසකි.

- ප්‍රජා පාදිත ස්වස්ථතා/සෞඛ්‍ය ප්‍රවර්ධනය
- පුම්තිරි සංවේදී මෙන්ම එච්.අයි.වී./ඒඩ්ස් කෙරෙහි යථාදර්ශීවූ ප්‍රජනක සෞඛ්‍ය තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය
- කොන්ඩම බෙදා හැරීම සහ කාන්තා නේවාසිකාවන්ගේ සඳහා සනීපාරක්ෂක අවශ්‍යතා සැපයුම.
- කැලිකසල එකතු කිරීම සහ ඉවත් කිරීම, පෞද්ගලික ස්වස්ථතාව සහ වාහක පාලනය

- පවුල් වෙනුවෙන් වැසිකිළි තැනීම, ප්‍රවර්ධන වැඩසටහන්, ඒවා නිරතුරු භාවිතය ප්‍රවර්ධනය කරන වැඩ සටහන්
- ආසාදන තත්වයන්හි බලපෑම් සමනය කිරීම සඳහා වන ක්‍රමෝපායයන් (සෞඛ්‍ය අධ්‍යාපනය හෝ ස්වස්ථතාව ප්‍රවර්ධනය සඳහා දිරි ගැන්වීම් ආදි) අනුවර්තනය කර ගැනීම. (ඒ ඒ නිශ්චිත අවස්ථා අධ්‍යයනය කර ආහාර හෝ මූල්‍යමය හෝ වශයෙන් දිරිදීම් සැපයීම අවශ්‍ය වෙයි.

හැකි සෑම අවස්ථාවකදීම මෙම වැඩසටහන් පාසල් විෂය මාලාව තුළට ඒකාබද්ධ කළ යුතුය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්.

### දත්ත එක්රැස් කිරීම සහ සේවා සැපයුම විමර්ශනය

කඳවුරු වෙතට සෞඛ්‍ය සත්කාර සේවා සැපයීමට සහාය වීමේ දී කඳවුර කළමනාකරණ කණ්ඩායමේ පළමු වගකීම (වෙනත් අංශ වල වැඩ සටහන් සම්බන්ධීකරණයේ දී මෙන්ම) වනුයේ හොඳ වාර්තා කරණ සහ දත්ත එක්රැස් කිරීමේ පද්ධතියක් ඇති කිරීමය. කඳවුර තුළ සිදුවන උපත්, මරණ, පිටවී යාම්, පැමිණීම් සහ කඳවුරු ජනගහනය තුළ සිදුවන ප්‍රජා විද්‍යාත්මක වෙනස්කම් විමර්ශනය කරමින් සතිපතා යාවත් කළ යුතුය. මෙහිදී වයස් ගතවූවන් සහ ආබාධිත පුද්ගලයන් එච්අයිවී/ඒඩ්ස් සහිත වූවන් වෙසෙන පවුල් ආදී අවදානම් කණ්ඩායම් වෙත විශේෂ අවධානයක් යොමු කළ යුතුය. විමර්ශන කාර්යයන් සෞඛ්‍ය දර්ශකයන්ට පමණක් සීමා නොකළ යුතුය. කෙසේ වෙතත් වෙනත් සේවාවන් හි ගුණාත්මක භාවය කඳවුරෙහි නේවාසිකයන් ගේ සාමාන්‍ය සෞඛ්‍යය කෙරෙහි දායක වන බවට වග බලා ගත යුතුය.

---

### කඳවුරු කළමණාකරණ කණ්ඩායමෙහි මූලික වගකීම්


---

- ***සෞඛ්‍ය සේවාවන් ක්‍රියාත්මක කිරීම:*** කඳවුර වාසීන් ගේ නිසි යහපත වෙනුවෙන් සියළු සෞඛ්‍ය සේවාවන් ක්‍රියාත්මක වන බවට කළමනාකරන කණ්ඩායම වග බලා ගත යුතුය.
- ***කඳවුරු වාසීන්හට ප්‍රදේශයේ සායන පහසුකම් ලැබීමට සැලැස්වීම:*** ප්‍රදේශයේ පවත්නා සායන වලින් කඳවුර වාසීන් පහසුකම් ලැබීම විමර්ශනයට ලක් කළ යුතුය. එහිදී ප්‍රාදේශීය සායනයෙන් සපයන ගුණාත්මක සත්කාරයන්ට කඳවුරු වාසීන් ගේ පැමිණීම හානිකර වේ ද? සායනය තුළ අධි-ගහණයක් ඇති කරන්නේ ද? යන්න සොයා බැලිය යුතුය.
- ***ජන විද්‍යාත්මක දත්ත හා වෙනත් තොරතුරු:*** කඳවුර හා සම්බන්ධ ජන විද්‍යාත්මක දත්ත සහ වෙනත් මූලික තොරතුරු කඳවුරෙහි සේවා සපයන හවුල් කාර ආයතන වලට සැපයීම අත්‍යවශ්‍යයය. (අවු: 5 ට අඩු පිරිමි සහ ගැහැනු, අවු: 5 ට වැඩි පිරිමි සහ ගැහැනු සහ මුළු ජනගහනය ආදී තොරතුරු)
- ***සෞඛ්‍යය පිළිබඳව විමසිලිමත්ව සිටීමේ පද්ධතියක් ඇති කරන්න:*** කඳවුර තුළ සෞඛ්‍යය තත්ත්වය විහිදෙන ආකාරය විමසීමේ පද්ධතියක් ඇති කරන්න. සෞඛ්‍ය තොරතුරු පද්ධතිය යාවත් කිරීම, දරු උපත් විමර්ශනය කිරීම, එච්අයිවී/ඒඩ්ස් සංඛ්‍යාවත්, මරණ හා යොමු කිරීමේ වාර්තා කිරීම් ආදී මේ සියල්ල වැදගත්ය. මෙම ප්‍රතිඵල උචිත සෞඛ්‍ය ආයතන සහ යූ.එන්.එච්.සී.ආර්. සමඟ හුවමාරු කර ගැනීම වැදගත් වන අතර, අවශ්‍ය පසු විපරම් සැලසුම් සකස් කිරීම සඳහන් යොදා ගත හැකිය.
- **මර්ත්‍යතාවයට ප්‍රධාන හේතු** කඳවුර තුළ සිදුවන මරණ-මර්ත්‍යතාවයන් වලට (මෙන්ම රෝගීවීම-ගිලන්‍යතාවයන්ට ද) බලපාන ප්‍රධාන හේතු කණ්ඩායම දැන සිටිය යුතුය. අදාල හේතු තුරන් කිරීමට ගන්නා උත්සාහයන්ට එක්විය යුතුය.

- ***කඳවුර වාසින්හට මෙන්ම ඔවුන්ව රැකබලා ගන්නා අය හටත් සෞඛ්‍ය පහසුකම් සමාන ලෙස ලැබිය යුතුය:*** කඳවුර වාසින්හට මෙන්ම ඔවුන්ට රැක බලා ගන්නා අයහටත් සමාන සෞඛ්‍ය පහසුකම් භුක්ති විඳීමේ අවස්ථාව පැවතිම අතිශයින්ම වැදගත්ය.

- ***ජාතික ප්‍රතිපත්ති යනාදියට ගෞරව කරන්න:*** සෞඛ්‍ය සායන තුළදී කඳවුරවාසින් මෙන්ම ඔවුන්ට රැකවරණ හා සෞඛ්‍ය සේවා සපයන අය ද ජාතික ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ හා ක්‍රියාපටිපාටි වලට ගෞරව කරන බවට සහතික විය යුතුය.

- ***රෝග වළක්වන හා ප්‍රතිකාර සේවා පැවතිම:*** ප්‍රමාණවත් තරමින් රෝග වළක්වන හා ප්‍රතිකාර සේවා පැවතිම අත්‍යවශ්‍යය. මෙයට සේවා සැපයිම හා ඒවාට සමීප විමට ඇති හැකියාව, සලසන සේවා වර්ග, කාර්ය සේවා සටහන, පුහුණු සෞඛ්‍ය කාර්ය මණ්ඩල සේවා ලැබිම, හදිසි අවස්ථාවන්ට කැඳවුම් කාර්ය මණ්ඩල පැවතිම යනාදිය නිරතුරුව විමර්ශන හා තක්සේරු කිරීම වැදගත්ය. එසේම සේවා වල සේවා කාර්ය සාධනය, පෙර ප්‍රසව සත්කාරය, ප්‍රතිශක්තිකරණ ක්‍රියා පිළිවෙළ විශේෂඥයන් සංඛ්‍යා සහ යොමු කිරීම් යනාදිය පිළිබඳව ද විමර්ශන හා තක්සේරු කිරීම සිදුවිය යුතුය.



### කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීම්

- ***ස්වස්ථතා අධ්‍යාපන හා ප්‍රවර්ධන වැඩසටහන්:*** සිදුවන ස්වස්ථතා අධ්‍යාපන සහ ප්‍රවර්ධන වැඩසටහන් කණ්ඩායම මගින් නිති විමර්ශනයට ලක් කළ යුතුය. නිතිපතා සිදුවන වැඩසටහන් පිළිබඳ තොරතුරු අඩු තරමින් මසකට වරක්වත් කඳවුරට ලැබිය යුතුය.
- ***සබන් ඇතුළු වෙනත් ද්‍රව්‍ය සැපයුම:*** සබන් සහ කාන්තා නේවාසිකාගාර සඳහා අවශ්‍ය සනිපාරක්ෂක ද්‍රව්‍ය නිතිපතා සැපයීම සම්බන්ධීකරණය කළ යුතුය.
- **ප්‍රජනක සෞඛ්‍යය:** කඳවුර තුළ ප්‍රජනක සෞඛ්‍යය වැඩසටහන් පැවැත්වීම අත්‍යවශ්‍යයය. එමගින් නිති කොන්ඩම බෙදා හැරීම ප්‍රවර්ධනය ද සිදුවිය යුතුය.

## යොමු කිරීම් සහ උග්‍ර වෛද්‍යමය ගැටලු.

කඳවුරු මට්ටමේ හොඳ සෞඛ්‍ය සත්කාර සේවාවක් පවත්වා ගෙන යාමට අමතරව වඩාත් දරුණු වෛද්‍ය ගැටලු වලට ප්‍රතිකාර ලබාදීමේ දී ගුණාත්මක භාවය සහතික විය යුතුය. කඳවුර නේවාසිකයන් රෝහල් කරා යොමු කළ විටද, ඔවුන්ට සැලකිල්ලම හිමි වන බවට කඳවුරු කළමනාකරණය සහතික විය යුතුය.

### කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීම්

- ***වෛද්‍ය සේවා විමර්ශනය කිරීම:*** කණ්ඩායම් විසින් වෛද්‍ය සේවා, රසායනාගාර කාර්යයන්, වෛද්‍ය තොරතුරු සහ සන්නිවේදනය සහ යොමු කළ රෝගීන් සඳහා නියම කළ පසු විපරම් ප්‍රතිකාර යනාදිය විමර්ශනය කළ යුතුය.
- ***පිටව යාමේ ක්‍රමානුකූල බව:*** වෛද්‍යමය හේතු මත කඳවුරු නේවාසිකයන් කඳවුරෙන් පිටව යාම හා සම්බන්ධ ක්‍රමානුකූල බවක් ඇති කිරීම වැදගත්ය. උග්‍ර රෝගී තත්වයන් හි දී පළාතේ රෝහල් වලට කෙරෙන පසු විපරම් මගින් වෛද්‍යමය තත්ත්වය විමර්ශනය කළ යුතුය.
- ***පොරොත්තු වාහනයක් සහ රියදුරු:*** වැඩ කරන කාලය තුළ වැඩ නොකරන කාලය තුළ රාත්‍රියට සහ සති අන්ත වලට ආදී වශයෙන් විවිධ අවස්ථා වලට පොරොත්තු වාහනයන් සහ රියදුරු නම් කොට හඳුනාගෙන සිටීම නිර්දේශ කෙරේ. සම්බන්ධීකරණය වන පරිදි විවිධ වගකීම් ඒ ඒ සුදුසු පුද්ගලයන් හට වැඩ කරන ක්‍රමවත් සැලසුම් කර සංවර්ධනය කළ යුතුය.

## සෞඛ්‍ය ආශ්‍රිත වෙනත් ගැටලු.

වෙනත් ක්ෂේත්‍රයන්හි දී මෙන්ම මෙහිදී ද කඳවුරු ජනගහනය සමග වගකීම් ඇති කිරීමෙන් සහ කඳවුරු තුළ සමස්ත සෞඛ්‍යය හා සම්බන්ධ වගකීම් බෙදා හදා ගැනීම තුළින් පමණක් හොඳ කඳවුරු පරිසරයක් ඇති කළ හැකිය.

### කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීම්

***ඇතුල්වීමේ ක්‍රමානුකූල බව:*** හැකියාවක් ඇත්නම් කඳවුරට පැමිණෙන සියලු අමුත්තන් ඇතුළුවීමේ දී කඳවුරු කළමනාකරණ කණ්ඩායමට මුණගැසීම සුදුසුය. එසේම කඳවුර තුළට ඖෂධ ඇතුළු අනවශ්‍ය දෑ ගෙන ඒමට පවත්නා අවදානම අඩු කිරීම සඳහා ඔවුන් පිළිබඳ වාර්තා තබා ගැනීම අවශ්‍යය. මෙම තොරතුරු පරීක්ෂා කර බැලීම තුළින් වසංගත අවස්ථාවන්හිදී පැමිණීම් ඇතුලු අනවශ්‍ය ඇතුල්වීම් වැළැක්වීමට පියවර ගැනීමටද උපකාරී වෙයි.

***සෞඛ්‍ය ආංශික කමිටු:*** සෞඛ්‍ය ආංශයික කමිටුවක් පිහිට විය යුතුය. එයට සෞඛ්‍ය අමාත්‍යංශයේ සහ කඳවුරෙහි සෞඛ්‍ය ගැටළු විමර්ශනයට තරම් විශේෂඥ දැනුම ඇති අනෙකුත් අදාළ අංශ වල නියෝජිතයන් ඇතුළත් විය යුතුය.

***ආයතනගත හැකියාව සහ වගකීම්:*** අවතැන්වීම් සිදුවූ අවස්ථාවන්හිදී සෞඛ්‍ය සේවා සැපයීම සඳහා ආයතනගත හැකියා සහ වගකීම් ඇති කිරීම බෙහෙවින් වැදගත්ය. කාර්යයන් ක්‍රියාත්මක කරන හවුල්කරුවන් තම සෞඛ්‍ය අධ්‍යාපනයේ දී සහ සේවා සැපයීමේදී හැකි පමණ විනිවිද භාවයකින් යුතුව එම කටයුතු සිදු කිරීමද ඒවායේ සාර්ථකත්වයට දායක වෙයි.

# මෙවලම් කට්ටලය

***සුලබ සෞඛ්‍ය ගැටලු සහිත වගුව (එ.ජා.ස.කො.):*** මෙම වගුවෙහි අවතැන් වූ ජනගහන අතර සුලබව දැකිය හැකි රෝග, ඒවා සඳහා වැඩියෙන්ම දායක වන සාධන මෙන්ම වැළැක්වීමට ගත යුතු පියවර දැක්වෙයි.

***සරණාගත කඳවුරු පසුබිම් තුළ ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන රෝග/ඒඩ්ස් වැඩ සටහන් සඳහා අවශ්‍යතා චෙක්ලිස්ට්:*** සරණාගත පසුබිම් තුළ ප්‍රජනක සෞඛ්‍යය අන්තර් - ඒජන්සි ක්ෂේත්‍ර මාර්ගෝපදේශය (1999) හි 5 වන පරිච්ඡේදයෙහි අනුවර්තනය.

***සරණාගත පසුබිම් තුළ එච්.අයි.වී./ඒඩ්ස් වැළැක්වීම සහ සත්කාර ක්‍රියාකාරකම් විමර්ශනය:*** මෙම වගුව සරණාගතයින් සහ ඒඩ්ස් : මානව හිතවාදී ප්‍රජාවන් කළ යුත්තේ කුමක්ද? යන්නෙහි කොටසකි. එම සරණාගත පසුබිම තුළ ප්‍රජනක සෞඛ්‍යය පිළිබඳ අන්තර් ජාතික කාර්ය සාධක කමිටුවේ අනු දැනුම මත සරණාගත කාන්තාවන් සහ දරුවන් පිළිබඳ කාන්තා කොමිෂම මගින් නිෂ්පාදනය කරනු ලැබුවකි.

## ආශ්‍රිත මෙවලම:

***සරණාගතයින් සහ ඒඩ්ස් මානව හිතවාදී ප්‍රජාව කළ යුත්තේ කුමක්ද?*** අවතැන් වූ පුද්ගලයන් හා සම්බන්ධ කඳවුරු පසුබිම්ව සේවය කරන සරණාගත සේවකයන් සඳහා ඉතා ප්‍රායෝගික මාර්ගෝපදේශයකි. එතුළ අවතැන් වූ තත්වයන් හි විවිධ අදියර තුළ දී රෝග සම්ප්‍රේෂණයවීම, වැළැක්වීම සහ මැදිහත්වීම් පිළිබඳ පැහැදිලි සහ ක්‍රියාත්මක කළ හැකි තොරතුරු හා මූලික මගපෙන්වීම් ඇතුළත්ය. මෙහි පළවනුයේ තරුණ පුද්ගලයින් හට එච්අයිවී/එඩ්ස් අධ්‍යාපනය ලබාදීම සඳහා වන සංක්ෂිප්ත සංනිවේදන පුහුණු මාර්ගෝපදේශකයකි. මෙම මාර්ගෝපදේශකය සරණාගත සුසංධානය සඳහා ප්‍රජනක සෞඛ්‍යය සංවිධානය මගින් නිෂ්පාදනය කර ඇති (RHRC) වෙබ් අඩවියෙන් ද ලබා ගත හැක. www.rhrc.org

## අවශ්‍ය කියවීම් සහ පරිශීලනය කළ හැකි ලේඛන:


- UNHCR 2000. හදිසි අවස්තා සඳහා අත්පොත. (පරිච්ඡේදය 14: සෞඛ්‍ය පි. 154-183 පිනිවා.
- MSF. සරනාගත සෞඛ්‍ය: හදිසි තත්ත්වයන් සඳහා පිවිසීමක්: MSF (පරිච්ඡේදය 6: හදිසි අවස්තාවන් හි සෞඛ්‍ය සත්කාරය, 7: බෝවෙන රෝග සහ වසංගත වැළැක්වීම, 8: මහජන සෞඛ්‍ය සුපරීක්ෂාව පි. 124-205, Public Health Surveillance
- ස්පියර් ව්‍යාපෘතිය. 2004 ව්‍යසනවලට මුහුණදීමේ අවම තත්ත්වයන් සහ මානවහිතවාදි ප්‍රඥප්තිය. (පරිච්ඡේදය 5: සෞඛ්‍ය සේවාවන්හි අවම තත්ත්ව: පිනිවා)
- UNICEF. හදිසි අවස්තාවන් වලදී උදව් වීම. (කොටස 3 - පරිච්ඡේදය 9: සෞඛ්‍ය පිග 79-89 සහ කොටස 5 - පරිච්ඡේදය 8: හදිසි අවස්තාවන්හිදි සෞඛ්‍ය සත්කාරක සහ මානව සම්පත් කළමනාකරණය පි. 267-322
- MMWR (Morbidity & Mortality Weekly Report) සාගින්නෙන් පෙළෙන, සරණාගත සහ අවතැන් වූ ප්‍රජාව, ප්‍රජා සෞඛ්‍ය ප්‍රශ්න සඳහා නිර්දේශ, ඇට්ලැන්ටා: ජුලි 24, 1992/වෙලුම. 41/අංක: RR-13
- UNHCR/UNFPA/WHO. 1999. සරණාගත තත්ත්වයන්හිදි ප්‍රජනන සෞඛ්‍ය: අන්තර් ආයතනික ක්ෂේත්‍ර අත්පොත.
- WHO/OMS. සරණාගත තත්ත්වයහිදි ක්ෂය රෝග පාලනය අන්තර් ආයතනික ක්ෂේත්‍ර අත්පොත
- H. E. L. P. Cours de sante publique pour la gestion de l'assistance humanitaire (Dr. P. Perrin, CICR, 1999)
- කැනි, එස්. සි. 1999 - සාගත, අර්බුද සහ පසු විපරම. මූලික මග පෙන්වීම කුමාරියන් ප්‍රෙස්.
- IASC 2003. හදිසි පසුබිමක් තුළ HIV/AIDS වලට මැදිහත්වීම සඳහා නිර්නායක

- www.unhcr.ch
- www.unaids.org
- www.who.ch (World Health Organization)
- www.cdc.gov
- www.msf.org (Medecins Sans Frontieres)
- www.sphereproject.org
- www.idpproject.org

# සුලබ සෞඛ්‍ය ගැටළු වගුව

| රෝගය | ප්‍රධාන වශයෙන් දායක වන සාධක | වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග |
|---|---|---|
| පාචනය රෝග | අධිගහණය<br>දූෂිත ජලය හා ආහාර පාන<br>දුර්වල ස්වස්ථතාවය | • ප්‍රමාණවත් ඉඩකඩ සහිතව ජීවත්වීම<br>• මහජන සෞඛ්‍ය අධ්‍යාපනය<br>• සබන් ලබාදීම<br>• මනා පෞද්ගලික හා ආහාර පාන ස්වස්ථතාවය<br>• ආරක්ෂිත ජලය සැපයීම සහ සනීපාරක්ෂාව |
| සරම්ප | අධිගහණය<br>එන්නත් ආවරණය පහළ මට්ටමක පැවැතිම | • පදිංචි ස්ථානයේ දරුවන්ට ප්‍රතිශක්තිකරණය ලබාදීම සැලසුම් කිරීම. පරිච්ඡේදයෙහි සඳහන් ජීවත්වීම සඳහා අවශ්‍ය ඉඩකඩ ප්‍රමාණය පිළිපැදීම සහ විටමින් ඒ ලබාදීම ජීවත්වන පරිසරයේ ඇති අඩුපාඩු නිසා මාස 6- අවු : 15 දක්වා දරුවන්ට ප්‍රතිශක්තිකරණය (සාමාන්‍යයෙන් අවු: 5 දක්වා වන විට ලබාදීම) නිර්දේශ කිරීම. |
| තීව්‍ර ශ්වසන රෝග | අහිතකර නිවාස ඇඳුම් සහ පොරවන රෙදි, හිඟකම ජීවත් වන ප්‍රදේශයේ දුම පැවතිම. | • ජීවත්වීම සඳහා අවශ්‍ය අවම ඉඩකඩ සැපයීම, නිසි නිවාස ප්‍රමාණවත් ඇඳුම් හා පොරවන රෙදි ලැබීම. |
| මැලේරියාව | අවතැන් වූවන්ට නුහුරු පරිසරයක, ඔවුන් තුළ ප්‍රතිශක්තිය රහිත රෝග කාරක මාදිලියන් සමඟ විසීම.<br>මදුරුවන් බෝවිය හැකි එක තැන රැඳුන ජලය පැවතිම | • මදුරුවන් බෝවිය හැකි තැන්, කීටයන් සහ වැඩුණු මදුරුවන් කෘමිනාශක ඉසීම මගින් විනාශ කිරීම, කෙසේ වෙතත් වාහක පාලනය සාර්ථක වීම ඒ ඒ මදුරු වර්ගයේ චර්යා මත බැවින් ඒ ප්‍රදේශයේ විශේෂඥයන් හමුවී උපදෙස් ලබාගත යුතුය.<br>• මදුරු දැල් ලබාදීම රෝගය වළක්වන ඖෂධ (උදා: ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ගර්භණී කාන්තාවන් සහ දරුවන්ට) ලබාදීම |
| මෙනින්ගොකොකුස මෙනින්ජයටිස් | රෝගය ජානපදිකව පවතින ප්‍රදේශ වල අධි ගහණය පැවතිම (බොහෝ විට ඒ ඒ පළාත් වල රෝගය පැතිරෙන කාල රටා පවතියි) | • ජීවත්වීම සඳහා අවම ඉඩකඩ සැපයීම<br>• සමීක්ෂණ වලින් අවශ්‍ය යයි පෙන්වා දෙන විට විශේෂඥ උපදෙස් මත ප්‍රතිශක්තිකරණය ලබාදීම. |

| | | |
|---|---|---|
| **ක්ෂය රෝගය** | අධිගහණය<br>මන්දපෝෂණය<br>එච්.අයි.වී. ආසාදනය ඉහළ මට්ටමක පැවැතීම | • ජීවත්වීම සඳහා අවම ඉඩකඩ පැවතීම (එසේ වුවද ජානපදික ප්‍රදේශ වල එය ගැටලුවක් වනු ඇත)<br>• ප්‍රතිශක්තිකරණය |
| **උණසන්නිපාතය** | අධිගහණය පෞද්ගලික ස්වස්ථතාවයේ දුර්වලතා දූෂිත ජල සැපයුම<br>සනීපාරක්ෂාව ප්‍රමාණවත් නොවීම. | • ජීවත්වීම සඳහා අවම ඉඩකඩ පැවතීම<br>• ආරක්‍ෂිත ජලය, නිසි සනීපාරක්‍ෂක පහසුකම්<br>• මනා පෞද්ගලික, ආහාර සහ මහජන ස්වස්ථතාව සහ මහජන සෞඛ්‍ය අධ්‍යාපනය, ලෝක සෞඛ්‍ය සංවිධානය මෙහිදී ප්‍රතිශක්තිකරණය නිර්දේශ නොකරනුයේ එමගින් ඉතා අඩු කෙටි කාලීන ප්‍රතිශක්තියක් පෞද්ගලිකව සැපයෙනවා විනා රෝගය පැවතීම වැළැක්වීමට ප්‍රයෝජනවත් නොවන නිසාය. |
| **පණු ආසාදන (විශේෂයෙන් කොකු පණුවන්)** | අධිගහණය සනීපාරක්ෂක පහසුකම් වල දුර්වලතා | • ජීවත්වීම සඳහා අවශ්‍ය අවම ඉඩකඩ පැවතීම<br>• නිසි සනීපාරක්‍ෂාව<br>• පාවහන් / සෙරෙප්පු පැලඳීම<br>• නිසි පෞද්ගලික ස්වස්ථතාව |
| **පණු හොරි (ස්කේබිස්)** | අධිගහණය<br>පෞද්ගලික ස්වස්ථතාවයේ දුර්වලතා | • ජීවත්වීම සඳහා අවශ්‍ය අවම ඉඩකඩ සැපයීම<br>• පිරිසිදුවීම සඳහා ප්‍රමාණවත් ජලය හා සබන් තිබීම |
| **සෙරොප් තැල්මියාව විටමින් ඒ ඌනතාවය** | ආහාර ප්‍රමාණවත් නොවීම සරම්ප සහ පාචනය දීර්ඝ කාලීන ආසාදන පැවතීම | • ආහාර මගින් විටමින් ඒ ප්‍රමාණවත් තරම් ලැබීම. නොඑසේ නම් විටමින් ඒ වලින් අධි-පෝෂණය කළ ආහාර ලබාදීම. එයත් කළ නොහැකි නම් විටමින් ඒ පරිපූරක ලබාදීම.<br>• සරම්ප වළක්වන ප්‍රතිශක්තිකරණය ලබාදීම.<br>• මාස 4-6 කට වරක් ක්‍රමානුකූලව ආරක්ෂක පියවර ගැනීම |

| | | |
|---|---|---|
| **නිරක්තිය** | මැලේරියාව, කොකුපණු රෝගය, යකඩ සහ ෆෝලේට් ගන්නා ප්‍රමාණය හෝ අවශෝෂණය වන ප්‍රමාණය අඩුවීම. | • දායක විය හැකි රෝග වැළැක්වීම/ප්‍රතිකාර ලබාදීම<br>• ආහාර බලකරණය ඇතුළු ක්‍රම මගින් ආහාර වේලේ අඩුපාඩු මග හැරීම |
| **පිටගැස්ම** | ප්‍රතිශක්තිකරණය නොලැබූ ජනතාවට ඇතුළු වන අනතුරු/තුවාල<br>දරු ප්‍රසූතයේ දී නිසි පිළිවෙත් අනුගමනය නොකිරීම නිසා නව ජන්ම පිටගැස්ම ඇතිවෙයි. | • නිසි ප්‍රථමාධාර සැපයීම<br>• ගර්භනී මවුවරුන්හට ප්‍රතිශක්තිකරණය ලබාදීම සහ ජාතික ප්‍රතිශක්තිකරණ වැඩ සටහනට අනුකූල වන සේ එන්නත් ලබා දීම<br>• දරු ප්‍රසූතියට උදව් වන අයට (පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්හට) හොඳ පුහුණුවක් ලබාදීම<br>• කතුරු, රේසර්, මැසීමට යොද ගන්නා ශල්‍ය නූල් ආදියෙහි පිරිසිදුකම තහවුරු කිරීම. |
| **සෙංගමාලය (හෙපටයිටිස්)** | දුර්වල ස්වස්ථතාවය ආහාර සහ ජලය දූෂණයවීම | • ආරක්ෂිත ජලය සැපයීම<br>• සාර්ථක සනීපාරක්ෂාව<br>• ආරක්ෂිත රුධිර පාරවිලයනය |
| **ලිංගාශ්‍රිත සම්ප්‍රේෂණය වන රෝග/ එච්.අයි.වී.** | සංවිධානාත්මක සමාජය බිඳියාම රුධිර පාරවිලයන ප්‍රතිපත්ති දුර්වලව පැවතීම<br>තොරතුරු නොමැතිකම | • ගර්භනී සමයේදී උපදංශ පරීක්ෂාව සිදු කිරීම<br>• පාරවිලයනයට පෙර රුධිරය පරීක්ෂාවට ලක් කිරීම<br>• විශ්ව ආරක්ෂිත පියවර අනුගමනය<br>• සෞඛ්‍ය අධ්‍යාපනය<br>• කොන්ඩම ලබා ගැනීමට හැකිවීම<br>• හවුල්කරුවන්ට ප්‍රතිකාර ලබාදීම |

පොදු සෞඛ්‍ය ගැටලු UNHCR හදිසි අවස්ථා
අත් පොත වගුව 3 පිටුව 370

## සරණාගත පසුබිමක් තුළ ලිංගාශ්‍රිත රෝග එච්.අයි.වී. ඒඩ්ස් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන අවශ්‍යතා වට්ටෝරුව.

1999 දී ප්‍රකාශයට ලක් කළ සරණාගත පසුබිමක් තුළ ප්‍රජනක සෞඛ්‍යය ලෙස නම් කරන ලද ක්ෂේත්‍ර මාර්ගෝපදේශයේ (අන්තර් ඒජන්සි ක්ෂේත්‍ර මාර්ගෝපදේශය) එච්අයිවී/ඒඩ්ස් ඇතුළු ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන රෝග නම් 5 වන පරිච්ජේදයෙන් අනුවර්තනය කරනු ලැබිය.

### MISP වලින්:

- කොන්ඩම නොමිලයේ ලබා ගැනීමේ පහසුකම් සහතික කිරීම
- විශ්ව ආරක්‍ෂක ක්‍රම අනුගමනයට බල කරන්න
- ලිංගික පසුබිම් පුම්තිරි බව පදනම් කලකෝලහල වැළැක්වීම හෝ පාලනය හෝ කිරීම
- පවත්නා එච්අයිවී/ලිංගාශ්‍රිත රෝග/ඒඩ්ස් තත්ත්වය විශ්ලේෂණය කිරීම.
- සරණාගත ප්‍රජාව තුළ සිටින පුහුණු පුද්ගලයන් හඳුනා ගැනීම
- තොරතුරු, අධ්‍යාපන හා සන්නිවේදන වැඩ සටහන් පවත්වා ගෙන යාම
- සෞඛ්‍යමය පසුබිම් තුළ විශ්ව ආරක්‍ෂිත ක්‍රම පිළිපැදීම
- නොමිලයේ ලබා ගැනීමට හොඳ තත්ත්වයේ කොන්ඩම පැවතීම හා ලබා ගැනීමට හැකිවීම
- කොන්ඩම බෙදා හැරීමේ ක්‍රමයක් පැවතීම
- ආරක්‍ෂිත රුධිර පාරවිලයන සේවාවක් පැවතීම. මාර්ගෝපදේශයන් බෙදා හැර තිබීම. එච්අයිවී/පරීක්ෂණ කට්ටල පැවතීම සහ කාර්ය මණ්ඩලය පුහුණු කර තිබීම
- ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන ආසාදන සඳහා විධිමත් කළමනාකරණ පිළිවෙත් ඇති කිරීම. හොඳින් විස්තර කර බෙදා හැර තිබීම.
- ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන ආසාදන සඳහා ප්‍රතිකාර තමන් සමීපව පැවතීම
- සහලක්ෂණමය රෝග පාලනය සඳහා කාර්ය මණ්ඩල පුහුණු කර/යළි පුහුණු කර තිබීම
- හවුල්කරුවන් දැනුම් දීමේ ක්‍රමයක් පැවතීම හා ප්‍රතිකාර ආරම්භ කිරීම
- දෙමාපියන් ගෙන් දරුවාට ආසාදන පැතිරීම වැළැක්වීම සඳහා පරීක්ෂණ මත නොයැපෙන මැදිහත්වීම් පැවතීම
- මවගෙන් දරුවාට ආසාදන පැතිරීම වැළැක්වීම සඳහා වන මැදිහත්වීම් පැවතීම
- උචිත ස්වේච්ජාමය උපදේශනය හා පරීක්ෂණ සේවා පැවතීම
- ඒඩ්ස් රෝගීන්හට තම නිවෙස් පාදක ප්‍රතිකාර ලබා ගැනීමේ පහසුකම් පැවතීම
- එච්අයිවී/ඒඩ්ස් සහිත පුද්ගලයන් හට උපදේශන හා සහාය සේවා පැවතීම.

**සරණාගත පසුබිමක් තුළ එච්අයිවී/ඒඩ්ස් වැළැක්වීම සහ සත්කාර ක්‍රියාකාරකම් විමර්ශන ලකුණු දීමේ පිළිවෙත**

ස්ථානය: ..........................................................................


ජනගහනය: ......................................................................

0 = කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නැත
1 = සුළු ක්‍රියාකාරකම් සංඛ්‍යාවක් පමණය
2 = මධ්‍යම ප්‍රමාණගත වැඩසටහන් ක්‍රියාත්මකය
3 = ඉතා පුළුල් වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මකය
(NI) = තොරතුරු ලබා ගැනීමට නොහැක
(Y/N) = ඔව්/නැත

| ක්‍රියාකාරකම්/තත්ත්වයන් | වර්තමාන තත්ත්වය | වැඩිදියුණු කිරීම සඳහා සැලසුම |
|---|---|---|
| **අ) මූලික තොරතුරු** | | |
| 1. සරණාගත පිළිසරණ ලද රටෙහි එච්අයිවී පැවතිම | | |
| 2. තම රටෙහි එච්අයිවී පැවතිම | | |
| 3. එච්අයිවී සම්බන්ධව ප්‍රතිපත්තියක් පවති ද? | | |
| **ආ) මානව අයිතිවාසිකම් පිළිබඳ ගැටලු** | | |
| 1. එච්අයිවී/ඒඩ්ස් සහිත ජීවත් වන අයගේ මානව අයිතිවාසිකම් අවුල් සහගත ද? | | |
| 2. විශ්වාසනියභාවය සුරැකේද? | | |
| 3. අනිවාර්ය පරීක්ෂා කිරීම් තහනම් ද? | | |
| **ඇ) එච්අයිවී වැළැක්වීම** | | |
| 1. පාරවිලයන රුධිරය සැපයුම් ආරක්ෂිත බව | | |
| 2. විශ්ව ආරක්ෂණ පිළිවෙත් | | |
| 3. කොන්ඩම ප්‍රවර්ධන සහ බෙදා හැරීම | | |
| 4. එච්අයිවී/ඒඩ්ස් අවබෝධය නංවාලීමේ ව්‍යාපාර | | |
| 5. චර්යාව වෙනස් කරන වැඩසටහන් | | |
| 6. තාරුණ්‍යයට විශේෂිත වූ වැඩසටහන් | | |
| 7. ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන රෝග පාලනය සහ හවුල්කරුවන් සොයා යාම | | |

| ක්‍රියාකාරකම්/තත්ත්වයන් | වර්තමාන තත්ත්වය | වැඩිදියුණු කිරීම සඳහා සැලසුම |
|---|---|---|
| 8. පාසල් විෂයමාලාව සමෝධානිත HIV/Aids | | |
| 9. අවධානමට ලක් වූ කණ්ඩායම් සඳහා වැඩසටහන් | | |
| 10. ස්වේච්ඡා උපදේශනය සහ පරීක්ෂාව | | |
| **ඈ) HIV/Aids සත්කාරය** | | |
| 1. අවස්ථාවෝචිත ආසාදනයට පිළියම් | | |
| 2. නිවාස - මූලික සත්කාරය | | |
| 3. **HIV** වැළඳුන පුද්ගලයින්ට ආධාර කිරීම සහ උපදේශනය | | |
| 4. මවගෙන් දරුවාට බෝවීම | | |
| 5. **ARV** සත්කාරය | | |
| **ඉ) HIV නිරීක්ෂණය** | | |
| 1. සුපරීක්ෂාකාරී රැකවල (ගැබිනි කාන්තාවන්) | | |
| 2. **HIV/Aids** සම්බන්ධිත මරණය යටත්වීමට ඇති සුපරීක්ෂාව | | |
| 3. **STI** ප්‍රවණතාව (අපේක්ෂිත පරාශය තුළ | | |
| **ඊ) සම්බන්ධිකරණය සහ ජාලගත කිරීම** | | |
| 1. එක්සත් ජාතින්ගේ "කිම්" කණ්ඩායම සමාජික ක්‍රියාකාරීත්වය. | | |
| 2. වෙනත් ජාල | | |

# 15 මනෝසමාජයීය සත්කාරය



ලෝ පුරා 300 000 පමණ බාල වයස්වයින් සොල්දාදුවන් වශයෙන්, බොහෝ විට බලහත්කාරයෙන් බඳවා ගැනෙයි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ක්ෂතියෙන් පෙළෙන අතර සාමාන්‍ය ජිවිතයට ප්‍රතිසංකලනයේදී ප්‍රශ්ණවලට මුහුණ දෙති.

# පරිච්ඡේදය 15 : මනෝසමාජයීය සත්කාරය

## හැඳින්වීම

අභ්‍යන්තර අවතැන්වූ හා සරණාගත ජනගහන අවතැන්වීමට පෙරත් දිවි ගලවා ගන යන අතරේදීත් බොහෝ විට ඇලුම් කළ අයවලුන්, පවුලේ සාමාජිකයන්, තමන් සන්තක සියල්ල හා තත්වයද අහිමි වූවෝ වෙති, වචනයේ පරිසමාප්ත වශයෙන් අවතැන් වූවෝ ආතතියේ ,කාංසාවේ සහ බියේ ලක්ෂණ පෙන්නුම් කරන්නෝය. ගැලවියාමේ හා ගැලවියාමට පෙර අත්දැකීම් වලට අමතරව කඳවුරු ජීවිතයම ආතතියෙන් පිරි එකකි. ගැතියා මානසිකත්වයන්, සම්පත් සඳහා තරගය,සීමිත කාරියයන්, හා කැඩුණු බිඳුණු පවුල් ජීවිතය, සහ ප්‍රජා ව්‍යුහයන්, ජනගහනයේ සමස්ත මානසික සෞඛ්‍යය කෙරෙහි රිනාත්මක බලපෑමක් කෙරෙයි. මේ සියල්ල මත ,ගැටුම හා එයට ජනතාවගේ සහභාගිත්ව මට්ටම අනුව, ජනයාගෙන් සියයට විශාල ප්‍රමාණයක් ක්ෂතයෙන් පීඩිත විය හැකි වන අතර පශ්චාත් ක්ෂතතීය ආතති ආබාධයෙන් (post traumatic stress disorder – PSTD ) පෙළෙන්නන් විය හැක. ප්‍රචණ්ඩ ගැටුම් හා යුද්ධ අත්දැකීම දැඩි ක්ෂතිය ඇතිකරයි. මේ නිසා අවතැන් ජනකායක් සමග සකාර්ය ලෙස වැඩ කිරීම - ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඔවුන්ට සහාය වීම, හා ඔවුන් යළි යථා තත්වය(ප්‍රතිපාප්තිය) ලබා ගැනීමට දිරිගැන්වීම - මේ මනෝසමාජමය ප්‍රශ්ණ කෙරෙහි යොමුවන ආකාරය මත රඳා පවති..

ක්ෂතිය සිද්ධීන් අත්දැකීමෙන් පසුව යළි ප්‍රකෘති තත්වයට පත්වීමේ ක්‍රියාවලියේදී මානසික සුව සඟන සේවා හා ප්‍රජා සහායක ව්‍යුහයන් බොහෝ සේ වැදගත් වෙයි.බොහෝ පුද්ගලයින් ක්ෂතිය අත්දැකීම් නම්‍යශිලිව දරා සිටියත්, තවත් සමහරුන්ට අවශ්‍ය දරා සිටීමේ ක්‍රමෝපායයන් හෝ යාන්ත්‍රණයන් නැත. තවත් සමහරුනට ක්ෂතිය අත්දැකීම කොපමණ ප්‍රබල වන්නේද කිව හොත් ඔවුන් යළි සක්‍රිය වීමට සහ යලි යථා තත්වයට පත්වීමට දැඩි ලෙස බාධා කෙරෙනු ඇත. ක්ෂතියේ සහ කාංසාවේ පල විපාක විඳිනවාට අමතරව, අන්‍යයන් සමග එකට නිරතවීම ප්‍රජා කටයුතුවල යෙදීම සහ බලධාරීන් සමග ගණුදෙනුව ආදියට ඇති ඔවුන්ගේ හැකියාව කෙරෙහි දැඩි ලෙස බලපෑමක් විය හැකියි.

## මුඛ්‍ය සංකල්ප කිහිපයක්.

### ක්ෂතිය

ක්ෂතිය යනු ජීවිතයට තර්ජනයක් කෙරෙන හෝ අතිශය බිය ජනක සිද්ධියකට හෝ පුද්ගලයෙකු දක්වන මනෝසමාජයිය ප්‍රතිචාරයන් පළකෙරෙන පදයෙකි . ක්ෂති ජනක සිද්ධියකින් ඇතිවන දැඩි වේදනාව, මතක තබා ගැනීම,අමතක කිරීම, සහ කාංසාව යනුවෙන් අවස්ථා හෝ වර්ග තුනකට බොහෝවිට බෙදෙයි. බියජනක අත්දැකීමකින් පසු පුද්ගලයෙක් එය එක දිගටම මතකයේ රඳවා තබා ගන, සිහිනයෙන් බිය වදිමින් නැවත නැවත එය සිදුවන බවක් විඳිය හැකියි. ඒ අතරම ඔහු හෝ ඇය ඒ ක්ෂති ජනක සිද්ධිය යළි සිහි ගන්වන හැම දෙයක්ම මග හරිමින් එය අමතක කිරීමට උත්සාහයකද යෙදිය හැකිය. මෙවැන්නකදී වූ දේ ගැන කතාබහෙන් වැළකීම, සමාජමය වශයෙන් මිනිසුන්ගෙන්. ජීවිතයෙන් තමාගෙන්ම ඈත්වීමක් විය හැක.ක්ෂති ජනක අත්දැකීම් විඳි පුද්ගලයින් අතිශය කංසාවෙන් පෙළෙන, පහසුවෙන් නොරිස්සුම්සුලු වන සහ/ හෝ කළහකාරී විය හැකිවන අතරම, නිදාගැනීම සඳහා අරගලක යෙදෙන, සුළු බිය වීම් වලින් පවා අහිතකර චිත්තවේගී ප්‍රතිචාරයන් දක්වනසුලු මෙන්ම කායික රිදුම් වේදනවාන් ඇත්තන්ද වීමට හැකිය. ක්ෂතිමය සිද්ධියක් පහසුවෙන් අමතක කළ නොහැකිය.. මතකයෙන් වේදනාව ලිහිල් කර ගැනීම සඳහා ඒ අත්දැකීම් සකස්කර, විමසිල්ලට ලක් කොට අවබෝධ කර ගැනීම අවශ්‍ය වෙයි. ක්ෂතිමය අත්දැකීමකට ලක්වූවන් හැම කෙනෙක්ම ඒ අත්දැකීම සකස්තර ගත යුතුවෙයි, එහෙත් හැම කෙනෙකුටම වෘත්තික සහායෙක් අවශ්‍ය නොවනු ඇත. සහායක් උවමනා අය හඳුනා ගැනීම සඳහා, මානසික සෞඛ්‍ය කණ්ඩායම, කඳවුරු නිවැසියන්ගේ කමිටු සහ නායකයින් සමග සම්බන්ධීකරණයකින්, මෙවලම් කට්ටලයෙහි ඇතුළත් නිමිති ලකුණු සෝදිසි ලැයිස්තුව පාදක කර ගෙන අවශ්‍යතා තක්සේරුවක් කළ යුතුය. සහාය අවශ්‍යවන පුද්ගලයන්ට, දරාසිටීමේ ක්‍රමෝපායයන් යළි ක්‍රියාත්මක කර ගැනීමටත්, තත්වාබෝධය ඇතිකරගැනීමට පිහිට වීමටත් යෝග්‍ය පුහුණුව ලත් මානසික සෞඛ්‍ය සේවක කණ්ඩායම විසින්/මනෝසමාජමය වැඩසටහන මගින්. ඔවුන් සමග වැඩ කළ යුතුය.

> ක්ෂිතිමය අනුදැකීම් විඳි බොහෝ අය කායිකව,චිත්තවේගිව,සමාජියව සහ මනෝවිද්‍යාත්මකව එක සමාන අයුරෙන් ප්‍රතිචාර දක්වති. ඔවුහු රෝගී,දුර්වල, හෝ පිස්සු හෝ නොවෙති. සාමාන්‍යයෙන් කාලයත් සමග මොවුහු යථා තත්වයට පත් වෙති.

### මනෝසමාජයීය

මනෝසමාජයීය යන්නෙන් පළ වෙන්නේ පුද්ගලයෙකුගේ චිත්තවේගී, මනෝවිද්‍යාත්මක හෝ සමාජ කාර්යයි. මෙවා නිරන්තරව එකිනෙකට සම්බන්ධයි.ඒ නිසා වැඩසටහනෙහි ඒවා එකට ඈඳා ඇත.

### ක්ෂතිය පිළිබඳ දර්ශක

ක්ෂතිය සිද්ධීන්ට භාජන වූ අය බොහෝවිට එවැනි සිද්ධීන් පිළිබඳ අත්දැකීම් නොමැති අයට වඩා වෙනස් අයුරෙකින් ප්‍රතිචාර දක්වති,. හැසිරෙති. එක් එක් පුද්ගලයා ක්ෂතිමය අත්දැකීම් වලට වෙනස් වෙනස් අයුරෙන් ප්‍රතිචාර දැක්වුවද, ක්ෂති පීඩිත පුද්ගලයන්ගේ හැසිරීම් අවබෝධ කර ගැනීම සඳහා භාවිත කළ හැකි පොදු දර්ශක ගණනාවක් ඇත. (අතිරේක දර්ශක සඳහා අමුණා ඇති මෙවලම ද බලන්න).

- **ක්ෂතියට පත්ව ඇත්තනට සුරක්ෂිත බවක හැඟීමක් නැත.**
  කාංසාව හා අනාරක්ෂිත හැඟීම් ඇතිකරමින් අත්දැකීමේ මතක පුද්ගලයා තුළ රැඳී තිබෙයි.

- **ක්ෂතියට පත්ව ඇත්තන්ට පාලනයක් නැති සේ හැඟීමක් වෙයි.**
  ක්ෂතිකාරක සිද්ධියක් හැමවිටකම වාගේ තමාගේ ජීවිතය කෙරෙහි තමාට පාලනයක් ඇතැයි යන හැඟීම නැත්තටම නැති කරනු හෝ අඩු කරනු ඇත.

- **ක්ෂතියට පත්ව ඇත්තෝ ඔවුන්ගේ ක්ෂතිය අත්දැකීමෙහිම ගැලී සිටිති.**
  දිවි රැක ගත්තෝ බොහෝ විට දුස්සුපිනයන්ගෙන් හා පසුබැල්මෙන් පෙළෙයි. කෙතරම් අත්දැකීමෙහි ගැලී සිටින්ද කිවහොත් වෙනත් කවරම දෙයක් කෙරෙහි සිත යොමු කිරීමට අපොහොසත් වෙති

- **ක්ෂතියට පත්ව ඇත්තෝ බොහෝ විට තමන් වැදගැම්මකට නැති, අතිරික්ත හෝ සීමිත අගයක් (අවලංගු) ඇත්තන් යයි සිතති.**
  දිවි රැකගත්තනට සිද්ධිය පාලනය කර ගැනීමේ හා එහි මතකය පාලනය කර ගැනීමේ උත්සාහයේදී දැඩි ලෙස අවශ්‍ය හා ලජ්ජා සහගත හැඟීම් බොහෝවිට ශේෂ වෙයි

- **ක්ෂතියට පත්ව ඇත්තෝ ගිලිහිනු හෝ විසන්ධිවූ වුවන් සේ හඟිති**
  දිවිරැකගත්තනට බොහෝවිට ධනාත්මක හැඟීම් පළකිරීමේදී හෝ තමාට සමීප වුවන් සමග සබඳකම් පවත්වාගන යෑමේදී දුෂ්කරතා ඇතිවෙයි

- **ක්ෂතියට පත් වූවෝ ආපදා ගෝචරයහ**
  දිවිරැක ගත්තෝ සිද්ධියට පෙර දී මෙන් කාර්යක්ෂම නොවෙති. සරල දෛනික දේවලට ඔවුන්ගේ ප්‍රතිචාර දැක්වීමේ හෝ ඔරොත්තු දීමේ හැකියාව කෙරෙහි ක්ෂතිය අහිසි බල පෑමෙක් කෙරෙයි.

**ගැහැනු හා දැරියෝ.**

හදිසි තත්වයන්හි දී කාන්තාවන් හා දැරියන් කෙරෙහි වන ප්‍රචණ්ඩත්වය හා ලිංගික ප්‍රචණ්ඩත්වය ක්ෂතියේ හා මනෝසමාජයීය ආඝාතියේ ප්‍රධාන හේතුකාරකයෙකි. ලිංගික ප්‍රචණ්ඩත්වයට ගොදුරුව දිවිගලවා ගත්තවුන් සම්බන්ධයෙන් සැලකිල්ලට ගත යුතු එකින් එක හරහා යනතරුණු රැසෙක් ඇත. අනු ගණන්වලදී රුවන්ඩාවේ හා බොස්නියා හර්සගෝවිනාහි ගැටුම්හි දී පෙණුනක් නම්,ක්ෂතිය, මනෝසමාජයීය සුවසහනයේ අවශ්‍යතාව හා ප්‍රජනන සෞඛ්‍ය අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම, ලිංගිකව බෝවන ආසාදන,(STIs) සහ HIV/AIDS, ආදිය බොහෝ අතින්ම අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට සමබන්ධබවකි.එයට අමතරව ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවා ගත්තෝ බොහෝ සංස්කෘතීන්හි නින්දාවට ගර්භාවට භාජන වෙති. ඒ නිසා බොහෝවිට නිහ'ඬවම ඔවුන්ගේ ක්ෂතීය අත්දැකීම් හා කායික හා මනෝවිද්‍යාත්මක ප්‍රතිවිපාක විඳදරා ගනිති.

- **කඳවුරු කළමණාකරණ කණ්ඩායමේ වගකීම්.** කඳවුරු කළමණාකරණ කණ්ඩායම උපදේශ සැපයීමේ හෝ ක්ෂතිය සම්බන්ධ කටයුතු කිරීමේ විශේෂඥයෙක් නොවුවද, මිනිසුන්ට සුරක්ෂිතබව පිළිබඳ හැඟීමක් ඇති කර ගත හැකිවනසේ ආතතිය හා කාංසාව අඩුකර ගැනීමට ඉවහල්වන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කිරීමට ඔවුන්ට ඇත.මනෝසමාජයීය සුවසහන හා දැනුවත්වීම කඳවුරේ හැම කාර්ය ක්ෂේත්‍රයකම පිළිබිඹු විය යුතුය. HIV/AIDS(PLWHAs) සමගින් ජීවත්වන්නන්ට මනෝසමාජයීය සුවසහනයෙන් හා දැනුවත්වීමෙන් ඔවුන්ගේ සෞඛ්‍ය තත්වය වැඩි දියුණු කර ගත හැකිය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ මුඛ්‍ය වගකීම.

- **වගකීම් දරණ ඒජන්සියේ බලපැවරුම පිළිබඳ දැනුම.:** මනෝසමාජයීය සුවසහන සම්බන්ධයෙන් වගකීම දරණ ඒජන්සියේ බලපැවැරුම් සීමාව පිළිබඳව කඳවුරු කළමණාකරණ කණ්ඩායම සම්පූර්ණයෙන්ම දැනුවත්ව සිටිය යුතුය. කඳවුරු කළමනාකරණ කණ්ඩායම හා වගකිය යුතු ඒජන්සිය අතර කාර්ය භාරය සහ වගකීම කවරේදැයි සියළු පාර්ශවයන් විසින් අවබෝධකරගත යුතුය. ක්ෂතියට භාජන වුවන් සම්බන්ධයෙන් (අදාල නම්) කටයුතු කිරීමේදී ඒජන්සි උපදෙස් මාලාව හා අධීක්ෂණ සේවා සම්බන්ධයෙන් ඒජන්සියේ හා UNHCR යේ චර්යා රීති පද්ධතිය අනුගමනය කිරීම යෝජනා කෙරෙයි.

- **ප්‍රජා නියෝජිතයන් සඳහා චරියා රීති පද්ධතිය.** මහජනයාට බලපවත්වන චර්යා රීති පද්ධතිය බලය දරන තත්වවල සිටින සියල්ලන් කෙරෙහි එකසේ බලපැවැත්විය යුතුය. එය, ක්ෂතිය,කාංසාව,ඉච්ඡාභංගය, සහ බිය පවත්නා තත්වයන් යටතේ සුවිශේෂ වශයෙන් වැදගත් වෙයි..චර්යා රීති පද්ධති නිසි ලෙස පතුරුවා හැරීමෙන්, අනුගමනයට අනුබලදීමෙන් සහ අධීක්ෂණයෙන්, කඳවුරු නිවැසියන් කෙරෙහි විනිවිද වූ,ගෞරවනීය වූ, හා වෘත්තිමය වූ හැසිරීමේ ප්‍රමිතීන් පුළුල් ලෙස පවත්වාගැනීම සඳහා දිරිගැන්වෙනු ඇත. ඒ නිසා කඳවුරු කළමණාකරුවෙකු විසින් සියලුම නියෝජිතයන් හා කඳවුරු විධායක කමිටු සහ වෙනත් තීරණ ගැනීමේ බලය ඇති කමිටු වැනි නායක පද්ධතීන් සඳහා ප්‍රමිතීන් වර්ධනය කර අනුගත වීමට ඉනන්දු කර යුතුය. සරණාගත තත්ව යටතේ විවිධ කායකත්ව පද්ධතීන් සමග හා අතර චර්යා රීති පද්ධතියක් වර්ධනය කර ගැනීමේදී හා පතුරවා හැරීමේදී UNHCR කාර්ය මණ්ඩලය සමග සම්බන්ධීකරණයක් ඇතිකර ගැනීම වැදගත්ය. UNHCR යේ සහ NGOj1 චර්යා රීති පද්ධතීන් ආරක්ෂාව සමබන්ධ පරිච්ජෙදයේ මෙවලම් කට්ටලයේ දක්වා ඇත (පරිච්ජේදය 5 ආරක්ෂාව බලන්න)

- **පවත්නා යාන්ත්‍රණයන් හඳුනා ගැනීම.** මානසික සෞඛ්‍ය ගැටළු සම්බන්ධයෙන් ස්ථානීය හා ඇත්තාවූ සමපත් හඳුනා ගැනීම අතිශය වැදගත්ය. සමහර සම්පත් කඳවුර තුළ හා සත්කාරක ප්‍රජාව අතර ඉන්නා ආගමික හා සාමප්‍රදායික සුවකරන්නන් විය හැකියි.

දිවිගලවාගෙන යෑමට පෙර හා දිවිගලවාගෙන යන අතරේ අවතැන්/ සරණාගත ජනගහනයේ ස්වභාවය හා තත්වය පිළිබඳ හොඳ දැනීමක් තිබීම කඳවුරු කළමණාකාරණ කණ්ඩායමට ක්ෂතියේ මට්ටම අවබෝධකර ගැනීමට හා මනෝසමාජමය අවශ්‍යතා හඳුනා ගැනීමටත් උදව්වක් වනු ඇත.

- **කමිටු පිහිටුවීම.** අවතැන් ජනගහනයේ විවිධ කණ්ඩායම් නියෝජනය වන සේ කමිටු පිහිටුවා ගැනීම, කඳවුරු ජනගහනයේ මානසික සෞඛ්‍ය අවශ්‍යතා අවබෝධ කර ගැනීමට කඳවුරු කළමණාකරණ කණ්ඩායමට උදව්වක් වනු ඇත..ඒ ලෙසම වෙනත් මනෝසමාජමය අවශ්‍යතා හඳුනාගැනීමට තොරතුරු බෙදාහදා ගැනීමට මේ කමිටුව වලට කාර්යභාරයක් දැරිය හැකිය. (පරිච්ඡේදය 3ප්‍රජා සහභාගිත්වය සහ පරිච්ඡේදය 5 ආරක්ෂාව)

- **ආපදා ගෝචර පුද්ගලයින්:** කඳවුරු ජීවිත කාලය තුළම අපදාගෝචර පුද්ගලයින් හා ඔවුන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීම අතිශය වැදගත්ය. මානසික සෞඛ්‍යය තක්සේරු කිරීම සඳහා වෘත්තිකයන් වගකීම දැරුවද, අවතැන්ව සිටීමේ කාලය තුළ විවිධ අවස්ථාවන්හිදී, ජනගහනයේ විවිධ මනෝසමාජයීය අවශ්‍යතාවන් හඳුනා ගැනීමේ වගකීමක් කඳවුරු කළමණාකරණ කණ්ඩායමටද ඇත.

- **වගකීම් දරණ ඒජන්සීන්:** කඳවුර තුළ විවිධ මනෝසමාජමය අවශ්‍යතාවයන් සඳහා සවි ඇති අනුපූරක ඒජන්සි ගැන සෝදිසියෙන් ඉන්න. හැකියා පුහුණුව හා මනෝසමාජමය වැඩසටහන් ,( සනීපාරක්ෂාව හා යටිතල පහසුකම් හා සසඳන විට,) සේවා සැපයීමේදී බොහෝවිට අමතකවී යන අංග වෙයි.එහෙත් ඒවා කඳවුරු ජීවිතයේ එක සමානව වැදගත්ය. විශ්වාසය ගොඩ නැගීම් මගින් ක්ෂතියට භාජන වූවකුට තමන්ට වූ දේ පිළිබඳව කතාකිරීමට මෙහෙයවෙන ක්‍රියාවලියකට ප්‍රවේශ වීම සඳහා එවැනි ක්‍රියාකාරකම් උපකාරකයක් විය හැකියි.

- **වගකීම් දරණ ඒජන්සි සමග සම්බන්ධීකරණය** ප්‍රජා ඒකාබද්ධතාව ශක්තිමත් කිරීම සහ ක්ෂතිය අඩුකිරීම සඳහා සංස්කෘතික උත්සව, සහ ක්‍රීඩා,වෘත්තිය පුහුණු කාර්ය සහ විනෝද ක්‍රියා ආදිය වැදගත් මෙවලම් වෙයි. කඳවුර තුළ වූ සියළු කණ්ඩායම් සඳහා කාරිය හඳුනාගෙන ඒවා ආරම්භ කිරීම සඳහා , පිළිගනු ලැබූ විවිධ ඒජන්සීන් සමග සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම වැදගත් වෙයි.

- **ප්‍රජා සංවේදීකරණය.** ආතතිය හා කාංසාව ආදී ක්ෂතියට සම්බන්ධ කරුණු ගැන ප්‍රජාව දැනුවත් කළ යුතුය. කඳවුරු කළමණාකරණ ඒජන්සිය මේ ක්ෂේත්‍රයේ විශේෂඥ ආයතනයක් නොවූවද ක්ෂතියට භාජන වූවන් පිළිබඳ ප්‍රජාවගේ අවබෝධය හා ගෞරවය වැඩි කිරීමට හා ගර්භාව අඩු කිරීමටත් එයට පුළුවන. මනෝසමාජමය සුවසහන ඒජන්සියක් වෙයි නම් සංවේදන හා දැනුවත් කිරීමේ කාර්ය සම්බන්ධයෙන් කඳවුරු කළමණාකරු විසින් ඒජන්සිය සමග අඛණ්ඩ පදනමක් මත සම්බන්ධීකරණයක් ඇතිකර ගත යුතුය.

- **සමානව යෙදීම හා සහභාගිත්වය** ක්ෂතියට භාජන වූවනට සාධාරණය අත්‍යවශ්‍යය. කඳවුරු කළමණාකරුවකුට භාණ්ඩ හා සේවා බෙදා හැරීමේ සාධාරණ ක්‍රමයක් වර්ධනය කර ගත හැක. ආහාර හා ආහාර නොවන ද්‍රව්‍ය සංවිධානය හා බෙදා හැරීම් සඳහා කාන්තවන්ගේ සමාන සම්බන්ධවීම තහවුරු කිරීම වැඩි සාධාරණත්වයක් සඳහා එක් වැදගත් මාර්ගයකි. සියයට පණහක කාන්තා සහභාගිත්වයක් සඳහා යත්න දැරිය යුතුය.(පරිච්ඡේදය 7 සහ 9 බලන්න) අතිරේකව හැමවිටම සියලුම නායකත්ව ව්‍යුහවල හා කමිටුවල සියයට පණහක කාන්තා සහභාගිත්වය ඇති කර ගැනීම ඉලක්කයක් විය යුතුය (පරිච්ඡේදය3 බලන්න)



අවතැන් වූවෙකුට තමන් බලවත්ව ඇතැයිද, තමන්ගේ ජීවිතය පාලනය කරගැනීමට හැකියාවක් ඇතැයිද යන හැඟිමක් ඇතිකර දීම ආත්ම අභිමානය හා ගෞරවය යළි නගා සිටුවීම සඳහා තිරණාත්මක වෙයි.

**තොරතුරු විනිවිදව ව්‍යප්ත කිරීම.** සමහරුන් වෙතට වෙනත් අයට පමණ පහසුවෙන් සමීප වීම අපහසු බව සිතෙහි තබා ගෙන, සරණාගතයින්ට/IDP යනට, ඔවුන්ගේ සියලු හිමිකම්, ප්‍රති ලාභ,හා සේවා සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු ලබා දිය යුතුය. කඳවුරේ බලපවත්නා රීති, අයිතිවාසිකම හා වගකිම් ,පුද්ගලයින් විසින් අවබෝධකර ගැනිම අවශ්‍යය. මේ අයුරෙන් කඳවුරු ජිවිතය ස්වීරසාර බවක් ඇතිකර ගැති හැකි වන අතර අපෙක්ෂා කළ හැකි දේවල් ද පැහැදිලි වනු ඇත. පුද්ගලයින්ගේ කාංසාව, ක්ෂතිය හා අනාරක්ෂිත බව පිළිබඳ හැඟිම් අඩුකර ගැනිමට උදව්වක් වශයෙන් සැලසුම් කිරීමේ හා බෙදා හැරීමේ සියලු අංගයන් පිළිබඳ පැහැදිලි හා විනිවිද බවකින් යුත් තොරතුරු සැපයිය යුතුය.

**උපදේශනය සඳහා ආරක්ෂිත ස්ටානයක්.:** උපදේශන සේවා සැපයෙන්නේ නම්. කඳවුර තුළ උපදේශනය පවත්වා ගත යාම සඳහා සුදුසු ස්ටානයක් කඳවුරු කළමණාකරු විසින් හඳුනාගත වෙන් කර දිය යුතුය. පිවිසිමට පහසු,නිස්කලංකය සහ සුවපහසුව ඇති තැනක් සොයා දිය යුතුය.

**රහස්‍යභාවය:** වගකිම දරණ ඒජන්සිය මගින් උපදේශනයෙන් පසුව පුද්ගලයින්ගේ පුද්ගලික ලිපි ගොනු රහස්‍ය බව හා ආරක්ෂාව ඇති වනසේ ගබඩා කර තැබීමට පෙළඹවිය යුතුය

**සන්නිවේදන නාලිකාව:** අවතැන්වූනන්ට ඇහුම් කන් දීම සහ ඔවුන් සමග කතාබහ කිරීම ඔවුන්ගේ සුවපත් වීම සඳහා අත්‍යවශ්‍යවෙයි. තමන්ට බලපාන කරුණු ඉදිරිපත් කර සිටීමට හා අවශ්‍යතා දන්වා සිටීම සඳහා මිනිසුන්ට සන්නිවේදන මාර්ගයක් සකස් කර දිය යුතුය. UNHCR ය ආරක්ෂාව

සැලසූ දවස්වල සංවිධානය කළ කඳවුරු කළමණාකරණ කණ්ඩායමේ සාමාජිකයෙක් කඳවුරු නිවැසියන්ගේ ඕනෑඑපාකම් වලට ඇහුම්කම් දීමට දවස් බාගයක් මිඩංගු කළ ආකාරයට සමාන ආකාරයකට, මේ සන්නිවේදන නාලිකාව පවත්වාගෙන යා හැක. මෙය මනෝසමාජමය සුවසහනය සඳහා වගකිම් දරණ ඒජන්සිය හා ආරක්ෂක නිලධාරි/ප්‍රජා සේවාන නිලධාරී හා සමග සහයෝගය ඇතුව කළ හැක.

**කඳවුරු නීතිරීති.** ආපදාවට හා ක්ෂතියට භාජන වුවනට නිදා ගැනීමේ දුෂ්කරතාවනට මුහුණ දිය හැකි බව දැන සිටිම වැදගත්ය.සාමනයයෙන් නිදාගන්නා වේලාවේ කඳවුර තුළ නිහඬතාවක් පවත්වාගන යාම සඳහා උනන්දු කළ යුතුය.

**පක්ෂග්‍රාහි නොවිය යුතුයි.** ප්‍රජාව තුළ එක් විශේෂ කණ්ඩායමකට, කමිටුවකට හෝ පුද්ගලයෙකුට විශේෂ සැලකිල්ලක් නොපෙන්විම අතිශය වැදගති.

කඳවුරු කළමණාකරණ කණ්ඩායම , ප්‍රජාව සඳහා වැඩ කිරීම වෙනුවට ප්‍රජාව සමග වැඩ කිරිමේ වැදගත්කම අවබෝධ කර ගත යුතුය. හොඳ සන්නිවේදනයක් හා පසුපෙවුම් ලබා ගැනිම හා සකස්කිරිම තහවුරු කිරීම ඉතා වැදගති.

# මෙවලම් කට්ටලය

**ක්ෂතිය අත්දැකීමවල පලවිපාක.-මූලික නිමිති ලකුණු ලැයිස්තුවක් (පශ්චාත් ආතතිය අබාධ සඳහා ජාතික මධ්‍යස්ථානයෙන්)**

මේ ලේඛණයේ ක්ෂති ආතතියේ වඩාත්ම පොදු මූලික නිමිති ලකුණු කෙටියෙන් විස්තර කෙරෙන ලැයිස්තුවක් දැක්වෙයි. ලැයිස්තුව කිසිසේත් පරිපූර්ණ නොවුනද, ක්ෂතිය අත්දැකීම් වල පලවිපාක වලින් පෙළෙන්නවුන් වඩා හොඳින් අවබෝධකර ගැනීමට සමහර හොඳ දර්ශක සපයයි. මේ පත්‍රිකාව දැන ගැනීම සඳහා පමණයි. මෙය කඳවුරු කළමණාකරුවතු විසින් හෝ කවරම වෘත්තික නොවන සෞඛ්‍ය කාර්ය මණ්ඩලයක් විසින් හෝ කවරම හෝ රෝග නිධාන හඳුනා ගැනීම සඳහා භාවිත කිරීම පිණිස නොවේ..

**අවශ්‍ය කියවීම් හා ආශ්‍රේයයන්.**

අර්බුද සහ පසු අර්බුදකාරි තත්වයට මුහුණ පෑ අවතැන් වු සහ වෙනත් ප්‍රජාවන්ගේ, සරණාගතයින්ගේ මානසික සෞඛ්‍ය අවශ්‍යතා ක්ෂණික ඇගයීම. WHO, ජිනිවා 2000

පෙනෙවි, එම්. 1996 බලෙන් අවතැන් කිරීම : සරණාගත ක්ෂනිය, ආරක්‍ෂාව සහ සහාය, ක්ෂනික ආතතියට ජාත්‍යන්තර ප්‍රතිචාරය. ඩානියලි, වයි, රොඩිනි, එන් වෛසාත්, එල් (EDS) එක්සත් ජාතින්ගේ ප්‍රකාශනය, නිව්යෝර්ක්.

who.who/NUHCR.1999 සරණාගතයින්ගේ මානසික සෞඛ්‍යය who - ජිනිවා.

LASC. 2003. හදිසි පසුබිම් තුළ HIC/AIDS වලට මැදිහත්වීම පිළිබඳ නිර්නායක

සරණාගත කාන්තා සහ ළමයින් සඳහා මහ කාන්තා කොමිසම සරණාගතයින් සහ ඒඩ්ස් මානවාදි රාජධානිය ෂණ්ඩ සහ ගැටුම ද්විත්ව හදිසියක්.

හොල්මිස් ඩබ් අන්තර් ජාතික ගලවා ගැනිමේ කමිටුව 2003 අනාගතය සුරකිම HIV වැළක්වීම, සත්කාරය සහ යුද්ධයෙන් බලපෑවිම ප්‍රජාව සහ අවතැන් වුවන්ව අතර සහාය.

- www.unhcr.ch
- www.ineesite.org (inter-Agency Network for Education in Emergencies)
- www.catholicrelief.org
- www.unaids.org
- www.theirc.org

සැලකිය යුතුයි මේ පත්‍රිකාව තොරතුරු දැන්වීමක් පමණි. මෙය කඳවුරු කළමණාකරුවනු විසින් හෝ කවරම වෘත්තික නොවන සෞඛ්‍ය කාර්ය මණ්ඩලයක් විසින් හෝ කවරම හෝ රෝග නිධාන සඳුනා ගැනීම සඳහා හෝ භාවිත නොකළ යුතුය.එවෙන්ම මෙය මානසික සෞඛ්‍ය සපයන්නතුගේ තැන සඳහා විකල්පයක් සේ ද නොගත යුතුය..

# ක්ෂති අත්දැකීම්හි පලවිපාක.

## මූලික නිමිති ලකුණු ලැයිස්තුව.

ක්ෂතියේ මූලික ලක්ෂණ බොහෝවිට ක්ෂතිකාරක සිද්ධියෙන් පසුව ආරම්භ වෙයි වඩාම පොදු මූලික ලක්ෂණ සාමූහිකව පශ්චාත් ක්ෂතිය ආතතිය ආපදාව යනුවෙන් නම් කෙරෙයි. (PT SD)(Post Traumatic Stress Disorder). පශ්චාත් ක්ෂති ආතති ආපදාව ප්‍රධාන වර්ග තුනකට වැටෙයි. යළි අත්විඳුම් නිමිති,, මගහැරුම් නිමිති, සහ ප්‍රබුද්ධනිමිති. ((Re-experiance¸Avoidance symptoms,Arousal symptoms) එක් එක් වර්ගය යටතේ පහත දැක්වෙන නිමිති ලැයිස්තුව සර්වසම්පූර්ණ නොවේ, ක්ෂති අත්දැකීම විඳින හැම කෙනෙක්ම මේ නිමිති හෝ සමාන නිමිති පෙන්වන්නේද නැත. වගුව ක්ෂති අත්දැකීම් වල පලවිපාක විඳින අය අවබෝධකර ගැනීම පිණිස පොදු නිදර්ශක ඉතා ස්වල්පයක් සපයයි.

| යළි අත්විඳුම් නිමිති | මගහැරුම් නිමිති | පිබිදවුම් නිමිති. |
|---|---|---|
| • පසු බැල්ම. අත්දැකීම යළි යළි නැවත විඳියි | • ක්ෂිති කාරක සිද්ධිය හා ඇය/ඔහු සබැඳින සියලු සිතිවිලි,සංවේදන, හා හැඟීම් මගහැරීමට උත්සාහ කරයි | • නින්දට යාමට හෝ නින්දේ පසුවීමට අපහසුව |
| • නරක සිහින හා සිහිනෙන් බිය වීම | | • අවධානය රඳවා ගැනීමේ දුෂ්කර |
| • නිතර කළඹන සුළු සිතිවිලි හා ක්ෂතිය හා සම්බන්ධ සිද්ධිය නිතොර මතකයට ඒම | • ඇය/ඔහු පෙර විනෝද වූ දේ වලට ඕනෑ කමක් නොදැක්වීම | • නිතර හදිසි කෝපය සහ නොරිස්සුම් ගතිය වැඩිවීම. |
| • මතකයන් කාංසාවට හා කෝපයට පොළඹවන නිසා හැඟීම් පාලනයට අපහසුකම් | • පුද්ගලයන්ට ඇල්ම දැක්වීමට සම්පවීමට දුෂ්කර වීම | • අතිශයෝක්ත තිගැස්සුම් ප්‍රතිචාර |
| | • තමන් තමන්ගෙන්ම භේදවූවා සේ හැඟෙයි | • අධි සුපරීක්ෂාව (හැම විටම තියුණු |
| • භෞතික නිමිති, සීතලෙන් ගැහීම, හිසරදය,දාහය හා හුස්ම ගැනීමේ අපහසුව. | • තමා අවට ලෝකයෙන් විසන්ධිව ඇතැයි සිතයි. • චිත්තවේගිව අත්හිටියි. | • සෝදිසියෙන් සිටීම හෝ දෘශ්‍යමාන අන්තාරායායනක් නැති විටත් අතිරේක පෙරපරිස්සම් ප්‍රතිකර්ම ගැනීම |

# 16 සාමය ගොඩ නැගීම සහ ප්‍රතිසන්ධානය.



සුහද සබඳකම් ගොඩනැගිම, ඉවසීමේ හැකියාව, ගැටුම් කළමණාකරනය සඳහා ක්‍රියාවන් කෙරෙහි යොමුවීම කඳවුරු ජිවිතය බොහෝ සේ ඉක්මවා යන ධනාත්මක බලපෑමක් කෙරෙනු ඇත. මේ කොන්ගෝ ජාතික දරුවෝ කායික හා මානසික අභියෝගවලට මුහුණ දීමේ ඉගෙනිමක නිරතව සිටිත්.

# පරිච්ඡේදය 16 : සාමය ගොඩ නැගීම සහ ප්‍රතිසන්ධානය.

## හැඳින්වීම

සරණාගත හා අභ්‍යන්තර අවතැන් (IDP) තත්ව බහුතරයක් ප්‍රචණ්ඩ ගැටුම් හා යුද්ධවල ප්‍රතිඵල වෙයි. කඳවුරු තත්වයන් යටතේ ප්‍රජා හැඟීමක් සහ සාමූහිකත්වයක් ගොඩනැගෙන,ඉවසිලිවන්තකම හා ගැටුම් කළමණාකරණ කාර්ය සඳහා දිරිගැන්වීම ,පවත්නා කඳවුරු ජීවිතය .ඉක්මවා යන ධනාත්මක බලපෑමක් කෙරෙන ආයෝජන වෙයි.සාමය ගොඩ නැගීම හා ප්‍රතිසන්ධානය දිගුකාලීන ක්‍රියාවලියෙකි. ඒනිසාම කඳවුරු පැවැත්මේ මුල් අවදිවල සිටම ආරම්භ කළ යුතුය.

සාමය හා ප්‍රතිසන්ධනය සඳහා දිරිගැන්වීමේදී සැලකිල්ල යොමු කළ යුතු ප්‍රධාන ගැටුම් තත්ව තුනක් ඇත.

### ප්‍රජාව තුළ ගැටුම්

බොහෝ අවස්ථාවන්හි අවතැන්වූ ජනගහන පොදු ප්‍රචණ්ඩත්වය, යුද්ධ හෝ මානව අයිතිවාසිකම් උල්ලංඝණයන්ගෙන් ගැලවී ගිය අයගෙන් සැදී ඇත. අවතැන්වූවෝ බොහෝවිට ක්ෂතියෙන්, පෙළෙන අතර අන් අයට වඩා ඉච්ජා භංගත්වයෙන්, කනස්සලලෙන්, හා කෝපයෙන් පසුවෙති. සම්පත් වලට සීමිත ප්‍රවේශවීමේ අවස්ථා හෝ ආහාර/ ආහාර නොවන ද්‍රව්‍ය බෙදීමේදී වන විෂමතා දැනටමත් පවත්නා චිත්තවේගී තත්ව හා ආතතිය පහසුවෙන්ම උග්‍ර කළ හැක.දිගු කාලයක් මුළුල්ලේ පැවැත්වී ගන යන කඳවුරු තත්ව යටතේ අවතැන්වූවන් විශාල ප්‍රමාණයක් සීමාසහිත ආර්ථික හා අධ්‍යාපන අවස්ථාවන් සහිත කඳවුරුවල සිරවී සිටිති. එවැනි තත්ව, විශේෂයෙන්ම ඇත්තටම අවතැන්වූවන් සන්නද්ධ කණ්ඩායම් හා මිශ්‍රව හෝ ඔවුන්ගේ බලපෑමට යටත්ව ඉඳීමට සිදුවන අවස්ථාවල වලදී සාමයට විශාල තර්ජනයක් විය හැක.තවද අවතැන්වූවනට පිළිසරණක් නොලැබුන හොත් එය අලුත් හෝ දිගටම පැවතිගන යන ගැටුම් තත්වයක ප්‍රභවයක් විය හැක. ප්‍රමාණවත් වන පිළිසරණක් හෝ ආරක්ෂාවක් නැතිවීමේ ප්‍රතිඵල වශයෙන් ආරක්ෂාව හෝ වඩා හොඳ ජීවන තත්ව තහවුරු කර ගත හැකිවෙතැයි ඔවුන් සිතන වෙනත් ස්ථාන කරා යෑමට අවතැන්වූවන් පොළඹවන ද්විතියික සංක්‍රමණයන් ඇතිවනු ඇත.

### බැහැරින් ගෙන ආ ගැටුම්

සටන් වැදී සිටින බලකායවලට ආහාර, පිරිස්බලය, හා අළුතෙන් බඳවා ගැනීම් අවශ්‍ය වනු ඇත.. අවතැන්වූවන් හා සරණාගතයින් සඳහා වූ කඳවුරු විශේෂයෙන්ම මායිමේ හෝ ගැටුම් ඇති ස්ථාන සමීපයේ වූ කඳවුරු, සටන් වැදී බලකායන්ගේ හොරන් කා වැදීම් වලට, බලෙන් බඳවා ගැනීම්වලට ,කප්පම් ගැනීම්වලට, හෝ ආහාර හා වෙනත් ද්‍රව්‍ය සොරකම් කිරීම්වලට ගොදුරු විය හැක. ඒවාට අමතරව, ගැටුම හා එයට හේතු ආදිය සම්බන්ධව අවතැන්වූ ප්‍රජාව අතර පවත්නා පරස්පර විරෝධී අදහස් හා මති මතාන්තර පහසුවෙන්ම ඉස්මතු කර කඳවුරේ අඩමාන ස්ථාවර බව බිඳ දැමිය හැක.

## සත්කාරක ප්‍රජාව සමග ගැටුම්.

සම්පත් සඳහා තරගය, ස්ථානීය පහසුකම් සඳහා ඇති සීමිත ප්‍රවේශය, සංස්කෘතිය වෙනස, හා භාෂා බාධක, සියල්ල අවතැන්වූවන් හා සත්කාරක ප්‍රජාව අතර ගැටුම්වලට පොළඹවයි. බොහෝ අවස්ථාවල අන්තර්ජාතික ප්‍රජාවගේ ආධාර උපකාර අවතැන්වූවන්ට ලබාදෙයි. එහෙත් සත්කාරක ප්‍රජාවනට නොසැපයෙයි. සත්කාරක ප්‍රජාවනට වඩා අවතැනවූවනට වැඩි අවධානය ලැබෙන වැඩසටහන් මේ කණ්ඩායම් දෙක අතර ආතතයික් ඇතිකරයි.

### යොමුවිය යුත්තේ කවුරුන්ද?

- කඳවුරු ජනගහනය
- කඳවුරු සේවා සඳහ වගකීම දරණ ඒජන්සි.
- සත්කාරක ප්‍රජාව
- ප්‍රාදේශීය බලධාරීන්
- UNHCR/ආරක්ෂාව සම්බන්ධ ඒජන්සි
- කඳවුරු ආරක්ෂා සේවය.

## සාමය ගොඩනැගීමේ ක්‍රමෝපායයන්

සාමය සඳහා දිරිගැන්වීම සහ ප්‍රතිසන්ධානය සහ ගැටුම් සම්බන්ධයෙන් ප්‍රතිකර්ම සලසාගැනිමට ප්‍රජාවකගේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා බොහෝ මාර්ග ඇත.

සිතාගත හැකි මුල පිරීම් අතර කඳවුරේ ප්‍රජාතාන්ත්‍රික නිලවරන, කඳවුරු තියටර, සංගීත , ක්‍රීඩා හා සමාජ උත්සව, දුක් ගැනවිලි කමිටු, ඒකාබද්ධ ක්ෂුද්‍ර ණය වැඩසටහන්, අන්තර් ආගමික සමුළු ආදිය ඒවායින් කිපයකි. සාමය නංවන වැඩසටහන් සඳහා වගකීම ඇති ඒජන්සියක් ඇතත් නැතත්, කඳවුරු කළමණාකරණ කණ්ඩායමට, ප්‍රජාවගේ පසුබිම , ගැටුමේ නිදන්ගත හා ආසන්න හේතු, ප්‍රජාව තුළ තවමත් පවත්නා බල ව්‍යුහයන් ආදිය පිළිබඳ මනා අවබෝධයක් තිබීම අතිශයෙන් අවශ්‍යය.සාමය සඳහා වූ ක්‍රමෝපායයන් සාර්ථක වීමට ප්‍රතිපත්ති (මූල ධර්ම)ගණනාවක් සැලකිල්ලට ගත යුතුය.

1. සාමය ගොඩනංවන යත්න දීර්ඝ කාලින කැපවීමක් සේ දැකිය යුතුය.
2. මේ ප්‍රයත්න ගැටුම් නිරාකරණය හා දැනටමත් ඇති ප්‍රවේශ මත පාදක විය යුතුය. අවතැන්වූ හා ස්ථානීය ප්‍රජාව යන දෙපක්ෂයම ඔවුන්ගේම ක්‍රමෝපායන් හා ප්‍රතිචාර මත සාමාන්‍යයෙන් විශ්වාසය රඳවති.
3. පොදු හරයන් දරණ හා පිළිබිඹු කරන පුද්ගලයින් මූලපිරුම්වලට සහභාගිවිය යුතුය.
4. ජනයා පලා යාමට පෙළඹුන හේතූන් හා ගැටුමේ පසුබිම, සාමය ගොඩනැගීමේ යත්න වලදී නොසලකා අත්නොහැරිය යුතුය.ඊට ප්‍රතිවිරුද්දව ගැටුමට මුල් වූ හේතුවලට නිසි ප්‍රතිචාර දැක්විය යුතු අතර අසාධාරණ සම්බන්ධතාවන්ට හා ව්‍යුහයයනට අවධානය යොමුකළ යුතුය.

5 සාමය ගොඩනැංවීමේ යත්න ප්‍රජාවගේ අවශ්‍යතා අනුව නිශ්චය කර ගත යුතු අතර ඒ සඳහා සහභාගිත්ව ප්‍රවේශයක් හැමවිටම තිබිය යුතුය. අවතැන්වූවන් අතර සහනාධාරවලට ගැතිවීමක් ඇතිවීම වැළැක්වමට උත්සාහ දැරිය යුතුය.

6 හැම වැඩසටහනක්ම සාමය ගොඩනැංවීමේ යත්න හා එකට බැඳී තිබිය යුතුය.

7 විරුද්ධ ප්‍රතිඵල ජනික කරවන බලපෑම් හඳුනා ගැනීම සඳහාත් සාමය හා දිගු කාලින ප්‍රතිසන්ධානය සඳහා සහායක දේශපාලන බල වේග,කණ්ඩායම් හා ඒකකයන් සන්නද්ධ කරගැනීම සඳහාත් බැහැරින් ලැබෙන ආධාර සුපරීක්ෂාකිරීව අධීක්ෂණය කළ යුතුය.

8 විවිධ කණ්ඩායම් මත සහනාධාර ඇති කරනු ලබන සමාජමය බලපෑම පරීක්ෂාකර බැලිය යුතුයඋදාහරණ වශයෙන් ගැහැණුන්ට හා පිරිමින්ට වෙනස් වෙනස් භෞතික හා සමාජමය අවශ්‍යතා ඇත



NRC කාර්ය මණ්ඩලය කොළොම්බියානු අවතැන්වුවන් (IDP) සමග.මැදිහත්බව හා ප්‍රජාවෙහි එක් කණ්ඩායමකට ,කමිටුවකට හෝ පුද්ගලටයන්ට විශේෂ අවධානයක් නොදැක්වීම හැම කඳවුරු කළමණාකරුවකටම වැදගති. ජායාරූපය තෘයිස් බ්‍රෙක්කෙ, NRC

සම්ප්‍රායික හා සංස්කෘතිය ලිංගික කාර්ය භාර හැමවිටම කාන්තාවන් හා ඔවුන්ගේ දූදරුවන් මත අතිරේක බරක් ගැටුම් අවස්ථාවල හා පශ්චාත් ගැටුම් කාල වල යොදයි.මෑත කාලයන්හි ගැහැණුන් සටන් වැදියන් හෝ ප්‍රචණ්ඩ ගැටුම් වලට ගොදුරුවූවන් ලෙස හෝ වඩ වඩා සබැඳී ඇත.ගැහැණුන් හා දැරියන් ඉලක්ක කර ගැනීම සුවිශේෂ යුද්ධ උපක්‍රමයක් සේ දැන් පිළිගෙන ඇත. සාමය ගොඩ නැගීමේ හා ප්‍රතිසන්ධාන ක්‍රියාවලියේ සියලු අවස්ථාවල සහ සෑම මට්ටමකදීම කාන්තාවන් සහභාගි කර ගත යුතුය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්.

සාමය ගොඩ නැගීමේ හා ප්‍රතිසන්ධාන ක්‍රියාවලින් කඳවුරු තත්ව යටතේ විවිධ ක්ෂේත්‍ර ගණනාවක් සමග සබැඳී පවති.කඳවුරේ සියලු වැඩසටහන් තුල අදාළ ක්‍රියාවන් පිළිබිඹු විය යුතුය. ආරක්ෂාව, ආහාර හා ද්‍රව්‍ය බෙදා හැරීම,ක්ෂති නිවාරණ,සේවාවන්ට ප්‍රවේශය,නායක්තව ව්‍යුහයන් ආදි ක්ෂෙත්‍ර සියල්ලම සාම ගොඩ නැගීමේ යත්න සඳහා අතිශය වැදගත්ය.ඒ නිසාම කඳවුරු කළමණාකරුවකුගේ වගකීම් ප්‍රමාණය බොහෝය.

## ▷▷▷ කඳවුරු කළමණාකරණ කණ්ඩායමේ මුඛ්‍ය වගකීම.

- **පක්ෂාග්‍රාහී නොවීම.** : ප්‍රජාවේ එක් විශේෂ කණ්ඩායමක්,කමිටුවක් හෝ පුද්ගලයන් කෙරෙහි සුවිශේෂ වූ අවධානයක් නොපෙන්වීම අතිශය වැදගත්ය.කඳවුරු කළමණාකරුවෙක් හැමවිටම මධ්‍යස්ත විය යුතුය(පරිච්ඡේදය 3 ප්‍රජා සහභාගිත්ව බලන්න)
- **බැහැරින් එන බලපෑම් අධීක්ෂණය** : කඳවුරු පරිශ්‍රයේ සිටින්නන් වශයෙන් කඳවුරු කළමණාකරණ කමිටුවට, සටන් වැදි කණ්ඩායම් මගින් කා වැදීම,,සටන් සඳහා බඳවා ගැනීම, සටන් වැදි කණ්ඩායම් මගින් ආහාර සහනාධාර බලෙන් පැහැර ගැනීම හෝ සොරකම්, කිරීම ආදි බැහැරින් ඇතිවිය හැකි තර්ජන හඳුනා ගැනීම සඳහා වැදගත් කාර්ය භාරයක් කිරීමට ඇත. කඳවුරු කළමණාකරු විසින් මෙවැනි තර්ජන ආරක්ෂාව සපයන ඒජන්සියට/ආරක්ෂා

නිලධාරියාට සහ අදාල ප්‍රාදේශීය බලධාරීන්ට වාර්තා කළ යුතුය.(පරිච්ඡේදය 5 ආරක්ෂාව සහ පරිච්ඡේදය 8: කඳවුරු ආරක්ෂාව බලන්න)

- **පසුබිම පිළිබඳ දැනුම** : අවතැන්වූ ජනගහනයේ පසුබිම, ගැටුමේ හේතු, සහ පවතින නායකත්ව ව්‍යුහය පිළිබඳ දැනීම අවශ්‍යය. ගැටුම් විශ්ලේෂණ මෙවලම් ගැටුමේ මුල් වූ හේතු හඳුනා ගැනීමට ඉවහල් වනු ඇත.

- **ප්‍රජානායකත්ව තේරීම් චන්ද** : කළමණාකරණ කණ්ඩායම ප්‍රජාතන්ත්‍රිකව තෝරාපත් කර ගත් කමිටු පිහිටුවීම සඳහා අනුබල දිය යුතුය.(පරිච්ඡේදය 3 ප්‍රජා සහභාගිත්වය බලන්න) මේ කමිටුවල දුක්ගැනවිලි කමිටුවේ සාමජිකයෙක් සිටීම සහතික කිරීම වැදගත්ය(දුක්ගැනවිලි කමිටුවක් සැලසුම් කිරීමේ උදාහරණයක් සඳහා පරිච්ඡේදය 3 ප්‍රජා සහභාගිත්වය බලන්න) මේ කමිටුවල සියයට පණහක කාන්තා සහභාගිත්වයක් ඇති කර ගැනීම ඉලක්කයක් විය යුතුය.

- **අයිතිවාසිකම් සහ වගකීම්** : සියලුම කඳවුරු වැසියන් සඳහා වූ කඳවුරු රීති,අයිතිවාසිකම් සහ වගකීම් හැම අයෙක්ම අවබෝධ කර ගත යුතුය. මේ අයුරෙන් කඳවුරු ජීවිතය සැක මුසු බවෙන් තොර පැහැදිලි අපේක්ෂාවලින් යුත් එකක් වනු ඇත. ඒ නිසා හැමවිටම කඳවුරු නිවැසියන් සමග තොරතුරු බෙදා හදා ගැනීමේදී නිවැරදි බව හා විනිවිද බව අතිශය වැදගත්ය. පුද්ගලයන්ගේ කාංසාව, ආතතිය හා අනාරක්ෂිතබව ආදී හැඟීම් අඩු කර ගැනීම සඳහා උදව්වීම සඳහා සැලැසුම් හා බෙදා හැරීම් සම්බන්ධ සියලුම අංගයන් පිළිබඳ නිරවුල් හා විනිවිදබවෙන් යුත් තොරතුරු තිබීම අවශ්‍යය.

- **කඳවුරු නිවැසියන්ගේ හිමිකම් තොරතුරු** : ප්‍රජාවේ හැම කෙනෙක්ම ඔහු ගේ හෝ ඇයගේ හිමිකම් පිළිබඳ තොරතුරු සම්පූර්ණයෙන් වශයෙන් දැන සිටිය යුතුය.

- **කඳවුරු නීති** : කඳවුරු නීති රීති සකස්කර, ස්ථාපනය කොට අනුගමනය සඳහා දිරිගැන්විය යුතුය.මේ සම්බන්ධයෙන් කළමණාකරණ කණ්ඩායම වගකීම දරණ ඒජන්සිය/ආරක්ෂක ඒජන්සිය සමග සම්බන්ධීකරණයක් ඇති කර ගත යුතුය.නීති රීති සම්බන්ධයෙන් කඳවුරු ජනගහනය දැනුවත් කළ යුතුය.

- **සත්කාරක ප්‍රජා සම්බන්ධීකරණ නිලධාරියා** : අවතැන් ප්‍රජාව අතරෙන් හඳුනාගත තෝරාපත් කර ගත් මේ නිලධාරියා කඳවුරු ප්‍රජාව හා සත්කාරක ප්‍රජාව අතර සාකච්ඡාවන්හිදී හා ගැටුම් නිරාකරණ කාර්යයන්හිදී නායකත්වය ගත යුතුය.සත්කාරක ප්‍රජාව හා කඳවුරු ප්‍රජාව අතර නිරන්තර හමුවීම්(රැස්වීම්) සංවිධාන කර ගත යුතුය.(පරිච්ඡේදය 3 ප්‍රජා සහභාගිත්වය බලන්න)

- **කණ්ඩායම් පනාගැනීම හා සහජීවනය** : මේ සඳහා ක්‍රීඩා, ජාතික/අන්තර්ජාතික නිවාඩු,සංගීතය සහ ක්‍රීඩා ආදියෙන් මුල පිරිය හැක. මේ සමාජ කාර්යයන්හි දී සත්කාරක ප්‍රජාවද සහභාගිකර ගත යුතුය. අවතැන් ප්‍රජාවේ සියලුම කණ්ඩායම් සහභාගි කර ගැනීමද අතිශය වැදගත්ය.

- **සම්ප්‍රදායික ගැටුම් නිරාකරණ ක්‍රම** : සත්කාරක ප්‍රජාව හා අවතැන් ප්‍රජාවන් දැනටමත් අනුගමනය කරණ ගැටුම් නිරාකරණ හා ප්‍රතිසන්ධාන ප්‍රවේශයන් පිළිබඳව දැන සිටීම වැදගත්ය.

- **වගකීම් දරණ වෙනත් ඒජන්සි සමග සම්බන්ධීකරණය** : කණ්ඩායම් /සබඳතා ගොඩනැගීම් ප්‍රවේශයන්, තමන්ගේ වැඩ සටහන්වලද අන්තර් ගත කරවීම සඳහා හැකියා පුහුණු කිරීම් හා අධ්‍යාපන සේවා සපයන ඒජන්සි සමග සම්බන්ධීකරණයක් ඇති කර ගැනීම ඉතා වැදගත්ය. ළමයින් සඳහා සාමය පිළිබඳ අධ්‍යාපනය සංවිධානය සඳහා අධ්‍යාපනය සඳහා වගකීම දරණ ඒජන්සිය සමග සම්බන්ධීකරණයක් ඇති කර ගත යුතුය.

# මෙවලම් කට්ටලය

## මවලම් කට්ටලයක් දැනට නැත.

ඔබේ යෝජනා කඳවුරු කළමණාකරණ ව්‍යාපෘතිය වෙත යොමු කරන්න.

### අවශ්‍ය කියවීම් සහ ආශ්‍රේයයන්

කාර්පෙන්ටර් එස් . එල්. කෙනඩ්, ඩබ්: ජේ.ඩී. 1988 ගැටලු විශ්ලේශනය, පරිච්ඡේදය 4 මහජන වාදකිරිම් පාලනය: අර්බුද මෙහෙයවීම සහ ගිවිසුම්වලට එලඹීමට ප්‍රායෝගික මගපෙන්වීමක්-සැන් ප්‍රැන්සිස්කෝ.

ෂීසර්, එස්. ජාවිඩ්, එල්.විලියම්ස් 2000 අර්බුද තේරුම් ගැනීම, සහ අර්බුද විශ්ලේශනය සඳහා මෙවලම් පරිච්ඡේදය 1 සහ 2 අර්බුද සමග වැඩ කිරීම ක්‍රියා කාරිත්වය සඳහා (පුහුණු ද්‍රව්‍ය)

කුමාර් කේ. 1997 සිවිල් යුද්ධවලට පසු සමාජ යලි නගාලීම, අන්තර්ජාතික සහයෝගය සඳහා තිරණාත්මක කාරියන් ලන්ඩනය.

- www.catholicreliet.org (CRS price building Programmes)
- www.wanep.org (west Africa network for peace-building)
- http://ccrweb.ccr.uct.ac.za (center for conflicts Resolution)
- www.relielweb.int/training

# 17 කඳවුර කළමනාකරණ කණ්ඩායමේ වගකීම්



*සියරා ලියෝන්හි ජෙම්බෙ කඳවුරේ ප්‍රජා සේවා සහායිකාවක සමග කඳවුර කළමනාකාරවරිය (දකුණේ) සාකච්ජාවක යෙදෙන අවස්ථාවක්. ජායාරූපය නිනා එම්. බ්‍රිකෙලැන්ඩ්*

# පරිච්ඡේදය 17 : කඳවුර කළමනාකාර කණ්ඩායමේ වගකීම්.

## හැඳින්වීම :-

මුල් පරිච්ඡේදවල පෙන්වා දුන් පරිදි කඳවුරු කළමනාකාරවරයෙකුගේ වගකීම් අධීක්ෂණ සහ පරිපාලක කාරියකට වඩා ඉක්මවා යන තත්ත්වයකි. කඳවුරු ක්‍රියාකාරී පිළිබඳ විවිධ ක්ෂෙත්‍රයන් හි අවශ්‍ය සේවාවන් සැපයීම හා සම්බන්ධීකරණය සම්මිශ්‍රණය කරමින් සමස්ත වගකීම් දැරීම කඳවුරු කළමනාකරුට හිමිවේ. කළමනාකාරවරයා සතු ක්ෂේත්‍ර පරිචය කුමක් වුවත්, ඔහු හෝ ඇය අවතැන්වූවන් වගේම සත්කාරක ජනයාට බලපාන්නා වූ සියලු කටයුතු ගැන දැනුවත් විය යුතුය. කඳවුරෙහි සේවය කරන බොහෝ ඒජන්සිවල පරිපාලනමය සහ සම්බන්ධිකරණ තාක්ෂණික අරමුණු වලට අමතරව, ආරෝරාවන් (විය හැකි) අර්බුදකාරී අවස්ථාවන් සහ අවතැන් වූවන්, සත්කාරක ප්‍රජාව සහ අධිකාරීන් අතර මානව හිතවාදී භේද රහිත, බව ප්‍රවර්ධනය කරන්නා වූ වඩාත් තීරණාත්මක ක්‍රියාකාරීනු වෙති. කඳවුරු පරිපාලනයේ පරම අපේක්ෂාව වන්නේ අවතැන් වූවන්ගේ මූලික අයිතිවාසිකම් ජාත්‍යන්තර පොදු සම්මතයන සහ ප්‍රමිතීන් වලින් පෙන්වාදී ඇති පරිදි සපුරා ලීමය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායම

කඳවුරු කළමනාකරණ කණ්ඩායම වඩාත් කැමති පරිදි සැදුම් ගනු ලබන්නේ, කඳවුර කළමනාකරණ ඒජන්සියේ නියෝජිතයින් කඳවුරු වාසී ප්‍රජාව සහ සියලුම ඒජන්සිවල නියෝජිතයින් සහ කඳවුරේ සේවාවන් කරන ස්වදේශීය ජාත්‍යන්තර නියෝජන සහිතවය. කෙසේ වුවද, කඳවුර කළමනාකරණ ඒජන්සිය කඳවුරේ දෛනික කටයුතුවල ප්‍රධාන මෙහෙයුම භාරගත යුතුය කළමනාකරණ ඒජන්සිය මගින් පුරුෂ හෝ ස්ත්‍රී කඳවුර කළමනාකරුට මානවවාදී සියලු කටයුතු පිළිබඳ පරිපාලන සහ සම්බන්ධීකරණ වගකීම ලබාදිය යුතුය කඳවුර කළමනාකරුට එක් සහායකුගේ සහාය අවශ්‍යයෙන්ම ලැබිය යුතු අතර ඔහු ඒජන්සිය හෝ කඳවුරු ප්‍රජාව අතරින් තෝරා ගත හැකිය කඳවුරු කළමනාකරු නොමැති අවස්ථාවලදී ඔහු / ඇය කටයුතු කළ යුතුය. කඳවුරු කළමනාකරණ කණ්ඩායම සැදුම් ගත යුත්තේ (ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයෙක්ම) කඳවුරු වාසියන්ගේ නියෝජිතයින් (උදාහරණයක් වශයෙන් කඳවුරු කමිටුව මගින් තෝරා ගත් (3 වන පරිච්ඡේදය බලන්න - ප්‍රජා සහභගිත්වය සහ කඳවුර කමිටු) කඳවුරෙහි කටයුතු කරන වෙනත් ඒජන්සිවල නියෝජියින් සහ කඳවුර පරිපාලනය කරනු ලබන ඒජන්සියේ කළමනාකාරවරයා හැර වෙනත් අයගෙන්ය. සරණාගත සහ අභ්‍යන්තර අවතැන් වූ කාන්තාවන්ගේ විශේෂිත තත්ත්වයන් සලකා බලා ඔවුන් කඳවුරු කළමනාකාර කණ්ඩායමට ප්‍රබල හඬක් නැගීමට හැකිවිය යුතු අතර තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී සම්බන්ධ විය යුතුය ඒ මගින් සෑම අංශයකම ස්ත්‍රී පුරුෂ කරුණු සැලකිල්ලට ගත හැකිය මුලින් අවධාරණය කර ඇති පරිදි විශේෂයෙන්ම ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය බෙදා හැරීම සහ ආරක්ෂාව සහ ආරක්‍ෂක බව සම්බන්ධයෙන් වැදගත් වේ.

කඳවුරු කළමනාකරණ කණ්ඩායමට සරණාගත සහ අභ්‍යන්තර අවතැන් වූ කාන්තා සම්පූර්ණ නියෝජනයක් තිබිය යුතුය. කඳවුර මෙහෙයුම් සම්බන්ධ සෑම අංශයකම ලිංගික කරුණු ඒකාබද්ධ කිරීම් වස් නිකම්ම ප්‍රතිලාභින් හෝ කඳවුරු වැසියන් වශයෙන් පෙනී සිටීම නොව එදිනෙද කටයුතුවලදී කොටස්කරුවන් ලෙස සැලසුම් කිරීමේදී සහ තීරණ ගැනීමේදී කාන්තාවන් තීරණාත්මක මෙහෙවරක් ඉටු කළ යුතුය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්.

කළමනාකාර හෝ කඳවුරු කණ්ඩායම වගකීම් ලෙස බොහෝ තීරණාත්මක කටයුතු හඳුනාගත හැකි වුවත්, වගකීමේ ප්‍රචණ්ඩත්වය සහ සම්බන්ධවීම තීරණය වන්නේ විශාල වශයෙන් බොහෝ කරුණු මතය. අවශ්‍යයෙන්ම කඳවුරු තත්ත්වය සහ ස්වාභාවය සහ එහි වැසියන්ගේ අධ්‍යාපනික පසුබිම වෙනසක් ඇති කරන්නේ වුවද, අත්දැකීම් මට්ටම විශේෂඥත්වය සහ දීර්ඝ කාලීනව ප්‍රතිපාදන ලබා ගැනීම සුවිශේෂී වන්නේය. කඳවුරු පිහිටුවීම ආරම්භයේදීම ජාත්‍යන්තර කඳවුරු කළමනාකරණ ඒජන්සියේ ජනිත කොටස්කරුවෙකුව සිටීම වැදගත්ය. හැකි අවස්ථාවල දී සෑම කඳවුරකම රජයේ සම්බන්ධීකාරක ස්ථානයක් අවශ්‍යයෙන්ම තිබිය යුතුය. කඳවුරු කළමනාකරණ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන කණ්ඩායමේ සම්බන්ධ කිරීම නිතරම වටිනා ආයෝජනයක්ම වේ. පරිශ්‍රයෙන් පරිශ්‍රයට කළමනාකරණ ව්‍යුහය විවිධ විය හැකි වුවද, කඳවුරු කළමනාකරණ කණ්ඩායමට සුභදාත්මක කාර්ය භාරයක් පැවැරේ.

- කඳවුර කළමනාකරු
- සහය කඳවුරු කළමනාකරු
- සියලුම ඒජන්සි නියෝජිතයින් (ජාත්‍යන්තර සහ ජාතික) වැඩසටහන් ක්‍රියාකාරිත්වයක් ඇතිව (කඳවුරට වගකිව යුතු බලධාරීන්ගේ අනුමැතිය ඇති කඳවුරු කළමනාකරණ ඒජන්සීන් නිරන්තරයෙන්ම)
- නිවැසියන් විසින් තෝරා ගනු ලබන කඳවුරු කමිටුවේ සභාපතිවරයා හෝ සභාපතිවරිය
- තරුණ නියෝජිතයා / නියෝජිතයින්
- ගබඩා භාරකරු
- ප්‍රජාසේවා නිළධාරී
- සමාජ සේවකයින් (සෞඛ්‍ය, පෝෂණය එච්.අයි.වී./එඩ්ස්)
- ගණකාධිකාර / කැෂියර්
- ලේකම්
- තර්ක ශාස්ත්‍රඥයා / මිළට ගැනීම
- දත්ත ලිපිකරු
- ක්ෂේත්‍ර සමීක්ෂකයින්

ඉහත දැක්වෙන තනතුරු වලින් සමහරක් කඳවුරු වැසියන් හෝ සත්කාර ප්‍රජාව අතරින් තෝරා ගත යුතුය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ සම්බන්ධීකරණ ක්‍රම වේදය

කඳවුරු කළමනාකරණ කණ්ඩායම මාසිකව දෙවරක් වත් අවම වශයෙන් හෝ අවශ්‍ය සෑම විටකම රැස්විය යුතුය. මෙම රැස්වීම් වලදී සිදු කෙරෙන සියලුම කටයුතු පිළිබඳව ගැඹුරින් සලකා බැලිය යුතුය. සංවර්ධනය පිළිබඳ තොරතුරු හුවමාරු කර ගත යුතුය කඳවුරු කළමනාකරණ නියමයන්ට අනුකූලව තීරණගෙන ඒ අනුව ක්‍රියා කළ යුතුය. ප්‍රජාවගේ යහ පැවැත්මට බලපාන කරුණු (යම් කණ්ඩායම් අතර) වලට නිතර ප්‍රමුඛත්වයක් ලබාදිය යුතුය.

සම්බන්ධීකරණ රැස්වීම් වලට ඇතුළත් විය යුතු, නමුත් පහත දැක්වෙන න්‍යාය පත්‍රයේ කරුණු වලට සීමා නොවිය යුතුය.

- ක්‍රියාත්මක කටයුතු පිළිබඳව ඇගයීම
- මානවහිතවාදී සීමාවන් සහ අත්‍යවශ්‍ය අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වයක් දීම හඳුනා ගැනීම

- ආරක්ෂාව පිළිබඳ කරුණු සහ රැකවරණයට අදාළ දේ.
- කඳවුරු වැසියන්ගේ යහ පැවැත්මට අදාළ වෙනත් කරුණු.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීම්

***ලියාපදිංචි කිරීම සහ ලියවිලි සැකසීම:*** කඳවුරු වාසීන්ගේ අලුත්ම නිරවද්‍ය වාර්තාවක් තබා ගැනීම කණ්ඩායම මගින් තහවුරු කළ යුතුය.

***කඳවුරේ ඒජන්සිවල කටයුතු නිරීක්ෂණය:*** මානව හිතවාදී සහ කඳවුරේ කටයුතු කරන ඒජන්සි මගින් භාර ගන්නා ලද වෙනත් කටයුතු නිරීක්ෂණය අත්‍යවශ්‍ය වේ.

***මානව හිතවාදී කටයුතු සම්බන්ධීකරණය:*** අදාළ සියලුම ඒජන්සි සහ ක්‍රියාකරුවන් සම්බන්ධකරගෙන නිතර සම්බන්ධීකරණ රැස්වීම් පැවැත් විය යුතුය. කඳවුරු කළමනාකරණ කණ්ඩායම අදාළ තොරතුරු රැස්කිරීම සහ පවත්වා ගෙන යැම වර්තා කිරීම සහ වෙනත් කටයුතු සම්බන්ධයෙන් මූලිකත්වය ගෙන ක්‍රියා කළ යුතුවේ.

***අතරමැදි මෙහෙවර:*** කාණ්ඩ හෝ කලාප නායකත්වය මගින් ප්‍රජා මට්ටමෙදී විසඳිය නොහැකි තර්කාදිය / කරුණු පොලිසිය/උසාවි සම්බන්ධ නොවන කරුණු සඳහා පිළියම් යෙදීම අවශ්‍යවේ.

***දත්ත සමුදය පවත්වාගෙන යැම:*** කඳවුරේ ජන විද්‍යාව හා සම්බන්ධ ආංශික සහ මානවහිතවාදී කටයුතු සිරස් හරස් කඩක් සඳහා නිරවද්‍ය දත්ත සමුදයක් රැස්කිරීම සහ පවත්වාගෙන යැම වැදගත් වේ.

***තොරතුරු බෙදාහැරීම:*** කණ්ඩායම මගින් නිරවද්‍ය කාලීන තොරතුරු කඳවුරු වැසියන්ගේ කාර්ය සම්බන්ධව කාලීන අයිතිවාසිකම් වගකීම් යන අවශ්‍යතාම් පිළිබඳව කඳවුරු වැසියන් හා මානවහිතවාදී ඒජන්සි ආයතනය යන දෙපිරිසටම ලබාදීම ගැන සහතික විය යුතුය.



*සියරා ලියෝන්හි ජෙම්බේ සරණාගත කඳවුරු නිවැසියන් සහ කඳවුරු කළමණාකරණ කණ්ඩායම ප්‍රජා සම්බන්ධීකරණ නිලධාරී සහ කඳවුරු කමිටු සත්කාරක ප්‍රජාව වෙනුවෙන් ප්‍රජා හිතවාදී වෙළඳ පොලක් පැවැත්වීම සම්බන්ධීකරණය කරන ලදි. ජායාරූපය : නිනා එම් බ්‍රික්ලැන්ඩ්-NRC*

- ***අදාල කඳවුරු නිතිරීති සහ පාලන පරිපාටි නිරීක්ෂණ සහ ප්‍රවර්ධනය කිරීම:*** ප්‍රජා නියෝජිතයින් සහ නායකත්ව කමිටු පරිපාලක පටිපාටිවල දක්වා ඇති පරිදි පිලිපැදිමටත් ප්‍රවර්ධනය කිරීමටත් උනන්දු කළ යුතුය. ඊට අමතරව කඳවුරු නිතිරීති පිලිපැදිම සහතික කිරීම වැදගත්ය.

## අවශ්‍යකරන කියවීම් සහ පරිශීලනය කළ යුතු ලේඛන

- **ඩාවිස් ජේ. ලැබිබර්ට් ආර්. රෙඩ් ආර්. වෙනුවෙන් 2002.** "හදිසි අවස්ථාවන්හි හැසිරවීම" **ලන්ඩන් මධ්‍යම තාක්ෂණ සංවර්ධන කණ්ඩාමය (ITDG)**
- **විෂය ක්ෂේත්‍ර ව්‍යාපෘතිය (ද ස්ෆියර් ප්‍රොජෙක්ට්) 2004.** ව්‍යසනවලට මුහුණුදීමේ අවම සම්මුති සහ මානව හිතවාදි අධිකාරි පත්‍රය **ලන්ඩන්, ඔකස්පාම් ප්‍රකාශකයෝ**
- **එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස් (UNHCR ) 2000.** හදිසි අවස්ථා සඳහා වන අත්පොත **ජිනිවා (UNHCR)**
- **IASC 2003.** හදිසි අවස්ථාවන්හිද, එච්. අයි. වි. / ඒඩ්ස් මැදිහත්වීම සඳහා වන ප්‍රතිපත්තිය.
- **ජාත්‍යන්තර ගලවා ගැනීමේ කමිටුව 2003,** අනාගතය සුරකිම. එච් අයි වී නිවාරණය සුරකිම, සහ අවතැන් වුවන් සහ යුද්ධය, බලපෑ ජනයා අතර සහයෝගය.

- www. sphereproject.org
- www. shelterproject.org
- www. refugeecam.org
- www. theirc.org

## අවපතනය කිරීම සඳහා මෙහි "ක්ලික්" කරන්න.

# කඳවුරු කළමනාකරු සඳහා තොරතුරු සටහන් පත්‍රය

කඳවුරු කළමනාකරුවන් සඳහා වන තොරතුරු සටහන පත්‍රය (මෙම ලේඛනය සවිස්තරාත්මක නොවේ.)

### ජලය

- ☐ ජනතාවට පහසුවෙන් ගෙන යා හැකි පරිදි ප්‍රමාණවත් ජලය තිබේ ද?
- ☐ ජලය ලබා ගනු ලබන්නේ ආරක්ෂිත මාර්ගයකින් ද? කලින් කලට වෙනස්වීම් සිදුවේ ද? ඒවා රැස්කර ඇත්තේ කෙසේ ද?
- ☐ නෑමට සහ සේදීමට ප්‍රමාණවත් ජලය තිබේ ද?
- ☐ ජලය ලබා ගැනීමේදී කාන්තාවන් ළමයින් සතුවන ක්‍රියාකාරීත්වය
- ☐ විශේෂයෙන්ම කුඩා දරුවන් සහ කාන්තාවන් සඳහා පහසුවෙන් ජලය ලබා ගැනීම දියුණු කිරීමට අමතර ක්‍රියාමාර්ග ගත යුතුවේ ද?
- ☐ නිතිපතා ජලය පරීක්‍ෂා කෙරේ ද?
- ☐ ජලයෙහි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක බව පිරික්සීමේ ක්‍රමයක් යොදා තිබේ ද?
- ☐ ජලය සම්බන්ධයෙන් වන "4R's" ක්‍රියාත්මක ද? ජලය පරිහරණය අඩුකිරීම. වැසි ජලය ලබා ගැනීම, ජලය ප්‍රතිචක්‍රීකරණය, ස්වාභාවික ජල චක්‍රය සුරැකීම.

### පාරිසරික සනීපාරක්ෂාව

- සනීපාරක්‍ෂා වැඩසටහන් සමග සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ඇතුළත් වේද?
- ස්ථානය ගංවතුරින් ආරක්ෂාවේ ද?
- සායන සහ පාසල්වලට සනීපාරක්ෂක පහසුකම් සපයා තිබේ ද?
- කඳවුරෙහි සාමාන්‍ය පවිත්‍රතාව ගැන සෑහීමට පත්විය හැකි
- ජලස්ථානයන් වටා ප්‍රමාණවත් ජලාපවාහන ක්‍රමයක් සකසා තිබේ ද? (විශේෂයෙන් ටැප් සහ සෝදන බේසම් අසළ)

- ජලය බැස යෑමේ පද්ධතිය නිතර ශුද්ධ පවිත්‍ර කෙරේ ද?

- සොහොන් බිම පිහිටා ඇත්තේ විෂ බීජ පැතිරීමේ අවදානම අවම මට්ටම පවතින ස්ථානයක ද?

- සබන් බෙදා හැරීම විධිමත් ක්‍රමයකට සිදුවේ ද? නොඑසේ නම් ඇයි?

- ඝන අපද්‍රව්‍ය එකතු කිරීම ප්‍රවාහනය සහ අපහරණය සඳහා සුදුසු ක්‍රම වේදයක් ස්ථාපිත කර තිබේ ද?

- වැසිකිළි සැලසුම් කිරීමේ දී කාන්තාවන්ගේ සංස්කෘතික පුරුදු වලට සුදුසු පරිදි පිහිටුවීමට ඔවුන් විමසා තිබේ ද?

- ළමයින්ට සහ ඔවුන්ගේ මවුවරුන්ට ආරක්ෂා සහිතව භාවිත කිරීමට සුදුසු ස්ථානවල ආලෝකවත් කර වැසිකිළි සකසා තිබේ ද?

- සනීපාරක්ෂක පහසුකම් පිරිසිදුව පවත්වා ගෙන යෑමට ළමුන් දැනුවත් කර තිබේ ද?

- පෞද්ගලික සෞඛ්‍යය සම්බන්ධයෙන් අවම පුහුණුවක් ළමුන්ට ලබාදී තිබේ ද? (උදා:- වැසිකිළි භාවිතයෙන් පසුව අත් සෝදා ගැනිම.)

## තාවකාලික නවාතැන් සහ ඇඳුම්

☐ සපයා ඇති නවාතැන් වල ළමයින් සහ ඔවුන්ගේ මව්වරුන්ට ප්‍රමාණවත් ආරක්ෂාව ලබාදී තිබේ ද?

☐ සම්මත ඉඩකඩ, දෙමාපියන් ඔවුන්ගේ දරුවන්ගේ පෞද්ගලිකත්වය සහ නිදහසේ යෑම් ඊම් වලට ඉඩ දීමට සහ ගෞරවනීය ලෙස හැඳී වැඩීමට සුදුසු පරිදි තිබේ ද?

## ආහාර සහ සනීපාරක්ෂාව

☐ ළමයින්ට ගුණාත්මක ආහාර ප්‍රමාණාත්මකව ලැබෙනවා ද?

☐ ලබා දෙනු ලබන ආහාර සංස්කෘතිය වශයෙන් සමාජානුගතව ලැබේ ද, රසවත් ද? දිරවා ගත හැකි ද?

☐ පිසීමට ඉන්ධන සහ අවශ්‍ය උපකරණ තිබේ ද?

☐ පෝෂ්‍යදායී බව සහ සොයා බැලීමේ ක්‍රමයක් සකසා තිබේ ද?

☐ දරුවන් අතර ඌනතා රෝග, විශේෂයෙන් ගැහැනු ළමුන් හෝ ගැබිනි මව්වරුන් හෝ කිරි දෙන මවුවරුන් අතර තිබේද?

☐ මව්කිරි දීම උනන්දු කරන්නේද? බෝතල් භාවිතය අධෛර්මත් කෙරේ ද?

☐ කිරි නිෂ්පාදන භාවිතය පිළිබඳව සොයා බලන්නේ ද? ඒවා එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්වරයාගේ ප්‍රතිපත්ති වලට අනුකූල වේ ද?

☐ පෝෂ්‍යපදාර්ථ ඌනතාව නිසා ඇතිවිය හැකි රෝග නිවාරණය සහ අවම කිරීමට සුදුසු පියවර ගනු ලැබේ ද?

☐ අවශ්‍ය මැදිහත්වීම සඳහා පෝෂණය පිළිබඳ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ අවශ්‍යතාවක් තිබේ ද?.

**සෞඛ්‍ය සේවා**

අධීක්ෂණය:

☐ වසංගත රෝග තත්ත්වයක් සුපරීක්ෂාකාරීව නිරීක්ෂය කිරීම සඳහා ක්‍රමයක් යොදා තිබේ ද?

හදිසි අවස්ථාලදී මැදිහත්වීම:

☐ මාස 6 සිට (මාස 9 දී එන්නත් වර්ධකයක් ) වයස අවුරුදු පහ දක්වා ළමුන්ට සරම්ප එන්නත ලබා දෙන ලද්දේ ද? (වයස අවුරුදු 12 දක්වා වැඩිහිටි දරුවන්ට එන්නත් ලබාදීමේ වැඩ පිළිවෙළේ ඌනතාවක් ඇති බවට සාධක තිබේද?)

☐ මුඛය හා සම්බන්ධ ප්‍රතිසජ්ලන (ORS) ප්‍රතිකර්ම තිබේ ද? මුඛය හා සම්බන්ධ ප්‍රතිසජ්ලන සුවසාදනය (ORT) සක්‍රියව උනන්දු කිරීමට අවශ්‍ය වන්නේ නම් (ORT) මුඛය සම්බන්ධ ප්‍රතිසජ්ලන සුව සාදන මධ්‍යස්ථාන මගින් මුල් කාලයේදීම ප්‍රතිකාර කිරීමට අවශ්‍යතා පිහිටුවීම අවශ්‍ය ද ?

☐ විටමින් A ඌනතාවෙන් දරුවන් ආරක්ෂා කරගැනීම සඳහා සුදුසු විටමින් A රෝග නිවාරණ වැඩ පිළිවෙළක් යොදා තිබේ ද? එසේම මුල් කාලයේදීම විටමින් A ඌනතා හඳුනා ගැනීමට ක්‍රමයක් තිබේ ද?

☐ කොලරාව වැනි අනුන්ට බලපෑ හැකි බරපතල බෝවෙන රෝගී තත්ත්වයක් ඇති වුවහොත් අවිනිශ්චිතතා සැලැස්මක් තිබේ ද?

☐ කොලරා රෝගයට ප්‍රතිකාර කිරීමට ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් තිබේ ද?

සෞඛ්‍ය සේවා:

☐ ග්‍රාම්‍ය හෝ නාගරික අවතැන් වු ජනයාට, ගැබිනි මව්වරුන්ගේ සෞඛ්‍ය පිළිබඳව සොයා බැලීම, ඔවුන් හඳුනා ගැනීම, ගැබිනි මව්වරුන්ට පිට ගැස්මට එන්නත් ලබාදීම, මාපිය හා ළමා සෞඛ්‍ය සේවා සැපයීම, ළමුන් අතර මූලික රෝගවලට ප්‍රතිකාර ලබාදීම, එන්නත් ලබාදීම, ප්‍රජා සෞඛ්‍ය සේවකයින් පුහුණුකිරීම, ළමයින් ඉඩකඩ ඇති සේවා සැලසීම සහ සෞඛ්‍ය අධ්‍යාපනය වැනි මූලික සෞඛ්‍ය සේවාවන් වලට පහසුකම් තිබේ ද?

☐ සෞඛ්‍ය සේවා මගින් ළමයින් සහ නව යොවුන් තරුණයින්ගේ සෞඛ්‍ය අවශ්‍යතා පරිපූර්ණය කෙරේද?

☐ අමතර සෞඛ්‍ය සේවා වෘත්තික කාන්තාවන් / හෝ ප්‍රජා සෞඛ්‍ය සේවකයින් අවශ්‍ය වේද?

සෞඛ්‍ය අධ්‍යාපනය:

☐ ජනතාවගේ සෞඛ්‍යයට වැදගත් වන බෝවෙන රෝග පාලනය කිරීමට සහ වැළැක්වීමට අධ්‍යාපනය සහ වෙනත් පියවර ගෙන තිබේ ද?

☐ ළමයින්ට සහ නව යොවුන් තරුණයන්ට බලපාන්නා වූ හානිකර සම්ප්‍රදායික සෞඛ්‍ය පුරුදුවලට ආමන්ත්‍රණය කරන වෙනත් පිළියම් තිබේ ද?

☐ මූලික සෞඛ්‍ය සුරක්ෂිත බව පිළිබඳ පුහුණු ආයතනයක් හෝ නිලධාරීන් ඇති කිරීමේ අවශ්‍යතාවක් තිබේ ද?

## ආබාධිත තත්ත්වයක් වැළක්වීම සහ සත්කාර කිරීම

තොරතුරු:

☐ ආබාධිත පුද්ගලයින් ලේඛන ගත කර සහ සහායවී තිබේ ද?

☐ ඔවුන්ගේ වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය කුමක් ද?

☐ ඔවුන්ගේ ආබාධිත ස්වභාවය සහ ප්‍රමාණය කුමක් ද?

☐ විවිධ ආබාධිත තත්ත්වයන් සම්බන්ධ සංස්කෘතික ආකල්ප මොනවා ද ?

☐ ආබාධිත පුද්ගලයින්ගේ පවුල්වලට අවශ්‍ය උදව් සහ ඔවුන්ගේ පවුල් වල විශේෂිත අවශ්‍යතා සපුරා තිබේ ද?

මැදිහත්වීම:

☐ එක් එක් ආබාධිත පුද්ගලයාගේ ඔහුගේ/ඇයගේ හැකියාවන් කරා ළඟාවීමට පියවර ගෙන තිබේ ද? (මෙය දරුවන් සම්බන්ධයෙන් ඉතා වැදගත්වේ)

☐ ප්‍රජා මූලික. පවුල් ඉලක්ක කර ගත් පුනරුත්ථාපන සේවාවන් තිබේ ද?

☐ ආබාධිත තත්ත්වයන්ගෙන් පසුවන දරුවන් සාමාන්‍ය කටයුතු වලට සහ සමාජ ජීවිතය, පාසල් යෑම වැනි කටයුතුවලට සමෝධාන ගත කර තිබේ ද ?

☐ අවතැන් වූ අයගේ ආබාධිත තත්ත්වයන්ගේ සුභ සිද්ධිය සහ පුනරුත්ථාපනය සහතික කිරීමට ගෙන ඇති අවශ්‍ය අමතර පියවර මොනවා ද?

## ආරක්ෂාවට ඇති තර්ජන

☐ කඳවුරු වැසි ජනතාවගේ එක් එක් කණ්ඩායමට බලපවත්වන ආරක්ෂාව පිළිබඳ තර්ජන මොනවා ද? (කාන්තාවන්, ළමයින්, තරුණයන් සහ වැඩිහිටියන්)

☐ කඳවුරු වාසින්ගෙන් කවුරුන් හෝ මිය ගියේද? එසේ නැති නම් ඊට හේතු කුමක්ද? මේ මරණ වළක්වා ගැනීමට කුමන පියවර ගත හැකිව තිබුණි ද?

☐ කඳවුරු වාසින්ගෙන් යම් සාමාජිකයෙකු කායික හෝ ලිංගික හිංසනයට, වධ හිංසාවට බලෙන් පැහැර ගෙන ගොස් යුද හමුදාවට බඳවා ගෙන හෝ වෙනත් ආකාර හිංසනයකට හෝ සූරාකෑමට ලක්වී තිබේ ද? එසේ නම් එහි විශේෂිත අවදානම කුමක් ද?

☐ කඳවුරු වාසීන්ගෙන් කවරෙකු හෝ හිර ගෙයි, බන්ධනාගර ගත කොට, දීර්ඝ කාලීනව , කඳවුරක රඳවා තබාගෙන හෝ වෙනත් ආකාර රඳවා තැබීමක සිටී ද ?

මැදිහත්වීම

☐ තවදුරටත් ළමයින් හිංසනයට ලක්වීමෙන් වැලක්වීමට සක්‍රිය පියවර ගෙන තිබේ ද?

☐ හිංසනයට ලක් වු සියලුම දෙනා සඳහා යෝග්‍ය ප්‍රතිකර්ම සේවා තිබේ ද?

☐ කඳවුරු වාසි පුද්ගලයින්ගේ පෞද්ගලික ආරක්ෂාවට බලපාන තර්ජන පිළිබඳ ජාතික බලධාරීන් සම්පූර්ණයෙන්ම දැනුවත්ව සිටී ද?

☐ ජාතික නීතිය සහ පොදු සම්මතයන් මගින් අවශ්‍ය ආරක්ෂාව ලබා දෙන්නේ ද?

☐ ආරක්ෂක ක්‍රම බලගැන්වීමට අවශ්‍ය වෙනත් පියවර මොනවා ද?

☐ සරණාගතයින්ගේ ආරක්ෂාවට තර්ජන සිදුවන අවස්ථාවලදී එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස්වරයාගේ යෝග්‍ය මැදිගත්වීමක් පවත්වා ගෙන යනු ලැබේ ද?

☐ කඳවුරු වාසි අවතැන් වු ප්‍රතිලාභින්ගේ නිදහස, ආරක්ෂාව දියුණු කිරීමට ගත හැකි උපදේශාත්මක පරිශ්‍රමයන් මොනවා ද?

☐ අවදානමට ලක්ව ඇති කණ්ඩායම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් සැළකිලිමත්වන කඳවුරු නායකයින්, රජයේ නිලධාරීන්, ආරක්ෂක නිලධාරීන්, වෙනත් ඒජන්සි සහ රාජ්‍ය නොවන සංවිධාන වලට පුහුණුව ලබා දෙනු ලැබේ ද? (ළමුන්, කාන්තාවන් සහ සටන් වැද සිටින බලකායන් සහ සම්බන්ධතා පවත්වන්නන් ආදිය)

☐ හිංසනය පිළිබඳ සිද්ධි, හමුදාවට බදාවා ගැනිම සහ අවතැන් වු ජනයා හමුදාවට බඳවා ගැනිම සහ අවතැන් වු ජනයා රදවා තබා ගැනිම සොයා බලා වාර්තා කෙරේ ද?

☐ අවශ්‍ය වන්නේ නම් කඳවුරේ පිහිටීම වෙනස් කිරීම හෝ වැසියන් වෙනත් තැනට යැවීම හෝ අවතැන් වූ පවුල, අවදානමට ලක් වු අය හිංසනයෙන් වලක්වා ගැනිම, සූරාකෑම හෝ හමුදාවට බඳවා ගැනිමෙන් ආරක්ෂා කර ගැනිමට අවශ්‍ය ද?

☐ වාසස්ථාන දියුණු කිරීම හෝ පවුල්වල ආරක්ෂාව තහවුරු කිරීමෙන් අවදානමට ලක්වී ඇති අයට ආරක්ෂා සහිත පසුබිමක් ඇති කළ හැකි ද?

☐ ළමුන් කාන්තාවන්, වැඩිහිටියන් හෝ තරුණයින් ගේ විශේෂයෙන් අවදානමට ලක්ව ඇති අයට විශේෂ වාසස්ථාන හෝ ආරක්ෂක විධිවිධාන අවශ්‍ය වේද?

ඉවත් වීම

☐ පවුල් එකමුතුවට ඇති තර්ජන සොයා බලා, පවුල් වෙන්වීම වැළැක්වීමට අවශ්‍ය උදව් ලබාදී තිබේ ද?

☐ කුමක් හෝ ඉවත්වීමක් සිදුවේද? එසේ නම් ළමයින් සහ අවදානමට ලක්ව සිටින අය ඔවුන්ගේ මූලික ආරක්ෂකයින් සමග යෑමට සියලු උත්සාහයන් දරන ලද්දේ ද?

☐ අවදානමට ලක් වූ අය සහ ළමයින් වැරදි සහගත හෝ හිංසාකාරී ඉවත්වීම් ආරක්ෂා කිරීම සහතික කිරීම පිණිස යෝග්‍ය වන වැඩ පිළිවෙළක් තිබේද?

☐ ආරක්ෂාව රහිත තත්ත්වයන් යටතේ ඉවත් වූ ළමයින් හඳුනා ගෙන ලේඛන ගත කිරීම තහවුරු කිරීම ඔවුන්ගේ සුරක්ෂිත බව, යහ පැවැත්ම සහතික කිරීම පවුල හඳුනා ගැනීමේ ප්‍රයෝජනය තිබේ ද? පවුල සමග සන්නිවේදනය කිරීම සහ යළි එක්වීමට හොඳම, කැමැති අවස්ථාව කුමක්ද යන්න පිළිබඳව සහතික වීමට යෝග්‍ය ක්‍රමවේද තිබේ ද?

☐ ළමයෙකුගේ ඉවත්වීම අවශ්‍ය ලෙස පෙනෙන විට ළමයින්ගේ ආරක්ෂාව සහ යහපත සහතික කිරීමට සුදුසු තත්ත්වයක් තිබේදැයි සොයා බලන ලදද?

## නීතිමය තත්ත්වයන්

☐ සරණාගත තත්ත්ව තීරණය කිරීම:

☐ සරණාගතයන් බවට තීරණය කිරීමේ තත්ත්වය ජාත්‍යන්තර නීති සහ ප්‍රතිපත්ති සමග එකගවේ ද?

☐ එක්ව නොආ ළමුන්ගේ සරණාගත තත්ත්වයන් කඩිනමින් තීරණ කරන ලදද?

☐ තීරණය කිරීමේ ක්‍රියාවලින් සරණාගත අයිතිවාසිකම් ආරක්ෂාවීම සහ ඔවුන්ගේ හොඳ යහපතට ගැලපෙන ලෙස ක්‍රියාත්මක වේද?

උපත් සහ ජාතික ලියාපදිංචිය:

☐ සරණාගත අවතැන් වූ දරුවන් උපතේදී ලියාපදිංචි කර තිබේ ද?

☐ දෙමාපියන්ට උප්පැන්න සහතික ලබාදී තිබේ ද?

☐ සරනාගතයින්ට යම් ජාතිකත්වයක් තිබේ ද?

☐ මරණ සහතික නිකුත් කර තිබේ ද?

## අධ්‍යාපනය

අධ්‍යාපනය සඳහා ඇති අවස්ථා:

☐ ප්‍රාථමික, පශ්චාත් ප්‍රාථමික, විධිමත් නොවන අධ්‍යාපනික අවස්ථා සරණාගතයින් සහ අවතැන් වූ දරුවන්ට තිබේ ද?

☐ අධ්‍යපන අවස්ථා සඳහා ඇති තත්ත්වය සහ එම තත්ත්වය දියුණු කිරීමට යොදා ඇති පියවර මොනවා ද?

☐ පවතින අධ්‍යාපනය සරණාගතයින්, අවතැන් වූ අයගේ පළපුරුද්ද සහ අවශ්‍යතාවන්ට ගැලපේ ද?

☐ අධ්‍යාපනය ලබා දෙන්නේ ළමයින්ගේ, විශේෂයෙන් කුඩා දරුවන්ගේ මව් බසින් ද?

ළමුන්ගේ මත / අදහස්:

☐ පවතින අධ්‍යාපන අවස්ථා ගැන ළමයින්ගේ අදහස් මොනවා ද? (අඩුපාඩු මොනවාද?)

පාසල්වලට ඇතුළත්වීම:

☐ වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව පාසල් වලට පැමිණෙන අවතැන් වූ / සරණාගත ළමයින්ගේ කිනම් ප්‍රමාණයක් ද?

☐ වෙනත් ළමයින් පාසල් නොයන්නේ, සහභාගී නොවන්නේ ඇයි ?

☐ පාසල් යන සරණාගත ළමයින්ගේ ප්‍රමාණය දියුණු කිරීමට කිනම් ක්‍රියා මාර්ගයක් ගත යුතු ද?

ප්‍රජා සහභාගීත්වය

☐ දෙමාපියන් සහ සරණාගත ප්‍රජාව ක්‍රියාකාරීව අධ්‍යාපන වැඩසටහන්වලට සම්බන්ධවේ ද?

සැලසුම් කිරීම සහ ඇගයීම

☐ සරණාගත / අවතැන් වූ ළමයින්ට අධ්‍යාපනය සඳහා සැලසුම්ගත අධ්‍යාපන ක්‍රමයක් තිබේද?

☐ තාක්ෂණික වශයෙන් සුදුසුකම් ලැබූ අධ්‍යාපන විශේෂඥයින් අධ්‍යාපනික අවශ්‍යතා සහ සම්පත් ඇගයීම භාර ගෙන තිබේ ද? අධ්‍යාපන සැලැස්මක් සකසා තිබේද?

☐ සරණාගත / අවතැන් වූ ළමයින්ගේ අධ්‍යාපන ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීමට අධ්‍යාපන ඇගයීමේ පද්ධතියක් තිබේ ද?

සහතිකපත්

☐ ළමුන්ගේ අධ්‍යාපන කාර්ය සාධනය ඇගයීමට සහතික ලබා දෙනු ලැබේ ද?

## එක්ව නො ආ දරුවන්

සේවා

☐ යමෙක් සමග එක්ව නො ආ දරුවන් කී දෙනෙක් ඔබේ කඳවුරේ සිටී ද?

☐ යමෙක් සමග එක්ව නො ආ දරුවන් හඳුනාගැනීම, ලේඛනගත කිරීම සහ සහභාගී වැඩ පිළිවෙළක් තිබේද?

☐ පවුල් වෙන්වීමේ හේතු සොයා ගෙන තිබේද? පවුල් සමගිය ආරක්ෂා කිරීම පිණිස වෙනත් පිළියම් යොදා තිබේ ද?

නිතිමය කරුණු

- ☐ යමෙකු සමග එක්ව නො ආ ළමයින් වෙනුවෙන් නීතිමය රැකවරණයක් හෝ ඊට සමාන දෙයක් සකසා තිබේ ද?
- ☐ යමෙක් සමග එක්ව නොආ ළමයින්ගේ නීතිමය (සරණාගත) තත්ත්වයට අදාළ විශේෂිත ක්‍රියා පරිපාටියක් යොදා තිබේද?

ළමා සුභ සාධන සේවා

- ☐ අවශ්‍ය ස්ථානගත කිරීමේ සුදුසු කටයුතු යෙදීමට සහ අවශ්‍ය සැලකිලි ලබාදීමට සුදුසු ළමා ස්ථානගත කිරීමේ සේවාවක් තිබේ ද?
- ☐ ළමයින්ට අවශ්‍ය සත්කාරය සහ තැන් යමෙකු සමග නොආ ළමයින්ට ලැබේ ද?

හඳුනා ගැනීම

- ☐ ක්‍රියාකාරීව සහ සාර්ථකව පවුල් හඳුනා ගැනීමේ වැඩ පිළිවෙළක් යොද තිබේ ද?

පවුල් යළි සමගි කිරීම

- ☐ ළමයින්ට හිමිකම් කියන පවුල් ප්‍රවේශමෙන් ඇගැයීමට ලක් කරන ලද ද?
- ☐ පවුල් නැවත එක්මුතු කිරීමට සහ ළමයින්ගේ සුභ සාධනය සඳහා සුදුසු සමාජ සේවා සහායක වැඩ පිළිවෙළක් සපයා තිබේද?

ළමයින්ගේ සහභාගිත්වය

- ☐ යමෙකු සමග නොපැමිණි දරුවන්ට තීරණ ගැනීමට සහ ඔවුන්ට බලපාන වැඩසටහන් වලට දායකවීමට අවස්ථා සලසා තිබේ ද?

වාර්තා

- ☐ යමෙකු සමග නොපැමිණි ළමුන්ගේ වාර්තා සම්පූර්ණ කර ආරක්ෂා සහිතව, ආරක්ෂා සහිත තැනක ගබඩා කර තිබේ ද?

## කඳවුරු වැසීම ලේඛන ගත කිරීම/වාර්තා තැබීම

සූදානම් කිරීමේ කටයුතු:

- ☐ ස්වේච්ඡාවෙන් සියරට යන පවුල්වල එකමුතුකම ආරක්ෂාකර තිබේ ද?
- ☐ කඳවුරු ප්‍රජාව ස්වේච්ඡාවෙන් සියරට යෑමේ වැඩ පිළිවෙළට ක්‍රියාකාරීව දායකවේ ද?
- ☐ සියරට යෑමට අවදානම් සහගත අයට වලදායි තොරතුරු සහ උපදේශන වැඩසටහන් තිබේ ද?

☐ අවදානම් සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් කෙන්ද්‍රීය ස්ථානයක් නියම කර තිබේ ද?

☐ ස්වේච්ඡාවෙන් සියරට යන්නන්ගේ වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට සුදුසු පරිපාලන යාන්ත්‍රණයක් සකසා තිබේ ද?

☐ රෝගීන් හඳුනා ගැනීමට වෛද්‍ය පරීක්ෂණයක් හෝ ගමනාගමනයට විශේෂ විධිවිධාන අවශ්‍ය අයට යොදා තිබේද?.

☐ රෝගී පවුල්වලට ඔවුන්ගේ ගෘහ ප්‍රජාවට / රටවලදී ප්‍රතිකාර ලබා ගැනීමට අවශ්‍ය කරන වෛද්‍ය වාර්තා තොරතුරු ලබාදී තිබේද?

☐ අවදානමට ලක්ව සිටින කණ්ඩායම්වල විශේෂ අවශ්‍යතා (එක්ව නොආ ළමුන් වැඩිහිටියන්ගේ කිරි දෙන මවුවරුන්ගේ ආදිය) සලසා තිබේ ද?

සංචලනය සහ ප්‍රත්‍යසංකලනය

☐ සිය කැමැත්තෙන් සියරට යන පවුල්වල සහ ළමයින්ගේ අවශ්‍යතා සඳහා සහයවීමට සමාජ සේවාවන් තිබේ ද?

☐ දේශ සීමාවෙන් අනෙක් පසෙහිදී යමෙකු සමග නොආ ළමුන් සහ අවදානමට ලක්වූවන්ට ප්‍රමාණවත් සුරක්ෂිත බවක් තිබේද?

☐ ආපසු යන ළමයින්ගේ පාසල් වලට ඇතුළුවීම සහතික කර තිබේද?

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්

කාර්යමණ්ඩලය සහ පුහුණුව:

☐ සරණාගත/අවතැන්වූ ජනයාගේ ආරක්ෂාව හා රැකවරණය සැලසීමට විශේෂ දක්ෂතා ඇති පුද්ගලයින් සිටිද?

☐ අවදානමට ලක්ව සිටින පුද්ගලයින්ගේ අවශ්‍යතා වැඩසටහන්වලට ඇතුළත් කිරීම සහ වාර්තා කිරීම, සමෝධාන ගත කිරීමේ වගකීම පවරා තිබේ ද?

☐ ආරක්ෂාව හා රැකවරණය ගැන කාර්ය මණ්ඩලයට දැනුවත් බවක් සහ විශේෂ පුහුණුවක් තිබේද?

**ප්‍රමිතීන්, ප්‍රතිපත්ති සහ මෙහෙයුම් නිර්ණායකයන්:**

☐ කඳවුරු මට්ටමේ අවතැන්වූ පුද්ගලයින් වෙනුවෙන් ව්‍යාප්ත වූ සමාජ මැදිහත්වීමක් සහ මෙහෙයුම් නිර්ණායක, දේශීය ප්‍රමිතීන්, ප්‍රතිපත්ති ප්‍රමාණාත්මකව පිහිටුවා තිබේ ද?

ඇගයීම සහ නිරීක්ෂණය:

☐ කඳවුරු වැසියන්ට ඕනෑ කරන ආරක්ෂාව සහ සහයෝගය සඳහා පරිපූර්ණ ඇගයීමක් පවත්වා තිබේද?

☐ ජන සංඛ්‍ය තොරතුරු එක් රැස්කර, අලුත් කර තිබේද? ඒවා ආරක්ෂා සහිත තැනක ගබඩා කර තිබේද?

☐ ආරම්භ රේඛීය දත්ත සමුදායක් කඳවුරේ සුභ සිද්ධිය සඳහා අනාගතයේදී සසඳ බැලීම පිණිස සකසා තිබේද?

☐ කඳවුරු ප්‍රතිලාභීන්ගේ ආරක්ෂාව සහ රැකවරණය, අවශ්‍යතා පිළිබඳව යොමු කෙරෙන, පවතින ප්‍රජා මූලික ඇගයීමේ සහ නිරීක්ෂණය කිරීමේ ක්‍රමයක් තිබේද.?

ක්‍රියාත්මක කිරීම:

☐ කාන්තාවන් සහ ළමයින් ද සම්බන්ධ වන කඳවුරු වාසීන්ගේ සහභාගිත්ව උපක්‍රම පිළිබඳව සුභ සාධනය නිරීක්ෂණ සහ මැදිහත් වීමේ පාදක ක්‍රම තිබේද?

☐ කඳවුරු ප්‍රජාවට සහායවීමට සහ ආරක්ෂාව සැලසීමට ජාතික සේවාවක් සංවිධානය කර තිබේද?

☐ කඳවුරු වැසියන්ගේ ප්‍රයෝජනය සඳහා පවත්නා ප්‍රාදේශීය ජාතික සහ ජාත්‍යන්තර සම්පත් සහ විශේෂ සේවාවන් සංවිධානය කර තිබේද?

☐ යමෙකු සමග නොපැමිණි බාල වයස්කාරයින් එක්කෙනෙකුගෙන් වෙන්වූ පවුල හඳුනා ගැනීම සහ යළි එකමුතු කිරීම ක්‍රමයක් පවති ද?

☐ අවදානමට ලක්වූ අයවලුන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිත බව තහවුරු කිරීමට අමතර උත්සාහයක් අවශ්‍ය වේද?

වාර්තා කිරීම:

☐ කඳවුරේ ආරක්ෂාව සහ සුභසාධනය නිරීක්ෂණයට ප්‍රමාණවත් වාර්තා කිරීමේ ක්‍රමයක් තිබේද?

☐ කඳවුරු ප්‍රජාවගෙන් කොටසක් විශේෂ අවදානමට ලක්ව, කඩකිරීම් පිළිබඳව අදාළ බලධාරීන්ට රහසිගත ආකාරයකට වාර්තා කර තිබේ ද?

ඇගයීම

☐ කඳවුරු වාසී ප්‍රජාවගේ ආරක්ෂාව සහ සුභසාධනය සඳහා විධිමත් ඇගයීමක් පවත්වා ගෙන යනු ලබන්නේද? මෙම අවශ්‍යතා වාර්තා කොට පසු සොයා බලනු ලබන්නේද?

## ක්‍රියාත්මක කිරීමේ පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාවන් නිරීක්ෂණය කිරීම.

☐ කඳවුරු වාසී පවුල්වල සංස්කෘතික, ආගමික සහ සමාජ මනාප, සහායක වැඩසටහන් වලදී ගෞරවයෙන් සලකනු ලැබේද?

☐ කඳවුරු සේවාවන් සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී සහභාගිත්ව ක්‍රමවේද ක්‍රියාත්මක කරනු ලැබේද?

☐ කඳවුරු වාසීන්ට ඔවුන්ගේ ආගමික වත් පිළිවෙත් පිරීමට පහසුකම් තිබේද?

☐ ජීවත්වීමේ විධිවිධාන දියුණුකර සහ සංස්කෘතික සමාජ, ආගමික වටිනාකම් ආරක්ෂාකර තිබේද?

- ☐ කඳවුරු වාසින් සමග ප්‍රතිචාර දැක්වීමේදී දේශිය භාෂාව යොදා ගනිද?

- ☐ ඔවුන් කැමැති පරිදි ජීවත්වීමට හැකිවන පරිදි පවුල්වල ස්වීය ආර්ථික හැකියාව ප්‍රවර්ධනය කර තිබේ ද?

- ☐ ක්‍රීඩා කටයුතු සහ විනෝදාත්මක අංග ප්‍රවර්ධනය කරන්නේද?

- ☐ සත්කාරක රටේ සංස්කෘතික සහ සමාජ වටිනාකම් වලට අනුගතවීම සහ/හෝ ප්‍රජා අවශ්‍යතා ප්‍රවර්ධනය කර ඇත්තේද?

- ☐ සහායක ඒජන්සි මගින් බලයෙන් ආගම්වලට සහ සංස්කෘතික පුරුදුවලට වැද්ද ගැනීම නිරීක්ෂණය කොට පිළියම් යොදනු ලැබේ ද?

## කඳවුරු පරිසරය

සාමාන්‍ය තත්ත්වයන් :

- ☐ පවුල් එකට ජීවත් වන්නේද?

- ☐ ඔවුන්ට ප්‍රමාණවත් පෞද්ගලික නිවසක් තිබේ ද?

- ☐ පවුල්වලට ගෞරවාන්විතව ජීවත්වීමට සහ ඔවුන්ගේ පවුල්වලට ආරක්ෂාව සහ රැකවරණය ලබාදීමට කරනු ලැබුවේ කුමක්ද?

- ☐ තවත් කළ හැක්කේ කුමක්ද?

- ☐ දුෂ්කරතා ඇති අවතැන් වූ ප්‍රජාවට සහායවීමට කරනු ලබන සාමාන්‍ය කටයුතු මොනවාද?

- ☐ අවතැන් වූ ප්‍රජාවගේ ආරක්ෂාවට බලපාන සහ අවදානමට පත් අයගේ සත්කාරක සමාජ සංවිධානය සහ සාමාන්‍ය ජීවත්වීමේ විධිවිධාන සිදු කෙරෙන්නේ කෙසේද?

- ☐ අවදානමට ලක් වූ අය සමග ඔවුන්ගේ රැකවලුන් හෝ පවුල්වල ජීවන තත්ත්වය දියුණු කිරීමට කුමන පියවර ක්‍රියාත්මක කර තිබේද?

- ☐ කඳවුරු ප්‍රජාව අතර නිත්‍ය කටයුතු සහ සේවාවන් සැපයිය හැකි, දැනට එවන් පහසුකම් ලබා නොදෙනු ලබන අය සිටිද?

පවුල්වල සමාජමය උද්යෝගිකම්

- ☐ පවුල්වලට ඔවුන්ගේ ප්‍රජාවන් / රට හැර යෑමට හේතු තත්ත්වයන් මොනවාද?

- ☐ අවතැන් වූ අය ඔවුන්ගේ යහ පැවැත්මට බලපෑ දුෂ්කරතා සහ මානසික ආතතිය කුමනාකාර ද? ඔවුන් සහ ඔවුන්ගේ දරුවන්ගේ රැකවරණය කෙසේ සලසන්නේද?

- ☐ මෙම දුෂ්කරතා අඩු කිරීමට ගත හැකි පියවර මොනවාද?

- ☐ ඔවුන්ගේ සංස්කෘතික රාමුව තුළ සාමාන්‍යයෙන් ලැබිය හැකි දේවලට වඩා කඳවුරු වැසියන්ට සහාය ලැබේද?

- ☐ ඔවුන් දැනට සිය රටින් පිටත සිටින තත්ත්වයක් යටතේ ඔවුන්ට බලපාන විපත්තිදායක දුෂ්කරතා වලට සහාය විය. හැකි, සාකච්ඡා කළ හැකි අවස්ථා කඳවුරු වැසියන්ට තිබේ ද?

අවදානමට ලක්ව සිටින කණ්ඩායම්:

- ☐ ළමයින් සහ අවදානමට ලක්වී සිටින අයට ප්‍රමාණවත් පෝෂණය සහ සත්කාරය ලැබේද? ඔවුන් ලබන්නා වූ සත්කාරය දියුණු කිරීමට ගත හැකි පියවර මොනවාද?

- ☐ කඳවුරෙහි හුදකලාව ඉන්නා අය සිටිද?

- ☐ අතිධාවනකාරී හා ප්‍රචණ්ඩකාරීව හැසිරෙන අය සිටිද?

- ☐ ළමයින්ට සහ කාන්තාවන්ට ඔවුන් ගැන, අදළව, අදහස් සහ ඔවුන්ට ඇති ප්‍රශ්න ගැන කතා කිරීමට සුදුසු ඉඩකඩ සලසා දෙන්නේද?

- ☐ යමෙකු සමග නොපැමිණි ළමයින්, දිගු කලක් නැවැති සිටින්නත්, වයසක උදවිය, ආබාධිත අය සහ වෙනස් ආකාර අවදානමට ලක්ව සිටින අය කෙරේ අවධානය යොමුවී තිබේද?

- ☐ ළමයින්ට ක්‍රීඩා කිරීමට අවස්ථාව තිබේද?

සේවා

- ☐ අපේක්ෂා කළ හැකි සහ නිත්‍ය සංවර්ධනාත්මක දියුණු කිරීමේ ක්‍රියාකාරකම්, අධ්‍යාපන අනෙකුත් කටයුතු ළමයින්ට සහභාගිවීමට හැකිවන පරිදි ලබාදී තිබේද?

- ☐ කඳවුරු වාසීන්ට සමාජ සේවාවන්ට පිවිසීමට සහ විශේෂිත බලපෑම් සහ ඔවුන්ගේ දුෂ්කරතාවලට උදව්වීමට ඉඩ තිබේද?

- ☐ මානසික ආතතිය අත්විඳින අවදනමට ලක්වු අය හඳුනා ගැනීමට සහ උදව්වීමට ක්‍රම තිබේද?

- ☐ බලවත් මානසික ආතතියෙන් පසුවන ළමයින් යොමු කළ හැකි විශේෂ මානසික සෞඛ්‍ය සේවාවන් පවතීද?

# කඳවුරු කළමනාකරුට බලපවත්වන්නා වූ කොන්දේසි

සියරා ලියෝන්හි බෝ දිස්ත්‍රික්කයේ ජෙම්බේ තාවකාලික යළි පදිංචි කිරීම ඔහුගේ/ඇයගේ අධීක්ෂණ ප්‍රදේශයයි. ඔහු/ඇය ස්ථාන ගත වන්නේ කෙනෙබාවලය.

ඔහු/ඇය සියරා ලියෝන් සහ වඩාත් විශේෂිතව පුනරුත්ථාපනය සහ කඳවුර කළමනාකරණ වැඩ සටහන නියෝජනය කරයි. ඔහු/ඇය ගෞරවාන්විතව සහ වෘත්තීයමය ආකාරයකට ආනුශංගිකව හැසිරීමට අපේක්ෂා කෙරේ. මීට රාජ්‍ය නොවන සංවිධාන ආධාර දෙනු ලබන ඒජන්සි (UNHCR) එක්සත් ජාතීන්ගේ වෙනත් සංවිධාන සහ රජයේ ආයතන (ආදිය, සමග වැඩ කිරීමේ කොන්දේසි විස්තර කළයුතු ආදිය ද ඇතුළත් වේ.)

ඔහුගේ ඇයගේ අධීක්ෂණ නිලධාරියා වාර්තා වැඩසටහන් කළමනාකාරවරයාය. ඇය/ඔහු නිත්‍ය පදනමක් මත මේ තැනැත්තාට වගේම ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිලධාරියාට වාර්තා කළ යුතුවේ. ඇය/ඔහු ජෙම්බේ තාවකාලික යළි පදිංචි කිරීමේ කළමනාකරණයට වගකීමට සහ නව කටයුතු සැකසීමට සහ කෙරිගෙන යන කටයුතු අධීක්ෂණයට බැඳී සිටී.

## වැඩ විස්තර:

1) NRC සහ වෙනත් රාජ්‍ය නොවන සංවිධාන සහ එක්සත් ජාතීන්ගේ සංවිධාන ජෙම්බේ තාවකාලික යළි පදිංචිකිරීම පිළිබඳ සම්පූර්ණ කටයුතු සම්බන්ධීකරණය කරනු ඇත. 2002 සිට පහත දැක්වෙන කටයුතු අධීක්ෂණ නිලධාරීන් විසින් යොදනවා ඇත.

   - නිපුණතා කටයුතු (වඩු වැඩ, කම්මල් වැඩ ආදිය

   - කාන්තා කටයුතු (මැහිම, ටයි සහ ඩයි කිරීම, හිස කෙස් සැකසීම, සහායවීම ආදිය)

   - සාමය ගොඩ නැගීමේ කටයුතු (ක්‍රීඩා, නැටුම්, නාට්‍ය ආදිය)

   - සුළු පරිමාන ණය පහසුකම්.

   - එච්අයිවි/ඒඩ්ස් පිළිබඳ දැනුවත් කිරීම

   - කෘෂිකර්මය

2) ප්‍රමාණවත් වාර්තා කිරීම් සහ නිරීක්ෂණය කිරීමේ මෙහෙයුම් ආධාර කරන, (NCRRR) සහ (OCHA) වෙන ප්‍රවර්ධනය හා පසු කටයුතු සම්බන්ධීකරණය කිරීම.

3) එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස් සහ ලෝක ආහාර වැඩසටහන සමග ජෙම්බේ ප්‍රජා දත්ත සමුදය කාලවත් කිරීම.

4) කඳවුර කළමනාකරණයට සම්බන්ධව රැස්වීම්වලට සහභාගිවීම - ඒවාට ඇතුළත් වන්නේ,

   - NCRRR සතිපතා රැස්වීම් (සෑම බ්‍රහස්පතින්දවකම පස්වරු 4.00 ට 'බෝහ' වල)

   - කඳවුරේ සංවිධානය කරන ලද සතිපතා රැස්වීම් - IP වරුන් සමග (සෑම බදාදවකම ප.ව. 2.00 ට කඳවුරේදී)

   - ජෙම්බේ තාවකාලික පදිංචි කිරීමේ කඳවුරට සම්බන්ධව කැඳවන ලද වෙනත් රැස්වීම්.

5) තාවකාලික කුටි, පාසල්, පුහුණු මධ්‍යස්ථාන, කැලි කසල වළවල් ඉදි කිරීම ආදි කාර්මික වැඩ කඳවුරෙහි ඉටු කිරීමේදී තාක්ෂණික උපදේශකවරයාගේ සමීප අධීක්ෂණය යටතේ සිදු කිරීම.

6) මූල්‍ය සහ අයවැය පිළිබඳ වගකීම : මුදල් ඉල්ලීම් පිළියෙළ කිරීම, ප්‍රතිපාදන භාවිතය සාධාරණීකරණය, යන්න ගැන වැඩ කළමනාකරු සමග අයවැය සහ වියදම් පිළිබඳව පසු කටයුතු කළයුතුය.

7) වැඩසටහන් කළමනාකරුට ඉදිරිපත් කිරීම පිණිස සති සහ කාර්තු වාර්තා පිළිවෙළ කිරීම.

8) කඳවුරේ සේවය කරන (NRC) කාර්ය මණ්ඩල නිරීක්ෂණය සහ ඇගයීම.

9) වැඩ ඉලක්ක සපුරා ගනු ලැබීම සහතික කරනු වස් ආධාර කරන්නන් සමග සමීපව කටයුතු කිරීම

10) අදාළ කරුණු දියුණු කිරීම සහ ප්‍රජා මට්ටමේදී සාමය පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා පෙම්බේ ප්‍රජාව සමග (හැම මසකම රැස්වීම් සංවිධානය කර) සම්බන්ධිකරණ ක්‍රියාදමයන් තබා ගැනීම.

11) සමාන කාන්තා සහභාගිත්වයක් සියලු ක්‍රියාකාරිත්ව සහ කඳවුරු මෙහෙයුම් කමිටු ව්‍යුහයන් වලදී පවත්වා ගැනීම සහතිකවීම

12) වැඩ කළමනාකරුට (හෝ ජ්‍යෙෂ්ඨ වැඩ නිලධාරියාට) ආරක්ෂාවට සම්බන්ධ වැදගත් කරුණු, ස්වදේශිය බලධාරීන් සමග ප්‍රශ්න, අන්තර් ප්‍රජා ගැටුම් පිළිබඳව අප්‍රමාදව දැනුම් දීම.

13) පෙම්බේ සහ කෙනමා කාර්යාල මට්ටමින් ලැබෙන අදාළ වාර්තා, ලිපි ආදිය වැඩ කළමනාකරු වෙත ඉදිරිපත් කිරීම

14) ප්‍රදේශයේ රාජ්‍ය නොවන සංවිධාන, ස්වදේශිය අධිකාරීන් සහ එක්සත් ජාතීන්ගේ සංවිධාන සමග සම්බන්ධිකරණය සහ තොරතුරු බෙද ගැනීම.

15) වාහනය ගැන සුපරීක්ෂාකාරීවීම (ලොග් සටහන්/ඉන්ධන, ආරක්ෂක උපකරණ භාවිතය) සහ ක්ෂේත්‍රයේ ඇති සියලුම දේපල ගැන සුපරීක්ෂාකාරී වීම.

**සුදුසු කම් සහ පළපුරුද්ද:**

— උසස් පරිගණක හැකියාවක්, විශේෂයෙන් "වර්ඩ් එක්සෙල්" සහ "පවර් පොයින්ට්" පිළිබඳව

— ඉංග්‍රිසි ලිවීම සහ කථනය පිළිබඳ විශිෂ්ට හැකියාව

— ගැටලු හෝ දුෂ්කර කාර්යයන් විශ්ලේෂණය කර විසඳ ගැනීමේ මනා හැකියාවක්

— අවශ්‍යතා ප්‍රමුඛත්වයෙහි සැලකීමේ හැකියාව සහ සමහරක් කටයුතු සමගාමීව පවත්වා ගෙන යෑම.

— ප්‍රබල පුද්ගලාන්තර සම්බන්ධතා

— ස්වදේශිය සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරිත්වය ගැන දැනුම

— මනා අධ්‍යාපනික පසුබිමක් හෝ විශ්ව විද්‍යාල උපාධි

— කඳවුරු කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද අගය කරනු ලැබේ.

# කඳවුරු සහායකයින්ට අදාළව බලපවත්වන්නා වූ කොන්දේසි.

ඔහුගේ/ඇයගේ අධීක්ෂණ ප්‍රදේශය වන්නේ සියරා ලියෝන්හි බෝ දිස්ත්‍රික්යේ ජෙම්බේතාවකාලික යළිපදිංචි කිරීමේ මධ්‍යස්ථානයයි.

ඔහු/ඇය නියෝජනය කරන්නේ සියරා ලියෝන් (NRC) ආයතනය සහ වඩාත් සුවිශේෂිව කිවහොත් පුනරුත්ථාපන සහ කඳවුරු කළමනාකරණ වැඩසටහනයි. ඔහු/ඇය නිරන්තරයෙන්ම ගෞරවාන්විතව සහ වෘත්තිය ආකාරයකින් හැසිරිය යුතුය. මීට රාජ්‍ය නොවන සංවිධාන ආධාර දෙනු ලබන ඒජන්සි (UNHCR) එක්සත් ජාතින්ගේ වෙනත් සංවිධාන සහ රජයේ ආයතන (NCRRR) සමග වැඩකටයුතු කිරීමේ කොන්දේසි ආදිය ඇතුළත් වේ.

ඔහුගේ/ඇයගේ අධීක්ෂණ නිලධාරියා වන්නේ (NRC) කඳවුර කළමනාකරුය. ඇය/ඔහු නිත්‍ය පදනමක් මත මේ තැනැත්තාට මෙන්ම වැඩ කළමනාකරුට නිත්‍ය පදනමක් මත වාර්තා කළ යුතුය. ඔහු/ඇය ක්‍රියාත්මක කිරීම සහ ජෙම්බේ තාවකාලික යළි පදිංචි කිරීමේ මධ්‍යස්ථානයේ තාක්ෂණික කටයුතු අධීක්ෂණය පිළිබඳව වගකිව යුතුය.

## වැඩ විස්තර:

1) ඉදිකිරීම්, කඩාබිඳ දැමීම් සහ කුටි සහ පාසල් නඩත්තුව, පාරවල් නඩත්තුව කැළිකසල වළවල් ඉදිකිරීම රාජ්‍ය නොවන සංවිධාන ගොඩනැගිලි නඩත්තුව ආදිය කඳවුර තුළ පවත්වා යෑම සහ තාක්ෂණික කටයුතු අධීක්ෂණය.

2) කුටි, ඉඩම් කට්ටි ප්‍රජා මට්ටමින් ගම් ආදිය මැනීම සහ අංකනය

3) කඳවුරු කළමනාකරුගේ අනුමැතිය ලැබුන පසුව කඳවුර පවත්වා ගෙන යෑමට අවශ්‍ය සියලුම දේ මිලට ගැනීම (ලී මිටි, ඇණ, ලැලි ආදිය)

4) ආහාර නොවන ද්‍රව්‍ය බෙදා හැරීම සංවිධානය ආහාර ද්‍රව්‍ය ආපසු යන අයට බෙදා දීම (ලෝක ආහාර වැඩසටහන වැනි) අධීක්ෂණය

5) කඳවුරු කළමනාකරු විසින් පත්කරනු ලැබුව හොත් බෝ සහ කෙනෙමා රැස්වීම්වලට ඔහු/ඇය යෑම (NCRRR, UNHCR, OCHA)

6) ඔහු/ඇය කඳවුර තුළ සංවිධානය කරනු ලබන අන්තර් ඒජන්සි සති රැස්වීම්වලට යා යුතුය.

7) කඳවුරු කළමනාකරණය දියුණු කිරීම් වස් අදහස් හුවමාරු කර ගැනීම සඳහා බෝ සහ කෙනෙමා ප්‍රදේශවල වැඩ කරන වෙනත් කඳවුරු කළමනාකරණ කණ්ඩායම් සමග සම්බන්ධිකරණය

8) දැනට කෙරීගෙන යන සියලුම තාක්ෂණික කටයුතු, ඒවායේ ක්‍රියාකාරීත්වය, ප්‍රමාදයන් ආදිය කඳවුරු කළමනාකරුට වාචිකව සහ ලිඛිතව වාර්තා කිරීම.

9) ආරක්ෂාව හා සම්බන්ධ වැදගත් සිදුවීම්, ප්‍රජා ගැටුම් ආදිය ගැන අප්‍රමාදව කඳවුරු කළමනාකරුට (වැඩ කළමනාකරුට පිටපත් සහිතව) දැනුම් දීම

10) කඳවුරේ සේවය කරන සියලුම (NRC) කාර්ය මණ්ඩලය, විශේෂයෙන් කඳවුරු කළමනාකරු සමග සම්බන්ධීකරණය

11) ප්‍රදේශයේ එක්සත් ජාතීන්ගේ සංවිධාන, ප්‍රාදේශීය අධිකාරීන් වෙනත් රාජ්‍ය නොවන සංවිධාන සමග තොරතුරු හුවමාරුව සහ සම්බන්ධීකරණය

12) වාහනය (ලොග් සටහන්/ඉන්ධන, ආරක්ෂක උපකරණ භාවිතය) සහ (NRC) වලට අයත් ක්ෂේත්‍රයේ ඇති සියලුම දේපල පිළිබඳව ආරක්ෂා කිරීම.

සේවා කාලය සතියේ සඳුදා - සිකුරාදා දක්වා පෙ.ව. 8.30 - පස්වරු 4.30 දක්වා එකගවෙමි

නම .......................................................................

අත්සන ...................................................................

# ප්‍රජා සේවා සහායකට අදාල කොන්දේසි :

ඔහුගේ/ඇයගේ අධීක්ෂණ ප්‍රදේශය වන්නේ සියරා ලියෝන්හි බෝ දිස්ත්‍රික්කයේ ජෙම්බේ තාවකාලික යළි පදිංචි කිරීමේ ක්ෂේත්‍රයයි.

ඔහු/ඇය නියෝජනය කරනු ලබන්නේ සියරා ලියෝන්හි (NRC) සහ විශේෂයෙන්ම ජෙම්බේ යළි පදිංචි කිරීමේ සියලුම කාර්ය ප්‍රධානීන්ය. ඔහු/ඇය කඳවුරු සභාපතිවරයා විසින් පවරනු ලබන කරුණු සම්බන්ධයෙන් මූලික කටයුතු කරනු ඇත. ඔහු සත්කාරක ප්‍රජාව සමග සම්බන්ධීකරණ නිලධාරියා ලෙස ක්‍රියාකරනු ඇත. ඔහු/ඇය ආනුෂාංගිකව ගෞරවාන්විත සහ වෘත්තීය ආකාරයකින් හැසිරිය යුතුය. ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, ආධාර දෙනු ලබන එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් ආයතනය එක්සත් ජාතීන්ගේ වෙනත් සංවිධාන සහ රාජ්‍ය බලධාරීන් ද (NCRRR ආදිය) සමග සබඳතාවයකින් කටයුතු කිරීම ද ඇතුළත්ව වගකිව යුතුවේ.

ඔහුගේ/ඇයගේ සෘජු අධීක්ෂණ නිලධාරියා වන්නේ (NRC) කඳවුරු කළමනාකරුය. ඔහු/ඇය නිරන්තරයෙන්ම ඔහුට සහ සහකාර කළමනාකරුට වාර්තා කළ යුතුවේ. ඔහු/ඇය කාර්ය ප්‍රධානීන්ගේ සම්බන්ධීකරණය සහ කළමනාකරණ පළදායකත්වය සහ ශිෂ්‍යයන්ගේ ඉගෙනුම අධීක්ෂණය නිත්‍ය ඇගයීමක් ඇතිව ඉටු කළයුතුය.

ජෙම්බේ තාවකාලික යළි පදිංචි කිරීම සඳහා (NRC) මගින් පහත දැක්වෙන කටයුතු ක්‍රියාත්මක කරනවා ඇත.

— කුසලතා පුහුණු කටයුතු : (උද : වඩු වැඩ, කම්මල් වැඩ, ගඩොල් සෑදීම)

— කෘෂිකාර්මික කටයුතු

— කාන්තා කටයුතු - උදා: මැහීම, බේක් කිරීම, ටයි සහ ඩයි කිරීම ආදිය.

— ප්‍රජනන සෞඛ්‍ය සහ එච්අයිවී/ඒඩ්ස් පිළිබඳ දැනුවත් කිරීම

— සාමය ඇති කිරීමේ කටයුතු : උද : නැටුම්, නාට්‍ය, ක්‍රීඩා ආදිය

— සුළු පරිමාණ ණය පහසුකම්.

වැඩි විස්තර:

1) කාර්ය ප්‍රධානීන්, නිලධාරීන්ද ඇතුළුව අධීක්ෂණ කාර්ය මණ්ඩල, සියලුම මෙහෙයුම් සම්බන්ධීකරණ කටයුතු.

2) පිළිපදිනු ලබන උපදේශන හේතු කාරක තුළ පිළිපදිනු ලැබීම.

3) ශිෂ්‍යයන්ගේ පළපුරුද්ද සහ හැකියාවන්ට අනුව සංවර්ධනාත්මක වැඩටසටහන් සැකසීම ස්ථිර කිරීම.

4) කාර්ය ප්‍රධානීන් සමග සම්බන්ධීකරණය කරමින් කුසලතා ඇගයීම සෑම මාස දෙකකට වරක් සිදු කෙරේ. ප්‍රජා සේවා සහායකයන් ඇගයීමේ පත්‍රිකා සිසුන් අතර බෙදා දී, ප්‍රතිඵල ඔහු/ඇය විසින් විශ්ලේෂණය කර කඳවුරු කළමනාකරුට ආපසු වාර්තා කිරීම.

5) කාර්ය ප්‍රධානීන් සහ කඳවුරු කළමනාකරු සමග මාසික රැස්වීම් ඔහු/ඇය විසින් සම්බන්ධීකරණ කිරීම.

6) කඳවුරු පරිපාලනයට අදාළ සියලුම රැස්වීම්වලට පැමිණීම - ඊට ඇතුළත් වන්නේ :

- IP වරුන් සමග කඳවුර තුළ සතිපතා පැවැත්වෙන රැස්වීම් සංවිධානය
- කාර්ය ප්‍රධානීන් සමග මාසික රැස්වීම්
- ජෙම්බේ යළි පදිංචි කිරීමේ ක්ෂෙත්‍රයට අදාළව කැඳවනු ලබන වෙනත් රැස්වීම්

7) ආදායම් උපද්දවන කටයුතු සම්බන්ධ ප්‍රධානිවරයාගේ සම්බන්ධීකරණය ඇතිව, ආදායම් ලබන ක්‍රියාමාර්ග අනුකූලව මුදල් එකතු කිරීම අධීක්ෂණය.

**සුදුසුකම් සහ පළපුරුද්ද:**

— ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා පරිචය

— මනා වාචික සංනිවේදන පරිචය

— ගැටලු සහ දුෂ්කර කාර්යයන් සංවේදනාත්මක ස්වරූපයකින් විශ්ලේෂණ කිරීමේ හැකියාව

— අවශ්‍යතා ප්‍රමුඛතා පදනමක් මත සහ සමහරක් කටයුතු සමගාමීව ඉටුකිරීමේ හැකියාව

## ගබඩා පාලකවරයාට අදාළ කොන්දේසි.

**ඔහුගේ/ඇයගේ අධීක්ෂණ ප්‍රදේශය වන්නේ සියරා ලියෝන්හි බෝ දිස්ත්‍රික්කයේ ජෙම්බේ තාවකාලික යළි පදිංචි කිරීමේ ස්ථානයයි.**

ඔහු/ඇය සියරා ලියෝන්, වඩාත් විශේෂිතව සඳහන් කළොත් පුනරුත්ථාපිත කඳවුරු කළමනාකරණ වැඩ සටහන නියෝජනය කරන්නේය. ඔහු/ඇය ආනුසංගිතව ගෞරවනීයව සහ වෘත්තියමය ආකාරයෙන් හැසිරිය යුතුය. මෙයට ඇතුළත් වන වගකීම වන්නේ රාජ්‍ය නොවන සංවිධාන, ආධාර දෙනු ලබන ඒජන්සිය (UNHCR) එක්සත් ජාතින්ගේ වෙනත් ආයතන සහ රජයේ බලධාරීන් (NCRRR ආදිය) සමග කටයුතු කිරීමය.

ඔහුගේ අධීක්ෂණ නිලධාරියා වන්නේ (NRC) සහකාර කළමනාකරුය. ඔහු/ඇය මේ තැනැත්තාට මෙන්ම කළමනාකරුට නිරන්තරයෙන් වාර්තා කළ යුතුය. ඔහු/ඇය. (NRC) රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් ලෝක ආහාර වැඩසටහන ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය ගබඩා ජෙම්බේ යළි පදිංචි කිරීමේ ගබඩාවේ ගබඩා කර තබා ගැනීම කළ යුතුය.

**රාජකාරි සහ වගකීම්:**

1) (NRC) ආයතනයේ ක්‍රියාමාර්ග අනුව ගබඩාව පවත්වා ගෙන යෑම සහ ගබඩාවේ පාවිච්චි කරන ද්‍රව්‍ය පිළිබඳ විධිමත් ගණක කටයුතු සංවිධානය කිරීම.

2) විධිමත් පරිදි සැළකිල්ලෙන් හෝ ගබඩා කිරීමේ ක්‍රමයක් මගින් විනාශවීම වැළැක්වීම, කාන්දුවීම විනාශවීම, හොරකම් කිරීම වැළැක්වීම සහතික කිරීම.

3) ගබඩාවට ලැබෙන ද්‍රව්‍ය ලේඛනගත කිරීම, ('ස්ටොක්' කාඩ් භාවිත කර) නිකුත් කළ ප්‍රමාණය සහ විස්තර ද සහිතව,

4) ගබඩාවෙන් ද්‍රව්‍ය නිකුත් කිරීමේ පිළිගත් පරිපාටි ක්‍රියාත්මක කිරීම. 23: ද්‍රව්‍ය නිකුත් කිරීම් ඉල්ලීම, මෙය වගකිව යුතු නිලධාරියෙකු විසින් අනුමත කර තිබිය යුතුය. ස්ථානයකින් තවත් ස්ථානයකට ද්‍රව්‍ය මාරු කිරීමේදි පහත දැක්වෙන ලියවිලි භාවිත කළ යුතුය. පිටත්කර යැවීමේ සටහන් පත්, භාණ්ඩ ලැයිස්තු (ප්‍රවාහනයේදී භාවිතයට අවශ්‍ය) ආදිය.

5) සියලුම භාණ්ඩ ලැයිස්තු නිශ්චය කිරීමට, නිකුත් කිරීමේ ලියවිලි, ආදිය ගබඩාවට ද්‍රව්‍ය භාර ගැනිමේදි, උදා : භාණ්ඩ ලැයිස්තු අනුව ද්‍රව්‍ය භෞතිකව පරීක්ෂා කරන්න හෝ ගබඩාවට ගැනීමට පෙර නිකුත් කිරීමේ ලේඛන පරීක්ෂා කරන්න.

6) පාරිභෝගික ද්‍රව්‍ය පිළිබඳ මාසික ප්‍රකාශයක් පිළියෙල කරන්න. කාර්තුවෙන් කාර්තුවට ගබඩාවේ ඇති ද්‍රව්‍ය භෞතික වශයෙන් වට්ටෝරු ගත කරන්න. "ප්‍රිටවුන්" වලට වාර්තා කරන්න.

7) පෙම්බේ කඳවුරට අවශ්‍ය පරිදි, ක්‍රියාකාරී වෙනත් පාර්ශ්ව කරුවන්ගෙන් (ලෝක ආහාර වැඩ පිළිවෙළ, රාජ්‍ය නොවන සංවිධාන හෝ වෙනත් එක්සත් ජාතින්ගේ වෙනත් සංවිධාන) ව්‍යාපෘති ගත ද්‍රව්‍ය එකතු කිරීම.

8) භෞතික (තිබෙන) හා න්‍යායාත්මකව ඇති තොගය අතර යම් වෙනසක් පවතී නම් වාර්තා කිරීම.

9) කඳවුරේ (NRC) කාර්ය මණ්ඩලය විශේෂයෙන් කඳවුර කළමනාකරු සමග සහයෝගය පවත්වා ගැනීම.

10) ප්‍රදේශයේ වෙනත් රාජ්‍ය නොවන සංවිධාන, ස්වදේශීය බලධාරීන් සහ එක්සත් ජාතින්ගේ ආයතන සමග තොරතුරු හුවමාරු කර ගැනීම සහ සහයෝගයෙන් වැඩ කිරීම.

11) වාහනය පිළිබඳ සොයා බැලීම (ලොග් සටහන්/ඉන්ධන ආරක්ෂක උපකරණ භාවිතය) සහ (NRC) ආයතනයේ ක්ෂෙත්‍රයේ සියලුම දේපල ආරක්ෂා කිරීම.


12) කළමනාකාරීත්වය මගින් පවරනු ලැබූ වෙනත් රාජකාරී.

ආයතනයේ කඳවුරේ සේවා. කාලය: සඳුද - සිකුරාද දක්වා පෙ. ව. 8.30 - ප.ව. 4.30 දක්වාය. එකගත්වය පළකරමි.

නම ..........................................................................

අත්සන ..........................................................................

# නෝර්විජියානු සරණාගත කවුන්සලයේ කළමනාකාරිත්ව
# ජෙම්බේ සරණාගත කඳවුරු



## ජෙම්බේ සරණාගත කඳවුර මිය ගිය කෙනෙකුගේ අවසන් කටයුතු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළ:

1) කඳවුරෙහි මරණයක් සිදුවූ විටක මරණ කරුගේ ඥාතීන් සහ / හෝ නිවාසයට එන වෛද්‍ය විෂයය දැනීම රහිත අය විසින් ප්‍රධාන සෞඛ්‍ය නිලධාරීවරයාගේ අවධානයට ලක් කළ යුතුය.

2) ප්‍රධාන සෞඛ්‍ය නිලධාරීවරයා මරණය නිශ්චය කළ පසුව මරණ සහතිකයක් නිකුත් කෙරේ. කාර්යාලයීය පිටපත (MSF) වෙත තබා ගනු ලැබේ. සහතිකයේ ආකෘතියක් ළඟම ඥතීන්ට වළදැම්මේ සහතිකයක්ද සමග නිකුත් කරනු ලැබේ.

3) ළඟම ඥාතීන් මෙම ලියවිලි දෙකම කඳවුරු කළමනාකාරීත්වය වෙත ඉදිරිපත් කරනු ලබයි.

4) අවමංගල්‍ය කටයුතුවලට අවශ්‍ය ඇඳුම්, සුවඳ වර්ග ආදිය ගැනීමට ඥාතීන් වෙත "ලියෝනිස්" 15000 ක මුදලක් ගෙවනු ලැබේ.

5) මරණ සහතිකය සහ වළදැම්මේ අනුමැතිය යන සහතික දෙකේම පවුලේ පිටපත්වල කඳවුරු කළමනාකාරීත්වය මගින් මුදල් ගෙවන ලද බවට මුද්‍රාව තබනු ලැබේ.

6) මිනිය වැසීමට බැලැන්කේට්ටුවක් ද කඳවුරු කළමනාකාරීත්වය මගින් ලබා දෙයි.

7) ජෙම්බේ ගම්මානයේ පිහිටි කනත්තට පවුලේ උදවිය සමග කඳවුරේ සනීපාරක්‍ෂා පිළිබඳ කණ්ඩායමේ සමාජිකයන් යනු ඇත.

8) නිල සෞඛ්‍ය නියෝජිතයා වශයෙන් පත්කරනු ලැබ සිටින ගම් වැසියෙක් වළදැම්මේ සහතිකය පිරික්සා බලා අවමංගල්‍ය කටයුතු කිරීමට ඉඩ සලසා දෙනු ලැබේ. මිනිවල අඩි 6ක් ගැඹුරට හැරීම ගැන ඔහු සහතික වෙයි.

9) ඊට පසුව වළ කැපූ තිදෙනා (පවුලේ අය විසින් පත් කළ) ඥාතීන් සමග කඳවුරට පැමිණ වළ හැරීමට නියමිත මුදල ලියනෝස් 1500 බැගින් භාර ගනු ලැබේ.

# 18 කඳවුර වසාදැමීම



කාබුල්හි පසුගිය සෝවියට් පරිග්‍රයෙහි පිළිකුල් සහගතව වසර ගණනාවක් විසීමෙන් අනතුරුව ඇප්ගනිස්ථානයේ අභ්‍යන්තර අවතැන් වුවන් සෝමාලි තැනිතලාවේ පිහිටි සිය නිජබිම වෙත ආපසු යැමේ අවස්ථාව. ජායාරූපය එන්. බෙහෙරිං එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස් කාර්යාලය.

# 18 වන පරිච්ඡේදය : කඳවුර වසා දැමීම.

## හැඳින්වීම:

කඳවුරක් යනුවෙන් සළකනු ලබන්නේ තාවකාලිකව යොදවනු ලබන විධිවිධානයකි. ඒ නිසා ධනාත්මක අවසානයක් ඒ හා සමානව, හොඳ ආරම්භයක් මෙන්ම වැදගත්වේ. ක්‍රියා පිළිවෙළ තුළ උනන්දුවක් දක්වන විවිධ කණ්ඩායම්වලට සාර්ථක කඳවුරු වසා දැමීමකදී ඔවුන්ගේ සහභාගිත්වය තහවුරු කිරීම ගැන දැනුම් දිය යුතුවේ. වඩාත් වැදගත් වන්නේ සරණාගතයින් හෝ අවතැන් වූවන් බැවින් මෙම ක්‍රියාවලියෙදී ඔවුන්ගේ සහභාගිත්වය අත්‍යාවශ්‍ය වේ. විධිමත් වසා දැමීමක් සඳහා කුමක් පිළියෙල කෙරේද, කොන්ත්‍රාත්කරුවන් සහ සම්බන්ධතා ක්‍රියාකාරීන් ගේ පසුබිම සකස් කිරීම ද වැදගත්වේ. කඳවුර වැසී මෙන් ඊට එරෙහිව ඇතිවිය හැකි ප්‍රතික්‍රියාවන්ට මුහුණ දීමට කඳවුරු කළමනාකරු කෙසේ වුවද සූදානමින් සිටිය යුතුය.

ඉවත් වීමේ කාලය සහ ඉවත්වීම පිළිබඳ උපමානයට පාදක විෂය අඛණ්ඩ සාකච්ඡාවට සහ විවාදයට ලක්විය යුතුය. එවන් තිරණයකට එළඹීමට පෙර සමාවබෝධිත ඇගයීමක් කිරීමේ වැදගත්කම තරයේ ප්‍රකාශ නොකළ යුතුය. ඉවත්වීම සඳහා සියලු දර්ශකයන් යොමුවන විට අවතැන් වූවන්ගේ සුභසාධනය සහ සම්බන්ධිත වෙනත් හේතු තවදුරටත් සුරක්‍ෂා කළ යුතුය. කඳවුරු කළමනාකාරිත්ව කණ්ඩායම මගින් සත්කාරක / ස්වදේශීය රජය සහ ආධාර කරනු ලබන රටවල් වගේම ස්වදේශීය සහ ජාත්‍යංතර රාජ්‍ය නොවන සංවිධාන සියල්ලම ස්ථිර වශයෙන්ම තිරණයට අනුකූලතාව දක්වන්නේ දැයි යන්න සහතික විය යුතුය. ප්‍රවේශම් සහගත සැළසුම සහ පරිපූර්ණ කිරීම පිළිබඳ දින සම්බන්ධිකරණය තිරනාත්මක වගේම සහ කඳවුරු කළමනාකාරිත්ව කණ්ඩායම විසින් කළ යුත්තේ ස්වදේශීය සහ ජාත්‍යංතර රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් අදල ක්‍රියාකාරීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීමය.

### ඉවත්වීමට හේතුවන සමාවබෝධතා :

- කඳවුරු ප්‍රජාවට තවදුරටත් ප්‍රධාන ඒජන්සියේ සහ කඳවුරු කළමනාකාරිත්වයේ රැකවරණය අවශ්‍ය නොවීම.
- සත්කාරක රජය, ආරම්භක රට සහ ප්‍රධාන ඒජන්සිය අතර ත්‍රයි පාර්ශික සම්මුතියකට එළඹීම, විශේෂයෙන්ම ආරම්භක රටෙහි ආරක්‍ෂාව සහතිකවීම සහ ගෞරවාන්විත ආගමනයක් සඳහා වන දියුණු තත්ත්වයක්ම පාදක විය යුතුය.
- කඳවුරු ප්‍රජාව විසින් අඛණ්ඩව ඔවුන් සඳහන් වන කල්පවත්නා විසඳුම ප්‍රධාන ඒජන්සියට ඒත්තු ගැන්විය නොහැකි තත්ත්වයක් පැවැතිම.
- ප්‍රතිපාදන අවසන්වීම, මානව සහ මූල්‍ය සම්පත් තවදුරටත් ප්‍රමාණාත්මකව නොතිබීම.
- රැකවරණ සහ ආරක්ෂක හේතු, කඳවුරෙහි සේවය කරන මානව හිතවාදී සේවකයින්ගේ දේපලවලට, සහ ජීවිතවලට ඇති තර්ජන ආදිය, එජන්සිවලට ඉවත්වීමට බලකිරීම.
- සරණාගතයින්/අවතැන් වූවන් වෙත පිවිසීම තව දුරටත් ප්‍රතික්ෂේප කිරීම හෝ බෙහෙවින් දුෂ්කරවීම.

---

1. ප්‍රධාන ඒජන්සියක් විය හැක්කේ සරණාගත/අවතැන් වූවන්ගේ වැඩසටහනට මූලික වශයෙන් ප්‍රතිපාදන සලසා දෙන සහ ඒ සමගම කඳවුරු කළමනාකරණ කණ්ඩායම සමග එක්ව කටයුතු කරනු ලබන හෝ නොවන යම් ආයතනයකි.

2. සරණාගතයින් සඳහා පිළිගත හැකි විසඳුම් තුනක් ඇත. ඒවා නම් ආපසු සිය රට යෑම, යළි පදිංචිවීම සහ ස්වදේශීය අනුකූලනය. එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස් වරයා විසින් සරණාගතයින් ආරක්‍ෂා කිරීම : රාජ්‍ය නොවන සංවිධාන සඳහා ක්ෂේත්‍ර යොමුව 1999 : 60-81.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම්

**එසා දැම්මට පෙර සළකා බැලිය යුතු සමහරක් කරුණු.**

**දත්ත කළමනාකරණය :** කඳවුරු ප්‍රජාව ගැන සාමාන්‍යයෙන් රජය සහ ප්‍රධාන ඒජන්සිය/කඳවුර කළමනාකරන ඒජන්සිය දත්ත සමුදයක් පවත්වා ගෙන යනු ලබයි. සංචලනය පිළිබඳ නිර්නායකයන් සැලසුම් කිරීමේ දී ආහාර බෙද හැරීමේදී අරක්‍ෂාව සම්බන්ධයෙන් සෘජු බලපෑම් කරන්නේය.

**අත්‍යවශ්‍ය ලේඛන :** මෙම ලියවිලි ප්‍රවේශම් සහිතව සහ කාර්යක්‍ෂමව සංවිධානය කොට, ආරක්‍ෂා සහිතව පියවරෙන් පියවර මාරු කළ යුතුය. විවිධ ඒජන්සි අතර ඇති ආගමික දෙපාර්තමෙන්තුවට, සමාජ සේවා සහ අධ්‍යාපන දෙපාර්තමෙන්තුවට නිරවද්‍ය තොරතුරු ලබාදිය යුත්තේ ආපසු යන සරණාගතයින් හෝ අවතැන් වුවන්ට, අධ්‍යාපනය සහ මුලික සමාජ සේවාවන් ලබා ගැනීමට හැකි වන පරිදි විධිමත් ලියවිලි අවශ්‍ය නිසාය. කඳවුරෙන් ලබා දෙන පාසල් වාර්තා නිවැරදිව තිබිය යුතු අතර එමගින් ශිෂ්‍යයන්ගේ කුසලතා මැනීම සහ දක්‍ෂතා මට්ටම ඔවුන්ගේ යලි සමෝධානයේ කොටසක් සාර්ථකව සලකා බැලිය හැකිවන බැවිනි. රෝහල්/වෛද්‍ය වාර්තා, වඩාත් වැදගත් වන එන්නත්/ප්‍රතිශක්තිකරණ ප්‍රවේශමෙන් සංවිධානය කොට මාරු කළ යුත්තේ වෛද්‍ය මැදිහත්වීම් නිසි පරිදි සහතික කරනු වස්ය. වෛද්‍ය වාර්තා මාරුවී යැමේදී සරණාගතයින්/ අවතැන් වුවන් හා තිබිය යුතුය.

**පරිපාලනමය වාර්තා :** මෙහෙයුම් වාර්තා, ගණන සහ මුල්‍ය වාර්තා ආදිය සමහරක් වැදගත් පරිපාලන වාර්තා වන අතර අවම වශයෙන් අවුරුදු පහක්වත් තබා ගත යුතු වන්නේ සාර්ථක ගණන පුරුද්දක් වශයෙනි.

**වාර්තා සම්බන්ධ විශ්වාසනියත්වය සහ ආරක්‍ෂාව :** සමහර අවස්ථාවලදී අවතැන් වු පුද්ගලයින්ට බලවත් තර්ජන සහ ඕනෑම අවස්ථාවකදී මුහුණ දිය හැකි අනතුරු සරණාගත/අවතැන් වු තත්වයන් යටතේ සිදුවිය හැකිය. මෙම තර්ජන ක්‍ෂණිකව බලපැවැත්විය හැක්කේ ඔවුන්ගේ මව් රටවල දමා ආ පවුලේ ආසන්න සමාජිකයින්ටය. මෙවන් තත්වයක් යටතේ නිතරම ජාත්‍යංතර මැදිහත්වීමක් කඳවුරේ තිබිය යුතුය. සරණාගතයින් / අවතැන් වුවන්ගේ අනන්‍යතාව රහසිගතව තිබිය යුතු අතර සංචලනයක දී සංචාරක ලියවිලි හා සංචලන සැලසුම් රහසිගතව තබා ගත යුතුවනවා සේම, හැකි තාක් දුරට සීමිත පිරිසකට පමණක් සීමා විය යුතුය.

අග්නිදිග ආසියාවේ එක් මෙහෙයුමකදී සරණාගත වැඩසටහන බෙහෙවින්ම මතභේදයට ලක්වුවා වගේම සහ සත්කාරක රට සහ සරණාගතයින්ගේ මව්රට යන දෙකටම එය අවශ්‍ය නොවීය. බලධාරීන් ඉවත්වීමේ හේතුව පිළිබඳව විසම, අදහස් දැරූ අතර එය සරණාගතයින්ගේ පක්‍ෂයෙන් ඕනෑම මොහොතක සිදුවිය හැකිව තිබුණි. සරණාගතයින්ගේ නම් සහ ලිපිනයන් පිටවිය හැකි බැවින් වඩාත් ආරක්‍ෂා කරන ලද අතර එසේ පිටවුවහොත් එක්ව නොආ සමාජිකයින් පිළිබඳ සැරුම් ලියවිලි පිටවීමට ඉඩ තිබුනි. අවදානම අවම කිරීම් වස් එක් කඳවුරකින් තවත් කඳවුරකට මාරු කිරීමේදී ප්‍රවේශමෙන් සහ රහසිගතව සැලසුම් කළ යුත්තේ මුල් රටේ නියෝජිතයින් පිටත සිට කඳවුර නිරීක්‍ෂණය කරන බැවිනි.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ ප්‍රධාන වගකීම්.

- **නිවැරදි දත්ත :** කඳවුරු කළමනාකරණ කණ්ඩායම සත්කාරක රජය සහ ප්‍රධාන ඒජන්සිය සමග සම්බන්ධිකරණයවී සංඛ්‍යා ලේඛන ගැලපීම සහ වාර්තා කාලානුරූපි කර නිවැරදිව නිශ්චය කර ගැනීම ගැන සහතික විය යුතුය.

- **වාර්තා පිළිබඳ සම්පූර්ණ විශ්වසනියත්වය :** උනන්දුවක් දක්වන්නන් විසින් සරණාගතයින්ගේ/අවතැන් වුවන්ගේ වාර්තාවල අනුල්ලංඝනිය බව සහ විශ්වාසනියත්වය කණ්ඩායම විසින් දිරිමත් කළ යුතුය.

- **රජයේ විවිධ ආයතන සමග සම්බන්ධිකරණය :** සරණාගතයින්/අවතැන් වුවන්ගේ තත්ත්වයට කල් පවත්නා විසඳුමක් සඳහා ලඟාවීමේ දී කඳවුරු කළමනාකරණ කණ්ඩායම අවශ්‍ය වන්නාවූ සහ අදාල වන්නා වූ දත්ත ආපසු යන අයට සම්පූර්ණයෙන් සමාජ සුභසාධනය, අධ්‍යාපනය ලබාගැනීමට සහ ඔවුන්ගේ ආපසු යෑමේදී අවශ්‍ය අනන්‍යතා ලියවිලි ලබාදිය යුතුය.

- **වාර්තා ගබඩාකර තැබීම :** අත්‍යාවශ්‍ය මෙහෙයුම්, මූල්‍ය / ගණක සහ පරිපාලන වාර්තා ආරක්ෂා සහිත තැනක තැබිය යුතුය.

## තොරතුරු සංවිධානය කිරීම.

**සුදනම්වීම :** උනන්දුවක් දක්වන අයගේ හදවත් සහ සිත් සාර්ථකව අදියරෙන් අදියර කරගෙන යා හැකි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහභාගීවීම සුදනම් කිරීම අත්‍යාවශ්‍යය. කඳවුරේ නිශ්චය කර ගත් ඒජන්සි ආයතනය ඇතුළත් වන පරිදි සමෝධානගත කණ්ඩායමක්, උනන්දුවක් දක්වන්නන්ට නිශ්චිත වැඩ දැනුම් දී තෝරා ගත යුතු වන අතර දැනුම් දී තෝරා ගත යුතු වන අතර වසා දැම්මේ දී බලපාන දෑකෙරෙහි ඔවුන් සුදනම් කළ යුතුය.

**කඳවුරු වාසින්ගේ මැදිහත්වීම :** තොරතුරු බෙදාහැරීමේදී කඳවුරු කමිටු වඩාත් අත්‍යවශ්‍ය මෙහෙවරක් ඉටු කරයි. කාන්තා සහභාගිත්වය තහවුරු කිරීම අවශ්‍යම දෙයකි. පැහැදිලි උපදෙස් ලබාදීම මගින් වැරදි අර්ථකථන දීමේ ඉඩකඩ සහ ක්‍රියාවලියේ අවුල් සහගත තත්ත්වයන් ඇති කිරීම අවම කරයි. අවදානමට ලක්වී සිටින කණ්ඩායම් ගැන තොරතුරු ලබාදීම සහ උපදේශන මගින් කාංසාව අඩු කළ හැකිය. සමහර කණ්ඩායම් වලට ආපසු යෑම තෝරා ගැනීමට ඉඩක් නැතිවීම හෝ ඔවුන්ට එල්ලවිය හැකි ප්‍රචණ්ඩත්වය සහ ආරවුල් ඇති වෙතැයි බියක් පවති. ඉක්මනින්ම ප්‍රකාශන, සිතියම් සහ පෞද්ගලික උපදේශනය මගින් තොරතුරු ලබා ගත හැකි මධ්‍යස්ථාන පිහිටුවීම ඉතා වැදගත්ය.

බංගලාදේශයේ බොහෝ සරණාගතයින්ට කියවීමට හෝ ලිවීමට නොහැකි නිසා කුටියෙන් කුටියට තොරතුරු ලබා දීමේ ව්‍යපාරයක් දියත් කළ අතර කුඩා හා විශාල රැස්වීම් මගින්ද ලබා දෙනු ලදී. ආගමික නායකයින්ගේ සහභාගිත්වය (ඉමාම්වරු) වඩාත් සංවිධානගත තොරතුරු ලබාදීමේ ව්‍යාපාරයක් සහ කඳවුර වසාදැම්මේ ඵලදායක සිද්ධියක් ලෙස ප්‍රබල මෙහෙයක් ඉටු කරන ලදී.

විවිධ මෙහෙයුම්වලදී යොදා ගන්නා ලද වෙනත් වෘත්තිය නියලුම් වන්නේ, ලොකු ප්‍රමානයේ පෝස්ටර් දැන්වීම්, බුලටින, පුවරු, තේමාවට අදළ ළමයින්ගේ සහ තරුණයින්ගේත චිත්‍ර තරග, කඳවුරු තුළ මහජන ඇමැතිතුම් ක්‍රම, බහු මාධ්‍ය ප්‍රචාරක දැන්වීම (ගුවන්විදුලි දැන්වීම්/රූපවාහිනි ප්‍රචාරයන්, වාර්තා

වැඩසටහන් ආදිය, ස්වදේශීය නායකයින් සහ අදාල කණ්ඩායම්, මාධ්‍ය ප්‍රතිපත්ති සැළසුම්කරුවන් සඳහා පුවත්පත් සාකච්ඡා ද වේ.

**කල් ගැනීම :** මහජනතාවට ප්‍රවෘත්ති දැනුම් දීම කළ යුත්තේ කිනම් වේලාවකදැයි යන්න තිරණාත්මකය. ආධාර දෙනු ලබන රටවල සහ රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීම ඉතාම අත්‍යාවශ්‍යය. රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාව සමග කටයුතු කිරීමේදී ඕනෑම ක්‍රියාන්විතයකදී ඉහළ මට්ටමේ සංචාර කල් ඇතිව කිරීම, ආධාර කරනු ලබන රටවල නියෝජනය සත්කාරක / දේශීය රජයන් සහ ආරම්භක රටේ බලධාරින්ගේ පිවිසීම අවශ්‍යවේ.

## කල්පවත්නා විසඳුම් සම්බන්ධයෙන් උපදේශනය

**කල්පවත්නා විසඳුම් :** කල් පවත්නා විසඳුමක් උදවිය හැකිද, උද කළ හැකිද යන ප්‍රශ්නය නිතරම සරණාගතයින්/අවතැන් වුවන්ට අතරක් නැතිව හිරිහැර කරන්නකි. කෙසේ වුවද, කඳවුරු වැසියන්ට පිටවීමේ ක්‍රියා පිළිවෙතක් ඇති කිරීමට සහවනු ලැබීමේදී තවමත් සිය රට යෑම වඩාත් සුදුසු තේරීම ලෙස පවතින්නෙ සිය රටට ආපසු යැමට ඉඩකඩ සලසා ඇති බවය. මෙම පිළියම අවසන් කිරීමට වෙනත් හැකියාවන් තිබිය දී එම අවස්ථාවේදීම මහන්සි වී උත්සාහගත යුතුය.

**උපදේශක මධ්‍යස්ථාන :** සරණාගතයින්ට හොඳ තොරතුරු සහ උපදෙස් ලබා දීමට මේ ආකාර මධ්‍යස්ථාන පිහිටුවිය යුතුය. මුල් අවස්ථාවකදී අන්තර්ජාතික නිති උපදේශන මධ්‍යස්ථානයක් වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුවේ.

පිලිපිනයේ කල්පවත්නා විසඳුම් උපදේශකවරුන් (ජාතික කාර්ය මණ්ඩලය) සහ අර්ථ නිරූපකයින් විසින් පවත්වා ගෙන යනු ලබන පැමිනිමේ මධ්‍යස්ථානයක් කඳවුර වසාදැම්මට පෙර පිහිටුවනු ලද්දේ ඉවත් කිරීම කඩින් කඩ සිදුකිරීමට අවුරුද්දකට පෙර වැදගත් තොරතුරු ලබාදීම සඳහාය. ස්වදේශීය නායකයින්/බලධාරින් දැනුවත් කිරීම සඳහා මධ්‍ය සහ වෙනත් ප්‍රතිපත්ති සම්පාදකයින් ප්‍රමාණයක් සාකච්ඡා වට කිහිපයක් පැවැත්විය. කඳවුරු කළමනාකරණ කණ්ඩායම විසින් කඳවුරු කමිටු සාමාජිකයින් කලාපිය තොරතුරු සැසි ආරම්භ කිරීම අවධාරණය කරමින් ක්‍රමිකව කඩින් කඩ ඉවත් කිරීමේ ක්‍රමවේදයක් ආරම්භ කරන ලදි. හැම ආපසු යැමක්ම හොඳින් දැනුවත් කරණ කරන ලද්දක් බව සහතිකවීම පිණිස ස්වේච්ඡාවෙන් සියරට යැම ගැන පවත්වන ලද උපදේශන සැසි, සහ එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස් මගින් තත්ත්වය සාධනය කරනු ලැබිය. උනන්දුවක් දක්වන තරුණයින් සහ දෙමාපියෝ අපේක්ෂිත කඳවුරු වසා දැම්ම පිළිබඳ ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කළහ. කඩින් කඩ බෙදී යැම ගැන නිවරදි තොරතුරු කඳවුරේ මහජන ඇමැතිම් පද්ධතිය තුළින් කරනු ලැබූ විට ප්‍රතිවිරෝධතා අඩුවිය.

**නිතිමය කරුණු :** බොහෝ අවසථාවලදී ගෞරවනිය ආපසු යැමක් සහ ආරක්‍ෂක තත්ත්වයක් සරණාගතයින්ට/අවතැන් වුවන්ට, සිය දේපලවලට ඇති අයිතිය සහ මූලික ලියවිලිවලට ප්‍රමාණවත් ආරක්‍ෂාවක් නොමැතිව සපුරා ගත නොහැක. මෙහිදී සැළකිල්ලට ගත කරුණු බොහෝය. උදහරණ වශයෙන් සරණාගත/අවතැන් වු අයගේ මුල් රටවල නිවාස සහ දේපල අවතැන්විමට සක්‍රිය කල්පවත්නා විසඳුම් බොහෝ විට පූර්ව තත්ත්වයක් වෙයි. අවතැන් වීමක දී මුල්ම අවස්ථාවේදී කරුණුවලට විසඳුම ලබාදීම වැදගත්වන අතර කඳවුරු කළමනාකරණ කණ්ඩායම මගින් අවම වශයෙන් යම් ආපසු යැමකට පෙර විසඳීම වඩාත් සුදුසුය. ජාත්‍යංතර අත්දැකිම වන්නේ මෙම කරුණු නොසලකා හැරීමෙන් නිතරම ආරක්‍ෂාවට සහ ගෞරවනිය ආපසු යැමකට බාධාවක් වෙන බවයි.

- **අදියරෙන් අදියර යැවීමේ ක්‍රමවේදය :** උනන්දුවක් දක්වන්නන් සහ ක්‍රියාකාරීන් හැකිතාක් ප්‍රමාණයක් සම්බන්ධ කර ගෙන කඩින් කඩ යැවීමේ ක්‍රමවේදයක් සැලසුම් කිරීම තීරණාත්මකය. උදහරණයක් විදියට කඳවුරක් කලාප හෝ කොටස් හෝ ක්‍රමික ආධාර ලැබෙන ආකාරයට අදියරෙන් අදියර යොදා ගත හැකිය. මුලින් ආහාර නොවන ද්‍රව්‍ය බෙදා දීම නැවැත්විය හැකිය. කොන්ත්‍රාත්කරුවන් සහ රාජ්‍ය නොවන සංවිධාන වලට කල් ඇතිව දැනුම් දීම මගින් ඒ අයගේ කටයුතු පෙළගස්වා ගැනීමට ඉඩකඩ ලැබෙනවා ඇත.

- **ආධාර කරන්නා සහ රජය සමග සම්බන්ධීකරණය :** අදියරෙන් අදියර යැවීමේ ක්‍රියාවලිය පිළිබඳව ආධාර කරන්නන් සහ අදාල රජයේ ආයතන සමග සහභාගීත්වය තොරතුරු සහ සහාය සම්බන්ධව සම්න්ධීකරණය වැදගත්වේ.

- **තොරතුරු වහනය කිරීමේ කණ්ඩායම :** තොරතුරු බෙදා හැරීමේ කාර්ය සම්බන්ධීකරණ කණ්ඩායම හඳුනාගෙන, තෝරා ගැනීම අත්‍යාවශ්‍යය. එහිදී ඔවුන්ගේ මෙහෙවර, වගකීම් සහ කාල පරාශය හඳුනා ගැනීම ද අවශ්‍ය වේ. කඳවුරු පූජාව සාමාන්‍යයෙන් ප්‍රජා පක්ෂයේ නායකයින්ගේ අවවාද හා මග පෙන්වීම අපේක්ෂා කරණ බැවින් කණ්ඩායම මගින් ඔවුන්ගේ මැදිහත්වීම ලබා ගත යුතුය.

- **නිතිපතා රැස්වීම් :** අදියරෙන් අදියර යැවීමේ ක්‍රියා පිළිවෙළ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සමෝධානගත කළමනාකරණ කණ්ඩායම රැස්වීම නිත්‍ය පදනමක් මත සිදුවිය යුතුය.

- **සන්නිවේදන මාධ්‍යය හා ස්වරූපය :** තිබෙන සම්පත් සහ සුදුසු බව සැළකිල්ලට ගෙන අදියරෙන් අදියර පිටමන් කිරීමේ ක්‍රමවේදයකදී සන්නිවේදනය කළ යුතු වඩාත් සුදුසු මාධ්‍යය සහ ස්වරූපය කණ්ඩායම මගින් හඳුනාගත යුතුය.

- **උපදේශන මධ්‍යස්ථාන :** කඳවුරු ප්‍රජාවට තොරතුරු සහ උපදෙස් ලබා ගැනීමට මධ්‍යස්ථාන පිහිටුවිය යුතුය.

- **ප්‍රතිචාර නිරීක්ෂණය :** නියම තොරතුරු බෙදා හැරීමේ වැඩ පිළිවෙලක් කණ්ඩායම මගින් සංවිධානය කර ප්‍රතිචාර නිරීක්ෂණය සහ කඳවුරු ප්‍රජාවගේ කාංසා මට්ටම සොයා බැලිය යුතුය.

## බිම්බෝම්බ පිළිබඳ දැනුවත් කිරීම දියුණු කිරීම

**බිම් බෝම්බ සහ ගවේෂණය නොකළ නියෝග (UXOS) :** අවතැන් වුවන්ගේ දේපල හොඳින් සොයා ගැනීමේදී බිම් බෝම්බ සහ ගවේෂණය නොකළ නියෝග ඉවත් කිරීමද ඇතුළත් වේ. බිම් බෝම්බ වල ඇති අවදනම පිළිබඳ අධ්‍යාපනය සහ දැනුම අර්බුදකාරී පෙදෙස්වල ජීවත්වන සහ ආපසු යන අයට ලබාදිය යුතුය.

2003 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දෙමළ අවතැන්වූවන් ආපසු යැමේ ක්‍රියාවලියේ දී බෙහෙවින් අභියෝගයට ලක් වූයේ බිම් බෝම්බ සහ අභියෝගාත්මක නියෝගයන්ය. එය ඔවුන්ගේ දේපල නිවාස සහ ඉඩකඩ ලබා ගැනීමේදී කාංසාවට යමක් එක් කරන ලදී. දශක දෙකක් තුළ පැවැති අරගලයේදී උතුරේ බොහෝ නිවාසවලට බෝම්බ හෙළා කැඩී බිඳී ගොස් ඇත. ද්විතියික පදිංචිකරුවන් කැඩිබිඳී ඉතිරිව තිබූ ව්‍යුහයන් වල පදිංචි වූ අතර හිමිකරු දකුණේ තාවකාලික කඳවුරුවල නතර වූහ. සාම ක්‍රියාදාමයත් සමග උතුරට ආපසු යැම උනන්දු කරන ලදී. විවිධ අන්තර් ආයතනික ක්‍රියාකාරීත් වඩාත් උනන්දු වූයේ සුභසාධක කඳවුරවල වාසය කොට ආපසු යන අයගේ කටයුතු කලින්ම කර, වලක්වා, ආපසු යැමේ අංශවලට ප්‍රමුඛත්වයක් සැලසීම සහ නිරායාශයෙන්ම දැනටමත් ආපසු යන අයට උදව්වීමටය. විවිධ රාජ්‍ය නොවන සංවිධාන සහයෝගයෙන් කටයුතු කොට බිම්බෝම්බ තිබුණ කෘෂි සහ පදිංචි වී සිටින විශාල ප්‍රදේශයක් භෞතිකව ශුද්ධ කිරීමට ක්‍රියාත්මක වීමය. ආපසු යැවීමට ඉඩ සැලසූ කඳවුරු ප්‍රජාවට ස්වදේශීය සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන මගින් බිම්බෝම්බ අවදානම පිළිබඳ දැනුවත් කෙරෙන සහ අධ්‍යාපනයක් ලබා දෙන සැසි පැවැත් වීමය. නිරායාසයෙන්ම ආපසු ගිය අයට සහාය වන ප්‍රජා මට්ටමේ දැනුවත් කිරීමේ ප්‍රචාරක කටයුතු ද මෙහෙය විය.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ මූලික වගකීම්.

- **බිම් බෝම්බ ප්‍රදේශවලට ආපසු යැම :** කඳවුරු කළමනාකරණ කණ්ඩායම මගින් බෝම්බ සහිත ප්‍රදේශවලට ආපසු යැමට ලේඛනගත කඳවුරු වැසියන් කවුරුන්දැයි හඳුනා ගත යුතුය.

- **බෝම්බ අවදානම පිළිබඳ අධ්‍යාපනය :** ආපසු යැමට පෙර විවිධ රාජ්‍ය නොවන සංවිධාන සමග බිම් බෝම්බ අවදානම පිළිබඳ අධ්‍යාපනය සහ දැනුවත්කිරීම ගැන සම්බන්ධීකරණය කිරීම නිර්දේශ කරනු ලැබේ.

- **බිම් බෝම්බ වලින් නිදහස් ප්‍රදේශ :** බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතුවල නියුතු රාජ්‍ය නොවන සංවිධාන රජය සහ යුද හමුදව සම්බන්ධීකරණය කොට ආපසු යැමට නියමිත ප්‍රදේශ බිම් බෝම්බ මුක්ත කලාපයක් බවට සහතිකවීම අවශ්‍යය.

- **නිවාස, භූමිය සහ දේපල :** කණ්ඩායම විසින් නිවාස, භූමිය සහ දේපල සඳහා නිසි අවධානය ලබා දෙන ලද බවට ප්‍රාදේශීය සම්බන්ධීකරණයේ දී සහතික විය යුතුය.

- **භූමිය, නිවාස සහ දේපල අයිතිය පිළිබඳ ගිවිසුම් :** ස්වේච්ඡාවෙන් ආපසු යන අයගේ ගිවිසුම් ත්‍රෛ පාක්ෂික ලෙසින් භූමිය, නිවාස් සහ දේපල අයිතිය ප්‍රකාශිත විය යුතු බවට උපදෙස්දීම අවශ්‍යය. හැකිතාක් දුරට ප්‍රතිෂ්ටාපනය, වන්දි ගෙවීම සහ හිමිකරුට ආපසු ලබාදීමේ ක්‍රමවේදය ඇතුළත් විය යුතුය.

### සත්කාරක ප්‍රජාව

රැකවරණය සලසන රටවල් ගණනාවක් නියමයක් නැතිව කලක් නැවැතීමට අවසර ලබාදී තිබෙන නමුත් සමහරක් නිතැතින්ම ස්වදේශීයව පදිංචියට පත්ව ඇත.. ස්වදේශීය නායකයින් සහ බලධාරීන් සම්බන්ධ බව පෙනී යන්නේ නම් කල්පවත්නා විසඳුමක් ස්ථාපනය කිරීමට සහ අදියරෙන් අදියර යැවීමේ ක්‍රියාවලිය වෙනුවෙන් සත්කාරක ප්‍රජාවට වැදගත් මෙහෙවරක් ඉටු කළ හැකි වෙනවා ඇත. අදාලවන සහ යෝග්‍යවන අවස්ථාවලදී කඳවුර අවසාන වශයෙන් වසා දැමීම පිළිබඳ තොරතුරු පතුරුවා හැරීමේ වැඩ පිළිවෙලට ස්වදේශීය නායකයින්ට සහ ආධාර සලසන ඒජන්සි ආයතනවලට සම්බන්ධ විය හැකිය.

පලවන් දූපතේ පිලිපින කඳවුරේ, ස්වදේශිය නායකයින් සහ බලධාරින්, දහසකට අධික වියට්නාම් අවශේෂ කණ්ඩායමකට යාථාර්ථයෙන්ම ස්වදේශියව සමෝදනගතවීමට ආධාර දීම පිණිස සහයෝගය දැක්වීය. දේශිය රාජ්‍ය නොවන සංවිධානයක සමීප සම්බන්ධීකරනයක් ඇතිව ඔවුන්ගේ පිටවීමේ ක්‍රියාවලියට සම්බන්ධව සරණාගතයින් සමාජගත කර ගැනිමට ප්‍රබල ලෙස යලි සහතික විය. රූපවාහිනිය සහ ගුවන් විදුලි ජාල ඔස්සේ ඔවුන්ගේ නෛතික අවිනිශ්චිතතා හා සහ බිය නොසලකා සහතිකයක් ලබා දෙන ලදි. බලධාරින් විසින් පදිංචිවීමට අගනා ඉඩම් කට්ටියක් ලබාදීම වෙනසක් ඇති කරන කඩඉමක් විය. කඳවුර වසා දැමීම පිළිබඳ විරෝධතා එල්ල කරමින් කරන ලද පෙළපාලි හා ප්‍රතිවිරෝධතාවල අවසානය එය විය.

සත්කාරක ප්‍රජාවන් නිතරම සරණාගතයින්/අවතැන් වුවන් සම්බන්ධව සාමාන්‍යයෙන් ආගන්තුකශීලි නොවේ. ස්වදේශිය බලධාරීන් අන්තර් විශ්වාසි ආගමික නායකයින් සහ ජාත්‍යන්තර නිරීක්‍ෂකයින්ගේ සම්බන්ධවීම ඒ නිසාම සාර්ථක, මැනවින් සංවිධානය කරන ලද සහ සුමට අදියරෙන් අදියර ක්‍රියාත්මක වන්නා වු ක්‍රියාවලියක් බවට සහතිකවීම තීරණාත්මකය.

කඳවුරක් අවසන් කර වසා දැම්ම ස්වේච්ජාවෙන් ආපසු යෑම පළ තනදැරීම පැහැර හැරිය නොහැකිය. කඳවුරු කළමනාකරණ කණ්ඩායම හැමවිටම කරදර හිරිහැර කිරීමේ සළකුණු ගැන අවධානයෙන් සිටිම සහ සත්කරක ප්‍රජාව විසින් මිත්‍රශිලි නොවන ආකාරයෙන් බලයෙන් නම්මවා ගැනිම හෝ කඳවුරු ප්‍රජාව විසින් එසේ කිරීම ගැන විමසිල්ලෙන් සිටිය යුතුවේ. ස්වදේශිය සම්බන්ධිකාරීන් සහ බුද්ධි අංශ කණ්ඩායම් මගින් තොරතුරු එක්රැස් කර ගැනිම සහ පවතින තත්වය පිළිබඳව සමීපව නිරීක්ෂනය කිරීම ධනාත්මකව කිරීමට කණ්ඩායම හැමවිටම ජාත්‍යංතර සහභාගීත්වය ඇතිව පවත්වා ගෙන යෑමට සහතික විය යුතුය. කඳවුරු ප්‍රජාව සමග එක්ව යමින් නිරීක්‍ෂණය කරමින් කටයුතු කිරීමට කෙෂ්ත්‍ර ආරක්‍ෂක උපදේශකයෙකු යෙදවීම සුදුසු බවට උපදෙස් දෙනු ලැබේ.



බොස්නියානු අවතැන් වුවන් කඳවුර වැසීමේදී ඔවුන්ගේ තොරතුරු කලානුරූප කිරීම. කඳවුර වසා දැමීම ස්වේච්ජාවෙන් සිදුවන්නක් නොවන බව පැහැර නොහැරිය හැකි තත්වයකි. ජායාරූපය හේජ් රොබර්ස්වැඩ්

## ක්‍රියාත්මක කිරීමේ සහ මෙහෙයුම් පාර්ශ්වකරුවන්

කඳවුරු ප්‍රජාව අදියරෙන් අදියර යැවීමේ ක්‍රියාවලිය සුදනම් කිරීමේදී ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් ස්වේච්ඡා කණ්ඩායම් විසින් වැදගත් කාර්ය භාරයක් සැලසීම වැදගත්ය. තථ්‍ය අදියරෙන් අදියර පිටත් කිරීමේදී ඔවුන්ගේ සහභාගීත්වය කඳවුරු වැසියන්ට සහතිකවීම වැදගත්. වන්නෙ විශේෂයෙන්ම සත්කාරක ප්‍රජාව ඔවුන්ගේ ආගන්තුක සත්කාර කිරීමේ හැකියාව දැක්වීමේදීය. එක් කඳවුරකින් තවත් කඳවුරකට සංචලනයවීමේදී සරණාගතයින් / අවතැන්වූවන් හෝ ඔවුන්ගේ දේපලවලට අපහරණක් හෝ හැසිරීමේ නොසරුප් ස්වරූපයක් වැළක්වීම් වස් පැමිණ සිටීම යම් මෙහෙවරක් ඉටු කරයි.

## සැපයුම් සහ ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරුවන්

සියලුම සැපයුම් කොන්ත්‍රාත් මගින් ආවරණය වන අතර ක්‍රියාවලියේදී කල්තබා දැනුම්දීම අනිවාර්යයෙන්ම වැදගත් දෙයක් වෙයි. ක්‍රමිකව අදියරෙන් අදියර පිටමන් කිරීම වැදගත් වන්නේ ප්‍රවේශම් සහිත සැළසුම සහ සාකච්ඡා කිරීම, විශේෂයෙන් ම ආහාර සහ ඉන්ධන සේවා කොන්ත්‍රාත්කරුවන් සමග සම්මුතියකට එළඹීම වැදගත් වන්නේ අවතැන් වූවන්ගේ සුභ සාධනය සහතිකවීම සඳහාය. සියලුම කොන්ත්‍රාත්කරුවන් සමග අදියරෙන් අදියර පිටමන් කිරීම පිළිබඳ ක්‍රමවේදය, කාල නිර්ණය සහ සැලසුම් කිරීමත්, නිතිපතා රැස්වීම් පැවැත්වීමත් වැදගත් වේ. අදල වන පරිදි මාසිකව මෙම කොන්ත්‍රාත් සඳහා දීගු ලබාදිය හැකිය.

## කඳවුරු ප්‍රජාව පිටත්කර හැරීම

**අවදනමට ලක්වූ කණ්ඩායම් :** කිසියම් ආකාර සංචලනයකට පෙර අවදනමට ලක්ව සිටින කණ්ඩායම්වලට (එක්ව නොපැමිණි පොඩිත්තන්, වැඩිහිටියන් සහ කායික මානසික ආබාධිතවලින් අවශ්‍ය වන සියලුම විශේෂිත සැපයුම් ස්ථානගත කර තැබීම අනිවාර්යවේ. මෙම කණ්ඩායම් ඔවුන්ගේ ගමනාන්තයේ දී පිළිගැනීමට, විශේෂ විධිවිධාන (රැකවරණ පිරිවර, සැපකරු රැකවරණය, වෛද්‍ය සහ වෙනත් ප්‍රායෝගික කරුණු) සුදනම් කළ විට ඔවුන් කඳවුරෙන් පිටමන් කිරීමට මුලින්ම ප්‍රමුඛත්වය දිය යුතුය. හැකියාව සහ කැමැත්ත ඇති කඳවුරු ප්‍රජා සමාජිකයින් ඔවුන් යන අතර මග සහයවීමට හදුනා ගත හැකිය.

**සවිස්තරාත්මක සැළසුම් ක්‍රියාත්මක කිරීම :** පිටමන් කිරීමට ඇත්තා වූ ප්‍රජාවගේ ප්‍රමාණය මත සහ ක්‍රියාන්විතයේ ප්‍රමාණය අනුව සාර්ථකව කඳවුරක් වසා දැමීම සවිස්තරාත්මක සැළසුම් ක්‍රියාත්මක කිරීම එක් තිරණාත්මක ක්ෂේත්‍රයක් වේ. එසේම සැළසුම් කිරීම හා සම්බන්ධීකරණය බොහොමත් අභියෝගාත්මක ද වෙයි. ව්‍යාපෘතිය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පුරාම තොරතුරු ගලා යෑම අවශ්‍ය ආකාරයෙන් සිදුවිය යුතුය.

**යලි පදිංචි කිරීම/සියරට යැවීම :** ආපසු යෑම ආරක්‍ෂා සහිත ගෞරවාන්විත එකක්ද යන්න නිර්ණය කිරීම උදෙසා දේශ සිමාවේ රැස්වීම් සහ  ගවේෂණය ගත යුතු තිරණාත්මක පියවරවේ. ආපසු යන අයට රටේ බලධාරීන්/ප්‍රදේශවල දී යලින් අධ්‍යාපනය ලැබීමට, වෛද්‍ය පහසුකම් සහ වෙනත් මූලික සේවාවන් ලැබීමට නියමිත බවටත් ආරක්‍ෂාව ඇති බවටත් සහතිකයක් දිය යුතුය. ආපසු යෑමේ කට්ටල, බෙහෙත් ද්‍රව්‍ය, ආහාර සැපයුම පිටත්වීමට දිනකට පෙර සාමාන්‍යයෙන් සිදුවිය යුතුය. තවද මූල්‍යමය ආධාර ආපසු යනු ලබන රටේ පිළිගැනීමේදී සිදුවිය යුතුය.

**වෛද්‍ය / කායික පරීක්‍ෂණය :** මෙය සිදුවිය යුත්තේ කුමක් හෝ සංචලනයක් සිදුවීමට පෙරය. සාමාන්‍යයෙන් වෛද්‍ය වාර්තා සරණාගතයා විසින් රැගෙන යා යුතුය. ගමනාන්තයේ වෘත්තික සහායකයින් සමග සම්බන්ධීකරණය වී වෛද්‍ය සේවාවන් සහ රැකවරණය සුදනමින් ඇද්ද නැද්ද යන්න පිළිබඳව නිසැක වශයෙන්ම දත යුතුය.

බංග්ලාදේශයේ රොහිංගයා සරණාගතයින්ට නිරන්තරයෙන්ම උපදෙස් දෙනු ලැබුයේ කඳවුරෙන් පිටමන්වීමට පෙර ක්ෂය රෝගය සඳහා වන ප්‍රතිකාර මුළුමනින්ම සපුර ගත යුතු බවය. මීට හේතු වූයේ ඔවුන් ආපසු යන ගම්මානයේ දී සම්පූර්ණ වශයෙන් ප්‍රතිකාර ගැනීමට ඇති අපහසුතාව, බෙහෙත් සහ පසු වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමේ දුෂ්කරතාවයයි.

**කාල නිර්ණය සහ ප්‍රවාහන පහසුකම් :** ආපසු යැමේදී නිත්‍ය ප්‍රවාහන පිළිබඳ සැළසුම් කිරීම හා කල නිර්නය සම්බන්ධයෙන් සංවේදී සහ අවදානයට ගැනීමේදී ආරක්ෂාව සහ ආරක්ෂා පිළිබඳ ප්‍රමිතීන් සැලකිල්ලට ගත යුතුවේ. ප්‍රවාහකයින් සමග ගිවිසුම (අවශ්‍ය අවස්ථාවලදී) ගුවන් සමාගම් සමග වෙන් කිරීම් කල් තබා කළ යුතුවේ. ගුවන් ගමන් අදල වන අවස්ථාවලදී, ගුවන් ගමන් කාර්ය මණ්ඩලය මගින් ලියවිලි පිළිබඳ රහස්‍ය බව තබා ගැනීමට පියවර ගත යුත්තේ ආරක්ෂක පියවරක් වශයෙනි.

මියන්මාරය හා බංග්ලාදේශය අතර පිහිටි පටු සමුද්‍ර සන්ධිය හරහා මෝසම් කාලයේ ගමන් කිරීමේදී ඇති භයානකකම නිසාවෙන් රොහිංගයා සරණාගතයින්ට ආරක්ෂිත ඇඳුම් ඇඳීම අනිවාර්ය අවශ්‍යතාවක් විය. රාමසාන් සමයේදී බංග්ලාදේශයේ රොහිංගියා සරණාගතයින්ට ආගමික වත්පිළිවෙත් පිරීම පිණිස ආපසු යෑම සම්පූර්ණ වශයෙන්ම ආගමික හා සංස්කෘතිසමය වශයෙන් වැදගත් බව සළකා මුළුමනින්ම නවත්වනු ලැබේ.

## කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ මූලික වගකීම්.

- **සැළසුම් රැස්වීම :** සමෝධානිත කණ්ඩායම සමග කඳවුරු කළමණාකරන ඒජන්සිය මගින් නිතිපතා රැස්වීම් පැවැත්විය යුතුය.
- **ප්‍රවාහන පහසුකම් :** ප්‍රවාහන පහසුකම් සැපයිය හැකි සැපයුම්කරුවන් හඳුනා ගත යුතුය.
- **නැවත පදිංචි කිරීම/මව් රටවල් සමග සම්බන්ධීකරණය :** යලි පදිංචි කිරීමේ රටවල නියෝජිතයින් හෝ ලිපිලේඛන සැකසීම සඳහා වන ආරම්භක රටවල, වෛද්‍ය අවශ්‍යතාවන් සැලසීම සහ ගමනා ගමන විධිවිධාන සම්බන්ධයෙන් නිර්දේශ කරනු ලැබේ.
- **සත්කාරක රජය සමග සම්බන්ධීකරණය :** අවශ්‍ය වන විට හමුදමය රැකවරණය සංචලනයේදී හා කඳවුරු වසා දැම්මේදී සහභාගිත්වය සඳහා සත්කාරක රජය සමග සම්බන්ධීකරනය කළ යුතු
- **සන්නිවේදන පහසුකම් :** සංචලනයේදී රැකවරණ සන්නිවේදන පහසුකම් සහ උපකරණ ලබාදීම සහතික වීම වැදගත් වේ.
- **සංස්කෘතික සංවේදී උප ලේඛන :** සංචලන උපලේඛන ගත කිරීම් සංස්කෘතික සම්ප්‍රදායයන්, විශේෂ නිවාඩු සහ කඳවුරු ප්‍රජාවගේ සිද්ධි සංවේදීව කළ යුතු බව සහතික කිරීම අවශ්‍යය.
- **සවිස්තරාත්මක සැළසුම් සංවිධානය සහ සැපයුම් :** කණ්ඩායම මගින් සවිස්තරාත්මක සැළසුම් සංවිධානය සහ ඉන්ධන සැපයුම, ආහාර, සිය රට යැමේ කට්ටල ආදිය පිළිබඳ තොරතුරු ලේඛන පවත්වා ගැනීම කළ යුතුය.
- **ජංගම සායන :** අවශ්‍ය අවස්ථාවන්හි ජංගම සායන සහ ජලය ලබා දෙන ස්ථාන පිහිටුවිය යුතුය.

## ඉවත් වූ ව්‍යුහයන්/පහසුකම්/ද්‍රව්‍ය/උපකරණ පිළිබඳ අනාගත ප්‍රයෝජනය

අනාගත ප්‍රයෝජනය : කඳවුරකින් ඉවත් වූ පසුව සාමාන්‍යයෙන් ද්‍රව්‍ය සහ පහසුකම් තව දුරටත් ප්‍රයෝජනයට ගත හැකිය. සම්ප්‍රදයයක් වශයෙන් කඳවුරක් වසා දැමූ පසුව සමහරක් ද්‍රව්‍ය සහ පහසුකම් තබා යෑම පිළිබඳව නීතිය අවබෝධාතා ගිවිසුමක් ඇත්සන් කිරීම සාමානය පිළිවෙතය. එවන් දේපල සහ වත්කම් වල අයිතිය හඳුනා ගැනිම සහ ප්‍රතිපත්තිය සකසා තීරණය කළ යුතුවේ.

කැම්බෝඩියාවේ දේශ සීමාවේ කඳවුර 2003 වසා දමන අවස්ථාවේ දී කඳවුරු කළමනාකරණ කණ්ඩායම විසින් සමහරක් ව්‍යුහ, ගබඩා මධ්‍යස්ථාන වශයෙන් තැබීමට තීරණය කරනු ලැබුවේ තවදුරටත් ඇතුල් වීමට ඉඩ ඇති නිසාය. ඊට අමතරව කඩින් කඩ එම කඳවුරින් ජනයා පිටමන් කිරීමේදී කඳවුර කළමනාකරණය/එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් ප්‍රධාන ඒජන්සිය සහ කඳවුරු කළමනාකරණ කණ්ඩායම එක වරම දැරීම නිසා ප්ලාස්ටික් තහඩු, නිල් කැන්වස් රෙදි, උණ බම්බු සහ තවත් සැහැල්ලු ද්‍රව්‍ය ගම්වාසීන්ට දෙනු ලැබුවේ ඇගයීමක් සහ ඔවුන්ගේ සත්කාරයට ගරු කිරීමක් ලෙසය.

සාමාන්‍යයෙන් රජයන්ට මෙවන් දේ මෙහෙයවීමට මෙවන් දෙපාර්තමේන්තුවක් තිබෙන අතර, මේ අවස්ථාවලදී කඳවුරු කළමනාකරණ ඒජන්සිය මගින් රජය හෝ සත්කාරක ප්‍රජාව සමග සම්බන්ධීකරණ කිරීමට කෙනෙකු පත් කරනු ලැබේ.

**පෝරම, ගිවිසුම සහ ඔප්පු :** ව්‍යාපෘතියේ බලපෑම නිරීක්ෂණය කිරීම සඳහා මේවා කල් ඇතිව සූදනම් කළ යුතුය.

**ප්‍රදානය කරණ ද්‍රව්‍ය ලේඛනය/අළෙවි කරණ ලේඛනය සහ ප්‍රතිලාභීන්ගේ ලේඛනය :** ප්‍රදානය කරන ලද ද්‍රව්‍ය / උපකරණ වල සම්පූර්ණ ලැයිස්තුවක් තිබිම ප්‍රයෝජනවත්ය. එසේම ප්‍රතිලාභීන්ගේ ලැයිස්තුවක්ද එම කාර්ය සඳහා තිබිය යුතුය. වෙන්දේසි කිරීමට ඇති ද්‍රව්‍ය ලේඛනයක් ද වෙනම සූදනම් කළ යුතුය.

අවබෝධතා ගිවිසුමේ දැක්වෙන පරිදි පිලිපීනයේ ඉවත් වූ පහසුකම්. හමුද බැරැතික ලෙස භාවිතා කරන ලදි. වතුර ලිං ද හමුදවෙවි ප්‍රයෝජනයට පරිත්‍යාග කරන ලිං ද හමුදවේ ප්‍රයෝජනයට පරිත්‍යාග කරන ලද පරිගණක, ජෙනරේටර් සහ වෙනත් කාර්යලිය උපකරණ ධාවන තත්වයේ වාහන සහ ගිලන් රථ ද හමුද වේ සේවය ඇගයීමක් ලෙස පරිත්‍යාග කරන ලදි. එය කඳවුරේ ආරක්ෂාව නවත් වසර ගණනාවක් සහතික කිරිමකි.

**කොල්ලකෑම/ පැහැර ගැනීම :** කඳවුර වසා දමන බව ප්‍රසිද්ධ වූ විට සත්කාරක ප්‍රජාවගේ සමහර කොටස් අවස්ථාවෙන් ප්‍රයෝජන ගනිමින් කොල්ලකෑම සහ කඳවුරේ ද්‍රව්‍ය සහ උපකරණ ගලවා ගෙන යෑමට ඉඩ ඇති හෙයින් ආරක්ෂාව සැළසිය යුතුය.

## කඳවුර කළමනාකරණ කණ්ඩායමේ මූලික වගකීම්

- **ප්‍රදානයන් :** කණ්ඩායම මගින් ප්‍රදානය කිරීමට නියමිත ද්‍රව්‍ය, උපකරණ, පහසුකම් සහ ව්‍යුහ හඳුනාගත යුතුය.
- **තබා ගත යුතු උපකරණ :** කණ්ඩායම විසින් ද්‍රව්‍ය, උපකරණ, සහ ව්‍යුහ ගබඩාකර තබා ගත යුතු, හැකි දේවල්, යම් ආපසු පැමිණීමක් සිදු වුවහොත් ගැනීම සඳහා හඳුනා ගෙන තිබිය යුතුය.

- **ප්‍රතිලාභීන්ගේ ලේඛනය :** ද්‍රව්‍ය, උපකරණ, ව්‍යුහ තබා ගිය ප්‍රතිලාභීන් හඳුනා ගෙන ලේඛනයක් පිළියෙල කිරීම වැදගත් වේ. සත්කාරක ප්‍රජාව ද ඇතුළත් කළ යුතුය.

- **භාර දීමේ ලේඛන :** කණ්ඩායම මගින් අවශ්‍ය කරන භාරදීමේ ඔප්පු සහ ලිපි ලේඛන පිළියෙල කළ යුතුය.

- **රාත්‍රී මුරකිරීම :** කඳවුර ආරක්ෂක නිලධාරීන් සහ ස්වේච්ඡා සේවකයින් අතර අවතැන් වූවන්ට ආරක්ෂාව සඳහා වන වැලැක්වීමේ පිළියමක් ලෙස රාත්‍රී මුර සේවා සම්බන්ධීකරණය වැදගත් වේ.

- **වෙන්දේසියේ වෙළඳාම :** ප්‍රකාශිත අරමුණු සඳහා ද්‍රව්‍ය පහසුකම් සහ උපකරණ වෙන්දේසියේ වෙළඳාම සංවිධානය කළ යුතුය.

## පරිසරය

මලමුත්‍ර, වැසිකිලි අප ද්‍රව්‍ය සහ පිටමන් වී යන අය විසින් දමා යන වෙනත් ද්‍රව්‍ය, සත්කාරක ප්‍රජාවට හෝ ඉඩම් හිමියන්ට කරදරයක් නොවන ආකාරයට සිදුවිය යුතු බව සම්බන්ධයෙන් මනා සැලකිල්ලක් දැක්විය යුතුය. මලමුත්‍ර සම්බන්ධයෙන් ක්‍රියා කිරීම මග හැරිය හැක්කේ (මැලේරියා සහ ජලයෙන් බෝවිය හැකි වෙනත් රෝග කාරකවලට එරෙහිව) එවැනි වලවල් පිරවීමෙන් පුනරුත්ථාපනය කිරීමෙන් සහ / හෝ අනතුරු හැඟවීමේ සංඥා පුවරු යෙදීමෙන් දිරිමත් කිරීම මගිනි.

අසල්වැසි ප්‍රජාවට ප්‍රදානය කිරීමට හඳුනා ගනු ලබන වෙනත් කඳවුරු ව්‍යුහයන්, කුටි, ද්‍රව්‍ය හා ගොඩනැගිලි ආදිය නියමාකාරව බාරදීමේදී උත්සවයක් පැවැත්විය හැකිය. භාරදීමේ උත්සවයට ස්වදේශීය නායකයින් සහ බලධාරීන්ගේ සහභාගීත්වය ලබා ගැනීම වැදගත් වේ.

## කඳවුර කළමනාකරණ කණ්ඩායමේ මූලික වගකීම්

**පුනරුත්ථාපනය :** අත්හැර දමන ලද කඳවුර පුනරුත්ථාපනය කිරීමට සත්කාරක ප්‍රජාව සමග විධිවිධාන යෙදීමට සම්බන්ධීකරණය කරමින්, සැලසුම් කිරීමට කණ්ඩායම ක්‍රියා කළ යුතුය.

**අපේක්ෂිත උපාය මාර්ග සැළසුම :** අත්හැර දමන ලද කඳවුර පුනරුත්ථාපනය කිරීමට අදාල කටයුතු පවත්වා ගෙන යැමට හැකි කොන්ත්‍රාත්කරුවන් හඳුනා ගෙන කඳවුර වැසීමෙන් පසුව ඇතිවන පාරිසරික කරුණු සම්බන්ධයෙන් සවිස්තරාත්මක සැලැස්මක් පිළියෙල කිරීමට නිර්දේශ කරනු ලැබේ. (මලමුත්‍ර ඉවත් කිරීම, ගස් වැවීම, සොහොන් බිම් සුරකීම)

**සුමට භාරදීම :** ද්‍රව්‍ය සහ පහසුකම් ප්‍රදානය ලබන්නා වූ ස්වදේශීය ප්‍රජාව (අදාල වන පරිදි) වෙත ද්‍රව්‍ය / පහසුකම් සුමටව භාරදීමේ මාර්ග ලෙස ක්‍රියාකාරී වන්නන් වූ මූලික ප්‍රජා ප්‍රතිලාභීන් සහ නායකයින් හඳුනා ගැනීම වැදගත්වේ.

**සත්කාරක ප්‍රජාවට සන්නිවේදනය:** සත්කාරක ප්‍රජාව දැනුවත් කොට ඔවුන්ගේ කරුණාව සහ සහයෝගය ලබා ගැනීම සඳහා පුවත්පත් සාකච්ඡා සහ පුවත්පත් නිවේදන කණ්ඩායම විසින් කළ යුතුය.

**පක්ෂපාතිව කථා කිරීම සහ ලොබි කිරීම :** ප්‍රතිපත්ති සකසන්නන් සහ ස්වදේශිය අධිකාරීන් සමග පක්ෂපතිව කතා කිරීම සහ ලොබි කිරීම මගින් සරණාගතයින් සහ අවතැන් වුවන්ගේ නෛතික අයිතිවාසිකම් කණ්ඩායම මගින් තහවුරු කළ යුතුය.

**භාරදීමේ උත්සව :** සත්කාරක ප්‍රජාව, අධිකාරී නියොජිතයන් හා අමුත්තන්ද ඇතුලුව භාරදීමේ උත්සවයක් සංවිධානය කිරීම වැදගත් වේ.

# මෙවලම් කට්ටලය

***කඳවුරු කළමනාකරුවන් සඳහා තොරතුරු පිරික්සීමේ සවිස්තර ලේඛනය***

විවිධ මාර්ග සහ ක්ෂේත්‍ර පලපුරුද්ද මුල් කරගෙන කඳවුරු කළමනාකරණ ව්‍යාපෘතිය මගින් කඳවුරක් වැසීමට පෙර තොරතුරු පිරික්සා බැලීමේ කාර්ය ලේඛනයක් සකසා ඇත.

***එක්සත් ජාතින්ගේ ස්වේච්ජාවෙන් ආපසු සිය රට යෑමේ ත්‍රෛ පාක්ෂික ආදර්ශක ගිවිසුම (පොදු නෛතික උපදේශන අංශය)***

මෙය ආරම්භක රට, රැකවරණය සළසන රටේ ආණ්ඩුව සහ ස්වේච්ජාවෙන් සියරට යන සරණාගතයින් සඳහා වන පිළිවෙත් සහ තත්ත්වයන් ගැන එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස්වරයා යන තෙපක්ෂය අතර ගිවිස ගන්නා වු ආදර්ශක ගිවිසුමකි.

## අවශ්‍ය කියවීම් සහ සමුද්දේශ

- එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්, 1999. සරණාගතයින් සුරකිම, රාජ්‍ය නොවන සංවිධාන සඳහා ක්ෂේත්‍ර මග පෙන්වීම.
- මානව හිමිකම් අප්‍රේල් 2002, "මොන්ටැග්නාඩ්ස්" මැඩ පැවැත්වීම.
- ජේ. හතවේ 1991, සරණාගතයින්ගේ තත්ත්වය පිළිබඳ නීතිය.
- ආර්. එලින්සන් 1993, ජගත් ව්‍යසනයන්
- එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් එක්ව නොආ, රැකවරණය අපේක්ෂිත කුඩා දරුවන් සම්බන්ධව කටයුතු කිරීමේදී ගත යුතු ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්ති අත්පොත.
- එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් 1991, සරණාගත කාන්තාවන් සුරකිම පිළිබඳ ප්‍රතිපත්ති
- 2003, ආරක්ෂාව සඳහා න්‍යාය පත්‍රය
- 1998, අභ්‍යන්තර අවතැන්වීම පිළිබඳ මග පෙන්වන ප්‍රතිපත්ති.
- 1997, නැවත පදිංචි කිරීමේ අත්පොත
- අන්තර්ජාතික ගලවා ගැනීමේ කමිටුව, වාර්ෂික වාර්තාව 2000/2001
- 2003 භූමිය, නිවාස සහ දේපල
- සී. අබිරාජ්/රම්රු, ඪකා, 2002 මායිමේ, සරණාගතයින්, සංක්‍රමනිකයින් සහ සුළු ජාතීන්.
- එම්නෙස්ටි ඉන්ටර්නැෂනල්, 2003, EUR/46/094/2003 පුවත් සේවාව අංක 276 - IASC 2002. සෙවණ දෙන ගස වැඩුම, මානව හිතවාදී ක්‍රියා මගින් අසිතිවාසිකම් සුරකිම.
- එන්. කෙලි/ජාත්‍යංතර රාජ්‍ය නොවන සංවිධාන, කාන්තාවන් වෙනුවෙන් ක්‍රියාකාරි කණ්ඩායම 1998. සරණාගත කාන්තාවන් සමග ක්‍රියාකිරීම. ප්‍රායෝගික මග පෙන්වීමක්.
- UNHCR 1996, ස්වේච්ඡාවෙන් සියරට යෑමේ අත්පොත. ජාත්‍යංතර සුරකිම.

- www.unhcr.ch
- www.theirc.org
- www.hrw.org
- www.savechildren.org.uk

# කඳවුරු කළමනාකරුවන් සඳහා හරි වැරදි බැලීමේ ලේඛනය

## සංචාලනයට පූර්ව

- ☐ ස්වේච්ඡාවෙන් සියරට යෑමේ දී පවුලේ එක්සත් බව පිළිබඳ ප්‍රතිපත්තිය සුරැකී ඇද්ද?
- ☐ ආපසු යෑමට අදාල වන තොරතුරු ආසන්නම දිනට, කඳවුරු ප්‍රජාවට ලබා ගැනීමට පුලුවන්, තොරතුරු මධ්‍යස්ථාන තිබේ ද?
- ☐ සියරට යෑමට අදාල වන සාර්ථක තොරතුරු සහ උපදේශන වැඩසටහන් තිබේ ද?
- ☐ අවදානමට ලක් වුවන් සඳහා විශේෂිත අවස්ථා තිබේ ද?
- ☐ සියරට යන පවුල්වලට සහ දරුවන්ට අවශ්‍යතා සපුරා ගැනීමට සහායක සමාජ සේවාවන් තිබේ ද?
- ☐ දේශ සීමාවෙන් එහා එක්ව නොආ දරුවන් හා අවදානමට ලක්වූවන්ට ප්‍රමාණවත් සුරකුමක් තිබේ ද?
- ☐ ආපසු යන්නන්ගේ දරුවන්ට පාසල්වලට ඇතුළත් වීමට සහතික වේ ද?
- ☐ ආපසු යන්නන්ට ඔවුන්ගේ භූමිය, නිවාස සහ දේපලවලට යලි ඇතුල්විය හැකි ද?
- ☐ ආපසු යන ප්‍රදේශය බිම්බෝම්බ සහ ගවේෂණය නොකළ ආග්‍රපනත් වලින් නිදහස් ද?

## වෛද්‍ය

- ☐ අසනීප හෝ වෛද්‍ය ආධාර අවශ්‍ය අය/ගමනේ යෙදෙන අතර අවශ්‍ය විශේෂ විධිවිධාන හඳුනා ගැනීම් වස් වෛද්‍ය පරීක්ෂණ කරන ලද ද?
- ☐ සියරට යෑමේ වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා සුදුසු පරිපාලන ක්‍රමවේධයක් සකසා තිබේ ද?
- ☐ පුද්ගලයින් සහ පවුලේ වෛද්‍ය තත්ත්වයන් ගැන සහ වෛද්‍ය සේවා රැකවරණ ආපසු යෑමේදී තිබේදැයි පරීක්ෂාවට ලක්කර තිබේ ද?
- ☐ පුද්ගලයින්ට හෝ පවුලේ සාමාජිකයින්ට වෛද්‍ය වාර්තා ලබාදී ඇද් ද?
- ☐ අවදනමට ලක්වූ කණ්ඩායම්වල විශේෂ අවශ්‍යතා (කිරි මවුවරු, එකට නොපැමිණි කුඩාදරුවන් වැඩිහිටියන් ආදිය)

## ආරක්ෂාව / සවිස්තරාත්මක සැළසුම් කිරීම

- ☐ කඳවුර වසා දැමීම පිළිබඳ ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් ප්‍රතිවිරුද්ධතා ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් ගත හැකි ආරක්ෂක හා ආරක්ෂිත අහඹු වැඩ පිළිවෙලක් තිබේ ද?
- ☐ ස්වදේශිය ප්‍රජාවට අවශ්‍ය සංචලන අවශ්‍යතා, ප්‍රවාහන, ජලය, ආහාර, ඉන්ධන ප්‍රමාණවත්ට තිබේ ද?
- ☐ සංචලනයකදි අවශ්‍යවන ආරක්ෂාව සහ වෙනත් ගමන් භාණ්ඩ ප්‍රමාණාත්මකව සපයා තිබේ ද? උදා: ජීවිතාරක්ෂක ඇඳුම්, රෝගින්ගේ මලු සහ ප්‍රථමාධාර කට්ටල ආදිය.

## පරිසරය

- ☐ තබායන ලද පහසුකම් සහ දේපල විකිණීමට/ප්‍රදනයට අදල පෝරම, ගිවිසුම් සහ ඔප්පු සුදනම් වී තිබේ ද?

- ☐ සොහොන් බිම්, මල මූත්‍ර පවිත්‍ර කිරීම, ගස් වැවීම ආදිය වෙනුවෙන් සංරක්‍ෂණයට අදල පරිපූර්ණ සැලස්මක් තිබේ ද?

**භූමිය, නිවාස සහ දේපල :** අර්බුදවලින් අනතුරුව ස්වේච්ඡාවෙන් ආපසු යන පදනම තුළ භූමිය (ඉඩම්) නිවාස සහ දේපල අයිතිය සම්බන්ධයෙන් පහත දැක්වෙන සමහරක් යහ පුරුදු, ඒවාට සෘජුව සම්බන්ධ/සහ/හෝ සාර්ථක පිටත්වීමක් පිළිබඳ ක්‍රමවේද [1] සම්බන්ධ පෙර නිමිති පහළ වූ විට, සුදුසු පරිදි ක්‍රියා කළ හැකිය.

- ස්වේච්ඡාවෙන් ආපසු යෑම සඳහා වන ත්‍රෛපාක්ෂික ගිවිසුම්. ඉඩම්, නිවාස සහ දේපල ගැන තොරතුරු සවිස්තරව ඇතුළත් විය යුතුය. හැකිතාක් දුර පුනරුත්ථාපනය, වන්දි ගෙවීම සහ යලි සංස්ථාපිත කිරීමේ යාන්ත්‍රණය ගැන දැනුවත් විය යුතුය.

- වඩාත් හොඳ, වඩාත් සාධාරණ සහ බෙහෙවින් දරාගත හැකි, ප්‍රතිඵල මත පදනම් වූ මානව හිමිකම් මත පිහිටි පිවිසුමක්, ඉඩම්, නිවාස සහ දේපල ආපසු ලබා ගැනීමේ දී පාදක කර ගත හැකිය.

- පෙර තිබූ දේ ඉල්ලා සිටීමේ ක්‍රියාවලියේදී කඩා වැටුනු නිවාස අළුත් වැඩියාව සහ ප්‍රතිනිර්මාණ කිරීම ඕනෑම ආපසු යැමක දී අත්‍යාවශ්‍ය දෙයක් බවට පත්වේ.

- ද්විතියික පදිංචිකරුවන්ට සම්පූර්ණ වශයෙන් ගෞරව කොට සහ ඔවුන්ගේ සුභසාධනය පිළිබඳවද අවධානය යොමු වේ නම්, ඉඩම්, නිවාස සහ දේපල කරුණු ගැන ප්‍රමාණවත් ලෙසින් වරද නිවරදි කළ හැකිවනු ඇත.

- **පෙර තිබූ දෙයක් ඉල්ලා සිටීමේදී සහ ඉඩම් අයිතිය කාලයා විසින් අනතුරට පත් නොකළ යුතුය. (උදා: ශ්‍රී ලංකා උසාවිය ඒකමතිකව එකඟ වූයේ රැකියාව වසර 10 කට වැඩි කාලයක් සඳහා අත්හිටවුවහොත් අයිතිය අහිමි වන නිතිමය කොන්දේසි අත්හිටුවීමටය.)**

---

1. **මූලාශ්‍රය : භූමිය, නිවාස සහ දේපල, එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් ශ්‍රී ලංකාව, මාර්තු 2003**




**ස්වේච්ඡාවෙන් සියරට යෑමේ ත්‍රෛපාක්ෂික ආදර්ශ ගිවිසුම.**

(ආරම්භක මුල් රට) මේ රජය සහ (රැකවරණය ලබන රට) රජයේ, (මෙයින් පසුව "පාර්ශ්වයන්" යනුවෙන් හඳුන්වන) සහ එක්සත් ජාතින්ගේ සරණාගතයින් සඳහා වන මහ කොමසාරිස් (මින්ව ඉදිරියට "මහකොමසාරිස්" හෝ (UNHCR) යනුවෙන් හඳුන්වනු ලැබේ)

(අ) 1948 ජගත් මානව හිමිකම් ප්‍රකාශයේ 13 (2) වගන්තිය සහ 1966 අන්තර් ජාතික සිවිල් සහ දේශපාලන අයිතිය පිළිබඳ ගිවිසුමේ 12 වන වගන්තියේ අනෙකුත් දේ අතර සියලුම පුරවැසියන් ඔවුන්ගේ රටින් යෑම සහ ආපසු ඒම මුලික අයිතිවාසිකමක් ඇති බව සුරක්ෂිත කොට හඳුනා ගනි.

(ආ) 1950 දෙසැම්බර් 14, එක්සත් ජාතින්ගේ මහා සභාවේ 428 (V) යෝජනාවට යොමු කරමින් පිළිගන්නා ලද එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස් වරයාගේ (UNHCR) ව්‍යවස්ථාව මගින් සරණාගතයින්ට ජාත්‍යංතර රැකවරණය ලබාදිම සහ සරණාගතයින්ගේ ගැටළුවලට ස්ථිර විසඳුම් සොයා ගැනිම, අනෙකුත් දේ අතර ස්වේච්ඡාවෙන් සියරට යෑම ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැළසීම සහ ඔවුන්ගේ මුල් රට සමග සමෝධානගතවීම මහකොමසාරිස්වරයාගේ කටයුතුවලට ආරෝපනය කරනු ලැබ ඇත.

**(ඇ) ස්වේච්ඡාවෙන් සියරට යෑම අවබෝධ කර ගනිමින් ප්‍රයෝගික වන අවස්ථාවන්හි දී, සරණාගතයින්ගේ ප්‍රශ්නවලට කල් පවත්නා, අපේක්ෂිත විසඳුමක් සංස්ථාපනය කිරීම සහ එම විසඳුම් වලට අවධානය යොමු විය යුත්තේ සරණාගතයින් ආපසු සිටරට යැවිය යුත්තේ ආරක්ෂිත තත්ත්වයන් හා ගෞරවනිය ලෙස සලකාය.**

(ඈ) මහ කොමසාරිස්වරයාගේ විධායක කමිටුවේ වැඩසටහන ස්වේච්ඡාවෙන් සියරට යන සරණාගතයින් පාලනය වන ජාත්‍යංතරව පිළිගත් ප්‍රතිපත්ති සහ ප්‍රමිතින් 18 (XXXI) සහ 40 (XXXVI) තින්දු ගැන සඳහන් කරමින් :

(ඉ) අවසාන සාමයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් පදනම දැමූ, ජාතික ඒකාබද්ධතාවය, ප්‍රතිසන්ධානය සහ (මුල් රටේ) සමාජ සහ ආර්ථික සංවර්ධනය සහ ...................... සමග .................................. අත්සන් කරන ලද දේශපාලන විසඳුම හෝ සාම ගිවිසුම කෙරෙහි අවධානය යොමු කරමින් :

(ඊ) ස්වේච්ඡාවෙන් සියරට යැම සඳහා වන, අනුගමනය කළ යුතු යෝජිත පිළිවෙල සහ නිශ්චිත ක්‍රියාමාර්ග සහ ආනුසංගික ප්‍රත්‍යානුකලනය (මුල් රටේ) ...................... සරණාගතයින් (රැකවරණය සළසන රටේ) එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස්වරයා හරහා ජාත්‍යංතර ප්‍රජාවගේ සහයෝගය ලැබෙන පරිදි ලබා ගෙන, සුදුසු අවස්ථාවලදී එක්සත් ජාතීන්ගේ වෙනත් ඒජන්සි සහ ජාත්‍යංතර සහ රාජ්‍ය නොවන සංවිධානවල සහාය ඇතිව අර්ථ කථනය කිරීමේ අවශ්‍යතාව අවබෝධ කර ගනිමින්.

***පහත දැක්වෙන පරිදි එකගත්වයට පැමිණ සිටී.***

## 1 වගන්තිය
## අර්ථ දැක්වීමේ

**මෙම ගිවිසුමේ කාර්ය සාධනය සඳහා**

1. සරණාගත යන වචනයේ යම්.......................... පුරවැසියෙකු, ( මුල් රටේ ජාතිකත්වය පිළිබඳ නීතිය මගින් අර්ථ දක්වා ඇති පරිදි) රටෙන් පිටත වෙසෙන්නෙකු (උපන් රටෙන් බැහැර) සරණාගතයෙකු ලෙස (රැකවරණය ලබන රටක) අදහස් කෙරේ.

2. මෙම වගන්තියේ 1 උප. ඡේදයේ විස්තර කෙරෙන පරිදි ආපසු යන්නා යන වචනයෙන් අදහස් වන්නේ යම් සරණාගතයෙක් මේ ගිවිසුම යටතේ ස්වේච්ඡාවෙන් (උපන් රට) ආපසු යන්නෙකු සම්බන්ධයෙනි.

## 2 වගන්තිය
## ත්‍රෛ පාක්ෂික කොමිසමක් පිහිටුවීම

ස්වේච්ඡාවෙන් සියරට යන්නන්ගේ ................ සරණාගතයින් (රැකවරණය ලබන රට) කොමිසමක් එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස් සහ පාර්ශවකරුවන් විසින් මෙයින් පිහිටුවනු ලැබේ.

## 3 වගන්තිය
## කොමිසමේ සංයුතිය.

1. කොමිසම සාමාජිකයින් තුනකින් සමන්විත යුතුය. එකිනෙක පර්ශ්වයන් සහ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් විසින් සමාජිකයෙකු පත් කරනු ලබයි.

2. කොමිසමේ යම් සාමාජිකයෙකුට රැස්වීම්වලට තමන්ගේ උපදේශකයින් සමග පැමිණිය හැකි වේ.

3. යම් සාමාජිකයෙකුට කොමිසමේ කටයුතුවලට පැමිණීමට නොහැකි වේ නම් එම සාමාජිකයාට ආදේශකයෙකු නම් කළ හැකිය.

## 4 වගන්තිය
## කොමිසමේ මෙහෙවර සහ ක්‍රියාකාරීත්වය

කොමිෂම මගින් සලකා බලා සහ එකඟවී හෝ පාර්ශ්වකරුවන් සහ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස්, එම කරුණු හෝ පියවර ගැන අවශ්‍ය පරිදි ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ස්වේච්ඡාවෙන් සියරට යන .................. (රැකවරණය ලබන රට) සරණාගතයින්ට උපදෙස් දෙනු ලැබේ.

## 5 වගන්තිය
## කොමිසමේ රැස්වීම්.

1. කොමිසමේ රැස්වීම් අවශ්‍ය වන පරිදි එම ස්ථානවල එකඟත්වය ඇතිවූ පරිදි පැවැත්විය හැකිය.
2. කොමිසම මගින් එහි නිති සහ ක්‍රියාමාර්ග සකසා ගන්නවා ඇත.

## 6 වගන්තිය
## යථායෝග ත්‍රයිපාක්ෂික ගිවිසුම්/සම්බන්ධිකරණය

අදල පාර්ශ්වකරුවන් විසින් ඔවුනොවුන්ගේ නිලධාරීන් තානාපති කාර්යාලවලදී (මුල් රටවල අගනුවර වල) සම්බන්ධිකරණ නිලධාරීන් නම් කරනවා ඇති අතර සහ (රැකවරණ සළසන රටේ අගනුවරවලදී) යථායෝගි පරිදි බලාපොරොත්තු නොවූ ක්‍රියාකාරී කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට බලය දෙනවා ඇත.

## 7 වගන්තිය
## ස්වේච්ඡාවෙන් සියරට යෑමේ ස්වභාවය

පාර්ශ්වකරුවන් සහ එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස්වරයා මෙයින් යලි අවධාරනය කරන්නේ .................... සරණාගතයින් (රැකවරණය ලබන රට) සියරට යෑම සිදුවන්නේ ඔවුන්ගේ නිදහස් අදහස් හා කරුණු පිළිබඳ සම්පූර්ණ දැනුවත් කම ඇතිව බවය. ඒ අනුව මෙම ගිවිසුමේ දැක්වෙන තත්වය අනුව ස්වේච්ඡාවෙන් සියරට යෑමට තිරණය නොකරන ........................ සරණාගතයින් අදල ජාත්‍යංතර රැකවරණ ප්‍රතිපත්ති සහ ප්‍රමිතින් වලින් පාලනය වන තත්වයන් පවත්වා ගෙන යනවා ඇත.

## 8 වගන්තිය
## ගමනාන්තය තෝරා ගැනීමේ නිදහස

පාර්ශ්වකරුවන් සහ එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්වරයා සරණාගතයින්ට නිදහසේ ආපසු යෑමට, සහ පදිංචියට, ඔවුන්ගේ කලින් පදිංචිව සිටි ස්ථානවල හෝ ඔවුන්ගේ මනාපය අනුව තොරා ගන්නා තැනක (මුල් රටේ) නැවැතිමට යලි යලිත් කියා සිටි.

## 9 වගන්තිය
## ආරක්‍ෂා සහිතව සහ ගෞරවාන්විතව ආපසු යෑම

1. පාර්ශ්වකරුවන් සහ එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්වරයා එකඟ වන්නේ ස්වේච්ඡාවෙන් සියරට යන ...................... සරණාගතයින්ගේ ආපසු යෑමට දයකවන තත්වයන් සුරක්‍ෂිතව සහ ගෞරවාන්විතව අවසාන ගමනාන්තයට (මුල් රටේ) ඉඩ ලැබෙන්නේ නම් පමණි.

2. (රැකවරණය සළසන රටවල්) රජය විසින් සියරට යන සරණාගතයින්ගේ ආරක්‍ෂාව සහ රැකවරණය පිළිබඳ වගකීම තබා ගන්නේ නම් (රැකවරණය සලසන රටේ) කඳවුරු ද, රැඳී සිටින තැන්ද, කොන්වොයි සංචලනය වන මාර්ගයේ දී ද, නියම කරන ලද දේශ සීමාවේ තැන්වල ද (මුල් රටේ) රජය විසින් ආපසු යන්නන්ගේ ආරක්‍ෂාව සහ රැකවරණය එම රට (මුල් රට) තුළ දී සුරැකීමේ වගකීම දැරිය යුතුය.

## 10 වගන්තිය
## ආපසු ගිය විට සහතිකවීම

1. (මුල් රටේ) රජය විසින් අනෙකුත් අදල පාර්ශ්වකරුවන් සමග, පොදු සමාවදීම්, විධිමත් සහතිකවීම් හෝ පොදු සහතිකවීම් සරණාගතයින් ස්වේච්ඡාවෙන් බියකින් තොරව, කරදර හිරිහැර කිරීම්වලින් තොරව, තර්ජනය කිරීම්වලින් තොරව, වධ හිංසාවකින් තොරව, පැමිණිලි කිරීමකින් තොරව හෝ කිසියම් දඬුවමකට පියවර ගැනීමකින් තොරව, ඔවුන්ගේ යෑම හෝ හේතු කොට හෝ රටින් පිටව සිටීම (මුල් රටින්) හේතු කොට සිදු නොවන බවට කරුණු ඉදිරිපත් කළ යුතුය.

2. ආපසු යන්නන් අදල නියමයන් ගෙන්, යම් පොදු සමාවකින් හෝ (මුල් රටේ) බල පැවැත්වෙන දයා සම්පන්න නීතිවලින් ප්‍රතිලාභ ලැබිය යුතුය.

3. (මුල් රටේ) රජය මගින් ආපසු යන අයට ඉඩම්වල පදිංචියට සහ පරිහරණයට, ජාතික නීතියට අනුව ඉඩ ඇති බව සහතික විය යුතුය.

4. (මුල් රටේ) රජය විසින් හැකි තාක් දුරට නැවත ලබා ගැනීම සහ/හෝ ආපසු යන්නන්ට, පෙර තිබූ වරප්‍රසාද ඉඩම් හෝ වෙනත් චංචල නිශ්චල දේපල, නැති වූ හෝ දමා ගිය, ආපසු ලබා දීමට කටයුතු කළ යුතුය.

## 11 වගන්තිය
## නෛතික තත්ත්වයන් සහ සමානාත්මතාව

(මුල් රට) රජය .................. ආපසු යන සරණාගතයින් (රැකවරණය ලැබූ රටේ) උත්පත්ති, මරණ, විවාහ, දික්කසාද ද ඇතුළු නෛතික තත්ත්වයක් ආරක්‍ෂා කර දිය යුතුය. (මුල් රටේ) රජය අදාලවන පරිදි අධ්‍යාපනය පිළිබඳ සමානාත්මතාව සහ වෘත්තිය දක්‍ෂතා ඩිප්ලෝමා සහ සහතික පත්‍ර (රැකවරණය ලැබූ රටේ) සිටින අතර සරණාගතයින් විසින් ලබා ගන්නා ලද දේ පිළිගැනීම සඳහා සහතිකවීමට වග බලා ගත යුතුය.

## 12 වගන්තිය
## එක්සත් ජාතින්ගේ මහ කොමසාරිස්වරයාගේ

අධීක්‍ෂණ මෙහෙවර : එක්සත් ජාතින්ගේ මහ කොමසාරින්වරයාගේ ප්‍රධාන කාර්ය වන්නේ පහසුකම් සළස්වමින් ස්වේච්ඡාවෙන් ආපසු සියරට යන්නන්ට ආපසු යෑම ස්වේච්ඡාවෙන් සිදුවන බව සහතික වෙමින් සහ සුරක්‍ෂිතව සහ ගෞරවාන්විතව සම්පූර්ණ වශයෙන් පාර්ශ්වකරුවන් විසින් ගරුකටයුතු ලෙස සම්බන්ධකරණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීමය.

## 13 වගන්තිය
## එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් විසින් සරණාගතයින් සහ ආපසු යන අයට ප්‍රවේශවීම

1. ජාත්‍යංතර රැකවනරණය සහ සහායක කර්යයන් සාර්ථකව පවත්වා ගෙන යනු වස් එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්වරයා විසින් නිදහස් සහ බාධා විරහිත ප්‍රවේශයක් සියළුම ............ සරණාගතයින්ට (රැකවරණය සලසන රට) සහ සියලුම ආපසු යන්නන්ට ඔවුන් කුමන ස්ථානයක රඳවා සිටියේ වුවත් (මුල් රට) සලසා දිය යුතුය. එසේම සියළුම සරණාගතයින් සහ ආපසු යන්නන් සඳහා නිදහස් හා බාධා රහිත පිවිසීම එක්සත් ජාතනින්ගේ සරණාගත මහ කොමසාරිස්වරයාට සලසා දිය යුතුය.

2. (මුල් රටේ) රජය විසින් විශේෂිතව, එක්සත් ජාතීන්ගේ මහා කොමසාරින්වරයාට සම්පූර්ණ සහයෝගය සලසා දිය යුතු වන්නේ (UNHCR) ආපසු යන සරණාගතයින්ට මනාව හිතවාදි සහ මානව හිමිකම්, හිමිකම් සත්කාර, මෙම ගිවිසුමේ ඇතුළත් බැඳීම් ක්‍රියාත්මක කිරීමද ඇතුළුව නිරීක්‍ෂණය කිරීමට අවකාශ සැළසිය යුතුය..

3. උප වගන්තියේ 1 සහ 2 උපජේද අනුව එහි ක්‍රියාකාරීත්වයන් එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්වරයාට පවත්වා ගෙන යැමට හැකි වනු වස්, (මුල් රටේ) රජය විසින් සියලුම අත් අඩංගුවට ගැනිම්, රඳවා තබා ගැනිම්, සහ ආපසු යන්නන් මැදිහත් වන නීතිමය කටයුතු එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්වරයාට දැනුම් දිය යුතුය. තවද, මෙම නඩු හබවලට අදාල නෛතික ලියවිලි UNHCR වෙත ලබා දීම වගේම අත්අඩංගුවේ සිටින සහ රඳවා තබා සිටින ආපසු යන්නන් වෙත බාධාවකින් තොරව ප්‍රවේශවීමට අවකාශ දිය යුතුය.

4. මෙම වගන්තියේ 1 පරිච්ජේදය යටතේ UNHCR වෙත සලසා දෙන ප්‍රවේශය, අදාල වන පරිදි රාජ්‍යන්තාර හෝ රාජ්‍ය නොවන සංවිධානවලට UNHCR වල, පාර්ශ්ව වල උපදේශනය ඇතිව, සියරට යැමේ මෙහෙයුම් සංරචක මෙම ගිවිසුම යටතේ සිතා බලා ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම්වලට ඇතුලත්වීමට ඉඩදිය යුතුය.

## 14 වගන්තිය
## ස්වයං සිද්ධ ආපසු යැම

**ප්‍රතිපත්තියක් වශයෙන්, සියලුම සහතිකවීම්, වගකීම් ඉටුකරන බව පොරොන්දුවීම් සහ මෙම ගිවිසුම මගින් දක්වා ඇති වෙනත් දීමනා මෙයින් තේරුම් ගනු ලැබීම සහ මෙම ගිවිසුමෙන් පාලකය වන ස්වේච්ජාවෙන් සියරට යන සරණාගතයින් (රැකවරණය සලසන රට) සහ ඔවුන්ගේම ඕනෑ කමින් සියරට යන සරණාගතයින්ගේ (මුල්රට) මෙන් අදල වන්නේය.**

## 15 වගන්තිය
## තොරතුරු සහ සංවේදීකරන ප්‍රචාරය

1. පාර්ශ්වකරුවන්ගේ සහයෝගය ඇතිව UNHCR මගින් ඔවුන්ගේ ආපසු සියරට යැමට අදල නිරවද්‍ය තොරතුරු ලබාදීමේ අරමුණ ඇතිව වැඩ පිළිවෙලක් සංවිධානය සහ ප්‍රත්‍යානුකලන (මුල් රටේ) කිරීම කළ යුතුය. ඒ මගින් ආපසු යන්නන්ට තීරණ ගැනීමට, සම්පූර්ණ තොරතුරු පිළිබඳ දැනුවත් වන්නේය.

2. (මුල් රටේ) රජය මගින් ආපසු යන අයගේ ආරක්‍ෂාව හා ගෞරවනීය බව ප්‍රත්‍යානුකලනයට උපකාර වන ආකාරයේ තත්ත්වයක් නිර්මාණය කළ යුතුවේ. සංවේදීකරණයට අවශ්‍ය සියලු පියවර ,ගැනීමට සහ සරණාගතයින් සියරට යන ප්‍රදේශයේ සියලුම ප්‍රජාව සුදනම් කිරීම කළ යුතුය.

## 16 වගන්තිය
## සරණාගත නියෝජිතයින් විසින් තොරතුරු සොයා බැලීම සඳහා කරනු ලබන සංචාරය

පාර්ශ්වකරුවන් සහ UNHCR මගින් සහ අවශ්‍යකරණ (මුල් රටේ) සරණාගත ප්‍රජාව අතරින් සියලුම කොටස් නියෝජිතයවන පරිදි තෝරා ගත් නියෝජිතයින් පිරිසකට (රැකවරණ ලබන රටේ) සංචාරය කොට තමන් යැමට අපේක්ෂා කරන ප්‍රදේශයේ පවතින තත්ත්වය ඔවුන් විසින්ම දැක බලා ගෙන ඉන් පසුව (රැකවරණය ලබ රටේ) සිටින සරණාගතයින්ට දැන්වීමට පහසුකම් සැලසිය යුතුය. ඉන්පසුව මෙම සරණාගත නියෝජිතයින්ට (රැකවරණය සලසන රටට) ආපසු යැමට ඉඩදිය යුතුය.

## 17 වගන්තිය
## ලියා පදිංචි කිරීම සහ ලියකියවිලි සැකසීම

ආපසු යැමේ තිරණයේ ස්වේච්ඡා ගති ස්වභාවය අනුව නිල නියෝගයට අනුගාමීව වගකිම සහතික විම අදල පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා කොට UNHCR මගින් වඩාත් සුදුසු ආකාරයට ආපසු යැමට කැමැති සරණාගතයින්ගේ (රැකවරණය සලසන රට) සම්මුඛ සාකච්ඡා සහ ලියාපදිංචි කිරීම කළ යුතුය.

2. නියමාකාරයෙන් සම්පූර්ණ කරන ලද ස්වේච්ඡාවෙන් සියරට යැමේ පෝරම වල ආකෘතිය පාර්ශ්ව සහ අන්‍යෝන්‍ය අවබෝධයෙන් එකඟව සිදුවිය යුතුය. (රැකවරණය සළසන රට) සහ (මුල් රටේ) පාර්ශ්වකරු විසින් වලංගු අනන්‍යතා ලියවිලි ලෙස හඳුනා ගත යුතුය. එසේම සරණාගතයින්ට ඔවුන්ගේ ගමනාන්තය දක්වා (මුල් රට) යැමේ කාර්යට ගමන් ලියවිලි (Travel Document) තිබිය යුතුය.

## 18 වගන්තිය
## පවුලේ සමගිය රැකීම

1. පවුලේ එකමුතුව පිළිබඳ ප්‍රතිපත්තියට අනුව, අදල පාර්ශ්ව සමග සහයෝගය ඇතිව සරණාගත පවුල් එක එකකයක් ලෙස සියරට යන වගට වග බලා ගැනීමට සියලුම උත්සාහයන් දැරිය යුතුය. යම් අයුරකින් එය අසාර්ථක වන අවස්ථාවලදී (මුල් රටේ) යලි එකමුතු කිරීමට ක්‍රමවේදයක් සැකසිය යුතුය.

**2. පවුලේ එකමුතු බව පවත්වා ගනු වස්, සියරට යන සරණාගතයින් (මුල් රටේ) පුර වැසියන් නොවන අඹු සැමියන් සහ/හෝ දරුවන්ට රටට ඇතුළු විමට සහ රැඳී සිටිමට (මුල් රටේ) ඉඩදිය යුතුය. මෙහි දැක්වෙන ප්‍රතිපත්ති මියගිය අයගේ අඹු/සැමියන් නොවන වගේම දරුවන්ටත් (මුල් රටේ) රැඳී සිටිමින් පවුල් සබඳතා පවත්වා ගැනීමට රුචිකර සරණාගතයින්ට ද අදලවේ.**

## 19 වගන්තිය
## අවදානමට ලක්ව සිටින කණ්ඩායම් සඳහා වන විශේෂ පියවර.

පාර්ශ්වකරුවන් සහ UNHCR මගින් අවදානමට ලක්ව සිටින කණ්ඩායම්වලට අවශ්‍ය ප්‍රමාණවත් රැකවරණය, සහාය සහ අවධානය සියරට යන කාලය සහ ප්‍රත්‍යානුකලන ක්‍රියාවලිය පුරාම ලබාදීමට විශේෂ පියවර ගත යුතුය.

## 20 වගන්තිය
## අපරාධකරුවන් මාරු කිරීම

පාර්ශ්වකරුවන් විසින් එකඟවන්නේ (රැකවරණය ලබන රටේ) දේශපාලන නොවන බරපතල වැරදි කරන ලද සරණාගතයින් සහ (මුල් රටේ) උත්සහ කරනු ලැබූ අයෙක් සහ වැරදිකරු වුවෙක් මාරු කළ හැක්කේ, ඔවුන් එසේ කිරීමට කැමැති වේ නම් පමනි. පාර්ශ්වකරුවන් සහ එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස්වරයා එකිනෙකා සමග සහයෝගයෙන් ඔවුන් ප්‍රවාහනය කර භාර දීමට සුදුසු පරිදි විධිවිධාන යෙදිය යුතුවේ.

## 21 වගන්තිය
## නියම කරන ලද දේශසීමා ඉක්ම යෑමේ ස්ථාන

ස්වේච්ඡාවෙන් සියරට යෑම සඳහා වන දේශ සීමා ස්ථාන හඳුනා ගැනිම පිණිස පාර්ශ්වකරුවන් සහ එක්සත් ජාතින්ගේ සරණාගත මහකොමසාරිස් එකග විය යුතුය.

## 22 වගන්තිය
## සංක්‍රමණය, රේගුව සහ වෛද්‍යමය විධි නියම

1. සරණාගතයින්ගේ කඩිනම් ආපසු යෑම සහතික විම සහ ඔහුට අයිති දේවල්, පාර්ශ්වකරුවන් විසින් අදාලව සංක්‍රමණික නියමයන්, රේගුව සහ වෛද්‍ය විධි නියමයන්, රේගුව සහ වෛද්‍ය විධි නියමයන්, සාමාන්‍යයෙන් දේශ සීමාවේ දි අනුගමනය කරන දෑ, දේශ සීමාව හරහා යෑමේ දි අත්හැර දැමිය යුතුවේ.

2. සරණාගතයින්ගෙ පෞද්ගලික හෝ ප්‍රජා දේපල, ගව මහිෂාදීන්ද ඇතුලුව රේගු, සේවා, ගාස්තු හා රේගු බදු වගකිමෙන් නිදහස් කෙරේ.

3. (අදල වේ නම්) පාර්ශ්වයන් විසින් යම් ගාස්තු වගේම මාර්ග හෝ වාහන සඳහා වන වෙනත් බදු හෝ සංක්‍රමණික බදු, නිදහස් කිරීම එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස්වරයා මගින් ආපසු සියරට යෑමේ මෙහෙයුමට අදල රාජ්‍යයන්ගේ අනුග්‍රහය යටතේ සිදුවිය යුතුය.

## 23 වගන්තිය
## සංචලනය සහ එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස්වරයාගේ කාර්ය මණ්ඩලය සහ සම්පත් සඳහා වන ආරක්‍ෂාව

1. පාර්ශ්වකරුවන් විසින් එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස්වරයාගේ සහ ක්‍රියාකාරි පාර්ශ්වයන් මෙන්ම වාහන, සහනසේවා ද්‍රව්‍ය, මෙහෙයුමේ දි භාවිත කරණ උපකරණ රට තුළ රටින් පිටත (රැකවරණය සළසන රට) සහ (මුල් රට) එහා මෙහා ගෙන යෑමට පහසුකම් සැළසිය යුතුය. විශේෂයෙන්ම ඔවුන් විසින් UNHCR ආයතනයට දේශසීමාව දෙපසට ගමන් කිරීමට, පාර්ශ්වයන් සහ UNHCR අන්‍යෝන්‍ය අවබෝධයෙන් සකසා ගත් රටාවක් අනුව සියරට යෑමේ මෙහෙයුම සිදුවන කාලය තුළදී එම කාර්ය මණ්ඩලයට සහ පුද්ගලයින්ට අවසර දිය යුතුවේ.

2. මෙම ගිවිසුම මගින් සළසා ඇති සියරට යෑමේ මෙහෙයුමේ දී නියුතු UNHCR කාර්ය මණ්ඩලයට සහ පුද්ගලයින්ට ආරක්‍ෂාව සහ රැකවරණය ඇතිව ක්‍රියාකිරීමට සුදුසු පරිදි පර්ශ්වකරුවන් විසින් පියවර ගැනිම සහතික විය යුතුය.

## 24 වගන්තිය
## සඟන බඩු බාහිරාදිය, ද්‍රව්‍ය සහ උපකරණ

1. මහා කොමසාරිස්වරයා ඔහුගේ/ඇයගේ උපරිම උත්සාහය යෙදවිය යුත්තේ සියරට යෑමේ මෙහෙයුම සහ ප්‍රත්‍යනුකලනය ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යංතර ප්‍රජාවගෙන් ලබා ගත යුතු සම්පත් ලබාගැනීම සඳහාය.

2. පාර්ශ්වකරුවන් විසින් අදල රාජ්‍ය බදු, තීරු බදු සහ අය බදු, සඟන බඩුබාහිරාදිය,ද්‍රව්‍ය, උපකරණ, සියරට යෑමේ කටයුතු සහ ප්‍රත්‍යානුකලනය මෙහෙයුම සඳහා කලින් තිරණය කරගත් පරිදි ප්‍රවාහන කටයුතු වලින් ඉවත් කළයුතුය.

3. පාර්ශ්වකරුවන් විසින් UNHCR ආයතනය වෙත එක්සත් ජාතින්ගේ සන්නිවේදන උපකරණ, සංඛ්‍යාත සහ ජාල, මෙහෙයුම් අවශ්‍යතාවන්ට අවශ්‍ය වන විටක, වෙනත් සංඛ්‍යාත ලබාදීමට ක්‍රියාකිරීමට බලය ලබාදිය යුතුවේ. උපකරණ සඳහා ලිඛිත අවසරය, සංඛ්‍යාත සහ දේශ සීමා ජාල UNHCR වෙත නිකුත් කළ යුතුය.

## 25 වගන්තිය
## UNHCR ක්ෂේත්‍ර කාර්යාලය

UNHCR මගින් මෙම ගිවිසුමේ ප්‍රකාර වගකිම් සාර්ථකව නිදහස් කිරීමේ කාර්යයේදී අදල රජයේ එකගතාව ඇති ස්ථානවල ක්ෂේත්‍ර කාර්යාල පිහිටුවිය හැකිය.

## 26 වගන්තිය
## වෙනත් ගිවිසුම්වල වලංගු භාවය පවත්වාගෙන යෑම

මෙම ගිවිසුමෙන් දැනට පවතින ගිවිසුම්, විධිවිධාන හෝ පාර්ශ්වයන් සහ UNHCR සමග ඇති සබඳතා මෙහෙයුමට බලපෑමක් නොවන්නේය. නාමිකව දැක් වුවහොත් සරණාගතයන්ගේ ස්වේච්ඡාවෙන් සියරට යෑම සහ ප්‍රත්‍යානුකලනය මෙම ගිවිසුමේ අරමුණු අනුසරනයට සහායවීම, අවශ්‍ය ප්‍රමාණයට නැත්නම් යෝග්‍ය වන ආකාරයට එම ගිවිසුම්, විධිවිධාන හෝ යාන්ත්‍රණයන් මෙම ගිවිසුමේ කොටස් වශයෙන් පැහෙන්නේ නම් විශ්වාසයෙහි පිහිටා කටයුතු කළ හැකිය.

## 27 වගන්තිය
## විරුද්ධවාදිකම් විසඳ ගැනීම

මෙම ගිවිසුම භාවිතයෙන් හෝ අර්ථකථනය කිරීමෙන් පැන නැගෙන යම් ප්‍රශ්නයක් හෝ පැහැදිලිව ප්‍රතිපාදන මෙයින් සපයා නැති නම් මිත්‍රශිලිව පාර්ශ්වකරුවන් සහ UNHCR සමග සාකච්ඡා කිරීමෙන් විසඳ ගත යුතුය.

## 28 වගන්තිය
## බල ගැන්වීම සඳහා ඇතුළත්වීම

පාර්ශ්වකරුවන් සහ UNHCR අත්සන් තැබීමෙන් මේ ගිවිසුම බල ගැන්විය හැකිය.

## 29 වගන්තිය
## සංශෝධන

UNHCR සහ පාර්ශ්වකරුවන් අන්‍යෝන්‍ය එකගත්වයෙන් මෙම ගිවිසුම සංශෝධන කළ හැකිය.

## 30 වගන්තිය
## අවසන් කිරීම

UNHCR සහ පාර්ශ්වකරුවන් අතර අන්‍යෝන්‍ය එකගත්වයෙන් ගිවිසුම අවසන් කරන තුරු මෙම ගිවිසුම බල පැවැත්වේ.

සාක්ෂි වශයෙන් පාර්ශ්වකරුවන් සහ බලය ලත් නියෝජිතයින් විසින් මෙම ගිවිසුමට අත්සන් තබන ලදි.

19 ................ මස ...................... දින ........................ හිදී මුල් පිටපත් තුනකින් යුතුව, ............... භාෂාව (භාෂාවන්) ඉංග්‍රිසි නිල පරිවර්තනය අර්ථ නිරූපන කාර්යයන් සඳහා තබා ගන්න ලදි.

(රැකවරණය සළසන රටේ) රජය වෙනුවෙන්
(මුල් රටේ) රජය වෙනුවෙන්
එක්සත් ජාතින්ගේ සරණාගත මහ කොමසාරිස් වෙනුවෙන්.

## ඇමුණුම 6 :- සමාව දීම සහ සහතිකවීම් පිළිබඳ ප්‍රකාශනයේ ආදර්ශය

**මෙයාකාර මුල් රටේ රජයේ සංකිර්ණ දේශපාලන තත්ත්වයන්ට හේතු කාරක වන පරිදි වගේ ම අනෙක් පාර්ශ්වයන්ගේ අර්බුදයට ද හේතුවිය හැකි බැවින් දෙනු ලබන විශේෂිත තත්ත්වයට අනුකූලවන පරිදි සැකසිය යුතුවේ. එම නිසා පහත දැක්වෙන ආකෘතිය මෙම සිමාවන් තුළ සළකා බැලිය යුතුවේ. අදාල වන පරිදි සහ නියමිත පරිදි පරස්පර විරෝදිතා ඇති සියලුම පර්ශ්වයන් ඒකාබද්ධව ප්‍රකාශනයකට දිරි ගැන්විය යුත්තේ සරණාගතයින් අතර ඒ පිළිබඳ විශ්වාසය වර්ධනය කිරීම උපරිම කරනු වස්ය. එවන් ප්‍රකාශයන් සරණාගතයින් කතා කරන විවිධ ස්වභාෂාවන්ට පරිවර්ථනය කළ යුතු වන බැවින් වාග් ශෛලිය හැකි තාක් දුරට සරල විය යුතුය.**

## සමාවදීම් සහ සහතිකවීම් සම්බන්ධ ආදර්ශ ප්‍රකාශනය

(මුල් රටේ) රජයේ සහ (අදාලවේ නම් පරස්පරතාවට අදාල අනෙක් පාර්ශ්වය/පාර්ශ්වයන්)

........................ සහ ............................ සමග අත්සන් කරන ලද දේශපාලන විසදුම හෝ සාම ගිවිසුම කල්පවත්නා සාමයක්, ස්ථාවරත්වයක් සහ සමාජ ආර්ථික දියුණුවක් (මුල් රටේ) ඇති කරනු ලබන බවට විශ්වාසයක් ජනිත කර ඇත්තේය.

තමන්ගේ රටෙන් බැහැරව සරණාගතයින් ලෙස ජීවත්වන සියල්ලන් ............... ඔවුන්ගේ නිජබිමට පැමිණීමට හෝ රටේ යම් ස්ථානයක පදිංචි වීමට සහ ...................... අනෙකුත් සියල්ලන් සමග ජාතික සමගි ක්‍රියාවලිය සහ සාමය තහවුරු කර ගැනීම, ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජ සංවර්ධනය නිදහස සහ අයිතිය අවධාරණය කරන්නේය.

යුහුසුළුව ස්වේච්ඡාවෙන් ආපසු යන සහ සමෝධානගත වන ................... සරණාගතයින්ගේ ආරක්ෂාව සමග ගෞරවනියත්වය, විශ්වාසය ගොඩනැගීමට පියවර ගැනීම ප්‍රවර්ධනය කිරීමට තවදුරටත් කැමැති වන්නේය.

1. මේනයින්, සියලුම .......... සරණාගතයින් ආපසු සියරට යෑමට සහ තමන්ගේ තෝරා ගැනීම අනුව රටේ කැමැති ස්ථානයක පදිංචිවීමට සහ ජාතික සමගිය ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලියට සම්පූර්ණයෙන් සහභාගිවීම, ප්‍රතිනිර්මාණය, සාමය තහවුරු කිරීම, ප්‍රජාතන්ත්‍රවාදය සහ සමජ, ආර්ථික සංවර්ධනයට, කැඳවීමට, ආරාධනා කිරීම හා උනන්දු කිරීම කරන්නේ ය.

2. පහත දැක්වෙන ද, ප්‍රසිද්ධව ප්‍රකාශ කරන්නේය.

### ආරක්ෂා සහිතව සහ ගෞරවාන්විතව ආපසු යෑම

(අ) ජාත්‍යංතරව පිළිගත් ප්‍රතිපත්තින්ට අනුව ස්වේච්ඡාවෙන් සියරට යෑම සහ සමාජයට යලි එක් කිරීම (ප්‍රත්‍යානුකලනය) ආරක්ෂිතව සහ ගෞරවාන්විත තත්ත්වයන් යටතේ සිදු කරන්නේය.

(ආ) කිසිදු ආපසු යන්නෙකු කිසිම ආකාරයක කරදර හිරිහැරයකට ලක්වීම, තර්ජනයකට අසාධාරණයකට, වධහිංසාවකට හෝ (මුල් රටෙන්) පලා යෑම නිසා කිසියම් දඬුවමකට පැමිණීම සහ (රැකවරණය ලබන රට) සරණාගතයෙකු ලෙස ඉල්ලා සිටීම නිසා සිදු නොවිය යුතුය.

(ඇ) කිසිදු සරණාගතයෙකු කරදර හිරිහැරයකට තර්ජනයට අසාධාරණයකට ලක්වීම වර්ගය ආගම, ජාතිය, හා සමාජ කොඨාශයක සමාජිකයෙකුවීම, දේශපාලන අදහස් දැරීම හෝ ස්ත්‍රී පුරුෂ භාවය නිසා සිදු නොවිය යුතුය.

### සමාව දීම

**(ඈ) සියලුම ආපසු යන්නන්, ඔවුන්ගේ දේශපාලන බැඳීම් නොසලකා හැර, රට හැර යෑමට පෙර හෝ ඒ කාලය තුළ සිදු කරන ලද සියලුම සාපරාධී වැරදිවලට හඬු පැවැරීමෙන් නිදහස් කළ යුතුය. මෙයට (මුල් රට ) හැර යෑම හා අනෙකුත් දේ ඇතුළුව (රැකවරණය ලබන රට) සරණාගතයෙකු ලෙස මුණ ගැසීම, මග හැරීම සහ අත් හැර යෑම මෙන්ම, නොපිළිගත් ජාත්‍යංතර යුද හමුදාවල හමුදා කටයුතුවල නියුතුවීම ද ඇතුළත්වේ. (පැහැදිලිව අර්ථ කථනය කරන ලද විශේෂිත අවස්ථාවන් ඉවත් කිරීමට සිදුවේ උදා : ජාත්‍යංතර මානව හිතවාදී නීති දැඩිව උල්ලංඝනය කිරීම, මිනිස් සංහාරයන් සිදු කිරීම)**

### මානව හිමිකම් සඳහා ගරුකිරීම

(ඉ) අනෙකුත් සාමාන්‍ය පුරවැසියන්ට මෙන් ආපසු එන අයගේ මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම් පූර්ණ ගරුකටයුතු ආකාරයෙන් සැලකිය යුතුය.

**ආපසු එන්නන් නිරීක්‍ෂණය.**

(ඊ) UNHCR සහ (අදාල වන පරිදි වෙනත් ජාත්‍යංතර ඒජන්සි ආයතනයන්ට) අවසර දෙනු ලබන අතර සම්පූර්ණ සහයෝගය ලැබීම ආපසු එන්නේ නිරීක්ෂණය ද ප්‍රකාශනයේ දැක්වෙන ආකාරයට ක්‍රියාත්මක කිරීම, මානව හිතවාදිව ප්‍රමිතින්ට අනුකූලව සලකන්නේදැයි සොයා බැලීමට ඉඩ තිබිය යුතුය.

**භූමියට පිවිසීම.**

(උ) සරණාගතයින්ට භූමියට පිවිසීමට, සහ (මුල් රටේ) නිතියට අනුව කෘෂිකර්මාන්තයට යොදා ගැනීමට ඉඩ තිබිය යුතුය.

**දේපල**

(ඒ) සරණාගතයින් ලෙස ආපසු එන අයට තමන්ගේ ඉඩම් හෝ චංචල, නිශ්චල දේපල, නැතිවූ හෝ දමා ගිය සියල්ලක්ම යලි ලබා ගැනීමට හැකි තාක්දුරට සියලු පියවර යෙදිය යුතුය.

**යුද හමුදාමය සහ වෙනත් බැඳීම් ඇති සේවාවන්.**

(ඔ) ආපසු එන අයට ප්‍රත්‍යානුකලනයවීමට සහාය වීම සඳහා කැපී පෙනෙන යුදහමුදා කටයුතුවලින් හෝ බැඳීම් ඇති සේවාවන්ගේන් වසරක කාලයකට නිදහස් කල යුතුය. හමුදාවෙන් හෝ වෙනත් බැඳීම් සහිත සේවාවන්ගෙන් සම්පූර්ණයෙන් ඉවත්වීමකට ඉල්ලා සිටිය හොත් ඒ පිළිබඳව ධනාත්මකව සලකා බැලිය යුතුය.

දිනය : ..................................................

අත්සන : ..............................................

# කඳවුරු කළමනාකරණ ව්‍යාපෘතිය

කඳවුරු කළමනාකරණ ව්‍යාපෘතිය ( CMP ) සියරා - ලියෝන්හි පිහිටුවන ලද්දේ 2002 ඔක්තෝබර් මාසයේදීය. අළුත්ම සොයා ගැනීම වන්නේ, බටහිර අප්‍රිකාවේ මානව හිතවාදී ඒජන්සි ආයතන, කඳවුරු වැසියන්ට කරන ලද ලිංගික හිංසනයන්ට සම්බන්ධව සිටි බවත් කඳවුරු කළමනාකරණ ක්‍රමවේධයේ වත්මන් අඩු ලුහුඬුකම් ඊට හේතුවූ බවත් පැහැදිලි වන බවයි.

ප්‍රතිචාරයක් වශයෙන්, කුඩා අන්තර් ඒජන්සි ආයතන ක්‍රියාකාරී කණ්ඩායමක්, මානව හිතවාදී කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ කාර්යලයකින් සැදුම් ලත්, එක්සත් ජාතීන්ගේ සරණාගත මහකොමසාරිස් ( UNHCR ) නෝර්විජියානු සරණාගත කවුන්සලය ( NRC ) ජාත්‍යංතර ගලවා ගැනීමේ කමිටුව ( IRC ) සහ සියරා - ලියෝන් රජයේ සමාජ ක්‍රියාකාරීත්වය සඳහා වන ජාතික කමිටුව, ( NASSA ) සියරා ලියෝන්හි ප්‍රිවුන්වලට එකට එක් වුයේ කඳවුරු කළමනාකරණය පිළිබඳ කටයුතු වැඩිදියුණු කිරීම ආරම්භ කිරීම පිණිසය.

සවිස්තරාත්මක මෙහෙයුම් නිර්නායකයන් සහ අවම ප්‍රමිතීන් කඳවුර සැලසුම් කිරීම සම්බන්ධව තිබිය දී කඳවුරට ලබා දෙන ලද ඉදිකිරීම් සහ තාක්‍ෂණික සේවාවන් ක්‍රමවත්ව සහ සාකල්‍යවාදී උත්සාහයක් ඇතිව සමස්ත කඳවුරු කළමනාකරණය කිරීම සඳහා කඳවුරු පිහිටුවීමට තැනක් කතිකා කිරීමේ පටන් අවසන් කිරීම දක්වා කාලය තුළ නොතිබිණි. කඳවුරු කළමනාකරුවන් ඇත්ත වශයෙන්ම කළ යුත්තේ කුමක්දැයි දැක්වෙන සවිස්තර ලේඛනයක්ද නොවිය. කඳවුරක් කළමනාකරණයේ නිර්නායක අභික්ෂාව සිදු වන්නේ කඳවුරේ විවිධ සහාය සහ ආරක්‍ෂක කටයුතු දැනටමත් බහුලත්වයක් ඇති කුමන අංශයේ නිර්නායකයන් මත ද යන්න පැහැදිලි කර ගැනීම අවශ්‍යය. මේ පසුබිම මත කඳවුරු කළමනාකරණ ව්‍යාපෘතිය, කඳවුරු වැසියන් සමග ඔවුන්ගේ හිතේ ඇති හොඳම උනන්දුව සහ සහයෝගිතාවේ ජවය සහ ක්‍රියාවලිය පිළිබඳව උනන්දුවක් දක්වන්නන් බොහෝමයක් අතර තොරතුරු හුවමාරුව සංවර්ධනය කර ඇත.

සියරා - ලියෝන්හි සිදුවූ උපදේශනය සහ කොටසක් වශයෙන් ලයිබීරියාවේ ද අවධානය යොමු කරන ලද්දේ කඳවුරු කළමනාකරණයේ වගකීම්වල ප්‍රධාන අංශ වර්ගීකරණය කරමින් : යහ පුරුදු හඳුනා ගනිමින් සහ කඳවුරු තත්ත්වයන්හිදී උගත් පාඩම් විමසුමට ලක් කරමින් : බොහෝ අවධානයක් යොදනු ලැබ ඇත්තේ කඳවුරු පසුබිමක සරණාගතයින්ට සහ අභ්‍යංතර අවතැන් වුවන්ට දත්ත මාරුකරමිනි. අරමුණ වුයේ කඳවුරු කළමනාකරණය කාරියේ සවිස්තරාත්මක ඉහළ දැක්මක් සංවර්ධනය කිරීම පිණිසය. නමුත් ඒ වගේම කඳවුරු කළමනාකරුවන්ට ඔවුන්ගේ එදිනෙද කටයුතුවලට සහය දැක්වීමට ප්‍රයෝගික සහ යොමු කෙරෙන මෙහෙයුමක් ලබාදීමටය.

අන්තර් ඒජන්සි ක්‍රියාකාරී කණ්ඩායම මගින් එක්රැස් කරන ලද දත්ත සකස් කිරීම කඳවුරු කළමනාකරණ මෙහෙයුම් කට්ටලයේ මුල් කෙටුම්පත විය. 2003 දෙසැම්බරයේ ඔක්තෝබර් දෙසැම්බර් අතර ක්ෂේත්‍ර පිරික්සුමට යවන ලද්දකි. එය කෙටුම්පත් කරන ලද මෙහෙයුම් කට්ටලය ක්ෂේත්‍ර පිරික්සුම සිදු වුයේ ලයිබීරියාව, සියරා - ලියෝන් සහ කොටසක් ඇන්ගෝලාවේදිය. ක්‍රියාකාරී කණ්ඩායම වැඩිපුර ස්ථානවල පිරික්සුමට සැළසුම් කර තිබුණත් කෙටි දැනුම් දීමකින් සාර්ථකව ඉටුකළ හැකි ඒජන්සි සොයා ගැනීම දුෂ්කර බව පැහැදිලි විය. ක්ෂේත්‍ර පිරික්සුම්වල ප්‍රතිඵල නෝර්විජියානු සරණාගත කවුන්සලයට ව්‍යාපෘතිය සම්බන්දීකරණය කිරීම පිණිස ආපසු එවන ලදි. එම පසු පෙවුම් කඳවුරු කළමනාකරණ මෙහෙයුම් කට්ටලයේ දෙවන අදියරේදී සම්බන්ධ කර ගන්නා ලදි.

කඳවුරු කළමනාකරණය ප්‍රාදේශිය මට්ටමින් ආරම්භ කර ජගත් තලයකට එළඹෙන විට ප්‍රධාන අරමුණ අන්තර් ඒජන්සි සහයෝගිත්වය දක්වා පවත්වා ගෙන ගොස් තිබුනි. මේ අතර ඩෙන්මාර්ක් සරණාගත කවුන්සලය ව්‍යාපෘතියට සම්බන්ධවී සිටියේය. OCHA, UNHCR, IRC, NRC සහ DRC නියෝජිතයන් ගෙන් සමන්විත සංස්කාරකවරු කාණ්ඩයක් දැන් කඳවුරු කළමනාකරණ මෙහෙයුම් කට්ටලයේ 18 වන පරිච්ඡේදය විමසුමට ලක්කරමින් සිටියේ නෝර්විජියානු සරණාගත කවුන්සලයේ සම්බනධීකරණයෙනි. තවදුරටත් දෙ දින කඳවුරු කළමනාකරණ සම්මන්ත්‍රණයක් 2004 මාර්තු 3-4 දිනවල ඔස්ලෝහි පවත්වාන්නට යෙදුනි. සහභාගිවූවන් අතර ව්‍යාපෘතියට සම්බන්ධව සියලුම ඒජන්සි ආයතනවල නියෝජිතයන් මෙන්ම නෝර්විජියානු රාජ්‍ය නොවන සංවිධාන සහ සරණාගත පිළිගැනීම් මධ්‍යස්ථාන ද විය. සමුළුවට සහභගිවූවන් අතර මහත් උනන්දුවක් ඇති විය. එසේම මෙහෙයුම් කට්ටලය ගැන අගනා ප්‍රතිචාරයක් ද ව්‍යාපෘතිය වෙත ලබා දෙන ලදි.

කඳවුරු කළමනාකරණ ව්‍යාපෘතියේ ඊළග පියවර වනවා ඇත්තේ ව්‍යාපෘතියේ අනාගත කටයුතු සංවර්ධනය කිරීමේ ක්‍රමවේදයකි. කඳවුරු කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලා සහ මෙහෙයුම් කට්ටලය උපයෝගි කර ගැනීම සඳහා ඉහළම ප්‍රමුඛත්වය හිමිවන්නේය.

කඳවුරු කළමනාකරණ මෙහෙයුම් කට්ටලයේ සංශෝධිත සංස්කරණයක්, කට්ටලය ක්ෂේත්‍රයේ දී ප්‍රායෝගිකව භාවිතයෙන් ලද ප්‍රතිචාර ද සැළකිල්ලට ගෙන 2004 අවසන් වීමට පෙර සකස් කරනවා ඇත.

## උපකාර අනුස්මෘති


කඳවුරු කළමනාකරණ මෙහෙයුම් කට්ටලය සම්පූර්ණයෙන් ම සහයෝගිතා ව්‍යාපෘතියකි. එය කළ හැකි වූයේ මෙහි දැක්වෙන පුද්ගලයින් හා ඒජන්සි ආයතනවලින් ලබා දෙන ලද දයකත්වයන් හේතුවෙනි. කඳවුරු කළමනාකරණ ව්‍යාපෘතිය ලිවීමෙන්, කියවීමෙන්, නවීකරණය කිරීමෙන්, විවේචනය කිරීමෙන්, සංස්කරණය කිරීමෙන්, විචාරයට ලක් කර කට්ටලය පරීක්ෂාවට ලක් කළ හැමෝටම ස්තූති වන්ත වීමට කැමැත්තෙමු.. මෙම ලේඛනයට ඇතුලත් නොකරන ලද අයට, නමුත් මෙම කට්ටලයට ඔවුන්ගේ සහාය දැක්වීමෙන්, ආගන්තුක සත්කාර සහ සහයෝගය දක්වා දයකත්වය දැක්වූ සැමට අපගේ ප්‍රණාමය පළ කිරීමට ද කැමැත්තෙමු.

### පහත දැක්වෙන පුද්ගලයින් උපදේශකත්වය දක්වා ඇත.

**සියරා ලියොන්හි (IA) ක්‍රියාකාරී කණ්ඩායමේ සමාජිකයින්**

සකුරා අත්සුමි ( UNHCR ) ක්ෂේත්‍ර නිලධාරිවරයා : නිනා එම් බ්‍රිකෙලැන්ඩ් නෝර්වේ (NRC) ව්‍යාපෘති උපදේශක : විරිස් බිලිර්ස්, සියරා - ලියෝන්හි (NRC) කඳවුරු කළමනාකරු : ජෙනිපර් ක්ලයින් : සියරා ලියෝන් (IRC) සරණාගත සම්බන්දීකාරක : ඔවුඩා කමාරා: වැඩසටහන් නිලධාරී: මරියා ඈන්ගේ ලාල්ලියර් සියරා - ලියෝන් ( NRC ) වැඩසටහන් කළමනාකරු: සාරා මුස්ක්‍රොප්ට් සියරා - ලියෝන් ( OCHA ) ජ්‍යෂ්ඨ මානව හිතවාදී කටයුතු පිළිබඳ නිලධාරී: එලන් වර්මෙමුලන්, සියරා - ලියොන් ව්‍යාපෘති උපදේශක :

**නෝර්විජියානු සරණාගත කවුන්සලය (NRC) ඇන්ගෝලා**

ලාර්ස් ඇන්ඩර්සන්: නේවාසික නියෝජිත: මතුස් තුනිවික්ස් උතුරු ඇන්ගෝලාවේ ව්‍යාපෘති අධ්‍යක්‍ෂක

**නෝර්විජියානු සරණාගත කවුන්සල (NRC ) ලයිබීරියාව**

ලිප් ශොෂ්ට්ං නේවාසික නියෝජිත: ලාමින් මන්ජන්ග් වැඩ කළමනාකරු සැමුවෙල් ට්‍රේලර් කඳවුරු

කළමනාකරු, ප්‍රැන්ක්ලිං එන් ගොන්ලෙ කඳවුරු කළමනාකරු ජේ. කොලි නොඩෝබෝ කඳවුරු කළමනාකරු බෙන්දු කමාරා ෂෙයිෂෙ කඳවුරු කළමනාකරු, වෝඩි රෝ වැඩ කළමනාකරු.

**නෝර්විජියානු සරණාගත කවුන්සලය (NRC) සියරා - ලියෝන්**

මෙත්තෙ නෝඩ්ස්ට්‍රැන්ඩ්, නේවාසික නියෝජිත: මරියා ඇන්ගේ ලාල්ලියර් වැඩසටහන් කළමනාකරු: එල්ලන් කිසෙ, පරිපාලන සහ මූල්‍ය නිලධාරි: ග්ලෝරියා මැක් කොන්ටෙ ලේකම්: ක්‍රිස්ටෝපර් බිලිර්ස් කඳවුරු කළමනාකරු: පොඩෙ සමුරා මෙහෙයුම් නිලධාරි, ඩවුඩා කමාරා, වැඩසටහන් නිලධාරි.

**නෝර්ජියානු සරණාගත කවුන්සලය (NRC) ජිනිවා**

එලිසබෙත් කේ. රස්මුසොන් නේවාසික නියෝජිත, සිමොනෙ කොස්මා, පරිපාලන නිලධාරි.

**නොර්විජියානු සරණාගත කවුන්සලය NRC ඔස්ලෝ**

ටොරිල් බෙරෙක්කේ, වැඩබලන හදිසි අවස්ථා අධ්‍යක්ෂ: එරික් සෙඩ්රිං වැඩසටහන් සම්බන්ධීකාරක උගැන්ඩා/බුරුන්ඩි/කොංගො: මරිට් සෝහයිම්, වැඩසටහන් සම්බන්ධීකාරක ඇන්ගෝලා/සුඩාන්/කොලොම්බියා, ඔඩ්හිල්ඩ් ගුංතර්, තාක්ෂණ සහාය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ: ටැර්ජි බොඩොගාර්ඩ්, සෙවන උපදේශක, ඇන් බ්‍රිට් හොට්ක් එරික්සන් මහා ලේකම්ගේ සහායක, ලාර්ස් ටොර්ජෙසන් තොරතුරු නිලධාරි: මොනිකා ඩල්සෙන් අලෙවි උපදේශක.

**ජාත්‍යංතර ගලවා ගැනීමේ කමිටුව (IRC) සියරා - ලියොන්**

බ්‍රයන් කොක්ස්, රටේ අධ්‍යක්ෂ, ක්‍රිස්ටිනා කොව්, නියෝජ්‍ය අධ්‍යක්ෂ, හයිඩි ලෙහෙමැන් ලිංගික සහ ලිංගාශ්‍රිත ප්‍රචණ්ඩත්ව වැඩසටහන් සම්බන්ධීකාරක, මාර්ටින්පින් වැන් ඩි රිපිට්, ජලය හා සනීපාරක්ෂක වැඩසටහන් සම්බන්ධීකාරක, බෙත් මාර්ටින්, ලිංගික සහ ලිංගාශ්‍රිත ප්‍රචණ්ඩත්ව වැඩසටහන් කළමනාකරු, ඇන් ෆිට්ස්ජෙරාල්ඩ්, අධ්‍යාපන වැඩසටහන් කළමනාකරු, ඩේවිඩ් වොකර්, අධ්‍යාපන වැඩසටහන් සම්බන්ධීකාරක, කාර්මිල් එල් එවන්ස්, තරුණ වැඩසටහන් කළමනාකරු, ජෙනිෆර් ක්ලයින්, සරණාගත වැඩසටහන් සම්බන්දීකාරක, පීටර් වන්දි සරණාගත අධ්‍යාපන අධීක්ෂක, ටම්බා ගොබොරියා නියෝජ්‍ය අධ්‍යාපන සම්බන්ධීකාරක, ක්‍රිස්ටොෆ් කෘෘට්ස්, වැඩසටහන් සම්බන්ධීකාරක, කෙවින් මැක් නල්ටි, ලිංගික සහ ලිංගාශ්‍රිත ප්‍රචණ්ඩත්ව වැඩ කළමනාකරු.

**එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් (UNHCR) සියරා - ලියෝන්**

සකුරා අත්සුමි ක්ෂේත්‍ර නිලධාරි, ලිං නුගුගි ප්‍රජා සේවා නිලධාරි, මරියා ක්ලවිඩ් බොටිනෙවු ජ්‍යෙෂ්ඨ කලාපිය සෞඛ්‍ය සම්බන්ධීකාරක, මායා අමරතුංග ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි

**එක්සත් ජාතීන් සඳහා වන මානව හිතවාදී කටයුතු සම්බන්ධීකාරක (UNHCR) සියරා - ලියෝන්**

ඩෙනිස් ජොන්සන්, ප්‍රධානි, සාරා මුස්ක්‍රොස්ට් මානවහිතවාදී කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ උපදේශක, කැතරින් ගෙලෙන් කැබිස්, අපචාර සහ උපයෝජන වැළැක්වීමේ සම්බන්ධීකාරක ඇස්ට්‍රිඩ් ඒ ස්ලෙටන් හදිසි ප්‍රතිචාර සම්බන්දීකාරක, ජොන් ටකර්, ක්ෂේත්‍ර සම්බන්ධීකාරක, ඇනට් රොල්ෆ් (GIS) නිලධාරි

**සමාජ ක්‍රියාකාරිත්වය සඳහා ජාතික කොමිෂම NaCSA (සියරා - ලියෝන් රජය)**

සිදි බාහා, සියරට යැම සහ ප්‍රත්‍යාවකලනය පිළිබඳ වැඩසටහන් කළමනාකරු, ජෙනට් මොමොහ්, සියරට යැවීමේ දිස්ත්‍රික් සහ ප්‍රත්‍යාවකලන නිලධාරි, ස්මාර්ට් සෙනෙසි ව්‍යාපෘති නිලධාරි. සියරට යැවීමේ දිස්ත්‍රික් සහ ප්‍රත්‍යාවකලන නිලධාරි ස්මාර්ට් සෙනෙෂි ව්‍යාපෘති නිලධාරි

**ලෝක ආහාර වැඩසටහන (WFP) සියරා ලියෝන්**
මිචෙල් ඉසෙම්ංගර් වැඩසටහන් මෙහෙයුම් නිලධාරි

**සියරා - ලියෝන්හි ලක්කාවල පවත්වන ලද අවතැන් වූ ජනතාව පිළිබඳ කඳවුරු කළමනාකරණ ප්‍රවර්ධනය ගැන වූ අන්තර් ඒජන්සි වැඩ මුළුවට සහභාගී වූවන්, 2003 ජනවාරි 10 - 12**

අබු බකර් ජලොන්, (UNHCR) ක්ෂේත්‍ර සහායක ක්‍රිෂ් බිලියර්ස්, (NRC) කඳවුරු කළමනාකරු, හෙලන් ටෙම්පල්, සමාජ ක්‍රියාකාරිත්වය සඳහා වන ජාතික කොමිෂමේ ලේකම් (NACSA) ජේ. ඩගස්ටින් ටෝ, යුක්තිය සහ සාමය පිළිබඳ කතෝලික කොමිෂම (CJPC) ජේම්ස් එස්. යුකොයි ජ්‍යෙෂ්ඨ (LRRRC) වැඩසටහන් කළමනාකරු ජානටි මොමොජ් (NACSA) බෝ මාරියා ඇන්ගේ ලල්ලියර් (NRC) වැඩසටහන් කළමනාකරු, නිනා එම් බ්‍රික්ලැන්ඩ් (NRC) උපදේශක: සාරා මුස්ක්‍රෝප්ට් (UNOCHA) මානව හිතවාදී කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ නිලධාරි, සිදි බාහ්, (NACSA) යලි පදිංචි කිරීම සහ ආපසු ලබා ගැනීම පිළිබඳ නිලධාරි, තර්ජි බොඩොගාර්ඩ් (NRC) සේවන උපදේශක NRC (ඔස්ලෝ)

**සේවන සහ කඳවුරු කළමනාකරණය පිළිබඳ සහභාගිවන්නන් සඳහා වූ (NRC) වැඩ මුළුව ඔස්ලෝ, නෝර්වේ 2003 මාර්තු 31 අප්‍රියෙල් 4**

**කඳවුරු කළමනාකරණ සහභාගි වන්නන්ගේ පුහුණු සමුළුව ඔස්ලෝ නොර්වේ 2004 මාර්තු 3-4**

පහත දැක්වෙන පුද්ගලයින් සහ සංවිධාන විශේෂයෙන්ම එක් එක් පරිච්ඡේද සැදීම සහ සංවර්ධනය උදෙසා දායක වී සිටි.

**පරිච්ඡේදය 1 : කඳවුරු පිහිටුවීමට පෙර ගිවිසුම්,**

**ජාත්‍යන්තර ගලවා ගැනීමේ කමිටුව (IRC) :** ජෙනිෆර් ක්ලයින්, ගර්ස්හුන් කඳවුරු කළමනාකරු

**නෝර්විජියානු සරණාගත කවුන්සලය (NRC) :** ක්‍රිෂ් බිලියර්ස්, ජෙම්බෙ කඳවුරු කළමනාකරු

**සමාජ ක්‍රියාකාරිත්වය සඳහා වන ජාතික කොමිෂම (NACSA)** සිදි බාහ්, සරණාගතයින් යලි පදිංචි කිරීමේ වැඩසටහන් කළමනාකරු: ජානටි මොමොන්, දකුණු කලාප ක්ෂේත්‍ර නිලධාරි: පෝර්ඩේ මොරිබා, සරණාගත සම්බන්ධීකාරක: ස්මාර්ට් සෙනෙෂි, දක්ෂිණ කලාප ක්ෂේත්‍ර නිලධාරි.

**එක්සත් ජාතින්ගේ මානවහිතවාදී කටයුතු සම්බන්ධීකරණය පිළිබඳ සංවිධානය OCHA:** සහිද් අබු ඩිංගි, දක්ෂිණ කලාප සම්බන්ධීකාරක, සරාහ් මුස්කොෂ්ට්, මානවහිතවාදී කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ නිලධාරි: ජෝන් ටකර්, බටහිර ප්‍රදේශ සම්බන්ධීකාරක: මයිකල් වොන් ස්වාරේ, නැගෙනහිර කලාපීය සම්බන්ධීකාරක.

**එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් (UNHCR):** සකුරා අත්සුමි, ක්ෂේත්‍ර සම්බන්ධීකාරක

## පරිච්ඡේදය 2 : කඳවුරු පිහිටුවීම සත්කාරය සහ නඩත්තුව

ජාත්‍යංතර ගලවා ගැනීමේ කමිටුව (UNHCR) : ජෙනිපර් ක්ලයින් සරණාගත වැඩසටහන් සම්බන්ධීකාරක: මාර්ටිජිං වැන් ඩි රිජ්ඩ්ට්, ජලය සහ සනිපාරක්‍ෂක වැඩසටහන් සම්බන්ධීකාරක

නෝර්වීජියානු සරණාගත කවුන්සලය (NRC) ක්‍රිස් බිලියර්ස්, කඳවුර කළමනාකරු, ටර්ජී බොඩොගාර්ඩ්, සෙවන උපදේශක: මාරියා ඇන්ගී ලාල්ලියර්, වැඩසටහන් කළමනාකරු,

එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් (UNHCR) ඔලිවර් ෂිගෙන්තාලර්, හදිසි ඉසව් සැළසුම්කරු සහ කාර්මික උපදේශක.

## පරිච්ඡේදය 3 : ප්‍රජා සහභාගිත්වය සහ කඳවුරු කමිටු

"ඇප්‍රිකන් කොන්සර්න්" : අල්ලිව් ජුසු කෙබ්බි, කඳවුරු කළමනාකරු: ක්‍රිස්ටෝපර් හෙස්සු, කාර්මික අධීක්‍ෂක, එමැනුවෙල් මුම්බා ව්‍යාපෘති සම්බන්ධීකාරක, කතෝලික සහන සේවාවන් (CRS) ජොන් ටී ජෝර්ජ් , ලාගෝ කඳවුරේ ප්‍රජා සේවා නිලධාරි: ජාත්‍යංතර ගෞරවය සඳහා වන පදනම: ඩික්සන් පිෂිඩ් ගබ්ලාහ් ක්‍ෂේත්‍ර පර්යේෂණ නිලධාරී ජාත්‍යංතර ගලවා ගැනීමේ කමිටුව, (IRC) ජෙනිෆර් ක්ලයින් සරණාගත වැඩසටහන් සම්බන්ධීකාරක: අබ්දුල් කෙමොහ් ගෙරිහුන් කඳවුරු කළමනාකරු: මාර්ගුට් මුසා ගෙරිහුන් කඳවුර, සහකාර කඳවුර ජිවිත කළමනාකරු: ලුතරන් ලෝක පෙඩරේෂනය (LWF) මොහම්මද් එම් ගබාස්සා, කඳවුර කළමනාකරු, ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ සංවිධානය (MRD) ඇල්පා කැලෝන් උපදේශන නිලධාරී සමාජ ක්‍රියාකාරිත්වය සඳහා වන ජාතික කොමිෂම: (NGCSA) ක්‍රිස්ටෝපර් මොයි - සන්නොහ්, ක්‍ෂේත්‍ර නිරීක්‍ෂක නෝර්වීජියානු සරණාගත කවුන්සලය : (NRC) ක්‍රිස් බිලියර්ස්, කඳවුරු කළමනාකරු: මාරියා ඇන්ගේ ලාල්ලියර් වැඩසටහන් කළමනාකරු, "පීස් වින්ඩ්ස් ජැපෑන්" (PWJ) මිහෝ පුකුයි, නියෝජ්‍ය නියොජිත: බොකාරි ජගුවා, කඳවුරු කළමනාකරු එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් (UNHCR) ජෙමෙයිනි බතියොනො, ජ්‍යෙෂ්ඨ සියරට යැවීමේ නිලධාරි.

## පරිච්ඡේදය 4 : ලියාපදිංචි කිරීම සහ දත්ත රැස්කිරීම

නෙදර්ලන්ත සරණාගත කවුන්සලය (DRC) හෙලනි රූඩ්, ඉංගුස්හෙතියා විශ්ලේශන ප්‍රධානි, ජෙට්ති ටොෂ්ට්, ව්‍යාපෘති නියෝජිත: කැතරින් ස්ටාර්අප්, ව්‍යාපෘති සම්බන්ධීකාරක: එලන් හකීම්, ක්‍ෂේත්‍ර නිලධාරි: රස්මුස් ස්තුහර් ජෙකොම්සන්, ව්‍යාපෘති සම්බන්ධීකාරක: පිත්තෙ ක්රොග් හදිසි අවස්ථා නිලධාරි, ජාත්‍යංතර ගලවා ගැනීමේ කමිටුව (IRC) ගිලියන් දුන්, හදිසි අවස්තා කණ්ඩායම් සම්බන්දීකාරක, ජෝශප් අගුඑට්ටැන්ට්, සම්බන්ධිකරණ නිලධාරි, නෝර්වීජියානු සරණාගත කවුන්සලය (NRC) ක්‍රිස් බිලියර්ස්, කඳවුරු කළමනාකරු: මැගන්හිල්ඩ් වාස්සෙට්, නේවාසික නියෝජිත: ටොර්ඩ් රෝ, වැඩසටහන් කළමනාකරු: ක්‍රිස් බිලියර්ස් කඳවුරු කළමනාකරු: ටෝර් වංග්ලි, ව්‍යාපෘති සම්බන්ධීකාරක.

## පරිච්ඡේදය 5 : ආරක්‍ෂණය,

**එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් (UNHCR)** ජර්මෙයිනෙ බතියොනො ජ්‍යෙෂ්ඨ සියරට යැවීමේ නිලධාරී: හෙලෙනි ඩවුබෙල් කෝ ආරක්‍ෂණ නිලධාරී: මාගරීටා බොසෙල් ලා ගොස්, ළමා ආරක්‍ෂණ නිලධාරී: ඇලෙක්ස් මුන්ඩට්, ආරක්‍ෂණ නිලධාරී: ඩොරිස් මවුරන්, ළමා ආරක්‍ෂණ නිලධාරී: මායා අමරතුංග, ජ්‍යෙෂ්ඨ ආරක්‍ෂණ නිලධාරි, කවෝරු නෙමොතො, ජ්‍යෙෂ්ඨ ආරක්ෂණ නිලධාරි: (UNHCR) **ජාත්‍යංතර රතු කුරුස කොමිෂම (ICRC)** ආචාර්ය මිචෙල් මාස්සන්, උප පැවැරුම් ප්‍රධානි: ක්‍රිස්ටෝපර්

සෙහිල්ඩ්, ආරක්‍ෂණ සම්බන්ධීකාරක: ඩෙනිස් දුරාන්, පැවැරුම් පිළිබඳ නියෝජ්‍ය ප්‍රධානි: කරිතාස්, රෝස්ලින් ගෙබෙන්ඩා, වැඩ සටහන් අධීක්‍ෂක: ප්‍රාන්සිස් ජොම්බවායි, අධ්‍යාපන නිලධාරී

**ළමා සුරකුම (SCF)** එක්සත් රාජධානිය, මොහොමඩ් බුන්දු, කඳවුර සම්බන්ධීකාරක: සාර් කමන්ද ළමා ආරක්ෂණ නිලධාරී, ස්ටිවන් කම්බා අග්නිදිග මෙහෙයුම් කළමනාකරු: ඇලිස් කොවුල්කර්, ළමා ආරක්ෂණ උපදේශක, ගලවා ගැනීමේ

**ජාත්‍යංතර කමිටුව (IRC)** ඩේවිඩ් ලාමින්, නියෝජ්‍ය වැඩසටහන් සම්බන්ධීකාරක අබ්දුල් කෙමෝ කඳවුර කළමනාකරු

**ලුතරන් ජගත් එකමුතුව ලෝක සේවා (LWF-WS)** මොහොමඩ් ගබාස්සා, කඳවුරු කළමනාකරු

**කතෝලික සහන සේවා (CRS)** මාලන් අමාරා, කඳවුර කළමනාකරු, තෙරේසා සොංගු උප කාර්යාල කළමනාකරු,

**ජාත්‍යංතර ගෞරවත්වය සඳහා වන පදනම (FIND)** ඩික්ෂන් පිසිබි ගබිලාජ්, පර්යේෂණ සහ තොරතුරු නිලධාරී කොෆි වුඩ්ස්, ප්‍රාදේශිය නියෝජිත, සමාජ ක්‍රියාකාරීත්වය සඳහා වන

**ජාතික කොමිසම (NGCSA)** ෂොඩේ මෞරිබා, ප්‍රත්‍යානුකලන නිලධාරී: ක්‍රිස්ටෝපර් සසනෝ, ක්‍ෂේත්‍ර නිරීක්ෂක:

**එක්සත් ජාතීන්ගේ මානවහිතවාදී කටයුතු සම්බන්ධීකරණ සංවිධානියා:** ජෝන් ටකර්, ක්‍ෂේත්‍ර සම්බන්ධීකාරක:

**පීස් වින්ඩ්ස් ජැපෑන් (PWJ)** මිහෝ ප්‍රකුයි, නියෝජ්‍ය නියෝජිත, ජජුවා බොකරියා, කඳවුරු කළමනාකරු අරුණා ඉගාජ්, කඳවුරු කළමනාකරු,

## පරිච්ඡේදය 6 : ළමා ආරක්ෂණය

**එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් (UNHCR)** ජර්මයිනි බතියෝනො, ජ්‍යෂ්ඨ සියරට යැවීමේ නිලධාරී: හෙලෙනෙ ඩවුබෙල්කෝර්, ආරක්‍ෂණ නිලධාරී, මාර්ගරීටා බොසෙල්, ලාගොස්, ළමා ආරක්‍ෂණ නිලධාරී: ඩොරිස් මවුරොන්, ළමා ආරක්‍ෂණ නිලධාරී: මායා අමරතුංග, ජ්‍යෂ්ඨ ආරක්ෂණ නිලධාරී, කඹරු නෙමොතො, ජ්‍යෂ්ඨ ආරක්ෂණ නිලධාරී,

**ජාත්‍යංතර රතුකුරුස කොමිසම (ICRC)** ආචාර්ය මිචෙල් මැස්සෝන්, උප-නියෝජනයේ ප්‍රධානි, ක්‍රිස්ටෝප ෂිහිල්ඩ්, ආරක්‍ෂණ සම්බන්ධීකාරක: ඩෙනිස් දුරාන් නියෝජ්‍ය නියෝජන ප්‍රධානි ළමා සුරකුම එක්සත් රාජධානිය (SCF) මොහොමඩ් බුන්ඩු, කඳවුරු සම්බන්දීකාරක: සාර් කමන්ඩා, ළමා ආරක්ෂණ නිලධාරී: ස්ටිවන් කබ්බා, අග්නිදිග මෙහෙයුම් කළමනාකරු: ඇලිස් කෝල්කර්, ළමා ආරක්‍ෂණ උපදේශක:

**ජාත්‍යංතර ගලවා ගැනීමේ කමිටුව (IRC)** ඩේවිඩ් ලාමින්, නියෝජ්‍ය වැඩසටහන් සම්බන්ධීකාරක, අබ්දුල් කොමෝ, කඳවුරු කළමනාකරු,

**එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)** පීන් ලයිබ්, සියරට යැවීමේ නිලධාරී:

**ලුතරන් ලෝක එකමුතුව ලෝක සේවය (LWF-WS)** මොහොමඩ් ගබාසා, කඳවුරු කළමනාකරු,

**ගෞරවනීයත්වය සඳහා වන ජත්‍යංතර පදනම (FIND)** පිසිම ඩික්සන් පිසිබ ගබිලාජ්, පර්යේෂණ සහ තොරතුරු නිලධාරී: කොෆි වුඩ්ස්, ප්‍රාදේශිය නියෝජිත,

**සමාජ ක්‍රියාකාරීත්වය සඳහා වන ජාතික කොමිෂම (NGCSA)** පෝඩේ මවුරිබාජ් සියරට යැවීමේ නිලධාරී: ක්‍රිස්ටෝපර් සසනෝජ් ක්‍ෂේත්‍ර නිරීක්‍ෂක,

**එක්සත් ජාතීන්ගේ මානව හිතවාදී කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ සංවිධානය.** ජෝන් ටකර්, ක්‍ෂේත්‍ර සම්බන්ධීකාරක

**කුපි :** පිලිප් කමාරා ළමා ආරක්‍ෂණ නිලධාරී

**"පීස් වින්ඩ්ස් ජැපෑන්" (PWJ)** මිහො පුකියි, නියෝජ්‍ය නියෝජිත: ජජුආ බොකරීසා, කඳවුර කළමනාරු අරුණ ඉජාජ්, කඳවුරු කළමනාකරු.

## පරිච්ඡේදය 7 : ලිංගාශ්‍රිත ප්‍රචණ්ඩත්වය වැළැක්වීම.

**එක්සත් ජාතීන්ගේ මානව හිතවාදී කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය (UNOCHA)** කැතරින් ගොලෙන්කැම්ප්, අපචාර හා උපයෝජන වැළක්වීමේ සම්බන්ධීකාරක.,
**ජාත්‍යන්තර ගලවා ගැනීමේ කමිටුව (IRC)** හෙයිඩි ලෙහෙමන්, ලිංගික සහ ලිංගාශ්‍රිත ප්‍රචණ්ඩත්වය වැඩසටහන් සම්බන්ධීකාරක, බෙත් මාර්ටින්, ලිංගික හා ලිංගාශ්‍රිත ප්‍රචණ්ඩත්වය වැඩසටහන් කළමනාකරු: කෙවින් මැක්නල්ටි, ලිංගික සහ ලිංගාශ්‍රිත ප්‍රචණ්ඩත්ව වැඩසටහන් කළමනාකරු
**ඔක්ස්පාම් :** වේල් ඉබ්‍රාහිම්, මෙහෙවර ප්‍රධානි:
**බෝ පුජේඥන්, සංවර්ධන සමාජය (BPDA)** පොම්බා කොරොමා, ක්ෂේත්‍ර නිලධාරි
**එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් (UNHCR)** කැතරින් හාර්ඩින්, ප්‍රජා සේවා සහායක: කවොරු නෙමොතො, ජ්‍යෙෂ්ඨ ආරක්‍ෂක නිලධාරි - ජිනිවා,
**පීස් වින්ඩ්ස් ජැපෑන් (PWJ)** මිහෝ පුකුයි ක්ෂේත්‍ර සම්බන්ධීකාරක, බෙබි බෙටි ස්වරේ, කඳවුරු සංවිධාන නිලධාරි: රැකායිල් බෝමාන්, සහකාර කඳවුරු කළමනාකරු,
**ලෝක ආහාර වැඩසටහන (WFP)** මිචෙල් ඉසෙම්ංගර් වැඩසටහන් නිලධාරි මෙහෙයුම්

## පරිච්ඡේදය 8 : කඳවුරු ආරක්ෂාව

**එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් (UNHCR)** ඉයෙන් පෝල්, ජ්‍යෙෂ්ඨ සරණාගත / ආපසු යන, ආරක්‍ෂක නිලධාරි: ඉසාබි මිසික්, ආරක්‍ෂණ නිලධාරි:
**ජාත්‍යන්තර ගලවා ගැනීමේ කමිටුව (IRC)** සැම් ෂර්මන්, ජ්‍යෙෂ්ඨ කාර්මික උපදේශක ආරක්‍ෂණ
**නෝර්විජියානු සරණාගත කමිටුව (NRC)** මයිල්ස් මාර්ටින්, ආරක්ෂක සම්බන්ධීකාරක, ක්‍රිස් බිලියර්ස් කඳවුරු කළමනාකරු ලාර්ස් පින්ස්ටාර්ඩ්, හදිසි කටයුතුවලට සුදනමින් සිටින හමුදව: ටොර් වංග්ලි, ව්‍යාපෘති සම්බන්ධීකාරක.

## පරිච්ඡේදය 9 ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍ය බෙද හැරීම.

### ආහාර බෙද හැරීම :

**ලෝක ආහාර වැඩසටහන (WFP)** මිෂෙල් ඉංසිම්ංගර්, වැඩසටහන් නිලධාරි: මෙහෙයුම්:
**නෝර්විජියානු සරණාගත කවුන්සලය (NRC)** මරියා ඇන්ගෙ ලාල්ලියර්, වැඩසටහන් කළමනාකරු: මාග්‍රට් වික්කි, බෙද හැරීමේ උපදේශක: මාරියන්නේ වික්, බෙද හැරීමේ උපදේශක
**එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් (UNHCR)** සකුරා අත්සුමි, ක්ෂේත්‍ර නිලධාරි: ජෙනට් ඔමෝරො, ආහාර ආධාර සහ පෝෂණ නිලධාරි: පාතියා අබ්දෙල්ලා - ජිනිවා (DOS)
**ජාත්‍යන්තර ගලවා ගැනීමේ කමිටුව (IRC)** ජෙනිපර් ක්ලයින්, සරණාගත වැඩසටහන් සම්බන්ධීකාරක.

### ආහාර නොවන ද්‍රව්‍ය :

**කෙයාර් ජාත්‍යන්තරය :** ජෝන් ලාහායි: ව්‍යාපෘති සම්බන්ධීකාරක
**රතුකුරුස සංවිධානයේ ජාත්‍යන්තර කමිටුව (ICRC)** ඩෙනිස් දුරාන්, පැවැරුම් නියෝජ්‍ය ප්‍රධානි:
**නෝර්විජියානු සරණාගත කවුන්සලය (NRC)** ක්‍රිස් බිලියර්ස්, කඳවුරු කළමනාකරු: මාරි යන්නේ වික්, බෙදහැරීමේ උපදේශක
**වෙනත් :** ග්‍රේ ජෙන්කිංසන්, මයික් වොරන්

## පරිච්ඡේදය 10 : ජලය සහ සනීපාරක්ෂාව:

**ජාත්‍යන්තර ගලවා ගැනීමේ කමිටුව** (IRC) මාර්ටිජිං වාන් ඩි රිජ්ඩ්ට්, ජල සහ සනීපාරක්ෂක වැඩසටහන් සම්බන්ධීකාරක
**නෝර්විජියානු සරණාගත කවුන්සලය** (NRC) ක්‍රිස් බිලියර්ස්, කඳවුර කළමනාකරු:
**ඔක්ස්පාම් :** එඩුවාර්ඩො වාර්ගාස්, වැඩසටහන් කළමනාකරු:
**නෝර්විජියානු පල්ලි ආධාර** (NCA) ඇන්ඩර්ස් හාලැන්ඩ්, (WATSAN) උපදේශක:
**වෙනත් :** ග්‍රේ ජෙන්කිංසන්, මයික් වොරන්

## පරිච්ඡේදය 11 : අධ්‍යාපනය

**අප්‍රිකානු අධ්‍යාපන කාර්යාලය** (ADED) කුබොකා හැරිසන්, ක්ෂේත්‍ර සම්බන්ධීකාරක.
**ක්‍රිස්තියානි ළමා අරමුදල** (CCF) ඩේවිඩ් ඔයෙකාන් - ජොන්, මනෝ - සමාජ සම්බන්ධීකාරක, රොජර් හලෝ, ළමා ආරක්ෂණ නිලධාරී
**ජාත්‍යන්තර ගලවා ගැනීමේ කමිටුව** (IRC) ජෙනිපර් ක්ලයින්: සරණාගත වැඩසටහන් සම්බන්ධීකාරක: කැමිලි එවන්ස්, තරුණ වැඩසටහන් කළමනාකරු: ඇන් පිටිස්පෙරාල්ඩ්, අධ්‍යාපන වැඩසටහන් කළමනාකරු, ටම්බා ගබෝරියා, නියෝජ්‍ය අධ්‍යාපන වැඩසටහන් සම්බන්ධීකාරක: ජොනතන් මිලර්, ප්‍රාදේශිය අධ්‍යාපන උපදේශක, පීටර් වන්ඩි, සරණාගත අධ්‍යාපන. අධීක්ෂක: ඩේවිඩ් වෝකර්, අධ්‍යාපන වැඩසටහන් සම්බන්ධීකාරක:
**නෝර්විජියානු සරණාගත කවුන්සලය** (NRC): මාරියා - ඇන්ගේ ලාල්ලියර්, වැඩසටහන් කළමනාකරු: ජෝර්ජ් මෙවෝල්ඩ්, තරුණ වැඩසටහන් නිලධාරී, මෙත්තෙ නෝර්ඩ්ස්ට්‍රැන්ඩ්, නේවාසික නියෝජිත, එල්ඩ්රිඩ් කේ. මිඩ්ට්ටුන් අධ්‍යාපන උපදේශක: පෙට්රා ස්ටෝර්ස්ටෙයින්, වැඩසටහන් නිලධාරී:
**එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්** (UNHCR) ලිංනෙ නුගුගි, ප්‍රජා සේවා නිලධාරී: ජෙමෙයිනෙ බතියානො, ජ්‍යෙෂ්ඨ සියරට යැවීමේ නිලධාරී:
**වෙනත් :** ග්‍රේ ජෙංකිංසන්, මයික් වොරන්:

## පරිච්ඡේදය 12 ස්වශක්තිය සඳහා දිවි පෙවෙත් ප්‍රවර්ධන උපායමාර්ග

**ඇමෙරිකානු සරණාගත කමිටුව** (ARC) තිමොති එච්. නොර්සෙ, ජගත් සුළු මූල්‍ය සම්බන්ධීකරක: ජෙනිපර් පෙට්රෝ දේශිය අධ්‍යක්ෂ (ARC) ගිනියා ඩේවි හැසල්, අප්‍රිකාව සඳහාවන ප්‍රාදේශිය අධ්‍යක්ෂ

**"කොස් කැනඩා"** මාර්ටින් ඒ පෝඩේ, වැඩසටහන් කළමනාකරු:
**ජෙසෙල්ස්චාප්ට් පර් ටෙක්නිසෙ ප්‍රසම්මෙනාබියට්** (GTZ) අබ්දුල් කාරිම් කමාරා, කුසලතා පුහුණු වාර්තා කිරීමේ නිලධාරී
**වෙනත් :** ග්‍රේ ජෙන්කිංසන්, මයික් වොරන්

## පරිච්ඡේදය 13 : තරුණයන් සහ විනෝදාංශ:

**අප්‍රිකා අධ්‍යාපන කාර්යාලය** (ADED) කුබොකා හැරිසන්, ක්ෂේත්‍ර සම්බන්ධීකාරක :
**ක්‍රිස්තියානි ළමා පදනම** (CCF) ඩේවිඩ් බයෙකන් ජෝන්, මනෝ සමාජ සම්බන්ධීකාරක රොජර් හොලො ළමා ආරක්ෂණ නිලධාරී
**ජාත්‍යන්තර ගලවා ගැනීමේ කමිටුව** (IRC) ජෙනිපර් ක්ලයින්, සරණාගත වැඩසටහන් සම්බන්ධීකාරක: කැමිලා එල් එවන්ස්, සරණාගත යොවුන් වැඩසටහන් කළමනාකරු: ඇන් පිටිස් ජෙරාල්ඩ්: අධ්‍යාපන

වැඩසටහන් කළමනාකරු: තම්බා ගොබොරි, නියෝජ්‍ය අධ්‍යාපන කළමනාකරු: ජොනතන් මිලර්, ප්‍රාදේශිය අධ්‍යාපන උපදේශක: පීටර් වන්ඩි, සරණාගත අධ්‍යාපන අධීක්ෂක: ඩේවිඩ් වෝකර් අධ්‍යාපන වැඩසටහන් සම්බන්ධීකාරක:

**නෝර්විජියානු සරණාගත කවුන්සලය** (NRC) මාරියා ඇන්ගෙ ලාල්ලියර් වැඩසටහන් කළමනාකරු: ජෝර්ජ් මෙවෝල්ඩ්, තරුණ වැඩසටහන් නිලධාරි, මෙත්තෙ නොර්ස්ට්‍රැන්ඩ්, නේවාසික නියෝජිත,

**එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්** (UNHCR) ලින්නෙ නුගුගි, ප්‍රජා සේවා නිලධාරි: ජෙමෙයිනෙ බතියානො, ජ්‍යෙෂ්ඨ සියරට යැපීමේ නිලධාරි:

**වෙනත් :** ග්‍රේ ජෙන්කිංසන්, මයික් වොරන්

## පරිච්ඡේදය 14: සෞඛ්‍ය සත්කාරය සහ සෞඛ්‍ය අධ්‍යාපනය

**එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්** (UNHCR) මරියා - ක්ලව්ඩි මොතිනොවිචා, ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශිය සෞඛ්‍ය සම්බන්ධීකාරක

**මැඩිසින් සාන්ස් පරන්ටියර්ස් නෝර්වේ :** (MSF) වෛද්‍ය හිල්ඩ් ක්ලොවිස්ටඩ්

**වෙනත් :** ග්‍රේ ජෙන්කිංසන්, මයික් වොරන්

## පරිච්ඡේදය 15 : මානසික සත්කාරය

**ප්‍රජා මානසික සෞඛ්‍ය,** (CVT) සාරා කරව්පෝඩ් බ්‍රවුන්, මානසික සෞඛ්‍ය ප්‍රතිකාරක: මයිකල් කමවු, ස්ටිවන් කමාරා, ඇබෙන්ඩිංගො බොර්ලෙ, ග්ලැඩිස් කෙස්ලි, මොහොමඩ් රොජර්ස්, සෙයිදු ස්වරේ, මෙයි වාර්ලියා ජෙන්නා පායේවේ, අමිනාතා රොජර්ස් සහ මුසු වෙයි: මානසික ඒජන්තවරු

**මර්ලින් :** ඇන්ජලිනා මාවු, මනෝ විද්‍යාඥ, ලිංගික සහ ලිංගාශ්‍රිත ප්‍රචණ්ඩත්ව වැඩසටහන:

**වෙනත් :** හැංකොං ස්ටේන්මාක්, මධ්‍යම නෝර්වේහි සරණාගත මනෝවිද්‍යා කණ්ඩායම: ග්‍රේ ජෙංකිංසන් මයික් වොරන්.

## පරිච්ඡේදය 16 : සාමය ඇතිකිරීම සහ ප්‍රතිසංධානය

**එක්සත් ජාතීන්ගේ මානව හිතවාදී කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ සංවිධානය** (OCHA) ජෝන් වකර්, ක්ෂේත්‍ර සම්බන්ධීකාරක:

**එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස්** (UNHCR) කැතරින් හාර්ඩින් ප්‍රජා සේවා සහායක:

**සමාජ ක්‍රියාකාරීත්වය සඳහා වන ජාතික කොමිසම** (NaCSA) අබ්දුල් රහමන් මන්සාරේ, ක්ෂේත්‍ර නිලධාරි:

**කතෝලික සහන සේවා CRS** තෙරේසා සොංගු උපකාර්යාල කළමනාකරු,

**ජාත්‍යන්තර ගෞරවය සඳහා වන පදනම** (FIND) ඩික්සන් පිසියෝ ගබිලා, පර්යේෂණ සහ තොරතුරු නිලධාරි

**අප්‍රිකානු අවධානය :** අර්නස්ට් ඇල්පා: ඇලියු කාඳි, කඳවුරු කළමනාකරු: එමැනුවෙල් මුම්බා: ව්‍යාපෘති සම්බන්ධීකාරක: ක්‍රිස්ටෝප් හෙසෝවි, කාර්මික ඉංජිනේරු, සියරා - ලියෝන් මෙතොදිස්ත පල්ලි, ජේම්ස් පෝයාහ්, ව්‍යාපෘති අධීක්ෂක:

**ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතිස්ථාපනය සඳහා වන සංවිධානය** (MRD) ඇල්පා කාල්ලෝන්: වැඩසටහන් සම්බන්ධීකාරක

**නෝර්විජියානු සරණාගත කවුන්සලය** (NRC) ත්‍රොංඩ් ජෙංසන්, වැඩසටහන් කළමනාකරු:

**වෙනත් :** ග්‍රේ ජෙංකිංසන්: මයික් වොරන්

## පරිච්ඡේදය 17 : කඳවුරු කළමනාකරණ කණ්ඩායමේ වගකීම් :

**ජාත්‍යංතර ගලවා ගැනීමේ කමිටුව** (IRC) ජෙනිපර් ක්ලයින්, සරණාගත වැඩසටහන් සම්බන්ධීකාරක: අබ්දුල් කෙමො, ජෙරිහුං, කඳවුරු කළමනාකරු: මාග්‍රට් මූසා, සහකාර කඳවුරු ජීවිත කළමනාකරු: ජෙරිහුං කඳවුර:

**ලූතරන් ලෝක එකමුතුව** (LWF) මොහොමඩ් එම්. ගබාස්සා, කඳවුරු කළමනාකරු:

**නෝර්විජියානු සරණාගත කවුන්සලය** (NRC) ට්‍රොංඩ් ජෙන්සන්, වැඩසටහන් කළමනාකරු:

**වෙනත් :** ග්‍රේ ජෙංකිංසන්, මයික් වොරන්

## පරිච්ඡේදය 18 : කඳවුර වසාදැමීම.

**සර්ජ්/IRC:** රෆායෙල් යූ. ආබිස්,

**නෝර්විජියාන් සරණාගත කවුන්සලය** (NRC) ඔඩ්පාල්ඩ් ගුංතර්, කාර්මික සහායක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ටොර් වංග්ලි, ව්‍යාපෘති සම්බන්ධීකාරක

2004 අප්‍රියෙල් 16, ඔස්ලෝ,

නිනා එච්. බ්‍රික්ලැන්ඩ්, ටොර් වංග්ලි සහ එලන් වර්මෙවුලන්.

# කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| ADEO | - | අප්‍රිකානු අධ්‍යක්ෂ අධ්‍යාපන කාර්යාලය |
| ACT | - | පල්ලි එක්ව ක්‍රියාකාරීත්වය |
| ANC | - | පූරෝ සුති උවටැන |
| ARC | - | දරුවන්ගේ අයිතිය වෙනුවෙන් ක්‍රියාකාරීත්වය (එක්සත් ජාතීන්ගේ සරණාගත මහ කොමසාරිස් සහ මහා බ්‍රිතාන්‍යයේ STC ව්‍යාපෘතිය එක්ව) |
| AU | - | අප්‍රිකා සංගමය (කලින් අප්‍රිකා සහයෝගිතා සංවිධානය) |
| CCF | - | ක්‍රිස්තියානි ළමා අරමුදල |
| CDC | - | බෝවෙන රෝග මර්දන සහ වැළැක්වීමේ මධ්‍යස්ථානය |
| CMA | - | කඳවුරු කළමනාකරණ ඒජන්සිය |
| CPA | - | ළමා රැකවරණ ඒජන්සිය |
| CRC | - | ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය |
| CRS | - | කතෝලික සහන සේවා |
| CWC | - | ළමා සුභසාධන කමිටුව |
| CTA | - | ප්‍රජා ගුරුන්ගේ සමාජය |
| DRC | - | ඩෙනිස් සරණාගත කවුන්සලය |
| ECHO | - | යුරෝපා කොමිසම සඳහා වන මානවහිතවාදී ආධාර |
| EPI | - | එන්නත් කිරීම පිළිබඳ විස්තෘත කාර්යාල වැඩසටහන |
| FGM | - | කාන්තාවන් සඳහා වන ප්‍රජනන අංග ඡේදනය කිරීම |
| FIND | - | ගෞරවාන්විත බව සඳහා වන අන්තර් ජාතික පදනම |
| GBV | - | ලිංගික ප්‍රචණ්ඩත්වය |
| GPS | - | මිහිපිට මං සෙවීමේ පද්ධතිය |
| GTZ | - | එනම් ජර්මන් සංවිධානය |
| HIS | - | සෞඛ්‍ය තොරතුරු පද්ධතිය |
| ICC | - | අන්තර් කාල රැකවරණ මධ්‍යස්ථානය |
| ICRC | - | අන්තර්ජාතික රතු කුරුස කමිටුව |
| IDP | - | අභ්‍යංතර අවතැන් වුවන් |
| ILO | - | ජාත්‍යංතර කම්කරු සංවිධානය |
| INEE | - | හදිසි අවස්ථාවන් සඳහා වන අන්තර් ඒජන්සි අධ්‍යාපන ජාලය |
| IMCI | - | ළමා කාලයේ රෝග සඳහා වන සමෝධානිත කළමනාකරණය |
| IOM | - | සංක්‍රමණය සඳහා වන ජාත්‍යංතර සංවිධානය |
| IRC | - | අන්තර්ජාතික ගලවා ගැනීමේ කමිටුව |
| ITDG | - | මධ්‍යම තාක්ෂණ සංවර්ධන කණ්ඩායම |
| LWF | - | ලූතරන් ජගත් ෆෙඩරේෂනය |
| MSF | - | ඖෂධ රහිත දේශ සීමාව |
| MRD | - | ප්‍රජාතන්ත්‍රවාදය සුරකීමේ සංවිධානය |
| MOU | - | අවබෝධතා ගිවිසුම |
| NGO | - | රාජ්‍ය නොවන සංවිධානය |
| NACSA | - | සමාජ ක්‍රියාකාරීත්වය සඳහා වන ජාතික කොමිෂම (සියරා - ලියෝන්හි) |
| NFIS | - | ආහාර නොවන ද්‍රව්‍ය |
| NRC | - | නෝර්විජියානු සරණාගත කවුන්සිලය |